

සඳසර

SANDASARA

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය

Essays in Honour of Senior Professor Chandrasiri Rajapaksha

ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
Department of Mass communication, University of Kelaniya

සඳසර

SANDASARA

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ
උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය

Essays in Honour of
Senior Professor Chandrasiri Rajapaksha

සඳසර
SANDASARA
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය
Essays in Honour of Senior Professor Chandrasiri Rajapaksha

මුද්‍රණය : 2017

ISBN 978-955-7040-29-5

© ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

මුද්‍රණය:
ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක: 06, ශ්‍රී බෝධිරාජ මාවත,
මාලිගාවත්ත,
කොළඹ 10.

Cover Design, Interior Layout and
Professor Rajapaksha's Photographs by
Aruna Lokuliyana
Department of Mass Communication
University of Kelaniya

Published By:
Department of Mass Communication
University of Kelaniya
Sri Lanka

සඳසර

SANDASARA

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ
උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය

Essays in Honour of
Senior Professor Chandrasiri Rajapaksha

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
2017

Department of Mass Communication
University of Kelaniya
Sri Lanka

සඳසර

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ
උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය

උපදේශකත්වය

මහාචාර්ය මාපා තිලකරත්න

මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස

මහාචාර්ය ආරියරත්න ඇතුගල

ප්‍රධාන සංස්කාරකවරු

අරුණ ලොකුලියන
විජයානන්ද රූපසිංහ

සහය සංස්කරණය

මධුරානි අත්තනායක

සම්බන්ධීකරණය

අයේශ් විජයසිංහ
අමිල නුවන් මධුසංඛ

විශත් සර වැහෙ
විශත් විශරණ වැරේ
දියොත් කිරි නැරේ
කියමි සඳසර අලංකාරේ.....

දෙටු මහ ඇදුරු චන්ද්‍රසිරි රාජපක්ෂයන් වෙත
ගෞරවාදරයෙන් සමර්පණය කෙරෙයි.

~ ජනසන්නිවේදන අධ්‍යයන අංශය

සංස්කාරක සටහන

'සඳසර' ශාස්ත්‍රීය සංග්‍රහය සංස්කරණය වූයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන්ගේ දසක හතරක විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සේවාවට උපහාරයක් වශයෙනි. ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨතම ආචාර්යවරයා වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන්ගේ සමකාලීනයන් මෙන්ම අධ්‍යයන ඇසුර ලැබූ විශ්වවිද්‍යාල ආචාර්යවරු සහ විද්‍යාර්ථීන් රැසක් මේ සඳහා දායකත්වය සපයා තිබේ.

සන්නිවේදනය හා ජනමාධ්‍ය අධ්‍යයනය විෂය ක්ෂේත්‍රය මෙන්ම සෙසු සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර තේමාවන්ට අදාළව සැපයුණු මෙම ලිපි ඒ ඒ රචකයාගේ පර්යේෂණ ක්ෂේත්‍ර වලට අනුව සම්පාදනය වූ ඒවා වේ. මෙහිදී විශේෂයෙන්ම මහාචාර්ය රාජපක්ෂයන්ට සමීප සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍ර වූ සන්නිවේදන න්‍යාය හා ජනශ්‍රැති අධ්‍යයනය පිළිබඳ ලිපි සඳහා වැඩි ඉඩක් වෙන් කෙරිණි.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ ලිපි අතරට ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ විවාදාත්මක තේමාවන් රැසක් එක් කිරීමට ලැබීම එතුමන්ගේ ශාස්ත්‍රීය ජීවිතයට දක්වන සැබෑ උපහාරයක් බව අපගේ විශ්වාසය යි.

මෙම වෙළුම සඳහා ලිපි ලබාදීමෙන් ස්වකීය ශාස්ත්‍රීය සේවාව සැපයූ විද්වත් පර්ෂදයට අපගේ පළමු ස්තුතිය හිමිවේ. මේ සඳහා මග පෙන්වූ අංශාධිපති මහාචාර්ය මාපා තිලකරත්න ඇතුළු ආචාර්ය මණ්ඩලයේ ආශිර්වාදය මේ සඳහා බෙහෙවින් උපකාරි විය. අවශ්‍ය දිරිදීමද පූර්වාදර්ශ ද මගින් දැක්වූ මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් පීඨාධිපති මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබේරත්න සහ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාරයන් ද ගෞරවයෙන් සිහිපත් කරමු. කෘතිය සම්පාදනයෙහිලා නන් අයුරින් සහය දැක්වූ සෙසු සහෝදර ආචාර්ය මණ්ඩලය ද කාර්යාලීය හිතවතුන් ද අපගේ ගෞරවයට පාත්‍ර වේ. මුද්‍රණ කටයුතු මනා ලෙස නිම කර ලබාදුන් වෙසෙස් සහයෝගය වෙනුවෙන් රනිල් ඇල්විටිගල මහතා ඇතුළු ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කිරීමට ද මෙය අවස්ථාව කර ගනිමු.

සංස්කාරකවරු

DEAN - FACULTY OF SOCIAL SCIENCES YEAR 2010
UNIVERSITY OF KELANIYA, SRI LANKA

පටුන

සංස්කාරක සටහන vi

පටුන ix

ලේඛක වගතුග xiii

උපකුලපතිතුමාගේ පණිවුඩය xviii

පීඨාධිපතිතුමාගේ පණිවුඩය xix

අංශාධිපතිතුමාගේ පණිවුඩය xx

සඳසර ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ xxi

න්‍යාය හා භාවිතය

1. සන්නිවේදන න්‍යාය දර්ශනය
   මහාචාර්ය ආරියරත්න ඇතුගල 03

2. චීන පුනරුදයේ පෙරමුණ ගත් දාර්ශනිකයා - හූ ෂිහ්
   දිලිනි ගමගේ 11

3. **Communication – Towards Alternative**
   Dr. S. Raguram 17

4. ජනමාධ්‍ය හිමිකාරීත්ව ආකෘතිය
   විජයානන්ද රූපසිංහ 21

5. ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික - සංකල්පීය ගැටලු පිළිබඳ විමර්ශනයක්
   ආචාර්ය ටියුඩර් වීරසිංහ 29

6. ජනමාධ්‍ය විපරිණාමය ප්‍රභූ - ජනකාන්ත-විශිෂ්ටකරණ චක්‍රය
   ආචාර්ය සුගත් මහින්ද සෙනරත් 41

ජනශ්‍රැති අධ්‍යයනය

7. ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ග්‍රාමීය ව්‍යුහය කේන්ද්‍ර කරගත් සම්බන්ධතා හා කලමනාකරණ ලක්ෂණ
අමාලි උත්පලා නන්දසිරි 49

8. මානව භාෂාවේ විශේෂතා
දර්ශන මාපා පතිරණගේ 61

9. නාට්‍යමය පෙළපාළි හා සන්නිවේදනය
මංගල කීර්ති ද පැස්කුවල් 73

10. සෙනරත් පරණවිතාන සූරීන්ගේ අභිලේඛන පර්යේෂණ පිළිබඳ සමාලෝචනයක්
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග 85

11. ශ්‍රී ලංකාව් මිනිරන් කර්මාන්තයේ ඉතිහාසය
අමිල නුවන් මධුසංබ 96

12. ශ්‍රී ජීවනාථයන් විසින් විරචිත "භාවකුතුහලය " කෘතියෙහි එන ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණවලින් නිරූපිත ශුභ - අශුභ සන්නිවේදනය පිළිබඳ විමර්ශනයක්
නන්දන මිල්ලගල 110

13. භාෂා භාවිතයේ පවතින ජීව විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ බෞද්ධ දාර්ශනික පර්යාවලෝකනය
සමන් රාජපක්ෂ 129

14. **Body Paintings, Tribal Tattooing and Lip pluggings with Fashion Culture, Semiotics & Communication**
Dineesha Liyanage 137

ජනමාධ්‍ය හා සමාජය

15. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ: ඡන්දදායකයාගේ සහභාගිත්වය සහ ජනමාධ්‍ය හැසිරීම
මධුරානි අත්තනායක 149

16. රසඥතා වර්ධනය, සාහිත්‍යයේ බලපෑම සහ ලාංකේය ගුවන්විදුලි නාට්‍ය සන්නිවේදනයේ පෝෂණය
මහාචාර්ය සේන නානායක්කාර 164

17. ලාංකික අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය හා පුවත්පත
මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස 174

18. **නිදහසින් පසු (1948 සිට 2015 දක්වා) ලාංකේය දේශපාලන ව්‍යාපාරය තුළ භික්ෂූවගේ ගමන් මග**
අයේශ් විජයසිංහ 183

19. **සෑම ටෙලිනාට්‍යක්ම සෝප් ඔපෙරාවක් නොවේ**
අතුල සමරකෝන් 199

20. **ජනමාධ්‍ය පර්යේෂණ හා අන්තර්ගත විශ්ලේෂණය**
සේනානි හරිස්චන්ද්‍ර 221

21. **ශ්‍රී ලාංකීය ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා බිහිවීම**
ධම්මික බණ්ඩාර හේරත් 225

සන්නිවේදනය හා විශ්‍රාන්තිය

22. **සෞඛ්‍ය සන්නිවේදනය, සංස්කෘතිය සහ චර්යා වෙනස්කම්**
මහාචාර්ය මාපා තිලකරත්න 237

23. **ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාවේ ගමන්මග සහ අනාගත අභියෝග**
ආචාර්ය අජිත් දිසානායක 242

24. **ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ සන්නිවේදන අර්ථ සමුදායක්**
සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර 255

25. **ආයතනික සන්නිවේදනය**
අසිත ප්‍රභාත් මල්ලවආරච්චි 261

26. **Buddhist Education**
Senior Prof. Ven. Kandegoda Wimaladhamma 273

27. **Towards a new information structure (With special reference to BRICS conference)**
Prof. Ajantha Hapuarachchi 278

28. **සන්නිවේදකයන් සඳහා සන්නිවේදන කෞශල්‍යය**
ආචාර්ය වාසනා මෛත්‍රී හේරත් 286

ජනමාධ්‍ය හා තාක්ෂණය

29. නව මාධ්‍ය බිහිවීම සහ සමාජගත වීම
දිනිති ජයසේකර 303

30. රූපවාහිනී මාධ්‍යයේ තාක්ෂණික සහ සංස්කෘතික ගෝලීය පරිණාමය
මනෝජ් පුෂ්පකුමාර ජිනදාස 311

සිනමාව, රසවින්දනය හා තාක්ෂණය

31. සිංහල සිනමාවට විෂය වූ තාරුණ්‍යයේ ජීවන අරගලය
ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර 339

32. ජනප්‍රිය සිනමාව : ජනශ්‍රැතියේ නව මුහුණුවර
චන්දිමා නිශ්ශංක 349

33. ශාබ්දික සිනමාවේ මූලධර්මයක් ලෙස අසමකාලිකතාවය
තරුපති මුණසිංහ 358

34. ලෝක සිනමාවේ වාරණ සංකල්පය
සමන්තිකා ප්‍රියදර්ශනී 363

35. අවකාශ රංගය හා සිනමාලංකාරය
අරුණ ලොකුලියන 379

කර්තෘ නාම සිංහල ආකාරාදියට අනුවය.

ලේඛක වගතුග

1. **සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර**
   BA (Cylon), MPhil, PhD (London)
   අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2. **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කන්දෙගොඩ විමලධම්ම හිමි**
   BA, MA (Kelaniya), PhD (Ioannina, Greece)
   ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

3. **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග**
   BA (Kelaniya), MA (Poona), MSc (Kelaniya)
   ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

4. **මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස**
   BA, MA (Kelaniya), PhD (Moscow)
   මහාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

5. **මහාචාර්ය ආරියරත්න ඇතුගල**
   BA, MA, PhD (Kelaniya)
   මහාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

6. **මහාචාර්ය මාපා තිලකරත්න**
   BA, MA (Kelaniya), PhD (Pune, India)
   අංශ ප්‍රධාන, මහාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

7. **Prof. Ajantha Hapuarachchi**
   BA, MA, PhD (Kelaniya), Post Doctoral (Hydrabad, India)
   මහාචාර්ය, ජනමාධ්‍ය ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය.

8. **මහාචාර්ය සේන නානායක්කාර**
   BA, MA, PhD (Kelaniya)
   මහාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

9. **ආචාර්ය ටියුඩර් වීරසිංහ**
   MA, PhD (Moscow)
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනමාධ්‍ය අධ්‍යයන අංශය, හොරණ ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.

10. **ආචාර්ය අජිත් දිසානායක**

BA (Kelaniya); MA (J'pura); PhD ((Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

11. **සේනානි හරිස්චන්ද්‍ර**

BA (Kelaniya); MCmS (Pune)
අංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

12. **ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර**

BSc, MPhil, PhD (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ලලිත කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

13. **අරුණ ලොකුලියන**

BA, MPhil (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

14. **අතුල සමරකෝන්**

BA (Kelaniya); MCmS (Pune)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ලලිතකලා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

15. **විජයානන්ද රූපසිංහ**

BA, MPhil (Kelaniya); Dip in Development Journalism (IIMC, India)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

16. **චන්දිමා නිශ්ශංක**

BA, MPhil (Kelaniya); Cert.in Russian Lang. (Pushkin Ins., Russia), Dip in Development Journalism (IIMC, India)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

17. **ආචාර්ය සුගත් මහින්ද සෙනරත්**

BA, MSSc (Kelaniya), PhD (Uhan, China)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනමාධ්‍ය අධ්‍යයන අංශය, හොරණ ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.

18. **ආචාර්ය එස්. රගුරාම්**

BSc, MA, PhD (India)
ඒකක ප්‍රධානී, ජනමාධ්‍ය ඒකකය, කලා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය.

19. **ආචාර්ය වාසනා මෛත්‍රී හේරත්**

BA, MPhil, PhD (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කළමනාකරණ අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

20. **මනෝජ් පුෂ්පකුමාර ජිනදාස**

BA, MSSc (Kelaniya), Pg.dip in Translation, Pg.Dip in Psychology(Perad.), Cert. in Research Methods (Col.), Sangeet Visharad,Sangeet Nipun (Lucknow)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

21. **සමන් රාජපක්ෂ**

BA, MPhil (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

22. **සමන්තිකා ප්‍රියදර්ශනී**

BA, MSSc (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

23. **ධම්මික බණ්ඩාර හේරත්**

BA, MSSc (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

24. **දර්ශන මාපා පතිරණගේ**

BA, MSSc (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

25. **දිනිති ජයසේකර**

BA, MSSc (Kelaniya)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

26. **තරුපති මුණසිංහ**

BA (Kelaniya), Dip in Communication (J'Pura), Master of Sound Design (University of Melbourne), MA in Drama & Theatre (J'Pura), Ad dip in music (Gipps TAFE, Melbourne),
සහකාර කථිකාචාර්ය, නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය.

27. **දිලිනි ගමගේ**

BA (Kelaniya)
සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

28. **මධුරානි අත්තනායක**

BA (Kelaniya)

සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

29. **අයේෂ් විජයසිංහ**

BA (Kelaniya)

සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

30. **අමිල නුවන් මධුසංඛ**

BA (Kelaniya)

සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

31. **නන්දන මිල්ලගල**

BA, MPhil, (Kelaniya)

සහකාර කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

32. **මංගල කීර්ති ද පැස්කුවල්**

BA, MSSc (Kelaniya)

33. **අසිත ප්‍රභාත් මල්ලවආරච්චි**

BA (Kelaniya)

34. **Dineesha Liyanage**

BA (Kelaniya)

35. **අමාලි උත්පලා නන්දසිරි**

BA, MPhil (Kelaniya)



DEAN - FACULTY OF GRADUATE STUDIES YEAR 2016
UNIVERSITY OF KELANIYA, SRI LANKA

උපකුලපතිතුමාගේ පණිවුඩය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ මහතා දශක හතරකට ආසන්න දීර්ඝ හා විශිෂ්ට සේවා කාලයක් අවසන විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිතය. එම අවස්ථාව නිමිති කොටගෙන එළිදැක්වෙන සඳසර උපහාර ශාස්ත්‍රීය සංග්‍රහයට පණිවුඩයක් එක් කරනුයේ සතුටිනි. මහාචාර්ය රාජපක්ෂයන් සහ මා විද්‍යාර්ථීන් ලෙස කැලණිය විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වුයේ එකම වසරේදීය. ඉන් අනතුරුව විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය තුළ එතුමන් සමඟ එක්ව උරෙනුර ගැටී කටයුතු කිරීමට හැකිවිම මේ මොහොතේ මා සිහිපත් කරන්නේ ප්‍රීතියෙනි.

විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජපක්ෂයන් ඉටු කරන ලද ශාස්ත්‍රීය හා ජාතික මෙහෙවර අප විශ්වවිද්‍යාලයට මහත් අභිමානයක් වූ බව පැවසිය යුතුය.

සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු මෙන්ම කැපවීමෙන් යුතුව ජනමාධ්‍යවේදී පරම්පරාවට මගපෙන්වීම් සිදුකල ආචාර්යවරයෙකුද වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජපක්ෂයන් සේවයෙන් විශ්‍රාම ගැනීම ජනසන්නිවේදන අධ්‍යයන අංශයට පමණක් නොව පොදුවේ විශ්වවිද්‍යාල පද්ධතියටම මහත් පාඩුවක් වනු ඇත.

එතුමන් ඉටුකළ අධ්‍යයන, ශාස්ත්‍රීය හා පර්යේෂණ සේවාව තවත් බොහෝ කලක් විශ්වවිද්‍යල මට්ටමේදී හා ජාතික මට්ටමේදී ඉටුකරනු ඇතැයි උදක්ම විශ්වාස කරමි. ඒ සඳහා එතුමන්ට නිදුක් නීරෝගීභාවය හා ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

පීඨාධිපතිතුමාගේ පණිවුඩය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ මහතාගේ සේවය අගයමින් එළිදක්වනු ලබන සඳසර උපහාර ශාස්ත්‍රීය සංග්‍රහයට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි. දශක හතරකට ආසන්න කාලයක් කැලණිය විශ්වවිද්‍යාලට පමණක් නොව සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියටම සුවිසල් මෙහෙවරක් ඉටුකල එතුමාට උපහාර දැක්වීමට ජනසන්නිවේදන අධ්‍යයන අංශය මෙන්ම එතුමාගේ සේවය අගයන බොහෝ පිරිසක් ඉදිරිපත් විය. මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවය කරන ශාස්ත්‍රීය සේවාව පමණක් ස්වකීය වෘත්තිය බවට පත්කොට ගත් එතුමාගේ නිල විශ්‍රාම ප්‍රාප්තිය සමඟ ඇතිවන රික්තකය පූරණය කිරීම අපහසු කරුණකි.

නිල වශයෙන් විශ්‍රාම ලැබුවද එතුමාගේ ශාස්ත්‍රීය සේවාව ජනසන්නිවේදන අධ්‍යයන අංශයටත්, කැලණිය විශ්වවිද්‍යාලයටත් අනාගතයේදී ද අත්‍යවශ්‍ය වන වන අතර, එම සේවය එතුමන් විසින් ලබා දෙනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමු. විශ්‍රාම දිවියට එළඹියද කිසිදා ශාස්ත්‍රීය කටයුතුවලින් විශ්‍රාම නොලැබිය යුතු එතුමාට නිදුක් නිරෝගී සුව හා චිර ජීවනය ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
පීඨාධිපති
සමාජීයවිද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

අංශාධිපතිතුමාගේ පණිවුඩය

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් ඉතිහාසයක් ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ දශක හතරකට ආසන්න කාලයක් සේවය කළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන්ගේ ප්‍රශස්ත හා දීර්ඝකාලීන සේවය අගයමින් අප අධ්‍යයන අංශය මගින් සම්පාදනය කරනු ලබන "සඳසර" උපහාර ශාස්ත්‍රීය ග්‍රන්ථයට එතුමාගෙන් අධ්‍යාපනය ලැබූ විද්‍යාර්ථීයෙකු ලෙස සහ අංශ ප්‍රධාන වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක් කොට සළකමි.

දෙස් විදෙස් සරසවි රැසක ස්පර්ශය ලැබූ සහ ලබන ආචාර්යවරුන්ගේ හා මහාචාර්යවරුන්ගේ තෝතැන්නක් වූ කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය වර්තමාන සංවර්ධනය කරා ගොඩනැගීමේදී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජපක්ෂයන් විසින් ඉටු කරන ලද ශාස්ත්‍රීය සේවය නිහතමානීව අගය කළ යුත්තකි. එමෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ හා පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපති තනතුරු හොබවමින් ලද ආභාසයද එතුමාගේ ශාස්ත්‍ර වෘද්ධභාවයට හා ශාස්ත්‍රීය සේවාවට මහඟු පිටුබලයක් විය. සමස්ත විශ්වවිද්‍යාලයට කීර්තියක් ලබා දුන් එතුමන් ලෝකයේ විවිධ විශ්වවිද්‍යාලවලින් ලද ශාස්ත්‍රීය ශික්ෂණය ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුවක් ද විය.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය වෙනුවෙන් ලබාදුන් දායකත්වය ජනමාධ්‍ය ක්ෂෙත්‍රයේද පැසසුමට ලක්වී ඇත. විශේෂයෙන් වඩාත් කීර්තිමත් නිහතමානී හා සරල ගති පැවතුම්වලින් යුක්ත ආචාර්යවරයෙකු වශයෙන් කටයුතු කල ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන්ට කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයෙන් ප්‍රණාමය පිරිනමන්නේ වඩාත් ගෞරවයෙනි. විශ්‍රාම දිවියට එළඹෙන එතුමන්ට තවදුරටත් ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පද්ධතියට සහ විශේෂයෙන් ජනසන්නිවේදන අධ්‍යයන අංශයට සේවය කිරීමට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර එතුමන්ට නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරන්නේ හද පිරි භක්තියෙනි.

මහාචාර්ය මාපා තිලකරත්න,
අංශාධිපති,
ජනසන්නිවේදන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ

සන්නිවේදනයෙන් තොර මානව සමාජයේ පැවැත්මක් සිතාගත නොහැකිය. මානව සමාජයට පමණක් නොව සත්ත්ව, ශාක යනාදී ජීවමය පැවැත්මක් සහිත සියලු වස්තු දැන හෝ නොදැන සන්නිවේදන ක්‍රියාවලියක නිරතව සිටිති. කිසිවකුටත් සන්නිවේදනයෙන් වැලකී සිටිය නොහැකි නමුත් සාර සන්නිවේදකයෙකු බවට පත්වීම අපහසු කාර්යයකි. 40 වසරක විශ්වවිද්‍යාල අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නිරතව සිට විශ්වවිද්‍යාලයෙන් නිල වශයෙන් විශ්‍රාම ලැබීමට සැරසෙන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන් යනු සැබැවින්ම සාර සන්නිවේදකයෙකි. මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන්ගේ දසක හතරක ශාස්ත්‍රීය සේවයට උපහාර පුදනු වස් “සඳසර” ශාස්ත්‍රීය සංග්‍රහය එතුමන් වෙත පුද කරන්නේ හද පිරි බැතියෙනි.

මෙරගල කුලතිලක චන්ද්‍රසිරි රාජපක්ෂයන් 1951 ජූලි දෙවන දා උපත ලැබුවේ සත්කෝරලයේ කුලියාපිටියේ උණලීය ග්‍රාමයේදීය. ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන කටයුතු අවසන් කර පාලි, සංස්කෘත සහ සිංහල විෂයයන්ගෙන් පණ්ඩිත උපාධිය සමත්ව, කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ එතුමා ලාංකීය විශ්වවිද්‍යාල වෙත හඳුන්වා දුන් නව සමාජීය විද්‍යා විෂයයක් වූ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ දෙවන ශිෂ්‍ය කණ්ඩායමේ විද්‍යාර්ථීයෙකු විය.

1974 වසරේදී වෘත්තියාභිමුඛ පාඨමාලාවක් ලෙස ජනසන්නිවේදන පාඨමාලාව හඳාරන්නේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ පුරෝගාමී ආචාර්යවරුන් වූ මහාචාර්ය විමල් දිසානායක සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන්ගේ ශාස්ත්‍රීය මෙහෙයවීම යටතේය. එම යුගයේ මෙරට කීර්තිමත් සන්නිවේදන මාධ්‍ය හා කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වූ ආචාර්ය එඩ්වින් ආරියදාස, ආචාර්ය ඩී.බී. නිහාල්සිංහ, ආචාර්ය පණ්ඩිත් අමරදේව, මහගමසේකර, පියසිරි ගුණරත්න, කේ. ජයතිලක වැනි අයගේ දේශන, සංවාද හා සාකච්ඡාවලින් සමන්විත ජනසන්නිවේදන පාඨමාලාවේ අප කථානායකයා ක්‍රියාශීලි විද්‍යාර්ථීයකු විය. හිටපු ජනසන්නිවේදන ඇමතිවරයකු වූ ඉමිතියාස් බාකිර් මාකර් සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයකු වූ සරත් කෝන්ගහගේ වැනි සමකාලීනයන් සමඟ මාධ්‍ය අධ්‍යයනයේ යෙදුණු චන්ද්‍රසිරි රාජපක්ෂ විද්‍යාර්ථීයා 1976 දී දෙවන පෙළ ඉහළ ගෞරව උපාධියක් දිනාගනිමින් 1977 දී ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවයට එක්විය.

1980 වසරේදී අධ්‍යයන අංශයේ ස්ථිර කථිකාචාර්යවරයකු ලෙස පත් වූ චන්ද්‍රසිරි රාජපක්ෂයන්

එවකට ඉතා අඩු භෞතික හා මානව සම්පත් යටතේ පැවති ජනසන්නිවේදන අධ්‍යයන අංශය ගොඩනැංවීමට උර දී ක්‍රියාකළේය.

එතුමන් 1985 දී පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කර, ශාස්ත්‍රපති උපාධිය කැලණිය විශ්වවිද්‍යාලයෙන් හිමිකරගනු ලැබුයේ 'සාම්ප්‍රදායික කුඩා කණ්ඩායම් සඳහා වන ජනමාධ්‍ය බලපෑම' නම් පුරෝගාමී පර්යේෂණාත්මක නිබන්ධනයක් ඉදිරිපත් කරමිනි. ඉනික්බිති තරුණ රාජපක්ෂ කථිකාචාර්යවරයා එවකට පැවති සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ ශිෂ්‍යත්වයක් දිනාගනිමින් කීර්තිමත් මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වෙයි. මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නිකොලොවිච් සසොර්ස්කි වැනි ප්‍රමුඛ පෙළේ සන්නිවේදන හා භාෂා අධ්‍යයන මහාචාර්යවරු යටතේ අධ්‍යයන කටයුතුවල නිරත වූ එතුමා 1989 දී ආචාර්ය උපාධිය දිනාගන්නේ 70 දසකයේ ශ්‍රී ලංකාවේ සංස්කෘතික ගැටලු හා ජනමාධ්‍ය පිළිබඳ දීර්ඝ අධ්‍යයනයකින් පසුවයි. එම කාලවකවානුවේ මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ පැවති ජනසන්නිවේදනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ රැසකට ක්‍රියාකාරී ලෙස එතුමන් සහභාගි වෙයි. නැගෙනහිර යුරෝපය තුළත්, යුරෝපයේ සෙසු රටවලත් සංචාරය කරමින් එම රටවල ජනමාධ්‍ය භාවිතය හා සමාජය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගත් රාජපක්ෂයන් ඒ ඒ රටවල ජනශ්‍රැති රැස්කරමින් අන්තර් සංස්කෘතික අධ්‍යයන පර්යේෂණයන්හි නිරත විය.

යළි වර්ෂ 1990 දී සියරට පැමිණ ආචාර්ය රාජපක්ෂයෝ 1994 දී ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා ලෙස පත්ව විෂය සංවර්ධනය සඳහා සුවිශාල දායකත්වයක් සපයයි. වර්ෂ 1997 දී සමාජීය විද්‍යාපීඨය යටතේ ජනසන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව ආරම්භ කිරීමේදී එහි විෂය නිර්දේශය සකස් කරමින් ආරම්භක සම්බන්ධීකාරකවරයා බවට පත්වන්නේ ආචාර්ය රාජපක්ෂයන්මය. එතැන් සිට මෙරට ජනසන්නිවේදන විෂය සඳහා පැවති එකම ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවත්, පසුව දෑ අවුරුදු සමාජීය විද්‍යාපති පාඨමාලාවත් පවත්වාගෙන යාම සඳහා එතුමන් කළ කැපකිරීම් අතිවිශාලය. එතුමාගේ මගපෙන්වීම යටතේ ජනසන්නිවේදන ප්‍රථම උපාධියේ සිට ජනසන්නිවේදන ආචාර්ය උපාධිය දක්වා විෂය හැදෑරීමේ අවස්ථාව අධ්‍යයන අංශය යටතේ මේ වන විට පවතින බව සඳහන් කරනුයේ එතුමන්ට විශේෂ ගෞරවයක් වශයෙනි.

මෙරට ජනමාධ්‍ය සහ ජනසන්නිවේදන සාහිත්‍ය පෝෂණය කරනු වස් මුද්‍රිත ප්‍රකාශන ගණනාවක් ආරම්භ කිරීමට ද එතුමා මූලික වෙයි. 1993 සිට ප්‍රකාශයට පත් කරනු ලබන 'මාධ්‍ය විමර්ශී' සන්නිවේදන ලිපි එකතුව ඊට උදාහරණයකි. කුඩා කණ්ඩායම් සන්නිවේදනය, ජනසන්නිවේදන මූලධර්ම, සන්නිවේදන සමීක්ෂා සහ ජනකවියේ නිර්මාණාත්මක සන්නිවේදනය යන විෂය මූලික යන කෘති ප්‍රකාශයට පත් කරමින් සන්නිවේදන විද්‍යාර්ථීන්ට මෙන්ම පොදු පාඨකයාට ද අවශ්‍ය මාධ්‍ය ග්‍රන්ථ සම්පාදනයට එතුමන් දායක වෙයි.

අධ්‍යයන කටයුතුවලට අමතරව විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු සඳහා ද ක්‍රියාකාරී දායකත්වයක් සැපයූ මහාචාර්ය රාජපක්ෂයන් 2010 වසරේදී සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ලෙස බහුතර කැමැත්තෙන් තේරී පත් විය. 2016 වසරේදී පශ්චාත් උපාධි පීඨයේ වැඩබලන පීඨාධිපතිවරයා ලෙස එතුමන් සේවය කළේය. විශ්වවිද්‍යාලීය පර්යේෂණ කටයුතු සඳහා වන ඉහළම සභාව වන පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද රාජපක්ෂ මහැදුරුතුමන් 2015 වසරේ සිට මේ දක්වාම කටයුතු කරමින් සිටියි. විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය ඉහළ නැංවීමටත්, විශ්වවිද්‍යාලය හා ප්‍රජාව අතර මහජන සම්බන්ධතා වර්ධනය කිරීමත් අරමුණු කරමින් පිහිටුවන ලද විශ්වවිද්‍යාලයී ය මාධ්‍ය ඒකකයේ අධ්‍යක්ෂවරයා ලෙස ද එතුමන් 2015 වසරේ සිට මේ දක්වා කටයුතු කරයි.

ශිෂ්‍ය සුබසාධන කටයුතුවලට සිය ක්‍රියාකාරී දායකත්වය දැක්වූ මහාචාර්ය රාජපක්ෂයන් ප්‍රධාන නේවාසිකාගාර පාලකවරයකු, ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයකු, කලා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ද කටයුතු කර තිබේ.

දේශීය සහ විදේශීය වශයෙන් ජනමාධ්‍ය ප්‍රතිපත්ති, විෂය නිර්දේශ, ආචාරධර්ම මෙන්ම පාසල් විෂය මාලා සංවර්ධනයට ද මහාචාර්ය රාජපක්ෂයන්ගේ දායකත්වය සුවිශාලය.

එසේම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන් රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් ගණනාවකට සිය සම්පත් දායකත්වය සපයමින් ජනසන්නිවේදන විෂය පිළිබඳවත් මාධ්‍ය හා සමාජය පිළිබඳවත් පුළුල් කතිකාවතක් නිර්මාණය කිරීමට කටයුතු කර තිබේ. මෙරට කීර්තිමත් රූපවාහිනී හා සිනමා සම්මාන උළෙල රසක ජූරි සභිකයකු ලෙස ද කටයුතු කරමින් එතුමන් එකී මාධ්‍යයන්හි වර්ධනයට දායකත්වයක් සපයා තිබේ.

එමෙන්ම එතුමන් 1990 වසරේ සිට 2015 වසර දක්වා මෙරට පුවත්පත්, සඟරා සඳහා ලිපි දෙසීයකට වැඩි ප්‍රමාණයක් රචනා කරමින් විෂය කරුණු පිළිබඳව මෙන්ම සමාජ ගැටලු පිළිබඳව ද සිය අදහස් පොදුජනතාව වෙත ඉදිරිපත් කර තිබේ. විෂය පෝෂණය සඳහා විවිධ විශ්වවිද්‍යාලවලට සිය දායකත්වය නොමසුරුව ලබාදුන් මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයන් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය ආරම්භ කිරීමේදී එහි විෂය නිර්දේශයන් සැකසීමේ කමිටුවේ ද සාමාජිකයකු විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය, සෞන්දර්ය විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවල බාහිර කථිකාචාර්යවරයකු, විභාග පරීක්ෂකවරයකු ලෙස ද එතුමන්ගේ සේවය සුවිශාලය. ඉන්දියාවේ පූනේ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි නිබන්ධ සමීක්ෂකයකු වශයෙන් ද එතුමන්ගේ සේවය නිරන්තරව දායක වෙයි. 1997 වසරේ සිට මෙරට ශාස්ත්‍රපති, සමාජීය විද්‍යාපති, දර්ශනපති සහ දර්ශන විශාරද උපාධි නිබන්ධ සියයකට වැඩි සංඛ්‍යාවක උපදේශකවරයකු වශයෙන් ද අප මහාචාර්යතුමා කටයුතු කර තිබේ. ගත වූ 40 වසරක කාලසීමාව තුළ ජනසන්නිවේදන විෂය හදාරන ලද විද්‍යාර්ථීන් අතර සන්නිවේදන න්‍යාය හා භාවිතය පිළිබඳ මූලික සංකල්ප ප්‍රචලිත කිරීමට ද මහාචාර්ය රාජපක්ෂයන් ඉමහත් දායකත්වයක් සපයා තිබේ.

2007 වසරේ සිට මෙරට පාසල් විෂය නිර්දේශයන්ට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන යන විෂය එක් කිරීමටත්, එය සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග සඳහා ඉදිරිපත් කිරීමටත් මෙතුමන් කටයුතු කර තිබේ.

මෙසේ ඉතා සංක්ෂිප්තව සටහන් කෙරෙන්නේ ජ්‍යෙෂ්ඨ මාහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයෝ විශ්වවිද්‍යාල ආචාර්යවරයකු, පර්යේෂකයකු, සමාජ ක්‍රියාකාරිකයකු, පරිපාලකයකු වශයෙන් සිදුකරන ලද මෙහෙයයන්ගේ අංශුමාත්‍රයකි. අතිශය ප්‍රියමනාප, සුහදශීලී මෙන්ම උපහාසය මුසු බස්වහරක් මුව දරමින් සාර සන්නිවේදකයකු ලෙස කටයුතු කරන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජපක්ෂයන්ගේ නිල විශ්‍රාම ගැනීම අප අධ්‍යයන අංශයටත්, පොදුවේ මෙරට ජනසන්නිවේදන විෂය ක්ෂේත්‍රයටත් බරපතල හිඩසක් නිර්මාණය කරන බව නොඅනුමානය. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ ඇදුරුතුමනි, ඔබ තුමන් වෙත සුවබර විශ්‍රාම දිවියක් වෙනුවෙන් අධ්‍යයන අංශයේ ඔබතුමන්ගේ ශිෂ්‍ය පරම්පරාව වන අපි ඉතසිතින් සුබ පතමු. චිර ජීවනය වේවා මහැදුරුතුමනි, ඔබට දීර්ඝායුෂ වේවා!



Mezcla la Magia

01

සන්නිවේදන න්‍යාය දර්ශනය

ආරියරත්න ඇතුගල

ප්‍රවේශය

න්‍යාය යනු වියුක්තිකරණයකි, වියුක්තිකරණය යනු සිද්ධියකට එහා ගිය අදහසක් පිළිබඳ ගුණාත්මක ගනුදෙනුවකි. එසේම න්‍යාය යනු ගොඩනැගීමකි හේතු ඵල සහිත මූලික ස්වභාවයක් විග්‍රහ කිරීමට සීමා හඳුනා ගැනීමට න්‍යාය ගොඩනගා ගනී. ප්‍රාථමිකව පැවති උපකල්පන, ගම්‍යමාන දේ සුසමාදර්ශ හා උපන්‍යාස යනාදිය පසුකාලීනව සංකල්ප හා න්‍යාය බවට වර්ධනය කොට ගෙන ඇත. ප්‍රධාන වශයෙන් සන්නිවේදන න්‍යාය වර්ග දෙකක් හඳුනා ගත හැකි ය.

01. පොදු සන්නිවේදන න්‍යාය

02. විශේෂිත සන්නිවේදන න්‍යාය

සාමාන්‍ය සන්නිවේදන ක්‍රියාව පැහැදිලි කරන විශ්වයට ම අදාළ ව යොදාගත හැකි න්‍යාය පොදු ගණයට අයත් වේ. නිදසුනක් ලෙස කේන්ද්‍රීය ඉලක්ක න්‍යාය, පිංපොං න්‍යාය දැක්විය හැකි ය. විෂය ක්ෂේත්‍ර හා අවස්ථා බද්ධව ගොඩනැගෙන ව්‍යවහාර කළ හැකි න්‍යාය විශේෂිත න්‍යාය ගණයට ගැනේ. රෝපණ න්‍යාය ඒ සඳහා නිදසුන් වේ. මෙම දෙවර්ගයම සන්නිවේදන අධ්‍යයනයේදී වැදගත් වේ. සන්නිවේදනයේ විවිධ ක්‍රියාකාරකම් පෙන්නුම් කිරීමට ඒවා සමත් වේ. කිසියම් න්‍යායක

01. සම්මුතික නිර්වචන

02. විස්තරාත්මක නිර්වචන

03. නිර්දේශක නිර්වචන ඇතුළත් වේ.

සංවිධානාත්මක සංකල්ප, විවරණ හා මානව අත්දැකීම්හි ආකාර න්‍යායකට අයත් වේ. අත්දැකීම් තුනීකර වර්ගීකරණය කරයි. නිරීක්ෂණයට පුළුල් අවකාශයක් ලබා දේ. පරිසරයෙන් යථාර්ථවත් කොටසක් ග්‍රහණය

කර ගනී. එබැවින් න්‍යායක් යථාර්ථය ප්‍රශ්න කිරීමකි. යථාර්ථය ප්‍රශ්න කළ හැක්කේ එකම මාර්ගයකින්ද නොවේ. එක් අතකින් ක්‍රියාව කෙරෙහි ආත්මීය බැඳීමක් න්‍යාය මගින් පෙන්නුම් කෙරේ. අප ක්‍රියා කළ යුත්තේ කෙසේද? අපගේ පරිචය උදෙසා අප සිතිය යුත්තේ කෙසේද යන්නට මග පෙන්වීමක් න්‍යාය මගින් සිදු කරයි.

විද්‍යාත්මක න්‍යායක් දාර්ශනික සංකල්පනාවකි. එයට විවිධ විශ්වාස පදනම් වේ පියවරින් පියවර ගොඩනැගීමකි එය ගොඩනැගුම් කට්ටලයක් බඳු ය එසේම න්‍යායක් මගින් නිදහස් පැහැදිලි කිරීම් හා ගතික සම්බන්ධතා ගොඩ නගයි. බොහෝ දාර්ශනිකයින් න්‍යාය සඳහා වන ප්‍රධාන මග තුනක් දක්වයි.

01. ඥාන විභාගය ; ඥානය ප්‍රශ්න කිරීම වේ.

02. සත්භාව විභාගය ; අත්දැකීම් ප්‍රශ්න කිරීම වේ.

03. සාරධර්ම විභාගය ; අගයන් ප්‍රශ්න කිරීම වේ.

ඥාන විභාගය

මෙමගින් මිනිසුන් තමන්ට අයිති ඥානය දැන ගන්නේ කෙසේ ද යන්න කෙරෙහි වඩා අවධානයට යොමු කෙරේ. මේ යටතේ දැනුම උත්පාදනය වන ක්‍රියාවලිය හඳුනා ගැනීම ප්‍රධාන ආකාර හතරකි. (1) මානව තර්කන ක්‍රම යථාර්ථය නිර්ණය කිරීමට සමත් වන්නේ ද? යන හේතුඵල සම්බන්ධතා ගොඩනැගෙන ආකාරය විමසීම නම් හේතුඵලවාදය ද (2) අපගේ සංජානනය ඔස්සේ යමක් වඩාත් නිවැරදිව හා ගැඹුරින් හසුකර ගන්නා ආකාරය විමසීම නම් අනුභූතිවාදය ද (3) මිනිසුන් නිර්මාණය කරන ලෝකය කුමක් දැයි විමසීම නම් අභිනිර්මාණවාදය හා (4) සමාජ කණ්ඩායම් අන්තර් ක්‍රියා ඔස්සේ සංකේත නිර්මාණය කිරීම නම් සමාජ අභිසංස්කරණවාදය ද ඔස්සේ ඥාන විභාග න්‍යායික පදනම් ශක්තිමත් කෙරේ.

සත්භාව විභාගය

ස්වභාවික මානව හා සමාජ අන්තර් ක්‍රියාවලියේ සන්නිවේදන ස්වභාවය විමසීම මෙමගින් අරමුණු කෙරේ. මානව අත්දැකීම් ප්‍රාථමික පුද්ගල බද්ධ වන්නේද එසේ නොමැති නම් සමාජමය ලෙස බද්ධ වන්නේ ද යන්න ප්‍රශ්න කරයි. සත්භාව විභාගය පුද්ගලයා හා සමාජය අතර මානව ක්‍රියාවලිය අවධානයට ගනී. අනෙක් අතින් සන්නිවේදන සන්ධර්භානුගත ස්වභාවයේ විස්ථාරණය කවරාකාර ද? විමසයි. මානව හැසිරීම් විශ්වීය මූලධර්ම මත පිහිටයිද? එසේ නොමැතිනම් ස්ථානමය සාධක මත පදනම් වේද? යන්න න්‍යායික සත්භාව විභාගයෙන් නිරීක්ෂණය කර ස්ථාවර කොට ගත හැකි වේ.

සාරධර්ම විභාගය

විවිධ වූ සමාජ මානව අගය අධ්‍යයනය කිරීම න්‍යාය ගොඩනැගීම පිණිස අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින් සාරධර්ම විභාගය මගින් අගයන් ප්‍රශ්න කරන ආකාරය හා එහි බලපෑම,විභාග කිරීමේ ක්‍රමවේද කෙතරම් ශක්තිමත් හා නිවැරදිද යන්න විමසයි. සාරධර්ම ඉතා ප්‍රවේශමෙන් නිරීක්ෂණය කර නිරවද්‍යතාවට ළඟාවිය යුතු වේ. මේ සඳහා විචාර විමතිය තිබිය යුතු ය. නිදහස් ක්‍රමවේද ඔස්සේ අගයන් ආශ්‍රිත විකෘතිතා නිදහසේ නිරීක්ෂණය කළ යුතු බව සාරධර්ම විභාගය මගින් පෙන්වා දේ.

කවර හෝ න්‍යායක (1) විවරණය (2) අවබෝධය (3) පුරෝකථනය හා (4) සමාජ වෙනස්වීම් යන සතරාකාර අරමණු පවතී. කිසියම් න්‍යායක වැදගත් සාධක ලෙස "පැරණි" තොරතුරු අනුකලනය, 'නව' තොරතුරු පුරෝකථනය හා තේරුම් ගැනීමට මගපෙන්වීම කැපී පෙනේ. එමෙන්ම කිසියම් න්‍යායක් මැන කිරා බැලීමට තර්කානුසාරී ස්ථිරත්වය, අනුභාවික ප්‍රමාණත්වය හා විචාරාත්මක බව යන ප්‍රවේශ පදනම් භාවිතා කළ හැකි ය. 20 වැනි සියවසේ දාර්ශනිකයෝ සන්නිවේදනය පිළිබඳ ශික්ෂණයෙන් යුතු නිර්වචන සපයන්නට පෙළඹුනහ. එමගින් මානව සන්නිවේදනය හෙළි පෙහෙළි කර ගැනීමට සමත් න්‍යාය ගොඩනැගුනි. මුල් කාලීනව න්‍යාය සඳහා ගොඩනැගුනේ චර්යාවාදී ආකෘති වන අතර, එහිදී බොහෝ විට මත, ආකල්ප, තොරතුරු, මූලාශ්‍ර හා අන්තර්ගතයන්හි වෙනස්කම් යන විචල්‍යන් නොසලකා හැරුණි. 1940 දශකය වන විට සන්නිවේදන පර්යේෂණ 'ප්‍රචාරණය' හා 'පෙළඹවීම' පදනම්ව වඩාත් සිදු විය. පර්යේෂකයින් පුද්ගල ආකල්පයන්හි වෙනස්වීම් එකිනෙකා හා බැඳුනු විචල්‍යන් සමුදායක් ඇසුරින් අධ්‍යනය කිරීමට පෙළඹුණි. 60 දශකය වන විට මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව ඇසුරු කොට ගනිමින් සන්නිවේදන විග්‍රහයන් ආරම්භ විය. මේ නිසා 70 දශකය වන විට සන්නිවේදන න්‍යාය බෙහෙවින් පුළුල් විය. අධ්‍යතනය වන විට සන්නිවේදන පර්යේෂණ නූතන මාධ්‍ය හා මානව සන්නිවේදනය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි. පුරාණ ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල වාග් විද්‍යාත්මක අලංකාර ශාස්ත්‍රය මානව විද්‍යාත්මක සන්නිවේදන අධ්‍යනයට ශක්තිමත් ආරම්භයක් ලබා දුනි. 19 වන සියවසේ සමාජ විද්‍යාත්මක අධ්‍යයන ඔස්සේ තව දුරටත් මෙම සන්නිවේදන අධ්‍යයන වල ඇති අවශ්‍යතාවය වටහා ගැනීමට පසුබිම සකස් වුණි. දෙවන ලෝක යුද්ධයෙන් පසු වඩාත් සන්නිවේදන අධ්‍යයන බල ගැනුවුණු බව පැහැදිලි කරුණකි. එයට ප්‍රධාන හේතුව යුද්ධය උදෙසා සියලු මාධ්‍ය භාවිත කිරීමෙන් මාධ්‍ය සතු බලය අවබෝධ වීමයි. රාජ්‍ය මට්ටමේ ද විශ්වවිද්‍යාල මට්ටමේද සන්නිවේදන දෙපාර්තමේන්තු ඇති විය. එක්සත් ජනපදය තුළ වඩාත් සන්නිවේදන න්‍යායික අධ්‍යයන ආරම්භ වන අතර මේ සඳහා මාක්ස්වාදී න්‍යාය ධර්ම ප්‍රබල බලපෑමක් නිර්මාණය කළේ ය.

බටහිර චින්තනයේ පදනම පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර සමග බැඳේ. බටහිර සත්භාව විචාර ආචාරධර්ම හා ඥාන වින්‍යාසය බැඳි සංවාද සන්නිවේදන න්‍යාය පෝෂණය වීමේ පළමු පදනමයි. සාරධර්මවාදය සමග සම්බන්ධව පැවති බටහිර දර්ශනවාදී දැනුම මත පැවැත්ම හා වටිනාකම් පිළිබඳ දෛනිකව සන්නිවේදන සංවාද ගොඩනැගුණි. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ප්‍රමුඛ සංවාදය ගොඩනැගී ය. අලංකාර ශාස්ත්‍රය ඉන් ප්‍රධාන වේ. නව සොයාගැනීම්, භාෂා සංවිධාන, භාෂණ ශෛලී, මතකය හා උච්චාරණය යනාදිය එම සංවාදවල ප්‍රධාන විෂය පථ ගොඩ නැගී ය. මානව සම්බන්ධතා, ගුණධර්ම යනාදිය සම්බන්ධයෙන් නැගෙනහිර චින්තන විධි බලවත් විය. ඉන්දියානු වාචික සම්ප්‍රදායන් හා හින්දු සම්ප්‍රදාය මේ සඳහා නිදසුන් වේ. ආගම් හා දර්ශවාද වල බොහෝ ධාරණා නූතන සන්නිවේදන අදහස්වලට අයත් වේ. රසවාදය පිළිබඳ ඉන්දියානු භාරත ලේඛන දියුණු වීමට අභිනව ගුප්ත වැන්නවුන් හේතු විය. 1600 -1700 අවධීන්හි යථාර්ථවාදය, ප්‍රබුද්ධත්වය දාර්ශනිකව ඉදිරියට පැමිණුනි. රෙනේ ඩෙකාට්ස්ගේ ප්‍රත්‍යක්ෂණ අදහස් සංවර්ධන අධ්‍යයනය ඒ අතර වැදගත් වේ. විද්‍යාවේ හා මානව විද්‍යාවේ අතු ඉති බටහිර චින්තනය තුළ විශාල බලපෑමක් කිරීමට සමත්වෙමින් මානව අත්දැකීම් හා තාර්කික පදනම් අධ්‍යයනයට යොමු විය. කෙසේ වුවද පුද්ගල හා සමාජ ජීවිතය ගැන සමාජය තුළ සාමය ස්ථාපිත කිරීමේ මාධ්‍යයක් ලෙස බටහිර සංකල්ප බොහෝ සෙයින් බලපෑම් එල්ල කළේ ය.

ආනුභාවික අත්දැකීම් හා මානව දැනුම් බටහිර යථාර්ථවාදය සමග ඒකාබද්ධව ව්‍යාප්තව ඇති බව ඉම්මානුවෙල් කන්ට් පවසයි. 1800 මිනිසා හා සතුන් ගැන භාව ප්‍රකාශ අධ්‍යයන විශේෂ තැනක් ගනී. විශේෂයෙන් චාල්ස් ඩාවින්ගේ The Expression of the Emotion in man and Animals කෘතිය විශාල සන්නිවේදන පතයක් විවර කරයි. ගැරික් මැලරි සංඥා භාෂාව හා වෙනත් භාෂා පිළිබඳව ද අධ්‍යයනය කරයි. මහජන ඇමතුම් විෂයෙහි ප්‍රකාශන කලාව භාෂා උච්චරණ ව්‍යාපාරය මගින් ඉදිරියට පැමිණුනි.

කාල් මාක්ස්ගේ චින්තනය මගින් සන්නිවේදන චින්තනය පිළිබඳ විවිධ විවේචනාත්මක පාසැල් ඇති විය. ප්‍රෙඩ්රික් නිට්ෂේ බලය හා ස්වයං රුචිය පිළිබඳ අධ්‍යයනය කරමින් සමාජ විද්‍යාත්මක චින්තනයට බලපෑම් ඇති කළේය.

මෙලෙස මෙම වකවානුවේදී සාමූහික ක්‍රියාකාරකම් හා මහජන සන්නිවේදනය උද්යෝගීමත් ශාස්ත්‍රීය මාතෘකාවක් බවට පත් විය' ගබ්රියෙල් ආඩ් හඳුන්වාදෙන නවෝත්පාදන විසිරණ සංකල්පය මගින් පැවති සාම්ප්‍රදායික චින්තනයට විතැන් වීමක් ලබා දුනි. ජෝන් ස්ටුවර්ට් මිල් මහජන සන්නිවේදනය හා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය පිළිබඳ වේදිකාවක් ගොඩනැගීය. චාල්ස් සැන්ඩර්ස් පියර් සංඥා, භාෂාව හා තාර්කික අධ්‍යයනය ආරම්භ කරයි. එමගින් සංඥා සහ සංඥා හැඟවුම්කාරක අතර සම්බන්ධතා අධ්‍යයනය ඉදිරියට පැමිණුනි. ශාන්ත එල්මෝ ලුවිස් වෙළඳපොළ ඇසුරින් ධූරාවලි රාමු පිළිබඳ යෝජනා ගෙන එයි.

1900 වෝල්ටර් ඩික් ස්කොට් වෙළඳ දැන්වීම් පිළිබඳ ඓතිහාසික පර්යේෂණ ආරම්භ කිරීම හා මනෝ විශ්ලේෂකයන් සමාජ හා හැසිරීම් න්‍යාය මගින් බුද්ධිමය රුචිය යන්න හඳුනා ගැනීම වැදගත් අවස්ථාවකි. එහිදී සිග්මන් ෆ්‍රොයිඩ් අනුභූතිවාදී දර්ශනයට ප්‍රහාර එල්ල කිරීම සංධිස්ථානයක් ලෙස සැළකේ. විල්හෙම් ටුන්ඩ්ට් විශ්ව භාෂාවක් ලෙස ඉංගිත සන්නිවේදනය ඉදිරියට පැමිණවීම ද තවත් වැදගත් සංධිස්ථානයකි. ඒ අනුව සංසිද්ධි විද්‍යාව සිතීමේ ශක්‍යතාවයක් බවට පත් විය. එඩ්මන්ඩ් හසෙල් "සංසිද්ධි විද්‍යා දර්ශනය" නම් කෘතිය ඉදිරිපත් කරමින් සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර විෂය දෙස අලුතින් කල්පනා කරන්නට බලපෑමක් එල්ල කළේය. එසේම සන්නිවේදනය ඇතුලු ක්ෂේත්‍ර පුරා පවත්නා මිත්‍යා සංකල්ප කාල් යුන්ග් අධ්‍යයනයට විවෘත කිරීම තවත් අතිශය වැදගත් ශාස්ත්‍රීය සංසිද්ධියකි. භාෂාවේ ව්‍යුහාත්මක සිද්ධාන්ත සංවර්ධනය ද සන්නිවේදනයේ වැඩීමට හේතු විය. එනම් ෆර්ඩිනන්ඩ් සාවුසර්ගේ සංඥා භාෂාව පිළිබඳ අධ්‍යයනය මගින් සන්නිවේදනයේ පරිවර්තනයකට නව පදනමක් වැටුණි. එසේම මැක්ස් වේබර්ගේ සමාජ ආර්ථික සංවිධාන න්‍යාය ආයතන හා සංවිධාන පිළිබඳ නව මතවාද ගොඩනැගීමට හේතු වූවෙකි. මෙලෙස ඇමෙරිකානු උපයෝගීතාවාදී ප්‍රායෝගික ක්‍රියාමාර්ග දෙසට දාර්ශනික දැක්ම විතැන් විය. ජෝන් ඩෙවිගේ "පරාවර්තනීය චින්තන ක්‍රියාවලිය" පිලිබඳ නිබන්ධනය මගින් පෙන්වා දෙන අප සිතන්නේ කෙසේද? යන්න විශේෂයෙන් කණ්ඩායම් සන්නිවේදනයට විශාල බලපෑමක් කිරීමට හේතු විය. මෙම වකවානුවේ විලියම් තෝමස් හා ෆ්ලොරියන් සැනිස්කි ආකල්ප යන්න මානසික හා ස්නායු උත්තේජන තත්වයක් ලෙස නිර්වචනය කිරීම ද විවාදාත්මක විය. 1930 මෙපිට ජනමාධ්‍යයේ නැගීම හා සම්බන්ධ පර්යේෂණ පුලුල් විය. මනෝ විද්‍යාව වැනි විෂයයන් ඔස්සේ සන්නිවේදන න්‍යායික සීමා සංවර්ධනය විය. වෝල්ටර් ලිප්මාන් සංකීර්ණ සමාජ ලෝකයේ මාධ්‍යයෙන් සරලව දැක් වූ මහජන පින්තූරය ගැඹුරින් අධ්‍යයනයට යොමු කරයි. මීට අමතරව මහජන හැසිරීම් සම්බන්ධතා රුචිකත්වය පිළිබඳ විද්‍යාත්මක විද්වත් අධ්‍යයන ආරම්භ විය. එමගින් සන්නිවේදනයේ

ආරෝපණ හා ඇගැයුම් පර්යේෂණ දිරි ගැන්වුණි. එසේම පරිවර්තනය හා සන්නිවේදනය යන මාතෘකාව ද ඉදිරියට පැමිණුනි. අයි.ඒ. රිචඩ්ස් සාහිත්‍ය විවේචන ක්‍රම සංඥාර්ථවේදය හා අර්ථ ගැන්වීම ගැන ලිවීය. එමගින් සන්නිවේදන න්‍යායන්ට නව පණක් ලැබුණ. සන්නිවේදනයට අදාළ මානව ප්‍රත්‍යක්ෂණ සංවර්ධනය ජේන් පියට්ගේ විකල්ප හැසිරීම්වාදය මගින් ද සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයට ඉමහත් බලපෑමක් සිදු කරයි.

ජර්මානු ෆ්‍රැන්ක්ෆර්ට් විශ්වවිද්‍යාල ගුරු කුලය විසිවන සියවසේ නව චින්තන දහරා නිකුත් කළේය. පශ්චාත් නව්‍යවාදය ලෙස අතිමහත් බලපෑමක් සන්නිවේදන ලෝකයට සිදු කළේය. මනෝ විද්‍යාඥ ගෝඩන් ඇල්පොට්ගේ පර්යේෂණ සන්නිවේදනයේ පෞරුෂත්වය හා ආකල්ප, සන්නිවේදන ගති ලක්ෂණ හා පෙලඹවීම අධ්‍යයනය සඳහා වේදිකාවක් සාදයි. 1940 පමණ වන විට සංඥා භාෂාව හා සන්නිවේදනය පිළිබඳ අධ්‍යයන නැවත පුලුල් විය. මානව සංකේත භාවිතය හා සම්බන්ධතා පිළිබඳ පුද්ගලාන්තර, සමූහ ආදී වශයෙන් පුලුල්ව අධ්‍යයන සිදු කෙරුණි. රුසියානු මනෝවිද්‍යාඥ ලෙව් විගෝට්ස්කි මානව සංවර්ධනය හා භාෂාත්මය චින්තන අධ්‍යයනය හා ඔහු ඇලෙක්සි ලියොන්ටිඩ් සමග ඉදිරිපත් කළ ක්‍රියාකාරකම් න්‍යාය අන්තර් සමාජ සන්නිවේදන ක්‍රියාකාරකම් විශ්ලේෂණය කරයි. මෙම අවධියේ රෝමන් ජැකෝබ්සන් භාෂාවේ කාර්යයන් දක්වමින් භාෂාව හා සන්නිවේදනයට නව ප්‍රායෝගික අධ්‍යයන ප්‍රවේගයක් විවර කරයි. මනස, ස්වයංභාවය හා සමාජය පිළිබඳ හර්බට් මීඩ් දක්වන ඉගැන්වීම් මත සන්නිවේදන සමාජ අන්තර් ක්‍රියාකාරී න්‍යාය වර්ධනය කිරීමට පදනම වැටුණි. 1930 දශකය වන විට මාක්ස්වාදී න්‍යාය නැවත නැවත ද ඉදිරියට පැමිණුනි. ඇන්තෝනියෝ ග්‍රැම්සි මාක්ස්වාදී චින්තනය හා ආධිපත්‍ය පිළිබඳ නැවත නැවත ද ලියයි. මෙලෙස සන්නිවේදනය, සමාජ ක්‍රියා හා හැසිරීම් අධ්‍යයන පුලුල් විය. කාට් ලෙවින් සමාජ මනෝ විද්‍යාත්මකව සන්නිවේදනය විශ්ලේෂණය කළේය. එසේම පෝල් ලාස්ෆෙල්ඩ්, බර්නාඩ් බෙරෙල්සන් , හැරල්ඩ් ලෑස්වෙල්ඩ් සහ චාල්ස් රයිට් සන්නිවේදනයේ ප්‍රමුඛ ස්ථානයක් ගනු ලැබීය. 1940න් පසු සන්නිවේදන තාක්ෂණික ඉංජිනේරු හා ගණිත ප්‍රවේශ ඉදිරියට පැමිණුනි. ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් සන්නිවේදන න්‍යායික ගණිතමය හා ඉංජිනේරුමය ආකෘති ගොඩනැගීය. ජූර්ගන් රුස්ච් සහ ග්‍රෙගොරි බිට්සන් පාර සන්නිවේදනය සංකල්පය සන්නිවේදනය කරමින් සංදේශයක ගැඹුරු සම්ප්‍රේෂණ අවස්ථා හඳුනා ගැනීමට සහාය විය. අනුක්‍රමයෙන් නිර්වාචික සන්නිවේදනයට 1940 දශකය තුළ විශේෂ උනන්දුවක් ඇති විය. රේ බර්ඩ්විස්ටල්ගේ සමාජ අන්තර් ක්‍රියා ගවේෂණ හා ජෝර්ජ් ට්‍රාගර් පාර භාෂා හා ගුණාත්මක හඬ අධ්‍යයනය තවත් පුරෝගාමී කාර්යයක් වන අතර එමගින් සන්නිවේදන අධ්‍යයන පුළුල් වීමට ඉමහත් බලපෑමක් එල්ල කරයි. කාල් හොලන්ගේ අභිප්‍රේරණ අධ්‍යයන, හැරල්ඩ් ඇඩම්ස්ගේ මාධ්‍ය බලපෑම් අධ්‍යයනය තවත් පුරෝගාමී කාර්යයක් වන අතර එමගින් සන්නිවේදන අධ්‍යයන පුලුල් වීමට ඉමහත් බලපෑමක් එල්ල කරයි. වඩාත් වැදගත් වන්නේ විල්බර් ශ්‍රාම්ගේ සන්නිවේදනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයයි. ඔහු සන්නිවේදන න්‍යායික සංකල්ප 04ක් ගෙනහැර දක්වයි. භාෂාව හා වාග් විද්‍යාත්මක අධ්‍යයන සන්නිවේදන ප්‍රවේශයෙන් වර්ධනය කරයි. කෙනත් බර්ක් සන්නිවේදනය තේරුම් කර ගැනීම නිත්‍ය සිද්ධාන්තවල සිට නාට්‍යවාදී සිද්ධාන්ත දක්වා ඉදිරියට ගෙන එයි. ලුඩ්විග් විට්ගන්ස්ටයින් දාර්ශනික ප්‍රවේශයන් චේතනාන්විත සන්නිවේදනය අධ්‍යනය කිරීමට පෙලඹවීමක් සපයයි. නෝබට් වීනර්ගේ සයිබර්නතිකය හා සමාජය පිළිබඳ අධ්‍යයනය නූතන මාධ්‍ය සමාජය හැදෑරීම පිණිස තවත් වැදගත් ප්‍රවේශයකි. මෙලෙස නව ප්‍රවේශ හඳුනා ගැනීමත් සමග සන්නිවේදන අධ්‍යයනය පුලුල් විය.

1955න් පසු කාල් රොජර්ස් කේන්ද්‍රීය සන්නිවේදන අධ්‍යයන ආරම්භ කරයි. අර්වින් ගොෆ්මන් මානව හැසිරීම් හා ස්වයං ඉදිරිපත්වීම සම්බන්ධ අන්තර් සන්නිවේදන පර්යේෂණ මගින් වඩාත් ප්‍රායෝගික සන්නිවේදන ලෝකය සමග එලදායී සම්බන්ධතා ඇති කරයි.

ජෝන් ප්‍රෙන්ච් හා බර්ට්‍රම් රවෙන් අන්තර් පුද්ගල බලය හා අන්තර් බලය පිළිබඳ සන්නිවේදන සාහිත්‍ය පදනම් කොට අධ්‍යයනයක යෙදේ. එඩ්වඩ්.ටී.හෝල් අවකාශ සන්නිවේදනය අධ්‍යයනය කිරීමට ඔහුගේ "නිශ්ශබ්දතාව" කෘතිය මගින් අවකාශ සපයයි.

1950 මැද භාගයේ දී මාධ්‍ය බලපෑම පිළිබඳ පර්යේෂණ අවධානය නැවත පුළුල් වේ. ජෝසප් ක්ලැපර්ගේ ජනසන්නිවේදන ප්‍රතිවිපාක කෘතිය සීමිත බලපෑම් න්‍යාය ගොඩනැගීමට හේතු විය. නොම් චොම්ස්කි භාෂාව පදනම්ව සිතීමේ නව ප්‍රවේග හඳුන්වාදීමෙන් පරිවර්තනීය ව්‍යාකරණයක් සන්නිවේදනයට ලැබුණි. ඔහු සන්නිවේදනය සම්බන්ධ ගොඩනගන "ප්‍රචාරණ ආකෘතිය" මගින් සංදේශයක පෙරණ පෙනුම පෙන්නුම් කරයි. එසේම "පරිමිත මාධ්‍ය අපරිමිත භාවිතය" හා විශ්වීය ව්‍යාකරණය යන සංකල්පයන් පැහැදිලි කරයි. ජූර්ගන් හබමාස්ගේ විචාරාත්මක න්‍යාය හා මහජන පරිමණ්ඩල සංකල්පය සන්නිවේදනයේ ශික්ෂණ ශාස්ත්‍රීය පදනම වඩාත් ශක්තිමත් කරයි. එසේම මාෂල් මැක්ලූහන්ගේ අධ්‍යයන (1951 සිට) සන්නිවේදන න්‍යාය හා ජීව විද්‍යාව අතර නව සම්බන්ධතා සෙවීය. ගුටෙන්බර්ග් තරු මණ්ඩලය කෘතිය මගින් මුද්‍රණාක්ෂරවේදී මිනිසා පිළිබඳව 1961 යාන්ත්‍රික මනාලිය කෘතිය මගින් කාර්මික මිනිසා පිළිබඳව ද 1964 මාධ්‍ය වටහා ගැනීම කෘතිය මගින් විශ්ව ගම්මාන සංකල්පය ද හඳුනා ගන්නට ලැබුණි. මිනිසාගේ දිගුවීම සංකල්පය ගොඩනගමින් මාධ්‍යම සංදේශය වේ යන සංකල්පය ඔස්සේ ඔහු නව මතවාදයක් ගෙන එයි. විශේෂයෙන් ඩිජිටල් මානවවාදය ඔස්සේ සන්නිවේදන මාධ්‍ය මධ්‍ය ස්නායු මණ්ඩලයේ දිගුවක් ලෙස පැහැදිලි කරයි. ජෝර්ජ් ගාබ්නර්ගේ රෝපණ න්‍යාය රූපවාහිනියේ ව්‍යාප්තිය පිළිබඳ නව අධ්‍යයන ප්‍රවේශයකි. 1968 ඇමරිකන් ජනාධිපතිවරණ අධ්‍යයනයෙන් මැක්ස්වෙල් මැක්කොම්බ්ස් හා ඩොනල්ඩ් ෂෝ මාධ්‍ය න්‍යාය සැකසුම් න්‍යාය හඳුන්වා දෙයි. පීටර් බර්ගර් හා තෝමස් ලක්මාන් සමාජ යථාර්ථ ගොඩනැගීම්, සන්නිවේදන හා සමාජ ව්‍යාපාර වර්ගීකරණ අධ්‍යයන ද සන්නිවේදන විෂයට බලවත් මැදිහත් වීමක් කරයි. කැනේඩියානු වාග් විද්‍යාඥ ෆර්නැන්ඩ් පොයටොස්ගේ භාෂාවේ විරාම ලක්ෂණ හා පාරවාග්විද්‍යාත්මක ස්වලක්ෂණ අධ්‍යයන ද සන්නිවේදන ක්ෂේත්‍රයට වැදගත් නව උත්තේජනයක් ලබා දුනි. 1970 දශකයේ බර්මින්හැම් පාසලේ නැගීම ද සන්නිවේදන විචාරාත්මක විෂය නව අවධියකට පැමිණවීමට හේතු විය. හර්බට් ෂිලර් එක්සත් ජනපද මාධ්‍ය හා සංස්කෘතික ආධිපත්‍ය තියුණු විවේචනයට ලක් කරමින් අධිරාජ්‍යවාදය දෙස සන්නිවේදන විශේෂඥයන්ගේ අවධානයට යොමු කරයි. ජෙරමි තන්ස්ටෝල් ඇමරිකානු මාධ්‍ය හා ගෝලීය බලපෑම විස්තර කරයි. මයිකල් හැලිඩේගේ විචාරාත්මක වාග් විද්‍යාව හඳුන්වා දෙමින් කථිකා විශ්ලේෂණය සම්බන්ධ තීරණාත්මක බලපෑමක් කරයි. ලුවී අල්තුෂර් දෘෂ්ටිවාදය හා රාජ්‍ය සංවිධාන පිළිබඳ අදහස් ද පව්ලො පෙරීගේ සන්නිවේදන අධ්‍යයන ද තීරණාත්මක ප්‍රවේශයක් හේතුවාදී ඉංග්‍රීසි දැනුමින් පීඩාවට පත් වූවන්ට ලබා දෙයි. එමෙන්ම එලිසබෙත් නොළුල් නියුමාන් නිහඬ දඟර න්‍යාය හඳුන්වා දෙමින් මහජන මතය වටහා ගැනීමට නැවුම් ප්‍රවේශයන් යෝජනා කරයි.

ආසියානු සන්නිවේදනය

ආසියානු සම්භාව්‍ය නිබන්ධ යුරෝ කේන්ද්‍රීය නොවන, සංස්කෘතික සංකල්ප ගවේෂණය හා බටහිර න්‍යාය මත විවේචනාත්මකව ආසියානු සන්නිවේදන න්‍යායන් ගොඩනැගෙමින් පවතී. 1999 දී රොබට් ක්‍රේග් මාධ්‍යාලංකාර, සංඥාර්ථ, සංසිද්ධි විද්‍යාත්මක, සයිබනතික, සමාජ මනෝවිද්‍යාත්මක, සමාජ සංස්කෘතික හා විචාරාත්මක යන සන්නිවේදන සම්ප්‍රදායන් හා සම්බන්ධව ආසියානු සන්නිවේදන න්‍යාය පරීක්ෂා කරයි. ආසියානු සන්නිවේදන න්‍යාය ඉන්දීය හා චීන දර්ශක ශ්‍රේෂ්ඨ දර්ශන කෙරෙහි මූලික අවධානය යොමු කරයි. ඒවා අනුභූතිවාදී දැක්ම සමග ගැටේ. බටහිර විද්‍යාව මානව කෘතියක් වේ. සසේම ආසියානු න්‍යාය අවධාරණය කරණුයේ පද්ධති, කණ්ඩායම්,ජාලයන් හා සාර්ව ප්‍රවේශයන්ය. ඒවා බටහිර න්‍යාය ඔස්සේ පහසුවෙන් පරීක්ෂා කළ නොහැකිය. ස්වයංභාවය, ස්වභාවධර්මය, අවකාශය, කාලය හා දැනුම යනාදිය බටහිරට වඩා ආසියාවේ වෙනස්කම් ඇති බැවින් ආසියානු සන්නිවේදන න්‍යායවල එකී ලක්ෂණ විද්‍යමාන වේ. ජොහාන් ගල්තුන්ග් මෙම ආසියානු හා බටහිර වෙනස්කම් මෙලෙස දක්වයි.

01. අපරදිග න්‍යාය පුද්ගලවාදය අවධාරණය කරයි. පෙරදිග පුද්ගලයා හා සමාජය අතර අන්‍යෝන්‍ය වගකීම අවධාරණය කරයි.

02. අපරදිග ස්වභාවධර්මයේ පාලනය අවධාරණය කරයි. පෙරදිග සමඟ ඇති එකමුතුකම අවධාරණය කරයි.

03. අපරදිග විද්‍යාඥයින් පරමානුවාදීව හා නිගාමිවාදීව දැනුම දකී. පෙරදිග විද්‍යාඥයින් සාරධර්මවාදී ඥාන වින්‍යාස සත්භාවවාදීව දැනුම දකී.

04. අපරදිග උත්තරීතර පැවැත්ම මින්සුන් සඳහා ද? යන්න ඉස්මතු වේ. පෙරදිග බෞද්ධ හා හින්දු ධර්ම මාර්ග කෙරෙහි විශ්වාස තබන අතර කොන්ෆියුසියානුවාදය හා මා ඕ වාදය යන දිව්‍යමය නොවන යථාර්ථය පිළි නොගනී.

සන්නිවේදන විද්‍යාඥ රොබට් ටී ඔලිවර් ආසියානු වාග් අලංකාර ශාස්ත්‍රය ගැඹුරු විශ්ලේෂණයට භාවිත කිරීම වැදගත් බව පවසයි. ආසියානු විශාරදයින් සංසන්දනීය සංඥාර්ථ න්‍යායන් සංවර්ධනය කරයි.එබැවින් චීන සංඥාර්ථ න්‍යායන්හි චීන චිත්‍රාක්ෂර ලේඛනවල සන්නිවේදන රටා පිළිබිඹු වේ. එසේ වුව ජපානය, කොරියාව,වියට්නාමය යන රටවල ඉතා වෙනස් භාෂා පද්ධති පවතී, සන්සිද්ධි විද්‍යාව පිළිබඳ අධ්‍යයන පුද්ගලයාගේ පර්යාලෝක ඔස්සේ සන්නිවේදන අධ්‍යයනය කිරීමයි, සංහතික අධ්‍යයන සම්බන්ධයෙන් ද ආසියානු සන්නිවේදන න්‍යාය සංවර්ධනය කර තිබේ. විශේෂයෙන් පද්ධති න්‍යාය ආසියානු දර්ශනය ද අවධාරණය කරයි. පශ්චාත් නූතන පද්ධති න්‍යායවාදීන් පරිසරයේ අන්‍යෝන්‍ය රැඳියාව වඩාත් අවධාරණය කරයි.

References

Berlo, D. (1960). The process of communication: An introduction to theory and practice. NewYork: Holt, Rinehart and Winston.

C. E. Shannon and W. Weaver. (1949) The Mathematical Theory of Communication, Urbana: University of Illinois Press,

C. E. Shannon. (1948),"The Mathematical Theory of Communication" Bell Telephone System Journal,27,379-423, http://cm.bellabs.com/cm/ms/what/shannonday/shannon1948.pdf

Claude F. Shannon and Warren Weaver (1964), The Mathematical Theory of Communication, (Urbana, Ill.: The University of Illinois Press,

Defleur, Melvin; Defleur, Margaret (2009), Mass Communication Theories: Explaining Origins, Processes, and Effects. Allyn &Bacon

Harold D. Lasswell, (1948), "The Structure and Function of Communication in Society", The Communication of Ideas, editor, Lyman (New York: Institute for Religious and Social Studies, Jewish Theological Seminary of America

02

චීන පුනරුදයේ පෙරමුණ ගත් දාර්ශනිකයා – හූ ෂිහ්

දිලිනි ගමගේ

සාරාංශය

හූ ෂිහ් 1891 දෙසැම්බර් 17 සහ 1962 පෙබරවාරි 24 කාලය තුළ චීනයේ වාසය කළ විද්වතෙකි. සම්පරීක්ෂණවාදය (Experimentalism) වශයෙන් ෂිහ් විසින්ම හඳුන්වන ලද උපයෝගීතාවාදී සංකල්ප (Pragmatism) සම්බන්ධයෙන් සප්‍රමාණික දැනුමකින් හා අවබෝධයකින් යුතු වූ චීන දාර්ශනිකයෙකු වශයෙන් මෙන්ම චීන ස්වභාෂාවන් පදනම් කරගනිමින් ලිඛිත චීන භාෂාවේ මානයන් වෙනස් කළ විද්වතෙකු වශයෙන් ද චීනය වෙනුවෙන් දේශපාලන ලෝකය තුළ පුරෝගාමී මෙහෙවරක් කරන ලද රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වශයෙන් ද හූ ෂිහ් සැලකිය හැකි ය. හූ ෂිහ් චීන ලිබරල්කරණයේ ත්, භෂා ප්‍රතිසංස්කරණයේ ත් මූලිකත්වය ගෙන කටයුතු කළහ. එසේම ඔහු චීන නව පුනරුදයේ සහ නව සංස්කෘතික ව්‍යාපාරයේ නායකත්ව භූමිකාවක් ඉටු කළ අයෙකි. 1919 මැයි 04 වනදා චීනයේ ශිෂ්‍ය උද්ඝෝෂණ හරහා පැන නැගි මැයි 04 ව්‍යාපාරය (May Fourth Movement) තුළ විද්වතෙකු හා ප්‍රතිසංස්කරණවාදියෙකු වශයෙන් ඔහුගේ බලපෑම ඉතා ඉහළ විය. විශේෂයෙන්ම සන්නද්ධ කණ්ඩායම් සහ ෂිවුආන්, ෂැන්ෂි, ක්වින්ග්හායි, නින්ග්ෂියා වැනි අභ්‍යන්තර චීන කලාප අතර යුධ ගැටුම් පැවති 1916-1928 චීන භීම සමය (Warlord Era) තුළ දේශපාලන සහ සමාජයීය ප්‍රතිසංස්කරණ ඇති කිරීමෙහිලා හූ ෂිහ්ගේ කාර්යභාරය කැපී පෙනේ.

1938 - 1942 කාලය තුළ එක්සත් ජනපදය තුළ මහජන චීන සමූහාණ්ඩුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ හූ ෂිහ් ඉන් අනතුරුව වර්ෂ 1946 - 1948 කාලය තුළ ප්‍රධාන පෙළේ චීන විශ්වවිද්‍යාලයක් වන පීකිං විශ්වවිද්‍යාලයේ කුලපති පදවිය හෙබවී ය. 1957 වර්ෂයේ දී චීන තායිපේ රාජ්‍යයේ ජාතික විශ්වවිද්‍යාලය වන ඇකඩමියා සිනීකා (Academia Sinica) හි සභාපති පදවියට පත්වූ හූ ෂිහ් 1962 වර්ෂයේ මරණයට පත්වන තෙක්ම එකී තනතුරේ කටයුතු කළහ.

1939 වර්ෂයේදී නොබෙල් සාහිත්‍ය ත්‍යාගය සඳහා හූ ෂීහ් ද නිර්දේශ විය. සාහිත්‍ය, ඉතිහාසය, ග්‍රන්ථ විචාරය සහ ශික්ෂණ විද්‍යාව ආදී ක්ෂේත්‍ර ගණනාවක ප්‍රවීණයෙකු වූ හූ ෂීහ් Dream of the Red Chamber නම් ග්‍රන්ථය පිළිබඳ පුළුල්ව අධ්‍යනය කළ විද්වතෙකි. දේශපාලනය, සාහිත්‍යය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍ර තුළ චීන පුනරුදයේ පියා වශයෙන් ද සැලකේ.

හූ ෂීහ්ගේ දාර්ශනික ඉගැන්වීම් සහ ජනමාධ්‍ය

වෝල්ටර් බෙන්ජමින් සහ මාර්ෂල් මැක්ලූහාන් වැනි විද්වතුන්ගේ අධ්‍යයනයන් සහ ශාස්ත්‍රීය දර්ශනයන් හරහා 20 වන සියවසේ අවසාන භාගයේ පටන් මාධ්‍ය විෂය ක්ෂේත්‍රය දැවැන්ත වෙනසකට ලක්වනු දැකිය හැකිවිය. මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සිදුවූ වේගවත් වර්ධනයන් මෙන්ම විවිධාකාර තාක්ෂණික භාවිතාවන්හි සිදුවූ වෙනස්කම් නිසාවෙන් මාධ්‍ය සහ වෙනත් සන්නිවේදන මාර්ගයන්හි ඉතිහාසය, සන්දර්භය සහ බලපෑම යන කරුණු ප්‍රමාණවත් පරිදි අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය මතුවන අතර මේ අවශ්‍යතාවයන්ට න්‍යායික පිළිතුරක් සැපයීමේ උත්සාහය තුළ දාර්ශනික සංකල්ප භාවිත වීම හරහා මාධ්‍ය දර්ශනවාදය (Philosophy of Media) විෂයක් වශයෙන් වර්ධනය වේ.

ඒ අනුව හූ ෂීහ් විසින් විද්වත්භාවයන් දැරුවා වූ දාර්ශනික ක්ෂේත්‍ර සහ මාධ්‍ය දර්ශනවාදය අතර පුළුල් සම්බන්ධතාවයක් ඇත. හූ ෂීහ් විශේෂඥභාවය දැරුවා වූ උපයෝගීතාවදය සහ සම්පරීක්ෂණවාදය මෙන්ම ලිබරල්වාදයද නූතන ජනමාධ්‍ය භාවිතය විග්‍රහ කිරීමේදී ඍජුවම අදාළ කරගන්නා න්‍යායික සන්දර්භයන් ය.

ලිබරල්වාදය (Liberalism) සහ හූ ෂීහ්ගේ ඉගැන්වීම්

හූ ෂීහ් තුළවූ ලිබරල්වාදී අදහස් වර්ධනය වීමට කොලොම්බියා සරසවිය තුළ ජෝන් ඩේවි යටතේ ගතකල කාල සීමාව පැහැදිලිව බලපාන්නට ඇත. 1919 - 1921 කාලය තුළ චීනය පුරා සංචාරයක කරමින් අධ්‍යාපනය සහ දේශපාලනය සම්බන්ධයෙන් චීන ජනතාවට දේශන මාලාවක්ම පවත්වන්නට ජෝන් ඩේවි කටයුතු කළහ. ජෝන් ඩේවිගේ මේ කාර්යය සඳහා චීන භාෂා පරිවර්තකයා ලෙස දායක වූයේ හූ ෂීහ් ය. ජෝන් ඩේවි ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ දීර්ඝ කාලයක් තිස්සේ දැක්වූ ලිබර්ල්වාදී අදහසක් චීන ජනතාවට හඳුන්වාදෙනු ලැබුවේ ද මෙම දේශන මාලාව තුළය, එයට අනුව පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය අත්පත් කරගත හැක්කේ හුදෙක් ඡන්ද අයිතිය ව්‍යාප්ත කිරීමෙන් නොවේ ය. ඒ සඳහා බල ගැන්වුනු මහජන අදහස් යාන්ත්‍රණයක්ද අනිවාර්යයෙන් අවශ්‍ය වන අතර පුරවැසියන්, විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්, සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා වගකිවයුතු වන්නා වූ දේශපාලනඥයන් අතර සාර්ථක සන්නිවේදන ජාලයක්ද ක්‍රියාත්මක විය යුතු ය.

දේශපාලනය පිළිබඳ ලිබරල්මය අදහසක් වන ජෝන් ඩේවිගේ ඉහත සංකල්පය පැහැදිලිව ම හූ ෂීහ්ගේ ද පිළිගැනීම වන්නට ඇත.

හූ ෂීහ්ගේ මරණයෙන් ඉතාම කෙටි කලකට පසුව The China Quarterly සඟරාවට Hu Shih and the Chinese Renaissance: Liberalism in the Chinese Revolution නමින් ලිපියක් සම්පාදනය කරන ජෙරෝම් බී. ගයිඩර් නම් ලේඛකයා හූ ෂීහ් තුළවූ ලිබර්ල්වාදී අදහස්වල ස්වභාවය පැහැදිලි කරමින් කියා සිටිනුයේ,

"සාමාජය තුළ ඇතිවිය යුතු වෙනස පිළිබඳ ඔහු අනුගමනය කළාවූ නවීන සහ විප්ලවීය ප්‍රවේශය, දේශපාලන සංසිද්ධියක් වශයෙන් නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වීමේ අත්‍යවශ්‍යතාවය පිළිබඳ ඔහු තුළවූ විශ්වාසය, සමාජය තුළ පුද්ගලයාගේ කාර්යභාරය සහ පුද්ගලයා වෙනුවෙන් රාජ්‍යයට පැවරෙන වගකීම පිළිබඳ ඔහුගේ දැක්ම තුළ ඔහු පුළුල් අර්ථයකින් යුතුව දේශපාලන ලිබරල්වාදියෙකු වශයෙන් හැඳින්විය හැක." යනුවෙනි.

සෑම පුද්ගලයෙකුම දේශපාලන සහ සමාජයීය වශයෙන් දෙයාකාර වැදගත්කමකින් යුතුවන බව හූ ෂීහ්ගේ විශ්වාසය විය. පුද්ගලයාගේ පුද්ගල පෞරුෂත්වය නගා සිටුව ඔහු අභිවෘද්ධියට පත්කිරීම හැර රාජ්‍ය ආයතනවලට පැවරෙන අන් කිසිඳු වගකීමක් නැතැයි යන්න ඔහුගේ අදහස විය.

උපයෝගීතාවාදය (Pragmatism) සහ හූ ෂීහ් ගේ ඉගැන්වීම්

1870 පමණ ඇමරිකා එක්සත් ජනපදය කේන්ද්‍ර කරගනිමින් ඇති වූ දාර්ශනික සංකල්පයක් වශයෙන් උපයෝගීතාවාදය හැඳින්විය හැක. C.S. පියර්ස් සහ විලියම් ජේම්ස් යන විද්වතුන්ගේ ඉගැන්වීම් මත පදනම් වූ මෙම දාර්ශනික සංකල්පය න්‍යායන් සහ විශ්වාසයන්හි ප්‍රායෝගික සාර්ථකත්වය දක්වා ගොස් ඒවා ඇගයුමට ලක් කරන ආකාරයේ ප්‍රවේශයක් වශයෙන් ඉතා සරලව වටහා ගත හැක. සිතුවිලිවල මූලික කාර්යය වනුයේ යමක් විස්තර කිරීම, ඉදිරිපත් කිරීම සහ සත්‍යය ප්‍රතිරූපනය කිරීම යන සම්ප්‍රදායික අදහස ප්‍රතික්ෂේප කරන උපයෝගීතාවාදය සිතුවිලි යනු පුරෝකථනය, ක්‍රියාව, සහ ගැටලු නිරාකරණය යන ප්‍රායෝගික අරමුණ සඳහා ක්‍රියාත්මක වන්නක් වශයෙන් දක්වයි. ඒ අනුව දේශපාලනය විෂයෙහි මහජන සහභාගීත්වය සහ මහජන අදහස් භාවිත කිරීම දේශපාලනය තුළ උපයෝගීතාවාදය ක්‍රියාත්මක කිරීමක් වශයෙන් විග්‍රහ කළ හැක.

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂය Pragmatism යන්න විස්තර කර ඇත්තේ, "යමක් පිළිබඳ න්‍යායත්මක අංග ලක්ෂණ ඉක්මවා ගොස් ඒවා සම්බන්ධ ප්‍රායෝගික ප්‍රවේශයකින් යුතුව සජීවීව සහ යථාර්ථවාදී ලෙස කටයුතු කිරීම" වශයෙනි.

Pragmatism යන වචනය ගොඩනැගෙන Pragmatic යන වදන 16 වන සියවසේදී පමණ 'කරුණු හා සම්බන්ධ' යන අර්ථය දෙන Pragmatikos යන ග්‍රීක වචනයෙන් බිඳී ඉංග්‍රීසි භාෂාවට එක් වූවකි.

හූ ෂීහ්ගේ දාර්ශනික භාවිතාවන් සහ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය අලලා දර්ශන විෂය සඳහා සිය ආචාර්ය උපාධි නිබන්ධනය රචනා කළ, වර්තමානයේ ලුසියානාහි නිකොලස් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය පිළිබඳ සහකාර මහාචාර්යවරියක වශයෙන් කටයුතු කරන ර්යා බටර්ෆීල්ඩ් හූ ෂීහ් හඳුන්වනුයේ "ඇමරිකානු උපයෝගීතාවාදය චීනයට ගෙන ආ තානාපතිවරයා" යනුවෙනි.

1920 පමණ කාලයේ සිට හූ ෂීහ් සහ ජෝන් ඩේවිගේ චීන අනුගාමිකයන් දේශපාලන වෙනසක් සඳහා සිය ක්‍රියාපිළිවෙල තුළට උපයෝගීතාවාදී සංකල්ප අන්තර්ගත කරන්නට උත්සාහ කළහ. China's Pragmatist Experiment in Democracy නම් ග්‍රන්ථය රචනා කරන සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ හිටපු සහකාර මහාචාර්ය ටැන්-සෝර් හූන් මහත්මිය හූ ෂීහ් විසින් අනුගමනය කළ

උපයෝගීතාවාදී ප්‍රවේශය පිළිබඳ සඳහන් කරමින් කියා සිටිනුයේ ප්‍රජාතන්ත්‍රවාදය අත්පත් කරගත හැකි ක්‍රමවේදය වනුයේ න්‍යායික පදනමකින් යුත් දේශපාලනයට වඩා ප්‍රායෝගික භාවිතයකින් යුතු අධ්‍යාපනය තුළින් යැයි හූ ෂීහ් විශ්වාස කළ බවයි.

චීනය තුළ එවකට පැවති දේශපාලන වියවුල්කාරීභාවය අවසන් කිරීමේ හූ ෂීහ්ගේ ප්‍රතිසංස්කරණ යෝජනා මුළුමනින්ම උපයෝගීතාවාදී පදනමකින් යුක්ත විය. ඔහුට අනුව දේශපාලනය විෂයෙහි මහජන සහභාගීත්වය වැඩි කිරීම ඕනෑම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක මූලික අවශ්‍යතාවය වනු ඇති බවයි.

චීන සංස්කෘතික පුනරුදයෙහිලා හූ ෂීහ්ගේ ප්‍රධානම අභිලාෂය වූයේ පෙරදිග පිහිටි චීනය සහ බටහිර ලෝකය අතර සංස්කෘතිකමය සහ න්‍යායාත්මක පාලමක් ගොඩනැගීමයි. චීනයේ බුද්ධිමය සහ සංස්කෘතිකමය සම්ප්‍රදායන් බටහිර ලෝකයට විවෘත කිරීම සහ එයට සමාන්තරව උපයෝගීතාවාදී බටහිර සංකල්ප චීන දේශපාලනයට, සංවර්ධනයට සහ සංස්කෘතියට බද්ධ කිරීමට ඔහු උත්සාහ කළහ.

සම්පරීක්ෂණවාදය (Experimentalism) සහ හූ ෂීහ්ගේ ඉගැන්වීම්

සම්පරීක්ෂණවාදය (Experimentalism) යනු අනුභූතිකවාදය (Empiricism) මත පදනම්ව පැන නගින දාර්ශනික සංකල්පයකි. එය ඉන්ද්‍රියගෝචර සහ ප්‍රායෝගික මූලධර්ම මත පදනම්වූ ගවේෂණාත්මක ක්‍රමවේද සහිත න්‍යායයක් හෙවත් ගවේෂණාත්මක ක්‍රමවේද හරහා නිරාවරණය කරගත් සාක්ෂිමය දත්තයන්හි අවශ්‍යතාවය අවධාරණය කරන්නාවූ න්‍යායක් වශයෙන් සම්පරීක්ෂනවාදය හඳුනාගත හැක.

සම්පරික්ෂණවාදය පිළිබඳ හූ ෂීහ්ගේ දැනුම ඔහුගේ ගුරුවරයා වන ජෝන් ඩේවි විසින් උපයෝගීතාවාදය පිළිබඳ කළ ඉගැන්වීම් මත පදනම් විය. ඩේවි සහ හූ ෂීහ් යන දෙදෙනාම සම්පර්ක්ෂණවාදය පිළිබඳ කළ විස්තර කිරීම්වලට ඩාවිනියානුවාදය සම්බන්ධ කරගත්හ. ඔවුන්ට අනුව පරිණාම ක්‍රියාවලිය තුළ එක් ජීව පුරුකක් ඔහු වෙසෙන පරිසරයේ වෙනස්කම්වලට අනුගතවීම හරහා ඔහුගේ ජෛව පද්ධතිය වෙනස්කම් වලට ලක්ව එයින් ඊළඟ ජීව විශේෂය බිහිවීම සිදුවේ. එලෙසම ඕනෑම කාරණයක් එයට අදාළ වන්නාවූ පරිසරයේ වෙනස්කම් මත වෙනසට ලක්වේ. උදාහරණයක් ලෙස මිනිසා සතුන් දඩයම් කරගෙන ජීවත් වූ ගෝත්‍රික යුගයේදී පිළිගත් සම්ප්‍රදායන් ශිෂ්ට යැයි සම්මත වර්තමාන යුගය තුළ ප්‍රතික්ෂේප වේ. එයට හේතුව මිනිසා ජීවත්වන පරිසරය වෙනස්වීම තුළ මිනිස් මූලධර්මද වෙනස්ව තිබීමයි.

The routledge history of Chinese philosophy නම් ග්‍රන්ථයේ විස්තර කෙරෙන ආකාරයට සම්පරීක්ෂණවාදය පිළිබඳ හූ ෂීහ් පහත මූලික කරුණු 04 පෙන්වා දී ඇත,

01. එය නිශ්චිත කරුණු සහ සිද්ධීන් සඳහා අදාළ වේ.

02. සම්පරීක්ෂණවාදයට අනුව සියලුම න්‍යායන් සහ පිළිගැනීම් සත්‍යයන් නොවන අතර ඒවා විද්‍යාත්මකව තහවුරු කළ යුතු උපකල්පනයන් පමණක් වේ.

03. සම්පරීක්ෂණවාදයට අනුව සියලු න්‍යායන් සහ දැනුම ගවේෂණාත්මකව තහවුරුවිය යුතු ය.

චීන පුනරුදය සහ ප්‍රතිසංස්කරණයන් සාධාරණීය කරන්නට හූ ෂීහ් විසින් මූලික වශයෙන්ම භාවිතා කළේ ඉහත කී න්‍යායන් ය. ඔහුට අනුව එවකට චීනය තුළ දේශපාලනික සහ සමාජ-ආර්ථික පරිසරය වෙනස් වෙමින් පැවති බැවින් චීන ජනතාව සම්ප්‍රදායික පරිසරයට ඔබින සම්ප්‍රදායික වටිනාකම් තවදුරටත් පවත්වාගෙන යාම නතර කළ යුතු බවයි. එසේම ඒ වෙනුවට නව නිෂ්පාදන සහ ප්‍රවේශයන් සකසා ගැනීම හරහා පැරණි වටිනාකම් සමකාලීන සමාජයට ඔබින පරිදි වෙනස් කරගැනීමට කටයුතු කළ යුතු බව හූ ෂීහ්ගේ අදහස විය.

නිගමනය

සන්නිවේදනය තුළ විල්බර් ශ්‍රාම්, හැරල්ඩ් ඩී. ලැස්වෙල්, ඩේවිඩ් කේ. බර්ලෝ, බෘස් වෙස්ට්ලි සහ මැක්ලිනින් වැනි විද්වතුන් විවිධ සන්නිවේදන ආකෘති ඉදිරිපත් කර තිබේ. නමුත් ප්‍රායෝගික සන්නිවේදන ක්‍රියාකාරීත්වය තුළ එම ආකෘති ක්‍රියාත්මක කිරීම අපහසුය.

මෙම තත්ත්වය වඩාත් සංකීර්ණ වනුයේ අන්තර්ජාලය ඇතුලු නව මාධ්‍යන්ගේ වර්ධනය හමුවේ සම්ප්‍රදායික මාධ්‍ය භාවිතයේ සීමාවන් තවදුරටත් වලංගු නොවීමයි. අරාබි වසන්තය වැනි ජනමත පිබිදීමකට පදනම ඇති කරමින් ඊජිප්තුවේ තහීර් චතුරස්‍රයෙන් පැන නැගි විප්ලවකාරී ක්‍රියාකාරකම් වලට පදනම වැටෙනු යේ ෆේස්බුක් වැනි සමාජ ජාල වෙබ් අඩවියක් හරහා වීම තුළ මේ තත්ත්වය මැනවින් පැහැදිලි වේ.

හූ ෂීහ් පෙන්වා දෙන පරිදි උපයෝගීතාවට අනුව සංකල්පමය ආකෘති තුළ ක්‍රියාත්මක වීමට වඩා ප්‍රායෝගික සන්නිවේදනය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පැහැදිලි වෙනස්කම් රාශියක් පවතී. වෙළඳ දැන්වීම්කරණය සහ මාධ්‍ය භාවිතය, මාධ්‍ය භාවිතය සහ මාධ්‍ය හිමිකාරීත්වය යනාදිය මගින් බොහෝ සංදේශ වාරණයට ලක්වීම ගැටලුවකි. රටකින් රටකට සන්නිවේදන ආචාරධර්මයන් වෙනස් ආකාරයට ක්‍රියාත්මක වීම තවත් ගැටලුවකි.

හූ ෂීහ් ගේ දාර්ශනික භාවිතයන් ලාංකීය සන්නිවේදන ක්‍රියාවලියට යොදාගැනීමේ දී යම් සීමාවන්ට යටත් වීමට සිදුවේ. ඊට හේතුව වන්නේ සන්නිවේදනය යන්න ගතික ක්‍රියාවලියක් වීමයි.

රටක සාමාජයීය සහ සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික පදනම සහ ආකෘතිය මත සන්නිවේදනය පැහැදිලිවම වෙනස් වේ. හූ ෂීහ් බටහිර දර්ශනයන් සහ ප්‍රතිසංස්කරණවාදී සංකල්පයන් තුළ චීනය ගොඩනගන්නට න්‍යායික දැනුම සැපයූවෙකි. ඔහුගේ දර්ශනය එවකට චීන භීම සමය තුළ ගොඩනැගී තිබූ දේශපාලනික, ආර්ථික සහ සාමාජයීය ප්‍රතිසංස්කරණ පිළිබඳ බලාපොරොත්තු හරහා මතු වූවකි. නමුත් එකී මතවාදයන් ලාංකීය සමාජයීය, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික පදනමට සමීප කිරීම ප්‍රායෝගිකව ගැටලු සහගතය.

නිදසුනක් ලෙස වර්තමාන ශ්‍රී ලංකාව තුළ පූර්ණ ලිබරල්වාදී මාධ්‍ය භාවිතයක් ක්‍රියාත්මක කිරීම අපහසුවීම දැක්විය හැක. ඊට හේතුව මාධ්‍යය ආයතන දේශපාලනීකරණය වී තිබීමයි. එසේම වර්තමාන ලාංකීය ජනමාධ්‍ය තුළ උපයෝගීතාවාදී මාධ්‍ය භාවිතයක් දක්නට නොලැබේ. ඊට හේතුව සෑම මාධ්‍යක්ම තම හිමිකාරීත්වය සහ රටේ දේශපාලන බලය හිමි පාලන පංතියේ අභිලාෂයන්ට අනුව ක්‍රියාත්මක වීමයි.

මූලාශ්‍ර

රාජපක්ෂ චන්ද්‍රසිරි, සන්නිවේදන මූලධර්ම 1, 2009, ෆාස්ට් ප්‍රින්ටර්ස් ලිමිටඩ්, කැලණිය.

China's 20th century sophist: analysis of hu shi's ethics, logic, and pragmatism, Rya Butterfield, 2010, Louisiana State University

China's Pragmatist Experiment in Democracy: Hu Shih's pragmatism and Dewey's Influence in China, Sor-Hoon Tan, Volume 35, Issue 1-2, January 2004

Dr. Mikhail Stepanov, What is pragmatic media philosophy in philosophy of media, 2004

Fairbank, John King, The United States and China, 1979, Cambridge: Harvard University Press.

Http://csua.berkeley.edu/~mrl/hushih/

Jerome B. Grieder, Hu Shih and the Chinese Renaissance: Liberalism in the Chinese Revolution, The China Quarterly, no.12 (October-December 1962) Cambridge, MA: Harvard University Press

03

Communication – Towards Alternative...

S. Raguram

Communication is an essential element that is inherent in living. Especially, in human life it has an essential for each and every activity. From the starting point of his or her life man starts the communication for co-existence. Let it be an expression of the need, or the ideas, even winking- there the communication begins.

Communication never ceases, even a moment. Even, when one decides not to communicate, his silence itself communicates a message. Communicators describe this fact using the meaningful quote 'you cannot not to communicate'.

As the pulsation, in human beings and the animals, communication takes place continually, when sender using comprehensible codes, expression of ideas takes place, sends a signal to a receiver.

Communication - A field of Social relationship

The evidence that communication is intertwined with man from his beginning and it is connected to the basis of his culture is that the communication of the ancient societies has close links with the rites and as a result, though it has the characteristics of worship, it could be seen, even at present, it is flourished because it is based on communication.

Communication has a place, at each stage of every man to be a member of society and to enable him to move around and stabilise him in the society; communication is the basis of meaningful existence. Because of this communication is defined as 'Social interaction through messages'. Moreover, even in the traditional culture, the communication was centered on groups and not on individuals.

In the meantime, it could not be denied that communications was used as tool in the ancient society to establish the chauvinism of the high class. Since the power based on literacy that enabled to use medium of communication-denoted power, the rulers and the high priests jealously prevented others become literate.

Notwithstanding this, communication plays a significant role in socialising. It is understood that the English term 'communication 'originated from the Latin word 'Communis' which means common for all. Hence, on this basis, communication is considered an activity of social expression in which all take part and common to all. Communication is an activity that one shares his feelings, knowledge, and ideas.

Accordingly, everyone engaged in communication understands the meaning, purpose, and use of the message received. Based on this communication is considered as an activity in which all participate and social expression connected to a society. Not only among the people, but also among communication plays a vital role in linking the public with government and private sectors.

Through transmitting information between the government and public by way vertical communication - bottom to top and bottom to top, and horizontal communication, media plays a key role in creating a participatory society.

Psychologist Abraham Maslow when listing the man's basic needs he gives importance to physiological needs, air, food, sexual gratification and states that communication helps greatly to fulfil these needs.

Likewise, communication contributes immensely toward fulfilling the other needs such as security, social needs, self-actualisations, and self-esteem.

One communicates to obtain what one need, to persuade others to behave the way they want, to express emotions, to mingle with others, maintaining social status, entertainment and this list is not exhaustive.

When we discuss the aim of communication, attention is to be paid to the traits of the aims and how communicative actions the (mode, medium)) should be performed to achieve the desired goals.

We could view this through the accepted 'Principles of Conversation Co-operation' put forward by H. Paul Chris:

- Providing adequate amount of information as required (quantity)
- Being genuine in providing the information (quality)
- Providing suitable information (appropriateness)

- Providing information candidly (clarity/method)

Mahatma Gandhi who was always interested in the well-being of the people at grassroots level, when commenting on the aims communication stated that the information should be always beneficial to the live in villages. In addition, he expects the media personnel the achievement of communicative goals:

- Should be able to expose the shortcomings found in public affairs without fear
- Should understand the feelings of the grassroots and expose them
- They should direct their attention towards the villages where the majority of people live

It is realistic that by fulfilling the above expectations only communications aims should be achieved.

Need of alternative media

In the context of commercialized mass media that has become profit oriented, alternate communication is put forward as mass as a medium for the people. It is put forward by the people for the benefit of the people, to fill the gap and shortcomings that prevalent in the current mass media, a new approach is embraced in the field of communication. The people who have been neglected / expelled by the mass media gets the opportunity to voice their needs through this alternative communication.

Generally, this, alternative media should be for the people at grassroots level. Accordingly, this will be substitute medium / media will be less expensive, participatory, democratic be trustworthy to by the people at grassroots level.

When the principles of the western media were influential, in Latin America, which is always fertile to alternative ideas, and African countries and Asian countries, that became independent after struggling formed and put forward constructive concepts of alternative communication.

During the 60's after the World War II, alternative media was used as a tool to achieve socio-economic political freedom and thus evolved as an effective measure to challenge domination and suppression of any kind.

Alternative media differ from mass-media that government and corporate interests and keep distant from public. Institutionalized mass-media has the attributes that do not fit to the interest of the poor and it is alienated from the people at the grassroots level.

Government, using money and power has formed an information society that takes information from top to the bottom, horizontally. Here information is structured according the need of those who in power and distributed to the masses depended on them.

As alternative, the communication from the edge to the centre is the one that could strengthen the communication of the people at grassroots level. Moreover, it voices their problems loudly.

References

Abreo, Desmond A.D, Voice to the People: Communication for social change, Culture and Communication, Loyola College, Chennai, 1990.

Appavoo, James Theophilus (Parattai). Folklore for Change, TTS Publications, Tamil Nadu Theological Seminary, Madurai , 1986.

Gutierrez, Gustavo. We Drink from our own wells: The Spiritual Journey of People, Orbis Books, New York, 1984.

Lasswell, H.D, The structure and function of communication in society, The Communication of Ideas, Lyman Bryson (ed.), Harper and Brothers, New York, 1948.

Mody, Bella. Designing messages for Development communication – An audience participation-based approach, Sage Publications, New Delhi, 1991.

Schramm, Wilbur. Mass Media and National Development: The role of information in the developing countries, Stanford University Press, Stanford, California and UNESCO, Paris, 1964.

04

ජනමාධ්‍ය හිමිකාරීත්ව ආකෘතිය

විජයානන්ද රූපසිංහ

පසුබිම

මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් සලකා බලන ලද්දේ ජනමාධ්‍ය හිමිකාරීත්වයේ ස්වරූපයන් පිළිබඳවය. එකී තත්ත්වය ජනමාධ්‍යයේ අන්තර්ගතයට බලපාන ආකාරයත් ඒ ඔස්සේ පක්ෂපාතීත්වයන් ගොඩනැගෙන ආකාරයත් විමසා බලන ලදී. මෙහිදී ලෝකයේ ජනමාධ්‍ය අයිතිය පිළිබඳව පවත්නා න්‍යායාත්මක තත්ත්වයන් ඔස්සේ මෙරට ජනමාධ්‍ය හිමිකාරීත්වය, පාලනය හා පක්ෂපාතීත්වය යන අංශ තුන කෙරෙහි අවධානය යොමු කෙරිණ.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය බිහිවීම හා ව්‍යාප්තිය පිළිබඳ සාධකයේ දී හිමිකාරීත්වය සැකසී ඇති ආකාරය දීර්ඝ වශයෙන් විමර්ශනය කරන ලදී. එක් එක් මාධ්‍යයන්ට වෙන් වෙන්ව හිමිකාරීත්වය පිළිබඳව සාකච්ඡා කළ ද සෑම මාධ්‍යයකම හිමිකාරීත්වයේ ස්වරූපයන් එකිනෙකට වෙන් කළ නොහැකි ආකාරයෙන් සම්බන්ධව පවතින අයුරු හඳුනාගත හැකි විය.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හිමිකාරිත්වය

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ සිට මේ දක්වා වන වාර්තා, මාධ්‍ය අත්දැකීම්, චරිතාපදාන, පර්යේෂණ වාර්තා හිමිකරුවන්ගේ හා කොටස් හිමියන්ගේ වෙනස්වීම් ආදිය සලකා බලන අතර හිමිකාරීත්වය සමඟ සම්බන්ධව පවත්නා දේශපාලන හා ආර්ථික සාධක විමර්ශනය කිරීම මඟින් මෙරට සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයට මෙම අධ්‍යයනය දායකත්වයක් සපයයි. ඒ අංශ කිහිපයකිනි.

01. හිමිකාරීත්වයේ ස්වරූපයන් හඳුනාගැනීම.
02. මාධ්‍ය පක්ෂපාතීත්වය සඳහා බලපාන පසුබිම් කාරණා සාකච්ඡාවට ලක්කිරීම.
03. ජනමාධ්‍ය පාලනය තුළ දැකිය හැකි සංකීර්ණත්වයන් විමර්ශනය කිරීම.
04. මැතිවරණ ක්‍රියාදාමය තුළ ජනමාධ්‍යයේ හැසිරීම්.

ග්‍රැහැම් මර්ඩොක් හා පීටර් ගෝල්ඩින්ග් පෙන්වා දෙන්නේ ජනමාධ්‍ය හැසිරීම තීරණාත්මක බලය එහි ආර්ථිකය (අයිතිය) මත පදනම්ව නොපවතින බවයි. ආර්ථික සාධකය ජනමාධ්‍යයේ හැසිරීමට බලපෑම් කරන නමුත් එහි අවසන් නිෂ්පාදනයට (සංදේශයන්ට) ඍජු ලෙස බලපෑම් නොකරන බව ඔවුහු පෙන්වා දෙති. (Curren et al, 1977, 20)

ජනමාධ්‍ය ඇතුළු සංස්කෘතික නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින කර්මාන්තවල ප්‍රධාන අංශ දෙකක් පවතී.

01. හිමිකරුවන්

02. සන්නිවේදකයින්

මෙම කණ්ඩායම් දෙකම එහි අවසන් නිෂ්පාදනයට බලපෑමක් එක් කරති. හිමිකරුවෝ **ලාභය** හා තමන්ට අවශ්‍ය ආකාරයට සංදේශ සකස් කරනු ලබති. දෙවන කණ්ඩායම ආයතනයේ ප්‍රතිරූපය ඉහළ නැංවීමට කැපවී කටයුතු කරන පිරිසකි.

කාල් මාක්ස්ට අනුව දේපළ අයිතිය, ආර්ථික පාලනය හා පංතිමය ආයතනය එකිනෙකට වෙන්කළ නොහැකි සාධකයන් ය. එසේ වුවද ජනමාධ්‍ය හිමිකාරීත්වය පිළිබඳව විමසීමේ දී හිමිකාරීත්වය හා පාලනය අතර තරමක් වෙනස් සබඳතාවක් දක්නට ලැබේ. නූතන සමාගම් පාලනය එහි අයිතියෙන් වෙන් ව සිදුවන්නක් බවට විවිධ මත පළවී තිබේ. 1932 දී පළවූ "The modern corporation and private property" යන කෘතියෙන් මෙම අදහස ඉදිරියට ගෙනගිය බව පෙන්වා දිය හැකි ය.

වැඩවසම් සමාජවල මෙන් පවුල් තමන්ට අයත් දේපළ පාලනය කළා මෙන් නූතන සමාගම්වල ක්‍රියාකාරීත්වයට මැදිහත් නොවේ. ඒ වෙනුවට විවිධ පිරිස් වෙත කොටස් ලබාදී සමාගම පාලනය කිරීමට කළමනාකරණ මණ්ඩලයක් පත්කරයි. එය කොටස් හිමියන්ගේ නියෝජනය සහිත අධ්‍යක්ෂ මණ්ඩලයක් සහ ප්‍රධාන විධායක නිලධාරියෙකු (CEO) ගෙන් සමන්විත වීම පොදු ලක්ෂණයන් බවට පත්ව තිබේ. එසේ වුවත් හිමිකරු සහ පාලනය පූර්ණ ලෙස ඉවත්ව ගොස් නැති බව ජනමාධ්‍ය හිමිකාරීත්වය තුළ පෙන්නුම් කරයි. පොදු සමාගම් හා කොටස් අයිතිය ව්‍යාප්ත වුවද පවුලේ බලය, අයිතිය හා පාලනය ක්‍රියාත්මකව පවතී.

මෙරට ජනමාධ්‍ය හිමිකාරීත්වය පුද්ගල මූලිකව වැඩුනකි. යටත් විජිත පාලන යුගයේ දී ඉංග්‍රීසි පුවත්පත් ආරම්භ වනුයේ පුද්ගල අවශ්‍යතා මතය. එම පුද්ගලයින් රාජ්‍ය, ව්‍යාපාරික අංශ නියෝජනය කළ අය බැවින් ඔවුන් කිසියම් අරමුණක් සහිතව පුවත්පත් පාලනය ගෙන ගිය බව හඳුනාගත හැකි ය. දේශීය සමාජ ව්‍යාපාර, ආගමික ව්‍යාපාර පුවත්පත් හිමිකර ගැනීමට යොමුවනුයේ යටත් විජිත පාලකයන්ට එරෙහිව ජනමතයක් ගොඩනැගීම වෙනුවෙනි. ඇතැම් අවස්ථාවල ආගම් පැතිරවීම, රැකගැනීම වැනි අරමුණු පැවති බවද පෙනේ.

පුවත්පත සන්නිවේදන මාධ්‍යයක් වුවද මුද්‍රණ යන්ත්‍රයක් හිමිකර ගැනීම මුල්කාලීන පුවත්පත් හිමිකාරීත්වයේ ප්‍රධාන සාධකය විය. 19 වන සියවසේ ඉංග්‍රීසි පුවත්පත් එකින් එක ආරම්භ වූයේ මුද්‍රණ

යන්ත්‍ර කිහිපයක් එකිනෙකා අතර විකිණීමෙනි. 20 වන සියවසේ මුල් කාලසීමාවේදී ද මුද්‍රණ යන්ත්‍රයක් හිමිකර ගැනීමට පුවත්පත් හිමිකාරීත්වයේ ප්‍රධාන සාධකය විය. D. R. විජේවර්ධන මුද්‍රණ යන්ත්‍ර මිලදී ගෙන විනාශ කරන ලද්දේ එකී තත්ත්වය අවබෝධ කරගෙන ය. (අයිවන්: 1997, 70).

පුවත්පත් රජය සතු නොවූව ද රජයට සම්බන්ධ පිරිස් යටතේ පුවත්පත් පැවතීම හේතුවෙන් ගැටලුවක් මතු නොවුණි. 1948 දී නිදහස දිනාගැනීමෙන් පසුව බලයේ සිටි එක්සත් ජාතික පක්ෂයට (UNP) පුවත්පත් අයිතිකර ගැනීමට කිසිදු වුවමනාවක් නොවූයේ පුවත්පත් තමන්ට අවශ්‍ය පරිදි පාලනය කිරීමට හැකියාව තිබූ බැවිනි. පුවත්පත්වල අයිතිය පිළිබඳ සාධකය 1956 දී මතුවනුයේ ප්‍රධාන පුවත්පත් ධාරාවට සම්බන්ධ නොවන පාලකයකු රටේ නායකත්වයට පත්වීමයි.

පුවත්පත් රජයට පවරා ගැනීමේ සාකච්ඡාව ආරම්භ වනුයේ දේශපාලන බලය හා ජනමාධ්‍ය අතර සබඳතාව බිඳවැටුණු හෙයිනි. දේශපාලන පක්ෂවල නායකයින් සතුව පුවත්පත් පැවතීම හේතුකොට ගෙන තමන්ට අවශ්‍ය ආකාරයට ජනමතය හැසිරවීමට හැකිවිය. මෙම පුවත්පත් ඍජු ලෙස අයිති නොවූව ද තමන්ට පාලනය කරගත හැකි මට්ටමක පැවතුණි.

දේශපාලන පක්ෂවලට අයත් නිල පුවත්පත් පැවතීම ද හිමිකාරීත්වයේ තවත් ස්වරූපයකි. එම පුවත්පත් ඇතැම් විටක සාමාජිකත්වය හා පාක්ෂිකයින් වෙත පමණක් යොමු වූව ද ඇතැම් අවස්ථාවල දී පොදු ජනතාව සමීප වූ බව හඳුනාගත හැකි ය.

ප්‍රංශ ජාතික ජනමාධ්‍ය පර්යේෂක Seymour – Ure ට අනුව පක්ෂ - පුවත්පත් සම්බන්ධතාවයේ සීමාව ඉතා පුළුල් විය හැකිය. පූර්ණ වශයෙන් පක්ෂ පාලනය කරන පුවත්පත් හා පූර්ණ නිදහස් පුවත්පත් අතර විවිධ තත්ත්වයන් යටතේ පවතී.

01. පුවත්පත් සංවිධානමය වශයෙන් පක්ෂයෙන් වෙන්ව පවතී. එහෙත් පක්ෂයේ පූර්ණ පාලනය යටතේ පවතී.

02. පක්ෂයේ සහ මූල්‍යමය සහනාධාර ලබාගන්නා පුවත්පත්

03. පක්ෂවලට සම්බන්ධ හෝ හිතවත් පුද්ගලයන් හා කණ්ඩායම් මඟින් පාලනය වන පුවත්පත්

04. දේශපාලන ගමන් මඟක් සහිත පුද්ගලයින් විසින් පාලනය කරනු ලබන පුවත්පත්

05. හිමිකරුවන් පුද්ගල සබඳතා මඟින් නිල නොවන ලෙස පක්ෂවලට සම්බන්ධිත පුවත්පත්

06. ප්‍රබල එහෙත් ක්‍රියාකාරි නොවන පක්ෂ හිතවතුන්ගේ පුවත්පත් (Kuhn: 2005, 74).

1980 දශකයෙන් පසු පක්ෂවලට අයත් නිල පුවත්පත් වෙනුවට පක්ෂවලට සම්බන්ධිත දේශපාලන පුවත්පත් ක්‍රියාත්මක වනු දැකගත හැකි ය. ඒවා නිල නොවූව ද නිල පුවත්පත් ආකාරයේ අන්තර්ගතයකින් යුක්ත වේ. පුවත්පත්වල අන්තර්ගතය මැතිවරණ කාලසීමාවල දී අදළ පක්ෂයට පක්ෂපාතීව සකසනු ලැබේ.

ප්‍රංශ ජාතික ජනමාධ්‍ය පර්යේෂක Seymour – Ure දක්වන පරිදි පුවත්පත් හා දේශපාලන පක්ෂ අතර සබඳතා කෙරෙහි බලපාන හේතු සාධක 03කි.

01. පුවත්පත් හා පක්ෂ ක්‍රමය අතර පවත්නා ඓතිහාසික සබන්ධතාව 19 වන සියවසේ යුරෝපයේ දේශපාලන පක්ෂවල වර්ධනය පුවත්පත්වල වර්ධනයට සමගාමීව සිදුවිය. බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, රුසියාව සහ ස්කැන්ඩිනේවියානු රටවල් ඊට උදාහරණ ලෙස දැක්විය හැකි ය.

02. විවිධත්වයෙන් යුත් දේශපාලන පක්ෂ ක්‍රමය තුළ නියමාකාරයෙන් හෝ අනියමින් පුවත්පත් භූමිකාවත්, පක්ෂයත් හා සම්බන්ධ වේ.

03. පුවත්පත්වල හැකියාවන් සමඟ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය මනා ලෙස සම්බන්ධ වේ. (Kuhn: 2005, 69)

ගුවන්විදුලිය හා රූපවාහිනිය රාජ්‍ය මාධ්‍ය ලෙස බොහෝ කළක් ක්‍රියාත්මක වුණි. 1990 දශකය මැදභාගයේ දී පෞද්ගලික මාධ්‍ය ආරම්භය මෙරට ජනමාධ්‍ය හිමිකාරීත්වයේ තීරණාත්මක අවස්ථාවකි. දේශපාලන අරමුණු හා ව්‍යාපාරික අරමුණු සහිත පිරිස් වේගයෙන් විද්‍යුත් මාධ්‍ය හිමිකර ගැනීමට යොමුවුණි. රාජ්‍ය නායකත්වයේ ඍජු පාලනය යටතේ පැවති බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය හේතුවෙන් කිසිදු පාරදෘශ්‍ය භාවයකින් තොරව විශාල බලපෑමක් සහිත ජනමාධ්‍ය ආරම්භ කිරීමට හැකියාවක් ලැබුණි.

මෙරට විද්‍යුත් මාධ්‍යයේ අයිතිකරුවන් එම සමාගම් සඳහා විද්‍යුත් මාධ්‍ය බලපත්‍ර ලබාගෙන ඇත්තේ ඒවා සමාගම් ලෙස ලියාපදිංචි කිරීමටත් පෙර ය. ඒවායේ කොටස්කරුවන් කිසිදු ආර්ථික හා දේශපාලන සම්බන්ධතාවයෙන් තොර සාමාන්‍ය පුරවැසියන් ලෙස දක්වමින් ලියාපදිංචි කිරීම් සිදුකර තිබේ. එහෙත් වසර කිහිපයකට පසු සැබෑ හිමිකරුවන්ට කොටස් පැවරීම හෝ විකිණීම සිදුව තිබේ.

උදාහරණ ලෙස පෞද්ගලික ගුවන්විදුලි නාලිකා ගණනාවකගේම හිමිකරුවන් වන්නේ විදේශීය රටවල ලියාපදිංචි සමාගම් ය. බහමාස්, British virgin Islands වැනි මධ්‍යම ඇමෙරිකානු රටවල මූල්‍ය පරිපාලන සමාගම්වල ලිපිනයන් යටතේ ඒවා ක්‍රියාත්මක වේ. මේ නිසා ඒවායේ සැබෑ හිමිකරුවන් කවුරුන්ද යන්න හෙළිදරව් නොවේ. බොහෝ විට හිටපු රාජ්‍ය නායකයින්, ඇමතිවරුන්, නිලධාරීන් රහසිගතව රටින් පිටමං කළ මුදල් මෙවැනි සමාගම් හරහා විද්‍යුත් මාධ්‍යවල ආයෝජනය කර තිබේ. මේ නිසා මෙරට විද්‍යුත් මාධ්‍ය තුළ "සැඟවුනු හිමිකරුවන්ගේ" භූමිකාවක් පවතින බව හඳුනාගත හැකි ය.

ලෝකයේ මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශක (Index) වලදී ද හිමිකාරීත්වය පිළිබඳ සාකච්ඡාවට ලක්වේ. ඒ අතරින් ප්‍රධාන දර්ශකයක් වන Freedom House ආයතනයේ ජනමාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය (Press Freedom Index)හි ජනමාධ්‍ය ආර්ථික වාතාවරණය (Economic Enviroment) පිළිබඳ විමසා බැලෙන කරුණු 03ක් හිමිකාරීත්වයට අදාළ වේ.

01. ජනමාධ්‍යයේ හිමිකාරීත්වයට හෝ පාලනයට රජයේ මැදිහත්වීම කෙබඳුද? එය ජනමාධ්‍යයේ විවිධත්වයට කෙතරම් බලපෑම් කරයිද?

02. ප්‍රවෘත්ති අපක්ෂපාතීත්වය මැනබැලීමට ග්‍රාහකයන්ට ඉඩකඩ ලැබෙන අයුරින් පෞද්ගලික ජනමාධ්‍ය හිමිකාරීත්වය කෙතරම් දුරට හඳුනාගත හැකි, දැකිය හැකි ආකාරයෙන් යුක්තද?

03. පෞද්ගලික ජනමාධ්‍ය හිමිකාරීත්වයේ ඒකරාශීකරණ ස්වරූපය කෙබඳුද? එය ජනමාධ්‍ය අන්තර්ගතයේ විවිධත්වයට කෙබඳු බලපෑමක් කරයිද? (Karlelar; 2005; xxi)

ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ජනමාධ්‍ය ආයතන ප්‍රමාණයක් රජය සතුවීම ද කැපී පෙනේ. එම නිසා ඒවා දැඩි ලෙස රාජ්‍ය පක්ෂපාතීත්වයෙන් යුක්ත වේ. එහෙත් ඒවායේ සැබෑ නීතිමය අර්ථයේ හිමිකාරීත්වයට අදාළ කොටස් මනා ලෙස ක්‍රියාත්මක නොවීම මත මෙවැනි තත්ත්වයන් ඇතිවී තිබේ. ලේක්හවුස් ආයතනයේ අයිතිය ක්‍රම ක්‍රමයෙන් පුළුල් විය යුතු බව ලේක් හවුස් පනතේ දැක්වේ. ස්වාධීන රූපවාහිනිය පවතිනුයේ රජයට අයත් සමාගමක් වශයෙනි. එහෙත් ක්‍රියාත්මක වීමේදී ඍජු ලෙසම ජනමාධ්‍ය ඇමතිවරයාගේ පාලනය යටතේ පවතී.

දේශපාලන ඥාති සම්බන්ධතා හා පවුල් හිමිකාරීත්වයන් ජනමාධ්‍ය අතර සුලබ තත්ත්වයකි. එම පවුල් අයිතිය දේශපාලන නායකත්වය තුළ පවත්නා පවුල් සබඳතාවන්ට සමාන්තර වේ. මාධ්‍ය-දේශපාලන පවුල් සබඳතා ජාලයක් ලෙස මෙරට ජනමාධ්‍ය හිමිකාරීත්වය නම් කළ හැකිය. ඒ බව ඩී.ඇස් සේනානායක අගමැතිවරයාගේ සිට වර්තමාන ජනාධිපතිවරයා දක්වා වන යුගවල ජනමාධ්‍ය හිමිකාරිත්වය විමසා බැලීමෙන් වටහාගත හැකි ය. එම සම්බන්ධතාවල ගොඩනැගී ඇත්තේ බලයට ඒමට පෙර හා පසු වශයෙනි.

1990 දශකයේ පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ආරම්භයේ දී හිමිකාරීත්වය දේශපාලන පවුල් හිමිකාරීත්වයෙන් මඳක් වෙනස් වූ බව පෙනේ. ඒ වෙනුවට දේශපාලන හා ව්‍යාපාරික සබඳතා ඉදිරියට පැමිණ ඇත. ගුවන්විදුලි හා රූපවාහිනී බලපත්‍ර නිකුත් කිරීම රටේ ප්‍රධානියාගේ අනුමැතිය මත සිදුවූ බැවින් දේශපාලන හා ව්‍යාපාරික සබඳතාවලට මුල්තැන හිමිවූ බව පෙනේ. පවුල් සබඳතාවලට ද යම්තාක් දුරට ඉඩක් පැවතුණු නමුත් එය පුවත්පත් ආයතන හා දේශපාලන පවුල් අතර පැවති සබඳතාවට වඩා වෙනස් මුහුණුවරක් ගත් බව පෙන්වා දිය හැකිය.

ඒ ඒ ජනාධිපතිවරු යටතේ පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය සඳහා බලපත්‍ර නිකුත් කළ ආකාරය මෙසේ දැක්විය හැකිය.

ජේ.ආර් ජයවර්ධන (1977-1988) - Independent Television Network

රණසිංහ ප්‍රේමදාස (1988-1993) - Colombo Communication (Pvt) Ltd., Maharaja Organisation (Pvt) Ltd., Teleshan Network (Pvt) Ltd.,

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග (1994-2005) - IWS Holding (Pvt) Ltd., Asia Brodcasting Corparetion (Pvt) Ltd., Television and Radio Network, Ru Ras Lanka (Pvt) Ltd., Asset Radio Brodcasting (Pvt) Ltd., Power Hous (Pvt) Ltd., MGM Networks (Pvt) Ltd.,

මහින්ද රාජපක්ෂ (2005-2015) – People's Media Network (Pvt) Ltd., Rangiri Sri Lanka Media (Pvt) Ltd., Lak View Brodcasting (Pvt) Ltd., Sat Net (Pvt) Ltd., Yellow Win Media (Pvt) Ltd., VIS Brodcasting Media (Pvt) Ltd., Sri Global Televition Company, Ask Media (Pvt) Ltd., Carlton Sports Network (Pvt) Ltd., Ritz Asia (Pvt) Ltd.,

මාධ්‍ය හිමිකාරිත්ව ආකෘතිය

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය තුළ හිමිකාරීත්වයට ප්‍රබල තැනක් හිමිවේ. එය ජනමාධ්‍යයේ සියලුම අංශ පාලනය කරනු ලබයි. හිමිකාරීත්වය අන්තර්ගතයට කරනු ලබන බලපෑම යම්තාක් දුරට අවම කරගත හැකි ව්‍යුහයක් මෙම ආකෘතියෙන් පැහැදිලි කෙරේ.



(විජයානන්ද රූපසිංහ,2009)

මෙහිදී ජනමාධ්‍ය හිමිකාරීත්වයට ප්‍රධාන කොටස් තුනක් සම්බන්ධ කෙරේ.

01. රජය :- ජනමාධ්‍යයට අදාළ ප්‍රධාන ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය රජය සතු වේ. ඒවා නීති අණපනත් ආදී ලෙස වරින් වර ඉදිරිපත් විය හැකිය. රටක පොදු මාධ්‍ය ප්‍රතිපත්තියක් සැකසීම මඟින් වඩා ක්‍රමවත් මාධ්‍ය ව්‍යුහයක් සකස් කරගත හැකිය. ජනමාධ්‍ය ආයතන හා ඒවායේ ක්‍රියාකාරීත්වය, විද්‍යුත් මාධ්‍ය සංඛ්‍යාත පද්ධති බෙදා දීම, දැන්වීම් ප්‍රතිපත්ති ආදී වශයෙන් විවිධ අංශ යටතේ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමේ හැකියාව රජය සතු වේ. එය ඍජු ලෙස ජනමාධ්‍ය හිමිකාරීත්වය පාලනය කිරීමට බලපානු ලැබේ.

02. නියාමන කොමිසම :- රටක ජනමාධ්‍ය පාලනය හා විමර්ශනය සඳහා කිසියම් ආකාරයක ජනමාධ්‍ය කොමිසමක් ස්ථාපිත කිරීම බොහෝ රටවල දැකගත හැකි තත්ත්වයකි. එමගින් ජනමාධ්‍යයට අදාළ ආචාරධර්ම හා මාර්ගෝපදේශයන් වරින් වර ඉදිරිපත් කළ හැකිය. ජනමාධ්‍ය හිමිකාරීත්වයේ බලපෑම් අවම කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ බලතල කොමිසම සතු විය යුතුය. කොටස් අයිතිය, දේශපාලන ප්‍රචාර, පක්ෂපාතීත්වයන් යනාදී විවිධ අංශයන් ඒ සඳහා ඇතුළත් වේ. මෙම කොමිසම පූර්ණ රාජ්‍ය කොමිසමක් ලෙස නොව කිසියම් ආකාරයක ජනමාධ්‍ය නියෝජනයන් සහිත කොමිසමක් බවට පත් කළ යුතුය.

03. මහජනතාව :- ජනමාධ්‍ය හා හිමිකාරීත්වය විෂයෙහි මහජනතාවට ද ප්‍රබල කොටසක් හිමිවේ. ඒ සහභාගීත්වය මඟිනි. මාධ්‍යයේ හිමිකාරීත්වයට තනි තනි වශයෙන් හා පුද්ගල කණ්ඩායම් ලෙස සහභාගී විය හැකිය. එමගින් ප්‍රජාවක් ලෙස මාධ්‍ය නිරීක්ෂණයේ යෙදීමේ හැකියාව ද සතු වේ. මහජනතාවගේ සක්‍රීය සහභාගීත්වය මඟින් ජනමාධ්‍ය පාලනය කළ හැකිය. සමාගම්වල කොටස් නිකුතුවල දී කොටස් අයිතිය ලබා ගැනීමට ද සහභාගි විය හැකිය.

රජය, නියාමන කොමිසම හා මහජනතාව අතර පවත්නා අන්තර් සම්බන්ධතාව ද මෙම ආකෘති මඟින් පෙන්නුම් කෙරේ. රජය හා නියාමන කොමිසම අතරත්, නියාමන කොමිසම හා මහජනතාව අතරත්, මහජනතාව හා රජය අතරත් එම සබඳතාව ක්‍රියාත්මක වන්නේ සහභාගීත්වය, ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ මඟින් ජනමාධ්‍ය හිමිකාරීත්වය සඳහා බලපෑමක් එල්ල වන අයුරිනි.

සමාලෝචනය

ජනමාධ්‍ය හිමිකාරිත්වය අතිශය සංකීර්ණ ස්වභාවයක් දැරුව ද ඒවායේ අන්තර්ගතය යම් ආකාරයකට පාලනය කළ හැකි ආකෘතියක් ලෙස මෙම මාධ්‍ය හිමිකාරිත්ව ආකෘතිය හඳුන්වා දිය හැකි ය. මෙය රජයේ භූමිකාවට වඩා මහජනතාවගේ භූමිකාව ග්‍රාහක සමාජ බිහි කරලීම මඟින් ශක්තිමත් කළ හැකි නම් වඩා වැදගත් වන බවද අවධාරණය කළ යුතු ය.

මූලාශ්‍ර

අයිවන්, වික්ටර්, (1999), නිදහස ජාතික ඒකාග්‍රතාව හා දේශපාලනයේ පවුල් පොරය, නන්දන මාරසිංහ අනුස්මරණ, (ග්‍රන්ථ ප්‍රකාශන) පදනම, රත්මලාන.

වික්‍රමසිංහ, සෝමසිරි සහ නිල්මල් (2005), ශ්‍රී ලංකාදේශපාලනයේපවුල් සබඳතා (ඇස්. ඩී. බණ්ඩාරනායක චරිතාපදානය සහිත ව), සමයවර්ධන, කොළඹ 10.

විජේතුංග, ගාමිණී. (2003), ශ්‍රී ලංකාවේ පුවත්පත් අයිතිය සහ දේශපාලන සන්නිවේදනය, සරසවි ප්‍රකාශකයෝ.

Altschull; J; Herbert; (1995) Agents of Power; The media and public policy; Longman; USA

Curren; James; Gurevitch; Michael; Woollacortt; Janel ed. (1977) Mass Communication and Society Edward Arnold; Open university press

Djanlov; Simeon; McLiesh; Caralee; Nenova; Tatiana; Shleifer; Andrei (2002); Who owns the media? World Bank.

Doyle; Gillian; (2002);Understanding media Economics; sage.

Gunawardena, Nalaka, Ed , (2016) Rebuilding Public Trust,Colombo, Sri Lanka.

Herman; Edward S and McChesney Robert W; (2004); The Global media; the new missionaries of Corporate Capitalism; Continuum.

Hulugalle; H A J; (1960); The life and times of D. R. Wijewardena; A N C L; Colombo.

Jiggins; Janice; (1979); Caste and family in the politics of the Sinhalese 1947-1976; KVG de Silva and Sons Colombo Ltd.

Karlelar; Larin Deutsch (ed) 2005; Freedom of the press 2005; A Global Surrey of Media Independence; Freedom House; USA

Kunczik; Michael, (1997); Media Giants; Ownership concentration and Globalisation FES

Kuhn; Raymond; (2005); The media in France; Roultedge.

Marw; Karl; Engels; Frederick; (1964) The German Ideology; Progress Publishers; Moscow

Petkovic; Brankica; ed. (2004) media Ownership and its impact on media independence and Pluralism; Peace Institute Slovenia.

Rice; Ronald E. ed. (2008) Media Ownership Research and Regulation Hampton Press; New Jercy

Thomas; Pradeep N and Nain; Zahrom (ed) (2004); Who Owns the media?; WACC

Tunstall; Jeremy and Palmer; Michael, (1991); Media Moguls; Routledge.

05

ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික-සංකල්පීය ගැටලු පිළිබඳ විමර්ශනයක්

ටියුඩර් වීරසිංහ

ශ්‍රී ලංකාවේ පමණක් නොව බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේදි ක්ෂේත්‍රයේ න්‍යායික සංකල්පීය අංගය පමණක් නොව එහි ප්‍රායෝගික අංගය ද බිහි වී වර්ධනය වන්නට වුයේ බටහිර ලෝකය සමඟ වූ අන්තර් ක්‍රියාකාරීත්වය සහ බලපෑම තුළ බව ප්‍රකටය. සංවර්ධනය වෙමින් පවතින රටවල පොදු තත්ත්වය හැඩ ගැසෙන්නට වුයේ 17 සහ 19 වන සියවස් තුළ යුරෝපීය රටවල වර්ධනය වූ කාර්මික සහ ආර්ථික නැගීමේ සහ යටත් විජිත කරණයේ ප්‍රතිඵලයක් වශයෙනි. කාල් මාක්ස්ට අනුව යටත්විජිත ප්‍රාග්ධනයේ ව්‍යාප්තිය ඉතිහාසයේ ප්‍රාදේශිය ස්වරූපය නිමාවට පත් කළ අතර එය ලෝක ඉතිහාසයක් බවට පත්විය. මේ සංවර්ධනය වන රටවල පොදු තත්ත්වය හැඩ ගැසුනේ ලෝක ධනේශ්වර පද්ධතියේ අවියෝජනීය කොටසක් ලෙසය. මෙය 19 සහ 20 වන සිය වස් සීමාව තුළ සිදු වූ අතර එය ඒ රටවල අනාගත ඉරණම කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයක් බවට පමණක් නොව ලෝක ඉතිහාසයේ ගමන් මග කෙරෙහි බලපාන ලද ප්‍රබල සාධකයක් බවට පත්වි ය.

එසේම සංවර්ධනය වෙමින් පවතින රටවල සංස්කෘතික සහ විද්‍යාත්මක චින්තනය හැඩගැසීමේ ක්‍රියාවලිය ද ද්විත්ව ස්වරූපයක් ගත් බව පෙන්වා දිය යුතු ය. එක් අතකින් පරිවාරික යථාර්ථය පාදක කොට ගෙන නිර්මාණය වූ ස්වවිඥානය ද පසුකාලීනව එම රටවල සමාජ දේශපාලන සංස්කෘතික විද්‍යාත්මක ලෙස බලපාන ලදී. පරිවාරික විඥානය යටත් විජිතවාදය සමගම බිහි වූ අතර ස්ව විඥානය යටත්විජිතවාදය එරෙහි අරගලය තුළ වර්ධනය වූ බවට පෙනේ.

පාරිවාරික විඥානය ශිෂ්ටාචාරික ආගමික ආලෝකන අදහස්වල ස්වරූපයෙන් ක්‍රියාත්මක වන අතර එම අදහස් සංකල්ප මතවාද වර්තමානයේදී ද ශ්‍රී ලංකාව වැනි පශ්චාත් යටත් විජිත සමාජවල ක්‍රියාත්මක වන්නේය. එසේම මේ වර්ගයේ විඥාන ස්වරූපය තුළ ප්‍රාග් යටත් විජිත ගතානුගතික සංඝටක ද අන්තර්ගතව පවතින්නේ ය. මෙම ලෝක සන්නිවේදනය සමහර විට පාරිවාරික විඥානාය් කොටසක් බවට හෝ ස්ව විඥානය නිර්මාණය වීමේ කොටසක් බවට හෝ පර්වර්තනය විය හැකි ය. ඒ අනුව එය

පවිත්‍ර ලෙස පරම ලෙස සාම්ප්‍රදායික විඥානය ලෙස ක්‍රියාත්මක වීමට අසමත් වන්නේ ය. එය ව්‍යාජ සාම්ප්‍රදායික හෝ අර්ධ සාම්ප්‍රදායික හෝ ස්වරූපයකට පත් වන්නේය. නමුත් බාහිරින් පැමිණියත් මේ පරිවාරික විඥාන යම් කෘතිම විඥානයක් නොවන බව අවධාරණය කළ යුතුය. මෙම පාරිවාරික විඥානය සංවර්ධනය වන සෑම රටකම වාගේ ප්‍රතිනිෂ්පාදනය වෙමින් සුරක්ෂිතව පවතින්නේ අසමාන වූ තත්ත්වයන් මත ය. මේ පාරිවාරික විඥානය බොහෝවිට බටහිර රටවල සිදු වන විද්‍යාත්මක තාක්ෂණික සංස්කෘතික සහ දෘෂ්ටිවාදී සොයා ගැනිම් සහ වර්ධනයක් සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රබුද්ධ ප්‍රජාවේ න්‍යායික සහ සංකල්පීය සැකැස්ම නිර්මිත කරන්නේය. මෙහිදී විශේෂයෙන්ම අවධාරණය කළ යුත්තේ ධනේෂ්වර කේන්ද්‍රීය රටවල විද්‍යා තාක්ෂණික විප්ලවයේ අසහාය සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රබුද්ධ ප්‍රජාවට සම්බන්ධ වන්නේ අසංවර්ධිත අවිධිමත් නව ලිබරල් වෙළඳ පොළ සන්දර්භයක් තුළ සහ ව්‍යාජ සාම්ප්‍රදායික විඥානික සැකැස්මක් තුළ බවයි. මේ තත්ත්වය තුළ පාරිවාරික විඥානයෙහි අභේදනීය ගතිලක්ෂණයක් වන ආකෘතිකත්වය සහ අනුකරණත්වය උත්කර්ෂණය වන්නේය. විශේෂයෙන්ම මෙහිදි අපට වැදගත් වන්නේ එම තත්ත්වය මානව සහ සමාජ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ න්‍යායික සහ සංකල්පීය සැකැස්ම තුළ වර්ධනය වීමයි. මේ අනුව පෙනී යන්නේ පාරිවාරික විඥානය ඊට ගැලපෙන්නා වූ මානව සහ සමාජ විද්‍යාත්මක න්‍යායිකත්වය සංකල්පිය සැකැස්මක් හැඩගස්වනු ලබන බවයි. එනම් යුරෝපීය ඥාන නිෂ්පාදන ක්‍රියාවලිය තුල න්‍යායික සහ සංකල්පීය පද්ධති පාරිවාරික යථාර්ථය තුල යම් යම් විකරණයන්ට ලක් කරන්නේය.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ මානව සහ සමාජ විද්‍යා ක්ෂෙත්‍රයේ න්‍යායික සහ සංකල්පීය ඌන සංවර්ධිත භාවය සාවද්‍ය අර්ථාරෝපණ භාවය, අවිනිශ්චිත භාවය, ව්‍යාජ ආර්ථික මත ආදියට අප ඉහත ගෙන හැර දක්වන ලද සාධක පාදක වී ඇති අතර ඊට අමතරව දැඩි සදාචාරාත්මක භාවය දැඩි ආගමිකභාවය එසේම දෘෂ්ටිවාදි බහු ආංශිකභාවය පන්න සහ පන්ති සම්බන්ධතාවල ඌන සංවර්ධනය සහ විශේෂයෙන්ම සුවිශේෂි සමුහන විඥානයක් පැවැත්ම සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාවේ සමාජ ජීවිතයේ දෘෂ්ටිවාදී නිර්මිතින්ගේ මූලික ලක්ෂණයක් ලෙස මෙය ගෙන හැර දැක්විය හැක්කේ එහි සංකර, විචිත්‍ර ස්වභාවය එකිනෙකට සංයෝජන කළ නොහැකි මූලධර්ම පවා සැබෑ ජීවිතයේ දී සංගත වීමක් අත්දැකිය හැකි ය. සාම්ප්‍රදායිකවාදය සහ නූතනවාදය, උන්මූලවාදය (රැඩිකල්වාදය) සහ ගතානුගතිවාදය, ධනවාදය සහ සමාජවාදය, ජාතිවාදය සහ ජාතිකවාදය නිදර්ශන වශයෙන් දැක්විය හැකිය. 1970 ගණන්වලදී මෙම ප්‍රතිවිරෝධීය ප්‍රවණතා සංශ්ලේෂීය අභිනතියක් ඔස්සේ වර්ධනය වීමේ ප්‍රයත්නයක් නීරීක්ෂණය වන්නට විය. පශ්චාත් යටත් විජිතවාදී ශ්‍රී ලංකාවේ මේ කාලය සංක්‍රාන්තික සහ බහු ආංශික ස්වරූපයක් පෙන්නුම් කළ අතර සමාජ විඥානය සහ චින්තනය තුළ දෙමුහුන් සංකර, සංගත සහ සාරසංග්‍රහවාදී ගතිලක්ෂණ ආධිපත්‍ය දැරි ය. චින්තන මාදිළිය සාම්ප්‍රදායිකත්වය සහ නූතනත්වය අතර කේන්ද්‍රගත වූ අතර විඥානයේ ගතිකත්වය බොහෝ දුරට නිර්ණය වුයේ බාහිර බලවේග වලට අනුකූලව ය. එසේම අධෝව්‍යුහයට වඩා උපරිව්‍යුහයේ නිර්ධාරක බලපෑම ප්‍රබල විය.[1] මෙම ක්‍රියාවලියේ මූලික කතෘකයින් ලෙස ඉදිරිපත් වුයේ ජාතිය, ගොවියෝ සුළු ධනේශ්වරය , මධ්‍යම පන්තිය සහ සමීප සමාජ පන්ති සහ ස්ථර සහ වර්ධනය වෙමින් පැවැති කම්කරු පන්තිය සහ ධනේෂ්වර පන්තියන් ය. මෙහිදී ව්‍යුහාත්මකව සමාජ විඥානයේ සහ චින්තනයේ වර්ධනය විමසා බලන ලද්දේ සාම්ප්‍රදායිකත්වය හා නූතනත්වයත්, ජාතිකත්වය සහ යටත් විජිත තත්ත්වයත් අතර අරගලයේ ප්‍රිස්මය තුළිනි. ජාතිකත්වයේ සහ යටත් විජිතවාදයේ සංශ්ලේෂණය තුළ ක්‍රියාවලියේ වර්ධනය දුටු අතර එකිනෙකා අතර පවත්නා අන්‍යෝන්‍ය වාසිදායක සම්බන්ධතාව සහ සමාකර්ෂණය තුළ සංවර්ධනය අර්ථ දක්වන ලදි.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල සමාජ, දේශපාලන, සංස්කෘතික තත්ත්වයන් ප්‍රජානනය කර ගැනීම එම සමාජයන්හි ස්වවිඥානය හැඩ ගැසීමත් සමඟම සිදු විය. එම රටවල ස්වවිඥානය වඩාත් පරිනත වීමට සාපේක්ෂ එහි විද්‍යාත්මක චින්තනය ද වඩාත් වර්ධනය වන්නට විය. විශේෂයෙන්ම මෙම ඍජු සහ ද්විපාර්ශ්වික සම්බන්ධතාව සමාජ - මානව විද්‍යා ක්ෂේත්‍රයන්හි න්‍යායික චින්තනය වර්ධන වීම කෙරෙහි බලපෑවේ ය. එම වර්ධනයන් විද්‍යාත්මක ප්‍රජානනයේ ශෛලියට සහ සංවර්ධනය වෙමින් පවතින සමාජවල හරයේ සහ එම රටවල් විශේෂතා සහ නියමානුකූලතා පිළිබඳවත් තිබූ න්‍යායික හා සංකල්පීය ආකල්පයන් අන්තර්ගතය වෙනස්වීම කෙරෙහි බලපෑවේය. යටත්විජිතවාදය විසින් විකෘතිකරන ලද සංවර්ධනය වෙමින් පවතින රටවල යථාර්ථය සහ එහි පාරිවාරික චින්තනයේ ශෛලිය මැඩපැවැත්වීම සඳහා ක්‍රියාවලින් අවබෝධකර ගැනීමේ නව ප්‍රජනන ශෛලියක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය කර්තව්‍යයක් විය. ඒ අනුව මේ සමාජවල යථාර්ථය පිළිබඳව විචාරාත්මක සහ නිර්මාණාත්මක චින්තන ශෛලියකින් තොරව මේ රටවල ආධිපත්‍ය දරන පාරිවාරික සහ අනුකාරික විඥානය සහ චින්තනය වෙනස් කළ නොහැකි ය.

ශ්‍රී ලංකාවේ සමාජ - මානව විද්‍යා ක්ෂේත්‍රයේ භාවිත න්‍යායික සහ සංකල්පීය පරිගතයේ තාර්කික ස්වරූපයත්, එහි ප්‍රජානන ශක්‍යතාවන් යළි සලකා බැලීම කාලීන සහ ශාස්ත්‍රීය අවශ්‍යතාවක් බව පෙන්වා දිය යුතු ය. මෙහිදී විශේෂයෙන් අපගේ අවධානය යොමු වන්නේ ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික සංකල්පීය ප්‍රදේශයේ දැනට භාවිත වන න්‍යායික සංකල්ප ගැටලු කීපයක් පිළිබඳව විමර්ශනය කිරීම ය. මේ සම්බන්ධව මූලික කාරණා හතරක් වෙන් කර හඳුනා ගත යුතු ය.

1. බටහිර කේන්ද්‍රියව නිර්මාණය වූ පෙරදිග සමාජ ක්‍රමය නවීකරණය කිරීම කෙරෙහි යොමු වී ඇති ක්‍රමවේදීය ආකෘතිකවාදය , දෘෂ්ටිවාදී ගතානුගතිකවාදය සහ කෘත්‍යවාදී ඒකමානීත්වය ආදිය පිළිබඳව විචාරාත්මකව ප්‍රතිසමාලෝචනය කිරීමේ ගැටලු

2. ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේදී න්‍යාය යන ක්ෂේත්‍රයේ භාවිත න්‍යායික සහ සංකල්පීය පද්ධතියේ ඌන සංවර්ධිත භාවය , ඌන උපයෝජිතභාවය සහ ඊට සිදු කොට ඇති ව්‍යාජ අර්ථාරෝපණය පිළිබඳ ගැටලු.

3. ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික සහ සංකල්පීය ව්‍යුහය තාක්ෂණිකවාදී සහ ආකෘතිකවාදී රාමුවක් තුළ ගොඩනැගී තිබීමේ ගැටලු.

4. සමකාලීන බටහිරවාදී සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේදී අධ්‍යයන ක්ෂේත්‍රයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යයේ ද අධ්‍යයනය සංවර්ධනය නොවීම සහ එහි ඓතිහාසික සීමා පිළිබඳ ගැටලු.

ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ පවතින මේ සමස්ත ගැටලු සංකීර්ණය ම මෙම විෂය ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය වී නම් , උත්තරාරෝපණය වී නම් සහ එහි ශාස්ත්‍රීය සම්ප්‍රදාය නියෝජනය කළ ප්‍රබුද්ධ ප්‍රජාවේ ඓතිහාසික සහ ශක්ෂණමය විශේෂතා සමඟ අවියෝජනීයව සම්බන්ධ බව අවධාරණය කළ යුතු ය.

මෙහි අප ගෙන හැර දක්වන ලද පළමු කාරණය අංග ඇංග්ලො - ඇමෙරිකානු න්‍යායික සහ සංකල්පිය ආකෘතිය අවිචාරාත්මක ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය ක්ෂේත්‍රයට ආරෝපණය කිරීම හා සම්බන්ධ වන්නේ ය. මෙම බටහිරවාදී සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ ක්‍රමවේද සහ සංකල්ප විශ්වීය අභිනතියක් සහිත ගෝලීය නියමයන් ලෙස අප රටවල පිළිගැනීමට ලක්වීම අදාල ක්ෂේත්‍රවල විචාරාත්මක සහ නිර්මාණාත්මක වර්ධනයන් වළකාලීමට හේතු වූ සාධකයක් විය. සමාජයෙහි පැවතුන සංහතික මාධ්‍ය සංස්කෘතියට සහ සමාජ සැකැස්මට සාපේක්ෂව මේ න්‍යායික සහ සංකල්පීය ආකෘති ආකර්යාත්මකවීම ක්‍රියාකාරීත්වවාදයෙන් තොර වීම , සුලභ සත්‍ය බව, ද්විතියිය ගැටලු කෙරෙහි යොමු වීම, එනම් අධ්‍යයනයට යොමු වූ යථාර්ථයේ වඩාත් වැදගත් පැතිකඩ මඟ හැරීම, විකෘති කිරීම, හරසුන් විශ්ලේෂණ එසේම අධිවියුක්තිකරණ සහ අධිආකෘතික බහුලව දැකිය හැකි විය.

දෙවන කාරණය සම්බන්ධව මෙය ශ්‍රී ලංකාවේ සංහතික මධ්‍යවේද ක්‍රියාකාරිත්වය නියෝජනය කරන තල ත්‍රිත්වය තුළම දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ ඊට අදාළ සංකල්ප වල ඌන සංවර්ධිත භාවය සහ ඌන උපයෝජිතභාවය පිළිබඳ ගැටලුවයි. ශාස්ත්‍රාලීය තලය, වෘත්තිය තලය සහ සංහතික තලය එම තල ත්‍රිත්වය වන අතර ඒවා අන්‍යෝන්‍ය වශයෙන් සහසම්බන්ධිතව ක්‍රියාත්මක වේ. නිදර්ශනයක් වශයෙන් ශාස්ත්‍රීය තලය තුළ භාවිත කරුනු ලබන ''ජන'' යන සංකල්පය ගෙන හැර දැක්විය හැකි ය. මේ ''ජන'' යන සංකල්පය ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව ව්‍යවහාර වීම ආරම්භ වන්නක් 1970 දශකය ආරම්භයේ දී බව පෙනේ. එනම් ශ්‍රී ලංකාව තුළ ජන සන්නිවේදන විෂයයක් වශයෙන් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යයනය ආරම්භ වන කාලයේ දී ය. 1973 දී කැලණිය විශ්වවිද්‍යාලයේ දී සන්නිවේදනය විෂයයක් ලෙස අධ්‍යයනය ආරම්භ විය. නමුත් ජනසන්නිවේදනය පමණක් නොව ''සන්නිවේදනය'' යන සංකල්පය ද 70 දශකය ආරම්භයේ දී පවා ශ්‍රී ලංකාව තුළ භාවිත නොවී ය. ශ්‍රී ලංකාවේ පුළුල් සාහිත්‍යයක හා සංස්කෘතික ප්‍රබෝධයත් සමඟ 1956 දී ප්‍රකාශයට පත් වී ඇති ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ ද සන්නිවේදනය හෝ ජන සන්නිවේදනය යන සංකල්ප ඇතුළත් නොවේ. ''සන්නිවේදනය යනු හැත්තෑව දශකය ආරම්භයේ දී ලාංකීය සමාජය තුළ භාවිත වචනයක් නොවේ.''[2]

ශ්‍රී ලංකාව තුළ ජනසන්නිවේදන අධ්‍යයන පාඨමාලා බිහි වන්නේ එවකට පැවතුන විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ පොදු අර්බුදයක ප්‍රතිඵලයක් වශයෙන් ය. 1971 කැරැල්ල උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව තවත් තහවුරු කළ අතර ඊට ප්‍රතිචාර ලෙස වෘත්තියාභිමුඛ පාඨමාලා ඇති කිරීමේ ප්‍රතිපත්තිය යටතේ ජනසන්නිවේදන පාඨමාලා ද බිහි වූ බව පෙන්වාදිය යුතුය. මෙම දේශපාලනික සහ පරිපාලනික සාධක ද ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේදී අධ්‍යයනයේ සංකල්පීය සහ න්‍යායික ව්‍යුහය සකස්වීමෙහිලා බලපා ඇති බව සිතිය හැකිය.

යුරෝපීය රටවල සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන පාඨමාලා ආරම්භ වන්නේ දේශපාලනික හෝ පරිපාලනික මැදිහත්වීම්වල වඩා සමාජ - සංස්කෘතික සහ විශේෂයෙන්ම නව සමාජ සැකැස්මක් වශයෙන් සංහතික ස්වරූපය හැඩ ගැසීමට සමාන්තරව ය. යුරෝපා ශිෂ්ටාචාරයේ සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස නව සමාජ සැකැස්මක් වශයෙන් සංහතිකත්වය සහ සංහතික සම්බන්ධතා වර්ධනය විය. ඊට සමගාමීව සංහතික මාධ්‍ය ගොඩ නැගිණි.

ශ්‍රී ලාංකික සමාජ සංවිධාන රටාවේ බලපෑම්වල සුවිශේෂතා සහ මානව ද්‍රව්‍යයේ නිලීන යම් යම් ගති ලක්ෂණ ද පාදක කොට ගෙන ශ්‍රී ලංකාව තුළ නව සමාජ සැකැස්මක් ලෙස සංහතිකත්වය හැඩගැසීමේ විශේෂතා ශ්‍රී ලංකාවේ ජනසන්නිවේදනය අධ්‍යයනය ක්ෂේත්‍රයේ සංකල්ප පද්ධතිය කෙරෙහි බලපා ඇති බව පැහැදිලි ය.

යුරෝපයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ mass communication වශයෙන් ප්‍රචලිත වූ මෙම සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව තුළ ජනසන්නිවේදනය ලෙස නාමකරණය කෙරේ. නමුත් අපගේ මූලික ගැටලුව වන්නේ යුරෝපයේ "mass" ලෙස හඳුනා ගන්නා නූතන යුගය තුළ සංවර්ධනය වූ මේ නව සමාජ සැකැස්ම හැඳින්වීම සඳහා සිංහල භාෂාවේ ''ජන'' යන සංකල්පය භාවිත කිරීම කොතෙක් දුරට විද්‍යාත්මක ද යන්න ය. ''ජන'' යන සංකල්පය මානව වර්ගයාගේ සමාජීය පරිණාමයේ දී විශේෂයෙන්ම මධ්‍යතන යුගයේ දී හැඩගැසුන මානවකයින් පාදක කොටගත් සමාජ සැකැස්මකි. එය යුරෝපයේ "Folk" ලෙස හඳුනාගත් අතර ඊට සිංහල භාෂාවෙන් 'ජන'' යන්න භාවිත කෙරේ.

මේ අනුව Folk (ජන) mass (ජන) සංකල්පීය සහ න්‍යායික පමණක් නොව ප්‍රායෝගික - පාරිහරික ක්ෂේත්‍රයේ දී ද පැටලිල සහගත බවක් සහ අවිනිශ්චිත බවක් ඇති කරන්නන් ය. මේ නිසා සිංහල භාෂාවේ ජන යන සංකල්පය ඓතිහාසික වශයෙන් එකිනෙකට වෙනස් සංකල්ප දෙකක් වන "Folk සහ Mass" හැඳින්වීම සඳහා භාවිත කිරීම යෝග්‍ය සහ විද්‍යාත්මක නොවන බව අවධාරණය කළ යුතු ය. මේ නිසා mass යන සංකල්පය හැඳින්වීම සඳහා සිංහල භාෂා ව්‍යවහාරය තුළ දී ''සංහතික'' යන සංකල්පය වඩාත් යෝග්‍ය සහ විද්‍යාත්මක බව අපගේ වැටහීමයි.

නූතන ලෝක සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ "Mass", "Mass Communication", "Mass Media", "Mass Society", "Mass Culture", "Mass War", "Mass Revolutions" යන සංකල්පවල ඓතිහාසික සහ සමාජීය නිශ්චිත විශේෂතා ගැබ් ව ඇති අතර ඒ අනුව "Mass" යන්න අප අවබෝධ කරගත යුතු වන්නේ ''නූතන සමාජ සැකැස්මේ නව මාදිලියක් වශයෙනි''[3] ඉහත ඉංග්‍රීසි පාරිභාෂික වෙනුවට සිංහල භාෂාවෙන් පිළිවෙළින් සංහතික , සංහතික සන්නිවේදනය, සංහතික මාධ්‍ය, සංහතික සමාජය, සංහතික සංස්කෘතික, සංහතික විප්ලවය යොදා ගත හැකි බව අපගේ අදහසයි. මෙයට අමතරව එකම අර්ථය සහිත සංකල්ප සඳහා විවිධ පාරිභාෂීය භාවිතය ද මඟහැරී යනු ඇත. නිදර්ශනයක් "Mass Media" සහ "Mass Culture" යන්න දැනට භාවිත සිංහල යෙදුම් වන ''ජන මාධ්‍ය'' සහ ''බහුජන සංස්කෘතිය '' නව භාවිතය තුළ ''සංහතික මාධ්‍ය'' සහ සංහතික සංස්කෘතිය ලෙස යෙදිය හැකි ය.

එසේම සම්මත ලෝක ශාස්ත්‍රීය භාවිතය තුළ යෙදෙන "Folk Song", "Folk Dance", "Folk Art". සඳහා සිංහල පාරිභාෂීය ලෙස පිළිවෙළින් ''ජන ගී, ජන නැටුම් , සහ ''ජන කලා'' වශයෙන් පැහැදිලිව භාවිත කළ හැකි ය.

අධ්‍යයනයේ දී පෙනී යන මූලික කාරණයක් වූයේ ''ජන '' යන සංකල්පය "Mass" යන සංකල්පයෙන් අදහස් කරනු ලබන භාෂාවේදාත්මක හා සංඥාර්ථවේදී අර්ථය පමණක් නොව දාර්ශනික - ඥාන විභාගාත්මක මෙන්ම දේශපාලනික - සමාජ විද්‍යාත්මක අර්ථය ප්‍රකාශ කිරීම සඳහා සුදුසු නොවන බවයි. මේ නිසා "Mass" යන සංකල්පයෙහි ගම්‍යමාන සියලු නෛසර්ගික ගුණාංග සහ ගතිලක්ෂණ

සංයෝජනය කිරීමට හැකි සිංහල පාරිභාෂිතයක් වශයෙන් සංහතික යන සංකල්පය වඩාත් යෝග්‍ය බව පෙනී යයි.

ශ්‍රී ලංකාවේ සමාජ - මානව විද්‍යා සම්ප්‍රදාය තුළ විශේෂයෙන්ම සංහතික සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේදී අධ්‍යයන ක්ෂේත්‍රයේ දශක හතරකට වඩා වූ ඉතිහාසය තුළ සංහතික (Mass) යන සංකල්ප ගැඹුරින් සහ පුළුල් ව අධ්‍යයනය කොට නැත. මේ අනුව වසර 40 කට ආසන්න කාලයක් ගත වුවත් අපේ ශාස්ත්‍රාලීය අධ්‍යයනයට සංහතික අනිශ්චේය (Mass Problematic) හරය අල්ලා ගෙන නැති බව පෙනේ.

සමකාලීන මානව වර්ගයාගේ සමාජ පරිණාමය ගෝලීය අවධියකට ප්‍රවිෂ්ට වි ඇති තත්ත්වයක් තුළ එහි සංහතික ස්වභාවය ගෝලීය පරිමාණික තත්ත්වයක් අත්පත් කර ගෙන තිබේ. මානව සංහතියේ සමකාලීන සමාජ පරිණාමය තුළ සංහතික සාධකයේ සක්‍රීය භූමිකාව එන්න එන්නම වර්ධනය වන්නේ ය. න්‍යායික පර්යාලෝකය සිට නිරීක්ෂණය කරන විට සමස්ත මානව වර්ගයාගේ ඓතිහාසික, සමකාලීන සහ අනාගත සමාජ පරිණාම ක්‍රියාවලියෙහි ජන සහ සංහතික යන ගුණාංගයන් සහ සම්බන්ධතා යම් යම් මට්ටමට සහ ප්‍රමාණයට අන්‍යෝන්‍ය වශයෙන් සංයුක්තව ක්‍රියාත්මක වන බව පෙනේ. වර්තමාන ශිෂ්ටාචාරය තුළ සහ සමාජය තුළ වර්ධනය වන සංහතික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා සංහතිකවේදයක (Massology) අවශ්‍යතාව තදින්ම දැනෙන්නේය. වර්තමානයේ දී ගෝලීය පරිමාණිකව සංහතිකකරණය (Massification) සිදු වෙමින් පවතින අතර ''සියලු පන්ති ගැටුම් සංහතික ගැටුම් බවට පරිවර්තනය වෙමින් පවතින්නේ ය. පන්ති අරගලය සංහතික අරගලයක් බවට පරිවර්තනය විම ජයග්‍රහණය කළ හැක්කේ මනෝවිද්‍යාත්මක මාධ්‍යයන් මගින් වන අතර ඒ අහි ද සන්නිවේදන අධ්‍යයනයට හිමි වන්නේ ප්‍රථම ස්ථානයකි.'' මෙය අද්‍යතන සංහතික මාධ්‍යයන්ගේ සමාජ භූමිකාව අවබෝධ කර ගැනිම සඳහා අපව යොමු කර වන්නේ ය.

අප ගෙන හැර දක්වන ලද දෙවන කාරණාවට සම්බන්ධව තවත් ගැටලුසහගත සංකල්පීය පාරිභාෂිතයක් වශයෙන් Journalism වෙනුවට භාවිත කෙරෙන ''පුවත්පත් කලාව'' දැක්විය හැකි ය. ශ්‍රී ලංකාවේ සමස්ත සංහතික මාධ්‍ය පද්ධතිය සේම පුවත්පත ද ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික සහ ප්‍රබුද්ධ - දෘෂ්ටිවාදී සම්ප්‍රදාය තුළ බිහි වී වර්ධනය වුවක් නොවන අතර එය යුරෝපීය ලිබරල් බුද්ධි සම්ප්‍රදාය මගින් අපට උත්තරාරෝපණය වූ යටත් විජිතවාදී සහ පශ්චාත් යටත් විජිතවාදී සංහතික විඥාපන මාධ්‍යයකි. යුරෝපයෙහි සංහතික තොරතුරු පාදක කොට ගෙන දැනුවත් කිරීමේ දෛනික හා පාරිහාරික ස්වරූපයක් ලෙස යුරෝපිය සමාජ සංස්කෘතික සහ ප්‍රබුද්ධ - දෘෂ්ටිවාදී සන්දර්භයට අවියෝජනීය සම්බන්ධතාවක් තුළ " Journalism" යන භාවිතය බිහි වී වර්ධනය විය.

වර්තමාන ලෝක Journalism විෂය ක්ෂේත්‍රයේ පරාමිතින් සහ එහි සන්දර්භය අර්ථභාරය පාදක ව ඇත්තේ මීට වසර ගණනාවකට ඉහත දී රෝමයේ සමාජ දේශපාලන ජීවිතයේ දෛනිකව සිදු වූ විශේෂ ගතික සහ චලන පිළිබඳව ප්‍රජාව සවිඥානික කිරීමේ සමාජ, දේශපාලනික සහ දෘෂ්ටිවාදී අවශ්‍යතාව පාදක කොට ගෙන බව පෙන්වා දිය යුතුය. මේ දෛනික සහ පාරිහාරික ජීවිතයට වැදගත් වන දෛනික සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීම රෝමවරුන් හඳුන්වන ලද්දේ "Acta Diurna" යන නමිනි. මෙහි Acta" යන්න ප්‍රවෘත්ති ලෙස ද " Diurna" යන්න කෙදිනක හෙවත් දිනපතා ලෙස අර්ථ දැක්විය

හැකිය. මේ අනුව" Acta Diurna" දිනපතා ප්‍රවෘත්ති යන අර්ථය ගෙන දෙන්නේ ය. යුරෝපීය භාවිතය තුළ Journalism යන සංකල්පයේ මුල රූපය දෛනිකත්වය සමඟ සම්බන්ධ වන්නේ ය. ප්‍රංශ භාෂාවේ " Journal " යන්න ''දිනපොත'' වන අතර එය දෛනික වාර්තාකරණයේ ආකෘතියකි. විශේෂයෙන්ම මධ්‍යතන යුගයෙන් පසුව යුරෝපීය මිනිසා ගේ කාලය කෙරෙහි වූ අනුස්ථාපනය වෙනස්වීම තව දුරටත් දෛනිකත්වයේ වැදගත්ම වර්ධනය විය. වර්තමානය අතික්‍රමණය කරමින් අනාගතය පිළිබඳ අදහස් යුරෝපීය විඥානය තුළ උත්කර්ෂණය වන්නට වූ අතර ඔවුන්ව දැන් වර්තමානය වැදගත් වන්නේ වර්තමානය තුළ නිලීන ගතික , චලන සහ ප්‍රවණතා අනාගතය වන බව අවබෝධකරගත් නිසා ය. වර්තමානයෙහි සිදුවන සංසිද්ධීන් , ක්‍රියාවලීන් සහ ප්‍රපංචයන් පිළිබඳව සවිඥානික වී නම්, දැනුවත් වීමේ ඒකායන පරිවර්තන , නිරූපණ ස්වරූපයක් වශයෙන් Journalism අතිශයින්ම වැදගත් විය. මේ ආකාරයට Journalism යනු සංහතික මාධ්‍ය පාදක කොට සංහතිකයින් සඳහා යොමු වූ සංහතික තොරතුරු ඒකරාශී කිරීමේ , අර්ථකථනය කිරීමේ, ප්‍රතිනිර්මාණය කිරීමේ, සංස්කරණය කිරීමේ, බහුලීකරණය කිරීමේ සමාජ - දේශපාලන සහ ප්‍රබුද්ධ - දෘෂ්ටිවාදී සමාජ ක්‍රියාකාරිත්වයකි. සිංහල භාෂාවේ මේ සඳහා දැනට භාවිත වන ''පුවත්පත් කලාව'' යන යෙදුම විද්‍යාත්මක නොවන බවත් ඒ සඳහා වඩාත් යෝග්‍ය පාරිභාෂිකයක් ලෙස ප්‍රවෘත්තිකරණය යෝජනා කළ හැකිය.

යුරෝපිය භාෂා භාවිතයේ එන Journalism වෙනුවට සිංහල භාෂාවේදී වෘත්තිය තලයේ දී ප්‍රවෘත්තිකරණය ද ශාස්ත්‍රීය තලයේ දී ප්‍රවෘත්තිවේදය ද භාවිතය මගින් අදාළ සංකල්පයේ නිලීන ඥානවිභාගාත්මක රූපජනකවේදී සහ රූපවිචාරවේදී තත්ත්වයන්ට සමපාත වන බව අපගේ අදහසයි. වර්තමාන ව්‍යවහාරය තුළ 'ප්‍රවෘත්ති' යන සංකල්ප පටු නොගැඹුරු සීමාවකට ඌනනය කර තිබේ. නමුත් මෙහි පළල් සහ ගැඹුරු අර්ථය තුළ දෛනික සත්තාවේ හැසිරීම ප්‍රකාශමාන වීම අර්ථවත් කරන්නේ[5] වර්තමාන අර්ථයෙන් Journalism හෙවත් ප්‍රවෘත්තිකරණය යනු සමාජය තුළ සාහිත්‍යයික සමාජ, දේශපාලනික සහ දෘෂ්ටිවාදී ක්‍රියාකාරීත්වයක් ප්‍රකට කරන්නා වූ පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය සහ අන්තර්ජාලය හරහා සමාජමය වශයෙන් වැදගත් තොරතුරු ඒකරාශී කිරීමේ, සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ හුවමාරුවේ, බහුලීකරණයේ සහ ව්‍යාප්තිකරණයේ ස්වරූපයක් ලෙස ක්‍රියාත්මක වන දෛනිකත්වය සහ කාලීනත්වය පාදක කොට ගත් සමාජීය භාවිතයකි.

ප්‍රවෘත්තිකරණය යනු මානව සංහතික යථාර්ථය කෙරෙහි ගොඩනගා ගන්නා සම්බන්ධතාව පිළිබඳව නව ස්වරූපයකි. එය පොදු වූ ද සාමූහික වූ ද බුද්ධිමය සහ නිර්මාණාත්මක ශ්‍රමය පාදක ප්‍රවෘත්තිකාරක (Journalist) ක්‍රියාකාරිත්වයකි. 'ප්‍රවෘත්තිකරණය සමාජය සඳහා ''සියලු සත්‍ය සමස්තයක් ලෙස අනාවරණය කරන්නේ එක් පුද්ගලයෙකු සියල්ල කිරීමේ ආකාරයෙන් නොව ශ්‍රම විභජනය මත පියවරෙන් පියවර සිදු වන සාමූහික ක්‍රියාකාරිත්වයක ප්‍රතිඵලයක් ලෙසය''[6] යැයි කාල් මාක්ස් නූතන සාමජයෙහි බුද්ධිමය සහ ප්‍රජානන භාවිතයක් ලෙස ප්‍රවෘත්තිකරණයේ ව්‍යුහය හරය දුටුවේ ය. මේ අනුව පුවත්පතකට සංස්කාරකත්වයක් මිස කර්තෘත්වයක් තිබිය නොහැකිය. නමුත් ශ්‍රී ලංකාවේ විශේෂයෙන් සිංහල පුවත්පත්වල සිටින්නේ ප්‍රධාන කර්තෘවරයෙකි. නමුත් මේ කර්මාන්තයේ ස්වභාවයට අනුව එහි සිටිය යුත්තේ ප්‍රධාන සංස්කාරකවරයෙකි. මෙය ද ශ්‍රී ලාංකේය සංහතික මාධ්‍යවේදයේ වෘත්තිය තලය කේන්ද්‍රකරගත් ගැටලුවකි.

සමහර විට ශ්‍රී ලාංකේය ආර්ථික නිෂ්පාදන ක්ෂේත්‍රයේ ද දෛනික සමාජ ක්‍රියාකාරී ක්ෂේත්‍රයේ ද බුද්ධිමය - දෘෂ්ටිවාදී ක්ෂේත්‍රයේ ද පැවති සරල, නොදියුණු, ඌනසංවර්ධිත සහ රේඛීය ශ්‍රම විභජනය මෙයට බලපාන ලද එක් හේතුවක් විය හැකි අතර දෙවන හේතුව ලෙස සංස්කෘතික - බුද්ධිමය ක්ෂේත්‍රයේ පැවැති ආධිපත්‍යවාදී සහ අත්තනෝමතික ලක්ෂණ ගෙන හැර දැක්විය හැක. ''සිංහල සමාජ ඉතිහාසය විඥානයේ ප්‍රධාන ධාරාව සැකසීමට උපස්ථම්භක වූ සම්භාව්‍ය ඉතිහාසය ආඛ්‍යාන සම්ප්‍රදානය වී ඇත්තේ රාජ්‍ය කේන්ද්‍රීයවය, ප්‍රභු කේන්ද්‍රීවය, වංශ කේන්ද්‍රීයවය, ඓතිහාසික බල උවමනාවන්ට අනුකූලවය''[7] ක්‍රමානුකූලව යුරෝපීය යටත් විජිත ආධිපත්‍යයේ බලපෑමක් සහ ශ්‍රී ලංකාවේ හැඩගැසෙමින් මධ්‍යම පන්තිය සිය සමාජ - දේශපාලන සහ සංස්කෘතික බලය අත්පත් කර ගැනීමේ සහ වර්ධනය කර ගැනීමේ වඩාත්ම ප්‍රබල දෘෂ්ටිවාදී මාධ්‍ය පවා ඔවුන් දැක්කේ පුවත්පත් බව සඳහන් කළ යුතු ය. එක් අතකින් යුරෝපීය සාහිත්‍යයික සහ දෘෂ්ටිවාදී විඥාපනික සම්ප්‍රදායන් ගේ ප්‍රාථමික අවබෝධය තුළ ද අනෙක් අතින් යුරෝපීය ප්‍රකාශන විශේෂයෙන් සාහිත්‍යයික, සමාජ දේශපාලන ප්‍රකාශනාර්ථ ලේඛනවේදීය සහ ප්‍රවෘත්තිකරණ ස්වරූපයන්ගේ ආභාසය යටතේ අපේ රටේ ප්‍රවෘත්ති කරණය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් නාමකරණය වූයේ සරල ප්‍රාථමික ප්‍රපංචයේ දී ස්වරූපයකිනි.

ඇත්ත වශයෙන්ම යුරෝපා ශිෂ්ටාචාරය තුළ ශත වර්ෂ ගණනාවක සිට වර්ධනය වූ මේ නව සාහිත්‍යයික - දෘෂ්ටිවාදී භාවිතය ඒ රටවල සමාජ - බුද්ධිමය ශ්‍රම විභජන මාදිලියට අනුකූලව සකස් වී වර්ධනය වී පුළුල් සමාජ ගත ප්‍රබුද්ධ හා නවීකාරක ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය. නමුත් ප්‍රවෘත්තිකරණය නව සමාජ - දේශපාලනික සහ සාහිත්‍යයික දෘෂ්ටිවාදි භාවිතයන් ලෙස ශ්‍රී ලංකාව සඳහා ආගන්තුක හා අලුත් දෙයක් විය. අප රටේ නූතන සන්නිවේදන සහ මාධ්‍ය මාදිලියේ ව්‍යුහය කර්තෘ කේන්ද්‍රීය ප්‍රවණතාවක් ගත්තේ ය. එසේ සමාජ සම්බන්ධතාවන්ගේ සහ චින්තනයේ කර්තෘ කේන්ද්‍රීය ප්‍රවණතාවද නූතන සන්නිවේදන සහ සංහතික මාධ්‍ය හා ප්‍රවෘත්තිකරණය මත කර්තෘ ආකල්පය ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන ලද ප්‍රබල සාධකයක් ලෙස සැලකිය හැකිය. ආරම්භක ලාංකේය පුවත්පත් කර්තෘ කේන්ද්‍රීය ප්‍රවණතාවක් අත්පත්කර ගැනීමට ඉහත ගෙන හැර දක්වන ලද සාධක සහ කොන්දේසිවලට අමතරව ලාංකේය ප්‍රබුද්ධ සහ ආධ්‍යාත්මික සම්ප්‍රදායේ ඌන සංවර්ධිත භාවය ද බලපා තිබේ. පුවත් පතක් නවීකරණය විය යුතු අන්දම ඔහු (ඩී.පී. කුරුකුලසූරිය කර්තෘ ඥානාර්ථ ප්‍රදීපය) දැන නොසිටියා පමණක් නොව පරණ හණ මිටි අතහරින්නට කැමති වූයේ ද නැත.''[8] මෙය ශ්‍රී ලංකාවේ බුද්ධිමය සහ නිර්මාණාත්මක ක්ෂේත්‍රයේ නොදියුණු ශ්‍රම විභජන ලක්ෂණ සහ එහි ගතානුගතික පසුගාමී තත්ත්වයන් පෙන්වන ගති පුවත්පත ස්ථාපනය වන සහ සංවර්ධනය වන යටත් විජිත සහ පශ්චාත් යටත් විජිත යථාර්ථයේ ධනේශ්වර සම්බන්ධතා පද්ධතිය තුළ ස්ථානගත වීම කෙරෙහි දක්වන ලද්දේ මන්දගාමී ස්වභාවයකි. සාම්ප්‍රදායික සමාජ සම්බන්ධතා පද්ධතිය බිඳ වැටෙමින් වාණිජවාදී සංකීර්ණ සම්බන්ධතා හැඩගැසෙමින් තිබිණ. ''මෙය වටහා ගැනීමට තරම් වර්ධනය වූ බුද්ධියක් පොදු ලාංකිකයා සතුව නොතිබුණි.''[9] යුරෝපීය රටවල ද ප්‍රවෘත්තිකරණය සංහතික මාධ්‍යයේ පමණක් නොව වෙනස් විෂයන්ගේ ද සංකල්පීය ව්‍යුහය වර්ධනය වීම අදාළ සමාජයේ වර්ධනය සහ ඊට සමගාමීයව සිදු වූ අදාළ විෂයික වාක්කෝෂීය වර්ධනය සමඟ සිදු වී ඇති බව පෙනේ. යම් සමාජයක භාෂා විෂයික සංකල්ප හැඩගැසීමෙහිලා එම සමාජ මානව ද්‍රව්‍යයේ බලපෑම නියමානුකූලතාවකි. '' ශාස්ත්‍රීය කරණය සඳහා පමණක් නොව දිනපතා ප්‍රවෘත්ති හා දැන්වීම් පළ කිරීම සඳහා සුදුසු මාධ්‍යයක් ලෙස සිංහල ගද්‍ය භාෂාව සකස් කර ගැනිමේ කාර්යය මුල් කාලින පත්‍ර කර්තෘවරුන් අතින් සිදු වී ඇත. ''[10] ලංකාවේ පුවත්පත්

බිහි වූ මුල් වකවානුවල සිටම ඊට සරිලන භාෂා ස්වරූපයක්, ශෛලියක් ගොඩනගා ගැනීමේ ප්‍රයත්නයක් සිදු වී තිබෙන බව එහි ඉතිහාසය පිරික්සීමේ දී පැහැදිලිව වන්නේ ය. නමුත් ප්‍රවෘත්තිකරණය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඒ පිළිබඳව කල්පනා කිරීමක් හෝ අවධානයක් නොතිබූ බව සඳහන් කළ යුතු ය. ''ප්‍රවෘත්ති පත්‍ර සඳහා උචිත ලේඛන රීතියක් සකසා ගැනීමට මෙකල පත්‍ර කර්තෘවරුන් දැරූ උත්සාහය විශේෂයෙන් කැපී පෙනේ.''[11] මෙය සාහිත්‍යයක් හා භාෂා භාවිතයේ අභ්‍යන්තර සංවර්ධනය නියමයන් මගින් තත්ත්වාරෝපණය කරනු ලබන කාරණයක් ලෙස දැක්විය හැකි අතර ප්‍රවෘත්තිකරණ සහ සංහතික මාධ්‍ය විෂයික සංකල්ප හැඩගැසීම ඉතා පුළුල් සහ ගැඹුරු සමාජ ඓතිහාසික සහ ශාස්ත්‍රාලිය පරිස්ථිතියක් තීරණය වන්නකි.'' සමාජ වාග්විද්‍යාත්මක දෘෂ්ටිකෝණය විමසා බැලීමේ දී භාෂා විෂයික නිර්දේශාත්මක ආකල්ප (Prescriptive attitudes) එම භාෂා සමාජයේ ඉතිහාසය හා අනෙකුත් සමාජ සංස්කෘතික දේශපාලන සාධක අනුව තීරණය වෙයි.''[12]

ලංකාව තුළ 19 වන සියවසේ යුරෝපීය යටත් විජිත ධනවාදය ඔස්සේ උත්තරාරෝපිත වූ ධනේශ්වර ප්‍රවෘත්තිකරණය, සංහතික මාධ්‍ය පිළිබඳ නව භාවිතය පැවැති ලාංකේය සාම්ප්‍රදායික වැඩවසම් සමාජ සංස්කෘතික හා දේශපාලනික පරිසරය තුළට විකරණය වූයේ නූතන මුද්‍රණ ධනවාදයට සරිලන ආකාරයට නොව පූර්ව ගතානුගතික වැඩවසම් සමාජයෙහි ආධිපත්‍ය දරන ලද සාහිත්‍යයික හා දෘෂ්ටිවාදී සම්ප්‍රදායේ ඉදිරි වර්ධනයක් ලෙස ය. එම ක්ෂේත්‍රයෙහි වූ ප්‍රධාන කර්තෘතයා සහ කර්තෘත්වය ද මේ යථාර්ථය කෙරෙහි නව ස්වරූපයක් වූ ධනේෂ්වර ප්‍රවෘත්තිකරණය සහ සංහතික මාධ්‍යකරණ ක්‍රියාවලියට ද ආදේශ කළේ ය.

ශ්‍රී ලංකාවේ සන්නිවේදන, ප්‍රවෘත්තිකරණ සංහතික මාධ්‍යය අධ්‍යයනය සහ ඒ පිළිබඳ ආකල්පය තාක්ෂණිකවාදී සහ ආකෘතිකවාදී රාමුවක් තුළ හැඩ ගැසී තිබීම ද එහි ගැටලුවක් වශයෙන් සැලකිය හැකිය. බටහිර ලෝකය තුළ පවා ආරම්භයේ දී සන්නිවේදනයට අදාළ න්‍යායික අදහස් නිර්මාණය වූයේ සහජාසාත්මක තලයේ වන අතර ඒ සම්බන්ධව බරපතල සහ ගැඹුරු අධ්‍යයනයන් ආරම්භ වන්නේ 1920 සහ 30 ගණන්වල දීය. එය විශේෂයෙන්ම සිදු වූයේ ප්‍රවෘත්තිකරණ ක්ෂේත්‍රයේ ය. සන්නිවේදන මාධ්‍යයන්ගේ ශීඝ්‍ර වර්ධනය ප්‍රවෘත්තිකරණය සහ තොරතුරු කෙරෙහි විද්‍යාත්මක අවධානය වර්ධනය වීමට බලපෑවේය. ආරම්භක අවධියේ සිට සන්නිවේදන න්‍යාය පිළිබඳ එකිනෙකට වෙනස් න්‍යායිත ප්‍රවේශයන් දෙකක් හැඩ ගැසුනේ ය. ඉන් එක් ප්‍රවේශයක් තාක්ෂණිකවාදී වූ අතර අනෙක ධනවාදී විය. මේ ප්‍රවණතා දෙක නියෝජනය කරන ලදි. පර්යේෂකයින් අතර වූ දුර්වල සම්බන්ධතාව හේතු කොටගෙන සන්නිවේදනය පිළිබඳ පොදු සහ සාකල්‍යමය සංකල්පීය ප්‍රවේශයක් ගොඩනගා ගැනීමට අපොහොසත් වූ බව ඉතිහාසය පෙන්වා දෙයි. මේ පිළිබඳව පුළුල් විග්‍රහයකට යෑමට මෙය අවස්ථාවක් නොවන නිසා එය ලාංකේය සන්නිවේදන සහ ප්‍රවෘත්තිකරණ අධ්‍යයනයේ සංකල්පිය ව්‍යුහයේ තාර්කික පදනම මාධ්‍ය ප්‍රවණතාව පෙන්වා දීමට සීමා වන්නේ ය.

ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයනයේ දී එහි ක්‍රියාවලිය විග්‍රහ කිරීමේදී බහුල ලෙස භාවිත කරන හැරල්ඩ් ඩී. ලැස්වෙල් ගේ සන්නිවේදන ආකෘතිය මගින් සන්නිවේදන ක්‍රියාවලියේ දෘෂ්ටිවාදී සහ සමාජීය ගතිලක්ෂණ පිළිබඳව කිසියම් අධ්‍යයනයක් යොමු නොකරන සරල රේඛීය ආකෘතියකි. මෙය සන්නිවේදන ක්‍රියාවලියේ අභ්‍යන්තර සංරචක යන්ගේ පැහැදිලි කිරීමකට සීමා වන අතර එම ක්‍රියාවලියේ අභ්‍යන්තර සීමා අතික්‍රමණය කරන්නා වූ ද, සන්නිවේදන අභ්‍යන්තර ක්‍රියාවලියෙන්

බාහිර ව පවතින්නා වූ ද ඉතා වැදගත් ප්‍රශ්නයක් වන සංහතික මාධ්‍ය සංදේශයේ අරමුණු පිළිබඳව අවධානය හෝ අධ්‍යයනය නොකෙරේ. සමාජ දේශපාලන සහ සංහතික - දෘෂ්ටිවාදී ක්‍රියාවලින් තේරුම් ගැනීමේ දී ඉතා වැදගත් වන්නේ ඍජු ලෙසම ප්‍රකට වුවමනාවන් ඉදිරිපත් කරන්නේ කවුරුද? යන්න එතරම් වැදගත් නැති අතර වැදගත් වන්නේ අදාළ අදහස් , වුවමනාවන් කා හට ද වාසි ගෙන දෙන්නේ යන්නය. ''දේශපාලනයේ දී වැදගත් වන්නේ මතය, අදහස් ඉදිරිපත් කරන්නා නොව එම මත අදහස් යෝජනා වාසි වන්නේ කාට ද යන්න බවය''[13] මේ ලැස්වේලියානු සන්නිවේදන ආකෘතියේ ඇති අඩුපාඩුව දුර්වලතාව සංහතික සන්නිවේදන ක්‍රියාවලියේ අවසාන හරය අනාවරණය කර ගැනිම සඳහා විශාල බාධාවකි. අපගේ අදහසට අනුව ලැස්වේලියානු සන්නිවේදන ආකෘතිය අංග සම්පූර්ණ වීම සඳහා කවුරු කුමන ප්‍රතිඵලයක් සඳහා කුමන මාර්ගයකින් කාට කුමක් කියයි ද යන පංච විධ අංගවලට අමතරව කුමන අරමුණකින් ද යන හය වැනි අංශයක් ද එකතු කළ යුතු ය.

ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ආධිපත්‍ය දරන ලද ආකෘතිකවාදී සහ තාක්ෂණිකවාදී ප්‍රවණතාව එය හුදු අදහස්, හැඟීම් සම්ප්‍රේෂණය කිරීමේ සහ හුවමාරුවේ මාදිලියක් ලෙසට සීමා වී තහවුරු විය. මෙය සන්නිවේදනය පිළිබඳ සාමස්තික න්‍යායයක් වර්ධනය වී නොතිබූ කලක සන්නිවේදනය න්‍යාය පිළිබඳ පැවතියේ සමාකලනාත්මක (Summative) ප්‍රවේශික අර්ථකථනයකි. එනම් සන්නිවේදන වස්තූන් , ක්‍රියාවලින් සහ ඊට සරිලන දැනුම් සංකීර්ණයකි. ශ්‍රී ලංකා සන්නිවේදනයේ න්‍යායික අධ්‍යයන ක්ෂේත්‍රය තුළ මෙම ප්‍රවේශය ප්‍රමුඛ වූ අතර සන්නිවේදනය ඒකීය මූලික විෂයක් සහ බහුමානීය පද්ධතියක් ලෙස සැලකීමේ දෙවන ප්‍රවේශය තුළ අර්ථකථන කිරීම නොකෙරේ. මෙම දෙවන ප්‍රවේශය තුළ වෙනත් විද්‍යාවන්ගේ න්‍යායික ආභාසය තුළින් ලබා ගන්නා දැනුම හා අත්දැකීම් සන්නිවේදනයේ පොදු න්‍යාය වර්ධනයට තුඩු දෙන්නේ ය. මෙහිදී න්‍යායික සංශ්ලේෂණය සිදු වන්නේ සමාජ - සන්නිවේදනාත්මක විද්‍යාවන් පමණක් නොව ස්වභාවික - විද්‍යා සහ විද්‍යාත්මක - තාක්ෂණික දැනුමත් සමඟ ය. මෙය ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ අවධානයට යොමු නොවූ එහි වර්ධනයේ ඓතිහාසික සීමාවක් සනිටුහන් කරන අංශයකි.

වර්තමාන ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය සමකාලීන යුරෝපීය සහ ඇමෙරිකානු අදාළ ක්ෂේත්‍රයට සාපේක්ෂව විමර්ශනය කරන විට විශාල වෙනසක් දැකිය හැකි ය. සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය පසුගිය දශක කීපය තුළ යුරෝපීය රටවල ශිඝ්‍ර ලෙස සංවර්ධනය වූ අතර එය විවිධ ප්‍රවණතා සහ ගතික ඔස්සේ ගමන් කොට ඇත. අද එය බහු විෂයික පාර විෂයීක, අන්තර් විෂයික පරාසයන් කරා පැතිරුන එසේ පුළුල් සහ ගැඹුරු, සිරස් සහ තිරස් චලනයන් ඔස්සේ අධ්‍යයනය කරනු ලැබේ මේ අනුව සන්නිවේදනය සහ සංහතික මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ විද්‍යාත්මක පරාමිතීන් සහ එහි දෘෂ්ටිවාදය සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ ය. මෙය ශ්‍රී ලාංකේය සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ සුසමාදර්ශක විස්ථාපනය (Paradigmatic shift) සන්ධිස්ථානයක් සනිටුහන් කරන අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

විශේෂයෙන් පසුගිය දශක දෙකකට ඉහත දී ශ්‍රී ලාංකේය සන්නිවේදනය සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වූ න්‍යායික සහ සංකල්පීය සීමා අතික්‍රමණය කරමින් එය නව අවධියකට

වර්ධනය වීම සනිටුහන් කරන අතර සන්නිවේදනය සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ ආධිපත්‍ය දැරූ දෘෂ්ටිවාදය සහ ආකල්පය උන් මූලවාදී ලෙස විපර්යාසයට ලක් වෙමින් පවතින්නේ ය.

සමකාලීන ශ්‍රී ලංකේය සන්නිවේදන සංහතික මාධ්‍යවේද සහ ප්‍රවෘත්තිකරණ ක්ෂේත්‍රයේ අධ්‍යයන සහ පර්යේසණ සීමා සහ ඒවා අධ්‍යයන ලෝක සන්නිවේදන, සංහතික මාධ්‍යයයේ සහ ප්‍රවෘත්තිකරණ අධ්‍යයන සහ පර්යේෂණ තත්ත්වයන් දක්වා සංවර්ධනය වී නොතිබීම ප්‍රබල ගැටලුවකි. සන්නිවේදන අධ්‍යයනයේ ආරම්භක ඉතිහාසයේ දී පැවැති සන්නිවේදනය හුදු අදහස් සම්ප්‍රේෂණයේ සිට අදහස් හුවමාරු කර ගැනීමේ මාදිලියක, අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයේ මාදිලියක, පොදු භාවයක් සහ අවබෝධයක් නිර්මාණය කිරීමේ භාවිතයක සිට වර්තමානයේ දී සන්නිවේදනය යනු සමාජ ක්‍රියාවලියේ පදනම සකසන්නා වූ මානව සමාජ සන්තාවේ ස්වරූපයකි. ''සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේදය ප්‍රවෘත්තිකරණය සමාජ යථාර්ථය නිර්මාණය කිරීමේ සුරක්ෂිත කිරීමේ, නවීකරණය කිරීමේ , ප්‍රතිනිර්මාණය කිරීමේ සහ අනුකරණය කිරීමේ පදනම් සමාජ ක්‍රියාවලියකි.''[14] සන්නිවේදනය සමාජය සංයුක්තකරණ සංරචක නිර්මාණය කිරීමේ ක්‍රියාවලියකි. එය හුදු දැනට අප තුළ තිබෙන අදහස්, හැඟීම්, අර්ථ මතවාද සම්ප්‍රේෂණය කිරීමේ සහ හුවමාරු කර ගැනීමේ මාධ්‍යයක් නොව ඒවා හැඩගස්වන සහ නිර්මාණකරණ ක්‍රියාවලියකි. වර්තමාන සංහතික මාධ්‍ය ක්‍රියාවලිය දෙස අප අවධානය ප්‍රධාන වශයෙන් යොමු විය යුත්තේ සමාජ - දේශපාලනික ක්‍රියාවලියක් ලෙස වටහා ගැනීම සඳහා ය. විශේෂයෙන්ම වර්තමාන ලෝක සංහතික මාධ්‍යවේද සහ සන්නිවේදන අධ්‍යයනය විවිධ ශාස්ත්‍රාලිය ගුරුකුල සහ ප්‍රවණතා ඔස්සේ වර්ධනය වෙමින් පවතී. පද්ධති න්‍යාය, සමාජ අභිසංස්කරණවාදය, සමාජ නිර්මාණවාදය, ප්‍රජානන මනෝවිද්‍යාව, සමාජ විචාරාත්මක චින්තනය, සංස්කෘතික අධ්‍යයනය, සංඥාර්ථවේදය, සමාජභාෂාවේදය, මානව වංශවේදීය සන්නිවේදනය, සම්භාෂණ විශ්ලේෂණය, කතිකා විශ්ලේෂණය, උපයෝග්‍යතාවාදය, අර්ථ කළමනාකරණය සහ සමාජායෝජිත මතිඒකත්වවාදය, විචාරාත්මක සමාජවිද්‍යාව, සමාජ අන්තර් ක්‍රියාකාරිවාදය සහ ස්ත්‍රිවාදය ඒ අතර සමහරකි. මෙම සියලු සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක ගුරුකුල සහ ප්‍රවණතා සිය ක්‍රමවේදය, න්‍යායික සහ සංකල්පීය පදනම් ලෙස විවිධ පර්යේෂණ සම්ප්‍රදායන් භාවිත කළ ද සන්නිවේදනය සහ සංහතික මාධ්‍යවේදය පිළිබඳ ගැටලුවේ දී ඔවුන් දරන පොදු දාර්ශනික සහ න්‍යායික ආස්ථානයන්ගේ ඒකාබද්ධතාවක් පෙන්නුම් කරන්නේ ය. සංහතික මාධ්‍ය සහ ප්‍රවෘත්තිකරණ ක්ෂේත්‍රය තුළ විසිවන සියවස අවසාන දශකයේ දී ''සන්නිවේදනය කෙරෙහි සමාජයීය ප්‍රවේශ''[15] නමින් එම පොදු දාර්ශනික ඒකීයත්වය නිර්මාණය විය.

මේ අනුව පෙනීයන්නේ ලෝක සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රය සංවර්ධනය වන්නේ හුදකලා ශික්ෂණ මාර්ගයක් වශයනේ නොව පොදු දාර්ශනික සහ න්‍යායික - සංකල්පීය පරිගනයක ආභාසය ලබමින් නිරතුරුවම ඉන් පෝෂණය වෙමින් බවය.

අද්‍යතන ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයෙහි න්‍යායික, සංකල්පීය, මූලධර්මිය සීමා විස්තාරණය විය යුතුය. ගැඹුරු විය යුතුය. ඒ පිළිබඳව පවතින සාම්ප්‍රදායික දෘෂ්ටිවාදය හා ආකල්පය වෙනස් විය යුතුය. ඒ අනුව ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ ප්‍රවෘත්තිකරණ අධ්‍යයනය විස්තරාත්මක ප්‍රවේශය ව්‍යුහාත්මක ප්‍රවේශය දක්වා ද, ආකෘතිකවාදී මාදිලිය සංදර්භීය මාදිලියක් දක්වා ද, යාන්ත්‍රික /තාක්ෂණිකවාදී ප්‍රවේශය කෘත්‍යවාදී ප්‍රවේශයක් දක්වා ද , පාරිශුද්ධවාදී /

සදාචාරවාදී ආකල්පය විද්‍යාත්මක ආකල්පය දක්වා ද භාෂාවේ ද කේන්ද්‍රීය ප්‍රවණතාව සංහතිකවේදී කේන්ද්‍රීය ප්‍රවණතාවක් දක්වා ද, ව්‍යාජ නිර්දෘෂ්ටිවාදී / ආස්ථානය දෘෂ්ටිවාදී / පක්ෂවාදී ආස්ථානයක් දක්වා ද සමාකලනවාදී ශෛලිය සමාස්ථිකවාදි / ඓන්ද්‍රිය ශෛලියක් දක්වා ද වෙනස් විය යුතු වන්නේ ය.

පාදක සටහන්

1. Marx , Engels, The german Ideology, Progress Publishers , Moscow, 1975
2. ටියුඩර් වීරසිංහ , මාක්ස්වාදි සහ නව මාක්ස්වාදි සංහතික මාධ්‍ය න්‍යාය, සරසවි ප්‍රකාශකයෝ , 20.
3. රෝහණ ලක්ෂ්මන් පියදාස (සංස්) සන්නිවේදන - ශාස්ත්‍රිය සංග්‍රහය, දෙවන වෙළුම , 2003
4. Blumen , H. The Mass, the public and public opinion in A.M. Lee (ed) New outhines of the princites of Sociology , New york, Barreas and Noble 1939.
5. Serge maskovici, The Age of the crowd , a historical treatese on mass psychology , Cambridge University Press, 1985.
6. සංක්ෂිප්ත සිංහල ශබ්දකෝෂය , ද්විතීය භාගය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව , 2009.
7. කාල් මාක්ස් , ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති එකතුව , වෙළුම 1,
8. සුනිල් විජේසිරිවර්ධන , පුරවැසි මං පෙත් - ගැටුම්වේදය ආශ්‍රිත සංස්කෘතික හා දාර්ශනික අවලෝකන , FLICT , කොළඹ , 2010.
9. ඩී.එෆ්. කාරියකරවන , දසක සතක මතක , කාරියකරවන ප්‍රකාශන , මහරගම, 1998.
10. ගාමිණී දැල බණ්ඩාර , සිංහල පුවත්පත් ප්‍රභවය සහ අභිවර්ධන , සම්භාව්‍ය ප්‍රකාශන , කැලණිය , 1993.
11. සඳගෝමී කෝපරහේවා, විසි වන සිවසේ සිංහල භාෂා ව්‍යවහාර සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්, එස් ගොඩගේ සහ සහෝදරයෝ , මරදාන, 2010.
12. එම
13. එම
14. වී.අයි ලෙනින් සම්පූර්ණ කෘති වෙළුම 23. පිටුව 61.
15. Pearce, W B and Pearce , K.H Extending the Theory of Cordinated Management of meaning, Throaugh a Community Dialog ... Communication Theory 2000.
16. Craig R.T. W.Ledds - Hurwatz (ed) Social approaches to Communication New York, 1995.

ජනමාධ්‍ය විපරිණාමය ප්‍රභූ – ජනකාන්ත–විශිෂ්ටකරණ චක්‍රය

සුගත් මහින්ද සෙනරත්

ජනමාධ්‍යයේ විපරිණාමය ගතික ක්‍රියාවලියක් ලෙස සඳහන් කළ හැකිය. ඇතැම් රටක මෙම ප්‍රගමනය තවත් රටක වඩා දෘෂ්‍යමාන වේ. මහාචාර්ය රැල්ෆ් ලොවින්ස්ටයින් සඳහන් කරන පරිදි තාක්ෂණික දියුණුව හේතු කරගත් මෙම ගතිකත්වය විසිවන සියවසේ අවසන් අර්ධයේ සිට වර්ධනය වී ඇත.



මාධ්‍ය ක්‍රමික වෘද්ධි රටාව හැඳෑරිය හැකි ප්‍රභූ-ජනකාන්ත-විශිෂ්ටකරණ, චක්‍රය මහාචාර්ය රැල්ෆ් ලොවින්ස් මහතා විසින් ගොඩනගන ලද්දකි. ඔහු සඳහන් කරන ආකාරයට ඕනෑම රටක මාධ්‍යයක් ප්‍රභූ අදියරේ සිට ජනකාන්ත අදියර දක්වාත් එතනින් විශිෂ්ටකරණ අදියර දක්වාත් වර්ධනය වේ.

ප්‍රභූ අදියරේදී මාධ්‍ය ආමන්ත්‍රණය කරනුයේත්, මාධ්‍ය සංදේශ පරිභෝජනය කරනුයේත් ප්‍රධාන වශයෙන් ජනමත නායකයන් විසිනි. නමුත් ජනකාන්ත අදියරේදී මාධ්‍ය ආමන්ත්‍රණය කරනුයේත්, සංදේශ වඩාත් පරිභෝජනය කරනුයේත් ජනගහණයෙන් බහුජනයා විසිනි.

විශිෂ්ටකරණය අදියරේදී මාධ්‍ය ආමන්ත්‍රණය කරනුයේ සංදේශ පරිභෝජනය කරනුයේත් කැඩුණු ග්‍රාහක කොටස් විසිනි. බොහෝ රටවල් මෙම රටාවේ එක් අදියරකට පැහැදිලිව දැකගත හැකි නොවීම ද මෙහිලා අවධානයට ගත යුතු වේ. බොහෝ විට විවිධ මාධ්‍යයන් ප්‍රභූ ජනකාන්ත විශිෂ්ටකරණ චක්‍රයේ විවිධ අදියරයන්හි සිටිය හැකි ය.

ප්‍රභූ අදියර

නීරක්ෂරතාව සහ දිළිඳු බව ලෝකයේ බොහෝ රටවල් තවමත් වෙළාගෙන ඇත. මෙම රටවල ප්‍රභූන් සාක්ෂරතා ඥානයෙන් යුක්ත වන අතර සියලු මාධ්‍ය සංදේශ අත්කර ගැනීම සඳහා මූල්‍යමය ශක්තියක් ඇත්තෝ ද මොවුහු ය. මෙම පිරිස ජනමත නායකයන්ට ඇතුළත් වේ. මෙම රටවල සාමාන්‍ය සාක්ෂරතා ඥානයෙන් යුත් සාමාන්‍ය පුද්ගලයෙකුට වුව ද දෛනිකව පුවත්පත් මිලදී ගන්නට, සඟරා හෝ පොත් ලබාගන්නට, රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගන්නට අසීරු ය. නිරක්ෂරතාවයෙන් යුක්ත අයෙකුට පවා ගුවන් විදුලිය, රූපවාහිනිය ආදී මාධ්‍ය සඳහා වියදම් කිරීම අසීරු ය.

මෙහිදී නීරක්ෂතාවය සහ දිළිඳුබව යදම් ලෙස කටයුතු කරයි. රටේ විශාල භූගෝලීය ප්‍රදේශයක ජනතාව දුගී බවින් පීඩා විඳිති. නාගරික ප්‍රදේශයන්හි සියලු ජනමාධ්‍ය සඳහා ප්‍රවේශ පැවතිය ද, ග්‍රාමීය ප්‍රදේශයන්හි තත්ත්වය මීට හාත්පසින් ම වෙනස් ය.

සාමාන්‍යයෙන් ප්‍රභූ අදියරෙහි මාධ්‍ය සංදේශ අන්තර්ගතයන් බොහෝ සෙයින් චක්‍රයේ අනෙකුත් අදියරයන්හි පවත්නා මාධ්‍ය අන්තර්ගතයෙන් වෙනස් වේ. ඉහළ සංස්කෘතික මට්ටමක විනෝදාස්වාදන අන්තර්ගතයන් සකස් වී තිබියදී පවා ඒවායේ ද්‍රව්‍ය සකස්ව ඇත්තේ දැනුම්දීම සඳහා ය.

ජනකාන්ත අදියර

නීරක්ෂරතාවය හා දිළිඳු බව යන සාධකයන් ජයගත් සැණෙන් මාධ්‍ය ජනකාන්ත අදියරට ප්‍රවේශ වේ. මෙම අදියරේ සංදේශ බෙදා හැරීම ඉහළ මට්ටමක පවතී. මාධ්‍ය විශාල පුරවැසි කණ්ඩායම් කරා ළඟා වේ. මෙම විශාල පුරවැසි කණ්ඩායම් විසින් මාධ්‍ය සංදේශ පරිභෝජනය කරනු ලබයි. මෙම අදියරේ ''ජන - ජන'' මාධ්‍යයේ ආධිපත්‍යයක් දැකගත හැකිය. මාධ්‍ය සංදේශ ආමන්ත්‍රණය කරනුයේ විෂමජාතීය ග්‍රාහකයන්ට ය. තවත් ලෙසකින් කිවහොත් මාධ්‍ය අන්තර්ගතය ජනගහනයෙන් අති බහුතරයට ආමන්ත්‍රණය නොකරයි. මෙහිදී 'අවම පොදු සම අගය' මූලධර්මය ක්‍රියාත්මක වේ.

මෙහිදී මිල අඩු ගුවන් විදුලිය නීරක්ෂරතාව හා දිළිඳු බව යන බාධකයන්ගෙන් ජනකාන්ත අදියරට ඉදිරි පිම්මක් පනින්නට සමත්ව ඇති බව ද අවධානයට ගත යුතු වේ.

විශිෂ්ටකරණ අදියර

පුළුල් ජනකාන්ත මාධ්‍ය සහිත සම්පූර්ණයෙන් සංවර්ධනය වූ රාජ්‍යයන් විශිෂ්ටකරණ අදියරට ප්‍රවේශ වීමට හැකියාව ලැබුවෝ වෙති. මෙම විශිෂ්ටකරණ අදියර වනුයේ තෙවන සහ අවසාන අදියර වේ.

විශිෂ්ටකරණ අදියරේ දී ඒකාබද්ධ චතුර්විධ සාධක වැදගත් වේ. එනම්,

1. උසස් අධ්‍යාපනය
2. සමෘද්ධිමත් බව
3. විවේක කාලය
4. ජනගහනයේ ප්‍රමාණය

ප්‍රභූ අදියරෙහි සිට ජනකාන්ත අදියරට ප්‍රවේශ වූවා සේ ජනකාන්ත අදියරෙහි සිට විශිෂ්ටකරණ අදියරට පරිණාමය වීම ද ක්‍රමික වූවකි.

ග්‍රාහකයන් විසින් විශිෂ්ටකරණ අදියරට වඩාත් කැමැත්තක් දක්වනුයේ ඇයි දැයි චතුර් සාධකයන් පැහැදිලි කරනු ලබයි.

උසස් අධ්‍යාපනය

ජනතාව වෘත්තීයමය හා/හෝ බුද්ධිමය වශයෙන් විශිෂ්ටකරණයට ලක් වූ පසුව ඔවුන්ට විවිධත්වයෙන් යුත් බුද්ධිමය හා සංස්කෘතික රසයන් හා අභිරුචීන් ඇති වේ.

පාසල් අධයාපනය වඩාත් ඒකාකාරී වූවකි. ජනගහනයෙන් ප්‍රමාණවත් පිරිසක් සරසවි අධ්‍යාපනයට යොමුවන විට එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන් සමජාතීය අධ්‍යාපන මාර්ගයෙන් ඉවත්ව නව මාර්ගයන් අනුගමනය කරන්නට යොමු වේ. විශිෂ්ටකරණය වූ සාක්ෂරතාව, විද්‍යාත්මක හා වෘත්තීයමය අභිරුචීන් ග්‍රාහකත්වය වෙනසකට බඳුන් කරනු ලබයි. මෙම පුද්ගල අභිරුචීන් සරසවි අධ්‍යාපනයට යොමු වූවන්ට පමණක් සීමා වූවක් ද නොවේ. නාගරික හා කාර්මීකරණය වූ සමාජයන්හි රැකියා විශිෂ්ටකරණයට ඉල්ලුමක් පවතී. එසේම විශිෂ්ටකරණයට ලක්වූවන්ට තමන් මෙන්ම විශිෂ්ටකරණයට ලක් වූ සෙසු අයට සවන් දීමටත්, පිළිතුරු දීමටත් අවස්ථාව උදාකරගැනීමට අවශ්‍ය වේ.

සමෘද්ධිමත් බව

විශිෂ්ටකරණ මාධ්‍ය අත්පත් කරගැනීමට හැකියාවක් ඇත්තේ විවිධත්වයෙන් යුත් මාධ්‍ය දැරීමට හැකියාවක් ඇති ජනගහනයකට පමණි. එනිසා මෙම අදියරට ළඟාවීමට පෙර ජනගහනයට ඉහළ ජීවන තත්ත්වයක් හිමිව තිබිය යුතුය.

මෙහිදී එක් කුටුම්බයකට මාධ්‍ය නානත්වයක් (රූපවාහිනියක්, ගුවන් විදුලි යන්ත්‍රයක්, පුවත්පතක්, සඟරා එකක් හෝ දෙකක්) දැරීම නොව ඔවුන්ට විශිෂ්ටකරණය වූ මාධ්‍ය ඒකකයක නානත්වයකට හැකියාවක් තිබිය යුතු ය. එනම් කුටුම්බයක ගුවන් විදුලි යන්ත්‍ර කිහිපයක්, රූපවාහිනී යන්ත්‍ර කිහිපයක්, බොහෝ පුවත්පත් හා සඟරා ආදී ලෙස අත්පත් කරගැනීමේ හැකියාව පැවතිය යුතු ය. විශිෂ්ටකරණය වූ මාධ්‍ය ආමන්ත්‍රණය කරනුයේ බිඳුණු ග්‍රාහක පිරිසකට ය. එසේම බිඳුණු කුටුම්බයක් ද මෙහිදී අවධානයට යොමු වේ. මන්ද යත් කුටුම්බයක එක් එක් සාමාජිකයාගේ වෙනස් විනෝදාස්වාදන හා බුද්ධිමය අභිරුචීන් පවත්නා බැවිනි.

විවේක කාලය

මෙය පූර්වොක්ත ව විස්තර කළ සමෘද්ධිය හා වඩාත් සමීප සාධකයකි. එහෙත් එය විශිෂ්ටකරණය වූ මාධ්‍ය නිෂ්පාදනය මිලදී ගැනීමට හුදෙක් මුදලට වඩා වැඩි යමක් ද ජනගහණයට අවශ්‍ය වන බව අවධාරණය කරයි. තම කාර්යයන් නිමාකොට සංචරණය, විනෝද කටයුතු ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් හා වෙනත් අභිරුචීන් මුවහත් කිරීම සඳහා මීට අදාළ විශිෂ්ටකරණය වූ මාධ්‍ය අවශ්‍ය වේ.

දැනට පවත්නා මාධ්‍ය නිෂ්පාදන නානත්වයෙන් පරිභෝජනය සඳහා ග්‍රාහකයාට පැහැදිලි ලෙසින් ම විවේක කාලයක් අත්‍යවශ්‍ය ය.

ජනගහන ප්‍රමාණය

මාධ්‍ය සඳහා අවම වශයෙන් හෝ සංසරණයකට ප්‍රමාණවත් තරමේ විශාල ජනගහණයක් පැවතිය යුතු ය. අඩු ජනගහණයකින් යුත් රටකට ප්‍රකාශන හා විසුරුවා හැරීම් මගින් සහාය දිය හැකිවන්නේ පුළුල් ආමන්ත්‍රණයන්ට ය. එය පටු ආමන්ත්‍රණ සඳහා සහාය දක්වනු නොලබයි. මාධ්‍යයන්ට දැන්වීම් සහ දායක මුදලින් යැපීම සිදුකළ හැකි , ඕනෑම මාධ්‍ය ඒකකයක ග්‍රාහකයන් නිෂ්පාදන හා බෙදාහැරීමේ පිරිවැය යුක්ති සහගත කිරීමට තරම් ජනගහනය විශාල විය යුතු ය.

මූලික අධ්‍යයන මගින් පෙනී ගොස් ඇති කරුණක් නම් විශිෂ්ටකරණ අදියරට ප්‍රවේශ වීමට පෙර මිලියන 10-15 අතර ජනගහනයක් යම් රටක් සිටිය යුතු ය.

කුඩා ජාතීන් සතුව ද ඇතැම් විශිෂ්ටකරණය වූ මාධ්‍ය පවතින බව ද මෙහිලා සැලකිය යුතුය. එහෙත් මෙහිලා සන්නිවේදන භූමිකාකාවන්හි දී ජනකාන්ත ප්‍රකාශන සහ වැඩසටහන් විසින් ආධිපත්‍ය පතුරුවනු ලබයි. න්‍යායාත්මකව විශිෂ්ටකරණයේ අනෙක් සාධක ත්‍රිත්වය අත්පත්කරගෙන කුඩා රට විශිෂ්ටකරණය වූ වැඩසටහන් සහ ප්‍රකාශන සඳහා දැවැන්ත ලෙස රාජ්‍ය සහනාධාර ලබාදීම සිදුකළ හැකිය.

මාධ්‍යයට දෙආකාරයකට විශිෂ්ටකරණය කරා ළඟාවිය හැකිය. එනම් ඒකක විශිෂ්ටකරණය හා අභ්‍යන්තර විශිෂ්ටකරණය වශයෙනි. ඒකක විශිෂ්ටකරණය යනු සමස්ත දෛනික වැඩසටහන් හෝ ප්‍රකාශන විශේෂිත ග්‍රාහකයාට යොමු කිරීම ය. අභ්‍යන්තර විශිෂ්ටකරණය යනු දෛනික ආමන්ත්‍රණ වැඩසටහන් කොටස් හෝ ප්‍රකාශන කොටස් විවිධ ග්‍රාහකයන්ට යොමු කිරීම ය.

රැල්ෆ් ලොවින්ස්ටයින්ගේ ප්‍රභූ ජනකාන්ත විශිෂ්ටකරණය වක්‍රය මාධ්‍ය පරිණාමයේ විවිධ යුග පිළිබඳ සාකච්ඡා කිරීමට වඩාත් යොදා ගනු ලබන ඉතා ජනප්‍රිය වක්‍රයකි. එය නූතන සංකීර්ණ මාධ්‍ය භාවිතය තුළ ද මාධ්‍යයේ ගමන්මග පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වඩාත් උපකාරී වන්නක් බව සඳහන් කළ හැකි ය.

මූලාශ්‍ර

Lowenstein, R Merill, J.C. (1971), Media Messages and Men-New Perspectives in Communication, New York; U.S.A.

ปราชญ์ชาวบ้าน

07

ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ග්‍රාමීය ව්‍යුහය කේන්ද්‍ර කරගත් සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ

අමාලි උත්පලා නන්දසිරි

හැඳින්වීම

'සංස්කෘතිය' යනු, පුළුල් ප්‍රවේශයකින් සාකච්ඡාවට ගැනෙන පෘථුල සංකල්පයකි. මානව හිතවාදීව ජීවත්වීමට අවශ්‍ය වන බොහෝ සාධක ආසියාතික රටවල 'සංස්කෘති' මගින් පෙන්වාදෙයි. ආසියාතික ජනතාව සමාජයේ යහපත් පැවැත්ම උදෙසා භාවිත කළ විවිධ සමාජ සම්මත ක්‍රමෝපායන් ඒ ඒ රටවල ජනතාවගේ ජනසම්ප්‍රදාය බවට පත්විය. එම ජනසම්ප්‍රදායේ පැවති මානව හිතවාදී ගුණාංග හේතුවෙන් ආසියාතික වැසියන්ට වඩාත් යහපත් සාමකාමී වටපිටාවක ජීවත්වීමේ අවකාශය හිමි විය.

එසේම නූතනයේ දී සන්නිවේදනය, කළමනාකරණය හා අලෙවිකරණ විෂය ක්ෂේත්‍ර සමග බද්ධ වූ වෘත්තිය විෂය ක්ෂේත්‍රයක් ලෙස මහජන සම්බන්ධතාව හඳුනාගත හැකි ය. ලෝකයේ බොහෝ රටවල මහජන සම්බන්ධතාව වෘත්තීය මට්ටමින් භාවිතයට ගැනේ. නමුත් විෂය මූලික වශයෙන් ආසියාතික රටවල මහජන සම්බන්ධතාව අධ්‍යයනයට යොමුවීම සිදුවූයේ විසිඑක් වන සියවස ආරම්භයේදී ය. මහජන සම්බන්ධතාව යුරෝපීය අධ්‍යයන සම්ප්‍රදායන්වල වර්ධනය වීමට පෙර ආසියාතික රටවල සමාජ අන්තර් ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාමේ කාර්යය ව්‍යුහයක් වශයෙන් ප්‍රචලිතව පැවතිනි. මෙම ලිපිය ශ්‍රී ලාංකේය සංස්කෘතියේ සිංහල ජනසම්ප්‍රදායේ ග්‍රාමීය ව්‍යුහය කේන්ද්‍ර කරගත් මහජන සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ පිළිබඳව සිදුකළ විමර්ශනයක් ඇසුරින් සැකසුණකි.

ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ග්‍රාමීය ව්‍යුහය කේන්ද්‍ර කරගත් මහජන සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ

ශ්‍රී ලාංකේය සිංහල සංස්කෘතියේ ග්‍රාමීය ව්‍යුහයේ පවතින මහජන සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කිරීමේදී එය ප්‍රධාන වශයෙන් මානව ජීවිතය හා පරිසරය කේන්ද්‍ර කරගනිමින් නිර්මාණය වී ඇති ආකාරය හඳුනාගත හැකිය.

i. ග්‍රාමීය ව්‍යුහයේ මානව ජීවිතය කේන්ද්‍ර කරගත් මහජන සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ

ලාංකේය සිංහල ජනසම්ප්‍රදායේ ගැමියන් ජීවත් වන ප්‍රදේශය හැඳින්වූයේ 'වැව් ගම්මානය' හෙවත් 'ගම්ගොඩැල්ල' නමිනි. වැවක් මුල් කරගනිමින් ජනාවාස පිහිටුවා ගැනීම මෙයට හේතුවිය. සමාජයට විවිධ සේවා සැපයීමෙහි යෙදුණු ඒ ඒ ශ්‍රේණිවලින් යුතු ගම්මැදි කිහිපයක එකතුවෙන් ගම්මානයක් පිහිටුවනු ලැබී ය. සාම්ප්‍රදායික වැව් ගම්මානයක් නිර්මාණය වූ ආකාරය පිළිබඳව විවිධ අදහස් පළ වී ඇත. 'ආර්‍යයන්ගෙන් වැඩිදෙනාගේ වෘත්තිය සකස් වූයේ ගොවිතැන පදනම් කොටගෙන ය. වැව් ආශ්‍රිතව පිහිටුවාගත් වැව් ඉස්මත්තේ සීමිත ප්‍රදේශයක එකම ස්වරූපයක් ගත් ගෙවල් සමූහයකින් ගම්ගොඩ තැනී ඇත්තේ එබැවිනි(අබේවර්ධන:1985:333).

ගම්මානයක නිවෙස් එක උසට සකස් වී තිබූ අතර ඒවා එක හඬින් සියලු දෙනා ඒකරාශී විය හැකි ආකාරයට නිවෙස් කිහිපයක එකතුවෙන් මැද මිදුලක් ද සහිතව නිර්මාණය විය. එය 'ගම්මැද්ද' ලෙස හැඳින්විය. ගම්මානයක, ඉහළ ගම්මැද්ද, පහළ ගම්මැද්ද, මැද ගම්මැද්ද වශයෙන් ගම්මැදි දෙකක් හෝ තුනක් දැකගත හැකි ය.

සිංහල ජනසම්මතය අනුව ඉහළ සහ මැද ගම්මැදිවල වාසය කරන ලද්දේ ගොවිතැනින් ජීවත්වන ජනතාවයි. පහළ ගම්මැද්දේ ජීවත් වූයේ ගොවිතැන් නොකරන එහෙත් ග්‍රාමීය ජනයාට අත්‍යවශ්‍ය වෙනත් කර්මාන්ත පවත්වාගෙන යන පිරිස් ය.

'වැව් ජලය' ජනාවාස පිහිටුවීමේ මූලික පදනම වූ බව දැක්විය හැකි ය (දිසානායක:2010:88-89). වියළි කලාපීය ගැමියන් තම වාසය සඳහා අලුතින් ගමක් පිහිටුවීමේ දී වැවක් මුල්කරගනිමින් ගමේ කුඹුරු යාය වෙන් කරගත් බව පෙනී යයි. මෙලෙස ගමක් නිර්මාණය කරගැනීමේ චාරිත්‍රය 'ගම් බැඳීම' නම් විය (පීරිස්:1964:268). උතුරු මැද පළාතේ පුල්එළිය ගම ඇසුරින් ඊ.ආර්.ලීච් (E.R. Leach) සිදුකළ අධ්‍යයනයේ දී ගමක් නිර්මාණය කර ගැනීමේ චාරිත්‍රය 'නැකතටවල් අල්ලනවා' ලෙස දක්වා ඇත (Leach:1961:148).

ප්‍රදේශයේ භූගෝලීය හා පාරිසරික ලක්ෂණවලට අනුව වැව, කුඹුරුයාය, විහාරස්ථානය, ජනාවාස ආදිය නිර්මාණය විය. සාම්ප්‍රදායික ගමක තිබිය යුතු අංගෝපාංග ලෙස වැව, විහාරය, කෙත, වනරොද, ජනතාව වෙසෙන ජනාවාස සහිත ගම්මැද්ද හා තිස්බඹය දැක්විය හැකි ය. මින් ගැමි ජීවිතය සමග බැඳුණු මූලික අවශ්‍යතා පිළිබඳ මනා අවබෝධයෙන් ගම නිර්මාණය වූ බව පැහැදිලි ය. එම අවශ්‍යතා ඉටු කරගැනීමට අවශ්‍ය භෞතික සැකැස්ම හා ජනතාවගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැගෙන අයුරින් ජනාවාස, විහාරස්ථාන, වගාබිම්, පොදු ස්ථාන නිර්මාණය වූ බව පෙන්වාදිය හැකි ය.

ලාංකිකයන්ගේ ජීවන ක්‍රමය ගොඩනැගීමෙහි ලා වී ගොවිතැන මෙන් ම විහාරස්ථානය ඉවහල් වූ බව පෙනේ. සමාජ අන්තර් සම්බන්ධතා ගොඩනැගීමෙහි ලා වැව, ජීවන වෘත්තිය හා විහාරස්ථානය මූලික විය. බෞද්ධ ආගමික සංකල්ප මත පදනම්ව සාම්ප්‍රදායික වැව ඉදිවිය. එමෙන් ම මේ සඳහා ගොවිතැන කෙරෙහි ද බුදුදහමේ දැක්වෙන ඉගැන්වීම් බලපෑවේ ය. ඒ අනුව ගැමියාගේ ජීවන වෘත්තිය මෙන් ම ආධ්‍යාත්මික ප්‍රීති සුවය වර්ධනය කරගැනීම පිණිස ගමේ විහාරස්ථානය සුවිශේෂී කාර්යයයක් ඉටු කළ බව පෙනේ. සියලු සබඳතා පැවැත්වීමේ දී බෞද්ධ ආගමික ආභාසය ගැමියාට නොමඳව ලැබුණි.

සාම්ප්‍රදායික ගමෙහි පැවැත්ම පිණිස ඉවහල් වන සබඳතා ගොඩනැංවීම හා කළමනාකරණය පිණිස බෞද්ධ ආගමික ඉගැන්වීම් මූලික වූ බව පෙනේ.

සාම්ප්‍රදායික ගමක ප්‍රධාන ජීවනෝපාය ගොඩනැගී තිබුණේ වී ගොවිතැන මුල් කරගනිමිනි. ගොවිතැන් සිදුකරනු ලබන්නේ ග්‍රාමීය නායකත්වය මූලික කරගෙන ය. එහි පදනම සාමූහිකත්වය යි. ගොවිතැන මානව හා පාරිසරික සම්බන්ධතා කළමනාකරණය සමග බැඳුණු සන්නිවේදන ක්‍රමවේද රාශියක එකතුවකි. එමෙන් ම කෘෂිකාර්මික කටයුතු 'ශ්‍රම විභජනය මෙන් ම උපකාරය හා ප්‍රතිඋපකාරය සමග සම්මිශ්‍රණය වූ කාර්යය ක්‍රම සංවිධානාත්මක සන්නිවේදනයක් සමග ගොඩනැගුණක් විය'(පල්ලියගුරු:1988:396). සිංහල ගමක ප්‍රජා පාලනය ශක්තිමත් පදනමක් මත ගොඩනැගෙමෙහි ලා ගොවිතැන හා ඊට අවශ්‍ය ජල අවශ්‍යතා සපුරාගැනීම පිණිස අනුගමනය කළ පිළිවෙත බලපා ඇත. ඒ පිළිබඳ මාර්ටින් වික්‍රමසිංහ දක්වන්නේ මෙසේ ය. ''සිංහල පොදු ජනකායක් නොහොත් එකම කාරියක් උදෙසා එකම අදහසකින් බඳිනු ලැබූ ජනකායක් ලෙස පළමුව සැඳුණේ වැව් කැණීමත් වී ගොවිතැනත් නිසා ය. සිංහලයාගේ ස්වාධීනත්වයටත් ශක්තියටත් දෙස් කියන කර්මාන්ත අතර වැව් හා වී ගොවිතැන පළමුවන තැන ගනියි. වැව් කැණිය හැක්කේ පවුලක්, කුලයක් වශයෙන් ජීවත්වන අතලොස්සක් විසින් නොවේ. යම් කිසි පොදු හැඟීමකින් හා අපේක්ෂාවකින් එකට බැඳුණු ජනකායක් විසිනි'' (වික්‍රමසිංහ:1994:80).

සිංහල ජනසම්ප්‍රදාය වාරි කර්මාන්තයෙන් ප්‍රභවය වූ බව වික්‍රමසිංහ මහතා පවසන්නේ ආදී සිංහල ගොවියන් සිය සමාජ තරාතිරම නොබලා සියලු දෙනා එක්ව වැව තනා ස්වයංපෝෂිත ශිෂ්ටාචාරයකට පදනම සැකසූ හෙයිනි. ප්‍රජා පාලන නිලධාරීන් ද සමාජයේ ම පුරුක් වශයෙන් සෙසු ජනතාව සමග සාමූහිකව කටයුතු කළ අතර ග්‍රාමීය දිවි පෙවෙත පිළිබඳ ඔවුන් සතු වූයේ භාවිතයෙන් ලද අත්දැකීම්වලින් ගොඩනගා ගත් බහුශ්‍රැතභාවයකි. එමෙන් ම ගොවිතැන සඳහා අවශ්‍ය මූලික අවබෝධයක් ජනතාවට මෙන් ම පාලකයින් සතු විය.

ගොවිතැන හා ප්‍රජා පාලනය පිළිබඳ අවබෝධ නිසා පාලකයින් පිළිබඳ විශ්වාසය ජනතාව තුළ පැවතුනි. ගොවිතැනට අවශ්‍ය පහසුකම් සපයා දීම (වැව් දියවර) මගින් තවදුරටත් විශ්වාසය වර්ධනය වූ අතර එමගින් සමාජ සාමූහිකත්වය නිර්මාණය විය. එම සාමූහිකත්වය මගින් ජනසම්ප්‍රදායක් ගොඩනැගීමට සමත්විය. ගොවිතැන මූලික කරගත් ශ්‍රම හුවමාරු ක්‍රම බිහි වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. 'අත්තමට, කයියට, මුත්තෙට්ටුවට, බුලතට, පෝරුවට..' යනාදී වශයෙන් ප්‍රජාවේ සාමාජිකයින් අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගිණි.

සිංහල ජනසම්ප්‍රදායේ පැවති සාම්ප්‍රදායික ශ්‍රම හුවමාරු ක්‍රම මගින් පෙන්වා දුන්නේ සාමූහික එකතුවයි. එක් අයෙකුගේ හෝ එක් ගමක කුඹුරු වැඩකට උපකාර කිරීම හා ප්‍රතිඋපකාර කිරීම ඇසුරෙන් මෙම ශ්‍රම හුවමාරුව සිදුවිය. මෙම සාමූහික බැඳීම මගින් ජන ජීවිතවල ඒකමිතිය රඳා පැවතුණි. ගොවිතැන සමග බැඳුණු ග්‍රාමීය ජනතාවගේ සාමූහිකත්වය පිළිබඳ රොබට් නොක්ස් 'එදා හෙළදිව කෘතියේ දී පෙන්වා දෙන්නේ, 'ලංකාවේ ගොවියෝ ගොයම් කැපීමෙහි දක්ෂයෝ ය. ගොයම් කැපීමේ දී මුළු ගමේ ම ගොවියෝ සාමූහිකව වැඩ කරති. එක් එක් ගොවියෙකුගේ කුඹුරේ ගොයම් කැපීමට ගමේ සියලු දෙනාම පැමිණෙති. වෙල් යායේ ම ගොයම් කැපී අවසන් වනතුරු ගමේ ගොවියෝ සාමූහිකව

වැඩ කරති. ගොයම් කපනු ලබන්නේ යම් ගොවියෙකුගේ කුඹුරක ද එම කුඹුරු හිමි ගොවියා එහි ගොයම් කැපීමට පැමිණි සියලු දෙනාට ම බත බුලත සම්පාදනය කරන්නේ ය. කපන ලද ගොයම් එක් කොට බැඳ, බඳින ලද ගොයම් මිටි එක් තැනකට ගෙන යාම ගැහැණුන් සතු වැඩක් වන්නේ ය'' (නොක්ස්:1995:68).

සාම්ප්‍රදායික ගැමියා ගොවිතැනේ දී සිය ශ්‍රමය කළමනාකරණය කර ගත්තේ ය. එහිදී ගැමියන් අතර පැවති අන්තර් සබඳතා ඉවහල් විය. ඔවුන් ශ්‍රමය වෙනුවට ශ්‍රමය හුවමාරු කරගැනීමේ ක්‍රියාදාමයක නියැලුනි. කයිය, අත්තම වැනි සාම්ප්‍රදායික ශ්‍රම හුවමාරු ක්‍රම බිහිවන්නේ ඒ අනුසාරයෙනි. මෙම ශ්‍රම කළමනාකරණ ක්‍රමවේද ඔස්සේ ඵලදායි සේවාවක් ලබා ගැනීමට ගැමියාට අවකාශ සැලසුණි.

මෙම සාම්ප්‍රදායික ශ්‍රම කළමනාකරණ ක්‍රමය පිළිබඳව මෙසේ දැක්වේ. 'අස්වැන්න කැපීම ආරම්භ කරන ලද්දේ ශුභ දිනයක දී දෙවියන් කෙරෙහි දැඩි විශ්වාසයක් ඇති 'හොඳ' පුද්ගලයෙකු විසිනි. සෙසු පංගුකාරයින් ඔහු අනුගමනය කරමින් සමුපකාර ක්‍රමයට 'කයිය' හෝ 'කුලියට' හෝ 'පුද්ගලිකව' හෝ තම අස්වැන්න කපා ගත්හ. යම් කෙනෙකුට අසනීප වීම නිසා ඔහුගේ පංගුවේ අස්වැන්න කපා ගැනීමට නොහැකි වී නම් සෙසු අය එක් වී ඔහු වෙනුවෙන් එය කර දුන්හ''(පීරිස්:1964:25).

ගමයි පන්සලයි වැවයි දාගැබයි

සාම්ප්‍රදායික සිංහල ව්‍යාවහාරය අනුව ලංකාවේ ගමක කේන්ද්‍රගත ව්‍යුහය සහ සංවිධානය 'ගම, පන්සල, වැව, දාගැබ' යන අංගෝපාංගවලින් සමන්විත වූ බව කියැවේ.

'ගම්වව්' යනුවෙන් පැරණි සෙල්ලිපියක සඳහන් වන්නේ, 'ලංකාවේ සෑම ගමක ම වැවක් වූ බව' යි(ලියනගමගේතගුණවර්ධන:1987:285). මෙම වැව නිර්මාණය වූයේ, කඳුකර ප්‍රදේශයක සිට පහත් බිමකට ගලා බස්නා ජල මාර්ගයක් හරස් කර වේල්ලක් බැඳීමෙනි. එසේ නොමැති නම් වර්ෂා ජලය ඒකරාශී කර නිර්මාණය කරගත් ජලාශයක් මගිනි. එය මදක් ගැඹුරට කැනීමෙන් ජලය රැස්කර ගැනීමට හැකි අයුරින් සකස් කෙරිණි. වැව කැනීමෙන් ලබාගත් පස් රැගෙන ගමේ උස් ස්ථානයේ දාගැබ (චෛත්‍ය) නිර්මාණය කෙරිණි. ගමෙහි කොතැන සිට බැලුවත් මෙම දාගැබ දිස්වෙන ආකාරයට එය ඉදිකෙරිණි. බෞද්ධ දර්ශනයෙන් පෝෂණය වූ ලාංකේය සිංහල ජනසම්ප්‍රදායේ දාගැබ ආධ්‍යාත්මික සහනශීලීත්වයේ සංකේතයයි. දාගැබ තැනීමේ දී එහි හැඩය ගැමියාගේ ආධ්‍යාත්මයේ පැවති ගැඹුරු ජීවන දර්ශනය කැටිකර ගත් ප්‍රතිභා ශක්තිය ඔස්සේ නිර්මාණය කෙරිණි. ධාන්‍ය, ජලය, ඝන්ඨාව, නෙළුම මල, කළගෙඩිය, නෙල්ලි ගෙඩිය ලාංකේය සංස්කෘතියේ ගැමි ජීවිතය සමග ඓන්ද්‍රීයව බැඳී ඇති භෞතික හැඩතල කිහිපයකි. එහිදී ගොවිතැන සමග ජලය, ධාන්‍ය බද්ධව පවතියි. විහාරස්ථානයේ ඝන්ඨාරය යනු, ගැමියන් කැඳ වූ සන්නිවේදන ක්‍රමෝපායකි. වරෙක එම නාදය ආමිස පූජාවෙන් ජනතාවගේ මනස ආධ්‍යාත්මික වශයෙන් පෝෂණය කරවීය.

බුදුදහමෙන් පෝෂණය වූ කලාකරුවා 'නෙළුම් මල' බෞද්ධ දර්ශනයේ ආධ්‍යාත්මික ලක්ෂණ නිරූපණය පිණිස උපයෝගී කර ගත් සංකේතයකි. නූතනයේ මෙය පූජනීය සංකේතයක් බවට පත්ව ඇත. බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතයේ විවිධ අවස්ථා නිරූපණය කිරීමේ දී නෙළුම් මල

යොදාගෙන ඇති බව පෙනේ. එමෙන් ම නෙළුම් මල නිමිති ශාස්ත්‍රයට අනුව සෞභාග්‍යය, යහපත් බව, පූජනීයත්වය හඟවන සංකේතයක් වශයෙන් ද දැක්විය හැකි ය.

බුදුදහමෙන් පෝෂණය වූ ගැමියාගේ අන්‍යෝන්‍ය බැඳීම, පූජනීයත්වය, සෞභාග්‍ය නිරූපණය කිරීම පිණිස පුන්කළස යොදා ගැනුණි. මෙය කළගෙඩියක හැඩයගත් බව පෙනේ. පුන්කළස ජලය රැස් කර තබා ගැනීමේ උපකරණයක් වශයෙන් ද භාවිතයට ගෙන ඇත. නිදසුනක් වශයෙන්, කළස හෙවත් කළගෙඩිය සිංහල ජනසම්ප්‍රදායේ විවිධ අර්ථ නිපදවන ආකාරය පහත පරිදි පෙන්වාදිය හැකි ය.

සෞභාග්‍ය	-	පුන්කළස
පූජනීයත්වය	-	බෝධි පූජා පැවැත්වීම, පිරිත් මණ්ඩප සඳහා පැන් තැබීම, දේව දාන සඳහා ජලය රැස්කර තැබීම, මුට්ටි නැමීම, පනම් බැඳීමේ චාරිත්‍ර සඳහා
අන්‍යෝන්‍ය බැඳීම	-	පින්තාලිය තැබීම
ජීවන අවශ්‍යතා	-	ජලය රැස්කර තබාගැනීම

නෙල්ලි ගෙඩියේ හැඩය දාගැබ් නිර්මාණය සඳහා යොදා ගැණිනි. රස කිහිපයක් (තික්ත රස, අඹුල් රස, කහට රස, පැණි රස, කටුක රස) සහිත ඖෂධීය ගුණ සහිත පලතුරක් වශයෙන් නෙල්ලි දැක්විය හැකි ය(ඇල්පිත්:2010.01.10:ස.ස). මේ ආකාරයෙන් විශ්වාසය, ගෞරවය, පූජනීයත්වය හා කෘතවේදීත්වය යන මානව හැඟීම් නිර්මාණශීලීත්වය ද ගලපා දාගැබ සැකසුණි.

වැව නිර්මාණය කිරීමෙන් ගොවිතැන සඳහා අවශ්‍ය ජලය ලබා ගැනුණි. ගොවිතැනින් ලද අස්වැන්නෙන් ජනතාව ජීවත්විය. එහි නොඉඳුල් පළමු කොටස මානව ජීවිතය ආශිර්වාදයෙන් හා මාර්ගෝපදේශයෙන් පෝෂණය කරන තෙරුවන සඳහා පූජා කෙරිණි.

මහින්දාගමනයත් සමග වඩාත් මානවීය සම්බන්ධතා හා කළමනාකරණ සංකල්ප ඔස්සේ නිර්මාණය වූ 'ග්‍රාමය' යුග ගණනාවක් පුරා පැවති බව ගම පිළිබඳ රැල්ෆ් පීරිස් මහතාගේ සටහනින් පෙනී යයි. ''උස්තැනක සිට වැව් රට නිරීක්ෂණය කරන විට බැබලෙමින් පැතිරී ඇති ජලාශයට අනුබද්ධව ඇති රන්වන් ගොයම් කෙත් නැමති තිත්වලින් පුල්ලි වැටුණු අතරතුරාවක් නැති කැළෑවක් සේ එය දිස් වේ. වැව් බැඳි විශේෂ ලක්ෂණයක් වූ කේන්ද්‍රය ග්‍රාම වාසස්ථානය යි. එළවළු වැවීම සඳහා වූ ගෙවත්තකින් සෑම නිවසක් ම වට වී තිබුණි. ගෙපැල ඉදිරිපිට ධාන්‍ය තැන්පත් කිරීම සඳහා වේවැල් වලින් සාදන ලද දවුල් කඳක හැඩයෙන් යුත් මඩුවකි. එම මඩුව තුළ ගොවි උපකරණ තැබීම සඳහා අට්ටාලයක් තිබුණි''(පීරිස්:1964:244).

'ගමයි පන්සලයි වැවයි' දාගැබයි යන කළමනාකරණ සංකල්ප ඇසුරේ සිංහල ජනසම්ප්‍රදායේ සාම්ප්‍රදායික ගම නිර්මාණය වූ බව පෙනේ. ඵලදායික බව ගම කේන්ද්‍ර කරගත් ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයේ පදනමයි. නූතනයේ ඵලදායිත්වය වශයෙන් හැඳින්වෙන මෙම සංකල්පය සාම්ප්‍රදායික ගම තුළ සශ්‍රීකත්වය වශයෙන් හැඳින්විණ. ගැමියා මෙම සශ්‍රීකත්වය සඳහා මග විවර කරගත්තේ වැව, විහාරය හා ප්‍රජාව අතර

සබඳතා ගොඩනංවමින්, ප්‍රජාවේ භෞතික හා ආධ්‍යාත්මික චර්යා කළමනාකරණය කිරීම මගිනි. කෝට්ටේ යුගය වන විට ලියැවුණු සංදේශ කාව්‍ය මගින් එලදායි බව පෙන්වා දෙන්නේ මෙසේ ය.

'පැසෙයි රුවට කෙත්වත් ගොඩින් මඩින්
තොසෙයි එසමග ම දුට ඒ වැබඩින් වඩින්.....

පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට
අසෙයිළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට (හංස සංදේශය:2005:157,161)

ලක්දිව සෑම ප්‍රදේශයක් ම ජනාවාස පිහිටුවීමත් සමග මූලික අවශ්‍යතාව වන ආහාර නිපදවා ගැනීම එම ප්‍රදේශ මුල් කරගනිමින් සිදුවිය. ගොඩබිමින් ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත්ව වර්ධනීය වී නොතිබීම එයට හේතුවකි(ආරියදාස,2016.02.24:ස.ස). මේ නිසා ගැමියන් විසින් ජීවනෝපාය සඳහාත් පරිසර අභියෝග ජය ගැනීම සඳහාත් ඒ ඒ ප්‍රදේශවලට ආවේණික ස්වයංපෝෂිත අර්ථක්‍රම ගොඩනගා ගැනුණි.



රුක් සටහන - ග්‍රාමීය මානව සම්බන්ධතා කළමනාකරණ ව්‍යුහය

ලාංකේය සිංහල ජනසම්ප්‍රදායේ සංස්කෘතික ව්‍යුහය සැකසීමට බලපා ඇති මූලික සාධකයක් වන්නේ කෘෂිකර්මාන්තය යි. අනාදිමත් කාලයක පටන් ශ්‍රී ලංකාව කෘෂිකර්මය මත රඳා පැවති රටකි. ලාංකේය කෘෂිකාර්මික අර්ථ ක්‍රමයේ ඉතිහාසය විජයාගමනයට වඩා ඈතට දිවෙන නමුත් කෘෂිකර්මාන්තය සමග බැඳුණු වාරි කර්මාන්තයේ වර්ධනය විජයාගමනයේ පටන් පැවත එන බව පෙනීයයි. 'විජය රජුගේ පැමිණීමෙන් පසුව ගංගා අසබඩ ජනාවාස පිහිටුවාගත් ආර්යෝ උතුරු මැද පළාත කේන්ද්‍ර කරගනිමින්

කෘෂි ජනාවාස පිහිටුවා ගත්හ(පියසේන:1994:22). ආර්යයන්ගේ පැමිණීමෙන් පසු මෙරට භූගෝලීය හා පාරිසරික තත්ත්වයට ගැළපෙන පරිදි වාරිමාර්ග ක්‍රම ඔස්සේ කෘෂිකර්මාන්තය ගොඩනැගිනි. මේ නිසා ජනාවාස පිහිටුවා ගැනීම කෘෂිකර්මය මූලික කොටගෙන සිදුවිය.

'ක්‍රි.පූ. 500 දී පමණ ආර්යයන්ගේ ප්‍රධාන රැකියාව කෘෂිකර්මාන්තය විය. සිංහල රජ දරුවන්ගේ ඉතිහාසය ඔවුන් විසින් කරවන ලද වැව් සහිත වාරිමාර්ග යෝජනා ක්‍රම පිළිබඳව කරන සඳහන් වලින් යුක්ත වේ'(සිංහල විශ්වකෝෂය:1991:616). කෘෂිකර්මික පසුබිමක ජීවත් වූ විජය කුමාරු මෙරට රජ වීමෙන් පසුව රාජානුග්‍රහය සහිතව කෘෂිකර්මය ගොඩනැගෙන්නට ඇත. මේ නිසා පසුකාලීනව ලාංකේය රජවරු වැව් හා වාරිමාර්ග කෙරෙහි අවධානය යොමු කළ බව පෙනී යයි.

මෙරට කෘෂිකර්මාන්තය හා වාරිකර්මාන්තයේ පැවති දියුණුව ඇසුරින් සිංහල ජනසම්ප්‍රදාය පෝෂණය වූ ආකාරය විද්වතුන් විග්‍රහ කර ඇත. මාර්ටින් වික්‍රමසිංහ දක්වන පරිදි, ''සිංහල සංස්කෘතියේ ශ්‍රේෂ්ඨතම අංගය ලෙස සැලකිය යුත්තේ වැව් ය.'' සිංහල ජනසම්ප්‍රදායෙහි අදීන අංගයක් ලෙස සැලකිය යුතු සමහර ජනකතා, දේවකතා, සිරිත් හා ඇතැම් උපකරණ ද උපන්නේ වැව් නිසා යැයි වික්‍රමසිංහ මහතා පෙන්වාදෙයි. එහිදී සිංහලයන් සමාජයක් නොහොත් පොදු කාර්යයක් උදෙසා එකම අදහසකින් බඳිනු ලැබූ ජනතාවක් ලෙස පළමුව සෑදුණේ මෙම වැව් තැනීමත්, කෘෂිකර්මයත් නිසා බව දක්වයි''(වික්‍රමසිංහ:1954:28,49,41).

ඒ අනුව වැව් සෑදීම හා කෘෂි කර්මාන්තය ලාංකේය සිංහල ජනසම්ප්‍රදාය පෝෂණය කිරීමට හේතු වූ බව හඳුනා ගැනීමට පිළිවන. 'පැරණි කාලයේ වැව් මත රඳා පැවති සමාජ ක්‍රමයක් පැවැති උතුරුමැද වියළි කලාපය, මහනුවර සමය වන විට සම්පූර්ණයෙන් මැ ජනශූන්‍ය පාළු පෙදෙසක් බවට පත්ව තිබිණි. අනුක්‍රමයෙන් සිංහල සභ්‍යත්වය තෙත් කලාපීය කඳුකරයේ ප්‍රතිෂ්ඨාපනය විය'(පීරිස්:1964:3). වැව් සහ කෘෂිකාර්මික සංස්කෘතිය ගොඩනැඟීම කෙරෙහි බුදුදහම හේතු විය. බුදුදහමේ සත්ත්ව ඝාතනය නොකිරීම අගය කිරීම සිංහලයාගේ මූලික ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම කෙරෙහි බලපෑවේ ය. එසේම කෘෂිකර්මාන්තය හා බැඳුණු සිරිත්විරිත් හා ආචාරධර්ම බෞද්ධාගමික වත්පිළිවෙත් කේන්ද්‍ර කරගනිමින් නිර්මාණය වී ඇත.

ii. ග්‍රාමීය ව්‍යුහයේ පරිසරය කේන්ද්‍ර කරගත් මහජන සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ

පරිසරය කෘෂිකර්මාන්තය හා බද්ධ වූ ප්‍රධාන සාධකයකි. වර්ෂාව, සූර්යාලෝකය, සුළඟ, සියතුන් සහ ගස්වැල් පරිසරය අතුරෙන් ප්‍රධාන වේ.

ගැමියාගේ ජීවනෝපාය වූ ගොවිතැන සඳහා මූලික අවශ්‍යතාවක් වන්නේ වර්ෂාවයි. ආදී මිනිසා වර්ෂාව යනු සොබාදහමේ දායාදයක් ලෙස සැලකීමට පුරුදු වී සිටියේ ය. ඔවුන් විසින් වර්ෂාව ස්වභාව ධර්මයේ සංසිද්ධියක් නොව දෙවියන්ගෙන් ලද ආශිර්වාදයක් ලෙස සලකන ලදී. වර්ෂාව හැඳින්වෙන විවිධ නාම සිංහල සංස්කෘතියේ දැකගත හැකිය. ඒ අතර 'වැහිපල මුත්තා, වැහිගම්පලයා, වැහිකෝඩය, වැස්ස වළාහක දෙවියෝ, වැහිගම්පල දොයියෝ, දුවන වැහි, අක්වැහි, හිරිපොද වැස්ස, හත්දා වැහි' ආදී ව්‍යාවහාර භාවිත කෙරේ.

වැහි පිරිත් කීම නියං සමයට වර්ෂාව පතා කරන පූජා කර්මයකි. එහිදී වැවේ සොරොව්ව අසළට ගොස් තුන්වරුවක්, හත්වරුවක් ආදී වශයෙන් පිරිත් දේශනා කෙරේ(සංසරතන හිමි:2012.03.03:ස.ස). එමෙන් ම පැන් පෙරහැර යනු නුවරකලාවිය ප්‍රදේශයේ වර්ෂාව පතා තිසා වැවේ පැන් ගෙනැවිත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ පැනින් නහවා කරන පූජා කර්මයකි. එසේම ශ්‍රී ලංකාවේ දළදා පෙරහැර මංගල්‍යය සිදුකරනු ලබන්නේ ද වර්ෂාව අපේක්ෂාවෙනි(දිසානායක:2010.05.25:ස.ස). එහිදී පෙරහැරක ගමන් ගන්නා අංග මගින් නිරූපණය කරනු ලබන්නේ වර්ෂාවේ ලක්ෂණයි. පෙරහැරේ පළමුව ගමන් ගන්නා කස පිපිරවීමෙන් විදුලියේ හඬත්, ගිනිබෝල කැරකැවීම මගින් විදුලියත්, පෙරහැරේ ගමන් ගත් අලි ඇතුන් මගින් වැහිවළාකුළුත්, නර්තනාංග මගින් වැසි ජලය ලැබීමෙන් ප්‍රීතියට පත් ජනතාවත් නිරූපණය කරයි(දිසානායක:2010.05.25:ස.ස). එපමණක් නොව වර්ෂාව මුල්කර ගනිමින් පැවැත් වූ මෙම පෙරහැර මගින් සිංහල ජනතාවගේ කලා කෞෂල්‍ය හා නිර්මාණ ශක්තිය ගොඩනැගිනි. ඔවුන් මෙමගින් ආධ්‍යාත්මික වශයෙන් ශ්‍රද්ධාව වඩවා ගත් අතර ඉවසීම ද පුරුදු පුහුණු විය. ඉන් සමාජීය සමගිය ද ගොඩනැගිණි. වර්ෂාව අපේක්ෂාවෙන් නුවරකලාවිය ප්‍රදේශවල ගායනා කරන පද්‍ය පංතියක් පහතින් වේ.

වැහැපං දෙයියා කස පැං	දෙඤ්ඤං
දොරකඩ පොල් ගහ නින්දෙම	දෙඤ්ඤං
හාන්ඩ මී ගොං බානක්	දෙඤ්ඤං
තනිකඩ අක්කා දීගෙට	දෙඤ්ඤං

මෙවැනි ගී අහස දෙස බලා හඬ නගා ගයනා කිරීම සිරිතකි. ඉන් වර්ෂාව ඇතිවන බවත්, අඩුවෙන් ලැබෙන වර්ෂාව වැඩිවෙන බවත් ගැමි විශ්වාසයයි(2012.03.03:නි.). මෙම ව්‍යාවහාර මගින් පෙනී යන්නේ වර්ෂාව යනු සිංහල ජනසම්ප්‍රදාය ගොඩනැගුණු සභ්‍යත්වයෙහි සාධකයක් පමණක් නොව සිංහල ගැමි ජනතාවගේ පාරිසරික ගනුදෙනුවල පැවති ආධ්‍යාත්මික සුහදශීලි බැඳීම හා සහසම්බන්ධතාවයි.

ගැමියන් ගොවිතැන් කටයුතු ආරම්භ කරන්නේ වර්ෂා කාලය පැමිණීමත් සමග ය. වැසි ලැබී, වැව් පිරී ගොඩ මඩ කුඹුරු වපුරා අස්වනු ගෙට ගන්නා තුරු එහි 'අක්යාල' (මුල්කොටස) වැහිපල දෙවියන් සඳහා ද කැපකොට පූජා කරන තෙක් මහත් වූ ගෞරවයෙන් ක්‍රියා කරයි. අස්වැන්නේ පළමු කොටස දෙවියන්ට පූජා කරන තෙක් ඉන් කිසිදු විටෙක ප්‍රයෝජන ගැනීමට ගැමියෝ නොපෙලඹෙති. මෙහිදී නියමිත දේවපූජා නොපිරිහෙලා ඉටු නොකරන ගමට හෝ වැසියන්ට දේව කෝපය නිසා නොයෙක් අපල උපද්‍රව, සාගත, වසංගතවලට මුහුණ පෑමට සිදුවේය යන හැඟීම ගැමියන් තුළ පවතියි(පුංචිරාළ:2009.08.25:ස.ස).

ගොවිතැන් කටයුතු සඳහා භාරහාර වීමේ දී කාසි පඬුරු ගැට ගැසීම, කිරි මුට්ටියක් ඉතිරිවීමට, කිරි ආහාර පූජාවකට හෝ ප්‍රණීත පූජා වට්ටියක භාරවීම, පොල් ගෙඩියක් දෙවියන් සඳහා කැපකොට වෙන් කිරීම දැකගත හැකිය(2015.05.05:නි.).

පොල් ගෙඩියක් වෙන් කිරීමේ දී ගසෙන් බිමට නොවැටුණු පැසුණු පොල් ගෙඩියක් ගෙන එහි ලෙල්ල (පොත්ත) ගලවා එහි ඇස්තුන නොපෙනෙන ලෙස සුද්ද කර දෙහියුෂ මිශ්‍ර කහ දියරෙන් සෝදා

පිරිසිදු කරගනියි. නුවරකලාවියේ හා සත්කෝරලයේ පින් ගහක් ලෙස පූජා කටයුතු සඳහා වෙන්කරගත් පොල් ගසක් ගෙවතුවල දැකගත හැකිය(2015.05.05:නි.). එම නිසා එම පොල් ගෙඩිය හඳුන්වන්නේ, 'පින් ගහෙන් ගත් ගෙඩියක්' ලෙසිනි(2015.11.31:නි.). මෙම පොල් ගෙඩිය පිරිසිදු කර ගැනීමෙන් පසු එහි සතර පැත්තේ බුලත් කොළයක හැඩයට හුණුවලින් 'අක්කරන්' අඳිනු ලැබේ. පසුව එම පොල් ගෙඩිය දෑතින් ගෙන හිස් මුදුනේ තබා දෙවියන්ට යාතිකා කොට නිවසේ ඉහළ ආරක්ෂිත ස්ථානයක තබයි(2015.11.31:නි.). මෙම පොල් ගෙඩිය වෙනත් ප්‍රයෝජන සඳහා නොගන්නා අතර හුණුවලින් අඳින ලද 'අක්කරන්'වලින් දෙවියන් සඳහා වෙන් වූවක් බව සන්නිවේදනය කරයි(2016.01.13:නි.). ගොවිතැන් සිදුකිරීමෙන් පසුව නැවත දෙවියන් සඳහා කරනු ලබන කිරි ඉතිරවීමක දී මෙම පොල් ගෙඩිය ප්‍රයෝජනයට ගනු ලැබේ.

එසේම ගොවිතැන් කිරීමට පළමුව භූමිය වෙන් කිරීමේ දී කුරුල්ලන් සඳහා 'කුරුලු පාලුව' වෙන් කිරීම ද සිරිතකි. වැවේ ජල ප්‍රමාණය අනුව 'කන්නය' වගා කෙරුණ ද සියලු කන්නවලදී මෙම කුරුලු පාලුව සඳහා ඉඩ වෙන් කිරීම ගොවියන් අනුගමනය කළ ආචාරධර්මයකි. කුරුලු පාලුව සඳහා භූමියක් වෙන්කරන්නේ ගොවිතැන් පිළිබඳ ඇති අත්දැකීමෙන් හා පළපුරුද්දෙනි. එහිදී වැව්ගම්මානයක කුඹුරු යාය පිහිටා ඇති වෙල් යායේ කුරුලු වාසස්ථානවලට සමීප දිශාවෙන් කුරුලු පාලුව පිහිටුවයි. වෙල් යාය වෙත කුරුල්ලන් පැමිණෙන දිශාවෙන් දිගටි හැඩයෙන් යුත් කනටි තීරුවක් ලෙස කුරුපාලුව වෙන් කෙරේ. මෙම භූමියේ බින්නැගීම, වැපිරීම හා වී ඉසීම සිදුකෙරෙන්නේ සාමූහිකත්වයෙනි. මීට අමතරව සත්කෝරලය හා නුවරකලාවිය ප්‍රදේශවල කුරුල්ලන් හා සිව්පාවුන් සඳහා වැවේ හෝ අමුණක ඉතිරි කරන ජලය 'මළ වතුර' ලෙස හැඳින්විය.

කුරුල්ලන්ගෙන් ගොවිතැනට සිදුවන උවදුරු වළක්වා ගැනීම මෙන් ම කුරුල්ලන්ගෙන් චර්යා මගින් ගොවිතැන් උවදුරු හඳුනා ගැනීමට මෙම කුරුලු පාලුව ඉවහල් වේ(ඇල්ජිත්:2010.01.10:ස.ස). ගොයම් කිරිවැදෙන කාලයේ දී කුරුල්ලන් කුඹුර වෙත පැමිණීමෙන් ගොයමට වැළඳී ඇති විවිධ පණු රෝග, කෘමි උවදුරු හඳුනාගත හැකි ය. එහිදී මෙම කෘමි උවදුරු මැඩලීම සඳහා කුරුල්ලන්ට ආරාධනා කරමින් කිරි ඉතිරවීම සිදුකරයි. කුඹුරේ කරල් පැසීමෙන් පසු කුරුලු පාලුව ඉදිරිපස නියරට පිටින් ඉපල් අතු තීරුවක් සිටුවයි. මෙම ඉපල් අතු නිසා ඉන් එපිට කෙතට කුරුල්ලන් නොගොස් කුරුලු පාලුවෙන් පමණක් වී කරල් ආහාරයට ගැනීමට පෙලඹෙයි(ඇල්ජිත්:2010.01.10:ස.ස).

මේ අනුව ලාංකේය සංස්කෘතියේ සිංහල ජනසම්ප්‍රදායේ පාරිසරික ගනුදෙනුවල පැවති ආධ්‍යාත්මික සුහදශීලි බැඳීමට අදාළ සිරිත්විරිත් හා ආචාරධර්ම මගින් පිළිබිඹු වන මහජන සම්බන්ධතා හා කළමනාකරණ ක්‍රමෝපායන් පහත සටහන මගින් පෙන්වාදිය හැකි ය.



රැක් සටහන - පාරිසරික සම්බන්ධතා හා කළමනාකරණ ව්‍යුහය

මේ අනුව මානව සමාජය යහපත්ව පවත්වා ගැනීමට අවශ්‍ය ගැඹුරු දාර්ශනික චින්තනයක් සමග බද්ධ වූ උසස් මානව හිතවාදී කළමනාකරණ හැකියාවක් ලාංකේය සංස්කෘතියේ පාරිසරක සම්බන්ධතා කළමනාකරණ ව්‍යුහය මගින් පිළිබිඹු කෙරිණි. එමගින් පුද්ගලයාගේ ජීවිත හා පරිසරය සමතුලිතව පවත්වා ගැනීමටත් අන්‍යෝන්‍යව පිටිවහල් වූ බව දැක්විය හැකි ය.

නිගමන

ලාංකේය සංස්කෘතියේ ග්‍රාමීය ව්‍යුහය කේන්ද්‍ර කරගත් මහජන සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ මගින් ගැඹුරු දාර්ශනික හා සමාජ-මනෝවිද්‍යාත්මක ලක්ෂණ ප්‍රකට කරන බව පෙනී යයි. ඒවා මානව ජීවිතය හා පාරිසරික සම්බන්ධතා කළමනාකරණය කිරීමේ ක්‍රම පුළුල් සමාජ අවස්ථා සංවිධානය කිරීමේ හැකියාවකින් සමන්විත වේ. සාමූහිකත්වය, කෘතවේදීත්වය, විශ්වාසය, ගෞරවය හා පූජනීයත්වය ලාංකේය සංස්කෘතියේ සිංහල ජනසම්ප්‍රදායේ මහජන සම්බන්ධතා හා කළමනාකරණයේ මූලික ආධ්‍යාත්මික පදනම වූ බව පෙන්වාදිය හැකි ය. එමෙන් ම ලාංකේය සංස්කෘතියේ ග්‍රාමීය ව්‍යුහය කේන්ද්‍ර කරගත් මහජන සම්බන්ධතා හා කළමනාකරණ ලක්ෂණ ඔස්සේ සමාජය මානව හිතවාදීව පවත්වාගැනීමට අවශ්‍ය පුද්ගල චර්යාත්මක පෙලඹවීම් සිදුකරමින් සමාජයේ අන්තර් සම්බන්ධතා හා කළමනාකරණ ව්‍යුහ ගොඩනංවයි.

මූලාශ්‍ර

අබේවර්ධන, එච්.ඒ.පී. (1985). සිංහල ගම හා කඩඉම්-මහවැලි වංශය, 2 කාණ්ඩය. කොළඹ, මහවැලි සංවර්ධන අධිකාරිය

ආරියපාල, එම්.බී. (1996). මධ්‍යකාලීන ලංකා සමාජය. කොළඹ, ගොඩගේ.

එල්ලාවල, එච්. (1962). පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කුමාරස්වාමි, ආනන්ද. (1962). මධ්‍යකාලීන සිංහල කලා. කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

නොක්ස්, රොබට්. (1995). එදා හෙළදිව. ඩේවිඩ් කරුණාරත්න (පරි.). කොළඹ, ගුණසේන

දිසානායක, උබේසේකර. (2010). අභිචාර. කොළඹ, ආරිය ප්‍රකාශන

දිසානායක, ජේ.බී. (1986). මහවැලි වංශය-දෙවැනි කොටස. කොළඹ, මහවැලි සංවර්ධන අමාත්‍යංශය.

පල්ලිගුරු, චන්‍ද්‍රසිරි. (1988). මහවැලි වංශය-දෙවැනි කාණ්ඩය. කොළඹ, මහවැලි සංවර්ධන අධිකාරිය.

පියසේන,චන්‍ද්‍රා (සංස්.). (1994). ශ්‍රී ලංකාවේ ඉතිහාසය (පළමු වැනි කොටස). අනුරාධපුර යුගය. කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පීරිස්, රැල්ෆ්. (1964). සිංහල සමාජ සංවිධාන. මහරගම, සමන් ප්‍රකාශකයෝ.

ලියනගමගේ, අමරදාසතගුණවර්ධන, රණවීර. (1987). අනුරාධපුර යුගය. කොළඹ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

වික්‍රමසිංහ, මාර්ටින්. (1954). සිංහල ලකුණ. රාජගිරිය, සරස ප්‍රකාශන.

වික්‍රමසිංහ, මාර්ටින්. (1994). මානව විද්‍යාව හා සිංහල සංස්කෘතිය. කොළඹ.

විමලකිත්ති හිමි, මැද්දෙ උයන්ගොඩ. (1952). සිංහල ගොවිතැන. ඩී.ජේ. හෙට්ටිගේ ප්‍රකාශන සමාගම.

විජේසේකර, නන්දදේව. (1966). ලංකා ජනතාව. කොළඹ, ගුණසේන සහ සමාගම

මහවැලි වංශය II. (1985). කොළඹ, මහවැලි සංවර්ධන අධිකාරිය.

මහාවංශය. (2003). දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සිංහල විශ්ව කෝෂය - 7 කාණ්ඩය. (1991). විජේතුංග,හරිචන්‍ද්‍රතසෙනෙවිරත්න,එස්.ඩබ්.(සංස්.)කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

හංස සංදේශය. (2005. ක්‍රිස්ටි ද සිල්වා. කොළඹ, රත්න පොත් ප්‍රකාශන

Foster, George M. (1973). Traditional Societies & Technical Change. India, Allied Publisher.

Hettiarachchi, Thilak. (1982). The Sinhalese Pesant in Changing Society. Colombo, Lake house Investment Ltd.

Leach, E.R (1961). Pul-Elliya: a village in Ceylon: Cambridge, Cambridge University Press.

Leavrs, R.W. (1889). Manual of the North Central Province in Ceylon. Colombo, Ceylon Goverment Printer.

සම්මුඛ සාකච්ඡා

ආරියදාස, එඩ්වින්. 2016.02.24 දින සිදුකළ සම්මුඛ සාකච්ඡාව (කොළඹ. සාහිත්‍යධර, විචාර, ආචාර්ය)

ඇල්පිත්, ජේ.ජී. 2010.01.10 දින සිදුකළ සම්මුඛ සාකච්ඡාව (දොරටියාව, කුරුණෑගල. වයස අවුරුදු 78. ගොවිතැන)

පුංචිරාළ, බී. 2009.08.25 දින සිදු කළ සම්මුඛ සාකච්ඡාව (මහියංගණය. වයස අවුරුදු 75. ගොවිතැන)

සංඝරතන හිමි, කහල්ලේ. 2012.03.03 දින සිදුකළ සම්මුඛ සාකච්ඡාව (සේනපුර, අනුරාධපුර. ශ්‍රී වනසිංහාරාමයේ, විහාරාධිපති)

නිරීක්ෂණ

2016.01.31 දින වයඹ පළාතේ සත්කෝරලයට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාගොල්ලාගම ප්‍රදේශයේ සිදු කළ නිරීක්ෂණය.

2015.11.31 දින දකුණු පළාතේ රුහුණුට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ කතරගම, තිස්සමහාරාම, දෙබරවැව ප්‍රදේශයේ සිදුකළ නිරීක්ෂණය

2015.05.05 දින මධ්‍යම පළාතේ සෙංකඩගල (නුවර) අයත් මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල, නත්තරන්පොත ප්‍රදේශයේ පැවති විවාහ මංගල අවස්ථාවකදී සිදුකළ නිරීක්ෂණ

2015.05.06 දින සබරගමු පළාතේ තුන්කොරලයට අයත් කෑගල්ල දිස්ත්‍රික්කයේ රන්වල ප්‍රදේශයේ සිදුකළ නිරීක්ෂණය

මානව භාෂාවේ විශේෂතා

දර්ශන මාපා පතිරණගේ

අනෙක් සතුන් අතර මානවයා අසහාය සත්ත්වයෙකි. ඔහු තිරිසන් සතුන්ගෙන් විශේෂ වීමට බලපෑ ප්‍රධානතම හේතුව වන්නේ මානව භාෂාව යි. සෑම සත්ත්වයෙක්ම මුඛය හා අංගෝපාංග ආශ්‍රයෙන් නොයෙක් පණිවුඩ හුවමාරු කර ගන්නා නමුදු, මානව භාෂාවේ ඇති හැකියාව නිසා සංකීර්ණ අදහස් හුවමාරු කරගැනීමට, සංකීර්ණ සමාජයක් හා අතිවිශාල පෘථුල ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට මානවයාට හැකි විය.මේ මහත් පෘථිවි තලය මෙන්ම ජීවි ලෝකය පාලනය කිරීමට මෙන්ම වෙනත් විශ්ව ලෝකයන් පිළිබඳව නිගමනයන්ට එළැඹීමට පවා මානවයා ලැබූ ශක්තිය කෙසේ ඇති වූවක් ද?

වෙනත් සත්ත්වයින්ට නොමැති අන්දමේ ඉන්ද්‍රීය ශක්තියක් හා බුද්ධි ශක්තියක් මානවයා සතුවීම, විශ්වය හඹා යෑමේ රහස වීය. මානවයා සතු ඉන්ද්‍රියයන් අන්‍ය සතුන්ට වඩා සංයමයකින් සියුම්ව භාවිත කළ හැකිවීම ඔහු ලැබූ මහඟු දායාදයක්. එම ඉන්ද්‍රියයන්ගේ මෙහෙයවීම ප්‍රාථමික මිනිසාගේ සිට වත්මන් මිනිසා දක්වා විවිධ නිර්මාණයන් කිරීමටත්, ශිෂ්ටාචාරවත් සමාජයක් බිහි කිරීමටත් ඔහුව පෙළඹවීය.

මොළය සියලුම අවයවයන් පාලනය කිරීමට සමත් විශේෂිතම ඉන්ද්‍රිය විය. වෙනත් සත්වයින්ගේ මනසට ගොදුරු වූයේ තමා ඉදිරිපිට ඇති දේ පමණක් වුවත්, මානවයාට අතීතයේ පැවති දේ මෙන්ම අනාගතයේ දී ඇති විය හැකි දේ ද මනසෙහි මවා ගනිමින් මතකයෙන් කටයුතු කළ හැකි වූයේ, මිනිස් මනසට ඇති කල්පනා ශක්තිය නිසා බව කිව යුතු ය.

මානවයා සතු වූ ඉන්ද්‍රිය ශක්තිය මෙන්ම බුද්ධි ශක්තියේ මහිමයෙන් අනෙක් සතුන්ට නොමැති විශේෂ හැකියාවක් ලබා ගැනීමට ඔහු සමත් විය. එනම් භාෂා හැකියාව යි. එය මිනිසා අනෙක් සත්ත්වයින්ගෙන් වෙන් කරනු ලැබූ ප්‍රධානතම සාධකය වූවා පමණක් නොව, මානව සමාජයේ ඇති සන්නිවේදන ක්‍රම අතුරින් ප්‍රබලතම සන්නිවේදන උපකරණය බවට පත් විය.

මානව භාෂාව මූලික වශයෙන් ඉන්ද්‍රියයන් සමූහයක් ක්‍රමානුකූලව චලනය කරමින් නිපදවන ශබ්දයන්ගෙන් සමන්විත වූවකි. මුඛ වාතය, පෝෂණ තන්තු, කණ්ඨය, දිව, තොල් ආදී ඉන්ද්‍රියයන් ක්‍රමානුකූලව චලනය කිරීමෙන් විවිධ විපර්යාසයන්ට භාජනය කිරීම භාෂාමය ශබ්ද නිර්මාණයේ දී සිදු වේ. ජන සමාජයක භාෂාමය අංග කිහිපයක් එක් වූ විට නිර්මාණය වන අර්ථය පිළිබඳව සම්මුතීන් සකස් කර තිබේ. මෙම සම්මුතිය එම භාෂාව භාවිත කරන සියලුම මිනිසුන්ගේ මනසෙහි තැන්පත්ව තිබේ.

උදා :- ගෙදරට කරත්තයක් එනවා.

මෙහිදී **ගෙදර+කරත්තය+එනවා** යන ශබ්ද සංකේත ගැමියන්ගේ මනසට එක් වූ විට ඔවුන් නිර්මාණය කරගත් සම්මුතීන් ක්‍රියාත්මක වීමෙන් පසු අදහස තේරුම් ගෙන, ඊට තම ප්‍රතිචාරය ක්‍රියාත්මක කිරීමට පියවර ගනී. ඒ අනුව තම ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක කරයි. මෙයින් හැඟෙන්නේ මානවයාගේ සියලු චින්තනයන් ක්‍රියාත්මක වන්නේ මානව භාෂාවේ ඇති හැකියාව නිසා බව ය. අතීතයක් වර්තමානයක් හෝ අනාගත දෘෂ්ටියක් සත්ත්වයින්ට නොමැති වීමට ත්, මානවයින්ට හිමි වීමටත් ප්‍රධාන සාධකය වන්නේ භාෂාව යි.

සෑම ජන සමාජයකම සංස්කෘතියේ ප්‍රධානම අංගයක් වූ භාෂාව මානවයා විසින් නිර්මාණය කරගන්නා ලද ප්‍රබලතම සන්නිවේදන මෙවලම යි. එය එක් එක් පුද්ගලයාගේ දෛනික ජීවිතයේදී අන් අයගේ සහාය ඇතිව හෝ තමාගේ සිත තුළින් නිර්මාණය වන සෑම සිතුවිල්ලකටම, පණිවිඩයකටම යම් කිසි ක්‍රමානුකූල බවක් සපයයි. සරලව ප්‍රකාශ කරතොත් කිසියම් ජන සමාජයක් තම සන්නිවේදන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමානුකූලව හා විධිමත් ව නිර්මාණය කරගත් ශබ්ද, සංකේත, සමුදාය වන්නේ භාෂාව යි. එලෙස නිර්මාණය කරගත් මානව භාෂක වර්ග අද වන විට ලෝකයේ පන්දහසකට අධික ප්‍රමාණයක් භාවිතයට ගනී.

මෙම භාෂාවක් වෙන්වීමට ප්‍රධානතම හේතු වී ඇත්තේ මානවයාගේ ලේ උරුමය යි. ''ඌ ඉංග්‍රීසිකාරයෙක්, ජපනෙක්, සිංහලයෙක්, දෙමළෙක්'' යනාදී වශයෙන් මානවයා වෙන් වන්නේ උරුම භාෂාව පදනම් කරගෙන ය. ඕනෑම පුද්ගලයෙක් උරුමයෙන් ලද භාෂාව ''මව් භාෂාව'' යනුවෙන් හැඳින්වේ. ලෝකයේ මානව පරිණාමය පිළිබඳ සලකන විට එක් එක් භාෂාවන් නිර්මාණය වීමට සංස්කෘතික හුවමාරුව ද බල පා ඇති බව පෙනේ.

සිංහලයේ ආරම්භය පිළිබඳ කරුණු දක්වන ඇතැම් මූලාශ්‍ර ''සිංහ ලෙයින් උපන් ජාතිය සිංහලය විණැ'' යි ප්‍රකාශ කළත් එය ජීව විද්‍යාත්මක වශයෙන් සාවද්‍ය බැව් පෙනේ. දේශීය ජනශ්‍රැති වලින් ප්‍රකට වන්නේ, ආදී කාලයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් වූ ශ්‍රී ලංකාවට භාරතයෙන්, චීනයෙන්, අරාබියෙන් ආ වෙළෙන්දන් මුතු, සේල මැණික්, ඇත් දළ මෙන්ම සේල මිලදී ගැනීම සඳහා මෙහි පැමිණි බව යි. සේල නිෂ්පාදනය කළ දේශය සේල දේශය හෙවත් හෙළ දේශය යනුවෙන් හැඳින්වී ය. ජනශ්‍රැතියේ සඳහන් වන පරිදි උත්තර භාරතයේ සික් දේශයෙන් පැමිණි විජය කුමරුන් ඇතුළු සත් සියයක් පිරිස හමු වූ කුවේණිය, සේල විවීම සඳහා කපු කටිමින් සිට ඇත. සික් දේශයෙන් පැමිණියවුන් හා හෙළයන් අතර ආවාහ විවාහය සික්+හෙළ, සී+හෙළ හෙවත් සිංහල බිහිවීමට හේතු වූ බව විශ්වාස කළ හැක.

1968 දී ආර්. ඒ. හෝල් (R.A. Hall) නම් විද්වතා ප්‍රකාශ කළේ, ''**භාෂාව යනු, මානව වර්ගයා විසින් සන්නිවේදනය ද, අන්‍යෝන්‍ය සම්බන්ධය ද පවත්වා ගැනීම සඳහා යොදා ගන්නා ඇබ්බැහිකම් පදනම් කොට භාවිත කරන වාචික, ශ්‍රව්‍ය, සංකේත සමූහයකින් යුත් ක්‍රම පද්ධතියකි.**''යන්න යි.

කථික භාෂාව හෙවත් කථන භාෂාව, ලිඛිත භාෂාව මෙන්ම සෑම ජන සමාජයකම භාවිත වන රූප භාෂාව හා එහි අර්ථයන්, හා මනෝභාවයන් මතු කිරීම එක් එක් සංස්කෘතීන්ට ම විශේෂිත ය.

ග්‍රාහකයා තුළ යම් කිසි උත්තේජයක් ඇති කිරීමට සමත් එවැනි රූපමය සන්නිවේදන ක්‍රම බොහෝ විට නිර්වාචික ප්‍රකාශයන් වේ.

මානව සංස්කෘතීන්ගේ සබඳතාවන් අතීතයේ සිට වර්තමාන සමාජය විවිධාකාරයෙන් දැකගත හැකිය. දිනෙන් දින දියුණු වන සන්නිවේදන තාක්ෂණය ඒ සඳහා මහඟු පිටිවහලක් සපයයි. එක් භාෂාවක් භාවිත වන සමාජයක් සහ අන්‍ය භාෂාවන් භාවිත වන සමාජ අතර සම්බන්ධතා ආක්‍රමණ, සංචාර, වෙළඳාම, ස්වභාවික හේතූන් ආදිය නිසා ඇති වේ. මෙසේ එකිනෙකින් වෙනස් භාෂා භාවිත වන සමාජ අතර සම්බන්ධතා නිසා, ඇතැම් භාෂාවක් කෙරේ අන්‍ය භාෂාවක හෝ භාෂා කිහිපයක බලපෑම දක්නට හැකිය.

උදා :- සිංහල භාෂාවේ "**කන්දට**" දෙමළ භාෂාවේ "**මලෙයි**" යනුවෙන් හැඳින්වෙන අතර, කොහොඹා කංකාරියේ මලය දේශයේ රජ්ජුරුවෝ යන්නෙන් පැවසෙන්නේ කන්දේ රජ්ජුරුවෝ යන්නට යි. කන්දේ රජ්ජුරුවෝ කඳ කුමරු, උස් කඳු කුමරා, ස්කන්ධ කුමරා, කඳු මත පිහිටි ලංකාපුර රාජධානියේ අගරජු **මහා රාවණ** යන්න එයින් ජනිත වේ. මෙලෙස භාෂා පරිණාමය ශීඝ්‍රවීම හා භාෂා සම්මිශ්‍රණයෙන් නව භාෂා ජනිත වීම ද සිදුවන්නට පුළුවන.

"භාෂාව යනු - මිනිසුන්, සමාජීය සමූහයක (ප්‍රජාවක) සාමාජිකයින් සංස්කෘතික කොටස්කරුවන් ද වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්ව හා සන්නිවේදනය සඳහා යොදා ගන්නා සම්මුතික වූ වාග් සංකේත පද්ධතියකි."

(බ්‍රිටැනිකා විශ්ව කෝෂය)

''භාෂාව යනු ලෝකය දෙස බලා අත්දැකීම් අර්ථ නිරූපණය කිරීමේ විශේෂ ක්‍රමයකි.''
(ක්ලයිඩ් ක්ලක්හෝන්)

"මානව භාෂාවේ ප්‍රභවය සිදුව ඇත්තේ මුල් මානවයා අතර ලිංගික අවශ්‍යතා මුල් කරගෙන ඇති වූ ආදර හැඟීම් මුල් කරගෙන යි."

(වාග් විද්‍යාඥ ජේස් පර්සන්)

ග්‍රීක දාර්ශනිකයන්ට අනුව, භාෂාව එකවර හදිසියේ බිහි වූවක් නොව, එය ක්‍රමයෙන් මිනිස් පරිණාමය ත් සමග වර්ධනය වූ සාධකයකි.

භාෂාව සමාජයේ පැවැත්මට අත්‍යවශ්‍යම අංගයක් ලෙස හැඳින්වීම වඩාත් නිවැරදි ය. ලෝකයේ ඇතැම් කොටස් වචන මඟින් තම අදහස් හුවමාරුව සිදුකර ගන්නා අතර, තවත් කොටසක් අංග චලන මගින් තම අදහස් හුවමාරු කර ගැනීම සිදු කරනු ලබයි. මේ සියල්ලම ''භාෂාව'' භාවිතයේ විවිධ ස්වරූපයන් ය.

ලෝකයේ පවත්නා සියලු ම භාෂාවන් **වාචික** හා **නිර්වාචික** වශයෙන් කොටස් දෙකකට බෙදනු ලැබේ. ඒ අනුව ''වාචික භාෂාව'' ලෙස හඳුන්වනුයේ ''අක්ෂර හෙවත් අකුරු යොදා ගනිමින්, තමන් තුළ හටගත් හැඟීම් අන්‍යන්ට අවබෝධ කරවීම පිණිස මුවින් පිටකරන ශබ්දයන් ය.'' ''නිර්වාචික භාෂාව'' යනු ''හුදෙක් වචන භාවිත නොකර ගනිමින් සංඥා සංකේත මගින් අදහස් හුවමාරු කර ගැනීම යි".

භාෂාවක ඇති ප්‍රධානතම අංගය ලෙස 'වචන' හඳුනාගත හැකිය. චේතනා, විරති, ශබ්ද වශයෙන් වචන ත්‍රිවිධාකාරයෙන් පුරාතන මිනිසා සැලකුවේය. චේතනා යනුවෙන් සරලව අදහස් කරනුයේ සිතෙහි පහළවන සිතුවිලි ය. විරති යන්නෙන් යමකින් වෙන්වීම අදහස් කරයි. යමකින් වෙන්වීම උදෙසා ප්‍රකාශ කරන ශබ්ද, වචන බව පැරැන්නන්ගේ මතය යි. නමුත් නියම භාෂාව වශයෙන් හැඳින්විය හැක්කේ ශබ්ද වශයෙන් හැඳින්වෙන වචන ය.

'භාෂාව' පිළිබඳ විවිධ පුද්ගලයින්, විවිධ කණ්ඩායම් අදහස් ප්‍රකාශ කර ඇත. ඒ අනුව අපරදිග විද්වතුන් භාෂාව නිර්වචනය කරනුයේ මෙසේ ය.

''භාෂාව, යනු යම්කිසි සමාජ කණ්ඩායමක් සහයෝගීව ක්‍රියා කිරීම සඳහා ඒ සමාජය විසින් පිළිගත් ශබ්ද සංකේත ක්‍රමයකි.''

''භාෂාව යනු ආත්ම දෙකක් අතර අදහස් හුවමාරු කර ගන්නා ක්‍රමයකි.''

මේ ආකාරයට භාෂාව පිළිබඳ විවිධ පිරිස් ඉදිරිපත් කළ, විවිධ අදහස් භාෂාවේ සංවර්ධනය කෙරේ බොහෝ සෙයින් දායක විය.

භාෂාව පිළිබඳව මුල්ම සාකච්ඡාව ඇති වූයේ වාග් විද්‍යාව තුළ ය. පශ්චාත් නූතනවාදී විචාරයේ මුල් පුරුකක් වූ **සොසී** ගේ අදහස වූයේ **''භාෂාව යනු පද්ධතියක් බව යි.''**

පද්ධතිය යනු සියලුම අංගෝපාංග එකට සම්බන්ධ වී ඇති ජාලයකි. යම්කිසි ව්‍යුහයකට අනුව සකස් වූව කි. වචන එකතු වී සෑදෙන වාක්‍ය, එකට සම්බන්ධ වී ජාලයක් ලෙස ක්‍රියා කරයි. එය පද්ධතියකි. එවැනි විවිධ ආකෘතිවලින් යුතු පද්ධති දැකිය හැකිය.

වාග් විද්‍යාඥයින්ගේ මතය අනුව භාෂාව මූලික සංකල්ප 3කින් යුක්ත වේ.

1. මානවයා සතු භාෂාව (Langage) ලංගාජ්
2. ජන සමාජය සතු භාෂාව (Langue) ලොංග්
3. පුද්ගලයා සතු භාෂාව (Parole) පරොල්

1. මානවයා සතු භාෂාව

භාෂාව යනු, සියලුම මිනිස් වර්ගයා සතු අනෙක් සත්ත්වයින් තුළ නැති විශේෂ හැකියාවකි. එය එක්තරා ආකාරයකට මානසික ඉන්ද්‍රියකි. එය පොදුවේ මනුෂ්‍යයා සතු පංචේන්ද්‍රීය සේ ම, භාෂා ඉන්ද්‍රියක් ලෙස ක්‍රියා කරයි. මානවයා සතු මතක තබා ගැනීමේ ශක්තිය හා පරිකල්පන ශක්තිය භාෂාව මත රඳා පවතී. මානවයන් අතර, භාෂාව ඔස්සේ සිතීම පාලනය වන්නේ වම්පස මොළයෙනි.

2. ජන සමාජය සතු භාෂාව

භාෂාව මඟින් ඉදිරිපත් වන අර්ථය මතු වන්නේ විවිධ සංකේත සහ රූප ඔස්සේය. විවිධ ප්‍රදේශවලට, සංස්කෘතීන්ට සහ ස්ථානවලට විශේෂ වූ රටාවකින් භාෂාව භාවිතා කරයි. ඒ ඒ සංස්කෘතීන්ට අනුව සකසා ගත් සම්මුතීන් අනුව මානවයා භාෂාව භාවිත කරයි.

වචනය	රූපය	අර්ථය
ගහ	ග්අහ්අ	

මෙම සම්මුතීන් ඇති වන්නේ රූපය ත්, සම්ප්‍රදාය ත් මත වීම විශේෂත්වයකි.

3. පුද්ගලයා සතු භාෂාව

ජන සම්මත භාෂාවක් තිබුණ ත්, ඒ සියල්ලම පිළිබඳ අවබෝධය ඇති පුද්ගලයෙක් සොයාගත නොහැකි ය. සිංහල භාෂාව පිළිබඳ සියල්ල දත් කෙනෙක් නැත. එනම් සිංහල භාෂාවේ ආරම්භය, විකාශය, වර්තමානය, වෙනස්වීම් ආදිය යි. සෑම පුද්ගලයෙක්ම සමාජයෙන් ග්‍රහණය කර ගන්නා භාෂාව, ඔහුගේ පුද්ගල ව්‍යවහාරයට අනුව භාවිත කරයි. ඔහුගේ ස්වීයත්වයට අනුව පැහැදිලි කරයි. භාෂාව සමාජය සතු වනවා සේ ම, පුද්ගලයා සතු වේ. එය එක් එක් අවස්ථා වලදී උචිත ආකාරයෙන් භාවිත කිරීම ත් පුද්ගලයා සතු කාර්යකි.

ඒ අනුව භාෂාව නිසා මානවයාට විශේෂ වූ ශක්‍යතාවයන් දෙකක් හඳුනා ගත හැකි ය.

1. භාෂා ශක්‍යතාවය
2. සන්නිවේදන ශක්‍යතාවය

1. භාෂා ශක්‍යතාවය

භාෂාවේ රීති පද්ධතියට අනුකූලව අලුතින් වාක්‍යයක් නිපදවා ගැනීමේත්, ඒවා වටහා ගැනීමේත් කුසලතාව භාෂා ශක්‍යතාව යනුවෙන් හැඳින්වේ.

2. සන්නිවේදන ශක්‍යතාව

මහාචාර්ය ඩෙල් හයිමස් නම් සන්නිවේදන විද්‍යාඥයා පෙන්වා දුන් පරිදි, භාෂා භාවිතයේ දී මානවයාට සන්නිවේදන ශක්‍යතාවය ද තිබිය යුතු ය. ඒ අනුව තැනට සුදුසු වාක්‍යයක් නිර්මාණය කර ගැනීමේ හැකියාව, එය නිර්මාණශීලීව හෝ පෙළඹවීක් ඇතිවන පරිදි ඉදිරිපත් කිරීමේ හා අවබෝධ කර ගැනීමේ හැකියාව සන්නිවේදන ශක්‍යතාව යනුවෙන් හඳුන්වයි.

භාෂාවේ ස්වභාවය පිළිබඳව අදහස් දක්වන **මහාචාර්ය ජේ.බී. දිසානායකයන්** ගේ මතයට අනුව භාෂාව සතු ගුණාංග දහය කි.

1. භාෂාව විශිෂ්ටතම මානව නිර්මාණය යි.
2. භාෂාව ප්‍රබලතම සන්නිවේදන මාධ්‍යය යි.
3. භාෂාව මුඛ්‍යතම සංස්කෘතික අංගය යි.
4. භාෂාව චින්තනයේ මූලික උපකරණය යි.
5. භාෂාව වාර්ගිකත්වයේ මූලික සංකේතය යි.
6. භාෂාව සමාජ තත්ත්ව දර්ශකයකි.
7. භාෂාව අනූපම ශක්ති ප්‍රවාහයකි.
8. භාෂාව සංකේත සමුදායකි.
9. භාෂාව රටා සමුදායකි.
10. භාෂාව රීති පද්ධතියකි.

භාෂාව මානවයාට පමණක් විශේෂ වූවක් ලෙස සැලකෙන හෙයින් ඔහු **''කථා කරන සත්ත්වයා''** යනුවෙන් හඳුන්වන බව **මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාසයන්** පවසයි. මානවයා විසින් ස්වෝත්සාහයෙන් භාෂාමය ලෝකයක් නිර්මාණය කොට තිබේ.

ද්‍රව්‍යයන් හා සත්ත්වයන්ගෙන් සමන්විත භෞතික ලෝකයේ මෙන්ම, ශබ්දයන්ගෙන් හා අර්ථයන්ගෙන් සමන්විත භාෂාමය ලෝකයේ ද, ඔහු ජීවත් වෙයි. ඔහු භෞතික ලෝකයේ තිබෙන දේ සහ වෙසෙන අය සමග සම්බන්ධතා පවත්වන ලෙසින් ම, භාෂාම ය ලෝකය සමග ද සම්බන්ධතා පවත්වයි. ඔහු අන්‍යයන් කියන දේ අනුව ක්‍රියා කරයි. වචන මඟින් අන්‍යයන් ක්‍රියාත්මක කිරීමට සමත් වෙයි. අතීතයේ පැවති, වර්තමානයේ පවතින, අනාගතයේ පැවතිය හැකි දේවල් හා පහළ විය හැකි දේවල් සහ සත්ත්වයන් ආදිය ගැන ත් ඒ ඒ දේ සහ ඒ ඒ සත්ත්වයින් අතර සම්බන්ධතා ගැන ත් සංකීර්ණ

අදහස් එකිනෙකා සමඟ හුවමාරු කර ගනී. මේ ආකාරයෙන් මානවයා භාෂාමය කටයුතුවල නිරත වන සත්ත්වයෙකු ලෙස හැඳින්විය හැකි ය.

මානව භාෂාව නිර්මාණයේ දී බිහි වූ විශේෂ සැලසුමක් වන්නේ මානව භාෂාව **ලිඛිත භාෂාව** හෙවත් **ගත් වහර** සහ **කථික භාෂාව** හෙවත් **කට වහර** යනුවෙන් දෙයාකාරයකින් යුක්ත වීම යි. **භාෂා ද්විරූපතාව** වශයෙන් හඳුන්වන මෙහිදී, ලිඛිත භාෂාව පරිශ්‍රමයෙන් හුරු කරගත යුතු අතර, කථික භාෂාව නිරුත්සාහයෙන් අවබෝධ කරගත හැකි ය.

ලිඛිත සහ කථික භාෂාව අතුරින් පැරණිම භාෂාව කථික භාෂාව යනුවෙන් හැඳින්විය හැකිය. කථික භාෂාවෙන් හැඳින්වෙන අර්ථ ශබ්ද සංකේත සමුදාය එක් එක් පුද්ගලයා තමාට අභිමත පරිදි කථනයේ යොදා ගත් අතර, එය පොදු සමාජයට ම ගැලපෙන පරිදි නිර්මාණය කරගත් විට ව්‍යාකරණ නීති රීති පද්ධතියකින් යුත් ලිඛිත භාෂාවකට මඟ පෑදී ය.

උදා :-

ලිඛිත භාෂාව

මම විශ්වවිද්‍යාලයට යමි.

මම මින් පසු ඇයට නොලියමි.

කථික භාෂාව

මම විශ්වවිද්‍යාලයට යනවා.

මම මීට පස්සෙ ඇයට ලියන්නෙ නෑ.

භාෂා ද්විරූපතාව පිළිබඳ ව මුල්වරට සාකච්ඡා වූයේ 1960 දශකයේ දී ය. **චාල්ස් ෆර්ගියුසන්** නම් ඇමරිකානු සමාජ වාග් විද්‍යාඥයා භාෂා හතරක් (ග්‍රීක්, අරාබි, ස්විස්, ජර්මන්, තහිති දූපතේ ප්‍රංශ භාෂා) ඇසුරෙන් මේ තත්ත්වය පැහැදිලි කළේ ය.

ලේඛන භාෂාව හා ව්‍යවහාර භාෂාව අතර ව්‍යාකරණමය වශයෙන් විශාල පරතරයක් පවතී. බැලූ බැල්මට, ලේඛන ව්‍යාකරණ සංකීර්ණ ය. ව්‍යවහාර භාෂාවේ ව්‍යාකරණ සරල ය. (බොහෝ භාෂකයෝ ව්‍යවහාර භාෂාවේ ව්‍යාකරණයක් නැතැ යි සිතති.)

ලෝකයේ පවතින සෑම භාෂක සමාජයකටම බලපාන සමාජයීක, ආර්ථික, දේශපාලන සාධක කලින් කලට වෙනස් වෙයි. ඊට අනුරූපව භාෂාව ද වෙනස් වෙයි. ඒ අනුව භාෂා භාවිතය පිළිබඳ පොදු සම්මුතීන් ද වෙනස් වේ.

සිංහල භාෂාවේ පවතින ද්විරූපතාව පිළිබඳව වරින් වර විවිධ පුද්ගලයන් විවිධ මතවාද හඳුන්වා දුන්නේ ය. ලේඛනයෙහි භාවිත වන විධිමත් භාෂා ස්වරූපය භාවිතා කළ යුතු ආකාරය ත්, එදිනෙදා කටයුතු සඳහා ව්‍යවහාර කරන භාෂා ස්වරූපයන්ට හිමි විය යුතු තැන ත් පිළිබඳ සමාජ සංවාද ඒ අතර විය.

සිංහල භාෂක සමාජයේ පවතින භාෂා ද්විරූපතාව ආශ්‍රයෙන් පැන නැගුණු සමාජ සංවාදය අධ්‍යයනය කිරීමෙන් සිංහල භාෂා භාවිතය පිළිබඳ පමණක් නොව, භාෂාවේ ස්වරූපය පිළිබඳව ද අවබෝධයක් ඇති කරගත හැකිය.

සත්ත්වයින්ගෙන් මානවයා විශේෂ වීමට හේතු වූ භාෂා භාවිතයට ඇති හැකියාව විවිධ දෘෂ්ටි කෝණ ඔස්සේ වර්ගීකරණය කරති. ඒ භාෂාවේ ඇති විශේෂතාවන් ය.

1. සංස්ථිතික විශේෂතා

භාෂාවට අයත් ඒකක (භාෂාංග ස්ථර කිහිපයක් යටතේ සංවිධානය වී තිබේ.) භාෂාවෙන් අදහස් ඉදිරිපත් වන්නේ ඒ ඒ භාෂාවන්ට සම්මත වූ යම් කිසි සැලැස්මකට අනුව ය. අපට අවශ්‍ය ඕනෑම ස්ථානයකට ඕනෑම වචනයක් හෝ පදයක් භාවිත කළ නොහැකිය.

උදා :- විභක්ති පද නිතරම නාම පදයේ අගට එකතු කළ යුතු ය. මුලට හෝ මැදට සම්බන්ධ කළ නො හැක.

මං හෙට උදේට ගමටු යනවා

විභක්ති පද අගට යෙදේ.

භාෂාව යනු පද්ධතියකි. එම පද්ධතියේ අනු පද්ධති ගණනාවක් පවතී. භාෂාවේ තුළ ඇති ශබ්ද ගණන සීමා සහිත ය. ලෝකයේ භාවිත වන බොහෝ භාෂාවල ශබ්ද සංඛ්‍යාව 20-60ත් අතර වේ. සිංහල භාෂාවේ ශබ්ද 40ක් දක්වා දක්නට ලැබේ.

මෙම ශබ්ද එකිනෙක සම්බන්ධ වන විශේෂ ක්‍රමයක් ඇත.

Sport	[Spo:t]	ස්ප්හෝට්
School	[Sku:l]	ස්ක්හුල්

එක් භාෂාවකින් තවත් භාෂාවක වචනයක් ගමන් කරද්දී, දෙවන භාෂාවේ ආසන්නයේ ඇති ශබ්ද උකහා ගැනීම ද විශේෂත්වයකි.

කොෆී - කෝපි

ටොෆී - ටොපි

2. ජීව විද්‍යාත්මක විශේෂතා

මිනිසාගේ මොළය අනෙක් සතුන්ට වඩා විශේෂ ආකාරයකින් ක්‍රියා කරයි. ජීව විද්‍යාත්මක වශයෙන් ස්නායු හා අතපය දකුණු මොළයෙන් ක්‍රියාත්මක වන අතර, මොළයේ ක්‍රියාකාරීත්වය හා භාෂාව අනුව සිතීම වම් මොළයෙන් ක්‍රියාත්මක වේ.

පෙණහළුවල සිට එන වායු ධාරාව විවිධ හැල හැප්පීම්වලින් ඉහළට පැමිණ දිව නම් ඉන්ද්‍රිය ඉහළ පහළ යවමින්, ඉදිරියේ තොල්වල, දත්වල ගැමෙන් විවිධ ශබ්ද නිකුත් කරයි. අනෙක් සතුන්ට අපහසු කරුණක් වනුයේ මිනිසාට තරම් දිව චලනය කිරීම ඔවුන්ට නොහැකි වීම යි. එනිසා සතුන්ට කථා කළ නොහැකි ය.

එසේම භාෂා හුරුවිය හැකි අවදින් ඇත. ඒවා භාෂා උපාර්ජන අවදින් හා තීරණාත්මක භාෂා අවදින් ලෙස හඳුන්වයි.

ශබ්ද වෙන් වෙන්ව රූපමය වශයෙන් අවබෝධ කර ගැනීමේ හැකියාව සහ මොළයේ සංයුතිය, ජීව විද්‍යාත්මක ලෙස මිනිසාට ලැබූ හැකියාවක් ලෙස විග්‍රහ කළ හැකි ය.

3. භාවිතය පිළිබඳ විශේෂතා

භාෂාව භාවිත කිරීමේදී එක් එක් පුද්ගලයා සතු විශේෂ හැකියාවන්, සහජ හැකියාවන් හා නිර්මාණශීලීත්වය භාවිත කරමින් සන්නිවේදනය කිරීමේ හැකියාව මානවයාට පවතී.

චාල්ස් ඒ. හොකට් (1965) භාෂා සන්නිවේදනයෙහි ඇති විශේෂතා ගණනාවක් හඳුන්වා දුන්නේ ය. ඒවායින් වැඩි ප්‍රමාණයක් භාෂාවේ භෞතික ස්වරූපය හා සම්බන්ධ ය.

1. ද්විත්වතාවය/ ද්වන්දාත්මක සංස්කරණ රටා (Dililty)

භාෂාව එක් පසෙකින් ශබ්දමය වශයෙනුත්, අනෙක් පසින් අර්ථමය වශයෙනුත් සංස්කරණ රටා දෙකකින් යුක්ත ය. සෑම භාෂාවකම ශබ්ද ගණන සීමා සහිත වන අතර, ඒවා අර්ථයකින් තොර ය. නමුත් ශබ්ද විවිධ ආකාරයෙන් සංයෝග කිරීමෙන් අර්ථවත් වචන අසීමිත ගණනක් තනා ගත හැකි ය.

උදා :- ''මිනිස්'' යන ප්‍රකෘති පදය ත්, ''ආ'' යන ප්‍රත්‍යය ත් එකතු වීමෙන් මිනිස් + ආ ''මිනිසා'' යන අර්ථවත් පදය නිර්මාණය වේ.

2. විවෘතභාවය හෙවත් නිර්මාණ ශක්තිය (Open-endedness)

මානව භාෂා සතු විශේෂ හැකියාවක් වනුයේ භාෂාවේ ඇති ශබ්ද පද එකතු කිරීමෙන්, සීමාවකින් තොරව අලුත් තොරතුරු, නව වාගාලාප සන්නිවේදනය කිරීමේ හැකියාව යි.

උදා :- සිංහල භාෂාවේ ඇති ''ස්වර'' ගැලපීමෙන්,

භෂ්ම+අවශේෂ	= භෂ්මාවශේෂ
සිංහල+අභිමානය	= සිංහලාභිමානය
මහින්ද+ආගමන	= මහින්දාගමන

3. රුඩිකෘත බව හෙවත් අත්තනෝමතික ස්වභාවය (Arbitrayness)

මානව භාෂාවේ ප්‍රකාශිත අර්ථය හා ප්‍රකාශනයේ ස්වරූපය අතර ඍජු සම්බන්ධතාවයක් දක්නට නොලැබීම, රුඩිකෘතබව හෙවත් අත්තනෝමතික ස්වභාවය යනුවෙන් හඳුන්වයි. එනිසාම විවිධ භාෂාවල එකම රූපය සඳහා විවිධ ශබ්ද හා පද භාවිතා කිරීම දක්නට ලැබේ.

සිංහල භාෂාවෙන් - කන්ද

දෙමළ භාෂාවෙන් - මලෙයි

ඉංග්‍රීසි භාෂාවෙන් - Mountain (මවුන්ටන්)

4. උත්තේජනයට ලැබෙන ප්‍රතිචාරයේ අවිනිශ්චිත බව (Unsure Reply)

සත්ත්වයෙකුට තවත් සත්ත්වයෙක් ඉඟියක් කළ විට, උගේ ප්‍රතිචාරය එම ජීවී ස්වභාවයට අනුව පොදු ප්‍රතිචාරයකි. බල්ලකු සර්පයෙක් දුටු විට බුරන ආකාරය තවත් බල්ලකුටත් පොදු ස්වභාවයකි. කාක්කෙක් කෑමක් දුටු විට කෑ ගහන ස්වභාවය ඕනෑම කාක්කෙකුට පොදු ය. නමුත් මනුෂ්‍යයකුට තවත් මනුෂ්‍යයකු යමක් ප්‍රකාශ කළ විට ඔහුගේ ප්‍රතිචාරය කුමක් වේ දැයි අවිනිශ්චිත ය.

සන්නිවේදනය

අම්බලමේ ටිකක් ඉඳලා යමුද නඟෝ

විය හැකි ප්‍රතිචාර

යන්නම් අයියණ්ඩි ගම රට දුර හින්දා

ඒවට වෙන කෙනෙක් අල්ල ගන්නවා

කන පැලෙන්ඩ ගහනවා.

මේ එනවා අයියා.

මේ ආකාරයෙන් ප්‍රතිචාර ගණනාවක් තිබිය හැකි ය.

5. දුරස්ථාපනය හෙවත් ප්‍රකරණයෙන් වියුක්ත ප්‍රකාශන සිදු කිරීම (Displacement)

මානව භාෂාවට ඇති විශේෂ හැකියාවක් වනුයේ මේ මොහොතේ මෙම ස්ථානයේ නොමැති, අතීතයේදී සිදු වූ හෝ අනාගතයේ දී සිදුවිය හැකි ඕනෑම දෙයක් පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමේ හැකියාව යි.

උදා :- යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජෙක් රාජ්‍ය පාලනය කරණ කල්හි.....

උඹලට කියන්ඩ පුතේ... ඒ කාලේ උඹලගේ අප්පච්චි කුඩා එකා. දවසක් හෙණ වැස්සක් වැටුණා....

6. සහජ ශක්තිය (Innateness) හා සංස්කෘතික සම්ප්‍රේෂණය මත උරුම වීම (Cutur al Transmission)

මානවයා භාෂා හැකියාව උපතින්ම රැගෙන එන්නකි. එය මානවයාට පමණක් උරුම වූවක් වන අතර, එයට අනුරූපව මොළයේ ක්‍රියාකාරීත්වය සිදු වේ. එය සහජ ශක්තිය වේ. බුද්ධ දර්ශනයට අනුව පෙර භවයේ යටි සිතට කා වැදුණු යම් යම් ස්වභාවයන් ඊළඟ භවය දක්වා රැගෙන ආ හැකි ය. එය සහජය හෙවත් සහජ දක්ෂතාවය ලෙස හඳුන්වයි. එවන් කුඩා දරුවන්ට අඩු වයසේ දී වෙනත් භාෂාවන් කථා කිරීමට, ලිවීමට, කියවීමට හැකියාව ඇත. එමෙන්ම මවගේ, පියාගේ හෝ ගුරු කුලයේ උරුමය මත භාෂා දැනුම පරපුරෙන් පරපුරට රැගෙන යාම විශේෂත්වයකි.

මෙවන් වූ විශේෂ හැකියාවන් ලෝකයේ පවතින එකිනෙකින් වෙනස් භාෂාවන්ට විවිධාකාරයෙන් උරුම වීම, ඕනෑම භාෂාවකට හුරු වීමට මානවයාට හැකි වීම හා මනුෂ්‍යයාගෙන් මනුෂ්‍යයයාට භාෂාව භාවිතා කරන ආකාරය හා උච්චාරණය කරන ආකාරය වෙනස් වීම, මානව භාෂාවේ අද්විතීය විශේෂත්වයක් ලෙස පෙන්වා දිය හැකි ය.

මූලාශ්‍ර

වික්‍රමසිංහ, මාර්ටින්. (1962). උපන්දා සිට, සමන් ප්‍රකාශකයෝ - මහරගම.

දිසානායක, විමල්. (1970). නිර්මාණය හා විචාරය, ප්‍රදීප ප්‍රකාශකයෝ - කොළඹ.

ගම්ලත්, සුචරිත. (1971) සාහිත්‍ය ලෝකය හා සැබෑ ලෝකය, ප්‍රදීප ප්‍රකාශකයෝ - කොළඹ.

ධර්මදාස, කේ. එන්. ඕ. (1972). භාෂාව හා සමාජය, ලේක් හවුස්, කොළඹ.

දිසානායක, ජේ.බී. (1962). සිංහල ජනවහර, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

වික්‍රමසිංහ, මාර්ටින්. (1962). සාහිත්‍ය කලාව - සමන් ප්‍රකාශකයෝ, මහරගම.

මහේන්ද්‍ර, සුනන්ද. (1998). ආබරනැල්ල. ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

සුභාෂිතය. (1995). අධ්‍යාපන ප්‍රකාශනය.

සුරවීර, ඒ. වී. (1987). නිර්මාණ පසුබිම - ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ.

විජේසූරිය, සරත්. (1995). නිර්මාණ අධ්‍යයනය, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.

නාට්‍යමය පෙළපාළි හා සන්නිවේදනය

මංගල කීර්ති ද පැස්කුවල්

ජනශ්‍රැතිය අධ්‍යයනය කර බැලීමේ දී ජන නාට්‍ය ජනප්‍රිය ජනශ්‍රැතිකාංගයක් ලෙස ව්‍යාප්ත වී ඇති බව හඳුනාගත හැකි ය.ශ්‍රීලංකාව, ග්‍රීසිය, චීනය, ජපානය, මියන්මාරය, පිලිපීනය, ඉන්දියාව ආදි රටවල ජනශ්‍රැතිය අධ්‍යයනයේ දී මේ බව වඩාත් තහවුරු වේ (Pertold, 1930; Cohen, 1983; Gargi, 1991; තිලකසිරි, 1971; Sarachchandra, 1953; කුමාරසිංහ, 1991; දිසානායක, 1996). ජන නාට්‍ය යන්න ගැමි නාටක යන ව්‍යවහාරයෙන් ද භාවිත වන්නකි (Sarachchandra, 1968). ජන නාට්‍ය යන යෙදුම තුළින් අර්ථවත් වන්නේ ගැමි සමාජය තුළ ක්‍රියාත්මක වූ ප්‍රාසංගික ඉදිරිපත් කිරීම් ය. පුරාතන ජන සමාජයේ නොයෙකුත් ඇදහිලි විශ්වාස මත පදනම් වූ සංස්කෘතියක සමාජ, ආර්ථික රටාවක් බිහි වී පැවතුණි. එය ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙන තත්ත්වයකි. තමාට මුහුණ දෙන්නට සිදු වූ විවිධ අභියෝග, බාධා, රෝගාබාධ, බව භෝග විනාශ වීම, දුර්භික්ෂ ආදි ව්‍යසනයන්ට පිළියම් ලෙස සොබාදහම දේවත්වයෙන් තබා මුල් කාලීන වැසියෝ විවිධ ඇදහිලි හා විශ්වාස ඇති කර ගත්හ. මෙවැනි ප්‍රාථමික සමාජය සතුව තිබුණු ඇදහිලි විශ්වාස වෙනුවෙන් විවිධ අභිචාර, පූජා කිරීමට ඔවුන් යොමු වූහ. එහි දී, විවිධ අනුකරණ හා සමාරෝප සහිතව සිදුකළ අභිචාර හා පූජා පසුව ශාන්ති කර්ම ලෙස හඳුන්වන ලදි. එවැනි ශාන්ති කර්ම කාලයත් සමග සුඛනම්‍ය ප්‍රාසංගික ලක්ෂණ සහිතව වර්ධනය විය. පසුව, එහි දිගුවක් ලෙස රංගනය ප්‍රමුඛ ව ලෝකය පුරා ව්‍යාප්ත වූ ජනශ්‍රැතිකාංගය ජන නාට්‍ය ලෙස හඳුන්වනු ලැබිණි. මේවා ඒ ඒ ප්‍රදේශයට ආවේණික ලක්ෂණ දරන නිසා ඒවා සම්ප්‍රදායන් ලෙස ද වර්ධනය වන අයුරු අධ්‍යයනයන් තුළ දී පෙනෙන්නට තිබේ. මේ අනුව ගත් කල මුල්කාලීන ප්‍රාථමික අභිචාර විධි වර්ධනය වී ශාන්ති කර්ම, යාතුකර්ම නිර්මාණයවීමත් එහි ප්‍රතිඵලය ලෙස ජන නාට්‍ය නිර්මාණය වීමත් සිදු වී ඇති බවක් දැක ගත හැකි ය. ජපානයේ නෝ, කබුකි, බොන්රකු, චීනයේ සෙවනැලි නාටක, ග්‍රීක ඩිතිරැම්බ ගායනය සහිත රංගන සහ ලංකාවේ කෝලම්, සොකරි ආදිය ඊට උදාහරණ සපයයි.

ඉහත විග්‍රහයට අනුව, ජන නාට්‍ය ජනශ්‍රැතිකාංගයක් ලෙස විග්‍රහ වුවත් අදවන විට යම් යම් සාහිත්‍යමය ලක්ෂණයන් ද මේවා තුළ අන්තර්ගත වේ. නාට්‍ය නමින් ලෝකය තුළ ව්‍යවහාර වන

කලාත්මක හා සන්නිවේදන වටිනාකමක් සහිත නිර්මාණ දක්වා මෙම ජන නාට්‍යවල ආභාසය ලැබී තිබෙන බව ඒ පිළිබඳ කරන ලද පර්යේෂණවලින් තහවුරු වේ (Sarachchandra, 1953; ඇතුගල, 2014). ලංකාවේ ද එවැනි නාට්‍ය නිර්මාණ බිහිකර ගැනීමේ දී ලංකාවේ ජන නාට්‍ය කෙරෙහි අවධානය යොමු කර තිබෙන බව අධ්‍යයන තුළින් පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ ප්‍රමුඛ අධ්‍යයනයක් සිදු කර තිබෙන්නේ මහාචාර්ය සරච්චන්ද්‍රයන්ය (Sarachchandra, 1953). ඊට අමතරව ජෝන් කැලවේ (Yakun Natanawa and Kolan Nattanawa, 1829), ඕ. පර්ටෝල්ඩ් (The Ceremonial Dances of the Sinhalese, 1930). තිස්ස කාරියවසම් (සිංහල නාට්‍යයේ විකාශනය, 1978), මුදියන්සේ දිසානායක (ගැමි නාටක ප්‍රවේශය, 1998), ඩබ්. ආතර් ද සිල්වා සහ ගුණපාල මලලසේකර (සිංහල ජන සම්මත කාව්‍ය, 1935), එම්.එච්. ගුණතිලක (කෝලම් නාටක සහ ලංකාවේ වෙස් මුහුණු, 1964) ආදීන්ගේ අධ්‍යයන තුළ ජන නාට්‍ය හෙවත් ගැමි නාටක පිළිබඳ අධ්‍යයනය කර තිබේ. ලංකාවේ ජන නාට්‍ය නම් ජනශ්‍රැතිකාංගය සැලකීමේ දී සොකරි, කෝලම්, නාඩගම්, දෙබස් කථන මුද්‍රා නාට්‍ය, රූකඩ නාට්‍ය ආදී ලෙස වෙන්කොට හඳුනාගත හැකි ජන නාට්‍ය ආකෘති හමුවේ. ලංකාව තුළ ව්‍යාප්තව ඇති අද වන විට භාවිතය ක්ෂය වෙමින් යන ජන නාට්‍ය පිළිබඳ අධ්‍යයන විවිධ විෂයන් ඔස්සේ පැතිර තිබේ. නූතන සන්නිවේදන විද්‍යාඥයින් නව සන්නිවේදන ක්‍රමෝපාය පිළිබඳ හා නිර්මාණාත්මක සන්නිවේදන සැලසුම් කෙරෙහි අවධානය යොමු කරන විට මෙම ජනශ්‍රැතිකාංග කෙරෙහි සන්නිවේදන දෘෂ්ටියෙන් යුතුව අවධානය යොමු කර ඇත.

ශාන්ති කර්ම දෙවියන්, උපත් කතා, පූජාර්ථය, භක්තිය, අදෘශ්‍යමාන බලවේග, යකුන් ආදිය ඔස්සේ ක්‍රියාත්මක වන්නකි. උඩරට, පහතරට, සබරගමු, නුවර කලාවිය, දෙමළ හත්පත්තුව ආදී වශයෙන් ප්‍රදේශ මූලික ව ශාන්ති කර්ම ප්‍රභේදනය වී තිබේ. ශාන්ති කර්මයක් තුළ ගායනය, රංගනය, වාදනය, නර්තනය ආදී ප්‍රාසංගික ඉදිරිපත් කිරීම් සියල්ල ඇතුළත් වේ. පූජාර්ථය ප්‍රමුඛ වේ.



ජනනාට්‍ය හා ශාන්තිකර්ම අතර ඇති සම්බන්ධතාව

ජන නාට්‍ය යම් පමණකට ඉහත ලක්ෂණ ද සහිතව කලා මාධ්‍යයක් ලෙස වර්ධනය වූවකි. ජන නාට්‍ය යනු පූජාර්ථයට වඩා විනෝදාර්ථය ඉස්මතුව පෙනෙන නාට්‍යමය ලක්ෂණ සහිත ප්‍රාසංගික ඉදිරිපත් කිරීමක් ලෙස වැඩි වර්ධනය වූවකි. එනිසා ශාන්ති කර්ම, ජන නාට්‍යවලින් වෙන්කර හඳුනාගැනීමේ හැකියාව තිබේ. නමුත්, ශාන්ති කර්මයක තිබෙන දෙබස් සහිත ඉදිරිපත් කිරීම් වන නාට්‍යමය පෙළපාළි ජන නාට්‍යවල වස්තු බීජය, ආකෘතිය හා භාෂාව ආදියට සමානකම් දරන නිසා ඒවා ජන නාට්‍යවල ආරම්භක අවස්ථාව ලෙස සලකා අධ්‍යයනය කිරීමේ හැකියාව තිබේ.

ලංකාවේ ජන නාට්‍ය පිළිබඳ සිදුකර තිබෙන අධ්‍යයනය තුළ වැඩි වශයෙන් අවධානය යොමු කර තිබෙන්නේ සොකරි, කෝලම්, නාඩගම් ආදිය පිළිබඳයි. නාට්‍යමය පෙළපාළි යන්න ජන නාට්‍ය යන විෂය තුළ ප්‍රබලව අවධානයට ලක් වී නොමැත. ඊට හේතුව එය ශාන්ති කර්මවල අන්තර්ගතයක් වන නිසයි. ශාන්ති කර්ම පිළිබඳ කර තිබෙන අධ්‍යයනවල ද නාට්‍යමය පෙළපාළි පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කර නොමැත. ශාන්ති කර්ම පිළිබඳ සිදුකර ඇති පර්යේෂණ වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ නර්තනය විෂයට විශේෂිතව ය. ඊට අමතරව මහාචාර්ය සරච්චන්ද්‍ර, මහාචාර්ය තිස්ස කාරිවසම් ආදීන් සිදු කර තිබෙන පර්යේෂණ ප්‍රමුඛ වේ. සරච්චන්ද්‍රයන්ගේ අධ්‍යයන නාට්‍ය හා රංග කලාව විෂයට මූලිකත්වයක් දී ඇත (Sarachchandra, 1953). මීට අමතර ව, පෝල් වීස් (Exorcism and the art of Healing in Ceylon, 1954), ගණනාථ ඔබේසේකර (The Cult of the Goddess Paththini, 1984), තිස්ස කාරියවසම් (ගම්මඩු පුරාණය, 1990), මුදියන්සේ දිසානායක (ගැමි නාටක ප්‍රවේශය, 1998), චාර්ල්ස් ගොඩකුඹුරේ (කොහොඹා කංකාරිය, 1969) ජේ. ඊ. සේදරමන් (ලංකාවේ යක්ෂ යුගය හෙවත් කොහොඹා කංකාරිය, 1962) ආදීන් මේ පිළිබඳ පර්යේෂණ සිදුකර තිබේ. මෙම අධ්‍යයන ජනශ්‍රැතික වටිනාකම් සලකා සිදු වී තිබෙනවා කියනවාට වඩා ඒ ඒ විෂයන් අරබයා සිදුකර තිබෙන බව පැහැදිලි ය.

ලංකාවේ ජන නාට්‍යවල ආරම්භක ස්වරූපය ලෙස සැලකිය හැකි ශාන්ති කර්මවල දක්නට ලැබෙන **නාට්‍යමය පෙළපාළි** මෙහිදී විශේෂත්වයක් ගනියි. මහාචාර්ය සරච්චන්ද්‍රයන් පවසන පරිදි නාට්‍යමය පෙළපාළි යනු ශාන්ති කර්ම හා ගැමි නාටක අතර අතරමැදි අවස්ථාවයි (Sarachchandra, 1968). ලංකාවේ ජන නාට්‍ය නිර්මාණය වීමට බලපාන්නේ ශාන්ති කර්ම තුළ තිබුණු නාට්‍යමය පෙළපාළි බව ඔහු පවසයි.

> *"ශ්‍රී ලංකාවේ ජන නාට්‍ය සැලකීමේදී සොකරි, කෝලම්, නාඩගම්, සින්දු නාඩගම් හා රූකඩ වැනි ජන නාටක මෙන්ම උඩරට, පහතරට හා සබරගමුව ආදි පළාත්වලට ආවේණිකව පවත්නා ශාන්ති කර්ම හා බැඳි නාට්‍යමය පෙළපාළි කෙරෙහි ද අවධානය යොමු කළ යුතුවේ"(දිසානායක,2010,පි.90).*

යනුවෙන් සිංහල විශ්ව කෝෂය ජන නාටක හැඳින්වීම තුළ දක්වා තිබේ. කින්නර අභිකුණ්ඩික ආදී ප්‍රාථමික ජන කොට්ඨාස තමන් සතු පුද පූජා කර්මවලදී නාට්‍යමය ලක්ෂණ සහිත ඉදිරිපත් කිරීම් සිදුකරයි. නයි නැටවීම රිළා නැටවීම වැනි අවස්ථාවල නාට්‍යමය ලක්ෂණ දැකිය හැකිය. ඩිංගි ගැසීම ද

හොඳ උදාරණයකි. රොඩී කණ්ඩායම් අතරද රබන් කරකැවීම, තැටි කරකැවීම වැනි ඉදිරිපත් කිරීම් කරන විට රංගනයන් ඉදිරිපත් කරයි. එසේම, ඔවුන් අතර කළු කුමාර, දළකුමාර ශාන්ති කර්ම ක්‍රියාත්මක වන අතර ඒවායේ නාට්‍යමය කොටස් ඉදිරිපත් කරන බව සිංහල විශ්වකෝෂයේ දක්වා ඇත (දිසානායක, 2010). ආදිවාසීන්ගේ යාතුකර්ම තුළ ද මෙවැනි ඉදිරිපත් කිරීම් ඇත. ඊතලයේ නැටුම, නෑ යකුන් නැටුම, පත යකා උත්සවය, රාහු යකා උත්සවය, කොළ මඩුව, කිරි කොරහේ යාගය, බඹර යකා උත්සවය, දොළ යකා උත්සවය ආදියේ එවැනි රංගනයන් ඉදිරිපත් වේ. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් තුනේම ශාන්ති කර්මවල විශාල ප්‍රමාණයක් නාට්‍යමය පෙළපාළි දක්නට ලැබේ. එවැනි පෙළපාළි අතර කොහොඹා යක් කංකාරිය: ඌරා යක්කම, නයා යක්කම, දර්ශන යක්කම, සීතා යක්කම, ගුරුගේ මාලාව, ගබඩා කොල්ලය, ඌරා යක්කම/බොරු යක්කම, නයා යක්කම, වැදි යක්කම, දර්පණ/දර්ශන යක්කම, සීතා යක්කම, වංගෙඩියේ සමයම, මුව මල විදීම, මහ යක්කම හෙවත් විජේරාජ කතාව, කප ඉදිරීම, ආවැද්දුම, ගබඩා කොල්ලය සහ ගුරුගේ මාලාව,අයිලෙ යක්කම, වනේ යක්කම, මල් බුලත් පුටුවේ යක්කම, අටමඟලේ යක්කම (දිසානායක,1998) යනාදිය පවතී.

කඩවර කංකාරිය	-: ඊ ගහට කියමන, දුන්නට කියමන, වංගෙඩියේ සමයම, ඌරා යක්කම
වලියක් මංගල්‍යය	-: කාලියාම, ගරායකුන් නැටීම, ගවර වල නැටීම, නයා යක්කම, වැදි යක්කම, මහ යක්කම, ගරා යකුන් නැටීම, ගුරුගේ මාලාව, ආවැන්දුම, මල නැටිම, කීල බැඳීම
කොටහළු ශාන්තිය	-: කොළ මඩුව හෙවත් පිදුම් කරච්චිය, සල්ලාලෙ කීම, කඩුලු පැනීම පන්දම් දොළහ දීම
උඩරට ගම්මඩු	-: අඹ විදමන, ඇත් බන්ධනය, මී බන්ධනය, මරාඉපැද්දීම
සූනියම් යාගය (උඩරට)	-: නානු උපත,පැදුරේ දැපවිල්ල
හත් අඩියේ දෙහි කැපීම	-: දොරටු පැනීම, වඩිග පටුන, වැල්වළලු පැළඳවීම හා කැපීම
වන්නි පළාතේ අළු වීදිය	-: ආතුරයා ගෙට ගැනීම වළ ගැසීමේ පෙළපාළි
රිද්දියාගය	-: වියන් රෙද්ද පාළිය, කපු උපත් පාළිය, දරු නැළවිල්ල, මුදුන් මලේ පාළිය, නානුමුරය, දලුමුර පාළිය, චාමර පාළිය
පහතරට සූනියම් යාගය	-: වඩිග පටුන, නානු මුරය
සන්නි යකුම	-: දහ අට සන්නිය, පාළි දොළහ, සූනියම් යක්ෂණිය තෙවරක් පැමිණීම, කළු යකා සහ රීරි යකාගේ පැමිණීම, අභිමාන යකාගේ පැමිණීම මහකෝළ යක්ෂයාගේ පැමිණීම.

මහ සොහොන් සමයම	-: සමයන් නැටීම,මහසොහොන් යක්ෂයාගේ පැමිණීම, පැදුරේ දැපවිල්ල, ඇඳුරා පුරාලපළට යාම
දෙවොල් මඩු	-: දෙවොල් ගොඩ බැසීම, මරා ඉපැද්දීම, අඹ විදමන
සබරගමු සම්ප්‍රදායේ පහන් මඩුව	-: තොරන් යාගය, පොක්කඩේ පාළිය, අඹ විදමන, රාමා මැරීම, දෙවොල් ගොඩ බැසීම, අසුරා යක්කම, හාතා යක්කම, පන්දම් පද, හත්පද පාළි (ලංකාතිලක,2002).
කිරි මඩුව	-: ඇත් බන්ධනය, මී බන්ධනය, ආඬිගුරු නැටීම, නුගේ හැල්ල, පොක්කඩේ පාළිය
කුමාර සමයම	-: දොළ උපත, දෙවොල් ගොඩබැසීම
ගොපලු සමයම	-: සමයම දොළහ, දියකෙළි සමයම

ලංකාවේ ශාන්ති කර්මවල දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාළි පිළිබඳ අධ්‍යයනය තුළින් ඉස්මතුව පෙනෙන කාරණය වන්නේ ඒවා ජන නාට්‍යවල මුල් ස්වරූපය ලෙස සලකා එහි සන්නිවේදන විද්‍යාත්මක වටිනාකම පිළිබඳ අධ්‍යයනයක් සිදු වී නොමැති බවයි. පහතරට ශාන්ති කර්මවල දහඅට සන්නිය, රටයකුම, සූනියම් යාගය ආදිය තුළ නර්තනය හා පූජා විධිවලට අමතරව නාට්‍යමය පෙළපාළි කොටස් ගෙන හැර දක්වයි. සළු පාලිය වැනි නූතනයේ පවා වඩා ජනප්‍රිය නාට්‍යමය පෙළපාළි ඒ අතර තිබේ. එය ව්‍යවහාරික භාෂාව හා ප්‍රස්තුත භාවිත කර ගනිමින් විනෝදය මූලික අරමුණ කොට ගෙන ක්‍රියාත්මක වෙයි. නමුත්, මේවායේ සංවාද, උපත් කතා, සන්දර්භය හා කතාව ආදිය කෙරෙහි අවධානය යොමු කර තිබෙන අධ්‍යයන අල්ප ය. පොදුවේ ශාන්ති කර්මවල ඇති උපත් කතා ආදිය පර්යේෂණවල ඉදිරිපත් කර ඇති නමුත් එම කතා නිර්මාණය වූයේ කෙසේද? එවැනි කතා නිර්මාණය කළේ ඇයි? එයින් සන්නිවේදනය කළේ කුමක්ද? ආදී තත්ත්වයන් පිළිබඳ පර්යේෂණවල අවධානය යොමුකර තිබෙන්නේ අල්ප වශයෙනි. නාට්‍යමය පෙළපාළි තුළ ව්‍යවහාරික තත්ත්ව ඇසුරෙන් නාට්‍යමය සංවාදය ගොඩ නගා ගෙන තිබෙන අතර හඳුනාගත හැකි කතා වමැවුම්වාදය, මළවුන්ගේ නැගිටීම ආදී මායාත්මක ප්‍රස්තුත පාදක කරගෙන තිබේ. උදාඃ මරා ඉපැද්දීම, අඹ විදමන, මී බන්ධනය. ඒවායේ වඩාත් ප්‍රබලව ඉන්ද්‍රජාලික තත්ත්ව ගෙන හැරපායි. ඊට අමතර ව, පුරාකතාවල එන යකුන්, දෙවිවරුන් ආදීන් පිළිබඳ කතා වැඩි වශයෙන් භාවිතයට ගෙන තිබේ. මෙවැනි කතා ඇතුළත් නාට්‍යමය පෙළපාළි තුළින් හඳුනාගත හැකි ආකෘතිය හා එහි භාෂාත්මක ලක්ෂණ කෙරෙහි සන්නිවේදන විද්‍යාත්මක දෘෂ්ටියෙන් අවධානය යොමු කර තිබෙන්නේ අල්ප වශයෙනි. ඒ කරුණු කෙරෙහි අවධානය යොමු කොට ගැඹුරින් නාට්‍යමය පෙළපාළි ලෙස සලකා සන්නිවේදන අර්ථයෙන් අධ්‍යයනයක් සිදුකර නොමැති වීම හඳුනාගත හැකි තත්ත්වයකි.

සන්නිවේදන විෂය තුළ සාම්ප්‍රදායික සන්නිවේදනය, නිර්මාණාත්මක සන්නිවේදනය යනුවෙන් උපකොටස් දෙකක් විග්‍රහවේ. සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ ශාන්ති කර්මවලට විශේෂ තැනක් හිමිවේ. සාම්ප්‍රදායික සන්නිවේදනය යනු සාම්ප්‍රදායික මාධ්‍ය උපයෝගී කරගෙන ක්‍රියාත්මක වන සන්නිවේදන

ධාරා ය. උදාඃ- ජනශ්‍රැතිය, ශාන්ති කර්ම, කුඩා කණ්ඩායම් සන්නිවේදන ආදියයි. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර පවසන ආකාරයට සාම්ප්‍රදායික සන්නිවේදනයේ ප්‍රධාන මෙවලම ලෙස ශාන්ති කර්ම සැලකිය හැකිය (ලොකුලියන,2001). තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, අධ්‍යාපනය, පෙළඹවීම, සමාජානුයෝජනය ආදිය ලෙස ගැනෙන සන්නිවේදන අරමුණු සැලකීමේ දී ශාන්ති කර්ම සාර්ථක උපක්‍රමයක් ලෙස දැක්විය හැකි ය. සමාජයේ පැවතුන මිත්‍යා විශ්වාස හා ඇදහිලි පිළිබඳ අවබෝධය ලබා ගැනීම, මානසික සංවර්ධනය, දේශපාලන අවබෝධය, පවුල් සැලසුම්කරණය පිළිබඳ දැනුවත්භාවය, පුද්ගල දුර්වලතා පිළිබඳ දැනුවත්භාවය, සිරිත් විරිත් පිළිබඳ දැනුවත්භාවය, ගැටලු සමතයකට පත්කරගන්නා ආකාරය, ඓතිහාසික තොරතුරු පිළිබඳ මනා දැනුමක් ලැබීම ආදිය මෙම ශාන්ති කර්ම ඇසුරේ ලැබුණේ ද? යන්න අධ්‍යයනය කිරීමේ හැකියාව තිබේ.නර්තනාංගයකට හෝ දේව ඇදහිල්ලකට පමණක් ශාන්ති කර්මය සීමා කළ හැකිද? යන්න සොයා බැලිය යුතුව තිබේ.

සමාජයේ කොතරම් කාර්මික දියුණුවක් දක්නට ලැබුණත් පුද්ගල සංවර්ධනයේ දුර්වලතා ද දැකිය හැකිය. පවුල් අසමගිය, සමාජානුයෝජනය නොවීම, තාක්ෂණික හුරුවක් නොමැති වීම ආදි ගැටලු සමාජයේ ඉහළ ගොස් තිබෙන බව පුවත්පත් වාර්තා තුළින් හෙළි වේ. සන්නිවේදනය සඳහා ජන මාධ්‍ය හා නව මාධ්‍ය කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවන බව ද පෙනී යන කරුණකි. ශාන්ති කර්මවල තිබෙන නාට්‍යමය පෙළපාළි සැලකීමේ දී එහි තිබෙන නිර්මාණාත්මක ලක්ෂණ ද සන්නිවේදන අර්ථයෙන් විග්‍රහ කර ගත හැකි ය. නිර්මාණාත්මක සන්නිවේදනය නමින් ලෝකයේ අධ්‍යයනයට පාදක වන විෂය ධාරාව තුළ සාකච්ඡා කෙරෙන්නේ සාර සන්නිවේදනයක් උදෙසා සංදේශයක නිර්මාණාත්මක ලක්ෂණ ඉවහල් වන බවයි. ශාන්ති කර්මවල නාට්‍යමය පෙළපාළි සැලකුවහොත් එහි නිර්මාණාත්මක ලක්ෂණ සාර සන්නිවේදනයක් උදෙසා යොදා ගත හැකි අයුරු අධ්‍යයනය කළ හැකිය. දෙබස්, සංවාද, රූපණය,ප්‍රහසනය, නාට්‍යමය අවස්ථා, වේෂ නිරූපණය ආදිය නිර්මාණාත්මක යෙදවීම්ය. ඒවායේ වස්තු බීජය, කතාව හා ඉදිරිපත් කරන ආකාරය අනුව වඩා සාර්ථක සන්නිවේදන ලක්ෂණ ප්‍රකට කරන්නේ ද? යන්න අධ්‍යයනය කිරීම අවශ්‍යතාවයකි.

එසේම, නාට්‍ය පෙළපාළි රූපණ සන්නිවේදනය (Theatre Communication) තුළින්ද විග්‍රහ කළ හැක. නූතනයේ බිහි ව තිබෙන වේදිකා නාට්‍යවලට අමතරව සාමාන්‍ය ජනතාව අතර රැඳුණු ජන නාට්‍යවලින් වඩා නිර්මාණශීලි සංදේශ සකස් කිරීමේ හැකියාව තිබේ. රූපණ සන්නිවේදනය යනු නාට්‍යමය හා රූපණ කුසලතා භාවිතයෙන් සන්නිවේදනයේ යෙදීමයි. නාට්‍යමය පෙළපාළි සන්නිවේදන අර්ථයෙන් විග්‍රහ කර බැලීමේදී නාට්‍යමය පෙළපාළි යනු කුමක්ද ? යන්න පහත සටහනේ විග්‍රහ වන ආකාරයට කරනු ලබන සොයාබැලීමක් ලෙස මෙම පර්යේෂණ කාර්යය තවදුරටත් දැක්විය හැකි ය.



අන්තර් විෂයික එළඹුම

Porformance — Content

- සෞඛ්‍ය විද්‍යාත්මක එළඹුම
- මනෝ විද්‍යාත්මක එළඹුම
- සෞන්දර්ය විද්‍යාත්මක එළඹුම
- සන්නිවේදන විද්‍යාත්මක එළඹුම
- වාග් විද්‍යාත්මක එළඹුම

නාට්‍යමය පෙළපාළිවල ස්වභාවය

ශාන්ති කර්මවල දක්නට ලැබෙන නාට්‍ය පෙළපාළිවල ආකෘතිය, අන්තර්ගතය හා භාෂා ලක්ෂණ සැලකිල්ලෙන් විමසීමේ දී ඉහත කරුණු අධ්‍යයනය කිරීමට අවස්ථාවක් ලැබේ.



නාට්‍යමය පෙළපාළිවල සන්නිවේදන ස්වරූපය

ඉහත රූප සටහනට අනුව, නාට්‍යමය පෙළපාළි තිබෙන සන්නිවේදනාර්ථ විමසීම සාර සන්නිවේදනයකට ඉවහල් වේ(Effective Communication) යන්න පැහැදිලි වන තත්ත්වයකි.

නාට්‍යමය පෙළපාළිවල ආකෘතිය සැලකීමේදී එය කවි හා සංවාදය මගින් ගොඩ නැගේ. කවි තුළ ඇත්තේ අතීත කතාවට අදාළ සිදුවීම්ය. සංවාදයේ අවසානයේ හෝ යම් නාට්‍යමය පෙළපාළිවල අතරමැද පටන් අවසානය දක්වා පූර්වාපර සන්ධි ගැළපීමක් සිදුකරයි. මෙමගින් අතීත කතාවට වර්තමාන ඉදිරිපත් කිරීම සම්බන්ධ කරයි.

අතීත කතාව - වර්තමාන නාට්‍යමය අවස්ථා - පූර්වාපර සන්ධි ගැළපීම

නාට්‍යමය පෙළපාළි සම්බන්ධයෙන් හඳුනාගත හැකි මූලික ලක්ෂණය මෙය වන අතර ජාතක කතාවල දක්නට ලැබෙන අතීත කතාව-වර්තමාන කතාව- පූර්වාපර සන්ධි ගැළපීමට සමාන ය. සෑම නාට්‍යමය පෙළපාළියක ම අතීත කතාවක් තිබේ.

සන්නිවේදන ආකෘතියක් ලෙස නාට්‍යමය පෙළපාළි සැලකීමේදී තොරතුරු, විනෝදය, පෙළඹවීම හා භක්තිය ඇතිකිරීම සඳහා භාවිත කරන නිර්මාණාත්මක ආකාතියක් වශයෙන් මෙය හඳුනාගත හැකි ය. එය ජාතක කතා ආකෘතියට බොහෝදුරට සමාන ය. මීට පෙර කිසිදු පර්යේෂකයකුගේ අවධානය ඒ

සඳහා යොමු වී නැත. ශාන්තිකර්මකරුවා දේවකතා නැතිනම් යක්ෂ කතාවක් ප්‍රේක්ෂකයාට දැන්වීමට නාට්‍යමය පෙළපාළි ආකෘතිය භාවිත කරයි. ශාන්තිකර්මවල තිබෙන නර්තන ප්‍රමුඛ විවිධ පූජා අවස්ථාවලට සාපේක්ෂව නාට්‍යමය පෙළපාළි සක්‍රීය සන්නිවේදන අකෘතියක් ලෙස ක්‍රියාත්මක වේ.

සන්දර්භය ⟶ ශාන්තිකර්ම ඇදුරාආකෘතිය ⟶ ඉදිරිපත් කිරීම ⟶ ප්‍රේක්ෂකයා ⟶

මෙය C → S → F → P → R

යන ඒක රේඛීය සන්නිවේදන ආකෘතිය ගනියි.

මෙහි C - Context

S - Sender

F - Format

P - Performence

R – Receiver

Context-සන්දර්භය තුළ නාට්‍යමය පෙළපාළිවල අන්තර්ගතය හෙවත් ශාන්තිකර්මකරුවාට සමාජගත කිරීමට අවශ්‍ය දේ අඩංගු වෙයි. ඊට දේව සංකල්පය හෝ යක්ෂ සංකල්ප භාවිත කරයි. ප්‍රාථමික ජන සමාජය අවිඥානික ව විශුද්ධිය බලාපොරොත්තු වෙති. එනිසා අධිවිශ්වාස අභිචාරයන් සමාජගත වී තිබේ. නාට්‍යමය පෙළපාළිවල සන්දර්භය පෝෂණය කරන්නේ මෙම අධිවිශ්වාසයයි.

Sender - ශාන්තිකර්මකරුවා යවන්නෙක් මිස සන්නිවේදකයෙක් නොවේ. ඔහු මිනිසුන් සතු විශ්වාසය තුළින් සාර්ථකත්වය කරා යාමට අවශ්‍ය ලෙස සන්දේශ ආකෘතියක් සකසා දෙයි. ඔහු දැනුවත් හෝ නොදැනුවත්ව සන්දර්භය ග්‍රාහකයා හමුවට ගෙන යාමට සහයෝගය දක්වයි. නූතන මාධ්‍යවලද නිවේදකයා සන්නිවේදකයෙකුම නොවේ. ඔහු සන්දේශය පිළිබඳ අවබෝධයකින් මෙන්ම අනවබෝධයෙන් ද සන්දේශ ඉදිරිපත් කරයි. ශාන්තිකර්මකරුවා අවබෝධයෙන් හෝ අනවබෝධයෙන් වුවද සන්දර්භය සමාජගත කිරීමට දායක වේ.

Format- නාට්‍යමය පෙළපාළි තුළ දක්නට ලැබෙන ආකෘතිය ශාන්තිකර්මකරුවා දේව භක්තිය ශාන්තිය අරමුණු කොට ගෙන විනෝදය, හාස්‍යය මුසුකොට ආකෘතියක් තුළින් ඉදිරිපත් කරයි.

- අතීත කතාව
- වර්තමාන කතාව
- පූර්වාපර සන්ධි ගැලපීම

Performance

මෙය ගායනය වාදනය නර්තනය රංගනය සහිතව ඉදිරිපත් කිරීමක් තුළින් ග්‍රාහකගත වේ.

Receiver

මෙහි ග්‍රාහකයා අබිමුඛ ග්‍රාහකයෙකි. ප්‍රතිපෝෂණ ක්‍රියාවක් නැත. අර්ථ බාධක සහිතය. මෙය සන්නිවේදන ආකෘතියක් ලෙස නොව සංවර්ධන සන්නිවේදන ආකෘතියක් ලෙස විග්‍රහ කිරීමේ හැකියාව තිබේ.

සංවර්ධනය සඳහා සන්දේශ සැකසීමේදී තිබෙන අභියෝගය වන්නේ ජනතාවට තිබෙන ආගන්තුක බවයි. එහිදී C S F P R ආකෘතිය භාවිත කිරීමේ හැකියාව තිබේ. සංවර්ධන සන්දේශය එහි ආගන්තුක බව තුරන්කිරීමට අඛ්‍යානමය ස්වරූපයකින් ඉදිරිපත් කළ හැකිය. උදා ඩෙංගු සඳහා ඩෙංගු යක්ෂයා හඳුන්වාදිය හැකි ය. මෙහි උපත පිළිබඳ කතාවක් ගෙතිය යුතුය. ඉන් පසු එහි බලපෑම ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් ඉදිරිපත් කළ හැකිය. නාට්‍යමය පෙළපාළි ආකෘතිය භාවිත කරමින් එය ගමේ සමාජයේ තිබෙන පොල්කටු, යෝගට් කෝප්ප ආදිය සම්බන්ධ සිදුවීමක් හරහා සංවාදයක් ලෙස ඉදිරිපත් කළ හැකිය. සිව් පද කවි ආකෘතිය හැරුණු විට ගීතවත් තාල ආදී උපක්‍රම ඔස්සේ පෙර කතාව හෙවත් ඩෙංගු හා ඇති සම්බන්ධය ගෙනහැර දක්වමින් පූර්වාපර සන්ධි ගැළපීම සිදුකළ හැකිය. මෙහිදී බෙර වාදනය, රංගනය ආදී සියලු ක්‍රමවේද භාවිතා කළ හැකිය. කුණු කසල ඉවත ලෑම, රෝග බෝවීමට හේතු වන විවිධ පුරුදු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ආදිය සඳහා මෙය භාවිත කළ හැකිය. මෙය ගැමි සමාජයට ආගන්තුක නොවන ආකෘතියක් නිසා සාර්ථක වීමේ ප්‍රවණතාව වැඩිය. සංවර්ධන සන්දේශය ඒක රේඛීය ව සමාජගත කිරීමේ හැකියාව තිබේ. නමුත් මෙයින් ප්‍රතිපෝෂණය සිදුනොවේ. එය දුර්වලතාවකි. ඒ අනුව නිර්මාණාත්මක රේඛීය සංවර්ධන ආකෘතියක් ලෙස විග්‍රහ කරගත හැකිය.නාට්‍යමය පෙළපාළි අධ්‍යයනය තුළින් එළඹිය හැකි නිගමනයක් වන්නේ ග්‍රාමීය සංවර්ධනය සඳහා යොදාගත හැකි ආකෘතියක් ලෙස මෙය භාවිත කළහැකිය යන්නයි.

මූලාශ්‍ර

ඇතුගල, ආරියරත්න. (2014). නූතන රංග භූමිය. කොළඹ,රජයේ ප්‍රවෘත්ති දෙපාර්තුමේන්තුව.

කාරියවසම්, තිස්ස. (1990). ගම්මඩු පුරාණය. මරදාන, සමයවර්ධන ප්‍රකාශකයෝ .

කාරියවසම්,තිස්ස. (1976). ශාන්ති කර්ම සහ සිංහල සමාජය. කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ.

කුමාරසිංහ,කුලතිලක . (1995). නෝ කබුකි නාට්‍ය කලාව. කොට්ටාව, සාර ප්‍රකාශකයෝ

ගුණතිලක, ඇම්.එච්. (1964). කෝලම් නාටක සහ වෙස්මුහුණු. කොළඹ, රත්න ප්‍රකාශකයෝ.

ගොඩකුඹුර,චාල්ස්. (1962). කොහොඹා කංකාරිය. කොළඹ,සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව

දිසානායක, මුදියන්සේ.(2001). නර්තන වාග් කෝෂය. කොළඹ, ගොඩගේ ප්‍රකාශන.

දිසානායක , මුදියන්සේ. (1998). ගැමි නාටක ප්‍රවේශය. කොළඹ, ගොඩගේ ප්‍රකාශන.

දිසානායක , මුදියන්සේ. (1996). ආසියාවේ නාට්‍ය හා නර්තන කලාව. කොළඹ,
ඇස් ගොඩගේ ප්‍රකාශන.

දිසානායක , මුදියන්සේ. (1996). දෙමළහත්පත්තුවේ ඇදහිලි හා විස්වාස. කොළඹ,
ගොඩගේ ප්‍රකාශන.

ලංකාතිලක , ධම්මිකා. (2002). සබරගමු නාට්‍යමය පෙළපාළි විධි. කොළඹ, කර්තෘ ප්‍රකාශන.

ලොකුලියන, අරුණ.(2002). ශාන්තිකර්ම සන්නිවේදනය. කොළඹ, ගොඩගේ ප්‍රකාශන.

සරච්චන්ද්‍ර, එදිරිවීර. (1968),(2013). සිංහල ගැමි නාටකය. සංස්කෘතික දෙපාර්තමේන්තුව, ප්‍රකාශන.

සිල්වා, ඩබ්. ආතර් ද., සහ මළලසේකර, ගුණපාල. (1935). සිංහල ජන සම්මත කාව්‍ය. කොළඹ,
ගොඩගේ සහ සහෝදරයෝ.

ලියනගේ, සිරි. (1996). ජන විද්‍යා ශබ්දකෝෂය. චතුර මුද්‍රණාලය.

ලියනගේ, සිරි. (2000). ජනශ්‍රැති ශබ්දකෝෂය. චතුර මුද්‍රණාල

Balwant, Gargi. (1991). Folk Theater of India. India: south Asia books.

Bell, Catherine. (1997). Ritual: Perspectives and Dimensions. New York, Oxford University Press.

Cohen, Matthew. (2006). Komedie Stamboel: Theater in Colonial Indonesia 1891-1903.London.

Callaway, Jhon. (1829).Yakun Natanawa and Kolan Nattanawa. London.

Coomaraswamy,Ananda.(1979).Mediaeval Sinhalese Art. Pantheon Books.

Gunawardana, J.A.(1976). Theatre in Sri Lanka. Colombo, Department of Cultural Affairs.

Gaiger, Williem.(1925).Culavanse. London, O.V.P

Makee, Alan.(2003).Textual Analysis. Australia, Sage Publication.

Frey, L., Botan, C., & Kreps, G. (ed.). (1999). Investigating communication: An introduction to research methods. Boston

Obeysekara, Gananath. (1984). The Cult of Goddess Paththini. University of Chicago.

Pertold, O. (1930).The Ceremonial Dances of the Sinhalese. Praha.

Sarachchandra, Ediriweera.(1953).The Sinhalese folk play and the modern stage. Colombo, Ceylon University Press Board.

Wirz,Paul.(1954). Exorcism and the Art of Healing in Ceylon. Netherland, E.J.Brill Printed.

P.E.P.Deraniyagala (Ed).(1987). Neville, Hugh. Sinhala Verse,(kavi) Ethnology Volume1,2,3. Ceylon National Museums, manuscript. Colombo, Government press

The Columbia Electronic Encyclopedia. (2013). Columbia University Press.

10

සෙනරත් පරණවිතාන සූරීන්ගේ අභිලේඛන පර්යේෂණ පිළිබඳ සමාලෝචනයක්

අනුර මනතුංග

පුරාවිද්‍යාවේ විවිධ ක්ෂේත්‍ර අතරින් සෙනරත් පරණවිතානගේ අවධානය වැඩි වශයෙන් යොමුව ඇත්තේ අභිලේඛන ක්ෂේත්‍රය කෙරේ ය. ඔහු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශිලා ලේඛන සහකාර තනතුරින් රැකියාව ආරම්භ කිරීම මීට ප්‍රධාන හේතුව විය හැකිය. රන්වලගොඩ පිරිවෙණින් ලැබූ ප්‍රාචීන භාෂා අධ්‍යයනයත්, ඉන්දියාවේ දී ලැබූ අභිලේඛන පුහුණුවත් මේ සඳහා ඔහුට ශක්තිමත් පදනමක් සැපයූ බව පැහැදිලි ය.

පරණවිතාන ශිලාලේඛන පිළිබඳ ලියූ මුල් ම ලිපිය වූයේ පොළොන්නරුවේ පිහිටි 1 වැනි විජයබාහු රජුගේ වේලයික්කාර ලිපියයි. මෙය 1926 දී 'එපිග්‍රැෆියා ඉන්ඩිකා' සඟරාවේ 18 වැනි වෙළුමේ 7-8 කාණ්ඩවල ප්‍රකාශයට පත්කොට තිබේ.[1] පළමුවන විජයයබාහු රජුගේ වේලයික්කාර හමුදාව පිළිබඳ වැදගත් තොරතුරු රැසක් හෙළිදරව් වන මේ ලිපිය ඉන්දියාවේ සිටිය දී ලියා තිබේ. ශ්‍රී ලංකාවට පැමිණි පසු ඔහු ලියූ මුල් ම ලිපිය වූයේ දකුණු ඉන්දීය ශිලා ලේඛන පිළිබඳ පළමු නවතම වාර්තාව පිළිබඳ විවරණයකි. එය 1927 දී රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ සඟරාවේ පළකරවා තිබේ.[2]

1927 දී පරණවිතාන ශිලාලේඛන සොයමින් ඌව, සබරගමුව සහ වයඹ පළාත්වල සංචාරය කළේ ය.[3] මේ සංචාරවල ප්‍රතිඵලයක් වශයෙන් ඔහු විසින් පිටපත් කරවනු ලැබූ ශිලා ලේඛන අතර මොනරාගලින් හමු වූ ක්‍රි.ව 5 වන ශතවර්ෂයට අයත් මහානාමගේ ලිපියක් එම ස්ථානයෙන් හමු වූ 10 වන ශතවර්ෂයට අයත් ලිපියකුත් වඩාත් වැදගත් ලෙස සැලකිය හැකි ය. තණමල්විල අසල වේරගලින් පස්වන සහ සත්වන ශතවර්ෂවලට අයත් ලිපි දෙකක් ද, යුදගනාවෙන් සහ කටුගහ ගල්ගෙයින් බ්‍රාහ්මී ලිපි ද මෙවර ඔහු විසින් පිටපත් කරවනු ලැබූ ලිපි අතර විය.

1928 දී ඔහු උතුරු, උතුරු මැද, වයඹ සහ මධ්‍යම පළාත්වල දීර්ඝ සංචාරයක් කළේ ය.[4] උතුරු පළාතේ කළ සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස තෝනිගල සහ මාමඩුව ලිපි පිටපත් කරනු ලැබී ය. උතුරුමැද

පළාතේ කළ සංචාර මගින් ලුණුමඩලාගල, පුවරසන්කුලම, කිරිදිගම, පහළ කයිනාට්ටම, විහාරේගම, වළස්කුණුවැව, නාගරීකන්ද, ඇතාගල, කිවුලේකන්ද, කොලින්දාව සහ මොරගහකන්ද ස්ථානවලින් ශිලා ලේඛන පිටපත් කරගෙන ඇත. වයඹ පළාතේ තම්මමැන්නාව ශිලා ලිපියත්, කටුගම්පොළ ස්ථූපයේ අකුරු කෙටූ කඩොලුත් මෙවර සොයා ගනු ලැබී ය. මධ්‍යම පළාතේ කළ සංචාරවලින් මාතලේ දිස්ත්‍රික්කයේ ගැරඬිගල ලිපිය පිටපත් කළ අතර දින තුනක් තිස්සේ සීගිරි කැටපත් පවුරේ කුරුටු ගී අධ්‍යයනය කිරීමේ නිරත විය.

1929 ජූනි 14 වැනි දා සිට 10 වැනි දා දක්වා පරණවිතාන නැගෙනහිර පළාතේ ස්ථාන 23 ක් ද, දකුණු පළාතේ ස්ථාන 6 ක් ද, ඌව පළාතේ ස්ථාන 2 ක් ද පරීක්ෂා කොට ශිලා ලේඛන 32 ක ස්පර්ශ ලාංඡන ලබා ගත්තේ ය. නැවත එම වසරේ අගෝස්තු 26 වැනි දා සිට සැප්තැම්බර් 5 වැනි දා දක්වා කළ සංචාරවලින් වයඹ පළාතේ ස්ථාන 15 කින් ලිපි 33 ක් ද, මිහින්තලේ අසල මහකනදරාවෙන් සහ ඉනාමළුව අසල විය. උල්පතින් වැදගත් ලිපි දෙකක් ද පිටපත් කරගනු ලැබ ඇත. මෙම වසරේ කළ සංචාර වල ප්‍රතිඵල වශයෙන් පිටපත් කරගනු ලැබූ මුළු ශිලා ලේඛන සංඛ්‍යාව 75 කි විය. ඒ අතරින් 28 ක් ම ලෙන්වල පිහිටි මූල බ්‍රාහ්මී ලිපි වන අතර, ඒවායින් ලබා ගෙන ඇත්තේ නේත්‍ර පිටපත් පමණය. අනෙතුත් සියලු ම ලිපි වල ස්පර්ශ ලාංඡන ලබා ගෙන ඇත. මුළු ලිපි සංඛ්‍යාවෙන් 45 ක් ම මුල් වරට පිටපත් කරනු ලැබූ ඒවා ය. අනෙකුත් ලිපි මුල් පිටපත් අසතුටුදායකවීම නිසා හෝ අස්ථානගතවීම නිසා නැවත පිටපත් කිරීමට සිදු වූ ඒවා ය. 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ පළකරවීම සඳහා මේ ඇතැම් ලිපිවල වඩාත් හොඳ පිටපත් ලබා ගැනීම අවශ්‍ය විය.

මේ වසරේ සිට 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ ප්‍රධාන සංස්කාරක වශයෙන් කටයුතු කිරීමට පරණවිතාන පත්කරවනු ලැබීම ඔහු ලැබූ භාග්‍යයක් විය. එතෙක් එම තනතුර හෙබ වූ ඩී.එම්. ද ඉසඩ් වික්‍රමසිංහ තමාට වැඩ අධික වීම නිසා මේ සඟරාවේ කටයුතුවලින් ඉවත් වීම එය පරණවිතානට පැවරීමට හේතු විය. වික්‍රමසිංහ මහතා සඟරාව පවත්වාගෙන ගිය උසස් මට්ටමින් ම එය පවත්වා ගෙනයාමට තමන් උත්සාහ කරන බව පරණවිතාන තමා සංස්කරණය කළ මුල් ම සඟරාවේ ප්‍රකාශ කොට ඇත.[8]

1929 දී පරණවිතානගේ සහ කොඩ්රින්ටන්ගේ නම් සඳහන් ව ප්‍රකාශයට පත් 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ තුන්වන වෙළුමේ දෙවන කලාපයට පරණවිතාන විසින් ශිලා ලිපි දෙකක් පිළිබඳ ලිපි ලියනු ලැබීය. ඉන් එකක් බදුළු ටැම් ලිපිය වන අතර අනෙක මන්නාරම් කච්චේරි ලිපිය ය.[9]

මෙතැන් සිට කලින් කලට සොයා ගනු ලැබූ ශිලා ලේඛන අතරින් වැදගත් ලිපි දීර්ඝ විස්තර සහ විවරණ සහිතව මේ සඟරාවේ පළකරනු ලැබ ඇත. ඒ හැරුණු විට 1928 සිට 1933 දක්වා පළ වූ ලංකා විද්‍යා සඟරාවේ 'ජී' කාණ්ඩයට ලියනු ලැබූ සාරාංශයක් ද,[10] පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික පාලන වාර්තාවල ද[11] සොයාගනු ලැබූ ලිපි පිළිබඳ විස්තර අඩංගු ය. රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ සඟරාවට ලියන ලද පුරාවිද්‍යා සාරාංශයේ ද මෙකී ලිපි පිළිබඳ කරුණු අඩංගු වී තිබේ.[12] මේ සියල්ල අතරින් වඩාත් පරිපූර්ණ බව පෙනෙන 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ පළ වූ ලිපි පිළිබඳ මෙහිලා වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. 1930 දී ප්‍රකාශයට පත් 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ තුන්වන වෙළුමේ 3 වන කලාපය සඳහා පරණවිතාන ලිපි 10 ක් ම ලියනු ලැබී ය.[13] ඒ අතරින් වැඩි

කොටසක් අනුරාධපුරයෙන් හමු වූ ශිලා ලේඛන පිළිබඳව ය. අනුරාධපුර යාපනය මාර්ගය අසලින් හමු වූ කැඩුණු සෙල්ලපිය, ඇතුල් නගරයේ මහා පාළිදාන ශාලාව අසල බත් ඔරුවේ ඇති ලිපි, බුදුධදාසගේ රුවන්වැලිසෑ ටැම් ලිපිය, ගජබාහුගේ ථූපාරාම පුවරු ලිපිය , අභයගිරියෙන් හමු වූ තඹ පත්තීරු පිළිබඳ ලිපි ඊට අඩංගු ය. පොළොන්නරුවේ වාන් ඇල අසලින් හමු වූ නිශ්ශංකමල්ලගේ ලිපියත්, ගිරිතලේ ටැම් ලිපියත් පළ වී ඇත්තේ මේ කලාපයේ ය. මේ හැරුණු විට මෝලාහිටියවෙළේගල ද, පහළ කයිනාට්ටම යන ස්ථානවලින් හමුවුණු පර්වත ලිපි පිළිබඳ විමර්ශනයන් ද මෙහි දුටුව හැකි ය.

'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ තුන්වන වෙළුමේ හතරවන කලාපය තදාන්තර වර්ෂයේ (1931) දී ප්‍රකාශයට පත් කිරීමට පරණවිතාන සමත් විය.[14]මේ කලාපයේ පළ වී ඇති ශිලා ලේඛන අතරින් තුන්වන කාශ්‍යපගේ ගැරඩිගල ලිපිය, ඉඳිකටු සෑයෙන් හමු වූ තඹ ඵලක, කතරගම සෙල්ලිපිය, තෝනිගල පර්වත ලිපිය සහ එප්පාවලින් හමු වූ සෙල්ලිපි දෙක පිළිබඳ විවරණ සහිත ලිපි පරණවිතාන විසින් ලියනු ලැබී ය.

1932 දී මේ සඟරාවේ පස්වන කලාපය ප්‍රකාශයට පත් කරනු ලැබී ය.[15] එහි පළ වූ ලිපි අතරින් කොළඹ කෞතුකාගාරයේ ඇති iv වන කාශ්‍යපගේ ටැම් ලිපිය, vi වන බුවනෙකබාහුගේ ඇදිගම පුවරු ලිපිය, අනුරාධපුර බෞද්ධ ගරාදී වැට ප්‍රදේශයේ ලිපි, බුවනෙකබා මහපාගේ අනුරාධපුර පුවරු ලිපිය, ලබුඇටබැදිලගල පර්වත ලිපි දෙක පිළිබඳ ලියා ඇත්තේ පරණවිතාන විසිනි.

1933 ප්‍රකාශයට පත් වූ තුන්වන වෙළුමේ හයවන කලාපය හෙවත් එම වෙළුමේ අවසන් කලාපයට පරණවිතාන විසින් ලියන ලද ලිපි 6ක් අඩංගුව ඇත.[16] ඒ අතරින් ලිපි දෙකක් ම ද්‍රවිඩ සෙල්ලිපි පිළිබඳව ය. ඒවා නම් බුදුමුත්තාවේ ද්‍රවිඩ ලිපි දෙක සහ ගාල්ලේ ත්‍රයිභාෂාම ය ලිපියේ ද්‍රවිඩ කොටස පිළිබඳ ලියූ විවරණ ය. මේ කලාපයේ අඩංගු අනෙකුත් ලිපි වන්නේ 1 වැනි පරාක්‍රමබාහුගේ දෙවනගල පර්වත ලිපිය, කටුගහගල්ගේ ටැම් ලිපිය, i වන සේනගේ ලිපි දෙකක් සහ iii වන සේනගේ වැල්මිල්ලේ පුවරු ලිපිය පිළිබඳ ලියූ ඒවා ය.

'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ හතරවන වෙළුමේ පළමුවන කලාපය 1934 දී ප්‍රකාශයට පත්කරනු ලැබී ය.[17] එහි අඩංගු ලිපි අතරින් වැඩි කොටසක් පොළොන්නරුවේ සහ පොළොන්නරු යුගයට සම්බන්ධ ලිපිය, පොළොන්නරු රාජසභාවේ පුවරු ලිපිය, v වන මහින්දගේ පොළොන්නරු ලිපිය, සංගමු විහාරයේ පර්වත ලිපිය ඊට නිදසුන් ලෙස දැක්විය හැකි ය. මේ හැරුණු විට විහාරේගම සහ මැදඋල්පොත ටැම් ලිපිය පිළිබඳ මේ කලාපයට පරණවිතාන විසින් ලිපි ලියනු ලැබී ය.

මේ වෙළුමේ දෙවන කලාපය 1935 දී ප්‍රකාශයට පත්කරනු ලැබී ය.[18] මේ කලාපයට පරණවිතාන විසින් පුවරු ලිපිය, ධර්මකීර්ති ස්ථවිරයන්ගේ ගඩලාදෙණි පර්වත ලිපිය, පොළොන්නරුවේ සුන්දර මහා දේවියගේ කැඩුණු පුවරු ලිපිය සහ කොට්ටන්ගේ පර්වත ලිපි දෙක යන ශීර්ෂයන් යටතේ ලියනු ලැබූ ඒවා ය. මේ වර්ෂයේ දී ම පරණවිතාන ඓතිහාසික අත්ලිපි කොමිසමේ දෙවන වාර්තාවට මහනුවර මල්වත්ත විහාරයේ ඇති කාම්බෝජ අකුරින් ලියූ පාලි ලියවිල්ලක් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

ශිලා ලිපි සඟරාවේ හතරවන වෙළුමේ තුන්වන කලාපය 1936 දී ප්‍රකාශයට පත්විය.[19] එහි අඩංගු ලිපි හයක් ම ලියන ලද්දේ පරණවිතාන විසිනි. කුඩ්ඩපාරින්දගේ අනුරාධපුර පුවරු ලිපිය, වෙස්සගිරියෙන්

හමු වූ පර්වත ලිපි හතරක්, බරෝස් මන්දිරය අසල පඬිගලක ඇති සෙල්ලිපි, කුමාරදාසගේ නාගරකන්ද පර්වත ලිපිය, හත්වන සහ අටවන ශතවර්ෂවලට අයත් ලිපි හතක්, තිරියාය පර්වත ලිපිය යන ලිපි එහි අඩංගු ය.

මේ සඟරාවේ හතරවන කලාපය 1937 දී ප්‍රකාශයට පත් වූ අතර එහි ලිපි හයක් අඩංගු වී ඇත. ගලපාත විහාරයේ පර්වත ලිපිය, ගෝනෑවේ විහාරයේ කැඩුණු ටැම් ලිපිය, මලගනේ ටැම් ලිපිය, පාලමොට්ටායි ද්‍රවිඩ පුවරු ලිපිය, රාස්සහෙලින් හමු වූ පර්වත ලිපි ය, මගුල් මහා විහාරයෙන් හමු වූ විහාරමහා දේවියගේ පර්වත ලිපි දෙක සහ වියඋල්පොත ටැම් ලිපිය යන ලිපි ඒවා ය.

1936 දී ආචාර්ය උපාධිය සම්පූර්ණ කරනු වස් දස මසක් නිවාඩු ලැබී විදේශගත වීම නිසා මේ සඟරාවේ පසවන කලාපය පිටවීම වසර කීපයක් පමාවිය. 1939 දී පළ වූ එම කලාපයේ පරණවිතානගේ ලිපි 8 ක් අඩංගුව ඇත.[20] හබැස්ස පර්වත ලිපිය, ඉදිකටුසෑයේ තඹ ඵලක, තිඹිරිවැව ගොඨාභය සමයට අයත් පර්වත ලිපිය, කල්‍යාණවතී බිසවගේ රුවන්වැලිසෑය පුවරු ලිපිය, මිහින්තලේ ලිපයක දැක්වෙන ත්‍රිකායස්ථව, වල්ලිපුරම් රන්පත් ලිපිය, ii වන ශ්‍රීනාගගේ වෙස්සගිරි පර්වත ලිපිය යනු එම ලිපි අට ය.

මේ වසරේ දී පරණවිතානගේ කාලයෙන් වැඩි කොටසක් සීගිරි ගී අධ්‍යයනය කිරීම සඳහා යෙදී වී ඇත. මේ වන විට ගී 350 ක් පමණ සාර්ථකව කියවා පරිවර්තනය කර තිබුණු පරණවිතාන එම ගී අළලා ලියූ ලිපි දෙකක් මේ වර්ෂයේ දී රාජකීය ආසියාතික සංගමයේ සඟරාවේ ද 21 ලේඩන්හි කර්න් ආයතනය මගින් පළකරනු ලබන ඉන්දියානු පුරාවිද්‍යාව පිළිබඳ වාර්ෂික ග්‍රන්ථයේ ද පළ වී ඇත.[22]

1940 දී පුරාවිද්‍යා කොමසාරිස් තනතුරේ ස්ථිරවීමෙන් අනතුරුව පරණවිතානගේ අභිලේඛණ පිළිබඳ පර්යේෂණ තරමක් දුරට ඇණහිටි බවක් දක්නට ලැබේ. මේ වන තෙක් වාර්ෂිකව මෙන් ප්‍රකාශයට පත්කරනු ලැබූ 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ කලාප 1940 සිට 1956 විශ්‍රාම ගන්නා තෙක් ම ප්‍රසිද්ධ කොට ඇත්තේ දෙකක් පමණ ය. ඒ 1934 දී ප්‍රකාශයට පත් හතරවන වෙළුමේ පස්වන කලාපයත් 1955 දී ප්‍රකාශයට පත් පස්වන වෙළුමේ පළමුවෙනි කලාපයත් ය.

මේ තත්ත්වයට ප්‍රධාන හේතු ලෙස පෙනෙන්නේ ශිලා ලේඛන සහකාර වශයෙන් එම කටයුතුවලට පමණක් යෙදවීමට තිබුණු ඔහුගේ කාලය එතැන් සිට පුරාවිද්‍යා කොමසාරිස් වශයෙන් අනෙකුත් සෑම අංශයක් කෙරේ ම යොමු කරවීමට සිදුවීමයි. 1940-45 අතර කාලය තුළ දෙවන ලෝක යුද්ධයේ බලපෑම නිසා කඩදාසි ලබාගැනීමේ දුෂ්කරතාවයනුත්, ගමනාගමනයේ අපහසුතාවයනුත් නව ශිලා ලේඛන සොයා පිටපත් කරගැනීමට බාධා පමුණුවා තිබේ.[23] අනෙත් අතට, සීගිරි ගී පිළිබඳ පරණවිතාන කරමින් සිටි පර්යේෂණ එකලස් කොට මහා ග්‍රන්ථයක් සකස් කරමින් සිටීම[24] 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ ප්‍රමාදයට හේතු වී ඇති බව පෙනේ.

1933 දී ප්‍රකාශයට පත් එම සඟරාවේ හතරවන වෙළුමේ පස්වන කලාපයේ පරණවිතානගේ ලිපි හයක් අඩංගු වේ.[25] ඒවා නම් අලුත් නුවර පුවරු ලිපිය, කොළඹ කෞතුකාගාරයේ ඇති ජේතවනාරාමයෙන් හමු වූ කැඩුණු ලිපිය, දළ මුගලන්ගේ නිලගම පර්වත ලිපිය සහ v වන බුවනෙකබාහුගේ සගම පර්වත ලිපිය යන ලිපි හතරය.

මෙතැන් සිට 1955 දී මේ සඟරාවේ පස්වන වෙළුම ප්‍රකාශයට පත්කරන තෙක් කාලය තුළ ශිලා ලේඛන පිළිබඳ පරණවිතාන ප්‍රකාශයට පත්කොට ඇත්තේ එක් ලිපියක් පමණ ය. මෙය කාව්‍යමය බ්‍රාහ්මී ලිපි පිළිබඳ 1945 දී රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛා සඟරාවේ පළ වූ ලිපිය ය.

ශිලා ලේඛන පිළිබඳ පර්යේෂණාත්මක දීර්ඝ ලිපි ප්‍රකාශයට පත් නොවූව ද දිවයිනේ නොයෙකුත් තැන්වල පිහිටි ශිලා ලිපි පිටපත් කොට එක්රැස් කිරීමට පරණවිතාන අමතක නොකළේ ය. 1940-45 කාලය තුළ දැඩි අපහසුතා මධ්‍යයේ වුව, ඔහු ශිලා ලිපි 117ක් පිටපත් කරවනු ලැබීය. මේ ලිපි අතරින් අඩකටත් වැඩි සංඛ්‍යාවක් පිටපත් කරවනු ලැබුවේ මුල්වරටය. මේවා වයඹ පළාතේ නාගොල්ලාගම විහාරය, වේරහැර, ලීකොළ වැව, දේවගිරි විහාරය, හෙට්ටිආරච්චිගම, තොරමයිලැව, ගල්ටැංපිටිය, මහනාන්නේරිය, කයිකාවල, වේරගල රිදී විහාරය, වීරදගොඩ, කොන්වැව, ඒරුණකුලිය සහ විහාරේගල යන ස්ථානවලින් ද උතුරු මැද පළාතේ අනුරාධපුර, හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, ඔච්චයප්පුකල්ලු, සින්න ආඩියාගල සහ ඇත්තන්කැල්ල යන ස්ථානවලින් ද ඌව පළාතේ කුකුරම්පොළ, කටුගහ ගල්ලේ, දොඩම්ගහවෙල, ඔබ්බේතොට සහ ඇතිළිවල යන ස්ථානවලින් ද, මන්නාරම් දිස්ත්‍රික්කයේ නාවට්කුලම්, මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ සහ බැඹිය, මඩකලපු දිස්ත්‍රික්කයේ රූගම් සහ කොළඹ දිස්ත්‍රික්කයේ තලගම යන ස්ථානවලින් පිටපත් කරගෙන ඇත.

1946 දී අනුරාධපුර රුවන්වැලි සෑ මළුවේ ද පොළොන්නරුවේ උතුරු දොරටුව අසල ද, ත්‍රිකුණාමල කොටුවේ දොර උළුවස්සක ද තිබූ ලිපි කිහිපයක් පිටපත් කර ඇත. මේ ලිපි සියල්ල ම කැණීම්වලින් හෝ වෙනත් එවැනි පර්යේෂණවල අතුරුඵල ලෙස හමු වූ ලිපි වන අතර ශිලා ලේඛන එක්රැස් කිරීම සඳහාම සංචාරය කළ බවක් නොපෙනේ[28]. 1947 දී ද මෙලෙස හමු වූ ශිලා ලේඛන කිහිපයක් පිටපත් කරවා තිබේ. අනුරාධපුර ඇතුල් නගරයේ නැගෙනහිර දොරටුව අසල පිහිටි ලිපිය, පොළොන්නරුවේ ලංකාතිලකයට ඔබ්බෙන් ලැබුණු සංස්කෘත ලිපිය එසේ පිටපත් කරනු ලැබූ ලිපි අතර වේ[29].

1948 දී පිටපත් කරවනු ලැබූ වැදගත්ම ලිපිය අනුරාධපුර දක්ඛිණ ථූපයේ කැණීමෙන් හමු වූ ලිපිය යි. මෙතෙක් සොයාගෙන ඇති දීර්ඝතම ලිපිය මෙය වෙයි. දෙවිනුවර ගල්ගේ අසලින් ලැබුණු ලිපි රැසක් ද, පඬුවස්නුවර නිශ්ශංකමල්ලගේ ලිපිය ද, මිහින්තලේ පොයගේ සඳකඩපහණේ ඇති ලිපිය ද, මේ වසරේ දී පිටපත් කරගෙන තිබේ. මේ ලිපි සියල්ලම කැණීම් හෝ සංරක්ෂණ කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස සොයාගනු ලැබූ ලිපි බව පෙනේ.

1949 වර්ෂය "ශ්‍රී ලංකාව සතු වඩාත්ම වැදගත් ඓතිහාසික ලියවිල්ල සොයාගැනීම නිසා ලංකා අභිලේඛන විද්‍යා පර්යේෂණවලට අමතක නොවන වසරකි". මේ සොයා ගැනීම නම් පළමුවන විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස ය. අහම්බෙන් සොයා ගනු ලැබූ මේ සන්නස පරණවිතානට ලැබුණේ එවකට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරියකුව සිටි සරත් වත්තල මහතාගේ උනන්දුව නිසාය. මේ වසරේදී ම වේවැල්කැටිය ලිපිය නැවත පිටපත් කරවා තිබේ. කුරුන්දන්කුලමේ තිබුණු බවට පාකර් විස්තර කරන ශිලාලිපියක් සෙවීමට ද, මේ වසරේ ගවේෂණ මෙහෙය වූ බව පෙනේ. අනුරාධපුර දක්ඛින ථූපය අසල කුඹුරකින් ද උට්ටිමඩුවෙන් ද පිටපත් කරවනු ලැබූ ලිපි දෙක මේ වසරේ සොයා ගනු ලැබූ අනෙක් වැදගත් ලිපි දෙක වේ.[31]

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන අංශය භාරව වෙනම සහකාර කොමසාරිස්වරයකු බඳවා ගැනීමට 1950 වර්ෂයේ දී පරණවිතානට හැකි වී තිබේ. පසුකලෙක දක්ෂ අභිලේඛන විද්‍යාඥයකු බවටත්, පුරාවිද්‍යා කොමසාරිස් තනතුරටත් පත් වූ මොහු ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න[32] ඔහුගේ පත්වීමෙන් පසුව එතෙක් නොදැන සිටි ශිලා ලේඛන රැසක් සොයා පිටපත් කරවනු ලැබීය.

1950 දී අලුතින් ශිලා ලේඛන 87ක් පිටපත් කරනු ලැබී ය. ඒ අතර හීපව්ව, කල්ලංචිය, උහපිට, පරගහකැලේ, වඩිනගල, පුළුනෙකෙම බැද්ද යන ස්ථානවලින් පිටපත් කළ ලිපි මූලාබ්‍රාහ්මී ලෙන් ලිපිය, එමෙන්ම වෙහෙරකෙම, පුළුනෙකෙම බැද්ද සහ ලිනිමලෙයි යන ස්ථානවලින් පිටපත් කළ ලිපි පශ්චාත් බ්‍රාහ්මී ලිපිය, ක්‍රි.ව. 2-ක්‍රි.ව. 7 අතර කාලයට අයත් ලිපි 24ක් රාජාංගනයෙන් පමණක් පිටපත් කරවනු ලැබීය. මේ කාලයට අයත් පිටපත් කරවනු ලැබූ අනෙකුත් ලිපි මාහෝ, කල්ලංචිය, උදයගිරි විහාරය, රංගිරි විහාරය, රම්බා විහාරය, හම්ගමුව, ගල්කැටියාගම, රන්මලු කන්ද, මඩුවේගල, නාකොළගනේ, කැදලිය වෙහෙර, වැල්ලවාය, මුන්නේස්වරම්, කිරින්ද, හම්බෙලිකන්ද, රංගිරිඔය, දොළුකන්ද, පාගාගොඩ, මොට්ටයාකල්ලු, වඩිනාගල සහ වෙහෙරගොඩැල්ල යන ස්ථානවලින් සොයාගෙන ඇත. මේ හැරුණු විට නුවර යුගයට අයත් තඹ පත්තීරු පහක් ද මේ වසරේ දී පිටපත් කරවනු ලැබීය. ඒවා ගලේවෙල, මැදවල, අස්ගිරිය, මාරස්සන සහ පල්කුඹුර යන ස්ථානවල පුද්ගලයන් සහ විහාර සතුව තිබුණු ඒවා ය.[33]

1951 සහ 1952 දී ශිලා ලේඛන 21 බැගින් පිටපත් කොට ඇත. පළමු වසරේ පිටපත් කළ ලිපි අතර, හේරත් ගල්මිල්ලෑව, වේරගල්කන්ද, ගලේකොටුව, කිඹුලාවැව, මොනරාගල, දාතියවැව සහ තිරියාය වටදාගේ යන ස්ථානවලින් ලැබුණු ලිපි වඩාත් වැදගත්ය.[34] 1952 වර්ෂයේදී පිටපත් කරනු ලැබූ ලිපි අතර අනුරාධපුර බසවක්කුලම වැවට උතුරින් පිහිටි ඉඩමක තිබුණු ලිපිය ද, අවුකන පිළිමගේ ගල් පුවරුවක තිබූ ලිපිය ද, පොළොන්නරුවේ රන්කොත් වෙහෙර අසල තිබුණු නිශ්ශංකමල්ලගේ ලිපිය ද ඔලගම්ගල මූල බ්‍රාහ්මී ලිපිය ද සඳහන් කළ යුතුය.[35]

මුල සිට 19 වන ශතවර්ෂය දක්වා ලංකා ඉතිහාසයේ සෑම වැදගත් යුගයක් ම නියෝජනය කරන ලිපි 31 ක් 1953 දී පිටපත් කර ඇත. මේ ලිපි අතර නාථනාර්කොවිල, තිරියාය වටදාගේ අසලින්, අම්පාරේ කොන්ඩවටවාන් වැව අසලින් ගොරකාන බෝගමුව සහ පදවිය යන ස්ථානවලින් හමු වූ ලිපි විශේෂයෙන් සඳහන් කළ හැකිය.[36]

1954 වර්ෂයේ දී ලිපි 55ක් තරම් විශාල සංඛ්‍යාවක් පිටපත් කරනු ලැබීය. මෙතරම් විශාල ලිපි සංඛ්‍යාවක් පිටපත් කරගත හැකි වූයේ සී. ඩබ්ලිව් නිකලස් මහතාගේ මගපෙන්වීම යටතේ යාල සහ විල්පත්තු අභයභූමිවල කළ ගවේෂණයන්ගේ ප්‍රතිපල නිසා ය. මේ ස්ථාන දෙකෙහි හැරුණු විට සෝමාවතිය, වෙල්ගම් වෙහෙර, කපාරාරාමය සහ කටගමුව යන ස්ථානවලින් ද මේ වසරේ දී ලිපි පිටපත් කරනු ලැබී ඇත.[37]

1955 දී තවත් ශිලා ලිපි 19ක් පිටපත් කොට ඇත. ඒ අතරින් අනුරාධපුර කැලෑවකින් හමු වූ 2 වන ගජබාහුගේ ලිපිය බෙහෙවින් වැදගත් වේ. දොළොස්වන ශතවර්ෂයට අයත් මේ ලිපියෙන් රුවන්වැලි සෑයට අමුණක් පූජා කළ බවත් සඳහන් වේ. මේජර් පොබස් විසින් පළාබත්ගල දුටු බව සඳහන් කොට තිබුණු 16 වන ශතවර්ෂයට අයත් ලිපිය ද මෙවර පිටපත් කළ ලිපි අතර වේ.[38]

'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ පස්වෙනි වෙළුමේ 1 වෙනි කලාපය ද 1955 දී ප්‍රකාශයට පත් කරනු ලැබීය. පරණවිතාන විසින් ලියූ ලිපි 14ක් ඊට අඩංගුව ඇත. ඒවා නම්, ත්‍රිකුණාමලයෙන් හමු වූ කැඩුණු සංස්කෘත ලිපිය, හිඟුරේගල පර්වත ලිපිය, වහරල ශිලා ලිපිය පිළිබඳව අර්ථනිරූපණය, II උපතිස්සගේ කන්දකාඩු පර්වත ලිපිය, IV දප්පුලගේ කොන්ඩවටවාන් ටැම්ලිපිය, කුඩා රත්මලේ පර්වත ලිපිය, මිනිපේ පුවරු ලිපිය, මුරුතව පර්වත ලිපිය, විජයබාහුගේ පනාකඩුව තඹ සන්නස, දඨෝපතිස්සගේ දක්ඛින ථූපය අසල පර්වත ලිපිය, ශ්‍රී මේඝගේ ටැම්ගොඩ විහාර ටැම් ලිපිය, VI අග්බෝ සමයට අයත් තිරියාය සංස්කෘත ලිපිය සහ විරදගොඩ ටැම් ලිපිය යන ඒවාය.[39]

පරණවිතානගේ අභිලේඛන පර්යේෂණවල පමණක් නොව, ඔහුගේ සමස්ත පර්යේෂණ සමුදායේ ම අග්‍ර ඵලය එළි දුටුවේ ඔහු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ලැබූ 1956 වර්ෂයේ දීය. ඒ කාණ්ඩ දෙකකින් යුත් 'සීගිරි ග්‍රැෆිමි' ග්‍රන්ථයයි.[40] ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයෙන් එළි දුටු මේ ග්‍රන්ථයේ පළමුවෙනි කාණ්ඩය කුරුටු ගී පිළිබඳ විවරණයකින් සහ ස්පර්ෂ ලාංඡන පිටපත්වලින් යුක්තය. දෙවන කාණ්ඩයේ කුරුටු ගී 685 ක පෙළ, පරිවර්තනය සහ අර්ථ නිරූපනය අඩංගුය. මෙහි පළමු කාණ්ඩයේ එන විවරණය සීගිරි ගී පිළිබඳ පමණක් නොව, සිංහල භාෂාවේ ඉතිහාසය, ව්‍යාකරණ සහ කාව්‍ය සාහිත්‍ය පිළිබඳ විශිෂ්ටතම විමර්ශනයක් ලෙස පෙන්වා දිය හැකිය. එහි දෙවන කාණ්ඩයේ දක්වා ඇති ගී අතරින් වැඩි කොටස 8,9 සහ 10ට වැඩි ශතවර්ෂවලට අයත් කළ හැකිය.

1956 පසුව පරණවිතාන අභිලේඛන පිළිබඳ කළ පර්යේෂණ රැසක් පළ වී ඇත්තේ විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනවලය. 1987 දී ඔහු පනාකඩුව තඹ සන්නස පිළිබඳව කෙටි සටහනක් ප්‍රකාශයට පත් කළේය.[41] 1958 දී ඔහු ශිලා ලේඛන අළලා ලිපි තුනක් ලියනු ලැබීය. ඒවා නම් හදගල පර්වත ලිපිය,[42] පෙරිමියන්කුලම පර්වත ලිපිය,[43] සහ ශ්‍රී ලංකාවේ සංස්කෘත ලිපි[44] පිළිබඳවය. 1960 දී පරණවිතාන ලංකාතිලක සෙල්ලිපිය පිළිබඳව ද ලිපියක් ලියනු ලැබීය.

1962 දී පරණවිතාන එතෙක් කරනු ලැබූ අභිලේඛනමය පර්යේෂණවලට මුළුමනින්ම වෙනස් පර්යේෂණයක ප්‍රතිඵල එළිදැක්වීය. එනම් ඉන්දු නිමින ශිෂ්ටාචාරයට අයත්, එතෙක් කියවාගත නොහැකි අක්ෂර කියවීමට යෝජිත ක්‍රමයක් ඉදිරිපත් කිරීමය. මේ පිළිබඳව ඔහු ඉන්දියාවේ පැවති සම්මන්ත්‍රණයකට ශාස්ත්‍රීය ලිපියක් ඉදිරිපත් කරනු ලැබූ අතර එම ලිපියේ කොටසක් සිංහල සඟරාවක ප්‍රකාශයට පත් වී ඇත.[45]

'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ පස්වෙනි වෙළුමේ දෙවෙනි කලාපය 1963 දී සී. ඊ. ගොඩකුඹුර සහ පරණවිතාන දෙදෙනාගේ සංස්කාරත්වයෙන් ප්‍රකාශයට පත් විය.[46] පරණවිතාන විසින් ලියන ලද ලිපි හතක් මේ කලාපයේ අඩංගු වී ඇත. ඒ අතර ඔහු විසින් ම මුලින්ම පළ කරවනු ලැබූ බදුළු ටැම් ලිපිය පිළිබඳව නව සංස්කරණයක් ඇතුළත් ලිපියක් ද ඇත. මිහින්තලේ බ්‍රාහ්මී ලිපි පිළිබඳවත්, වව්නියා දිස්ත්‍රික්කයේ ස්ථාන තුනක පිහිටි බ්‍රාහ්මී ලිපි පිළිබඳවත් මේ සඟරාවට ඔහු ලිපි ලියා ඇත. එහි ඇති අනෙකුත් ලිපි අතර ගල්ලෙන විහාර ලිපිය, රන්කොත් වෙහෙර අසල නිශ්ශංක මල්ල ලිපිය, කල්කුලම් පර්වත ලිපිය. II විජයබාහුගේ යැයි වරදවා හඳුනාගෙන සිටි නිශ්ශංකමල්ලගේ පොළොන්නරු පුවරු ලිපිය පිළිබඳ ලියැවුණු පර්යේෂණාත්මක ලිපි අඩංගුය.

මේ වසරේදී ඔහු 'යුනිවර්සිටි ඔෆ් සිලෝන් රිවීව්' සඟරාවට ශිලා ලේඛන පිළිබඳව ලිපි දෙකක් ලියනු ලැබීය. ඉන් එකක් පඬුවස්නුවර ද්‍රවිඩ ලිපිය පිළිබඳ සටහන්ය.[47] අනෙක විල්පත්තු වනෝද්‍යානයේ තිඹිරිවැව සහ අතරගල්ලෑවෙන් හමු වූ පර්වත ලිපි දෙකක් පිළිබඳවය.[48] මේ වසරේදී ඔහු අශෝක අධිරාජ්‍යාගේ රුමේන්දෙයි ලිපිය පිළිබඳව ඇමෙරිකානු සඟරාවකට ද ලිපියක් ලියනු ලැබීය.

1964 දී පරණවිතාන ශිලා ලේඛන අලලා තවත් ලිපි දෙකක් පළ කරනු ලැබීය. ඉන් එකක් රජගලින් හමුවූ මිහිඳු හිමියන් සිහිගන්වන ලිපිය පිළිබඳ ව රාජකීය ආසියාතික සංගමයේ සඟරාවට ලියනු ලැබූ ලිපියකි.[50] අනෙක පදවියේ සංස්කෘත ලිපිය පිළිබඳව රාජකීය ආසියාතික සංගමයේ සඟරාවට ලියනු ලැබූ ලිපියකි.[51]

1965 දී පළමු 'එපිග්‍රැෆියා සෙයිලනිකා' සඟරාවේ පස්වෙනි වෙළුමේ තුන්වන කලාපයට පරණවිතාන ලිපි දෙකක් ලියනු ලැබීය.[52] ඉන් එකක් කදුරුවැව බ්‍රාහ්මී ලිපි පිළිබඳව වන අතර, අනෙක 1 වන වික්‍රමබාහුගේ කහඹිලියාවේ (කදුරුවැව) පුවරු ලිපිය පිළිබඳවය. මෙතැන් සිට 1967 දී 'වහරල' වචනය පිළිබඳව ඇමරිකානු පෙරදිග සංගමයේ සඟරාවට ලියූ ලිපිය[53] හැරුණු විට 1970 දක්වා ශිලා ලේඛන පිළිබඳව පරණවිතානගේ නව පර්යේෂණ ලිපි කිසිවක් පළ නොවීය. එහෙත් 1970 දී එතෙක් ශ්‍රී ලංකාවෙන් සොයාගන්නා ලද සියලුම බ්‍රාහ්මී ලිපි අළලා 'ඉන්ස්ක්‍රිප්ෂන්ස් ඔෆ් සිලෝන් වොලියුම් වන්' නමින් ඔහු මහා ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කළේය.[54] මේ ග්‍රන්ථයට ක්‍රි.පූ. 1 වන අතැඟි විග්‍රහාත්මක හැඳින්වීමක් ද ශිලා ලේඛන වැඩිකොටසක ස්පර්ෂ ලාංඡනවල ඡායාරූප ද මෙහි අඩංගු වී ඇත. මේ මහා ග්‍රන්ථය ඔහුගේ ජීවිත කාලය තුළ පළ කරවනු ලැබූ අවසාන කෘතිය වන්නේය. ඒ වන විටත් ලියා අවසන් කොට තිබුණු මේ ග්‍රන්ථයේ දෙවැනි වෙළුම පරණවිතානගේ මරණයෙන් දශකයක් ඉක්ම ගියාට පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කොට ඇත.[55] ක්‍රි.පූ. 41 ක්‍රි.පූ. 164 අතර කාලයට අයත් බ්‍රාහ්මී ලිපි 84ක් අඩංගු මේ ග්‍රන්ථයට පරණවිතානගේ විග්‍රහය ඇතුළත් නොවීම කණගාටුවට කරුණකි.

කෙටි යෙදුම්

ABIA	-	Annual Bibliography of Indian Archaeology
ASCAR	-	Archaeological Survey of Ceylon Annual Reports
CJS(G)	-	Ceylon Journal of Science (Section G)
EI	-	Epigraphia Indica
EZ	-	Epigraphia Zeylanica
JRAS(C.B)	-	Journal of the Royal Asiatic Society (Ceylon Branch)
JAOS	-	Journal of America Oriental Studies
UCR	-	Univercity of Ceylon Review

පාදක සටහන්

01. EI. vol.18.p. 7-8 ,pp 330-338
02. JRAS (C.B) vol.30 No.80 1927 pp 461-463
03. Hocart (1928) ASCAR 1927, p.72
04. Winzer (1929) ASCAR 1927-28, p.7
05. Winzer (1930) ASCAR 1928-29, pp.6-7
06. EZ.vol.111 (1928-1933).Introduction.
09. EZ.vol.111 p2, pp 71-100 and pp 100-113
10. EZ. CJS(G) vol.1 p.4.pp 17-19; (1928)
    EZ. CJS(G) vol.2 p.1.pp 17-29; (1928)
    EZ. CJS(G) vol.2 p.2.pp 49-128; (1930)
    EZ. CJS(G) vol.2 p.3.pp 149-173; (1935)
11. ASCAR 1932-35,37,38-39 etc
12. EZ and AS.JARS (C.B) vol.32.NO.85(1932)etc
13. EZ.vol.111. p.3 (1930)
14. EZ.vol.111. p.4 (1931)
15. EZ.vol.111. p.5 (1932)
16. EZ.vol.111. p.6 (1933)
17. EZ.vol.1v. p.1 (1934)

18. EZ.vol.1v. p.2 (1935)
19. EZ.vol.1v. p.3 (1936)
20. EZ.vol.1v. p.4 (1939)
21. JARS (C.B) vol.34 NO.92 (1939) pp 309-346
22. ABIA vol.12 (1937) pp 34-37
23. ASCAR 1940-45 p 39
24. ASCAR 1946 p.16 1948 p 22
25. EZ vol.IV p.5 (1943)
26. JARS (C.B) 1945.vol.No.98, pp 58-65
27. ASCAR 1940-45 p.39-41
28. ASCAR 1947 p.16-18
29. ASCAR 1947 p.15-17
30. ASCAR 1949 p.22-23
31. ASCAR 1949 p.28-33
32. ASCAR 1950 p.4
33. Ibid p.31
34. ASCAR 1951 p44 and Appendix F. p 64-65
35. ASCAR 1953 p 21-23 and Appendix 11 p 40-43
36. ASCAR 1953 p 21-23 and Appendix 11 p 26-28
37. ASCAR 1954 p 29-30 and Appendix 11 p 35-39
38. ASCAR 1958 p 31-32 and Appendix 1 p 34-35
39. EZ.vol v. p+1 (1955)
40. SG.vol 1 and 2 (1956)
41. JARS (G.B&I) 1967 pp 213-214
42. UCR vol.16.No.1-2 (1958)
43. JARS (G.B) vol.12 (N.s) p+2 (1958) pp 129-137
44. Bharathi (1957-58) Annual of the indological Society.
45. University of Ceylon.3-7
46. EZ,vol v p.2 (1963)
47. UCR.vol 20 No 1 (1962) pp 16-18)

48. UCR.vol 19 No 2 (1961) pp 95-104 (1963)
49. JAOS.vol 82 No 2 (1962) pp 163-167 (1963)
50. UCR.vol 20 No 2 (1962) pp 159-162 (1963)
51. JARS (C.B) vol.8 (N.S) p+2 (1963) pp 262-264
52. EZ vol v.p.3 (1965)
53. JAOS vol.87.No 2 (1967) pp 166-169
54. IC. vol 1. (1970)
55. IC.vol 11 (1983)

11

ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයේ ඉතිහාසය

අමිල නුවන් මධුසංඛ

සංක්ෂේපය

පතල් කර්මාන්තයේ ආරම්භය සනිටුහන් වන්නේ මැණික් පතල් කර්මාන්තයත් සමගිනි. අනාදිමත් කාලයක සිට පැවත එන මැණික් පතල් කර්මාන්තයට විධිමත් භාවයක් ලැබෙන්නේ 19 වන සියවසේදී මිනිරන් පතල් ආරම්භයට සමගාමීව ය. දේශීය කර්මාන්ත පිළිබඳව අවධානය යොමු කරන විට මිනිරන් පතල් කර්මාන්තය අමතක කළ නොහැක. ඈත අතීතයේදී මෙරටට විදේශ විනිමය උපයා දීම උදෙසා එමගින් සිදුවූයේ මාහැගි මෙහෙයකි. මධ්‍යතන යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවයත්, විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති වූ සීඝ්‍ර දියුණුවත්, දෙවන ලෝක සංග්‍රාමය හේතුකොටගෙන නොයෙකුත් කාර්මික යෙදවුම් සඳහා මිනිරන් අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීම වඩාත් ප්‍රචලිත වීමත් නිසා බ්‍රිතාන්‍ය යටත් විජිත රටක් වූ ශ්‍රී ලංකාවේ මිනිරන් සඳහා ඇති ඉල්ලුම ද ක්‍රමයෙන් වැඩිවන්නට විය. එකල සිටි කුරුඳු තලන්නන් අයත් වූයේ වහුම්පුර නම් කුලයටයි. පසු කලෙක මිනිරන් පතල් කර්මාන්තයට වැඩි වශයෙන් යොමු වූයේ මොවුන්ය. එනිසා මිනිරන් පතල් කර්මාන්තයේ නියැලි පිරිස් වහුම්පුර කුලයට අයත් වූවන් ලෙස සලකන ලදි. කෙසේ වෙතත් මේ සියලුම උස් පහත් වීම් වලට නොසැලී මුහුණ දෙමින් ශ්‍රී ලංකාවේ මිනිරන් වලට හිමිව තිබූ සීමිත වෙළඳපොල ස්ථාවරව පවත්වාගෙන යමින් විදේශ.ය වෙළඳපොලේ පැවැත්ම තහවුරු කර ගැනීමට සමත් වූයේ බෝගල, කහටගහ සහ කොලොන්ගහ පතල් පමණකි. වර්තමානයේ මිනිරන් සඳහා පවතින්නා වූ මෙක. සීමිත වෙළඳපොල ස්ථාවරව සාර්ථකව පවත්වාගෙන යාමේ වගකීම කරටගෙන තිබෙන්නේ බෝගල මිනිරන් පතල පමණකි. එබැවින් දිනෙන් දින විනාශ මුඛයට ගමන් කරන දේශීය කර්මාන්ත රැක ගැනීම උදෙසා වගකිව යුතු පිරිස් වහ වහා ක්‍රියාත්මක විය යුතු කාලය එළඹ ඇති බව සඳහන් කළ යුතුය.

හැඳින්වීම

මානව පරිණාමයෙන් බොහෝ කලකට පසුව වානර ගති පැවතුම් අතහැර දමමින් ශිෂ්ට සම්පන්න යුගයට පිවිසෙන මිනිසා ගෝත්‍ර වශයෙන් තම වර්ගයා සමග තමන්ටම ආවේණික පරිසරයක සුවිශේෂී සංස්කෘතික ප්‍රවාහයක් තුළ ජීවත් වන්නට පටන්ගත් දා සිට ලෝකය තුළ විවිධත්වයක් නිර්මාණය වන්නට විය. රටින් රටට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට නව්‍යකරනයක් එක්කරන මෙම ආවේණිකත්වය භූගෝලීය වශයෙන් ලාංකීය සමාජය තුල ප්‍රතිනිර්මාණය වන්නේ සංසමිත්තා තෙරණිය සමඟ මෙරටට පැමිණි ශිල්ප ශ්‍රේණි හෙවත් කුල පදනම් කරගෙනය. මීට ප්‍රථම මෙරට තුළ රාජාණ්ඩු පාලනයක් පවතින කාලසීමාවේද කුල ක්‍රමයට මූලික අඩිතාලම නිර්මාණය වන්නට විය. මේ අනුව කුල ක්‍රමය පදනම් කරගනිමින් කුලයට අයත් සුවිශේෂී රැකියාවක්, සංස්කෘතික පරිසරයක් සමාජය තුළින්ම නිර්මාණය කරගත් ආකාරයක් දැකගත හැකි විය.

පතල් කර්මාන්තයේ ප්‍රාථමික අවධියක් වන මැණික් ගැරීම අනාදිමත් කාලයක සිට මෙරට පැවතුන ද එය කර්මාන්තයක් බවට පත් වන්නේ 19 වන සියවසේ මිනිරන් පතල් වල ආරම්භයත් සමගිනි. පුරාවිද්‍යාත්මක සාධක වලට අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේදී (එනම් ක්‍රි.පූ 4 වන සියවසේදී පමණ) ගිණිකොනදිග යුරෝපයේ මැටි බඳුන් අලංකාර කිරීම සඳහා ස්වභාවික මිනිරන් භාවිතයට යොදාගත් බවට සාදක හමුවී ඇත. එසේම ක්‍රි.ව 1565ට පෙර ආසන්න වසරකදී බ්‍රිතාන්‍යයේ බැටළු එඩේරන් පිරිසක් විසින් බැටළුවන් සළකුණු කිරීම සඳහා මිනිරන් භාවිතයට ගත් බවද කියැවේ. සාක්ෂරතාව පහළ මට්ටමක තිබූ පුරාණයේ ජීවත් වූ ජනයා මිනිරන් වල සුවිශේෂී දිළිසෙන ස්වභාවයත් ලිහිසි ගතියත් නිසා එය වටිනා ලෝහයක් ලෙස වරදවා වටහා ගැනීමට පවා යොමුව තිබෙයි.

මෙසේ ස්වභාවිකව හමු වූ මිනිරන් කෝව සෑදීමට, අච්චු ඇතුලත ආලේප කිරීමට වඩාත් සුදුසු යැයි සොයාගැනීමත් සමගම වර්ෂ 1533-1603 අතර කාලයේදී එය කාර්මික අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතයට ගන්නට යෙදුනි. කාලතුවක්කු උන්ඩ සෑදීමට ගන්නා අච්චු ඇතුලත ආලේපනය සඳහා මිනිරන් සුදුසු වීම හේතුවෙත් එය බ්‍රිතාන්‍ය හමුදාවන්ගේ ආයුධ නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගැනීම උදෙසා සියලු මිනිරන් පතල් රජය යටතට පවරාගෙන නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කළ බව සඳහන් වේ. මධ්‍යතන යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවයත්, විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති වූ සීඝ්‍ර දියුණුවත්, දෙවන ලෝක සංග්‍රාමය හේතුකොටගෙන නොයෙකුත් කාර්මික යෙදවුම් සඳහා මිනිරන් අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීම වඩාත් ප්‍රචලිත වීමත් බ්‍රිතාන්‍ය යටත් විජිත රටක් වූ ශ්‍රී ලංකාවේ මිනිරන් සඳහා ඇති ඉල්ලුම වැඩිවන්නට බලපාන ලදී.

මිනිරන් කර්මාන්තයක් වශයෙන් දේශීයන්ට උරුම වන්නේ 1800 ගණන් වලය. වාර්ෂික පාලන වාර්ථාවලට අනුව මිනිරන් කර්මාන්තය 1839 වැනි කාල වල සිට කෑගලු දිස්ත්‍රික්කයට අයත් ගල්බොඩ, කිණිගොඩ, වර්ණකුර යන කෝරළ වල පැවති බව පෙනී යයි. මිනිරන් පතල් කම්කරුවෝ බෝගලට පහත රටින් සංක්‍රමණය වූ පිරිසකි. මුල් යුගයේ මිනිරන් නිධි හමු වූ තැන් වල සංක්‍රමණික කම්කරු කණ්ඩායම් වල පදිංචිය සිදු විය. ජාත්‍යන්තර වශයෙන් කුරුඳු වෙළඳපොල කඩාවැටීමත් සමඟ පහතරට බහුල ලෙස සිදු කළ කුරුඳු වගාවට අයහපත් බලපෑම් එල්ල වන්නට විය. මෙනිසාම කුරුඳු වගාවේ නියැලී සිටි පිරිස් තම ගම් බිම් අතහැර කම්කරුවන් ලෙස බෝගල වැනි පතල් වාඩි වලට සංක්‍රමණය

වන්නට විය. එකල සිටි කුරුඳු තලන්නන් අයත් වූයේ වහුම්පුර නම් කුලයටයි. පසු කලෙක මිනිරන් පතල් කර්මාන්තයට වැඩි වශයෙන් යොමු වූයේ මොවුන්ය. එනිසා මිනිරන් පතල් කර්මාන්තයේ නියැලි පිරිස් වහුම්පුර කුලයට අයත් වූවන් ලෙස සලකන ලද.. එය අදාල වන්නේ අතීතයට පමණකි. වර්ථමානයට මෙය අදාල නොවේ. එනම් වර්තමානයේ මිනිරන් පතල් කැනීම් සිදුකරනුයේ කුලය මත පදනම්ව නොවේ. මෙයට හොඳම නිදසුන නම්, මිනිසුන් 2500 ක් පමණ වැඩ කළ කහටගහ පතලේ අයිතිකරු වූ දොන් චාර්ලිස් මොරිස් ආටිගල මහතා වහුම්පුර කුලයට අයත් වීමයි.

බටහිර රටවල සිදු වූ ස.ග්‍ර කාර්මික වර්ධනය හේතුකොටගෙන මිනිරන් වලින් ලබාගත හැකි වෙනත් ප්‍රයෝජන සම්බන්ධයෙන් අවධානය යොමු වන්නට විය. බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවති ලංකාව ඒ වන විට කාර්මීකරණය පැවති බටහිර රටවල මිනිරන් සඳහා වූ ඉල්ලුම සපුරන්නට උත්සාහ ගන්නා ලදී. එමෙන්ම ඒ සඳහා අවශ්‍ය වෙළඳ සබඳතාවයක් ගොඩනගාගෙන තිබූ හෙයින් ශ්‍රී ලංකාවේ මිනිරන් 19 වැනි ශතවර්ෂයේ මැද භාගයේ සිට 1870 ගණන්වල මුල කොටස දක්වා වූ කාලයේ සුළු අපනයන කර්මාන්තයක් වශයෙන් ස්ථාපිත විය. මේ කාලයේ ද. මිනිරන් කර්මාන්තයේ වර්ධනයට හේතු වූ මූලිකම සාධකය වූයේ අධික කාබන් ප්‍රමාණය අතින් සුප්‍රසිද්ධ ශ්‍රී ලංකාවේ මිනිරන් ඉල්ලම සඳහා වූ ඉල්ලුම වැඩිවෙමින් පැවතීමයි.

1869 සිට 1919 දක්වා වූ කාලය තුළ ලංකාවේ මිනිරන් වලවල් හා පතල් 3000 ක් පමණ දිවයිනේ නිරිතදිග ප්‍රදේශය පුරාම තැනින් තැන බිහිවී ඇත. යාන්ත්‍රික උපකරණ යොදාගත් පතල් (මෝල් පතල්) හා මිනිස් ශ්‍රමයෙන් වැඩ කළ පැරණි ක්‍රමයේ පතල් (දබරේ පතල්) මේ අතර වේ. කෙසේ වෙතත් ලංකාවේ විශාල පතල් කිහිපයක දියුණුව ඇතිවී ඇත්තේ රට තුල කලින් කලට සිදු වූ ආර්ථික උස් පහත්වීම් වලට මුහුණ දෙමිනි. වර්ෂ 1930 දී ඇති වූ ආර්ථික අවපාතය හේතුවෙන් මිනිරන් පතල් විශාල ප්‍රමාණයක් වැසී ගිය අතර, තවත් කිහිපයක නිෂ්පාදනය මුළුමනින්ම නැවතී ඇත. දෙවන ලෝක සංග්‍රාමය හේතුවෙන් ඇති වූ ඉල්ලුමට අවශ්‍ය නිෂ්පාදන ලබා දිය යුතුව තිබූ හෙයින් නැවතත් 1940 දී පමණ ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය පුනර්ජීවනයක් ලබන ලදි. කෙසේ වෙතත් මේ සියලුම උස් පහත් වීම් වලට නොසැලී මුහුණ දෙමින් ශ්‍රී ලංකාවේ මිනිරන් වලට හිමිව තිබූ සීමිත වෙළඳපොල ස්ථාවරව පවත්වාගෙන යමින් විදේශ.ය වෙළඳපොලේ පැවැත්ම තහවුරු කර ගැනීමට සමත් වූයේ බෝගල, කහටගහ සහ කොලොන්ගහ පතල් පමණකි. වර්තමානයේ මිනිරන් සඳහා පවතින්නා වූ මෙක. සීමිත වෙළඳපොල ස්ථාවරව සාර්ථකව පවත්වාගෙන යාමේ වගකීම කරටගෙන තිබෙන්නේ බෝගල මිනිරන් පතල පමණක් බව කිව යුතුය.

ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය

ශ්‍රී ලංකාව යනු ඛනිජ සම්පත් ආකරයකි. එම ආකරය පිරී ඇත්තේ බොහෝ විට ආසියාවේ වටිනාම සහ හොඳම ඛනිජ වර්ගයන්ගෙන් බව සමහර විට ඔබ නොදන්නවා විය හැකිය. ඛනිජ සම්පත් යනු, මිනිස් සංවර්ධනය හා ඉතා කිට්ටුවෙන් බැඳී පවතින ස්වභාවික සම්පත් විශේෂයකි. ඇමරිකානු පතල් කාර්යංශය මගින් කරනු ලැබ ඇති වර්ගීකරණයකට අනුව ලොව ඇති ආර්ථික ඵලදාය. ඛනිජ සම්පත් ශක්තිය සපයන ඛනිජ, යකඩ හා යකඩ මිශ්‍ර ලෝහමය ඛනිජ, යකඩ නොවන ලෝහමය ඛනිජ හා ලෝහමය

නොවන ඛනිජ ලෙස ප්‍රධාන කොටස් 04 කට බෙදා ඇත. ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව සළකා බලන විට ඛනිජ ඉන්ධන හෝ ආර්ථික මට්ටමේ ලෝහමය ඛනිජ සංචිත කිසිවක් රට තුල මෙතෙක් සොයාගෙන නොමැත.

එසේ වුවද ලෝහමය නොවන ඛනිජ සම්පත් වලින් රට කිසියම් වූ ප්‍රමානයකට පොහොසත්ය. මිනිරන්, මැණික්, ඛනිජ වැලි, පිඟන් මැටි, හුණු ගල් හා පොස්පේට් දේශීය ලෝහමය නොවන ඛනිජ වලට නිදසුන් වේ. මේ සියළු ඛනිජ සම්පත් වලට සාපේක්ෂව මිනිරන් නිධි ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශ වල පැවති අතර එය අතීතයේ පටන්ම බහුල ලෙස මිනිස් ශ්‍රමය යොදාගනිමින් පවත්වාගෙන යන්නා වූ කර්මාන්තයකි. දේශීය මිනිරන් වල ඇති අධික කාබන් ප්‍රමාණය අතින් ලංකාවේ මිනිරන් ඉල්ලම් සුප්‍රසිද්ධ බැවින් ද ඒ සඳහා අධික මිලක් ගෙවන හෙයින් ද අනෙකුත් දේශීය ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත අභිබවමින් ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය ක්‍රමයෙන් රට තුල ස්ථාපිත වන්නට විය.

උසස් තත්ත්වයේ මිනිරන් නිපදවන රටක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියක් උසුලයි. මිනිරන් වල 95% පමණ ප්‍රමාණයක් කාබන් (c) අඩංගුය. අත.තයේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල මිනිරන් කැන.ම සඳහා නොගැඹුරු පතල් හා කුඩා පතල් 6000 ක් පමන තිබී ඇත. නමුත් අද ලංකාවේ ප්‍රසිද්ධම මිනිරන් පතල් වනුයේ බෝගල සහ කහට ගහ යන පතල්ය. මිනිරන් ශ්‍රී ලංකාවේ වැදගත් අපනයන ද්‍රව්‍යයකි. හාරාගනු ලබන මිනිරන් වලින් කෝව, කාබන්, බුරුසු සහ කලිල මිනිරන් වැනි වැඩි වටිනාකමකින් යුත් මිනිරන් ආකාර වේ. අත.තයේද. මෙම මිනිරන් (Black Lead, Plumbago) යන නම් වලින්ද හඳුන්වන ලදි.

පතල් කවි ඔස්සේ විද්‍යමාන වන මිනිරන් පතල් කරුවන්ගේ සංස්කෘතික පසුබිම

අපේ ජන කවි අතර පතල් කවි වලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එදා මිනිරන් ඉල්ලමක් සොයා ජීවත් වන්නට මහ පොළව සමඟ කටුක සටනක යෙදුනු පතල් කරුවා ස්වකීය ජීවන වෘත්තියේ තමන් අත්විඳි පාළුව තනිකම කටුක බව සහ බිය දුරුකර ගැනීම උදෙසා ගැයූ කවි අතීතයේ පටන් පතල්කරුවන් අතර කටවහරේ පැවත එමින් පතල් කවි වශයෙන් හෙළ ජන ගී කෙත පෝෂණය කරනු ලැබූහ. මතුපිටින් මෙන් හුස්ම ගැනීමට පහසු නොවූ අඳුරු උණුසුම් වාතාශ්‍රයෙන් පිරි යන්තම් හිස වදින නොවදින ප්‍රමාණයට කපාගෙන ඇති ගල් දෝනාවක් දිගේ මිනිරන් කඩමින් පොළව මතුපිට සිට බඹ ගණනාවක් දුර ඉසව්වක රැකියාවක් කරද්ද. ඇතිවන දුක්බර හැඟීම් පතල් කවි තුලින් මොනාවට පිළිබිඹු වෙයි. මෙම පතල් කවි අධ්‍යයනය කරන විට ඒ තුළ සැඟවුන සමාජ විද්‍යාත්මක අගයක් ද පවතින බව අවබෝධ කර ගත හැකිය.

දුම්බර කන්ද පාමුල මිනිරන්	පතලේ
බැසලා බඹ තිහක් කළු ගල	සිදුරු කලේ
බස්නාහිරට දෝනා දෙක	ගමන් කලේ
විස්තර කියක් දුම්බර මිනිරන්	පතලේ

ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
කන්නෙත් කරවලයි රට හාලේ බතට
බොන්නෙත් බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදාද මව්පියො දකින්නට

දබරේ කරකවා අත් දෙක වෙව්ලනවා
නිතරම ඇවිත් ලෝඩර් දත් මිටි කනවා
වතුර ඇදල අත් වල කරගැට එනවා
මිතුර පතලෙ දුටුවම මගෙ බඩ දනවා

වල ඇතුලේ සොල්දර වාසනාවන්
සොල්දර උඩට දබරේ වාසනාවන්
දබරේ උඩට දම්වැල් වාසනාවන්
දුප්පත් අපට පතලේ වාසනාවන්

මිනිරන් පතල හරියට අපෙ ගෙදර වගේ
බත් දෙන කෝකි අයියා අපෙ අම්ම වගේ
ලියන අප්පු පවුලේ ලොකු අයිය වගේ
ලෝඩර ගොල්ල හරියට මහසෝන වගේ

මී වදේ ලෙසට ඉල්ලම සොයා ගෙන
එම වදේ ලෙසට කටු පන තියා ගෙන
ආයුදේ ලෙසට ඉල්ලම් කටු රැගෙන
මේ සඳේ පතල් වල ඉල්ලම් කපන

ඉර පායා එනකොට රැස් විහිදෙනවා
සඳ පායා එනකොට තරු දිළිසෙනවා
මල් පිපිලා සුවඳට බමරුන් එනවා
ලඳ නුඹ මතක් වෙනකොට හදවත දනවා

කිරි මදු කොළ කිරි මදු කොළ කිරි අම්මේ
කිරට අඩන අත දරුවෙක් මම අම්මේ

අනුන් දෙන බතට වග බෝමයි අම්මේ
ඈත ඉඳන් මට අත වනනුය අම්මේ

වදුරාගොඩට අපි ඇවිදින් විදින දුකා
ගැට්ට නැති මුට්ටි පොඩියේ උයන් කකා
පණම් විස්ස ණය වෙනකොට හිගා කකා
සතර වරම් දෙවි පිහිටෙන් නොවන් දුකා

දවස උදාවත්ම වැඩ අරඹා අඩි සිය ගණන් ගැඹුරු පතල් තුලට බසින පතල් කරුවා ඉන් ගොඩ එන්නේ දින කිහිපයකට පසුවය. පතල තුලදී ඔහුට දැනෙන පීඩාව කාන්සිය පාළුව බිය අපමනය. එහෙයින් මේ සියලු දුක් වේදනා අමතක කර දමමින් ගැයූ පතල් කවි තුලින් මිනිරන් පතල්කරුවන්ගේ ජීවන තොරතුරු හා සංස්කෘතික වටපිටාව මොනාවට විද්‍යමාන වෙයි.එසේම සුනිල් සරත් පෙරේරා විසින් රචනා කළ පණ්ඩිත් අමරදේවයන් සංගීතවත් කරමින් විමලා අමරදේව මහත්මිය විසින් ගායනා කරන්නට යෙදුනු පහත සඳහන් ගීතය තුලින්ද මිනිරන් පතල් කර්මාන්තයේ අසීරු බව මොනාවට කියාපායි.

ඉහින වලට දබරේ වාසනාවන්
දුප්පත් අපට බෝගල වාසනාවන්
අන්ධකාරෙන් අන්ධකාරෙට-අඳෝනා දෝනාවෙ යන ඔබ
මහා කළු ගල සිදුරු කැරගෙන
දිවෙන මීමෙ සොයා වෙහෙසෙති
එළිය නොදකින ඔබේ ලෝකය-සදා හිරු සඳු නොම දකින සඳ
ඈත ගිරඟින් ගමට නැග එයි
මලානික වූ පෝය පුන් සඳ-ජීවිතේ අරගලෙන් යුධ වැද
හෙළන දහදිය මුතු කඳුළු යට
නිදන් වී ඇති රිදී ඉල්ලම-මුනගැසේවා ඔබට දිනයක

තම ගම් බිම් අතහැර බෝගලට පැමිණි කම්කරුවන් සිය සිතුම් පැතුම් වාතලයට මුදාහලේ කවි ගී ඔස්සේයි. එසේම අනූපමා ගනේගොඩ නම් රචිකාවිය විසින් රචනා කළ **පතල් ගිය අම්මාට** නම් පැදි පෙළෙන් මිනිරන් පතල් සංසකෘතියේ තවත් පැතිකඩක් නිරූපනය කරනු ලබයි.

ඩක්කුව හඩයි සිත පිරිලා ප.ලි දිගේ
මහ වැහි වැටෙයි මිනිරන් කැට වගේ දිලේ
ඒ වැහි යටින් මගෙ දරුවෝ කොහෙද ගියේ
කවදා කොතැන නිවනක් විද නුඹේ හිතේ

හිතේ හයිය වාරුව කොට පාර දිගේ
මිරිවැඩි සඟල ගෙවිලා ඇත දෙපය රිදේ
ඇතින් ඇසෙන සෙක්කුවෙ හඬ සවන පිරේ
වැලි කන්ද පාමුල තාමත් නුඹෙ කඳුළු තියේ

උදේ ඉදන් රෑ වෙනතුරු කාස්ටකේ
මිනිරන් කැට එක්ක හරියට ඔට්ටු වුනේ
පුපුරු ගසන තුරු අත් පා හිරි වැටුනේ
හන්දි බේත් වාත තෙලුයි තනි රැක්කේ

කුසෙන් අඩක් කා ඉතිරිය ඔතාගෙන
පතල් බතුත් රස මසවුළු කළා නුඹ
නිදන කලෙත් දුක් ගිනිකඳු හිනාවක
සඳක් පිපුනි නිමවා රෑ අමාවක

බෝගල පතලෙ මිනිරන් ඇහිළුව අම්මා
ඒ රන් විකුන දිව මාළිග තැනු අම්මා
තාමත් විසල් දරු දුක් උහුලන අම්මා
නිවන් පුරේටම පලයන් අපෙ අම්මා

මිනිරන් පතල් රැකියාවේ නිරතවන මවකගේ දුක් කඳුළු දරුවකුගේ දෑසින් දකින අයුරු මෙයින් නිරූපිත වේ. මෙය සමස්තය වෙනුවෙන් එක් නියෝජනයක් පමණි. පතල් රැකියාවේ නිරත වන්නන්ගේ ජීවිත මිනිරන් මෙන් මතුපිටින් දිළිසෙන්නේ නැත.

මිනිරන් පතල්කරුවන්ගේ සංස්කෘතිකමය හැඩගැස්ම

බෝගල පතල් භූමියේ කාලාන්තරයක් තිස්සේ වාර්ෂිකව දෙවොල් මඩුවක් පැවැත්වෙයි. පහතරට ප්‍රදේශවල දක්නට ලැබෙන සිංහලයන්ගේ චාරිත්‍රයක් වන මෙය බෝගලද. පවත්වන්නේ සංක්‍රමණික කම්කරුවන්ගේ ආගමනයත් සමගිනි. පතල් රැකියාවල නියැලෙන මොවුන්ගේ ජීවිත නිරන්තරයෙන් අවදානමක පැවතුනි. ඔවුන් මෙම කාර්යයේ නිරත වූයේ ඒ පිළිබඳව ද කිසිදු තැකීමක් නොකරමිනි. මේ අනුව පතල් උප සංස්කෘතිය තුලින් මතු වූ කවි වලින් තත්කාලීන සමාජ විවරණයක් සිදුව ඇත. පතල් කවි ප්‍රවාද වලට අයත් හටන් කවි මේ පිළිබඳ ඍජු උදාහරණ වලට ගත හැකිය. ගිරන් බාස් හටන, පතල් කවි විවිධත්වය තුල දැකිය හැකි ප්‍රශස්ථ ගනයේ කාව්‍යයකි. මෙය චූල සාම්ප්‍රදායේ නම හෙළි නොකල

කවියකුගේ ප්‍රබන්ධයකි. මිනිරන් පතල් සංස්කෘතිය පිළිබඳව පළල් අවබෝධයක් ලබා දෙන පැදි 90 කින් සමන්විත මේ තුල ගිරන් බාස්ගේ ජීවන අන්දරය කියැවෙයි.

ගිරන් බාස් යනු පහත රටින් දුම්බර පතලට සංක්‍රමණය වූ පතල් කම්කරුවෙකි. එසේ වුවද මොහුගේ නම දුම්බර පමණක් නොව කෑගලු දිස්ත්‍රික්කයේ බෝගලද එකසේ පතලව තිබේ. ඔහු උපන්නේ දකුණු ශ්‍රී ලංකාවේ බෙන්තර අසල යාලේගම බව මෙම හටන් කාව්‍යයේ එන කවි වලින් පැහැදිලි වේ. ගමේදී දුප්පතෙකු වූ මොහු දුම්බරට ගොස් මිනිරන් පතල් කර්මාන්තයට යොමුවනවාත් සමගම ධනවතෙකු විය. එසේම තම පතල් කටයුතු සඳහා පහත රටින් කම්කරුවන් ද ගෙන්නා ගන්නා ලද.. කෙසේ හෝ මිනිරන් කර්මාන්තය ආශ්‍රිතව සිදු වූ සදාචාරාත්මක පිරිහ.ම නිසා ඔහු පාන්තියා නම් වූ පතල් කම්කරුවකු අතින් මිය යයි.

ගිරන් බාස් දුම්බර මැද පොළට ගියා
මුදල් වැඩිවෙලා තව තව ඉහල ගියා
කරගෙන තිබුන පින් පව් ටික ඉහල ගියා
මරනෙට මුල්වෙන්න ඇත්තේ පාන්තියා

මැද පොළ යනු ගිරන් බාස් වැඩ කළ දුම්බර පතල් සමූහයට අයත් තවත් විශේෂ පතලකි. මිනිරන් පතල් කර්මාන්තය අතිශය ප.ඩාකාරී අත්දැක.ම් ගෙනදෙන්නක් වූයෙන් මේවායේ නිරත වූ කාන්තා පක්ෂයට මෙය දරාගත නොහැකි විය. නමුදු ජීවන සටන වෙනුවෙන් ඈ ඒ සියලු අපහසුතා විඳ දරා ගත්තාය.

උදේ හයට නැගිටල බෝගල යනවා
සවස හයට නාගෙන ගෙදරට එනවා
ඇඟේ තියෙන ගෝමර අව්වට දනවා
බෝගල නොයා ඉන්නට සිත පොරකනවා

මිනිරන් පතල් ඇතුලත කාන්තාවෝ සේවයේ නොයෙදෙති. එසේ වුවද පතල් භූමිය තුල හා මඩුවල අපනයනය කිරීම සඳහා මිනිරන් වර්ග කිරීම හා ඇසිරීම සිදුකරන්නේ කාන්තාවන් විසිනි. දුටු පමණින් හොඳ මිනිරන් වර්ග හඳුනාගැන.මේ හැකියාව වසර ගණනාවක් සේවය කිරීමේ පලපුරුද්ද මත ඇයට උරුමව පවත.. බොහෝවිට ඔවුනගේ ස්වාමිවරු පතල ඇතුලත සේවය කරන ලද.. අත.තයේ රිද.විට කුඹුරේපොළ වැනි පතල සඳහා විදුලි එන්ජින් භාවිත කොට තිබේ. මේ සඳහා ගල් අඟුරු වලට අමතරව දර භාවිත කළහ. වරුවකට දර යාර 12 ක් පමණ අවශ්‍ය වූ මේ සඳහා දර ඇද.ම භාරවූයේ පතල් පළේ වැඩ කළ කාන්තාවන්ටය.

ශ්‍රී ලංකාවේ මිනිරන් පතල් ව්‍යාප්තිය සහ එහි නිෂ්පාදන

භූ විද්‍යා හා පතල් කැන.ම් කාර්යංශයේ භූ විද්‍යාඥ ද.පානි වීරකෝන් මහත්මිය පෙන්වාදෙන ආකාරයට ලංකාවේ ඛනිජ සම්පත් වර්ග විස්සකට අධික ප්‍රමාණයක් ඇතිබව හඳුනාගෙන තිබෙයි. ඒ අතර මිනිරන් හා තලාතු මිනිරන් වලට විශේෂ තැනක් හිමිවේ. ශ්‍රී ලංකිවේ මධ්‍යම පලාත මුල්කරගනිමින් ව්‍යාප්ත වී ඇති මෙම මිනිරන් පතල් අතර ජනප්‍රිය පතල් කිහිපයක්ම දැකගත හැකිය. ඒ අතර,

- මාතලේ
- ඕවල
- උතුරු හා දකුණු පරාගොඩ
- රිද. ඕවිට
- කහට ගහ
- කොළොං ගහ
- කෑගල්ල දිස්ත්‍රික්කය



පරිගණක මෘදුකාංග ඇතුළු අධි තාක්ෂණික උපකරණ නිෂ්පාදනයට යොදා ගන්නා තලාතු මිනිරන් මධ්‍යම පළාතේ මාතලේ සහ ඕවල යන ප්‍රදේශ කේන්ද්‍රකොටගෙන හමු වී ඇති අතර ඒවා අපනයනික ඛනිජ සම්පත් වර්ගයට අයත් වෙයි. ජපානය, සිංගප්පූරුව, මැලේසියාව හා යුරෝපයට මෙම තලාතු මිනිරන් අපනයනය කරනු ලබයි. බෝගල, කහට ගහ, කොළොං ගහ යන ප්‍රදේශ වලින් ද මිනිරන් හමු

වී ඇත. ශ්‍රී ලංකාවේ මිනිරන් යනු, ලෝකයේ සියලු මිනිරන් අතරින් පිරිසිදු භාවයෙන් ඉහළම මිනිරන් බවට ද සනාථ වී තිබේ.

- යුධ උපකරණ
- යුධ ඇඳුම් කට්ටල
- පරිගණක මෘදුකාංග
- අධි තාක්ෂණික උපකරණ (zinc-carbon batteries,electric motor)
- පැන්සල් වර්ග
- Artistic Medium, Smoke Box, Fire Box

ආද. බොහෝ නිර්මාණ කිරීම සඳහා මිනිරන් යොදාගනු ලබයි. අප මිනිරන් හොඳින්ම හඳුනන්නේ අකුරු කරන්නට පැන්සල අතට ගත් දා සිටය. කාබන් වල බහු රූප. ආකාරයක් වන මිනිරන් පොළොවෙන් ලබාගන්නා ඛනිජයකි. ප්‍රධාන වශයෙන් පැන්සල් සෑද.මට භාවිත කරන මිනිරන් හොඳ විද්‍යුත් සන්නායක ද්‍රව්‍යයකි.

මිනිරන් පතලේදී භාවිත කරන උපකරණ හා එයටම ආවේනික වචන මාලාවක්

පතල් කම්කරුවන් මිනිරන් පතල තුලද. එකිනෙකා ඇමත.මටත්, එහිද. භාවිත කරන උපකරණ හැඳින්වීමටත් ආවේණික වචන මාලාවක් භාවිත කරන ලද..

- ලෝඩර් (වැඩ බලන තැනැත්තා)
- ලිස්ට් එක, මැෂින් බාල්දිය (දබරය)
- ඉනිම (ඉහලට නැග.ම සඳහා තනා තිබෙන ඉනිමග)
- අඩිකාරයා (වලේ පහල කොටසේ සිටින්නා)
- බක්කිකාරයා (වල තුල ප්‍රවාහන කටයුතු සිදුකරන්නා)
- දෝනාව(පතල තුල කපා ඇති උමග)
- සැර යවනවා (පතලේ ඇති වතුර ඇද.මට ඉහල සිට බටයක් දිගේ හුළං යැවීම)
- මිනිරන් දෝනාව (ඉල්ලම දිගේ යන දෝනාව)
- දෝරුව (ඉල්ලම යටට බසින උමග)
- තට්ටු කපනවා (ඉල්ලම දිගේ උඩට හෑරීම)
- ඩක්කුව (උමග තුල මිනිරන් ප්‍රවාහනය සඳහා භාවිත කරන උපකරණය)
- දියමන්ති විදුම් යන්ත්‍රය-Diamond Drilling Machine (මේ උපකරණය භාවිතයෙන් මිනිරන් ඉල්ලම තිබෙන තැන සොයාගත හැකිය)

- කථාකරන පයිප්පය
- විදුලිය සපයන පයිප්පය
- හුළං යවන පයිප්පය

} සැපයුම් බට

- වයිරොඩ් කම්බි (ඉහල පහල යාම සඳහා භාවිත කරන ලද පොට ඇමිනූ යකඩ කම්බි)

බෝගල මිනිරන් පතල සහ එහි ඇතුලත ක්‍රියාවලිය

මහපොළව යට කිලෝමීටරයකටත් වඩා යට සිටින මොහොතක් ගැන යමෙකුට සිතිය හැකිද ? අඳුරු පාළු මහ පොළොව තුල තම ජීවිකාව සරිකර ගන්නා අපූරු මිනිසුන් දැකබලා ගනිමින් එවන් අපූරු වූ අද්දැක.මක් විදගැන.මට නම් අප යා යුත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති බෝගල මිනිරන් පතල වෙතටයි. මේ අඳුරු පාතාලයෙන් ඉහළට යාමට හැකිවේදෝ යන සැකයත් අවිනිශ්චිත හැග.මත් සිත දරාගෙන පතල් කම්කරුවා සිදුකරන සේවය මිල කළ නොහැකි වන්නේ එබැවිනි. එදා පතල් කම්කරුවන් විසින් අස.මිත දුක් කම්කටොළු මැද සිදුකරන ලද එම රැකියාව අද වන විට නවීන තාක්ෂණයෙන් සන්නද්ධව අපූරු ලෙස සිදුවන ආකාරය දැක ගැන.මටත් අප යා යුත්තේ බෝගල මිනිරන් පතල වෙතටයි. ලොව ඉහළම කාබන් ප්‍රතිශතයක් අඩංගු හොඳම තත්ත්වයේ මිනිරන් හමුවන බෝගල මිනිරන් පතල ආරම්භ කර ඇත්තේ 1847 ද. බවට එවකට කෑගල්ල දිසාපතිවරයාගේ දිනපොතේ එක් සටහනක් සාක්ෂි දරයි.

කෑගල්ල අවිස්සාවේල්ල මාර්ගයේ මත්තමගොඩ පතල් හන්දියෙන් හැරී 04 kmපමණ ගිය විට බෝගල පතල් භූමියට පිවිසෙන ප්‍රධාන පිවිසුම හමුවේ. ගල් තලාව මත බෝගසක් තිබූ නිසා බෝගල වූවායැයි සැලකෙන මෙම ග්‍රාමයෙහි මහ බෝගල, පුංචි බෝගල, කරඳවත්ත ලෙස පතල් තුනක් තිබී ඇති අතර දැන් ඇත්තේ මහ බෝගල පතල පමණකි. බෝගල පතල පිළිබඳව තොරතුරු ලබා ගන්නට එම ස්ථානයේ ඇති කුඩා අනුරූ ප්‍රයෝජනවත් වේ. අත.තයේ භාවිත කළ උපකරණ සේම වර්තමානයේ නවීන තාක්ෂණය යොදාගෙන මිනිරන් කැන.ම් කරන අයුරු සියැසින්ම දැක ගත හැකිය. 1950 ද. පමන නවීණ තාක්ෂණය බෝගල පතලට යොදා ගත් අතර මෙකලම විදුලි සෝපානයක් ද සවි කළහ.

පළමුව බුදු ගුණ සිහිකර මිහි තුලට පිවිසෙනු ලබයි. මිනිරන් පතලක් රැඳ. තිබෙන්නේ එහි ඇති මිනිරන් නිධි මතයි. මිනිරන් නිධියක් සාමාන්‍යයෙන් අඟල් කිහිපයක සිට මීටර් සියගණනක් දක්වා පැතිරී තිබිය හැකිය. දැනට බෝගල පතලෙහි එවැනි විශේෂ මිනිරන් නිධි කිහිපයක් ඇති අතර ඒවා සාම්ප්‍රදායික ලෙස නම් කර තිබේ. එනම්,

- නා ඉල්ලම
- මී ඉල්ලම
- කුඹුක් ඉල්ලම

මෙහිද. මෙම නම් භාවිත කර ඇත්තේ ඉල්ලම් ලබාගැන.මට කනින උමගේ සවිශක්තිය වැඩි කිරීම සඳහා එකල යොදාගැනුනු ල. වර්ග පදනම් කරගෙන බව බොහෝ දෙනාගේ පිළිගැන.මයි. එක් එක් උමංවල ජල මට්ටම වෙනස් බැවින් මෙසේ විවිධ ල. වර්ග යොදාගන්නට ඇතැයි සැලකේ. අදට ද

මෙම පතල් සඳහා එම දැව යොදාගතහොත් කිසිඳු හානියක් නොවන බව ඉංජිනේරුවන්ගේ මතයයි. සාමාන්‍යයෙන් මෙම උමගක 80m පමණ කැන.මට වසර 10 ක් පමණ ගතවේ. පිරිසිදු කරන ලද 99% කාබන් අඩංගු මිනිරන් 1000 kg රුපියල් ලක්ෂ හතරකට අලෙවි කළ හැකිය. කෙසේ වෙතත් පතල තුල සෑමවිටකම ජලය එකතුවේ. එය කෙතරම්දැයි කිවහොත් දිනකට එකතුවන ජලය ගැළුම් 100000ට වැඩි මිස අඩු නැත. මෙම ජලය පොම්ප මගින් ඉවත් කරයි. මේ සෑම කාර්යයක් සඳහාම විවිධ යන්ත්‍ර භාවිත කරන අතර මාසික විදුලි බිල රුපියල් 3500000 අභිබවයි.

තව වසර 30 කට සරිලන ඉල්ලම් පතල තුල සැගව තිබෙයි. හිසට පතල් තොප්පිය, එළිය ලබාදෙන කැප් ලාම්පුව, ගම් බූට්ස් සහ ආරක්ෂක මෙවලම් පැලද.ම පතල් කම්කරුවන්ට අනිවාර්ය වේ. 1975 වන තෙක් බඹ 42 මට්ටම දක්වා පමණක් මෙහි සෝපානය ක්‍රියාත්මක වූවත් අද වන විට බඹ 275 (මීටර් 476) දක්වාත්, 800 m දක්වාත් එය ක්‍රියාත්මක වේ. එක් වරකට මිනිරන් දෝනාවක වැඩ කරනු ලබන්නේ කම්කරුවන් තිදෙනෙකු පමනකි. කම්කරුවන්ගේ ආරක්ෂාව සඳහා වෛද්‍යවරයෙක් සහ ජීවිතාරක්ෂකයෙක් පතල තුල සිටියි. ගල් දෝනාවක් හෑරීමට සහ ඉල්ලම කඩා ගැනීමට වෙඩි දැමිය යුතුය. මුලින්ම කළු ගල සිදුරු කරනු ලබයි. ඒ සඳහා අධි ප.ඩන වායුව මගින් ක්‍රියාකරවන Atlas Copcor නම් වූ විදුම් මැෂිම භාවිත කරයි. එම සිදුරු වලට විදුලි කැප්, ඩයිනමයිට්, ඇමෝනියම් සහ වෙඩි බෙහෙත් යොදා විදුලිය සැපය.මට වයර් දමා ක්ෂණිකව විදුලිය සපයනු ලබයි. ඉල්ලමට වෙඩි දමනු ලබන්නේ කළු ගල් ඉවත් කිරීමෙන් අනතුරුවය. එසේම බටයක් හරහා පතල තුලට ඔක්සිජන් වායුව (O_2) ගෙනයනු ලබයි. දියමන්ති විදුම් යන්ත්‍රයේ ඇති රවුම් විදුම් කටුව අඩි 5 ක් දිග හටයකට සවිකර මැෂිමේ ආධාරයෙන් ගල විද.ම සිදුකරනු ලබන අතර බටයට එකතුවන කළුගල් කොටස් සාම්පලයක් ලෙස සළකුණු කළ පෙට්ටියක අසුරා තබයි. මෙලෙස අඩි 5 බැගින් වූ බට සවිකර අඩි 1500 ක් පමණ දුර විද.ම කළ හැකි අතර ඒ මගින් මිනිරන් ඉල්ලම ඇති තැන පහසුවෙන් හඳුනාගනියි.

වර්තමාන පතල්වල ප්‍රධාන බලශක්තිය වනුයේ විදුලි බලයයි. විදුලි බලයෙන් ප.ඩනය (Compressure) වැඩිකර වාතය (Air) උපයෝග. කර ගනිමින් පතල ඇතුලේ සියලු විද.ම් කටයුතු සිදුකරයි. පතල ඇතුලේ පිරෙන ජලය අශ්වබල 185-125 බැගින් වන මෝටර් 3 බැගින් සවිකර නිතර ඉවත් කරනු ලබයි. මිනිරන් වල අඩංගු කාබන් ප්‍රමානය අනුව ඒවායේ මිල ත.රණය වේ. 90% අඩු කාබන් සහිත මිනිරන් සුලබ අතර 90% වැඩි මිනිරන් දුර්ලබය. බෝගල මිනිරන් වල කාබන් ප්‍රතිශතය 99% කි. මෙය ලෝකයේ හොඳම මිනිරන් නිධියකි. කළුගල් කුඩු සමග මිශ්‍ර මිනිරන් වෙන් කරන්නේ විශේෂ යන්ත්‍රයක් මගිනි. මිනිරන් ජලයේ දියවෙන බැවින් මුලින්ම මේවා අඹරා තලපයක් ලෙස සාදාගන.. පසුව ජලය සමග මිශ්‍රකර පයිනෝල් නම් රසායන ද්‍රව්‍ය ඊට එක්කරයි. එවිට මිනිරන් ජලයේ පෙන මෙන් පාවී ගොස් ගල් කුඩු සමග අපද්‍රව්‍ය යට යයි (Flotation Plant). මෙලෙස ජලයේ පාවුනු මිනිරන් වෙන් කර මලුවල අසුරා ජලය ඉවත්කර $150C^0$ උෂ්ණත්වයේ රත් කරනු ලබයි. පසුව ලැබෙන්නේ සියුම් මිනිරන් කුඩුය. මේවා ටොන් එකක් ලක්ෂ 04 කට පමණ අලෙවි කළ හැකිය.

මෙම ව්‍යාපෘතියේ අපද්‍රව්‍ය බැහැර කිරීම ඇතුළු සම්පූර්න ක්‍රියාවලිය පරිසර ප්‍රතිපත්තියට හා ප්‍රමිත.න්ට අනුකූලව සිදුකරන හෙයින් 2007 වසරේද. ISO 4001-2004 SLS පරිසර තත්ත්ව සහතික හිමිකරගෙන තිබේ. එසේම බෝගල පතල් වල සම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ISO 9001-2000 SLS ප්‍රමිති සහතිකය 2004 ද. ලබාගෙන තිබේ. මෙලෙස මිනිරන් වල ප්‍රමිතිය සහ තත්ත්වය සහතික කිරීම

සඳහා අති නවීන යන්ත්‍ර සහිත විද්‍යාගාරයක් ඇති අතර මෙයින් ලබාදෙන තත්ත්ව සහතික ජාත්‍යන්තරව ද පිළිගනු ලබයි.

මිනිරන් පතල් කර්මාන්තයේ සිදුවන අනතුරු ද එමටය. ඒ සියල්ලක්ම වාර්ථා නොවුනත් මෑත ඉතිහාසයේ වාර්ථා වූ ප්‍රබල අනතුරක් වනුයේ 1993 ද. වූ මරණ.ය අනතුරයි. වැඩ අතැර තිබූ උමගක නඩත්තු කටයුතු සඳහා තම කණ්ඩායම් ප්‍රධානියාට පෙර එහි ගිය සේවකයින් දෙපලක් උමග තුල ඔක්සිජන් වායුව (O_2) නොමැති වීමෙන් මියයෑම එම සිදුවීමයි. මුල් කාල වකවානුවේ වෙන් වෙන්ව පැවති මෙම මහ බෝගල, පුංචි බෝගල හා කරඳවත්ත යන පතල් තුන අයිතිකරුවන් තිදෙනෙකු යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස පැවතුන අතර 1938 ද. මේ පතල් තුනම තනි සමාගමක් යටතට ගෙන තිබේ. 1970 වනතුරු මෙම පතල් මොරටුවේ ආර්නස්ට් ප්‍රනාන්දු නමැත්තාට අයත්ව තිබී ඇත. 1971 ද. මිනිරන් පතල් කර්මාන්තය ජනසතු ව්‍යාපාරයක් බවට පත්කිරීමෙන් පසුව බෝගල මිනිරන් පතල් කර්මාන්තය ද රාජ්‍ය මිනිරන් සංස්ථාව වශයෙන් යලි නම් කර තිබෙයි. පසුව 1979 ද. මෙම ආයතනය රාජ්‍ය පතල් කැන.ම් හා ඛනිජ සංවර්ධන සංස්ථාව ලෙස නම් කළහ. 2000 නව පාලනය බෝගල මිනිරන් කර්මාන්තය භාරගන්නා විට එහි සේවකයින් 610 ක් පමන සිටියහ. නමුත් තාක්ෂණය හේතුවෙන් අද වනවිට එය 408 දක්වා පහත බැස තිබේ. 2000 වසරේද. මෙම පතලේ ආදායම මිලියන 112 ක් වූ අතර 2007 වනවිට එය මිලියන 403 දක්වා වැඩි වී තිබේ.

බෝගල මිනිරන් පතල සංචාරක ගමනාන්තයක් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග

ලොව ඉහළම කාබන් ප්‍රතිශතයක් අඩංගු මිනිරන් ඇති බෝගල පතල දෙස් විදෙස් සංචාරකයින් අතර ප්‍රචලිත කිරීමට සබරගමුව පළාත් සභාව මේවන විට සැරසේ. 1847 එනම් වසර 166 කට පෙර ඇරඹූ මෙහි ඓතිහාසික වටිනාකමක් ද ඇත. 275 m ගැඹුරු මෙය මුහුදු මට්ටම ද පසුකර කැන.ම් කර තිබේ. ඇතුලත විහිදුන උමං මාර්ග රැසකි. ජෛව විවිධත්වයෙන් අනූන සබරගමුවේ සුන්දර ප්‍රදේශයක් වන කොළඹ අවිස්සාවේල්ල හරහා කෑගල්ල මාර්ගයේ ගමන් ගන්නා විට හමුවන කොටියාකුඹුර කඩමණ්ඩියෙන් හැරී කඳු හෙල් ඇළ දොළ වලින් සමන්විත සෞම්‍ය දේශගුණයකට උරුමකම් කියන සුන්දර පරිසරයකට මැදිව මෙම පතල පිහිටා තිබෙයි.

ලාංකේය ඉතිහාසයේ දැනට සියවස් එකහමාරකටත් වඩා පැරණි මතකයක් හිමි විශාල විදේශ විනිමයක් උපයා දෙන මෙම පතල දෙස් විදෙස් සංචාරකයන්ට නැරඹීමට ඉඩහසර සැළැස්වීමෙන් අප මාතෘභූමියේ වටිනාකම ලොවට ප්‍රදර්ශනය කළ හැකිවනු ඇත. සබරගමුව පළාත් සභාවේ සංචාරක අමාත්‍යංශය මගින් දැනටමත් ආරම්භ කර ඇති පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධන වැඩසටහනට මෙම බෝගල පතල අයත් ප්‍රදේශය ද යොදාගෙන තිබේ. සියවස් ගණනාවක් පැරණි ඉතිහාසයකට උරුමකම් කියන බෝගල පතල අවට සිහිවටන නිර්මිත හා කෞතුක භාණ්ඩ රැසක්ම දැකගත හැකිය. එය අපේ රටේ උරුමය ලොවටම කියාපාන කැඩපතකි. මේ සියලු කරුණු සළකා බලමින් බෝගල මිනිරන් පතල දෙස් විදෙස් සංචාරකයින් අතර ප්‍රචලිත කිරීමට කටයුතු කරන්නේ නම් සංචාරක කර්මාන්තය හරහා අනාගතයේද. රටට විශාල විදේශ විනිමයක් උපයාගත හරකිවනු නොඅනුමානය.

මූලාශ්‍ර

ඇතුගල, ආරියරත්න. (2009) සන්නිවේදන ප්‍රවණතා, කොළඹ 10, ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්.

කරුණාරත්න, ඩේවිඩ්. (1989) එදා හෙළදිව, කොළඹ, එම්.ඩී.ගුණසේන ප්‍රකාශකයෝ.

කුමාර, දර්ශන අශෝක. (2009) වත්මන් මාධ්‍ය අධ්‍යයන ප්‍රවණතා, කෙළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහේන්ද්‍ර, සුනන්ද. (1997) සන්නිවේදන ශබ්දාකරය, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, නන්දසේන. (2012) සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම, කොළඹ, ආරිය ප්‍රකාශකයෝ.

ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව, (2012) සැලළිහිණි වත, කොළඹ 07. ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛා සේවා මණ්ඩලය. (2012) *ප්‍රලේඛා පළමුවැනි වෙළුම 01 කලාපය*, කොළඹ 07, පුස්තකාල සහයෝගිතා අංශය.

සංස්කෘතික කටයුතු දේපාර්තුමෙන්තුව. (2008) *රූපවාහිනි සමීක්ෂා දෙවන කලාපය*. බත්තරමුල්ල. සංස්කෘතික කටයුතු දෙපාර්තුමෙන්තුව.

ලංකා පුවත්පත් මණ්ඩලය. *පුවත්පත් කලා සමීක්ෂා*. (1993) කොළඹ, ලංකා පුවත්පත් මණ්ඩලය.

12

ශ්‍රී ජීවනාථයන් විසින් විරචිත "භාවකුතූහලය" කෘතියෙහි එන ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණවලින් නිරූපිත ශුභ - අශුභ සන්නිවේදනය පිළිබඳ විමර්ශනයක්

නන්දන මිල්ලගල

හැඳින්වීම හා අරමුණු

දේහ ලක්ෂණ විද්‍යාව මිනිසා කියවා ගැනීම සඳහා උපයුක්ත ඓතිහාසික ක්‍රමවේදයකි. ස්ත්‍රී - පුරුෂ ශරීරාංග මගින් සන්නිවේදිත අර්ථ එකී මිනිසුන්ගේ ජීවිත විනිශ්චය කර ගැනීමට යොදා ගනී. කේසාන්තයේ සිට පාදාන්තය දක්වා බාහිර රූප කායෙහි කුඩා අනුකුඩා සකලවිධ අංග ප්‍රත්‍යංග එහිදී සියුම් නිරීක්ෂණයට ලක්ව ඇත. එමගින් අධ්‍යාත්මික ස්වරූපයත් චර්යාත්මක ස්වභාවයත් අතීත, වර්තමාන හා අනාගත යන කාලත්‍රයේ ජීවිත ස්වභාවයත් අර්ථකථනය කරයි. දේහ ලක්ෂණ ක්‍රම විද්‍යාත්මකව නිරීක්ෂණය කිරීමෙන් විවිධ නිගමනවලට ප්‍රවේශවීමක් නිසා මෙය මිත්‍යාවක් ලෙස බැහැර කළ නොහැකි ය. ඇස්, දිව, හෘදස්පන්දනය (නාඩි) හා ශාරීරික උෂ්ණත්වය ආදී බාහිර සාධක පරීක්ෂා කිරීමෙන් වෛද්‍ය වරයෙක් රෝග විනිශ්චයක නිරත වන්නේ යම්සේ ද? මෙය ද එක්තරා ජීවන පරීක්ෂණ ක්‍රමවේදයක් ලෙස විමර්ශනයට භාජනය කළ හැකි ය.

නිර්වාචික සන්නිවේදනයේ දී කාය භාෂාව, මුහුණේ සන්නිවේදනය, ඇස් සම්බන්ධතාව හා හස්ත සංඥා ආදිය පිළිබඳ ප්‍රබල අවධානයක් යොමුවේ. මානව ශරීරාංග සන්නිවේදනය සඳහා හිතාමතා සවිඥානව භාවිත කිරීම මෙන්ම එම ශරීරාංග මගින් සිදුවන සන්නිවේදනාර්ථ පරීක්ෂාව ද එක් ක්‍රමයකි. යම් ස්ත්‍රියකගේ හෝ පුරුෂයෙකුගේ මුහුණ, ඇස්, අත්ල ආදිය පිහිටීම මගින් යම් යම් සන්නිවේදනාර්ථ පළවිය හැකි ය. සවිඥානකව එම අවයව ඇසුරෙන් කිසියම් සන්නිවේදනයක් සිදුකළ හැකි ය. එසේම ස්වයං සිද්ධව ඉබේ ම සිදුවන සන්නිවේදනයන් ද පවතී. එම දෙපාර්ශවය ම පුද්ගල ජීවිතයට අත්‍යවශ්‍ය වේ. මෙම විමර්ශනය ජීවනාථ නම් භාරතීය දෛවඥයාගේ "භාව කුතූහලය" නම් ඉපැරණි කෘතියේ ස්ත්‍රී - පුරුෂ ශරීරාංග ආශ්‍රිත අර්ථ නිරූපණ පදනම් කරගෙන සිදු කෙරෙන්නකි. එය සන්නිවේදනාත්මක දෘෂ්ටියෙන් අධ්‍යයනය කිරීමට උත්සුක වේ.

මෙවැනි අධ්‍යයනයක අරමුණු කීපයක් පවතී විශේෂයෙන් ඓතිහාසික ඥානමය දායාදයන් හි වටිනාකම් නූතන සමාජ වෙත හඳුන්වාදීම ඉන් වඩාත් ප්‍රමුඛ වේ . එසේම " භාව කුතුහලය" වැනි අප්‍රකට ඓතිහාසික කෘතියක ස්ත්‍රී පුරුෂ ශරීරාංගවල නිරූපිත සන්නිවේදනාර්ථ මගින් වර්තමාන මානව සමාජ උදෙසා ලබාගත හැකි, පරමාදර්ශ හෝ උපදේශ විමසා බැලීම ද වැදගත් ය. කුමන ශාස්ත්‍රයක විද්‍යාවක හෝ සෞන්දර්ය කලා නිර්මාණයක වුව ද පරමාර්ථය මිනිසා ඇතුළු ලෝකය උසස් තලයට පත් කිරීම නම් ; 'භාව කුතුහලය' කෘතියෙන් එම අභිමතාර්ථ සාධනයට කෙතරම් සාධාරණයක් ඉටුව තිබේදැයි විමර්ශනය කිරීම ද මෙයින් අපේක්ෂිත ය.

අධ්‍යයන ක්‍රමවේදය

මෙම විමර්ශන අධ්‍යයනය මුද්‍රිත කෘතියක් පදනම් කර ගත්තකි . එබැවින් අධ්‍යයන ක්‍රමවේදයක් ලෙස මුද්‍රිත කෘති පරිශීලනය උපයෝගී කර ගැනීමට සිදු වේ. එහි දී භාව කුතුහලය නම් වූ කේන්ද්‍රීය කෘතිය පමණක් නොව ඇතැම් සංසන්ධනාත්මක විශ්ලේෂණවල දි මෙන්ම සාහිත්‍යමය විමර්ශනයේ දී පවා මුද්‍රිත ග්‍රන්ථ ඇසුරු කිරීමට සිදු වේ.

එසේ ම කේන්ද්‍රීය කෘතියේ අන්තර්ගතය විශ්ලේෂණය කිරීමට සිදුවන නිසා අන්තර්ගත විචල්‍ය විශ්ලේෂණ ක්‍රමය (Content analysis) අවශ්‍යයෙන් ම භාවිත කළ යුතු ය. මාධ්‍ය වැඩසටහන් නිරීක්ෂණය වැනි ක්‍රමයකින් ද අධ්‍යයනය සඳහා යම් පෝෂණයක් ලැබීමට හැකි වනු ඇත .

සාහිත්‍ය විමර්ශනය හා සාකච්ඡාව

පෙරදිග චින්තනයේ දාර්ශනික ගැඹුර , වේද සහ උපනිෂද් සාහිත්‍යය යි. එම ශක්තිමත් පදනම මත ඉන්දීය, සාහිත්‍ය, ශාස්ත්‍ර, විද්‍යා, ශිල්ප කලා ආදිය ප්‍රතිෂ්ඨාපිත ය. ඒ සියල්ලෙහි අපේක්ෂිත අභිප්‍රේතාර්ථ වන්නේ අර්ථ, ධර්ම, කාම. මෝක්ෂ සාධනයයි. මේ චතුර්විධ පරමාර්ථ සාක්ශාත් කරගන්නා මානව ජීවිත උත්කෘෂ්ට සාර්ථකත්වය වැළඳ ගන්නා බව පිළිගැනේ. ආගම්, දර්ශන, ජ්‍යෝතිර් විද්‍යාව, සෞන්දර්යවේදය, ආයුර්වේද, වෛද්‍ය විද්‍යාව, ගණිත මිනිත විද්‍යා ආදී විෂය සියල්ලගෙන් අපේක්ෂා කරන ලද්දේ උසස් යහපත් සුභදායී ජීවිත ගොඩනගා ගැනීමයි. රාමායනය, මහාභාරතය, කාමසූත්‍ර, පඤ්ච තන්ත්‍ර හෙසජ්ජ මංජුසා, සුභාෂිත රත්න භාණ්ඩගාර ආදී කෘතිවල සිට භාස්කර්, කපිල මුනි ආදින්ගේ ගණිත, මිනිත සංඛ්‍යා විද්‍යා කෘති ද කාව්‍ය ශාස්ත්‍ර විෂයෙහිලා සම්පාදිත කෘති ද ඇතුළු රවින්ද්‍රනාත් ටාකුරයන්ගේ ගීතාංජලී දක්වා සෑම කෘතියක ම පාහේ එකී පරමාර්ථයෝ නිදන්ගතව ඇත්තා හ. අර්ථ, ධර්ම, කාම, මෝක්ෂ යන පුරුෂාර්ථ සපුරා ගනු සඳහා භාරතීය නිර්මාණ සාහිත්‍ය කෘති නිර්මාණය කර ඇත. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍ර හා චාණක්‍යගේ කාමන්දක නීතිසාරය ආදිය අර්ථ පරමාර්ථය පිණිස නිපදවිණි. මනුස්මෘතිය වැනි කෘතියක් ධර්ම පරමාර්ථය පිණිස ය. වාත්ස්‍යායනගේ කාමසූත්‍ර මගින් කාම පරමාර්ථය සපිරේ. ස්ත්‍රී - පුරුෂ සබඳතාව උසස් ආශ්වාදනීයත්වයට පත්කර ගනිමින් ජීවන අපේක්ෂා මුදුන්පත් කරගන්නා ආකාරය කාමසූත්‍රවලින් ප්‍රකට වේ. කාම විෂයෙහි ඉන්දීය සෞන්දර්ය කලා සාහිත්‍ය සුපෝෂිත ය . "වාල්මකී ගේ රාමාණය සංස්කෘත සාහිත්‍යයෙහි ආදි කාව්‍ය සේ සලකනු ලැබේ. එහෙයින් වාල්මිකී ආදි කවියා ය . පද්‍යය මුලින් ම වාල්මිකීගේ මුවින් පිටවුණු බව ජනප්‍රවාදයෙහි සඳහන් වේ." (ජයසුමන ;-පිටු 5-6) එසේ වාල්මිකී මුවින් පිට වුණු පද්‍යයට විෂය වූයේ ද කාමයයි. දිනක් වනයෙහි සිටින ඔහු

කොස්වාලිහිණි යුවලක් දැක්කේ ය. එතැනට පැමිණි වැද්දෙක් හීයකින් විද කුරුල්ලා මැරී ය. කිරිල්ලිය ශෝකයෙන් විලාප, කියන්නට පටන් ගත්තා ය. මෙය දුටු වාල්මීකීගේ සිත ශෝකයෙන් පිරිණ. ඒ ශෝකය ශ්ලෝකයක ආකාරයෙන් මෙසේ පිටවිණ.

මා නිෂාද ප්‍රතිෂ්ඨාං

ත්ව මගම ඃ ශාශ්වාතී ඃ සමා ඃ

යත් ක්‍රෞඤ්ච මිථුන දෙක

මවධී ඃ කාමමොහිතම් (ජයසුමන - 6)

ස්ත්‍රී- පුරුෂ විලාස , ස්වභාවයන් සහ චර්යා ඇසුරින් සාහිත්‍යයෙහි නොයෙක් කලාප පිරි පවතී . විශේෂයෙන් දේහ විලාස මිනිසුන් කියවා ගැනීමට සහ ඔවුනගේ චරිත අවබෝධ කර ගැනීමට නිර්ණායකයක් ලෙස යොදා ගෙන ඇත . බෞද්ධ ජාතක සාහිත්‍යයෙහි ගුත්තිල , උම්මග්ග පදමානවක වැනි ජාතක ඊට නිදසුන් ය . ගුත්තිල ජාතකයේ දක්වන පරිදි " එවිට බෝධිසත්වයෝත් සාමුද්‍රිකා ලක්ෂණ දන්නා හෙයින් මේ අසත් පුරුෂයායයි කියා දැන තොපට මා දෙන විද්‍යා නැත පලායව" යි කීහ . (ජාතක පොත සංස්ඃ 1995 ; පිටු - 653) ගුත්තිල ජාතකය විෂය කර ගනිමින් රචිත ගුත්තිල ජාතක කාව්‍යයේ ද මෙම අවස්ථාව නිරූපිත ය .

"බලමින් ගකුණු ගත

දුදන ගුණ දැන ඔහු සිත

නොවසව තෙපි මවෙත

ශිල්ප නොදෙමැයි කිවෙන් මහසත " (167 පද්‍ය) (බටුවන්තුඩාවේ ; (සංස්) ; 85) -

ගත ලකුණු මගින් දුදන ගුණ , නොදැමුණු බව ප්‍රකටවන බව ය. මෙරට සම්භාව්‍ය නිර්මාණ සාහිත්‍ය කෘතිවල ස්ත්‍රී පුරුෂ දේහ ලක්ෂණ වඩාත් චමත්කාර ජනක ලෙස වර්ණනාවට ලක්වේ.

රතොට රතැදියෙම් - කොපුල් පතලේ බිඳියෙම්

තනහස මුසු කළෙම් -නිදොසින් ලූ හා නුගියට

(ආරියපාල (සංස්) ; 2004 ඃ 497)

රත් තොල්වල රත් පැහැය ඇද ගත්තෙමි. කම්මුල්වල පත්‍ර ලේඛා බින්දෙමි. පයෝධර නමැති හංසයන් මූර්ඡා කළෙමි. භාර්යාවට මම වනාහි නිර්දෝෂයෙම්ලු .. අහෝ ..... යනු එහි අදහසයි.

" සම්භාව්‍ය සිංහල ගී කවීන් ස්ත්‍රීත්වය ප්‍රතිනිර්මාණය කිරීමේ දී කේන්ද්‍රීය සංකල්පය ලෙස යොදා ගෙන ඇත්තේ ස්ත්‍රීයගේ රූප විලාසයයි. එහි දී ඔවුහු ස්ත්‍රීයගේ මුහුණ, නෙත්, පියයුරු, උකුළ, ඉඟ ,කෙස් කළඹ , ඡවි වර්ණය සහ ඇතුල් පතුල් වැනි ශරීරාංගවල සුන්දරත්වය වර්ණනා කළහ, " (රත්නමාලා ; 2014 ඃ 123)

එහෙත් බොහෝ කෘතිවල පුරුෂයාගේ ශරීර විලාස ඉතා මද වශයෙන් වර්ණිතය. ශක්තිමත් බාහු, පුළුල් උර මඩල, තියුණු ඇස්, දිගු නසය, ආදියයි, එහෙත් ශක්තිමත් බව රණශූරත්වය , අභිත බව , කීර්තිය ඔද තෙද බලය , වැනි ගුණාංග මහත් ලෙස ඇගයුමට ලක්ව තිබේ. මෙරට සම්භාව්‍ය නිර්මාණ සාහිත්‍ය කෘතිවල ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණ වඩාත් චමත්කාර ජනක ලෙස වර්ණාවට ලක් වේ. දේහ ලක්ෂණ පරීක්ෂාව හා අර්ථකථන සම්පාදනය ඓතිහාසික යුගවල සිට පැවති ක්‍රමවේදයක් බව මෙයින් ගම්‍ය වේ.

ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණ පිළිබඳ අපර දිග පර්යේෂණවල දී ද හමුවේ. එහිලා එංගලන්තයේ උපත ලද ඩෙස්මන්ඩ් මොරිස්ගේ අධ්‍යයන වැදගත් වේ . ඔහු විසින් රචනා කළ නිරුවත් වානරයා (The Nakcd ape) නිරුවත් ගැහැණිය (The íked Woman) සහ ශරීරය දැකීම (Bodywatching) වැනි කෘති ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණ පිළිබඳ විමර්ශන අධ්‍යයනයන් ය . ඒ ඒ අවයවවල පිහිටීමේ ස්වභාවය, කාර්යභාරය, හා සංඥාර්ථවේ දී ය . නිරූපණ ගැන ද විද්‍යාත්මකව සාකච්ඡා කරයි . රස දැනීම (Testing) මුඛය හා දිව ආශ්‍රිත ක්‍රියාවලියකි . අප ගන්නා විවිධ ආහාර පානවල රස සන්නිවේදනය වන්නේ මෙම ඉන්ද්‍රිය මගිනි .

"දිව රස දැනීම ආහාර විකීම සහ ගිලීම තුළ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වෙමින් පෝෂණ ක්‍රියාවෙහි ප්‍රධාන භූමිකාවක් ද වේ. එහි ගෝරෝසු උඩු මතු පිට රසංකුර නමදාහක් දහදාහක් අතර ප්‍රමාණයක් දරා සිටින පීටිකාවක් තුළ ආවරණය වී ඇත . රසයන් හතරක් දැනීමට ඒවාට හැකියාවක් ඇත . දිව තුඩු මත පැණි රස සහ ලුණු රස , දිවෙහි පැතිමත ඇඹුල් රස සහ දිව පිටු පසෙහි තිත්ත රස වශයෙනි". (මොරිස්; (කොඩිකාර- සංස් ; 2011ඃ163)

ඒ අනුව මොරිස් තම කෘති මගින් හිසකෙස් ඇහිබැම , ඇස් , කන් , නනාසය , කම්මුල් , තොල් උරහිස් , බාහු , අත් , පියයුරු , ඉඟ , උකුළ , උදරය , පිට , කෙසුරක , තට්ටම් , පාද , අඩි ආදිය ;වෙන් වෙන් ව ගෙන දීර්ඝ වශයෙන් ඒවායෙහි ලක්ෂණ , ස්වභාවය , කාර්ය භාරය ගැන විමර්ශනය කරයි.

"ඔවුන්ගේ ශරීර භෞතික වශයෙන් ඔවුන්ගේ විශේෂ ක්‍රියා මාර්ගයනට ගැලපෙන සේ වෙනස් වන බව ඒ අයුරින් ම මනස ද වෙනස් විය. බොහෝ ගැහැණුන්ට වඩා පිරිමි උසින් වැඩිව වඩා ශක්තිමත් වූ අතර ඔවුනගේ මොළය ද කාර්යයනට ගැලපෙන සේ වර්ධනය විය. පිරිමි දඩයම සඳහා පිටත ගිය පසු ගැහැණු ගුහාවල දරුවන් පෝෂණය කරමින් සිටියහ." (චන්ද්‍රවංශ (පරි) ; 2005ඃ 25)

භෞතික ශරීර සහ මානසික ක්‍රියාවලිය අතර සබඳතා පවත්නා බවත් , එය පරිණාමීය ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් බවත් පැහැදිලි වේ.

ශ්‍රී ජීවනාථ හා භාව කුතුහලය

ජීවනාථ පඬිවරයා භාරතයේ මිථිලා පුර නම් බ්‍රාහ්මණ ග්‍රාමයේ විසූ බව කියවේ . කාලය පිළිබඳ නිශ්චිත නැත. ශතවර්ෂ කිපයකට පූර්වයෙහි බව අනුමාන කෙරේ. වේද වේදාංග, කාව්‍යලංකාර, වථ්‍යාකරණාදිය පිළිබඳ ප්‍රාමාණික දැනුමැත්තෙකි. ඔහුගේ විශේෂඥභාවය ජ්‍යෝතිර්විද්‍යාව ගණිතය හා තුන්කල් ඵල ප්‍රකාශක දෛව ශාස්ත්‍රය මගින් විශද විය. ජීවනාථ යථෝක්ත විෂයක්ෂෙත්‍රවලට අදාළව කෘති කීපයක් ඵලකර තිබේ . ඒ අතර තාජික දර්පණ, පාරාශරිවාසනා, වනමාලා ජල විචාර, ප්‍රශ්න චන්ද්‍රිකා ආදිය ගැන සඳහන් වේ. එකී ග්‍රන්ථ අතරින් මොහුගේ විශිෂ්ට කෘතිය " භාවකුතුහලය" යි. ඒ බැව් අදින් වසර එකසිය දොළහකට (112) පමණ පෙර එනම් 1904 පමණ කෘතියේ පරිවර්තක බී. ඇල්. සරණේලිස් වෛද්‍යාචාර්ය වරයා ග්‍රන්ථාවසානයේ මෙසේ දක්වයි. " භාවකුතුහලය ද්වදශාවස්ථාදී විශේෂාර්ථ රාශියකින් සම්පූර්ණ කරන ලද්දක් වූයෙන් මෙයින් ලැබිය හැකි ප්‍රයෝජනය නම් කාලයෙහි පරිචිත අන් කිසි ජ්‍යොතිෂ ග්‍රන්ථයකින් නොලැබිය හැකියි" (සරනේලිස් 1904 ඃ 267)

භාව කුතුහලයේ ශ්ලෝක 597 ක් පමණ ය. ඒවා විෂයානුබද්ධ අනු පරිච්ඡේද 16 කින් පමණ සමන්විත ය.

සංඥා , පිත්‍රාද්‍යරිෂ්ට , ජාතික චිහ්න , අරිෂ්ට , අරිෂ්ටභංග, පුත්‍රභාව විචාර රාජ යෝග , සාමුද්‍රිකා , ස්ත්‍රී ජාතක , කන්‍යාංග ලක්ෂණ , ද්වාදසාවස්ථාවිචාර , ද්වාදසාවස්ථාඵල කථන , බාලාද්‍යවස්ථා මකරාදී විචාර හා ද්වාදසභාව විචාර , දශානයන , ගර්විතාදිශා යනුවෙනි. මෙම පරිච්ඡේද අතරින් ප්‍රශ්තුත විමර්ශනයට යොදා ගනු ලබන්නේ සාමුද්‍රිකා යනුවෙන් හඳුන්වන පුරුෂ පක්ෂයේ යහසාධනයට අදාළ පරිච්ඡේදය සහ කන්‍යාංග ලක්ෂණ යනුවෙන් හඳුන්වන ස්ත්‍රී දේහ ලක්ෂණ අනුව ශුභා- අශුභ ඵල ප්‍රකාශනය යන පරිච්ඡේද දෙකයි. එම පරිච්ඡේදවල එන කරුණු ද ජ්‍යෝතිර් විද්‍යාවට අයත් ය. එහෙත් දේහ ලක්ෂණ විද්‍යාව හා නිර්වාචිකව ඒවායින් පළවන සන්නිවේදනය පරීක්ෂාවකට උත්සුක වන්නේ විමර්ශනයේ උපන්‍යාසයට අදාළ කර ගනිමිනි.

සාමුද්‍රිකා - (පුරුෂ දේහ සලකුණු)

භාවකුතුහලය කෘතියේ සාමුද්‍රිකාධ්‍යාය නම් පර්ච්ඡේදය ශ්ලෝක දොළහකින් (12) යුක්ත ය. එහි දක්වා තිබෙන්නේ පුරුෂ දේහ ලක්ෂණ පිළිබඳව ය. සියලුම දේහ ලකුණු වෙනුවට ඵල කථනයට අදාළ වන අංග ප්‍රත්‍යංග දැක්වීමට උත්සුක වේ. එහි තවත් විශේෂයක් වන්නේ පුරුෂයා රජෙක් , ප්‍රභුවරයෙක් , ධනවතෙක් , පණ්ඩිතයෙක් ආදී වශයෙන් උසස් තත්ත්වයකට පත්වන ශරීර සලකුණු පමණක් දැක්වීම ය.

ශරීරාංගය / අවයවය	සලකුණ/ චර්යාව	ගුණ ගැණ හා ප්‍රතිඵලය
1. අත්ල හෝ පතුල	රාජ සලකුණ	රාජ්‍යත්වයට පත් වීම
2. 1 මැදගිල්ල හා සුළැඟිල්ල අතර ඇඟිල්ල 11. මැදගිල්ල මුල සිට මැණික් කටුව තෙක්	1. පැහැදිලි රේඛා ලකුණක් 11. රේඛා ලකුණක් වැටීම	1. ශුභ ඵල අත් වේ 11. ශුභ ඵල අත් වේ.
3. මැදගිල්ල මුල සිට මැණික් කටුව තෙක්	පැහැදිලි උඩුකුරු රේඛාව කැඩී සිටියහොත් කෙමෙන් කුඩා වීම	වස්තු ලැබේ දුක්ඛාදි නපුරු ඵල වස්තු හීන වේ.
4. මාපට ඇඟිල්ල මැද	යව ඇටයක් වැනි රේඛාවක්	කාම සම්පත් , වස්තු සම්පත් කීර්තිය , පරම්පරා ප්‍රධානී
5. දකුණු අතේ මැද	මත්ස්‍යාකාර රේඛාව ඡත්‍රාකාර රේඛාව ඇත් ආකාර රේඛාව විලක ආකාර රේඛාව අකුස්සක් හෝ වීණාවක් පිහිටීම	රාජ ශ්‍රී ලැබීමට නියමිත ය. රාජ ශ්‍රීය , පරම්පරා ප්‍රධානී
6. දකුණු අත	දර්පණයක් , පර්වතයක් , කඩුවක් නඟුලක් , මල් මාලාවක්	ධනවත් වීම රාජ්‍ය ශ්‍රීය ලැබේ
7. අත්ල හෝ පතුල	රථ, චක්‍ර, දුනු, පියුම්, කොඩි,රථ ආසන, දෝලා, අශ්ව වැනි සලකුණු	ගෘහස්ථාන අලංකෘතවීම හා සමෘද්ධිය.
8. අත හෝ පය	ටැම් කලස් මිහිඟු බෙර, මාන දඬු, රුක්, අස්ව ආකර රූප	අලංකාර ශරීර පාණ්ඩිත්‍ය හෝ විනෝදයට බර වස්තු වෙළෙන්දෙක් වීම
9. නලල ඇස් හිස දෙඅත	පුළුල්ව පිහිටීම නෙළුම් පත්‍ර යේ පිහිටීම මනාව රවුම්ව පිහිටීම දෙදන තෙක් දික්ව පිහිටීම	රාජත්වයට , ප්‍රභූත්වයට පණ්ඩිත්‍යයට හෝ ධනවත් භාවයට පත්වේ .
10. නාභිය නාසය ළය පාද	විලක් සේ ගැඹුරු වීම රන් පැහැව , ඍජුව පිහිටීම රන් පෝරුවක් සේ පිහිටීම මද රත් පැහැව , මොළොක්ව පිහිටීම	නායකයෙක් බවට පත්වන අතර කරුණා , මෘදු මොළොක් ගුණ ඇත්තෙක් වේ.
11. අත්ල පතුල	තල කැලලක සලකුණු පිහිටීම	යාන වාහන සහිත ධනවතෙක් බවට පත්වීම

12. රාජ වංශ ප්‍රජානානාං - සමස්තං ඵල මිදෘශම්
අන්‍යෝ ෂා මල්පතාංයාති - තථා ව්‍යක්තං සුලක්ෂණම්

මෙහි කියන ලක්ෂණ වලට අදාළ සියලු ඵල , රජවරුන්ට සපුරා ලැබේ. අන්‍ය දරුවන්ට ඔවුනොවුන්ගේ ප්‍රමාණයට ලැබේ. එසේම රේඛා හෝ අංග ලක්ෂණ පැහැදිලිව පෙනෙන ප්‍රමාණයට අදාළ ශුභ - අශුභ ඵල ලැබේ.

පුරුෂ දේහ සලකුණු සහ ඒවාට අදාළ ඵලාපල හෙවත් ගුණාගුණ සංක්ෂිප්තව යථෝක්ත සටහනේ දක්වේ. ඒ අනුව අත්ල, ඇඟිලි හා එහි රේඛා පිහිටීම පිළිබඳ වැඩි අවදානයක් යොමු කරයි. මානව හස්ත, (ඉදිරිපස ගාත්) පරිණාමීය ක්‍රියාවලියේ දී විශේෂයෙන් සංවර්ධනය වූ අවයවයන් ය. මොළය සහ අත්ල මෙන් ම ඇඟිලි අතර සියුම් සබඳතා පවත්නා බව විද්වත් අවධානය යොමු වූවකි. කුඩා දරුවකුගේ හසුරු කෞශල්‍යතා වර්ධනය කිරීමේ දී අත්ලේ හා හස්තයේ ක්‍රියාකාරීත්වය බෙහෙවින් වැදගත් වේ. අතිශය සංවේදී සියුම් ස්නායු අග්‍ර ඊට සම්බන්ධිතව පවතී. මිනිසාගේ නිර්මාණශීලී චින්තනයට හා ක්‍රියාකාරිත්වයට අත්ලෙ හා ඇඟිලි බෙහෙවින් ම වැදගත් වේ. අත්ල මත පිහිටා ඇති රේඛා නිරීක්ෂණයත් ඒ සම්බන්ධ අර්ථ නිරූපනයත් වසර දහස් ගණනක් මුළුල්ලේ පවත්නා ගෙන එන ඥානමය දායාදයන් ය. එමගින් පුද්ගලයාගේ දුබලතා මගහැර ප්‍රබලතා මතුකර ගැනීමට අදාළ ධනාත්මක ආකල්ප සන්නිවේදනය කළ හැකි ය. එසේ ම හොඳ නරක ගුණා ගුණ විනිශ්චයක් ද එමගින් සිදුවේ. එය එක්තරා සදාචාර සන්නිවේදන සම්ප්‍රදායක් ලෙස හැඳින්විය හැකි ය.

එසේ ම නළල , ඇස් , හිස , නාභිය, නාසය ළය වැනි අංග පිළිබඳව ද දක්වා ඇත . අදාළ අවයවවල දිග, පළල, ගැඹුර, පැහැය , ස්වාභාවය , පිහිටා ඇති ආකාරය අනුව අදාළ ගුණාගුණ නිර්ණය වේ. තමා තුළ තමා පිළිබඳ යහපත් ආකල්ප උත්පාදනය කිරීම මගින් සාර්ථකව ජීවන අරමුණු සපුරා ගැනීමට අවශ්‍ය ධෛර්ය , ශක්තිය, අධිෂ්ඨානය වැනි ගුණාංග සන්නිවේදනය කෙරේ. කාමබෝගී ජීවිතයට අවශ්‍ය ධනය , වාසස්ථාන අඹු -දරු තනතුරු, උසස්වීම්, නායකත්වය ආදී සැපත් ලඟා කර ගැනීමට , ශරීර ලකුණුවල පිහිටීම කෙසේ බලපා ඇත්දැයි මෙහි දී දක්වේ. එම ලකුණුවලින් සන්නිවේදිත ගුණා ගුණ එලෙසින් ම ජීවිතය කෙරෙහි බලපාන බැව් කිව නොහැකි ය. එහෙත් මානව සමාජයේ පුරුෂයකුගේ ජීවිතය සාර්ථක කර ගැනීමට අදාළවන යම් පුරුෂාර්ථ පද්ධතියක් එමගින් සන්නිවේදනය කෙරෙන බව ප්‍රකට වේ.

කන්‍යාංග ලක්ෂණ විමර්ශනය (ස්ත්‍රී දේහ ලක්ෂණ)

භාවකුතුහලයේ ද අන්‍ය සාහිත්‍ය හා වෙනත් කෘතිවල මෙන් ස්ත්‍රී දේහ ලක්ෂණ දැක්වීමට වැඩි අවකාශයක් ලබාගෙන ඇත. එය ප්‍රමාණාත්මක වශයෙන් ශ්ලෝක සියයකට අධික ය. එය පුරුෂ දේහ ලක්ෂණවලට වඩා දස ගුණයකින් වැඩි සංඛ්‍යාවකි. මානව රසවාහිනිය ඇය යි. සෞන්දර්යේ හා කාමයේ ප්‍රතිමූර්තිය යි. එමෙන් ම පෙර අපර දෙදිග හා විශේෂයෙන් භාරතීය සාහිත්‍ය ශාස්ත්‍ර විද්‍යාවන්හි කාන්තාව වෙනුවෙන් වැඩි ඉඩ හසරක් වෙන්වීම විස්මයට කරුණක් නොවේ.

ශුභ ලක්ෂණ සම්පන්නා - භවෙදිහ යදාංගනා
කක්නරග්‍රහණාදේව වර්ධතේ - ගෘහිණාං සුඛං
ශුභා ශුභං පුරා ගීතං - වේදව්‍යාසේන ධීමතා
ප්‍රකාශ්‍යතේ තදේ වාත්‍ර නාරීණා මංගලක්ෂණම්

යනුවෙන් ඉඳුරන් ප්‍රිය උපදවන සුළු යම් ස්ත්‍රියක් යහපත් ලක්ෂණ ඇති වුවහොත් ඇය සරණ පාවා ගැනීමෙන් පුරුෂයාගේ සැප වර්ධනය වේ. එසේම වේදව්‍යාස ඍෂීහු විසින් ස්ත්‍රීන්ගේ අංග ලක්ෂණ වලින් ශුභාශුභ ඵල කී පරිදි මෙහි දක්වනු ලැබේ. ඒ අනුව විශ්වනාථයන් ද මෙහි දක්වනුයේ ඔහුටත් පෙර භාරතීය සමාජයේ පැරණි ඍෂිවරුන් විසින් පළකළා වූ ද වසර දහස් ගණනක් මුළුල්ලේ භාරතීය සමාජයේ ව්‍යවහාරයේ පැවතියා වූ ද කාරුණු සමුදායක් බැව් ප්‍රකට ය.

ශරීරාංගය / අවයවය /ස්ථානය	සලකුණ/ චර්යාව හෝ පිහිටන ආකාරය	ගුණා ගුණ හා ප්‍රතිඵල
1. පතුල (පාද තලය)	මොළොක් , බඳු වද මල් පැහැය , සම වූ මසින් උණුසුම්ව පැවතීම	යහ ගුණ ධර්ම රකී රාජ භාර්යාවකි
2. පතුල (පාද තල)	පියුම් , හක් ගෙඩි රථ ධජ චක්‍ර මත්ස්‍ය, තකුණු පිහිටීම	රාජ භාර්යාවකට පරිද්දෙන් ඉසුරු ලැබීමට හේතු වේ.
3. පතුල (පාද තල)	කුල්ලක හැඩැතිවඅඳුරු වර්ණ , වියළි කර්තෘ රළු ස්වභාවය	පින් නැති අයහපත් ගුණ ඇත්තියක වේ
4. පතුල (පතුල පිට)	අරුණ වර්ණව , කුංකම පැහැය ,ඉදුණු කෝවක්කා හෝ නෙළුමක පිට මෙන් මොළොක්ව නිර්මලව පැවතීම	උතුම් , පුන්‍ය වන්ත භාග්‍ය සම්පන්න තැනැත්තියකි.
5. මාපට ඇඟිල්ල (පය)	වටව උස්ව පිහීම	දුක් විඳිමට හේතු ය.
6. පා ඇඟිලි	එකිනෙක උඩ නැගී සිටින සේ පිහිටීම	ස්වාමියා නසන වේසා ස්ත්‍රියකි
7. පා සුලැගිල්ල	බිම නොගැටීම	හිමියා නසා සොර සැමියෙක් සරණ යයි.
8. අනාමිකා ඇඟිල්ල මැද ඇඟිල්ල	බිම නොගැටීම බිම නොගැටීම	හිමිවරු දෙදෙනෙක් ගනී හිමසිවරු තිළෙනෙක් ගනි
9. අනාමිකා ඇඟිල්ල මැදගිල්ල	කෙටිව පිහිටීම	ස්වාමියාගෙන් සැප අහිමිවීමට හේතු වේ
10. පා නිය පොතු	සිනිඳුව උස්ස තඹවන්ව රවුම්ව පිහිටීම	මහත් වූ බෝග සම්පත් ලැබීමට හේතු වේ .

11. පා ගමන	ඇවිදීමේ දී දූවිලි නැගීම	පුරුෂයන් තිදෙනෙක් නිසා සොර පුරුෂයකු සමඟ සතුටට පත් වෙන්.
12. පය	නැමීම අධික නහර නැගීම ලොම් සහිත වීම	දියුණු වීමට හේතු ය. යාචන ස්ත්‍රීයකි. දාසියක් වීමට හේතු ය.
13. පය මැද බොලට යුග්මය	මස් අඩුව පිහිටීම වටව නහර මතු නොවීම	පින් මද දුක් විඳින්නියකි. පිනැත්තියකි.
14.විලුඹ	සමව පිහිටීම මහත්ව පිහිටීම උස්ව පිහිටීම දික්ව පිහිටීම	පින් ඇති තැනැත්තියකි පින් නැති තැනැත්තියකි වේසා ස්ත්‍රීයකි රෝගී තැනැත්තියකි
15. කෙණ්ඩ	කෙසෙල් කඳක් වැනිව රෝම නැතිව , මස් වැඩී වටව , සින්දුව පිහිටීම	රාජ භාර්යාවක් හෝ එලෙස යසස ඇති වේ.
16. රෝම	එක සිදුරක එකක් පිහිටීම, දෙකක් පිහිටීම තුනක් පිහිටීම	රජ බිසවක් වීම සැප ඇත්තියක් වේ වැන්දඹුවකි.
17. දනහිස්	මස් වැඩී වටව පිහිටීම කෙට්ටු අස්ති මද වී පිහිටීම	ශුභ ඵලදායි වේ අශුභ ඵල ගෙන දේ
18. උකුල / නිතඹ	උකුල අගල් 24 ක් පමණ හා නිතඹ වටව පිහිටීම	රජ ඉසුරු ලැබීමට හේතු වේ
19. උකුල	වැහැරී, නැමී, දික්ව, කුඩාව ලෝම සහිතව පිහිටීම	කණ වැන්දුම් වීමට හේතු වේ
20. නිතඹ	බිම්බාකාරව, උස්ව, පළල්ව මස් සහිතව පිහිටීම	කාම සැප ලබා දෙන්නකි
21. යෝනිය	ඇත් උරහිසක් , කුසුඹු පිඩක් සේ පිහිටීම	උසස් අයට කම් සැප ලබා දෙන්නියකි
22. භගස්ථලය	වම් පස උස්වීම දකුණු පස උස්වීම හා පළල්ව දැඩි වී නිර්මල පියුමක් සේ දිස් වීම	ගැහැණු දරුවන් වදන්නියකි. පුත්‍ර සම්පතක් ලැබීමට හේතු වේ
23. යෝනිය	බෝපතක් හෝ මුව කුරයක් හෝ ඇතකුගේ කන්මුලත්ළ වැනී වීම	සුභදායක පිහිටීමකි

24. යෝනිය	අවුල් වූ ලෝම , දැකීමට අපහසු විකෘති ම්ව සහිතව මහත්ව පිහිටීම	පුරුෂ ක්‍රීඩා සතුට පිණිස හේතු වේ
25. යෝනිය	සැවක් මෙන් රැළිවැටි වක් වී පිහිටීම	දරුවන් දැරීමට අසමත් බවයි
26. යෝනිය	වේපතක් උණ පතක් වැනීව හිස් කබලක් වැනිව පැතලිව එල්ලෙමින් විකෘතිව, ඇත් ලොම් වැනි ඝණ ලොම් සහිත බව	ශුභ නොවන පිහිටීමකි
27. උකුලේ පූර්වභාගය	මොලොක්ව, රෝම සහිත පිහිටීම උස්ව, පළල්ව දීප්තිමත් වීම	පින් ඇති වේ ප්‍රියාදර වේ
28. ජඝනය	මස් අධිකව , ලොම් දකුණට කැරකැවී කැඩී සිටියහොත්	ශුභ ඵල ඇති වේ අශුභ ඵල සහිත වේ
29. ජඝනය	මස් සහිත වක් රළු ඉතාමහත් ඉතා දික් වීම	කණ වැන්දුම් බව ඵල කරයි පින් නැති බව ඵල කරයි
30. වස්තිය	මොළොක්, මහත් උස් පිහිටීම රේඛා සහිත ලොම් පිරී නහර මතු වී තිබීම	යහපත් ඵල රහිතය අශුභ ඵල ඇති කරයි
31. නැබ	දකුණට කර කැවීම උස් වූ , ගැටයක් සහිත වමට කැරකැවීම	සැප වඩන්නිය වේ අශුභ ඵල පළ කරයි
32. උදර (බඩ)	පුළුල්ව පිහිටීම මැඩියකුගේ වැනි පිහිටීම දික් වූ පිහිටීම	විසල් දරු සම්පත් සහිතය නර ස්වාමියකු බිහි කරයි බලැත්තකු බිහි කරයි
33. උදර (ඩ)	උස්ව පිහිටීම තද වූ ගල් වූ පිහිටීම	වඳ ස්ත්‍රියක් වේ ගැබ් හෙලන්නියක් වේ
34. උදර (බඩ)	ලෝම සහිත වීම මොළොක් වූ සම වූ මස් කැඩුනා වූ පිහිටීම	දාසියක් වේ යහපත් ගති සහිත වේ
35. උදරය	මොළොක් වූ මුදුන් වූ ඉතා වැහැරුණු පිහිටීම	දරු සම්පත් ඇත්තියකි කාමය වඩවන සැප හා සතුට ඇත්තියකි

36. උදර (බඩ)	කලයක , මිහිඟු කවරයක යව ඇටයක ස්වරූප සහිතව පුසුල් ඵල හෝ මහත් ප්‍රකාර වැනි දැඩි පිහිටීම	අයහපත් ඵල සහිත දරුවන් නැති තැනැත්තිය යහපත් නොවේ
37. උදර (බඩ)	බඩේ රැල ඇඳ නැති වීම සිහින්ව , තුනක් පිහිටීම පිඟුවන් වකුටුව හෝ තුනීව පිහිටීම	සතුට උපදවන්නියකි අයහපත් වූ තැනැත්තියක් වේ
38. ළය	ලොම් නැතිව සමව දික්ව පිහිටීම	සියළු සැප විඳිමට පැමිණ දෙවනුව වියෝග ඇත්තියක් වේ
39. ළය	උඩට බිඳුණු ලොම් සහිත පලල් වූ පිහිටීම අගල් 18 ක පමණ පිහිටීම ලොම් වූ විෂම වූ	ස්වාමියා නසයි වෙසඟනකි සැප ඇත්තයකි සැප නැත්තියකි
40. ළය	උස් වූ පිරුණු නොපිරුණු පලල් වූ පාත් වූ පිහිටීම	යහපත් තැනැත්තියකි පින් නැත්තියකි
41. පියයුරු	සමව, දැඩිව ගණව වටව පිහිටීම	ස්වාමියාගේ කාමය වර්ධනය කරන්නියකි
42. පියයුරු	තුනී, සියුම්, මහත් දකුණු පස උස්වීම වම් පියයුර උස්වීම පලල් වූ මහත් වූ මුඛ සහිත වීම	අයහපත් තැනැත්තියකි පිරිමි දරුවන් ඇත්තියකි ගැහැණු දරුවන් බිහි කරයි අයහපත් චරිත ලක්ෂණ සහිතය
43. පියයුරු	මුල මහත්ව ක්‍රමයෙන් සිහින්ව , අග තියුණු වීම	පළමුව සැප ඇතිව පසුව ඉතා දුකට පත් වේ
44 . උරහිස	නැමුනු ස්වභාවය කොට වූ පිහිටීම මස් වැඩුණු පිහිටීම	දරුවන් ඇත්තියකි සැප ඇත්තියකි කාම , සුරති , සැප ඇත්තී
45. උරහිස	මහත්ව වකුටු උවහොත් ලොම් සහිත වීම	කාමයෙන් අන්ධ වෙයි කන වැන්දුම් වෙයි
46. උරහිස	දැඩි වූ හෙලුණා වූ උස් මස් සහිත පිහිටීම	පින් ඇත්තියකි වැන්දඹුවකි.
47. අතේ මහපට ඇඟිල්ල	පියුම් කැකුළු වැනි වීම	බොහෝ සැප ඇත්තියක් වේ
48. අත්ල	පියුමක් සේ මොළොක්ව උස්ව පිහිටීම	කාම සැප වඩන්නියකි

49.අත්ල	පිරිසිදු රේඛා සහිත බව රේඛා නැති මද රේඛා සහිත අධික රේඛා ඇත්තී	යහපත් ගති සහිතය අයහපත් තැනැත්තිය වැන්දඹු වේ
50. අත්ල පිටි අල්ල	නහරින් වැඩුණු හොත් උස්ව පිපුනාක් වැනි වීම	දිළිඳු ස්ත්‍රියක් වේ යහපත් තැනැත්තියකි
51. පිටි අල්ල	ලොම් වැඩී ගැඹුරුව මස් වැඩී පැවතීම	කනවවැන්දුම් භාවයයි
52. රේඛා ලකුණු (වම් අත)	ගැඹුරු රතු , මොළොක් පැහැදිලි රේඛා ලක්ෂණය වට වූ රේඛා සහිත බව මත්‍යාකාර රේඛා ස්වස්ථික රේඛා	යහපත් තැනැත්තියකි ස්වාමියා සැප ඇත්තෙකි පින් ඇති ස්වභාවයයි බලැති පුත්‍ර සම්පත්තිය
53. වම් අත්ල	පියුම් ලකුණු පිහිටීම	උතුම් රාජ භාර්යාවක් වන අතර මිනිස් පාලනයට පුතුන් ලබයි
54. වම් අත්ල	දකුණට කැරකැවුණු නන්ද්‍යා වර්ණ ලකුණක්	සක්විති රාජ භාර්‍යාවක් වීමේ භාග්‍ය
55. වම් අත්ල	ඡත්‍ර , ඉදිබු , හක්ගෙඩි ආකාර සහිත රේඛා	ගුණවත් ය. පති දහම් ඇත්තියකි. රාජ මාතාවක් විය හැකි ය.
56. වම් අත්ල	තරාදියක හෝ මාලාවක ආකාර රේඛා	යස ඉසුරු සහිත ව්‍යාපාරිකව දියුණු කාන්තාවක් වීමේ භාග්‍ය
57. වම් අත්ල	ඇත් , අස් ගව ආකාර රේඛා පිහිටීම ප්‍රාසාද හෝ වජ්‍ර ලකුණු සහිත රේඛා	ඤාණවන්ත වීමේ හැකියාව යහපත් ගුණවත් අයෙකි
58. වම් අත්ල	හෙණ්ඩු චාමරයක දුන්නක රේඛා පිහිටීම යානාවක ආකාර රේඛා	රාජ බිසවක වීමේ භාග්‍යයක වාණිජ ව්‍යාපාරික කාන්තාවක් වීමේ භාග්‍යය
59. වම් අත	මාපට ඇඟිල්ල මුලසිට සුලැඟිල්ල තෙක් රේඛාවක්	ස්වාමියා නසන්නියකි
60. වම් අත	කඩු, යගදා, කුන්ත යුධ ශූලායුධ මිහිඟු බෙර කුක්කුට මෘග ආකාර රේඛා පිහිටීම	මහත් ඉසුරු සහිත ධනැත්තියක්

61. වම් අත	වෘක , මැඩි , ගෝනුසු සර්ප සිවල් කොටලු පලඟැටි බලල් ඇත් පැටව් , ආකාර රේඛා පිහිටීම	අධික රෝගාබාධ සහිත තැනැත්තියකි
62. අතැඟිලි	මොළොක් , පිරුණු ඇනැති මාපට ඇඟිල්ල හා දිග පිරුණු පිට ලොම් ඇති පැතලි , කෙට්ටු , කොට හැකුළුණු පුරුක් සහිත පුරුක් වැඩි , උස් ඇඟිලි	යහපත් තැනැත්තියකි රෝග ඇත්තී බිය ගෙන දෙන්නී අයහපත් වූ තැනැත්තී
63. අතේ නියපොතු	හක් කැබලි වැනි, වලවැදි අවර්ණ කිඹුල් වන් ,වකුටු , රළු නිය	අශුභ ගෙනදේ සැප විනාශ කරන්නියකි
64. අතේ නිය	සුදු පැහැති බින්දු මතු වීම	අධික කාමාශාවෙන් පර පුරුෂ සේවනයෙහි යෙදෙන්නියකි.
65. පිට	මස් සහිත ඇට මතු නොවූ ලොම් අධිකව පිහිටි	හිමියාට ප්‍රිය වේ වැන්දඹුවක විය හැක.
66. පිට	නහර සහිතව නැමී බිඳුණු පිට ඇද නැති ,මස් සහිත උස් වූ	දුක් විඳින්නියකි උතුම් යහපත් ස්වාමි ප්‍රිය ස්ත්‍රිය
67. ගෙල	පිරුණු මනහර වට වූ අඟල් සතරක් පමණ වුවහොත්	ස්වාමියාට ප්‍රිය තැනැත්තී
68. ගෙල	මස් වැඩී අස්ථි සැඟවුණු රේඛා තුනක් සහිත දැඩි වූ	යහපත් තැනැත්තියකි (මීට ප්‍රතිවිරුද්ධ ලක්ෂණ ඇත්නම් අයහපත් තැනැත්තියක් වේ)
69. ගෙල	මහත්ව පිහිටීම රත් පැහැ පිහිටීම පලල්ව පිහිටීම සිහින්ව පිහිටීම	හිමියා පිට කරන ලද්දී දාසියක් වීමේ ලක්ෂණ ස්වාමියා නැති අයෙකි වස්තු හීන ඇත්තියකි
70. හනු	හීන මොලොක් රෝම නැති ලොම් නැති වකුටු වූ වැහැරුණු ඉතා මහත්	යහපත් තැනැත්තියකි අයහපත් ගති ඇත්තී
71. කොපුල් (කම්මුල්)	වටව මස් සහිතව උස්ව සහ මොළොක්ව පිහිටීම	යහපත් වූ තැනැත්තියකගේ ලක්ෂණ
72. කොපුල් (කම්මුල්)	මස් අඩු රළු ලොම් ඇති වකුටු වූ	අයහපත් වූ තැනැත්තියකි

73. තොල් (යටි)	වටව සිනිඳුව රේඛාවලින් යුතු බඳුවද මලක් සදිසිව පැවතීම	අතුමන්ට ප්‍රියවන තැනැත්තියක් වේ
74. තොල්	රළුව එල්ලෙන සුළුටව හැකිලුණු මස් සහිතව පැවතීම කළු පැහැව පිහිටීම	පින් නැත්තියකි වැන්දඹුවක් වේ
75. දත්	දෙතිසක්ව උඩු යටි ඇඳිවල ස්ථානව බෙදී කුඩා කිරි පැහැව පිහිටීම	පින් ඇත්තියකි
76. දත්	කහපැහැති හෝ කළු පැහැතිව මහත්ව සක් කැබලි සේ තුනීව පිහිටීම	පින් මද තැනැත්තියකි
77. දත්	(යටි ඇන් ද) දත් වැඩිව පිහිටීම විකෘති හෝ උස් වූ දත් තුනී දත්	මවගෙන් වෙන් වේ දුක් විඳින්නියකි වැන්දඹුවකි හිතුවක්කාර ගති ලක්ෂණ ඇත්තියකි
78. දිව	මොළොක්ව රතුව හෝ සුදුව ඇද නැතිව පිහිටීම මහත් වූ අග පලල් වූ මැද හා විකෘති වීම	යහපත් තැනැත්තියකි සැප නැත්තියක වේ
79. දිව	මද නිල් පැහැ වීම මහත් වීම එල්ලෙන සුළු වීම	කලහ ඇත්තියකි දිළිඳු වේ නොකැයුතු දේ කන්නියකි
80. තල්ල	රත් පියුමක් සේ මොළොක්ව පිහිටීම කසාවත් වුවහොත් කළු වුවහොත්	යහපත් වේ ශ්‍රවණ ජීවිතයට අවතීර්ණ වේ වැන්දඹුවක් වේ
81. තල්ල	මද නිල්වන් වීම රළුතල්ලක් සහිත වීම වකුටු වූ තල්ල විශාල තල්ල	දරුවන් නැත්තියකි දුක් ඇත්තියකි කලහයට කැමති පින්මද තැනැත්තියකි
82. තලු දිව	සියුම්ව ඇරුණුවත්ව මහත්ව පිහිටීම ඉතා මහත්ව කළුවන්ව එල්ලෙන සුළු නම්	ශුභදායක වේ අයහපත් , අශුභදායක වේ

83.නාසය	කුඩා සිදුරු සහිත වීම සමව වටකුරු නාස් පුඩු මහත් අග්‍රය මැද නැමුන	ශුභ ඵල දේ අශුභ ඵල ගෙන දේ
84. නාසය	රතු වූ අග ඇත්තා වූ වක් නාසය පැතලි වූ නාසය එල්ලෙන නාසය	වැන්දඹු බව ඵල කරයි දාසියකගේ ලකුණු ය. කලහයට ප්‍රිය ඇත්තී
85. ඇස්	රතු වූ කෙළවර ඇතුළත කළු වූ තාරකා ඇති සුදු වූ ශුක්ල මණ්ඩල මොළොක් කළුවන් ඇසි පිය	යහපත් ගති ඇති තැනැත්තියකි
86. ඇස්	උස් වූ ඇස් වට වූ පිරුණු ඇස් එළු හෝ මී දෙන් වැනි උස් වූ ඇස්	මන්දායුෂ්ක වේ යහපත් කුලයන් කරා පැමිණේ පින්නැත්තියකි
87. ඇස්	මීයන්ගේ කොබෙයියන්ගේ වැනි ඇස් වල වැදුණු ඇස් රතු වූ ඇස්	නපුරු ස්වභාව සහිත කාමාසා අඩු අයෙකි ඉතා නපුරු අයෙකි ස්වාමියා නසන්නියකි
88. ඇස්	බලල් වැනි හස්ති වැනි ඇස් දකුණැස වපර වීම වම් ඇස වපර වීම	උග්‍ර කාමාසා සහිතය කුල නාසිකාවකි වඳ තැනැත්තියකි පුරුෂයන් වෙත යන්නීය
89. ඇසිපිය	මොළොක් කළු ඝන සැහැල්ලු පිහිටීම	ස්වාමියාට ප්‍රිය උපදවන යහපත් තැනැත්තියකි
90. ඇසිපිය	ලොම් අඩු තුනී එල්ලෙන කපිලවන් මහත් වූ	පර පුරුෂයන් වෙත යන්නීය
91. ඇසිපිය	වට වූ මොළොක් වූ මද නිල්වන් දුනු වැනි මෘදු ලොම් ඇති	කාම රාග උපදවන තැනැත්තියකි
92. ඇසි පිය	පිඟුවන් තුනී වූ මහත් ඇද නැති දික් ලොම් ඇති හෝ ලොම් නැති	අයහපත් ඇවතුම් පැවතුම් ඇත්තියකි.
93. කන්	එල්ලෙන වට වූ කන් නහර වැඩුණු වැහැරුණු කන් සිදුරු නැති	යහපත් තැනැත්තියකි ගර්භාවට ලක් වන්නියකි

94. නලල් තලය	උස්ව අඟල් තුනක් පමණ මොළොක්ව අඩ සඳ වැනි වීම	යහපත් තැනැත්තියකි
95. නලල් තලය	ස්වස්ථික රේඛාවකින් බැබලීම දික්ව පිහිටා නම් ලොම් ඇත්තේ නම්	ජන හා බෝග ඇති කරන්නයකි ස්වාමියාගේ සහෝදරයන් නසන්නියකි නිතර රෝග දෙන්නේ වෙයි
96. කෙස් වැටිය	ඇතකුගේ කුම්බස්තල වැනි මනා උස් වූ කොලොම් එලයක් වැනි	බොහෝ ධන ධාන්‍ය ලබන්නියකි.
97. කෙස් වැටිය	පිරුණු ලෙස පිහිටීම එල්ලෙන කෙස් වැටිය	නින්දිත පුරුෂ සේවනයේ යෙදෙන්නියකි කුලය හා සියල්ල නසන්නියක් වේ
98. හිස කෙස්	මී මැසි පෙළක පැහැයෙන් වකුටුව නැමුණු අග්‍ර ඇති තුනී පිඟුවන් මහත් වූ ඉතා සැහැල්ලු	යහපත් තැනැත්තියකි වඳ දුක් සහිත වැන්දඹු තැන්තියකි

මෙකී ශරීරවයව හා ඒ ආශ්‍රිත ලක්ෂණ මෙන් ම එලාපල දැක්වීමෙන් පසු තිලක ලක්ෂණ හෙවත් ලප කැලැල් ඒ ඒ ස්ථානවල පිහිටීමේ යහපත් අයහපත් ලක්ෂණ දක්වයි. එයින් පසු උතුම් ස්ත්‍රීන් දැකීම ඇසුරට පත්වීමේ ශුභාශුභ ලක්ෂණ ද දක්වයි. එසේ යහපත් ශරීර ලක්ෂණ සහිත ස්ත්‍රී ආත්ම බව පෙර කරන ලද පුණ්‍ය මහිමයෙන් හිමිවන්නක් බව පෙන්වා දෙයි. මේ සඳහා ශ්ලෝක 108 සිට 130 දක්වා ප්‍රමාණයක් දක්වා ඇත. ඒවා අප විමර්ශනයට ඍජුව බද්ධ නොවන බැවින් අර්ථ පරීක්ෂාවක් කර නොමැත. දේහ ලක්ෂණ දක්වන අතර වුව ද ලාලිත අලංකාර ස්ත්‍රීය පිළිබඳ දක්වා තිබේ.

" භායති චෙදනිමිලිත ලෝචනං
ශුභ දාශං දර ථුල්ලකපොලකම්
අල මලක්ෂිත දන්ත මුදීරිතං
පති හිතං සතතං සමිත මුත්ත මම් "

නොහැකිලෙන ලද ඇස් ඇති වූ ද මදක් පිපුණු කොපුල් ඇත්තා වූ ද වැසුණු දත් ඇති සිනාසෙන සුළු ස්ත්‍රීය ස්වාමියාට ප්‍රිය වන බව පෙන්වා දෙයි. (සරනේලිස් ; 1904 ඃ 139)

එසේම පරිච්ඡේදය අවසානයේ කන්‍යාංග ලක්ෂණ හෙවත් ස්ත්‍රී දේහ ලක්ෂණ ජීවනාථයන් දක්වන්නේ කුමන මූලාශ්‍ර ඇසුරින්දැයි පෙන්වා දෙයි.

" ජීවනාථ විදුෂාත්‍ර කාමිනී
ලක්ෂණං බුධ මනෝ මුදේ මයා
ස්කන්ද කුම්භ භවයෝර්වාද ජං
ව්‍යාස ගීත මබිලං ප්‍රකාශිතම් "

ස්කන්ද කුමාර අගස්ති ඍෂි යන දෙදෙනාගේ විවාදයෙන් උපන්, ස්ත්‍රීන්ගේ ශුභාශුභ ලක්ෂණ විභාගය ව්‍යාස ඍෂිහු විසින් මෙහි ප්‍රකාශ කරන ලද්දේ ය. යන අදහසයි (සරනේලිස් ; 1904 ඃ 156)

ස්ත්‍රී සිරුරේ පාද තල හෙවත් පතුලේ සිට කේසාග්‍ර දක්වා සියුම් නිරීක්ෂණයන්ට ලක් කරයි. ඇතැම් සංවේදී ස්ථාන සම්බන්ධ ලක්ෂණ හා ඵල දැක්වීම තරමක් විස්තරාත්මක ලෙස සිදු කරයි. පතුල , යෝනිය , උදර , පියයුරු , අත්ල , තොල් ඇස් වැනි ශරීරාංග එසේ වැඩි අවධානය යොමු වූ ස්ථානය සාහිත්‍යයේ සෞන්දර්ය විෂය වුව ද මෙම ශරීරාවයව වැඩි වර්ණනාවට ලක්වේ. එසේ ම ස්ත්‍රී සිරුරේ අතිශය රසාලිප්ත සංවේදී කලාප වන්නේ ද මේවා ය.

නිගමන හා සමාලෝචන

වසර හාර පන්සියයකට පෙර භාරතීය සමාජයේ ස්ත්‍රිය හා පුරුෂයා පිළිබඳ , දේහ ලක්ෂණ පදනම් කරගත් තොරතුරු ඇතුළත් භාවකුතුහලය නම් කෘතියේ ප්‍රශ්තුත පරිච්ඡේද දෙකක් අපගේ කේන්ද්‍රිය විමර්ශන භූමිය විය. එම ලක්ෂණ භාවකුතුහලයේ ලේඛනාරූඪ වීමට ප්‍රථම වසර දහස් ගණනක් සමාජ ව්‍යවහාරයේ පැවති ඒවා බව ජීවනාථ විසින් ම දක්වන අවස්ථා පවතී. පොත පත කියවා ගැනීමට ලේඛන අක්ෂර වචන හා ඒවායේ සම්මතාර්ථ දත යුතු ය. එනම් සාක්ෂරතාවක් (A Literacy) අවශ්‍ය වේ සිනමා පටයක් රූපවාහිනි සංදේශයක් මනාව කියවා ගැනීමට සිනමා - රූපවාහිනී මාධ්‍ය සාක්ෂරතාව (Media Literacy) තිබිය යුතු ය. එසේ ම සමාජයේ පුද්ගලයින් කියවා ගැනීමට ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණ , චර්යා සම්බන්ධතා විලාස ආදිය ඇතුළත්, සාක්ෂරතාවක් අවශ්‍ය ය. පැරණි සමාජ ව්‍යවහාරයේ ස්ත්‍රීන් - පුරුෂයින් කියවා ගැනීමට අදාළව යොදාගත් දේහ ලක්ෂණ හා ඊට සම්බන්ධ ඵලා ඵල කථනය එක් ක්‍රමවේදයකි. මෙම ක්‍රමය හිතලුවක් හෝ මිත්‍යාවක් නොවේ. පාදාන්තයේ සිට කේසාන්තය දක්වා මිනිස් සිරුරේ බාහිරට විවෘත වූ අංග සියුම් ලෙස පරීක්ෂාවට ලක්කරයි. මෙයින් මනෝ විද්‍යාත්මකව ජීවවිද්‍යාත්මකව, රසායනික විද්‍යාත්මකව හා සමාජ විද්‍යාත්මකව කායික අංග ලක්ෂණ හා ගුණාගුණ පිළිබඳ විමර්ශනය කළ හැකි ය. ජීවනාථ ට පෙර ජීවත් වූ ඍෂී හූ ඉතා සියුම්ව, ගැඹුරු අවධානයෙන් ස්ත්‍රී හා පුරුෂ සිරුරු පරීක්ෂාවට ලක්කර ඇත . ඔවුන් යහපත් අයහපත් , ගුණාගුණ හොඳ - නරක ශුභ - අශුභ වැනි විනිශ්චයන් සිදු කරන්නේ තත්කාලීන සමාජ සාරධර්ම හා පිළිගැනීම් මත පිහිටා ය. ඒවා කාලානුරූපව වෙනස් විය හැකි ය. ඇතැම් ආගමික සංස්කෘතික හා සදාචාරාත්මක ප්‍රමිතීන් හා නිර්ණායක ද ඒ සඳහා හේතු විය.

ස්ත්‍රී - පුරුෂ ශරීරාංග ශුභ හෝ යහපත් පාර්ශවයේ පිහිටි අයකුගේ ජීවිතය වඩාත් උසස් වින්දනයකින් සමන්විත වේ. එය ජීවිතයේ අර්ථ, ධර්ම හා කාම යන ත්‍රිවිධ සම්පත් ලඟා කර ගැනීමට හේතුවකි. ජීවිතය වයසින් මුහුකුරා යත්ම, වියපත් වෙත් ම මෙකී සංවේදී, වින්දනීය ශරීරාවයව වල

කාලානුරූප වෙනස්වීම , උපේක්ෂා සහගත ලෙස දැකීමෙන් මෝක්ෂ යන උතුම් සම්පත්තිය ලඟා කර ගැනීමට ද හැකි වේ.

වාත්ස්‍යායනගේ කාම සූත්‍රයේ වුව ද ස්ත්‍රී - පුරුෂ ශරීරාංග මෙතරම් සවිස්තරාත්මකව පරීක්ෂාවට ලක්කර නැත . ඔහුගේ අවධානය උසස් වින්දනීය ලිංගික ජීවිතයකට අදාළව , ලිංගික චර්යාවන්හි නිරතවන ආකාරය පිළිබඳව ය. එහි දී සිව් සැට කාම කලාවන් ආදිය පිළිබඳව කරන විග්‍රහයන් ද වැදගත් වේ. දේහ ලක්ෂණ විද්‍යාව ස්ත්‍රී - පුරුෂ ලිංගිකයන් තේරුම් ගැනීමට උත්සුක වන ආකාරය පිළිබඳ ඩෙස්මන්ඩ් මොරිස්ගේ පර්යේෂණ ඔස්සේ මෑත භාගයේ ප්‍රබල අවධානයක් යොමු වේ. නිරුවත් වානරයා හා නිරුවත් ගැහැණිය යන කෘති දෙක එහිලා වැදගත් වේ. එහි දී වෛද්‍ය විද්‍යාව ඇතුළු අනෙකුත් විද්‍යාවන් ආශ්‍රිතව සහ සංස්කෘතිය , කලාව මෙන් ම ආගම ආදිය පදනම් කරගෙන ස්ත්‍රී - පුරුෂ දේහ ලක්ෂණ විමර්ශනය කරයි. මොරිස් සහ ජීවනාථ , ස්ත්‍රී - පුරුෂ ශරීරාංග විග්‍රහ කරන්නේ පදනම් දෙකක සිටිමිනි. එහෙත් මොරිස්ට වසර හාරපන්සියයකට පෙර ජීවනාථ ඉතාම සූක්ෂම ලෙස කරන විමර්ශනය බැහැර කළ නොහැකි ය.

සාම්ප්‍රදායික ඥානමය උරුමයන් සොයායාම නූතන සන්නිවේදන පර්යේෂණවල ප්‍රමුඛ ක්ෂේත්‍රයකි. දේහ භාෂාව , මුහුණේ සන්නිවේදනය ඇස් සබඳතා අංග චලන , අභිනයාදී ක්‍රම ස්ත්‍රී-පුරුෂ දේහ ලක්ෂණ සමඟ බද්ධවන සන්නිවේදන ක්‍රමයන් ය. ඇස් උපයෝගි කරගෙන සවිඥානිකව හිතා මතා යම් සන්නිවේදනයක් කළ හැකි ය. එසේ ම ඇස්වල පිහිටීම , පැහැය , ස්වභාවය හසුරුවන විලාශය ආදිය මගින් යම් සන්නිවේදනයක් සිදුවිය හැකි ය. අනෙකුත් අවයව ආශ්‍රිත තත්ත්වය ද එසේ ය. දේහ ලක්ෂණ මගින් සිදුවන සන්නිවේදනාර්ථ පිරික්සීම ද ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශවය විවිධ පැතිවලින් කියවා ගැනීමටත් තේරුම් ගැනීමටත් හේතු වේ . එසේ ම සමාජීය ජීවිතය සාර්ථකව ගොඩනගා ගැනීමට අවශ්‍ය පරිචයන් , මෙවැනි ඉපැරණි ඥාණමය කෝෂ්ටාගාරයක් පරීක්ෂා කිරීමෙන් ද ලබාගත හැකි බව නිගමනය කළ හැකි ය.

මූලාශ්‍ර

1. ආරියපාල ඇම්. බී (2004) ; කවිසිළුමිණ හෙවත් කුසදාවත , එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
2. කොඩිකාර පසන් (පරිවර්තන) (2011) ; නිරුවත් ගැහැණිය , සරසවි ප්‍රකාශකයෝ , නුගේගොඩ.
3. චන්ද්‍රවංශ ආරියරත්න (පරි.) , (2005) ,පිරිමි සහ ගැහැණු මෙතරම් වෙනස් ඇයි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය , කොළඹ.
4. ජයසුමන . එච්. ජී. සංස්කෘත සාහිත්‍ය ප්‍රවේශය , රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
5. ජාතක පොත් වහන්සේ ; සංස් ඃ (1995) දෙ. ක. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
6. බටුවන්තුඩාවේ රොබර්ට් (සංස්ඃ) ,ගුත්තිල කාව්‍ය , රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
7. රත්නමාලා දිලුම් එම්. එච්. ඒ. (2014) සම්භව්‍ය සිංහල ගීකාව්‍ය බපිළිබඳ ස්ත්‍රී - පුරුෂ සමාජභාවී අධ්‍යයනයක් , එස්. ගොඩගේ සහෝදරයෝ , කොළඹ.
8. සරනේලිස් . බී . ඇල් (පරි) - (1904) භාවකුතුහලය , ඇම්. ඩී. ගුණසේන සමාගම , කොළඹ.

13

භාෂා භාවිතයේ පවතින ජීව විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ බෞද්ධ දාර්ශනික පර්යාවලෝකනය

සමන් රාජපක්ෂ

හැඳින්වීම

ඥාන වර්ධනය, රසජනනය, සාමූහිකත්වය ආරක්ෂා කරගැනීම හා ප්‍රජනනය සඳහා මානවයා සන්නිවේදනයේ යෙදෙයි. මේ සඳහා මානවයා උපයෝගී කර ගනු ලබන ප්‍රධාන මෙවලම වන්නේ භාෂාවයි. එබැවින් මානවයා ස්වකීය පැවැත්මේ පහසුව සඳහා මෙතෙක් භාවිතයට ගත් මෙවලම් අතරින් වඩාත් විශිෂ්ට නිෂ්පාදනය වන්නේ භාෂාව යැයි දැක්වේ. ඒ අනුව භාෂාව වනාහි ඓශ්වර්යමත් සන්නිවේදන මෙවලමකි. එය සන්නිවේදනයේ ද, සංස්කෘතියේ ද පදනම වශයෙන් ගත හැකි මෙවලමකි.

ඒ අනුව සන්නිවේදනයේ අනේකවිධ අභිප්‍රායන් සපුරා ගැනීමේ දී එහි මූලිකාංග හඳුනාගත යුතු ය. මෙහිදී මාහැඟි සන්නිවේදන මූලිකාංගයක් වන භාෂාවේ පවතින ජීවවිද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම කාලෝචිත වූවකි. මේ පිළිබඳව පෙර අපර දෙදිග අධ්‍යයන සම්ප්‍රදායන්හි විද්වතුන්ගේ විචාරක්ෂිය යොමු වී ඇත. නමුත් භාෂා භාවිතයේ ජීව විද්‍යාත්මක ලක්ෂණ සමග සම්බන්ධ දාර්ශනික දෘෂ්ටිවාද ඇසුරින් සිදු කළ සන්නිවේදනාත්මක අධ්‍යයන ප්‍රශස්ත මට්ටමක නොපවතියි. බුදුදහම මගින් භාෂාවේ ස්වභාවය දාර්ශනික, සමාජ මනෝ විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක ලක්ෂණ න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව ක්‍රමානුකූල ලෙස විමර්ශනය කර ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ මූලික අභිප්‍රාය වන්නේ භාෂා භාවිතයෙහි ජීවවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව බෞද්ධ දාර්ශනික දෘෂ්ටිය විමර්ශනය කිරීමයි.

භාෂා භාවිතයේ ජීවවිද්‍යාත්මක ප්‍රවේශය

බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතුරෙන් කිහිපයක මුඛයෙහි ජීව විද්‍යාත්මක පිහිටීම සහ උන්වහන්සේගේ හඬෙහි ශබ්ද විද්‍යාත්මක ස්වරූපය පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙම ගුණාංග ඍජු ලෙස බුදුරජාණන් වහන්සේගේ බස හැසිරවීමේ නිපුණතාව සමග සම්බන්ධ වේ.[1] දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතුරෙන් මුඛය හා ස්වරය සම්බන්ධයෙන් වෙන් වූ ලක්ෂණ කිහිපයක් දැක

ගත හැකි ය. ජීව විද්‍යාත්මකව මුඛයේ පිහිටීම ස්වර උච්චාරණය සහ බස හැසිර වීම කෙරෙහි බලපායි. මුඛය ආශ්‍රිතව ගොඩනැගෙන දුබලතා උච්චාරණයේ අවහිරතා ඇති වීම පිණිස ඉවහල් වේ. එමගින් සන්නිවේදන බාධක ඇති වේ. බුදුරජාණන් වහන්සේ සතුව පැවති මතු දැක්වෙන ලක්ෂණ හේතුවෙන් උන්වහන්සේගෙන් සුබ උච්චාරණයක් සහ නිවැරදි ව්‍යවහාරයක් ප්‍රකට වෙයි.

i. සමචත්තාළීසදන්තතා

බුදුරජාණන් වහන්සේගේ මුවෙහි දත් හතළිහක් පිහිටීමේ ගුණය චත්තාළීසදන්තතා ගුණය යටතේ විග්‍රහ වේ. සාමාන්‍ය මිනිසෙකුට නොමැති සුවිශේෂී දන්ත මාලාවක් පිහිටීම බුදුරජාණන් වහන්සේට පමණක් ආවේණික, මහා පුරුෂයෙකු සතු ලක්ෂණයක් වශයෙන් දැක්විය හැකි ය. පෙර ආත්ම භාවයන්හි කේලාම් කීමෙන් වැළකී සිටීම, කථනයේ දී අසමගි වූ අය සමගි කර වීමට සමත් වචන භාවිත කිරීම වැනි පුණ්‍ය ශක්තීන් "චත්තාළීසදන්තතා" ගුණය සඳහා හේතු විය.

ii. අවිවරදන්තතා

දත් අතර විවර නොමැති බව මෙයින් කියැවේ. මෙම ලක්ෂණය පැහැදිලි වචන උච්චාරණය සඳහා බලපායි. දත් අතර විවර නොමැති වීමෙන් බස හැසිරීමේ දී මුඛයෙහි සිදු වන ජීව විද්‍යාත්මක කාර්යය නිසි පරිදි ඉටු වේ. දත් අතර සමපාත බවක් නොතිබීම, විවර පැවතීම උච්චාරණ ඌණතා ඇති කරයි.

iii. පහූතජිව්හතා

මෙමගින් දික් පුළුල් දිවකින් යුක්ත බව විස්තර වේ. මහා පුරුෂයාගේ දිව මෘදු ය, පුළුල් ය, දිගකින් යුක්ත ය. බුදුරජාණන් වහන්සේගේ දිවෙහි පළල් බව හේතුවෙන් නළල් තලය පවා වැසිය හැකි ය. දිවගින් නාසය ස්පර්ශ කිරීමට පිළිවන. පෙර ආත්ම භාවයන්හි අන්‍යයා කෙරෙහි ප්‍රිය මෘදු මොළොක් වචන කතා කිරීම සහ පරුෂ වචනයෙන් වැළකී සිටීම මෙම ලක්ෂණ ඇති වීමට හේතු වූ බව ලක්ඛණ සූත්‍රයෙහි දැක්වේ.

iv. සීහහනූතා

බුදුරජාණන් වහන්සේගේ හනු සිංහයකුගේ හනු හා සමානව පවත්නා බව මෙයින් කියැවේ. සිංහයාගේ මෙන් උඩු හනුව හා යටි හනුව පිරී පවත්නා බැවින් එකිනෙකට ගැටීමේ දී හනු දෙකම සමපාත වේ. පෙර ආත්මයන්හි දූහැමි වචන, අරුත්බර වචන කතා කළ නිසාත් කථනයේ දී ප්‍රලාපයෙන් බැහැර වීමත් හේතුවෙන් මෙවැනි ලක්ෂණ ඇති වූ බව දැක්වේ.

v. සම දන්ත

දත් හතළිහක් පිහිටීමේ මහා පුරුෂ ලක්ෂණය මෙන් වැදගත් ම ලක්ෂණයක් වශයෙන් සමදන්ත හෙවත් ඒකාකාරිව දත් පිහිටීමේ ගුණය හැඳින්වීමට පිළිවන. මෙම ස්වභාවය ළදරු කල පටන් මහා පුරුෂයෙකු වෙතින් ප්‍රකට කෙරෙන ලක්ෂණයකි.

vi. බ්‍රහ්මස්වරතා

බුදුරජාණන් වහන්සේගේ ස්වරය (වචන) මහා බ්‍රහ්මයාගේ ස්වරය සහ සමාන බව මින් ප්‍රකාශ වේ. මහා බ්‍රහ්මයාගේ ස්වරයෙහි අඩංගු සියලු ගුණ බුද්ධ වචනයෙන් ප්‍රකට වේ. පූර්ව ආත්ම භාවයන්හි පරුෂ වචනයෙන් වැළකී ප්‍රියවචන කථා කිරීමේ ආනිසංසයෙන් බුදුරදුන්ගේ ස්වරය විශිෂ්ටත්වයට පත් වූහ. බ්‍රහ්මස්වරයෙහි ස්වභාවය දීඝනිකාය අටුවාව මෙලෙස පැහැදිලි කරයි.

"අන් අයගේ බිඳුණු ස්වර ඇත්තෝ ය. කාක ස්වර ඇත්තෝ ය. බුදුන් වහන්සේ වනාහි මහා බ්‍රහ්මයාගේ ස්වරයට සමාන ස්වරයෙන් යුක්ත වන්නේ ය. සෙම් පිත් ආදියෙන් බාධා නොවන බැවින් මහා බ්‍රහ්මයාගේ ස්වරය පැහැදිලි ය. පිරිසිදු ය. මහා පුරුෂයන් සිදු කරනු ලබන කුසල කර්ම හේතුවෙන් හදවත පිරිසිදු කරයි. එහෙයින් නාභියේ පටන් හටගන්නා ස්වර පිරිසිදු ය. එම ස්වර අංග අටකින් යුක්ත ය. එම ස්වරය මත් වූ කොවුලෙකුගේ මිහිරි හඬ ට සමාන ය. එය 'කරවිකභාණි' ලෙස විග්‍රහ වේ."[2] ඒ අනුව බුදුරජාණන් වහන්සේගේ ස්වරයෙහි අඩංගු විශේෂතා මෙපරිද්දෙන් දැක්විය හැකි ය.

i.	සිනිඳු බව	-	විස්සට්ඨ
ii.	මිහිරි බව	-	මඤ්ජු
iii.	පහසුවෙන් වැටහෙන බව	-	විඤ්ඤෙය්‍ය
iv.	ඇසීමට රුචි උපදවන	-	සවණීය
v.	නිරවුල් බව	-	අවිසාරි
vi.	ඒකමිතිය	-	බින්දු
vii.	ගැඹුරු බව	-	ගම්භීර
viii.	පිළිරැව් දීම	-	නින්නාද

භාෂා භාවිතයේ ජීව විද්‍යාත්මක විශේෂතා

i. විස්සට්ඨ

ස්වර උච්චාරණයේ පැහැදිලි හා ව්‍යාකූල නොවූ ස්වරූපය මෙමගින් හැඟ වේ. බස හැසිරවීමේ දී වචන, වාක්‍ය අතර පවතින පරතරය හා විරාම ලක්ෂණ පිළිබඳ විමසිලිමත් විය යුතු ය. ශ්‍රාවකයාට දේශනයේ අර්ථකථනය වටහා ගැනීමට නොහැකි වන පරිදි සන්නිවේදකයා අදළ මාතෘකාව පිළිබඳ අල්ප වූ විස්තරයක් පමණක් ඉදිරිපත් කිරීම නිසා සන්නිවේදන බාධක ඇති වේ. භාෂා භාවිතයේ දුර්වලතා නිසා ඇතිවන මෙම ස්වභාවය'සන්දිට්ඨ දෝෂ' නම් වේ.

සන්නිවේදනයේ දී 'විලම්බිත දෝෂ'ද පැන නගී. කථනයේ දී වචන අතර දැඩි පරතරයක් තබා ගනිමින් බස හැසිර වීම, ඉතා පහත් හඬකින් කථා කිරීම විලම්බිත දෝෂ වශයෙන් සැලකේ. භාෂා භාවිතයේ සහ උච්චාරණයේ දී මෙවැනි අවහිරතා පැවතීම සන්නිවේදකයා සහ ශ්‍රාවකයා අතර දුරස් බවක් ඇති කරයි. එමගින් ග්‍රාහකයා වෙත සංදේශ රැගෙන යාමේ කාර්යයට බාධා පැමිණේ.

සන්නිවේදනය වෙතින් ශ්‍රාවක අභිප්‍රායන් ඉටු නොවීම, ශ්‍රාවකයා කලකිරීම පිණිසත්, අප්‍රසාදය පිණිසත් හේතු වේ. එපමණක් නොව එමගින් සන්නිවේදකයාගේ පෞරුෂත්වයට හා පැවැත්මට හානි සිදු වේ.

'විස්සට්ඨ ගුණය' පිළිබඳ සාකච්ඡා කිරීමේ දී බස හැසිරවීමේ තවත් ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැකි ය. සන්නිවේදනයේ දී ඉතා වේගයෙන් වචන උච්චාරණය කිරීම මෙන් ම ඉතා සෙමෙන් උදාසීනව වචන උච්චාරණය කිරීම නොකළ යුතු දෝෂයක් වශයෙන් හැඳින්වේ. මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍ර දේශනාවේ දී ඉතා වේගයෙන් වචන උච්චාරණය කිරීම නොකළ යුත්තක් සේ දක්වයි.[3]

"ත්වරිත නොවී බණන්නේ යැ, ත්වරිත ව නො බණන්නේ යැ".

ඉක්මනින් යමක් නොකියා සෙමින් කථා කළ යුතු බව මෙයින් කියැවේ. ඉතා වේගයෙන් වචන උච්චාරණය කරමින් කථා කරන තැනැත්තාගේ ශරීරය සැණෙකින් දුර්වල වේ. සිත ද වෙහෙසට පත් වේ. ඔහුගේ ස්වරය බිඳී යයි. උගුර රෝගී වෙයි. වචන අපැහැදිලි වෙයි. ශීඝ්‍ර උච්චාරණයෙන් මිදී සෙමින් කතා කරන විට ඉහත සියලු දුෂ්කරතා දුරුවන බව ද අරණ විභංගසූත්‍රයේ දැක්වේ.[4] මෙම දෝෂවලින් බැහැර ව සන්නිවේදනයේ දී භාෂාව හැසිර වියයුතු අයුරු 'විස්සට්ඨ ගුණය' යටතේ විග්‍රහ කෙරේ.

ii. මඤ්ජු

මඤ්ජු ගුණය යටතේ සාකච්ඡා වන්නේ වචන භාවිතයේ පවත්නා මිහිරි බව යි. සන්නිවේදනයේ දී ස්වරය කඨෝර නොවිය යුතු ය. ස්ත්‍රී පුරුෂභාවයට යෝග්‍ය වන පරිදි වචන හැසිර වීම 'මඤ්ජු' හෙවත් 'මධුර බව' ඇති වීම පිණිස හේතු වේ. සන්නිවේදකයා අර්ථවත්ව, නිවැරදිව, පැහැදිලිව වචන හැසිර වූ පමණින් සන්නිවේදන ක්‍රියාදාමය සාර්ථක නොවේ. සන්නිවේදකයා පරුෂ වචනයෙන් තොරව තමන්ට ආවේණික වූ නියත ස්වභාවයකින් මධුර ලෙස වචන හැසිර විය යුතු ය.

iii. විඤ්ඤෙය්‍ය

විඤ්ඤෙය්‍ය ගුණය ඔස්සේ ශ්‍රාවකයාට සංදේශයේ අර්ථය අවබෝධ කරගැනීම පහසු වන ආකාරයට භාෂාව භාවිත කිරීම, ශබ්ද උච්චාරණය කිරීම පිළිබඳව විග්‍රහ වේ. එහිදී ශ්‍රාවකයාට සන්දේශයේ අර්ථ අවබෝධ කර ගැනීම පහසු වන පරිදි වචන භාවිත කළ යුතු ය. සන්නිවේදකයා සංදේශය තුළ සිදුකරන අර්ථ ගැන්වීමට හානි නොවන පරිදි එකී අර්ථ ඒ ආකාරයෙන් ම ශ්‍රාවකයා වෙතට ද ගෙන යාම සන්නිවේදනයේ අරමුණ යි.

භාවිතයට ගනු ලබන වචනවල අර්ථය මැනවින් ප්‍රකට වීම ශ්‍රාවකයාට සංදේශය අවබෝධ කර ගැනීම පහසු කරයි. විඤ්ඤෙය්‍ය ගුණය මගින් බස හැසිරවීමේ දී වචනය යෙදිය යුතු වඩාත් සුදුසුම ස්ථානය තීරණය කිරීමටත් අවකාශ සැලසේ. ඇතැම් විට වචනය භාවිතයට ගනු ලබන අවස්ථාව සහ එය වාක්‍යයක යොදනු ලබන ස්ථානය අනුව අර්ථ සම්පාදනය වෙනස් වීමට පිළිවන.

iv. සවණීය

දේශනය සවන් දීමට ශ්‍රාවකයා පොලඹවන සවණීය ගුණය, සන්නිවේදනයේ දී අතිශයින් වැදගත් වේ. දේශනය ශ්‍රවණය කිරීමට ශ්‍රාවක මනසෙහි රුචියක් ඇති කෙරෙන ආකාරය 'සවණීය ගුණය' යටතේ

සාකච්ඡා කෙරේ. සන්නිවේදකයා 'සවණීය ගුණය' සුරැකෙන ලෙස භාෂාව හසුරුවන්නේ නම්, එකී ගුණය ආරක්ෂා වන ලෙස සංදේශයේ අන්තර්ගතය සකස් වී ඇති නම් ශ්‍රාවකයා තෘප්තිමත් වේ. බස හැසිරවීමේ දී 'සවණීය ගුණය' පිළිබඳ සැලකිලිමත් වීම ශ්‍රාවක අභිමතාර්ථ සාධනය පිණිස හේතු වේ. සවණීය ගුණය නිසා ශ්‍රාවකයා සංදේශය වෙත සමීප වේ. සවණීය ගුණ සහිතව වදන් හසුරුවන සන්නිවේදකයාට ශ්‍රාවක මනස කිසිදු බාහිර අරමුණක් වෙත නොරඳවා සංදේශයෙහිම රඳවා තබා ගැනීමට හැකියාව පවතියි. එමෙන්ම 'සවණීය ගුණය' සංදේශයේ මතුපිට අර්ථය පරයමින් අභ්‍යන්තරිකව ගොඩනැගෙන බුද්ධිමය සංවාද කෙරෙහි ශ්‍රාවකයා යොමු කරවීමට සමත් වේ.

v. අවිසාරි

භාෂාව හැසිරවීමේ නිරවුල් බව 'අවිසාරි ගුණය' මගින් පෙන්වා දෙයි. සංදේශයක භාවිතයට ගැනෙන වචන, යෙදුම්, වාක්‍ය නිරවුල්වීම නිසා ශ්‍රාවක අවධානය රඳවා ගැනීම පහසු වේ. ශ්‍රාවකයාට සංදේශය මුල, මැද, අග වශයෙන් වෙන් වෙන් ව තේරුම් ගැනීමට හැකි වීම නිරවුල් බවෙහි මූලික ලක්ෂණයකි. එසේම ශබ්ද සහ අර්ථ වශයෙන් ද වෙන් වෙන් ලෙස සංදේශ තේරුම් ගැනීමට හැකි වන පරිදි එය ඉදිරිපත් කිරීම වැදගත් වේ.

vi. බින්දු

දේශනයක පවත්නා සංක්ෂිප්ත බව හැඟවීම, සම්පිණ්ඩන, ගුණය හැඟවීම, වචන, වාක්‍ය යෙදුම් අතර ඒකීය සබඳතාව හැඟවීම සහ වචනවල අර්ථ සම්පාදනයේ දී ඒකීය බවක් හැඟවීම 'බින්දු ගුණය' යටතේ විග්‍රහ වේ. ශ්‍රාවකයා සමස්ත දේශනයට සවන් දෙනවා වෙනුවට එක් සංක්ෂිප්ත මොහොතකට පමණක් සවන් දීමෙන් දේශනයෙහි යථා ස්වභාවය අවබෝධ කර ගත හැකි වනුයේ සන්නිවේදකයාගේ භාෂා භාවිතයෙහි පවත්නා 'බින්දු ගුණය' හෙවත් ඒකමිතිය හේතුවෙනි.

vii. ගම්භීර

මෙමගින් වචන, යෙදුම් ගැඹුරින් උච්චාරණය කිරීමේ ගුණය විවරණය වේ. සංදේශයේ නිසි අර්ථ උත්පාදනය සඳහා වචන සහ ශබ්ද භාවිතයේ ගැඹුරු බව ඉවහල් වේ. සංදේශයට යෝග්‍යව භාෂාව හැසිර වීම සන්නිවේදකයා සතු කාර්යයකි. එහිදී සංදේශයෙහි අන්තර්ගත ලක්ෂණවලට උචිතව බස හැසිර විය යුතු ය. ඕනෑ ම අරුත්බර සංදේශයක ගම්භීර බව ගිලිහීයාම මගින් එය අර්ථ ශූන්‍යයත්වයට පත් වේ.

ශබ්දයේ ගම්භීර හෙවත් 'ගැඹුරු බව' ඇතිවීම කෙරෙහි පුද්ගලයාගේ මුඛය හා බැඳි අංග හේතු වේ. අවකාශයෙහි වඩාත් හොඳින් පැතිර යන ශබ්දයක් උත්පාදනය වන්නේ දත්, හනු, තොල්, තල්ල වැනි ස්ථාන සමග දිව තදින් ස්පර්ශ වීම හේතු කොට ගෙන යි. දිවෙහි මඳ ස්පර්ශය බොල් වූ හඬක් ජනනය පිණිස හේතු වේ. සන්නිවේදකයා තම සන්දේශයේ ප්‍රකාශිත අර්ථ නිසි පරිදි උත්පාදනය වන අයුරින් දිව සෙසු ස්ථාන සමග ගැටීමට සැලැස්විය යුතු ය. එමගින් සෑම වචනයක ම ඊට අනන්‍ය, උචිත, ශබ්දය උත්පාදනය වේ. දේශකයෙකුට ස්වකීය භාෂා භාවිතයේ දී ශබ්දය ක්‍රමවත්ව හැසිර වීම මගින් ගම්භීර ගුණය ඇති කිරීමට පිළිවන.

viii. නින්නාද

සංදේශයෙහි භාවිත වචනයන්හි අර්ථය සහ ශබ්දය සමබරව පැවතීම 'නින්නාද ගුණය' ඇති වීම කෙරෙහි ඉවහල් වේ. භාෂා භාවිතයේ දී වචනාර්ථවලට ශබ්දර්ථය සමපාත විය යුතු ය. නින්නාද ගුණය සංදේශය අර්ථ සම්පන්න කරවීමටත්, ශ්‍රාවක ආකර්ෂණය රඳවා තබා ගැනීමටත් හේතු වේ.

බුදුරජාණන් වහන්සේගේ ශබ්ද ඉන්ද්‍රීය පද්ධතිය සහ එහි පවත්නා ජීව විද්‍යාත්මක ස්වරූපය මේ ආකාරයට අධ්‍යයනය කළ හැකි ය. ශාස්තෘවරයෙක් වශයෙන් උන්වහන්සේ ශ්‍රාවකයන් අතර ආදර ගෞරවයට පාත්‍ර වීමෙහි ලා ධර්ම දේශනාවන්හි අභ්‍යන්තර අංග මෙන් ම එහි ශබ්ද විද්‍යාත්මක සාධක ඉවහල් වූ බව පෙනී යයි. තථාගතයන් වහන්සේ තම ධර්ම දේශනාවන්හි සමබරතාව පිළිබඳ ව සැලකිලිමත් වූහ. උන්වහන්සේ දේශනාවේ අර්ථය වඩාත් ඉස්මතු වන පරිදි හඬ භාවිතයට ගත්හ. බුදුරජාණන් වහන්සේ දේශනාවේ අර්ථය හෝ හඬෙහි ජීව ගුණය ගිලිහී නොයන පරිද්දෙන් බස හැසිර වූහ. එහි දී වාග් විද්‍යාත්මක සංරචක බැහැර නොකළහ.

භාෂා භාවිතයේ දී ශබ්ද හා අර්ථ අතර ඇති සම්බන්ධය

බුදුරජාණන් වහන්සේගේ භාෂා භාවිතයෙහි තවත් සුවිශේෂි පියවරක් වශයෙන් උන් වහන්සේගේ දේශනාව වෙතින් ශබ්ද මාධුර්ය පමණක් ඉස්මතු නොවීමේ ලක්ෂණය පෙන්වා දිය හැකි ය. තථාගතයන් වහන්සේ සමස්ත දේශනාවේ අන්තර්ගතය 'ශබ්ද' සහ 'අර්ථ' වශයෙන් දෙවැදෑරුම්ව සකස් කොට ඉදිරිපත් කළහ. බුදුරජාණන් වහන්සේ දේශනාවට අනුචිත එකදු වචනයක් භාවිත නොකළ අතර නොගැළපෙන කිසිදු වාචික හෝ ආංගික අභිනයක් උපයෝගී කර නොගත්තේ ය. ග්‍රාහකයාගේ සිතට මිහිරි, හෘදයාංගම වූ සහෘද වදන්වලින් ඔප් නැංවුන, සරල භාෂා භාවිතයක් බෞද්ධ දාර්ශනික සන්නිවේදන සංකල්පයේ අන්තර්ගත වේ. ඒ අනුව අර්ථමය වශයෙන් බුදුරජාණන් වහන්සේගේ දේශනාවන්හි පහත ගුණාංග පවත්නා බව බොහෝ සූත්‍ර දේශනාවන්ගේ සඳහන් වේ.[5]

භාෂා භාවිතයේ දී සියලු දෙනාට යහපතක් සලසන වචන කෙළ තොලු නොවූ (අනෙළගලා) කනට මිහිරි වූ (කණ්ණ සුඛා), ඇසිය යුතු වූ (සවනීයා), මෘදු වූ (මුදු), කියවීමට හැකි වූ (වාචාපෙය්‍ය), සභ්‍ය හෙවත් පිරිසිදු වූ (සුචි), පැහැදිලි වූ (වග්ගු), ව්‍යඤ්ජන සහිත වූ (සබ්‍යඤ්ජනා) වියත් වූ (වියත්ත) හඬ පැතිරෙන්නා වූ (නිග්ඝොෂා), සිත ඇලෙන්නා වූ (රජනියා), උතුම් හඬක් ඇත්තා වූ (බ්‍රහ්මස්සරා), නොකැඩෙන්නා වූ (බින්දුස්සරා), මනා කොට වෙන් කරන ලද (සුවිකපප්පිතා), කරවි කෙවිල්ලකගේ හඬ වැනි වූ (කරවිකසදිය), යනා දී වශයෙන් ද, සමාජයට අයහපත් වචන පිළිබඳ ව කෙළ තොලු වූ (ඵළගලා), කර්කෂ වූ (කක්ඛසා), කණට අමිහිරි වූ (ඵරුසා) අසභ්‍ය හෙවත් අපිරිසිදු වූ (අසූචී) වරදවා ප්‍රකාශ ලද්දා වූ (දුරක්ඛාතා), වරදවා යොදන ලද පද, සහ ව්‍යඤ්ජන ඇත්තා වූ (දුන්නික්ඛිත්ත පද ව්‍යඤ්ජනා) යනා දී වශයෙන් ද හඳුන්වා ඇත.

බෞද්ධ දාර්ශනික සන්නිවේදන සංකල්පය තුළ භාෂා භාවිතයේ දී වචනයේ අර්ථය හා බැඳි ස්වභාවය පිළිබඳ මෙපරිද්දෙන් අවධානය යොමු කොට ඇත. නිර්දෝෂ වූ (නෙළා), සිත් ඇද ගන්නා වූ (හෘදයාංගම), ඇල්ම ඇති කරන්නා වූ (පෙමනියා), පැහැදිලි වූ (සංබිලා), පුරවැසියන් භාවිත කරන්නා වූ (පොරි), බොහෝ දෙනෙක් කැමති වන්නා වූ (බහුජන කාන්තා), බොහෝ දෙනෙකුට මනාප වූ (බහුජන

මනාපා) යනා දී වශයෙන් ධර්ම සංදේශයෙහි අන්තර්ගත ජීව විද්‍යාත්මක ලක්ෂණ සියුම් ලෙස විවරණය කරයි.

සන්නිවේදකයා මෙන් ම ශ්‍රාවකයා ද භාෂණයේ විවිධ ස්වරූප හඳුනා ගත යුතු ය. මෙමගින් සත්ත්වයාට ලෞකික සහ ලෝකෝත්තර අභිමතාර්ථ වඩාත් පහසුවෙන් සාධනය කර ගත හැකි බව බෞද්ධ ඉගැන්වීමයි. එපමණක් නොව සන්නිවේදකයා සහ ශ්‍රාවකයා සංදේශයේ යහගුණ හඳුනා ගැනීමට ඉහත විග්‍රහය වැදගත් වේ. මෙමගින් මානව සන්නිවේදනය ව්‍යවහාර ලෝකයෙහි ක්‍රියාවට නැංවීමේ ස්වරූප පිළිබඳව පැහැදිලි කෙරේ. සන්නිවේදන ක්‍රියාදාමයේ සාර්ථකත්වය අපේක්ෂා කරන සන්නිවේදකයෙකු විසින් කාලයට ගැළපෙන සත්‍ය වූ, අර්ථවත් වූ, මෘදු ප්‍රකාශන මෙත් සිතින් ශ්‍රාවකයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සංකීර්ණ සහ ගැඹුරු අර්ථ සහිත සංකල්ප, ශ්‍රාවකයා වෙත ඉදිරිපත් කිරීමේ දී සන්නිවේදකයාට මාහැඟි කාර්යයක් පැවරේ. එහි දී සන්නිවේදකයා ශ්‍රාවකයා සත්‍ය අසත්‍ය වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට අවකාශ සලසා දිය යුතු ය. ශ්‍රාවකයා සමීපව සහ සුහදව අව්‍යාජව, නිවැරදිව කරුණු පැහැදිලි කරදීම සන්නිවේදකයාගේ මෙහෙවරයි. බුදුරජාණන් වහන්සේගේ ඇතැම් දේශනාවන් හි සාර්ථක සන්නිවේදකයකුගේ චර්යාව පුළුල් පරාසයක් යටතේ ගෙන හැර දක්වයි. සන්නිවේදකයා ශ්‍රාවකයා විෂයෙහි බස හැසිර විය යුතු ආකාරය කියැවෙන 'සුමංගල විලාසනී අටුවාවේ' සඳහන් මතු දැක්වෙන ඉගැන්වීම ඉහත විශ්ලේෂණය සඳහා මාහැඟි නිදසුනකි.[6]

බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා සිටින ඕනෑ ම ශ්‍රාවකයෙකු තුළ ශ්‍රද්ධාව උපදවන හෙයින් (සද්ධාජනනතො), ප්‍රඥාව උපදවන හෙයින් (පඤ්ඤාජනනතො), අර්ථ සහිත බැවින් (සාත්‍ථතො), ව්‍යංජන සහිත බැවින් (සව්‍යංජනතො), ප්‍රකට වචන ඇති බැවින් (උත්තානපදතො), ගැඹුරු අරුත් ඇති හෙයින් (ගම්භීරත්‍ථතො), කනට මිහිරි හෙයින් (කණ්ණසුඛතො), හද පත්ලෙන්ම පැන නගින හෙවත් හෘදයංගම හෙයින් (හදයංගමතො), තමන්ගේ උසස් බව පමණක් නොකියන හෙයින් (අනත්තුක්කංසනතො), අනුන් හෙළා නොදකින හෙයින් (අපරවම්භනතො), කාරුණික වචන භාවිත කරන හෙයින් (කරුණා සීතලතො), ප්‍රඥාවෙන් පිරිසිදු හෙයින් (පඤ්ඤාවදානතො), ඉන්ද්‍රියයන්ට රමණීය හෙයින් (ආපාථරමණියතො), මැඩීමට සමත් හෙයින් (විමද්දක්ඛමතො), ඇසීමට සැප හෙයින් (සුයමානසුඛතො), විමසීමට හිත හෙයින් (විමංසියමානහිතතො) යනා දී වශයෙන් මෙම විග්‍රහය දැක්වීමට පිළිවන. මෙමගින් සන්නිවේදනයෙහි භාෂාත්මක ලක්ෂණවල පවතින ජීව විද්‍යාත්මක ස්වරූපය විවරණය කෙරේ. සන්නිවේදනයේ දී යොදා ගන්නා වචනවල ශබ්දමය සහ අර්ථමය පෙළ ගැස්ම 'සාර සන්නිවේදනය' පිණිස ඉවහල් වන බව ද මෙහි දී පෙන්වා දිය හැකි ය.

තථාගතයන් වහන්සේ අනුදැන වදළ වචන භාවිතයේ පදනම පිළිබඳ ධම්මපද පාළියේ 'සහස්‍ර වග්ගයේ' සඳහන් වේ. බුදුරජාණන් වහන්සේ අර්ථවත් වචන භාවිතය ප්‍රශංසා කළ අතර සත්ත්වයාට අයහපතක් සිදු කරන අර්ථ රහිත නිසරු වචන භාවිතය ප්‍රතික්ෂේප කළහ. ලෞකික පාරලෞකික සුභ සිද්ධිය නොසලසන නිසරු පදවලින් යුක්ත වන පද දහසකට වඩා අර්ථ පූර්ණ එක පදය වුව ද වඩාත් අනර්ඝ බව තථාගතයන් වහන්සේ දේශනා කළහ.[7] ඒ අනුව පුද්ගලයා අවැඩට යොමු කරවන භාෂා භාවිතය බෞද්ධ ඉගැන්වීම් වෙතින් ප්‍රතික්ෂේප වේ.

නිගමනය

ඵලදායි සන්නිවේදන කාර්යයන් ඉටු කිරීම සඳහා භාෂාවේ පවතින 'ශබ්ද' සහ 'අර්ථ' මෙහෙය වන ආකාරය පිළිබඳ පුළුල් විග්‍රහයක් සම්බුද්ධ දේශනාවේ අන්තර්ගත වේ. භාෂාවේ ශබ්ද සහ අර්ථ සමග බැඳි ව්‍යවහාර රීතිය සමාජ අන්තර් සබඳතා ගොඩනැංවීමෙහි ලා උපයුක්ත වන ආකාරය පිළිබඳව ඉහත විශ්ලේෂණය වෙතින් ප්‍රකට කෙරේ. සන්නිවේදනයේ ඵලදායක බව අර්ථවත් භාෂා ව්‍යවහාරයකින් පමණක් ඇති වන ආකාරය බුදුදහම ඔසසේ විවරණය කරයි. එමෙන්ම බෞද්ධ දාර්ශනික විග්‍රහයට අනුව අර්ථවත් භාෂා භාවිතය පුළුල් ජීව විද්‍යාත්මක පදනමක් සහිතව ගොඩනැගෙන බව මෙම අධ්‍යයනය ඔස්සේ පැහැදිලි වේ. ඒ අනුව සන්නිවේදනයේ නිවැරදි, නිරවුල්, අර්ථවත්, විශ්වසනීය භාෂා භාවිතය පුද්ගලයා සතු ජීව විද්‍යාත්මක සාධක මත පදනම්වන බව දැක්වීමට පිළිවන.

පාදක සටහන්

1. දීඝනිකාය 3, පාථිකවග්ග, ලක්ඛණ සූත්‍රය, බු:ජ:ත්‍රි:, බෞ:ස:ම:, දෙහිවල, 2006, පි. 236
2. බාලසූරිය, බී. එම්. පී., සුමංගල විලාසිනි නම් වූ දීඝනිකායට්ඨ කථා, දෙවෙනි කොටස, බෞ:ස:ම:, දෙහිවල, 2008, පි. 249 : 266
3. අතරමානොව භාසෙය්‍ය, නො තරමානො ති

   මජ්ඣිමනිකාය 3 , විභංගවග්ග, අරණවිභංග සූත්‍රය, බු:ජ:ත්‍රි:, බෞ:ස:ම:, දෙහිවල, 2006, පි. 490
4. තරමානස්ස භාසතෝ කායෝපි කිලමති. චිත්තම්පි උපහඤ්ඤති. සරොපි උපහඤ්ඤති. කණ්ඩොපි ආතුරීයති. අවිස්සට්ඨම්පි හොති අවිඤ්ඤෙය්‍යං තරමානස්ස භාසිතං, තත්‍ර භික්ඛවේ, අතරමානස්ස භාසතො කායොපි න කිලමති. චිත්තම්පි න උපහඤ්ඤති. සරොපි න උපහඤ්ඤති. කණ්ඩොපි න ආතුරීයති. විස්සට්ඨම්පි හොති විඤ්ඤෙය්‍යං අතරමානස්ස භාසිතං. අතරමානො ව භාසෙය්‍ය, නොතරමානොති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං

   එම
5. පියරතන හිමි, වෑගම., සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය, සරස්වතී, දිවුලපිටිය, 2006, පි. 62
6. සුමංගල විලාසනී, සාමඤ්ඤඵලසුත්ත වණ්ණනා, බු:ජ:ත්‍රි:, බෞ:ස:ම:, දෙහිවල, 2006, පි. 159
7. සහස්සමපි චෙ වාචා අනත්ථපදසංහිතා

   එකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.

   සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා

   එකං ගථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.

   ඤාණරතන හිමි, වැලිගම., 2011, සිංහල අනුවාද සහිත ධම්මපදය, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකශන සමිතිය, මහනුවර, පි. 69

14

Body Paintings, Tribal Tattooing and Lip pluggings with Fashion Culture, Semiotics & Communication

Dineesha Liyanage

Introduction

The visual imagery deserves a significant place in fashion. Fashion is not just a primitive subject which represents the field of body decoration. In the discussion of its structure, it is significant that fashion semiotics social, mental, economic, political, cast based and racial factors. (Elizabeth Wilson States)

As described in Semiotics, there is a sign generated by everything. In terms of social factors, these forms of fashion act as symbols which introduce people. It sometimes systematically reveals the cultural identities of certain groups of cultures. If elaborated further, there is no powerful medium like fashion which combines man with his or her social institution.

According to Paulin Thomas, "Fashion is a language of signs, symbols and iconography that non verbally communicate meanings about individuals and groups.

At present, the fashion in the world marks a swift improvement. The establishment of fashion cities is a reflection of the evolution of fashion. Body decorations deserve a significant place in fashion. When analyzing the history of fashion, it is crystal clear that this is a special form of fashion used by the tribal people. They have been engaged in this fashion by using colors, lines, shapes and causing scars on the skin. This also unravels that through this, the tribal people also communicated their physical and non-physical factors such as social power, religious beliefs, cast and wealth. In this regard, the priority is to be given for the trends of fashion such as tattooing, lip plugging and body painting.

Fashion

Clothing and accessories which are famous during a specific culture and certain culture are called fashion. When identifying fashion, Sporles, in his book, "Consumer Behavior Awards Dress" (2008) states that fashion is a communicative product.

The fashion designer called Solaman (2007) defines fashion as follows. "In terms of psychology, fashion reveals privacy. It follows the competition of social class and social equality. According to economists, fashion is chasing on and according to historians, it is introduced as a revelation and distinguishing the differences of a gradually transforming society. According to the artists, fashion is creative and beautiful ideas.

Body Painting

Body Art can also identified as a form of fashion which dates back to the tribal society. These methods of Body Art are analyzed under three categories by Bella Volen.

1. Ritual Body Art
2. The birth of a new art form (1960-1980)
3. Contemporary body painting (after 1980)

1. Ritual Body Art

Hereby it is mainly studied the methods of body art followed by various tribal groups based on their cultural factors. Even today, various tribal groups of the world use this art as social semiotics, to add glamour to their personal and spiritual lives.

2. The birth of a new art form (1960-1980)

The artists have unraveled a new field to symbolize the emotions of people through body art. Thereby, the colors and the trends of body art have amply been used to represent happiness, sexual freedom and the man's combination with nature.

3. Contemporary Body Painting (after 1980)

This has been evolved up to Fine Art body painting, Advertising, Fashion Body Painting, Commercial Body Painting, UV body painting, Special Effects, Air Brush, Competition Body Painting, Paintoon, Action Painting, Body Painting Shows and Performances.

Under this art, vivid art is painted on the skin. Sometimes these paintings are composed in fine lines by combining various colors. This methodology is quite well known among the people in the African Content. They communicate through these to spread their social condition and religious beliefs in a cultural approach.

Elaborating on the Body Paining & Body Art History, Bella Volen moreover states that there is an exclusive method of body art in every culture. (Every major society, past or present, has or had its own body art culture.). Especially, it is evident through studies that in the tribal societies, body painting and body art have been used to communicate the special moments in their lives. For instance, these body paintings have been used as semiotics in the significant milestones in their lives such as birth, puberty, marriage and death.

As for the countries which used this art in the expression of these semiotics, North and South America, Africa, Australia, New Zealand, Polynesia, Papua Newgenia, Oshania, India, Middle East, China, Japan, Thailand, Bulgaria and Kosovar top the list.

In this context, they have used clay or other natural colors in liquid foam to paint their bodies. It implies the fact that by using body paint, they have expressed their social, religious and personal views.

Over the African continent, men and women in certain tribes had used body paint everyday as a uniform to communicate their social status to the people in other cultures. (Gronning Kari Body Decoration: A World Survey of Body Art- New York, Vendome Press. 1998)



Figurer 1 : Tribal Body Painting

Body paint may have been produced by using natural substances such as clay and minerals. Most of the time they selected these colors in line with social and religious guidelines. For

instance, people in Nuba mountains in Sudan, used these body paints as mentioned in the table below. In this regard, mainly, the attention is paid to the culture of Ritual Body Decoration in terms of fashion.

"A young man living in the Nuba Mountains of Sudan, for example, was allowed to paint himself with red and white paint from age eight, but he had to wait until he was a bit older to wear yellow, and he could not use black until he was initiated into the group. Young women of the Nuba Mountains coated their bodies with oil and red ocher, a reddish type of clay, between puberty and their first pregnancy. Ethiopians also used specific types of body painting to celebrate each stage of life, from childhood to old age. The meanings associated with colors and patterns differed from culture to culture. Red, for example, represented blood in many cultures, but blood could symbolize life and happiness in some tribes, or death and sadness in others".

(Gröning, Karl. *Body Decoration: A World Survey of Body Art.* New York: Vendome Press, 1998.)

Semiotics of Body Paintings

Most of the tribal groups have applied this art of body painting based on hunting, religious reasons and communication with their rival groups.

For example, face painting was very common among native tribal groups in North America and various tribes in Africa and South America. Indigenous American tribes have been using this art since past while the gypsies in the Amazon forest have used this to demonstrate the link between humanity and animals.

The colors used by the Native American tribes and their semiotics.

Color	Significance
Red (Violent Color)	Color of war
Black	Considered to be an inauspicious color in many cultures
White	The color of peace
Green	This is believed to empower the wearer with a night vision. The color was applied under their eyes
Yellow	The most inauspicious color; the color of death. They wear this to symbolize their very tragic moments.

Franz Boas and Cloude Levi-Strauss, who comment on the tribal art of body painting in Human Scientific Study state that "primitive art, the aim is not to imitate the appearance of an animal"

Tribal Tattoo

Tattooing are basically very important body decoration system. Those Native American and some Asian tribes Tattooing was practiced going on thousands of years. The word tattoo, or tattoo in the 18th century, Oxford dictionary define the Verb of Tattoo was,

"Mark (a part of the body) with an indelibledesign by insertingpigment into punctures in the skin:his cheek was tattooed with a wingedfist"

Cambridge dictionary define this word of "Tattoo" was,

"informal that a permanent image, pattern, or word on the skin that is created by using needles to put colours under the skin."

Tattooing are very famous Body decorations art in the modern world. Use of tattooing lines, images & ect… very different from culture and culture. Many tribes tattooed themselves by cutting their skins with sharp objects and rubbing dye into the cuts.

Ex: Native Americans tattooed themselves use of CactusesNeedles, Fish bones, Pine Needles, Bird Bones, Sharp stones, or other Sharp objects pricked the skin and pigments such as charcoal, cedar-leaf ashes , or other materials were used to make red, blue, or green tattoos of the skin.
-Fashion, Costume & Culture p. 381

Semiotics of Tribal tattoos

Regarding the Study of tattooing history all the tribes was a tattooing of the different meaning. Furthermore it has own symbols of tattooing. Basically here we studding mainly tree categories.

01. symbol that a person belonged to a certain tribe or social status
02. self-protection
03. medicinal purposes

Many tribes or any other culture use the tattoos these purposes were located. Aleut people of the some Asian &American Countries lives from some tribes use to very sharp tattoo lines on their face, neck and hands.

Marquesan island in Polynesia were tattooed. They regarded the tattooed symbols as a form of language. Usually, the image was inspired by animals: for example, shark teeth represented

protection, and shells meant wealth. Other common symbols included turtles, fish hooks, and lizards. (Tribal Tattoo Meanings, Designs, and History:http://hubpages.com/style/tribal-tattoo-meanings-2)

The New Zealand tribes called " Maori" this tribes people use of tattoo they believe it was showing high social status (person's rank, Job Position& other achievements.) These tattoos are known as Moko.

Figurer 2 :Tribal Tattooing

"Haida" Called a Native American tribe they believed that if you had a certain tattoo, you took on some of the strength of that animal.

"Borneo" (That is the boundary of Malaysia, Brunei, and Indonesia.) These traditional tattoos of this region were symbols of protection and proof of achievement.

Tribal tattoos always communicate a message on the cast, politician, power of the tribe and man's religion and beliefs. It can be identified that man has used these tattoos to communicate with their human society. There is a specific identity for each tattoo. In this regard, every line is painted being very exclusive to each person. There is a cluster of semiotics associated with the tattoos, painted by the people in the tribal societies.

Ex: "Naga tattooing provides an excellent example of the interconnection of various aspects of culture. (The History of Tattooing; Wilfred Dyson Hambly- 2009)

Moreover, it is significant that tattoos have played a major role in religious tasks in the tribal societies. Some tattoos communicated man's personal freedom. Some tattoos bear witness for the fact that tribal community has been using these tattoos for 3000 years.

"Oldest tattooed body known to date is that of a Bronze Age man who died over 5000 years ago. He was found frozen intact in an Italian Glazier. Researchers where started at close examination he was found to have both arms, legs and torso covered with elaborate tattoos representing mythical creatures. (www.tribal-celtic.tattoo.com/tribal-history.html)

Tattoos communicated the many identifications among various tribes.

- Women's tattoos from California to Washington communicated their village.
- A group of tattoos in Alaska symbolized the killing of an enemy at a battle.
- In the tribe "Yokuts" the tattoos were painted in the places impregnated with amazing power.
- The Native American tribes too communicated the problems and attitudes regarding the body.

Lip plugging

Lip plugging can also be identified as a specific form of fashion among ancient tribal people. It is also identified that this method of body art was given a significant value in African and South American tribes. Murudi women must wear these lip pluggings since their youth. The tribes have introduced that they have to be worn since they were 13 years old. At the beginning, wearing these lip pluggings was a very painful experience, but as time passed the pain got alleviated.

"In Western Ethiopia, in Surma Community, the elderly women are known to be plate-women. When they come to the age of 20, they wear a small plate called "labret" by piercing their upper lip or lower lip 6 months before their marriage.
(Morris, Desmond; Naked Women)

Wearing these plates for lips can be identified as a popular method in many tribes of the world including Makonde tribe in Kenya and Loby tribe in Ghana.

Many tribes considered these large lip plates as a symbol of a beautiful tradition.

Young boys in some Amazon tribes considered cutting their lips as a ritual. Besides, they used these plates as a way of showing their glory and status. In Kayabo tribe and Mato tribe in Brazil people have tried to demonstrate the features such as leadership by wearing very large plates (such as plates in 8 inches).

Figurer 3 : Lip Pluggings

In accordance with Charles Derida's concept of deconstruction, man finds it difficult to grasp because of the complexed methods that they are using. The art of tattooing is also causing a lot of issues in terms of communication, as they evoke multiple interpretations based on the tribal societies that they are living in.

Conclusion

The forms of body decoration including lip plugging, tribal tattooing and body painting used in the tribal societies are creative semiotics which stand for the factors related to society and power in their tribe and other physical and non-physical aspects such as personal independence and inferiority.

Moreover, it can be pointed out that these forms of body decoration represented various interpretations in various tribal groups within the same country.

References

Anthony Seeger, (1975).The meaning of body ornaments: a Suya example," Ethnology

Atkin, Albert. (2006). , Stanford Encyclopedia of Philosophy

Berger,ArtherAsa,(2010).The object of Affection Semiotics and consumer culture;Palgrave Macmilian,United state.

Berger,Arthur,Asa.(1933).Media analysis techniques.Sagepublication,United Kingdom.

Brumberg, Joan Jacobs.(1997) The Body Project: An Intimate History of American Girls. Vintage Books: New York.

.(2001/2007). Semiotics: The Basics. London: Routledge

Davis, Fred.(1994.) Fashion, Culture, and Identity. The University of Chicago Press.

Eco, Umberto. (1979) A Theory of Semiotics. Bloomington: Indiana University Press.

Greif, Judith, Walter Hewitt, and Myrna L. Armstrong. (1999). Tattooing and Body Piercing: Body Art Practices Among College Students." Clinical Nursing Research.

Morris, Desmond, Naked women. (2007), St.Martin's Griffin.

Remirez, Christine Marie.(1999) Fashion as Communication: Jacqueline Kenney's Rhetoric of Style.Diss: Florida Atlantic University,.

Turton, David (2004). (PDF). Anthropology Today.

Web sites

http://www.face-painting-fun.com/cultural-face-painting.html

ปรศิวาฬ ทา ผศิวาฬ

15

ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ : ඡන්දදායකයාගේ සහභාගිත්වය සහ ජනමාධ්‍ය හැසිරීම

මධුරානි අත්තනායක

පසුබිම

මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ සංධිස්ථානයක් ලෙස 1982 පවත්වනු ලැබූ ප්‍රථම ජනාධිපතිවරණය හඳුන්වා දිය හැකිය. 1977 බලයට පත් වූ අග්‍රාමාත්‍යවරයා වන ජේ.ආර්. ජයවර්ධන මහතා ව්‍යවස්ථාව සංශෝධනය කරමින් පළමු විධායක ජනාධිපතිවරයා බවට පත් වූයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. ජනාධිපති තනතුරට පෙර මෙරට ප්‍රධාන පාලකයා ජනතා නියෝජිතයා බවට පත් වූයේ අග්‍රාමාත්‍යවරයා ය. 1978 වන විට මෙරට පුරවැසියන්ට ජනාධිපති ධූරය පිළිබඳ අවබෝධයක් නොතිබුණි. පූර්ණ බලතල සහිත විධායක ජනාධිපති තනතුර නව දේශපාලන අත්දැකීමක් බවට පත් විය. එම නිසා දේශපාලන සංස්කෘතියේ සංධිස්ථානයක් ලෙස විධායක ජනාධිපති ධූරය හඳුන්වා දිය හැකි ය. මෙමගින් අධ්‍යයනය කරන්නේ ජනාධිපතිවරණයකදී ඡන්ද දායකයාගේ හැසිරීම පිළිබඳවත් එම කාල සීමාව තුළ මාධ්‍ය හැසිරීම පිළිබඳවත් ය. ශ්‍රී ලංකාවේ මේ වන තෙක් පවත්වා ඇති ජනාධිපතිවරණ ඇසුරු කොටගෙන මෙම අධ්‍යයනය සිදු කෙරුණි.

1982 ජනාධිපතිවරණය සහ ඡන්දදායකයා

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජනාධිපතිවරණයක් පැවැත්වුයේ 1982 වසරේ වුවද ප්‍රථම විධායක ජනාධිපතිවරයෙකු පත් වූයේ 1978 වසරේ දීය. විධායක ජනාධිපති ක්‍රමය 1978 වසරේ සිට ලංකාවේ ක්‍රියාත්මක විය. 1977 ජූලි මස 23 වන දින 5/6 ක ඡන්දයක් ලබා ගනිමින් ජේ.ආර්. ජයවර්ධන මහතා 1972 ජනරජ ව්‍යවස්ථාවට අනුව අග්‍රාමාත්‍යවරයා ලෙස දිව්රුම් දී වැඩ භාරගත්තේ ය. ඉන් පසුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දෙමින් 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ප්‍රථම විධායක ජනාධිපති වරයා වශයෙන් 1978 පෙබරවාරි 04 වනදා ඔහු දිවුරුම් දුණි. ඔහුට අසීමිත බලතල ප්‍රමාණයක් හිමිවිය. විධායක ජනාධිපති වරයා රජයේ ප්‍රධානියා පමණක්

නොව ආණ්ඩුවේ සහ සන්නද්ධ සේවාවන් හි ද ප්‍රධානියා විය. මෙම ධූරය සඳහා ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන අතර අවුරුදු හයක කාලයක් එම ධූරය දරනු ලැබේ. විධායක ජනාධිපතිවරයා සතුව පවතින අසීමිත බලතල හේතුවෙන් ඒකාධිපති පාලනයක් වුවද පවත්වාගෙන යා හැකිය. විධායක ජනාධිපතිවරයා පත් වන්නේ ජනතාවගේ කැමැත්ත මත ය. මේ නිසා ඡන්ද දායකයාගේ ඡන්දය ජනාධිපතිවරණයකදී ඉතා වැදගත් වේ.

මෙම විධායක ජනාධිපති ක්‍රමයේ නිර්මාතෘවරයා වන්නේ ජේ.ආර්. ජයවර්ධන මහතා ය. ඔහු ඒ පිළිබඳ දැක්වූ අදහසක් පහත අයුරින් ඉදිරිපත් කළ හැකිය.

''ඡන්දයෙන් තෝරාගත් විධායක ජනාධිපති ක්‍රමය 1978 සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විය. මේ ක්‍රමය පිළිබඳ මූලික අදහස මගේ ය. 1977 ආණ්ඩුව පිහිටුවාගෙන මාස කිහිපයක් ඇතුළත ඇමති මණ්ඩලයේ පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ඇතිව 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරගෙන විධායක ජනාධිපති ක්‍රමයේ ආණ්ඩුවක් අපි හඳුන්වා දුන්නෙමු. ''**(ජයවර්ධන, 107 පිටුව)**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1982 වසරේ සංශෝධනය කරමින් ජනාධිපති වරයා තෝරාපත් කර ගැනීමෙන් පසු වසර 4 ක් ගෙවීමෙන් පසු ඕනෑම අවස්ථාවක ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කළ හැකි විය. එවැනි අවස්ථාවක ජනාධිපතිවරයා තෝරාගනු ලබන්නේ ජනාධිපතිවරණයක් තුළිනි. එය මැතිවරණ කොමසාරිස් වරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය. 1982 සැප්තැම්බර් 17 දින ප්‍රථම ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා භාරගනු ලැබූ අතර ඒ සඳහා නාමයෝජනා පත්‍ර 09 ක් ලැබී තිබුණි. ඉන් හය දෙනෙකුගේ නාම යෝජනා පිළි ගැණුනු අතර ඉන් තිදෙනෙකුගේ නාමයෝජනා ප්‍රතික්ෂේප විය. ඒ අනුව මෙම ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකත්වය ලැබූ පුද්ගලයන් වූයේ,

- ජේ. ආර්. ජයවර්ධන
- හෙක්ටර් කොබ්බෑකඩුව
- කොල්වින් ආර් ද සිල්වා
- වාසුදේව නානයක්කාර
- ජී.ජී. පොන්නම්බලම්
- රෝහණ විජේවීර

යන අයයි. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පැවැත්වීමට නියමිතව තිබූ ජනාධිපතිවරණය මෙරට ජනතාවට නව අත්දැකීමක් බවට පත් විය. මහමැතිවරණ, පළාත් බද ඡන්ද ස්වරූපයෙන් වෙනස් මගක් ගනිමින් මැතිවරණ කටයුතු ක්‍රියාත්මක විය. මුලු රටම එක ඡන්ද කොට්ඨාසයක් සේ සලකා මැතිවරණය පැවැත්වෙන අතර මනාප ක්‍රමය මුල් වරට හඳුන්වා දෙනු ලැබුවේ ද මෙම මැතිවරණය තුළිනි.

අපේක්ෂකයන් දෙදෙනෙකු පමණක් ඉදිරිපත් ව සිටී නම් පෙර පැවති මැතිවරණ වල මෙන් ඡන්දය භාවිතා කළ හැකි විය. එනම් වඩාත් කැමති අපේක්ෂකයා ඉදිරියේ 1 ඉලක්කම යොදා අනෙක් අපේක්ෂකයාට 2 ඉලක්කම යොදා මනාපය ලබා දිය හැකිය. අපේක්ෂකයන් තිදෙනෙකු ගේ ඊට වැඩි

පිරිසක් සිටී නම් කැමැත්තේ පිළිවෙලට 1, 2, 3 ලෙස මනාප ලබාදිය හැකිය. මෙහිදී ජනාධිපති වරයෙකු ලෙස තේරී පත්වීමට නම් ජනතාවගේ ඡන්දයෙන් 50% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතුය.

1982 ඔක්තෝම්බර් 20 වැනි දින පැවති ජනාධිපතිවරණයෙන් වැඩි ඡන්ද ප්‍රමාණක් ලබා ගන්තේ එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන මහතා විසිනි. ඔහු ලබාගත් ඡන්ද සංඛ්‍යාව වූයේ 38,50,711 කි. එය ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 52.91% විය.

මෙම ජනාධිපතිවරණයේ ඡන්ද දායකයාගේ ඡන්දය භාවිතය පිළිබඳ විමසා බැලිය යුතු ය. ජනාධිපතිවරණයක දී ඡන්ද දායකයාගේ ඡන්ද චර්යාව පිළිබඳ සාකච්ඡා කිරීමේදී 1982 ජනාධිපතිවරණයේ ලියාපදිංචි මුළු ඡන්ද සංඛ්‍යාව වූයේ 8,14,5015 කි. නමුත් ඡන්දය ලබා දී ඇත්තේ 66,02,617 ක් වැනි පිරිසකි. මෙමගින් පැහැදිලි වන්නේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් 1,542 398 ක් වැනි පිරිසක් ඡන්දය දීමෙන් වැළකී ඇති බවයි. එමෙන් ම ඡන්දය ලබා දුන් සංඛ්‍යාවෙන් 80,470 ක් ප්‍රතික්ෂේප වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 1% කි. ජනාධිපතිවරණයක දී ඡන්දය ලබා දීමේ ක්‍රියාවලිය සංකීර්ණ වී ඇත. මෙය රටේ ප්‍රථම ජනාධිපතිවරණය වීම නිසා ඡන්දය දීමෙන් වැළකී සිටී මට එක් හේතුවක් විය හැකි බවට නිගමනය කළ හැකිය. 1% ක් වැනි ප්‍රමාණයක් ඡන්දය ප්‍රතික්ෂේප වීම මගින් මෙම මැතිවරණයේ පවත්නා සංකීර්ණ බවට එක් හේතුවක් බව හඳුනාගත හැකි ය. මෙම ජනාධිපතිවරණ මනාප භාවිතය පිළිබඳ ජනතාව තුළ පවත්නා දැනුවත් භාවය පිළිබඳව ප්‍රතික්ෂේප ඡන්ද සංඛ්‍යාව අනුව පැහැදිලි කරගත හැකි ය.

1980 දශකයේ ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය

1980 දශකය වන විට ශ්‍රී ලංකාවේ සමාජ දේශපාලනික වශයෙන් වැදගත් කමක් සහිත සිදුවීම්වලට සෘජුවම ජනමාධ්‍ය සම්බන්ධ විය. මේ අවධිය වන විට ලංකාවේ පුවත්පත් හා ගුවන්විදුලිය පමණක් නොව රූපවාහිනිය ද ප්‍රබල මාධ්‍යයක් ලෙස කැපී පෙනේ. මේ යුගයේ ශ්‍රී ලංකාවේ පුවත්පත් මාධ්‍යයේ හැසිරීම පිළිබඳ සාකච්ඡා කළ විට වාණිජමය පුවත්පත් කලාව ප්‍රබලව කැපී පෙනුණි. ලේක්හවුස්, ටයිම්ස්, උපාලි, දවස යන පුවත්පත් ආයතන මහජන මතය සකස් කිරීමෙහිලා මූලිකත්වය ගනු ලැබීය. 1982 ජනාධිපතිවරණයේ දී පුවත්පත් මාධ්‍ය ක්‍රියාත්මක වූයේ ද එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරවීමේ මූලික අරමුණෙනි. විශේෂයෙන් ඒ අතුරින් ලේක්හවුස් ආයතනයේ ප්‍රධාන පුවත්පත් වන සිළුමිණ, Daily News, පුවත්පත් කැපී පෙනුනි. J.R ජයවර්ධන මහතාගේ ජයග්‍රහණය උදෙසා ජනතාව පෙළ ගැස්වීමට පුවත්පත ඉවහල් විය. එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය උදෙසා මෙම පුවත්පත් ආයතන ප්‍රමුඛත්වය ගත් විට විරුද්ධ පක්ෂවල අපේක්ෂකයන් සඳහා තවත් පුවත්පත් මූලිකත්වය ගනු ලැබීය. ඒ අතර කොමියුනිස්ට් පක්ෂයේ ''ඇත්ත'' පුවත්පත, ලංකා සමසමාජ පක්ෂයේ ''ජනදින'' පුවත්පත වැනි පුවත්පත් විරුද්ධ පක්ෂවල නායකයන් කිහිපදෙනෙකු වෙනුවෙන් පෙනී සිටිය ද ජාතික පුවත්පත් තරම් ප්‍රබල නොවීය. මේ නිසා රටේ මහජන මතයට ප්‍රබල බලපෑමක් එල්ල කිරීමට නොහැකි විය. කෙසේ නමුත් 80 දශකය වන විටත් රටේ ජනතාව අතර ජනප්‍රිය මාධ්‍ය බවට පත් වූයේ පුවත්පතයි.

1925 වසරේ මෙරට ගුවන්විදුලිය ද ආරම්භ විය. 1980 දශකය වන විට රටේ සංවර්ධන ක්‍රියාවලිය උදෙසා ප්‍රබලව දායක වූයේ ගුවන් විදුලියයි. මේ නිසා ජනතාව අතර ගුවන්විදුලිය ප්‍රබල ජනමාධ්‍යයක්

විය. 1980 දශකය වන විට මහවැලි ව්‍යාපෘතියත් සමඟ ලංකාවේ ගුවන් විදුලි මාධ්‍යය සුවිශේෂී විය. ජනතාවට සමීප ප්‍රජා සන්නිවේදන ක්‍රමවේදය හඳුන්වා දුන්නේ ද මෙම යුගයේ ය. බොහෝ පිරිසක් ගුවන්විදුලියට සවන් දුන්නේ තම කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වලට ගුවන්විදුලිය අත්වැලක් වූ නිසාය. 1982 ජනාධිපතිවරණයේදී සියලු අපේක්ෂකයන්ට ගුවන් විදුලියෙන් ජනතාව ආමන්ත්‍රණය කිරීමට අවස්ථාව ලබා දී ඇත. **(ජයවර්ධන, 166 පිටුව)**

ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍ය ආරම්භ වූයේ 1979 වසරේදී ය. 1979 අප්‍රේල් 14 දින ස්වාධීන රූපවාහිනිය ආරම්භ කරනු ලැබූ අතර 1979 ජූනි මාසයේ ස්වාධීන රූපවාහිනිය රජයට පවරා ගන්නා ලදී. 1982 පෙබරවාරි මාසයේ ජාතික රූපවාහිනිය පිහිටුවීමත් සමඟ ඒ වන විට රූපවාහිනී නාලිකා දෙකක් රජය සතු විය. 1982 ඔක්තෝම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණයේ දී රූපවාහිනිය මඟින් මහජනයාට බලපෑම් කිරීමට හැකි වූයේ අවම වශයෙනි. එයට හේතු වූයේ ඒ වන විටත් ලංකාවේ බොහෝ පිරිසකට රූපවාහිනී යන්ත්‍ර නොතිබීමයි. මේ නිසා සුළු පිරිසකට බලපෑම් කිරීමට මහජන මතය වෙනස් කිරීමට රූපවාහිනිය බලපෑවේ ය. කෙසේ නමුත් 1982 ජනාධිපතිවරණ සමයේ පුවත්පත, රූපවාහිනිය, ගුවන්විදුලිය යන මාධ්‍ය ත්‍රිත්වයම ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේ ය. මැතිවරණයේදී එය ප්‍රචාරණ උපකරණයක් ලෙස යොදා ගත්තේ ය.

ඩබ්ලිව් ජයවර්ධන රචිත 'අඩසියවසක දේශපාලනය' කෘතියේ සඳහන් පරිදි "රජයේ ජනමාධ්‍ය මෙන්ම රජයට සහය දුන් ජාතික යැයි කියාගනු ලබන ජනමාධ්‍ය මගින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය මතවාදී ආරවුලක් බවට පත් කරනු ලැබූ බවයි. එය කොතරම් දුර ගෙනයනු ලැබුවේ ද යත්, කොබ්බෑකඩුව මහතා ජයග්‍රහණය කළ ද ඔහු ඉවත් කළ විට ජයවර්ධන නිසැකවම ජනාධිපති බවට ප්‍රකාශ කිරීමට ඇති බව මැතිවරණ නීතියට නව අර්ථ කථනයක් ගෙන එමින් එම පක්ෂයේ ලේකම්වරයා වන බර්නාඩ් සොයිසා නිවේදනයක් නිකුත් කරනු ලැබීය. මෙවැනි අදහසක් ඉදිරිපත් කර ඇත්තේ කොල්වින් ආර් ද සිල්වා ගේ නීති තර්කයක් අනුව යමිනි. එනම් ප්‍රජා අයිතිය අහිමි වූ සිරිමාවෝ බණ්ඩාරනායක විසින් කොබ්බෑකඩුව මහතා ජනාධිපති අපේක්ෂකයා ලෙස නම්කර තිබීම හේතු කොටගෙන කොබ්බෑකඩුව ජයග්‍රහණය කළද ඔහුට ජනාධිපති පදවියට හිමිකම් කිව නොහැකි බවයි. මෙම තර්කයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අර්බුදයට ලක් කළේය. ඔවුන් පිළිබඳ ඡන්ද දායකයා තුළ තිබූ කැමැත්ත දුර්වල කළේය. ඡන්ද දායකයා ව්‍යාකූල බවට පත් විය." මෙවැනි කරුණු මගින් පැහැදිලි වන්නේ 1982 ජනාධිපතිවරණයේ දී ප්‍රචාරණ කටයුතු උදෙසා ජනමාධ්‍ය ප්‍රබල භූමිකාවක් ඉටු කර ඇති බවයි.

1988 ජනාධිපතිවරණය සහ ඡන්දදායකයා

1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයෙකුගේ නිල කාලය අවසන් වීමෙන් පසු නැවත ජනාධිපතිවරණයක් පැවැත්විය යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවේ දෙවැනි ජනාධිපතිවරණය 1988 දෙසැම්බර් 19 වනදා පවත්වනු ලැබීය. මේ සඳහා නාමයෝජනා භාර දුන් අය අතර,

- එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් රණසිංහ ප්‍රේමදාස
- ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් සිරිමාවෝ බණ්ඩාරනායක

- එක්සත් සමාජවාදී පෙරමුණෙන් ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ඔසී අබේගුණසේකර

යන අය වේ. 1988 යනු ශ්‍රී ලංකාවේ බිහිසුනු සමාජ වාතාවරණයක් පැවති සමයකි. දැඩි අර්බුදකාරී තත්ත්වයකට රට මුහුණ දෙමින් තිබුණි. උතුරේ ත්‍රස්තවාදී ක්‍රියා තිබිය දී තවත් අතකින් ජනතා විමුක්ති පෙරමුණේ භීෂණකාරී ක්‍රියාවක් නිසා රටේ ජනතාව විශාල කම්පනයකට හසුව සිටියේ ය. මෙම බිහිසුනු කාරී තත්ත්වය හේතුවෙන් රට ව්‍යාකූලව පැවතුණි. 1988 යනු මෙරට ඉතිහාසයේ පෙර නොවූ විරූ අයුරින් දැඩි මර්දනකාරී තත්ත්වයන් සහිත සමයක් වීම නිසා ජනතාවට නිදහසේ තම ජීවිකාව ගෙන යාමට ද අපහසු විය. මෙවැනි තත්ත්වයක් තුළ හිඳිමින් ජනාධිපතිවරණයක් පැවැත්වීම අපහසු නිසා පාර්ලිමේන්තුව විසුරුවා හැර භාරකාර ආණ්ඩුවක් යටතේ ජනාධිපතිවරණය පැවැත්වීමට විවිධ දේශපාලන සංවිධාන සහ දේශපාලන පක්ෂ රජයෙන් ඉල්ලා සිටිය ද රජය පාර්ලිමේන්තුව විසුරුවා නොහැර 5/6 ක බලයෙන් ජනාධිපතිවරණය පැවැත්වීමට කටයුතු යොදා ඇත. **(ජයවර්ධන, 217 පිටුව)**

ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීමත් සමඟ රටේ ප්‍රචණ්ඩකාරී වාතාවරණය ඉහළ නැගුණි. මිනිස් ඝාතන, පැහැර ගැනීම් දිනෙන් දින ඉහළ ගියේය. පොදු ජනතාවට නිදහසේ රාජකාරි කටයුතු සිදු කිරීමට ද නොහැකි විය. ජනතා විමුක්ති පෙරමුණේ මෙම ප්‍රචණ්ඩකාරී හැසිරීම් නිසා එක්සත් ජාතික පක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෙන්ම අනෙකුත් දේශපාලන පක්ෂ වල ප්‍රචාරණ කටයුතු වලට බාධා ඇති විය.

මැතිවරණ දිනයේ ඡන්දදායකයාට ඡන්ද පොළ වෙත යාමට පවා නොහැකි තත්ත්වයක් උදා විය. ඡන්ද දින බෝම්බ පිපිරවීම් මිනීමැරුම් මෙන්ම මැතිවරණ නිළධාරීන්ට සිය රාජකාරී කටයුතු සිදු කිරීමට පවා නොහැකි විය. මොනරාගල දිස්ත්‍රික්කයේ දරුණු භීෂණ ක්‍රියා සිදු වූ අතර ඡන්ද මධ්‍යස්ථාන 49 ක් වසා දමා ඇත. මෙවැනි හේතු කාරණා නිසා ඡන්ද දායකයාට සිය කැමැත්ත ප්‍රකාශ කිරීමට නොහැකි විය. ඔවුන්ගේ වටිනා ඡන්දය ජනාධිපතිවරයා තෝරා ගැනීමට භාවිත කළ නොහැකි විය. එමෙන්ම බහුතරයකට ඡන්ද කාඩ් පත් ද අහිමි වී තිබුණි. මෙවැනි කරුණු නිසා 1988 ජනාධිපතිවරණයේ දී ඡන්ද දායකයාගේ හැසිරීම ඉතාමත් කලබලකාරී විය. ඔවුන්ගේ ඡන්දය භාවිතය අවම විය. මෙවැනි වාතාවරණයක පැවැත්වූ ඡන්දයෙන් රණසිංහ ප්‍රේමදාස මහතා මනාප 25,69,199 ක් ලබා ගනිමින් ජනාධිපතිවරයා ලෙස තේරී පත් විය. එය ප්‍රතිශතයක් ලෙස 50.45% කි.

1982 පැවති ජනාධිපතිවරණයේ දී ඡන්ද දායකයාගේ සහභාගිත්වය ඉතා ඉහළ මට්ටමක පැවතුණි. ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණය 81.1% දක්වා ඉහළ ගොස් තිබුණි. නමුත් 1988 ජනාධිපතිවරණයේ දී රටේ පැවති බිහිසුණුකාරී තත්ත්වය මත ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව 55.32% ක් වැනි අවම ප්‍රමාණයක් විය. මේ පිළිබඳව වික්ටර් අයිවන් ''පෑන අහිංසකද'' කෘතියෙහි මෙසේ අදහස් දක්වා ඇත.

''මගේ මතයට අනුව 1988 ජනාධිපති වරණයෙන් ප්‍රේමදාස මහතාට ජයගත හැකි වුයේ ජේ.වී.පී. දෙවැනි කැරැල්ල රටේ ඇති කර තිබුණු බිහිසුණු වාතාවරණය නිසාය. ජනතා විමුක්ති පෙරමුණ ජනාධිපතිවරණය තහනම් කොට ජනාධිපතිවරණය වෙනුවෙන් වැඩ කරන විවිධ පාක්ෂිකයන් මරා දැම්මේ ය. ඡන්ද මධ්‍යස්ථානවලට පහර දුන් අතර ඡන්ද නිළධාරීන්ට ගණනාවක් ද මරා දැම්මේය. රටේ පැවති මෙම

බිහිසුණු වාතාවරණය ප්‍රේමදාස මහතා තමන්ගේ වාසියට හේතු වන ලෙස කළමනාකරණය කිරීමට සමත් විය.' **(අයිවන්, 259 පිට)**

මැතිවරණ සමයේ ඡන්දය භාවිත කරන්නන්ගේ අනුපාතිකයේ අතිවිශාල ප්‍රමාණයක් පහත වැටීම කෙරෙහි ජනාධිපතිවරණ කාලයේ පැවති භීෂණ වට පිටාව බලපෑවේය. කෙසේ නමුත් 1988 ජනාධිපතිවරණ සමයේ ඡන්ද දායකයාගේ භූමිකාව ව්‍යාකූළ ස්වරූපයක පැවතුණු බව ඉහත කරුණු මගින් පැහැදිලි වේ.

1988 ජනාධිපතිවරණය හා ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය

1988 වන විට ජනාමාධ්‍යයට ද විවිධ තර්ජන බලපෑම් එල්ල විය. විශේෂයෙන් පුවත්පත් කලාවේදීන්ට මරණ තර්ජන එල්ලවීම්, පැහැර ගැනීම්, මිනී මැරුම් වැනි ප්‍රචණ්ඩ ක්‍රියා සිදු විය. 1988 ජනාධිපතිවරණයේදී ජනමාධ්‍යයේ භූමිකාව පිළිබඳ සාකච්ඡා කළ විට පෙනී යන්නේ එක්සත් ජාතික පක්ෂය තම ප්‍රාචාරණ කටයුතු සඳහා ප්‍රබල ලෙස මාධ්‍ය යොදාගෙන ඇති බවයි. ආණ්ඩුවේ අපේක්ෂකයාගේ ජයග්‍රහණය සඳහා ගුවන් විදුලිය හා රූපවාහිනිය ප්‍රබල භූමිකාවක් ඉටු කළේය. එවකට ලේක් හවුස් පුවත්පත් වලට විවිධ තර්ජන එල්ල වුවද රාජ්‍ය අපේක්ෂකයා වන ආර් ප්‍රේමදාස දිනවීමේ ප්‍රයත්නයේ ඔවුන් ද නිරත වුණි. එමෙන්ම කොමියුනිස්ට් පක්ෂයේ පුවත්පත වන ''ඇත්ත'' පුවත්පතට ද විවිධ බලපෑම් එල්ල විය. නමුත් රූපවාහිනිය මගින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට ප්‍රේමදාස ජනාධිපතිවරයා ඉඩ ලබා නොදුණි.

1994 ජනාධිපතිවරණය හා ඡන්දදායකයා

1993 මැයි පළමුවන දින රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා බෝම්බයකට හසු වී හදිසියේ මරණයට පත් වීමත් සමඟ එවකට අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කළ ඩී.බී. විජේතුංග මහතා ජනාධිපතිවරයා ලෙස පාර්ලිමේනතුවේ අනුමැතියෙන් කටයුතු කළේය. නමුත් ඔහුට වැඩි කලක් ගත වන්නට පෙර නැවත මහ මැතිවරණයත් සමඟ ජනාධිපතිවරණයක් පැවැත්වීමට කටයුතු සූදානම් කළේය. මෙවර පැවැත්වීමට නියමිත වූයේ ශ්‍රී ලංකාවේ තුන්වන ජනාධිපතිවරණයයි. එනම් ලංකාවේ හතරවැනි ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ මැතිවරණයයි. මහමැතිවරණය පවත්වා අවසන් වීමෙන් පසුව ජනාධිපතිවරණය පැවැත්වීමට නාම යෝජනා කැඳවනු ලැබී ය. ඒ සඳහා

- පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් එවකට අගමැති චන්ද්‍රිකා බණ්ඩාරනායක
- එක්සත් ජාතික පක්ෂයේ ගාමිණී දිසානායක

  යන දෙදෙනා ප්‍රධාන පක්ෂ දෙකෙන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වූ අතර ඊට අමතරව

  - නිහාල් ගලප්පත්ති
  - හරිස්චන්ද්‍ර විජේතුංග
  - ඒ. ජේ.රණසිංහ
  - හඩ්සන් සමරසිංහ

යන අයද ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා භාර දෙනු ලැබීය. ශ්‍රී ලංකාවේ තුන්වන ජනාධිපතිවරණ ප්‍රචාරණ කටයුතු අතර තුර ත්‍රස්තවාදීන් විසින් බෝම්බයක් පිපිරවීම හේතුවෙන් එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂක ගාමිණී දිසානායක ඇතුළු 16 දෙනෙක් මිය ගියේ ය. මේ නිසා 1994 ඔක්තෝම්බර් 26 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ ඒ බව ඡන්ද කොමසාරිස් වරයා විසින් ප්‍රකාශයට පත් කරමින් ගාමිණී දිසානායකගේ බිරිඳ ශ්‍රීමා දිසානායක නාමිකව එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂිකාව ලෙස පත් කරනු ලැබිණි. ජනාධිපතිවරණය පැවැත්වුයේ 1994 නොවැම්බර් 09 වනදා ය. 1988 ජනාධිපතිවරණයට සාපේක්ෂව මෙවර ජනාධිපතිවරණයේ දී ඡන්දය භාවිත කළ ප්‍රමාණය 70.47% දක්වා ඉහළ ගොස් තිබුණි. මෙම ජනාධිපතිවරණයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය ජයග්‍රහණය කළේ ඡන්ද 47,09,205 ක් ලබා ගනිමින් එය ප්‍රතිශතයක් වශයෙන් 62.28% කි.

ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති ජනාධිපතිවරණයන්ගෙන් ඉහළම ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත් ජනාධිපතිවරිය ලෙස චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය තේරීපත් විය. මෙම මැතිවරණයේ අවලංගු ඡන්ද ප්‍රතිශතය ද 1.97% ක් අවම මට්ටමක පැවතුනි. ඊට හේතුවුයේ ඡන්ද ක්‍රමය පිළිබඳව ඡන්ද දායකත්වයන්ට තිබු අවබෝධය බව ජනාධිපතිවරණය පිළිබඳ විදෙස් නිරීක්ෂණ වාර්තාවල සඳහන් වේ.

1994 ජනාධිපතිවරණය සහ ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය

1994 ජනාධිපතිවරණය පැවති කාල සීමාව වන විට ලංකාවේ පුවත්පත, ගුවන් විදුලිය සහ රූපවාහිනිය සක්‍රීය ප්‍රචාරක මාධ්‍ය බවට පත් විය. 1994 මැතිවරණයේ දී "මාධ්‍ය නිදහස ලබා දීමේ" තේමා පාඨය චන්ද්‍රිකා බණ්ඩාරනායක විසින් භාවිත කළේය. මෙම ජනාධිපතිවරණ ප්‍රචාරණය ක්‍රියාවලියේ දී ජනමාධ්‍යවේදීන් විශාල සහයෝගයක් ලබා දුන්නේ ය. ඔවුන්ගේ ප්‍රධානතම ඉල්ලීම වුයේ පූර්ණ මාධ්‍ය නිදහස මාධ්‍යවේදීන්ට දිය යුතු බවයි. මෙවැනි හේතු නිසා චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ ''මාධ්‍ය නිදහස'' යන්න සිය මැතිවරණ පොරොන්දුවක් බවට ද පත් විය. **(දොඩංගොඩ, 19 පිටුව)**

රණසිංහ ප්‍රේමදාස මහතා, ජනාධිපතිවරයා ලෙස කටයුතු කරන යුගයේ දේශපාලන මතවාද සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු සිදු නොකරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. නමුත් 1994 ජනාධිපතිවරණයේ දී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ස්වාධීන රූපවාහිනී සේවය ආණ්ඩු පක්ෂයට හිතවාදී මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු කළේය. මේ පිළිබඳ රජිත් කීර්ති තෙන්නකෝන් විසින් මෙසේ අදහස් දක්වා ඇත.

''1994 මහමැතිවරණයේදී රාජ්‍ය මාධ්‍ය හැර අන් සියලු මාධ්‍ය පොදු ජන පක්ෂයේ පෙරමුණට සහය දක්වන බව මතු පිටින් දැකිය හැකි විය. 1994 ජනාධිපතිවරණයේ දී ගාමිණී දිසානායක එ.ජ.ප අපේක්ෂකයා බවට පත් වීමත් සමඟ ඔහුගේ ඝාතනයෙන් පසුව ශ්‍රීමා දිසානායක එ.ජා.ප අපේක්ෂිකාව වීමත් හේතුවෙන් රජයේ සහ සියලු ජනමාධ්‍ය පො.එ.පෙ ස්වරයකට තල්ලු වී යයි.'' **(තෙන්නකෝන්, 36 පිටුව)**

1999 ජනාධිපතිවරණයේ සහ ඡන්දදායකයා

ශ්‍රී ලංකාවේ සිව්වැනි ජනාධිපතිවරණය 1999.12.21 දින පැවැත්විය. මෙම ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිතව තිබුණේ 2000 වසරේ නොවැම්බර් මාසයේ වුවද එවකට ජනාධිපති ධූරයේ සිටි චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තමන්ට ලැබී ඇති බලතල අනුව වසරකට පෙර පැවැත්වීමට කටයුතු සූදානම් කළේය. ඒ අනුව සිව්වැනි ජනාධිපතිවරණය සඳහා 1999 නොවැම්බර් මස 16 දින නාමයෝජනා යනු භාරගනු ලැබීය. මෙම ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෝ 13 දෙනෙකු ඉදිරිපත් විය. ඒ අතර,

- පොදුජන එක්සත් පෙරමුණේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය
- එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහතා

යන අය ප්‍රධාන අපේක්ෂකයන් ලෙස ජනාධිපතිවරණය සඳහා තරග වැඳුණි. ඒ හැරුණු විට නන්දන ගුණතිලක, හරිස්චන්ද්‍ර විජේතුංග, ඩබ්.වී.ඇම් රංජිත්, රජිව් විජේසිංහ, වාසුදේව නානායක්කාර, ටෙනිසන් එදිරිසූරිය, අබ්දුල් රසූල්, කමල් කරුණාදාස, හඩ්සන් සමරසිංහ, ආරියවංශ දිසානායක, අල්විස් වීරක්කොඩි යන අපේක්ෂකයන්ද මෙම ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් විය. එක්සත් ජාතික පක්ෂයෙන් තරග වැදුනු රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධාන තේමා පාඨය බවට පත් වුයේ "රටට සාමය උදා කිරීම" යන්නයි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කියා සිටියේ "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා නව ව්‍යවස්ථාවක් සකස් කිරීමට තමන්ට ජන වරමක් ලබා දෙන ලෙසයි."

මැතිවරණය ආසන්න වන විට චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය ඇගේ අවසාන මහජන රැළියේ දී බෝම්බ ප්‍රහාරයකට ලක්විය. මෙවැනි ක්‍රියා මගින් ඇය මරණයට පත් කිරීමට තැත් කළ ද ඇය සුළු තුවාල වලට ලක්ව ඇසක් අහිමි විය. මෙම සිද්ධිය වුයේ 1999.12.18 දින රාත්‍රියේ ය. එදිනම එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ ගේ පක්ෂ රැළියකදී බෝම්බ ප්‍රහාරයක් එල්ල වී එවකට සිටි විශ්‍රාමික හමුදා ප්‍රධානියෙකු වන ලකී අල්ගම ඝාතනයට ලක් විය.

1999 හතරවැනි ජනාධිපතිවරණයේ තීරණාත්මක අවස්ථාව පිළිබඳව ආචාර්ය එස්.අයි. ගමගේ දැක්වූ අදහස් මෙසේ ය.

''මෙම ජනාධිපතිවරණයේ දී ජන රැල්ල එක්රොක් වී තිබුනේ එ.ජ.ප ජනාධිපති ධූරාපේක්ෂක රනිල් වික්‍රමසිංහ වෙතය. බොහෝ අයගේ විශ්වාසය වූයේ එ.ජා.ප නායකයා ජනාධිපතිවරණයෙන් ජයගන්නා බවයි. එහෙත් එල්.ටී.ටී.ඊ සංවිධානය එය වෙනස් කළේය. චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිවරියට එල්ල කළ බෝම්බ ප්‍රහාරය නිසා සහ ඇය සුළු අසනීප තත්ත්වයකට පත් වීම නිසා සහ රෝගී තත්ත්වයෙන් 1999.12.19,20 සහ 21 දිනවලත් රූපවාහිනියෙන් ජනතාව ඇමතීම නිසා ජනතාවගේ අනුකම්පාව බණ්ඩාරනායක කෙරෙහි යොමු වන්නට විය. **(ගමගේ, 23 පිටුව)**

කෙසේ නමුත් 1999 පැවැත්වුණු සිව්වන ජනාධිපතිවරණයේ දී පොදුජන එක්සත් පෙරමුණේ අපේක්ෂිකාව වන චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය ජයග්‍රහණය කළේ 51.12% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමිනි. මෙය විශිෂ්ට ජයග්‍රහණයක් නොවීමට හේතු වූයේ එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ ද

42.7% ක ඡන්ද ප්‍රතිශතයකට හිමි කම් කියූ නිසාවෙනි. ඒ අනුව රටේ ජනාධිපති ලෙස දෙවනි වරටත් චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය තේරීපත් විය.

මෙම මැතිවරණය සාමකාමී අයුරින් පැවැත්වීම හේතු කොටගෙන ඡන්ද දායකයාගේ සහභාගිත්වය ඉහළ මට්ටමක පැවතුනි. මෙම මැතිවණයේ දී වලංගු ඡන්ද සංඛ්‍යාව 77.69% ක් වූ අතර ඉන් ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව 2.31% ක ප්‍රමාණයකි. ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව 73% ක් දක්වා ඉහළ මට්ටමක තිබුණි. මේ වන විට ඡන්ද දායකයා ජනාධිපතිවරණයක දී ඡන්දය භාවිත කළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක සිටින බවට නිගමනය කළ හැකි ය.

1999 වර්ෂයේ ජනාධිපතිවරණයේ මාධ්‍ය ක්‍රියාකාරීත්වය

1999 ජනාධිපතිවරණයේ දී ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය කළ විට පැහැදිලි වන්නේ මාධ්‍ය වැඩි ඉඩකඩක් වෙන් කරන ලද්දේ චන්ද්‍රිකා බණ්ඩාරනායක වෙත ය. ඇය මුහුණ දුන් හදිසි තත්ත්වය මීට හේතු වන්නට ඇති බව නිගමනය කළ හැකි ය. චන්ද්‍රිකා බණ්ඩාරනායක ඝාතනය කිරීමේ අරමුණින් එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් ඇයට එක් ඇසක් අහිමි විය. මේ නිසා ජනමාධ්‍ය හරහා නිතර ඒ පිළිබඳ කතාබහට ලක් විය.

1999 ඔක්තෝම්බර් 20 සිට දෙසැම්බර් 21 දක්වා ජනාධිපතිවරණ පූර්ව ප්‍රචාරක සමයේ දී රජය සතු පුවත්පත් පාලන පක්ෂයට නැඹුරු ආවරණ, ප්‍රවෘත්ති විශේෂාංග, කතුවැකි 1451 ක් පළ කරන විට එක්සත් ජාතික පක්ෂයට නැඹුරු විශේෂාංග පළ වූයේ 135 ක් පමණි. පො.එ.පෙ ට අවාසිදායක එකම එක් ලිපියක් පමණක් පළ කරන විට අවස්ථා 529 ක දී එ.ජා.ප. ය විවේචනය විය. **(තෙන්නකෝන්, 37 පිටුව)**

මෙහි සඳහන් වන්නේ පුවත්පත් වල පළ වූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳවය. රූපවාහිනිය පිළිබඳ අධ්‍යයනය යොමු කිරීමේදී රාජ්‍ය මාධ්‍ය වන ජාතික රූපවාහිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක පිළිබඳ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම ඉහළ මට්ටමක තිබී ඇත. කෙසේ නමුත් 1999 ජනාධිපතිවරණයේ චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ ජයග්‍රහණය උදෙසා මාධ්‍ය ක්‍රියාකාරිත්වය ප්‍රබලව බලපාන්නට ඇතැයි නිගමනය කළ හැකිය.

2005 ජනාධිපතිවරණය සහ ඡන්දදායකයා

ශ්‍රී ලංකාවේ පස්වැනි ජනාධිපතිවරණය පැවැත්වීම චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිවරියගේ කැමැත්ත පරිදි සිදු වූවක් නොවේ. පස් වැනි ජනාධිපතිවරණය පැවැත්වීම පිළිබඳ විවිධ ගැටලු මතු විය. 2005 වසර වන විට ජනාධිපතිධූරයේ කාලය අවසන් වන බවට මුලින්ම අදහස් ඉදිරිපත් කළේ එක්සත් ජාතික පක්ෂයයි. ඉන් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ජාතික හෙළ උරුමයත් මෙම මතයට එකඟ වෙමින් 2005 වසරේ ජනාධිපතිවරණය පැවැත්විය යුතු බවට යෝජනා කළේය. පස්වැනි ජනාධිපතිවරණය පිළිබඳ විවිධ මතවාද විවේචන ඉදිරිපත් වනවාත් සමඟ ජනාධිපතිවරණය පැවැත්විය යුතු බව ප්‍රකාශ කරමින් 2005 ජූලි මාසයේ උද්ඝෝෂණයක් ද ක්‍රියාත්මක විය. ඒ එක්සත් ජාතික පක්ෂය විසින් දෙවුන්දර තුඩුව දක්වා විශාල ජනබල මෙහෙයුමක් මෙහෙය වමින් පා ගමනක් යාමෙනි.

එමෙන්ම 2005 වසරේ ජනාධිපතිවරණය පැවැත්විය යුතු බවට මතවාදයක් ගොඩ නගමින් ජාතික හෙළ උරුමය විසින් අධිකරණයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර ඇත. අධිකරණයට ඉදිරිපත් වූ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විභාග කරමින් තීන්දුව දුන්නේ 2005 වසරේ ජනාධිපතිවරණය පවත්වන ලෙසයි.

කෙසේ නමුත් මෙවැනි අර්බුදකාරී වාතාවරණයකින් පසු ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා කැඳවනු ලැබීය. ඒ අනුව,

- එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් රනිල් වික්‍රමසිංහ මහතා
- එක්සත් ජනතා නිදහස් සංධානයෙන් මහින්ද රාජපක්ෂ මහතා

යන අය ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා ලෙස මැතිවරණයට ඉදිරිපත් විය. මෙම මැතිවරණය සඳහා අපේක්ෂකයන් 13 දෙනෙකු ඉදිරිපත් වූ අතර අනෙක් එකොලොස් දෙනා වන්නේ සිරිතුංග ජයසූරිය, අචල අශෝක සුරවීර, වික්ටර් හෙට්ටිගොඩ, චමල් ජයනෙත්ති, අරුණ ද සොයිසා, විමල් ගීගනගේ, අනුර ද සිල්වා, අජිත් කුමාර ජයවීර, විජේ ඩයස්, ජී නෙල්සන් පෙරේරා, එච් ශාන්ත යන අයයි.

2005 නොවැම්බර් 17 දින පැවැත්වීමට නියමිත තිබූ ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේදී මහින්ද රාජපක්ෂ මහතා සිය ''මහින්ද චින්තනය'' නම් ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළේය. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික හෙළ උරුමය ද සහය පළ කර ඇත.

2005 නොවැම්බර් 17 දින පැවති ජනාධිපතිවරණයේ දී ඡන්ද දායකයාගේ හැසිරීම පිළිබඳව සාකච්ඡා කළ විට හඳුනාගත හැකි වන්නේ ඡන්ද දායකයා සක්‍රීය ලෙස මැතිවරණයේ දී ඡන්දය භාවිත කර ඇති බවයි. මහින්ද රාජපක්ෂ සහ රනිල් වික්‍රමසිංහ යන අපේක්ෂකයන් දෙදෙනාටම රටේ ජනතාව කැමැත්ත පළ කර ඇති බව හඳුනාගත හැකිය. කෙසේ නමුත් 50.29% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් මහින්ද රාජපක්ෂ මහතා ශ්‍රී ලංකාවේ හත් වෙනි ජනාධිපති වරයා ලෙස තේරී පත් විය. රනිල් වික්‍රමසිංහ ලබා ගත හැකි වූයේ 48.73% ක ඡන්ද ප්‍රතිශතයකි. උතුරේ ඡන්දය වර්ජනය කරන ලෙස එල්.ටී.ටී.ඊ සංවිධානය ජනතාවට නියෝග කිරීම නිසා ඡන්දය සඳහා සහභාගිත්වය අවම මට්ටමක පැවතුනි. එසේ නොවුනි නම් ඇතැම් විට එ.ජා.ප අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතා ජයග්‍රහණය කරනු ඇත.

කෙසේ නමුත් මෙම මැතිවරණයේ ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණය 73.14% ත් වූ අතර ඉන් ප්‍රතික්ෂේප වූයේ 1.12% ක් වැනි සුළු ප්‍රමාණයකි. මේ වන විට ඡන්ද දායකයා මැතිවරණය මනාප භාවිතය පිළිබඳ පැහැදිලි අවබෝධයක සිටින්නට ඇත. ඒ වන විට ලංකාවේ ජනමාධ්‍ය ව්‍යාප්තිය ඉහළ මට්ටමක පැවතුනි. සෑම නිවසකම පාහේ රූපවාහිනී යන්ත්‍රයක් තිබූ අතර ඡන්දය පිළිබඳ විවිධ වැඩසටහන් ඉදිරිපත් කිරීම නිසා මහජනතාව මැතිවරණය පිළිබඳ මහත් උනන්දුවක් දැක්වීය.

2005 ජනාධිපතිවරණයේ දී මාධ්‍ය ක්‍රියාකාරිත්වය

2005 ජනාධිපතිවරණයේ දී රාජ්‍ය මාධ්‍ය වන ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනී සේවය මහින්ද රාජපක්ෂ මහතා වෙත වැඩි නැඹුරුවක් දක්වීය. ඔහුගේ ප්‍රතිරූප වර්ධනයෙහිලා ඉතා ප්‍රබල ලෙස රාජ්‍ය මාධ්‍ය පෙනී සිටි අතර බහුතරයක් පෞද්ගලික මාධ්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවෙන් පෙනී සිටියේ ය. සිරස TV, සිරස FM එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ප්‍රචාරණ කටයුතු සිදු කළේ ය.

මෙම මැතිවරණයේ දී පුවත්පත් මාධ්‍යයේ හැසිරීම දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වූයේ ලක්බිම සහ දිවයින පුවත්පත් පොදු පුවත් සඳහා වැඩි ඉඩක් ලබා දී ඇති බවයි. කිසියම් දේශපාලන පක්ෂයක් වෙනුවෙන් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමක් දක්නට නොලැබේ. නමුත් සිළුමිණ වැනි පුවත්පත් එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කළේ ය. දිනමිණ පුවත්පතද එසේම ය. දිනමිණ පුවත්පත මගින් එක්සත් ජාතික පක්ෂය විවේචනය කළේ ය.

2010 ජනාධිපතිවරණය හා ඡන්දදායකයා

මෙතෙක් පැවති ජනාධිපතිවරණ අතුරින් 2010 පැවති ජනාධිපතිවරණය සඳහා වැඩිම ජනාධිපතිධූර අපේක්ෂකයින් ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇත. එනම් 2010 ජනාධිපතිවරණයේ දී පිළිගත් දේශපාලන පක්ෂවලින් අපේක්ෂකයන් 17 දෙනෙකු සහ ස්වාධීන කණ්ඩායම් වලින් අපේක්ෂකයන් 05 දෙනෙකු ජනාධිපතිධූරයට තරග වැදුනි. තවත් විශේෂ කරුණක් වූයේ මෙම ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වූ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාගෙන් සරත් ෆොන්සේකා යනු මීට පෙර දේශපාලන ක්ෂේත්‍රයේ නොසිටි පුද්ගලයෙකු වීමයි. කෙසේ නමුත් මෙම ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වූ ප්‍රධාන අපේක්ෂකයන් වූයේ,

- එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහින්ද රාජපක්ෂ මහතා
- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ සරත් ෆොන්සේකා මහතා

මේ හැරුණු විට මොහොමඩ් කාසිම් ඉස්මයිල්, අචල අශෝක සුරවීර, ජනක සුගත්සිරි ගමගේ, ඩබ්ලිව්.වී.එම් ගමගේ, ඒ.එස්.පී ලියනගේ, සරත් මන්මේන්ද්‍ර, එච්.කේ සිවාජිලිංගම්, උක්කු බණ්ඩා විජේකේන්, ලාල් පෙරේරා, සිරිතුංග ජයසූරිය, වික්‍රමභාහු කරුණාරත්න, මොහොමඩ් ඉල්ලියාස්, විජේ ඩයස්, සනත් පින්නදූව, මොහොමඩ් මුස්තාපා, බත්තරමුල්ලේ සීලරතන හිමි, සේනාරත්න ද සිල්වා, අරුණ ද සොයිසා, සරත් කෝන්ගහගේ, මුතුබණ්ඩාර තැමිණිමුල්ල යන අයද ජනාධිපතිරණය සඳහා තරග වැදුණි. ලෝකයේ රටක් තුළ ඇති වූ දැඩි ප්‍රචණ්ඩකාරී යුද්ධයක් ලෙස ද මෙය හැඳින්විය හැකිය. එවකට ජනාධිපතිව සිටි මහින්ද රාජපක්ෂ ගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා යුධ හමුදාව ජනරාල් සරත් ෆොන්සේකා ඇතුළු යුද්ධ හමුදාව ත්‍රස්තවාදය තුරන් කිරීමේ මෙහෙයුමට මූලිකත්වය ගත්තේ ය. යුද්ධය ජයග්‍රහණය කරා මෙහෙයවීම නිසා සියලු ජනතාව රටේ නායකයන් කෙරෙහි යහපත් ප්‍රතිරූපයක පසු විය. කෙසේ නමුත් 2009 වසරේ මැයි 18 වන දින ලංකාවේ ත්‍රස්තවාදී භීෂණය නිමාවීමත් සමඟ 2010 වසරේ හයවන විධායක ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ මැතිවරණ සටන ඇරඹුණි. ඉහත අපේක්ෂකයන් දෙදෙනා අතර තියුණු තරගයක් දක්නට ලැබුනි. ඒ අනුව 2010 ජනවාරි 26 දින පැවැත් වූ ජනාධිපතිවරණයෙන් 57.88% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් මහින්ද රාජපක්ෂ මහතා දෙවනි වරටත්

රටේ විධායක ජනාධිපතිවරයා ලෙස තේරී පත් විය. ජනරාල් සරත් ෆොන්සේකා මහතාට ලබා ගත හැකි වූයේ 40.15% ක ඡන්ද ප්‍රතිශතයකි.

මෙම මැතිවරණය සඳහා ඡන්දදායකයා මහත් උනන්දුවක් දැක්වී ය. ඊට එක් හේතුවක් වූයේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති දරුණු යුද්ධයක් අවසන් වීමෙන් පසු රටේ සියලුම ප්‍රදේශවල ජනතාව මුහුණ දෙන නිදහස් මැතිවණය මෙය බවට පත් වීමයි. අනෙක් කරුණ වන්නේ මෙම මැතිවරණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන් දෙදෙනාම යුද්ධය නිමා කිරීම සඳහා සැබෑ නායකයන් බවට පත් වීමයි. මේ නිසා කුමන අපේක්ෂකයා වෙත තම මනාපය දක්වන්නේ ද යන ආන්දෝලනාත්මක ගැටලුව ඡන්ද දායකයා තුළ ඇති විය. මෙම මැතිවරණයේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 1,40,88,500 ක් වූ අතර එයින් ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව 1,04,95,451 ක් විය. මෙම ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස 74.4% ක් වූ අතර ප්‍රතික්ෂේප ඡන්ද ප්‍රමාණය වූයේ 0.0970% ක් වැනි සුළු ප්‍රමාණයක් වීම විශේෂත්වයකි.

රටේ බහුතර ඡන්ද දායකයන් පිරිසක් මෙම මැතිවරණය සඳහා සහභාගී විය. පසුගිය වර්ෂවලදී පැවති සියලු මැතිවරණ කාල සීමා තුළ රටේ විවිධ ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් ද ගොඩනැගී තිබුණි. නමුත් යුද්ධය නිමා කිරීමෙන් පවත්වනු ලැබූ පළමු මැතිවරණය නිසා උතුරේ දෙමළ ජනතාව ද මෙම මැතිවරණයට සක්‍රිය ලෙස දායක වීම විශේෂ අවස්ථාවකි.

2010 ජනාධිපතිවරණයේ මාධ්‍ය ක්‍රියාකාරිත්වය

2010 ජනාධිපතිවරණයේ දී රාජ්‍ය මාධ්‍ය දැඩි පක්ෂග්‍රාහීව ක්‍රියා කරමින් විපක්ෂයේ පොදු අපේක්ෂකයා දැඩි ලෙස විවේචනයට ලක් කළේය. ඒ අතුරින් ජාතික රූපවාහිනය සහ ස්වාධීන රූපවාහිනිය ප්‍රධාන වේ. මේ වන විට නව මාධ්‍ය මගින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු බහුලව සිදු කෙරුණි. facebook වෙබ් අඩවියේ "Green blood" නම් පිටුවේ සරත් ෆොන්සේකා දිනවීමට ප්‍රචාරණ කටයුතු සිදු කර ඇත. "Lanka Political" යන ෆේස් බුක් පිටුවේ මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කරවීමට මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කර ඇත. එමෙන්ම "Lanka C News" වෙබ් අඩවිය හරහා ජෙනරාල් සරත් ෆොන්සේකා දැඩි ලෙස විවේචනය කළේය.

2010 වන විට රටේ තරුණ ප්‍රජාව වඩාත් සමීප වූයේ නව මාධ්‍යටය. Facebook, twitter , you tube, yahoo වැනි විවිධ සමාජ ජාල මෙන්ම Gossip Lanka , Lanka E News , Lanka C News වැනි වෙබ් අඩවි පරිහරණය කරන තාක්ෂණික තරුණ ප්‍රජාවක් රට තුළ නිර්මාණය විය. මේ නිසා 2010 ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා නව මාධ්‍ය යොදා ගැනීමත් සමඟ රටේ තරුණ ඡන්ද දායකයන්ගේ ඡන්දය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ හැකි විය. නව මාධ්‍ය ඔස්සේ විවිධ අපහාස ප්‍රචාරණය කටයුතු සිදු වීම බහුලය. නමුත් ඒ සියල්ල පිළිබඳ සලකා බලනවා මිස ස්වාධීන මතවාදයක් තුළ හිඳිමින් ඡන්දය ප්‍රකාශ කිරීම තරුණ ප්‍රජාව තුළ දක්නට නොමැත. ලංකාවේ තරුණ ජනයාගේ මනාපය තීරණය කිරීමට මේ කාල සීමාව වන විට නව මාධ්‍ය සෘජු බලපෑමක් එල්ල කරයි.

2010 ජනාධිපතිවරණ අපේක්ෂකයන් දෙදෙනාම ත්‍රස්තවාදයෙන් රට මුදවා ගැනීමේ මෙහෙයුමට මූලිකත්වය ගෙන ක්‍රියා කළ නිසා දෙදෙනාටම ජනතා ප්‍රසාදය හිමි වී තිබුණි. ජයග්‍රහණය කරන්නේ

කවුරුන්ද? යන්න පැහැදිලිව නිගමනය කළ නොහැකි විය. මෙම මැතිවරණයේ ප්‍රචාරණ කටයුතු අතර තුර සරත් ෆොන්සේකා විසින් කළ ප්‍රකාශයක් 2009 දෙසැම්බර් 13 දින Sunday Leader පුවත්පතේ පල විය. එනම් ''Gota ordered them to be shoot - General Sarath Fonska'' යන සිරස්තලය සහිත ප්‍රවෘත්තියයි. මෙම පුවත නිසා ජනතාව තුළ ජාතිවාදී හැඟීම් ඇවිස්සීමක් සිදු කළ බව කියමින් සියලු මාධ්‍ය සරත් ෆොන්සේකා විවේචනය කළේ ය. දේශද්‍රෝහී ලෙස රට පාවාදීමක් ලෙස ද පුවත්පත් වල සඳහන් විය. සුදු කොඩි නඩුව නමින් ප්‍රචලිත වූ මෙම වාර්තාව මැතිවරණයේ තීරණාත්මක සාධකයක් බවට පත් විය. මේ නිසා එය ඔහුගේ මැතිවරණ කටයුතුවලට සිදු වූ අවාසිදායක තත්ත්වයක් සේ මෙය සැලකිය හැකි ය. කෙසේ නමුත් 2010 ජනාධිපතිවරණයේ දී ජනමාධ්‍ය විසින් මහජන මතය සකස් කිරීමට ප්‍රබලව දායක වූ බව කිව හැකිය.

2015 ජනාධිපතිවරණය සහ ඡන්දදායකයා

ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ ඉතිහාසයේ හත්වැනි ජනාධිපතිවරණය ලෙස 2015 ජනාධිපතිවරණය හැඳින්විය හැකිය. 2015 ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා භාර ගනු ලැබුවේ 2014 දෙසැම්බර් මස 08 වන දින ය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනයට අනුව මහින්ද රාජපක්ෂ මහතා තුන්වන වරටත් ජානාධිපතිවරණය සඳහා තරග වැදුනි. මෙම මැතිවරණයට අපේක්ෂකයන් 19 දෙනෙක් නාම යෝජනා භාර දුන් අතර ඉන් ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා වූයේ,

- එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහින්ද රාජපක්ෂ මහතා
- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ මෛත්‍රීපාල සිරිසේන මහතායි.

මෙම මැතිවරණයේ විශේෂත්වය වූයේ එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා සහ මහ ලේකම් වරයා ප්‍රධාන මැතිවරණ අපේක්ෂකයන් වීමයි. නමුත් මැතිවරණය සඳහා පක්ෂ දෙකක් නියෝජනය කරමින් තරග වැදුනි.

මෙම අපේක්ෂකයන් දෙදෙනා හැරුනු විට විමල් ගීගනගේ,එම් ඉල්ලාස්, සිරිතුංග ජයසූරිය, ජයන්ත කුලතුංග, ඒ.එස්.පී ලියනගේ, සුන්දරම් මහේන්ද්‍රන්, සරත් මන්මේන්ද්‍ර, මවුලවී ඉබ්‍රහීම් මොහොමඩ්, දුමින්ද නාගමුව, රුවන්තිලක පේදුරු, අනුරාධ පොල්ගම්පල, ප්‍රසන්න ප්‍රියංකර, නාමල් අජිත් රාජපක්ෂ, බත්තරමුල්ලේ සීලරතන හිමි, රත්නායක ආරච්චිගේ සිරිසේන, මුතුබණ්ඩාර තැමිනිමුල්ල, පනී විජේසිරිවර්ධන යන අයද ජනාධිපතිවරණය සඳහා තරඟ වැදුණි.

කෙසේ නමුත් මෙම මැතිවරණයෙන් ජයග්‍රහණය කළේ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙන් තරග කළ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ය. ඔහු ලබාගත් ඡන්ද සංඛ්‍යාව වූයේ 62,17,162 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 51.28% කි. මහින්ද රාජපක්ෂ මහතා ලබාගත් ඡන්ද සංඛ්‍යාව වූයේ 57,68,090 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 47.58% කි. මෙම මැතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා දිස්ත්‍රික්ක 10ක ජයග්‍රහණය ලබා ගන්නා විට මෛත්‍රීපාල සිරිසේන මහතා අනෙකුත් දිස්ත්‍රික්ක 15හි ජයග්‍රහණය තහවුරු කළේය. මෙම මැතිවරණය පිළිබඳ විදෙස් නිරීක්ෂණ කණ්ඩායම් වල නිගමනය වූයේ වංචා දූෂණවලින් තොරව ඡන්ද දායකයාගේ ඡන්දය ආරක්ෂිතව ප්‍රකාශ කිරීමට ඡන්ද දායකයාට අවකාශය ලැබුණු බවයි.

විවිධ කඩාකප්පල්කාරි ක්‍රියා කිහිපයක් හැරෙන්නට මෙම ජනාධිපතිවරණය සාමකාමී අයුරින් සිදු කෙරුණි.

2015 ජනාධිපතිවරණය සඳහා ඡන්ද දායකයාගේ සහභාගිත්වය පිළිබඳ විමසා බැලීමේදී හඳුනාගත හැකි වන්නේ වලංගු ඡන්ද සංඛ්‍යාව ප්‍රශස්ත මට්ටමක තිබුණු බවයි. ප්‍රතික්ෂේපිත ඡන්ද ප්‍රමාණය 1.15% ක් වැනි ප්‍රමාණයකි. මෙම මැතිවරණය සඳහා ඡන්ද දායකයා සක්‍රීයව දායක වී ඇති බව නිගමනය කළ හැකිය.

2015 ජනාධිපතිවරණයේ මාධ්‍ය ක්‍රියාකාරිත්වය

2015 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හැසිරීම පිළිබඳ විවිධ විද්වතුන් විවිධ අදහස් දක්වා ඇත. මාධ්‍ය විසින් සමාජය පාලනය කරන අතර ආචාර ධර්ම පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා මාධ්‍ය කටයුතු කරන බවට චෝදනා එල්ල විය. කෙසේ නමුත් එවැනි පසුබිමක සිට ජනමාධ්‍ය ප්‍රචාරණ කටයුතු ආරම්භ කළේය. විශේෂයෙන් ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනි සේවය මහින්ද රාජපක්ෂ මහතාට පක්ෂග්‍රාහී අයුරින් මාධ්‍ය ක්‍රියා කළේ ය. ඊට හේතු වන්නේ එම ජනමාධ්‍ය ද්විත්වය රාජ්‍ය මාධ්‍ය වීම නිසාය.

2015 දී ජනමාධ්‍ය සෘජු ලෙසම මහින්ද රාජපක්ෂට පක්ෂග්‍රාහී විය. ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනිය මෙන්ම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, ලේක්හවුස් පුවත්පත් යන සියලු මාධ්‍ය මහින්ද පාක්ෂිකයන් බවට පත් විය. ස්වර්ණවාහිනී, හිරු ටීවී, දෙරණ වැනි පෞද්ගලික රූපවාහිනී මාධ්‍ය සෘජුවම මහින්ද පාක්ෂික ලෙස ප්‍රචාරණ කටයුතු සිදු නොකළ ද ප්‍රවෘත්ති වැඩසටහන් වලදී පැහැදිලි වූයේ මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කරවීමට සහයෝගය දෙන බවයි. ඒ අතර දිවයින වැනි පුවත්පත් ද මහින්ද රාජපක්ෂ දින වීමට සහයෝගය ලබා දුන්නේ ය. නමුත් මෙවැනි අවස්ථාවක මැතිවරණ කොමසාරිස්ගේ භූමිකාව ප්‍රබලව ක්‍රියාත්මක විය. ඇතැම් ප්‍රචාරණ කටයුතු වලට ඔහු විසින් සීමා පැන වූයේ ජනාධිපතිවරණය ස්වාධීන අයුරින් සිදු කිරීමේ අරමුණින්ය. මැතිවරණ දිනයට පෙර දින රාත්‍රියේ මාධ්‍ය හැසිරීම ඡන්ද දායකයාගේ මනාපය වෙනස් කිරීමට ප්‍රබල ලෙස බලපෑම් කර ඇත. එබැවින් මහින්ද රාජපක්ෂ මහතාට පක්ෂපාති ලෙස කටයුතු කළ ප්‍රධාන රූපවාහිනි නාලිකාවල ඔහුගේ වැඩසටහන් ප්‍රචාරය කිරීමට කටයුතු සූදානම් කර තිබුණි. නමුත් එක්සත් ජාතික පක්ෂය ඊට විරෝධය ප්‍රකාශ කරමින් කඩුවෙල උසාවියෙන් තහනම් නියෝගයක් ලබාගෙන එය නතර කළේ ය.

සමාලෝචනය

ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවැත් වූ ජනාධිපතිවරණ වලදී ඡන්ද දායකයාගේ භූමිකාව සහ ඒ ඒ යුග වල ජනමාධ්‍යයේ ක්‍රියාකලාපය පිළිබඳව මෙමගින් අධ්‍යයනය කර ඇත. එහිදී 1982 සිට 2015 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ හතක් පැවැත්වුණි. එම ජනාධිපතිවරණ කාල සීමාවලදී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ: ඡන්දදායකයාගේ සහභාගිත්වය සහ ජනමාධ්‍ය හැසිරීම මෙමගින් අධ්‍යයනය කළේය. මෙම කරුණු මගින් හඳුනාගත හැකි වූයේ 1982 වසරේ සිට 2015 දක්වා කාල සීමාව තුළ සමාජ දේශපාලනික වශයෙන් විශාල වෙනස්කම් සිදු වී ඇති බවයි. 1982 වන විට රූපවාහිනී ආගමනය සිදු වී

තිබුනද දේශපාලන ප්‍රචාරණ කටයුතු සඳහා භාවිත නොකළේය. එමෙන්ම ගුවන් විදුලිය සහ පුවත්පත ගත් විට දේශපාලන ප්‍රචාරණයේදී බහුලව යොදා ගනු ලැබුවේ පුවත්පතයි. නමුත් 2015 වන විට මෙම තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වී ඇත. දේශපාලන ප්‍රචාරණ ක්‍රියාවලියේදී පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය පමණක් නොව නව මාධ්‍යය ද ප්‍රබල ලෙස යොදා ගැනීම විශේෂ ලක්ෂණයකි. මෙම එක් එක් ජනාධිපතිවරණ වලදී ඡන්ද දායකයාගේ භූමිකාව නිරීක්ෂණය කිරීමේදී හඳුනාගත හැකි වූයේ 1982 ට සාපේක්ෂව 2015 වන විට ඡන්දය සඳහා සහභාගිවීම වර්ධනය වී ඇති බවයි. නමුත් මේ අතරතුර කාලයේදී රටේ පැවති යුධමය තත්ත්වය සහ 1989 දක්නට ලැබුණු භීෂණකාරී තත්ත්වය මත ඇතැම් ජනාධිපතිවැරණ වලදී ඡන්දදායකයාගේ ඡන්දය භාවිතය අවම මට්ටමක පැවිති බවයි.

මූලාශ්‍ර

අභයගුණවර්ධන, අශෝක. (2015). යුග පෙරළිය, ලංකා ප්‍රින්ටර්ස්: කොළඹ 10.

අයිවන්, වික්ටර්. (2009). පෑන අහිංහකද?, රාවය ප්‍රකාශකයෝ මහරගම.

අලවත්තගේ, ශ්‍රී ප්‍රේමදාස. (2014). ශ්‍රී ලංක මැතිවරණ ප්‍රතිඵල සංග්‍රහය, ගොඩගේ සහෝදරයෝ: කොළඹ 10.

ගමගේ, එස්. අයි. (2015). ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ ඉතිහාසය, ගොඩගේ සහෝදරයෝ: කොළඹ 10.

ගලපාත, ඒ.එස්.පී .(2000). ජනාධිපති ක්‍රමය හා 1999 ජනාධිපතිවරණය, කර්තෘ ප්‍රකාශන

ජයතිලක, මලිත්. (2016). මා දුටු ජනවාරි 8, කලාව ගෘජ්: කොළඹ 3.

ජයවර්ධන, කුමාරි. (2006). සොක්කන් ලොක්කන් වූ වගයි, කරුණාරත්න සහ පපුත්‍රයෝ: හෝමාගම.

ජයවර්ධන, ඩබ්ලිව්. (1999). අඩසියවසක දේශපාලන සටහන්, ජයනි ප්‍රින්ට් ග්‍රැෆික්ස්: වරකාපොල.

තෙන්නකෝන්, රජිත් කීර්ති. (2011.) දේශපාලන සන්නිවේදනය, ඇක්සස් ලංකා ප්‍රින්ටර්ස්: පිටකෝට්ටේ.

දොඩංගොඩ, චන්ද්‍රසිරි. (1995). මාධ්‍ය නිදහසට යළිත් කණකොක් හඩ, වත්මන. උපාලි ප්‍රින්ටර්ස්: හෝමාගම.

රූපසිංහ, විජයානන්ද. (2013). ශ්‍රී ලංකාවේ මැතිවරණ හා ජනමාධ්‍ය පක්ෂපාතීත්වය, සන්නිවේදන ශාස්ත්‍රීය සංග්‍රහය; ගොඩගේ සහෝදරයෝ: කොළඹ 10.

වර්ණපාල, විශ්වා. (1995). ශ්‍රී ලංකාවේ කාලීන දේශපාලනය, ගොඩගේ සහෝදරයෝ: කොළඹ 10.

සිල්වා, කේ.ඇම්. රිගින්ස්, හවඩ්. (1997). ජේ.ආර් ජයවර්ධන චරිතාපදානය: පළමු වෙළුම, ශ්‍රීදේවි ප්‍රින්ටර්ස්: දෙහිවල.

සිල්වා, කේ.ඇම්. රිගින්ස්, හවඩ්. (1998). ජේ.ආර් ජයවර්ධන චරිතාපදානය: දෙවන වෙළුම, ශ්‍රීදේවි ප්‍රින්ටර්ස්: දෙහිවල.

16

රසඥතා වර්ධනය, සාහිත්‍යයේ බලපෑම සහ ලාංකේය ගුවන්විදුලි නාට්‍ය සන්නිවේදනයේ පෝෂණය

සේන නානායක්කාර

රසඥතා වර්ධනය යනු අතිශයින් ම මනෝවිද්‍යාත්මක කාර්යාවලිය කි. එය ජීවවිද්‍යාත්මක වන්නා සේම මානවවිද්‍යාත්මක ය. කලාව හා සෞන්දර්ය කරණකොටගෙන නිෂ්පන්න කවර නම් වූ දෙයක් වුව ඊට උපයෝගී වෙයි. සාහිත්‍යය ඒ අතර සුවිශේෂ ය. මන්ද යත්, සාහිත්‍යය වූ කලී ඒ සඳහා වන ප්‍රමුඛත ම සංවාහකයක් බව අවිවාදිත බැවිනි. එය ශ්‍රව්‍ය, දෘශ්‍ය හෝ ස්පර්ශකාරක ද විය හැකි ය. කෙබඳු ස්වරූපයකින් හෝ උසස් ගණයේ සාහිත්‍ය පරිශීලනය යනු පිරිපුන් සහෘදත්වය සහ සංවේදිතාව සහිත උතුම් මනුෂ්‍යභාවයක් කෙරෙහි ලා වන සාධනීය ක්‍රියාවලියකි. කොටින්ම තිරිසන්භාවයේත්, මිනිසත්භාවයේත් වෙනස පෙන්නුම් කෙරෙනුයේ සාහිත්‍ය කලාදිය තුළ බව නිර්ණය කිරීම කිසිසේත් ම අතිශයෝක්තියක් නොවේ.

> 'මිනිසා සතුව ඇති ශාරීරික අවයවයන් ද, ඇතැම් යන්ත්‍රෝපකරණ ද තිරිසන් ලෝකයට ද නැත්තේ නොවේ. මිනිසාට වඩා ජවසම්පන්න වූ ද, මිනිසාට වඩා සියුම් දෘෂ්ටියක් ඇත්තා වූ ද, මිනිසාට වඩා සියුම් ශ්‍රවණයක් ඇත්තා වූ ද සත්ත්ව විශේෂයෝ බොහෝ වෙති. මිනිසා මෙන්ම සත්තු දුක සැප ප්‍රීතිය විඳිති. ඇතැම් සත්තු ඉතා සියුම් වූ ද, අලංකාර වූ ද කැදලි හා කූඩු තනති. අහස් යානාවක් සේ අහසේ පියාසර කළ හැකි වූ ද, නෞකාවක් මෙන් දිය මතුපිට හා දිය තුළ ගමන් කළ හැකි වූ ද සත්ත්වයෝ සිටිති. එසේම මිනිසා මෙන්ම ක්ෂුධාව, කාමය, භීතිය, ව්‍යාධිය මේ සත්තු අත්විඳිති. දැඩි ප්‍රේමයකින් වෙළී සිටින ඇතැම් සතුන් ගැන අපි අසා ඇත්තෙමු. මව් සෙනෙහස, අන්‍යෝන්‍ය ප්‍රේමය, කරුණාව, දයාව, ක්‍රෝධය, වෛරය ආදී විවිධ හැඟීම් වුව තිරිසන් ලොව දැකිය හැකි ය. ප්‍රඥාසම්පන්න වූ ද, මනා ස්මරණ ශක්තියක් ඇත්තා වූ ද සත්ත්වයන් දක්නට ලැබේ.

මේ අනුව මිනිසා සතුව ඇති ගුණ විශේෂයන් කිසියම් පමණකින් හෝ තිරිසනුන් වෙත ද පවතින බව පැහැදිලි ය. එබැවිනි මිනිසත් බවේත්, තිරිසන් බවේත් ඇති වෙනස සාහිත්‍ය කලා ආදියෙන් පිළිබිඹු වන්නේ යැයි කිව හැක්කේ. වෙනත් වචනවලින් කිවහොත් තිරිසන්බවෙන් මුක්තියක් ලබාගැනීමට වෙහෙසෙන මිනිසාගේ ආධ්‍යාත්මික වර්ධනයේ විපුල ඵල සාහිත්‍ය කලා නිර්මාණයෝ වන්නා හ' (රත්නකාර 1961).

ඒ අනුව සාහිත්‍යය පරිහරණය යනු යහපත් චිත්ත චෛතසික තත්ත්වයක් කරා මිනිසා ප්‍රවේශවීමකි. එනම් රසඥතා වර්ධනය කි. හොඳ-නරක, යහපත-අයහපත, කුසල-අකුසල, සුචරිත-දුශ්චරිත ඈ සකලවිධ පරස්පරයන් හඳුනාගැනීමෙහි ලා එය පිටුබල සපයයි. ඒ අනුව ශ්‍රාහක පරපුරේ රසඥතා වර්ධනය පරමාර්ථ කොටගත් කවර නම් වූ මාධ්‍ය ප්‍රයත්නයක් වුව පැසසිය යුත්තකි. ලාංකේය ගුවන්විදුලිය නාට්‍යය සන්නිවේදනය විෂයයෙහි ලා දෙස් විදෙස් සාහිත්‍යයේ ප්‍රවේශය පිළිබඳ මේ කෙටි නිබන්ධයෙන් විමසා බැලෙන්නේ එකී අධ්‍යාශයට අනුකූලව ය.

ලංකා ගුවන්විදුලිය ආරම්භයේ සිට 1950 දක්වා ගත වූ දශක දෙකහමාරකට අධික කාලය අතරතුර ගුවන්විදුලි නාට්‍ය ක්ෂේත්‍රයේ සෑහීමට පත් විය හැකි වර්ධනයක් දක්නට ලැබුණේ නැතැයි සිතීම නිරවද්‍ය වෙයි. 1949 වර්ෂයේදී ගුවන්විදුලියේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් පත්වූ ජෝන් එන්. ලැම්ප්සන්ගේ ප්‍රතිසංවිධානයෙන් පසු සිංහලාංශයේ සංවිධායක වූයේ තේවිස් ගුරුගේ මහතා ය. නාට්‍ය සහකාර තනතුර දැරූ එස්. පියසේන මහතා ඉතා කෙටි කලක් කළ සේවාව, 1952 මාර්තු 01 වෙනිදා සිට නාට්‍ය සහකාර තනතුරට පත් වූ පී. වැලිකල මහතා විසින් තවදුරටත් වර්ධනය කරන ලදී. ශ්‍රාවක රසවින්දනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් සලකා බලන කල 1950 දශකය තුළ සිදු වූ වෙනස්කම් කිහිපයක් නම් කළ හැකි ය. ඒවා විශ්ව සාහිත්‍යය හා නාට්‍ය සම්බන්ධ කොටගෙන සිදුවීම සුවිශේෂ ය. එනම්,

(i) විශ්ව සම්භාවනාවට ලක් වූ සම්භාව්‍ය විදෙස් සාහිත්‍ය කෘති සිංහලට පරිවර්තනය කොට ගුවන්විදුලියට සකසා ශ්‍රාවකයාට හඳුන්වා දීම.

(ii දේශීය නිර්මාණකරුවන්ගේ උසස් කෘතීන් ආශ්‍රය කොට ගෙන නාට්‍ය සකස් කිරීම.

(iii) මෙතෙක් ප්‍රචාරය කළ ඒකාංගික නාට්‍ය වෙනුවට, නවකතා වැනි සුප්‍රකට සාහිත්‍ය කෘතීන් ගුවන්විදුලියට සකසා කොටස් වශයෙන් ප්‍රචාරය කිරීම.

විශ්ව සාහිත්‍යයේ ප්‍රශස්ත නිර්මාණ ලෙස ගැනෙන කෘතීන් සිංහලට පෙරළා සකස් කළේ වෙසෙසින් ම, ස්වභාෂාවෙන් ලියැවුණු හොඳ පිටපත්වල හිඟකම නිසාවෙනි. කෙසේ වුව ද, එකී පියවර දේශීය නාට්‍ය රචකයා යහපත් පිටපත් සම්පාදනයක් කරා පොළඹවන්නට ත්, නාට්‍ය ශ්‍රාවකයා යහපත් වින්දන මට්ටමක් දක්වා කැඳවාගෙන යන්නට ත් හේතු සාධක වී යැයි සිතේ. විශ්ව සාහිත්‍ය පිළිබඳ සංකල්පනය ප්‍රඥාව පැතිර යන අවධියක අත්‍යවශ්‍ය සමාජ විචල්‍යතාවකැයි යන්න සනාථ කෙරෙන කදිම දෘෂ්ටාන්ත ප්‍රකාශයකි මේ.

"පොදුවේ සලකා බලන කල පරිවර්තන කෘති නිසා සමාජයකට සැලසෙන මුඛ්‍යතම මෙහෙය නම් උසස් රචනා බිහිවීමට අගනා පසුබිමක් සකස්වීම යි. පරිවර්තන සාහිත්‍ය

> නිසා දේශීය රුචිකත්වය උසස් වන අතරම දේශයෙහි නිර්මිත ස්වතන්ත්‍ර කෘති විශ්ව සාධාරණ හෝ අන්තර් දේශීය මිම්මකින් මැනීමට ඉඩ සැලසේ. මෙය ඉතා වැදගත් ය" (දිසානායක 1963).

පියදෝර් දොස්තොවුස්කි ගේ, "Crime and Punishment" "අපරාධය සහ දඬුවම" ලෙස ත්, නිකොලායි ගොගොල්ගේ "Marriage" "විවාහය" ලෙස ත්, පර්ල් එස්. බක් ගේ "The Good Earth" "සාරභූමි" ලෙස ත්, ඇන්ටන් චෙකොෆ් ගේ "The Proposal" "මගුල් ප්‍රස්තාව" හා ඔහුගේ ම "The Bear" "වලහා" ලෙස හා හෙන්රික් ඉබ්සන් ගේ "The Dall's House" "සෙල්ලම් ගෙය" ලෙස ත් ප්‍රචාරය කිරීම ඊට නිදසුන් ය.

ජෝර්ජ් බර්නාඩ් ෂෝ, පිරන්දෙලෝ, ඔස්කා වයිල්ඩ්, මැක්සිම් ගෝර්කි, හෙන්රික් ඉබ්සන්, ඇලෙක්සැන්ඩර් පුෂ්කින්, ලියෝ තොල්ස්තෝයි, ගී ද මෝපසාං, සර් ආතර් කොනන් ඩොයිල්, ෂන් පෝල් සාත්‍රෙ, ඇලන් තෝන්හිල්, ආර්. කේ. නාරායන් ආදී විශ්ව කීර්තිධර ලේඛකයින් ගේ සාහිත්‍ය කෘති රාශියක් ම ඉන්පසුව සිංහල ගුවන්විදුලි නාට්‍ය පිටපත් බවට පත්විය. එය දියුණු සමාජ සංලක්ෂණයක් ලෙස හඳුනාගැනීම නිරවද්‍ය වෙයි. මේ ඊට අදාළ ප්‍රකාශය කි.

> "ග්‍රීක නාට්‍ය රචකයන් ලෙස හැඳින්වෙන යුරිපිදීස්, සොෆොක්ලීස් වැන්නවුන්ගේ කෘතීන්ගෙන් පටන් ගෙන හැරල්ඩ් පින්ටර්, ජෝන් ඔස්බෝන් වැනි නවීන නාට්‍ය රචකයින්ගේ හොඳ නාට්‍ය කෘතීන් නවීන අසන්නන්ට කනින් ඇසීමට සැලසීම බී.බී.සී ය ප්‍රමුඛ බටහිර උසස් ගුවන්විදුලි මධ්‍යස්ථානයන් හි එක් අරමුණ කි. මේ මගින් ශ්‍රාවකයාගේ දැනුම පුළුල් කළ හැකි අතර, එම මුල් කෘතිය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරවීමට ද පුළුවන්කමක් ඇත" (මහේන්ද්‍ර 1979).

විශ්ව සම්භාව්‍ය නිර්මාණ හඳුනාගැනීම හා ඊට සාපේක්ෂ රසිකත්ව සංවර්ධනය එ මගින් බොහෝ දුරට ඉටු කෙරුණු බව ඔප්පු කෙරෙනුයේ දේශීය ගුවන්විදුලි නාට්‍ය නිර්මාණකරුවන් රැසක් ඒ කාලය තුළ බිහිවීම තුළිනි. ඒ. පී. ගුණරත්න, පී. වැලිකල, එදිරිවීර සරච්චන්ද්‍ර, ජේ. එච්. ජයවර්ධන, ටී. ඊ. ද එස්. ලීලානන්ද, පී. දේවසිරි පෙරේරා, එස්. පියසේන, සෝමපාල ගුණධීර, ටී. ජී. ඩබ්ලිව්. ද සිල්වා, ධර්ම ශ්‍රී මුණසිංහ, බී. කේ. සෝමපාල, වී. ඊ. හල්වල, ආනන්ද සිරිසේන, පී. කේ. ඩී. සෙනෙවිරත්න, ඩබ්ලිව්. ඒ. සෝමදාස, විමල් නවගමුව, සුදාස් මාස්කෝරාල, මුදලිනායක සෝමරත්න, සිරිසුමන මාඋස්සාගොල්ල වැනි පිරිස ඒ අය අතරින් කිහිප දෙනෙකි.

මේ නිසා ම ලාංකේය ගුවන්විදුලි නාට්‍යයේ ස්වරූපය බොහෝදුරට වෙනස් මගක් ගන්නට විය. නාට්‍ය රචනය සඳහා භාවිත භාෂා රටාව හා ප්‍රස්තුත තේමාවන් ද වෙනස් මං ගෙන තිබිණි. සැබැවින් ම, 1953 මැදභාගය වන විට ලාංකේය ගුවන්විදුලි බලධාරීහු ඒ පිළිබඳ සෑහීමකට පත් ව සිටි බව පෙනේ. විශ්ව සාහිත්‍යයෙන් ඒ සඳහා සිදුවූ බලපෑම ද එහි සුවිශේෂ වෙයි. 1953 පෙබරවාරි මස 09 වෙනිදා "ලංකා ගුවන්විදුලි" සඟරාවේ (4 වැනි කාණ්ඩය, 4 වැනි කලාපය) 37 වන පිටුවේ එන සංස්කාරක සටහනෙන් උපුටාගත් කොටසක් ඒ සඳහා නිදසුන් ලෙස දක්වමි.

"සෑම සතියකට වරක් ම ලංකා ගුවන්විදුලි සේවය මගින් සිංහල නාට්‍යයක් ප්‍රචාරය කරනු ලැබේ. මේ නාට්‍ය ශ්‍රවණය කිරීමට අසන්නන් විසින් මෙතෙක් දක්වා ඇති උනන්දුව ම එහි ජනප්‍රිය භාවයේ සලකුණක් වශයෙන් පිළිගත හැකි ය.....නවීන සිංහල නාට්‍ය රචකයා කාලය අනුව හැඩ ගැසී ඇති බැව් ඔබට පෙනීයනවා ඇත. ඔහු නවීන ශෛලියක මාර්ගයෙන් නවීන සමාජ තොරතුරු අලළා ස්වාභාවික චරිත නිරූපණය කරයි. ඔහුගේ භාෂාව ප්‍රියංකර ය. සරල ය.

ළඟදී ප්‍රචාරය කරන ලද "දරුදුක", "බෝනික්කා" සහ "මෝහිනී" යන නාට්‍යවලට ඔබ සවන් දී තිබේ නම්, ගුවන්විදුලි නාට්‍යයෙහි විශේෂ අංගයක් ද ඔබට පෙනී යනවා ඇත. ඒ නාට්‍ය සියල්ල ම මනෝවිඥ්ඤාණික නාට්‍ය ගණයෙහි ලා සැලකිය හැකි ය. මනෝවිඥ්ඤාණික නාට්‍යය (Psychological Drama) නැතහොත් හිත පිළිබඳ ව තොරතුරු කියැවෙන නාට්‍යවලට බටහිර සාහිත්‍යයේ ලැබී ඇත්තේ ඉතා උසස් ස්ථානයෙකි. සිංහල ගුවන්විදුලි නාට්‍ය රචකයෝ විශ්ව සාහිත්‍යයෙන් කෙටිකථා, නාට්‍ය ආදිය ගෙන මෙරට පරිසරයට ගැළපෙන සේ සකස් කරති. එහෙත්, ඒ නිසා ඔවුන්ගේ නිර්මාණ ශක්තිය නැති වී යන්නේ යැයි නො සිතිය යුතු ය. එයින් අපේ ගුවන්විදුලි නාට්‍ය කලාව පෝෂණය වෙයි. ඒ අතර ඔබේ පළපුරුද්ද ත්, දැනුම ත් වැඩි දියුණු කරයි.....

අපේ නාට්‍යවලට සහභාගිවීමට ස්වකීය කැමැත්ත පළ කර සිටින අසන්නන්ගේ විශාල සංඛ්‍යාවෙන් ම "ගුවන්විදුලි නාට්‍ය මහජන අවශ්‍යකත්වයක් පිරිමසන්නේ ය" යන අපේ නිගමනය තවදුරටත් තහවුරු වෙයි. සිංහලයා ගේ ජාතික සංස්කෘතිය නගා සිටුවීම සඳහා ලංකා ගුවන්විදුලි සේවයෙන් ඉටු වන්නේ සැලකිය යුතු සේවයක් බව අපි මෙහි දී තරයේ ම කියා සිටිමු."

එය එසේ වුව ද, විදෙස් කෘති බහුල ව පරිවර්තනය සහ අනුවර්තනය කිරීම පිළිබඳ ව විවේචකයන්ගේ අප්‍රසාදය පළ වූ අවස්ථාවන් ද විරල නොවේ.

විශ්ව සාහිත්‍යය සිංහල ශ්‍රාවකයාට හඳුන්වා දීමෙන් නාට්‍යාංශය මගින් සෑහෙන සේවයක් දැනට සිදුවෙන බව ස්තුති පූර්වක ව සඳහන් කරන ඔවුහු, නාට්‍යාංශය පිරිහීමේ ප්‍රපාතය කරා ගෙන යන්නේ ද මෙම විශ්ව සාහිත්‍ය ගැතිකම ම බව ද බොහෝ විට පළ කළ චෝදනාව කි. නිතිපතා එක ම ශිල්පීන්ගේ හඬ හා එක ම විධියේ නාට්‍ය ශ්‍රවණය කිරීමට සිදුවීම ද ඒ අතර අප්‍රසාදයට හේතු විය. නාට්‍ය හා සංගීත යන අංශද්වය ම මේ චෝදනාවට දැඩි ලෙස පාත්‍ර වූ බව පෙනේ.

විටෙක ගුවන්විදුලිය වැරදි පිළිගනිමින් ද, එවා නිවැරදි කරමින් ද, තවත් විටෙක විවේචකයින් සදොස් කරමින් ද ඒවාට පිළිතුරු සැපයී ය.

"පුද්ගලයින් හා ඇති විරුද්ධවාදිකම් නිසා වැඩසටහනෙක හොඳ පැත්ත නො දකින විවේචකයෝ ද අප අතර සිටිති. විශේෂයෙන් මේ ගණයට අයත් වන්නේ අප සිංහල

සහ ද්‍රවිඩ ප්‍රවෘත්තිපත්‍ර විචාරකයන් බව මෙහි දී අප ප්‍රකාශ කරන්නේ ඉතාමත් කනගාටුවෙනි" (ලංකා ගුවන්විදුලි සඟරාව 1953 මැයි).

"සංවිධානය වූ සංස්කෘතික වැඩපිළිවෙළක් ලංකාවේ නැත. මේ සඳහා ලංකා ගුවන්විදුලි සේවය වැනි මහජන ආයතන අප අතර ඇත්තේ ඉතා ස්වල්ප වශයෙනි. තත්ත්වය මෙසේ හෙයින්, එක ම ශිල්පියෙකුගේ වැඩසටහන් අපේ නො කැමැත්තෙන් වුව ද නිතර නිතර ප්‍රචාරය කිරීමට අපට සිදු වෙයි. වැඩසටහන් සංවිධායක නිලධාරීන්ට ද සිදුවන්නේ නිතර නිතර තමන් හඳුනන නැතහොත් තමන් විසින් අසා ඇති ශිල්පීන් වෙත යාමට ය.....

ගුවන්විදුලිය පිළිබඳ නව අදහස් දීමට ත්, වැඩසටහන්වලට සහභාගිවීමට ත්, ඉදිරිපත් වීමට කැමැති පුද්ගලයින් හෝ කාණ්ඩ අපට ඕනෑකර ඇති බැව් පසු ගිය කාලයේ දී අපි කියා සිටියෙමු. එබඳු පුද්ගලයින්ට ත් කාණ්ඩවලට ත් අපි ආරාධනා කළෙමු. එහෙත්, කියා සිටීමට කනගාටුයි. එයින් සතුටු දායක ප්‍රතිඵලයක් නො ලැබුණි. ඉදිරිපත් වූ ටික දෙනා අපි සාදරයෙන් පිළිගතිමු. අද ඒ ටික දෙනාගේ සේවයෙන් අපේ වැඩසටහන් තරමක් දුරට විධිමත් කිරීමට ත්, රසවත් කිරීමට ත් පිළිවන් වී තිබේ. සැබැවින් ම අප අතරේ දක්ෂ ශිල්පීන් තවත් කොතරම් සිටින්නට පිළිවන් ද? එබඳු පුද්ගලයින්ට ගුවන් විදුලියේ දොර නිරන්තරයෙන් ම විවෘත වී ඇත" (ලංකා ගුවන්විදුලි සඟරාව 1953 ජනවාරි).

ලැම්ප්සන් ප්‍රතිසංවිධානයෙන් පසුව බහුතර වැඩසටහන් සිංහල ශ්‍රාවකයා සඳහාම යොමුවිය. විශේෂයෙන්ම නාට්‍ය වැනි විනෝදාත්මක වැඩසටහන් කෙරෙහි ඔවුන්ගේ අවධානය දැඩිව කැපී පෙනිණි. පොතපත කියවා ලබාගත් දැනුම සහිත, එක්තරා දුරකට හෝ සමාජාවබෝධයක් හා කලාත්මක දෘෂ්ටියක් ද ඇති රචකයින් සහ ගුවන්විදුලි ශිල්පීන් සොයා යාම එවකට අතිශයින් දුෂ්කර වූ බව පෙනේ.

එබඳු සාර්ථක රචකයින් සහ දක්ෂ ශිල්පීන් තෝරා ගැනීමේ පරීක්ෂණයක් පිළිබඳ ව හා සාර්ථක ගුවන්විදුලි නාට්‍ය පිටපත් රචනා හිඟය පිළිබඳ ව පොදු ජනතාව දැනුවත් කරන්නට ද විටින් විට විවිධ පියවර ගෙන තිබිණි. පහත උපුටා ගැනෙනුයේ 1955 හා 1960 අතර කාලය තුළ ලංකා ගුවන්විදුලි සඟරාව නිරන්තරයෙන් පළ කළ එබඳු දැන්වීම් සඳහා නිදසුන් දෙකක් පමණි.

ගුවන් විදුලි නළු නිලියන් තේරීමේ
පරීක්ෂණය
සිංහලාංශයේ නාට්‍ය වලට සහාය කරගැනීම සඳහා
නළු නිලියන් තේරීමේ පරීක්ෂණයක් 1955 අප්‍රේල් මස
අගභාගයේදී පැවැත්වේ.
සිංහලාංශයේ සංවිධායක තැන,
ලංකා ගුවන් විදුලි සේවය
කොළඹ 7.


රේඩියෝ රඟ මඬල
ගුවන් විදුලි නාට්‍යය
දින දින දියුණුකිරීම
රේඩියෝ රඟ මඬලේ
පරමාර්ථයයි

මේ සියල්ල සිදු කෙරුණේ පොදු ජන ශ්‍රාවකයා කෙරෙහි උසස් නාට්‍ය රසවින්දනයක් ප්‍රදානය කරවීමෙහි ලා වෙයි. එ මගින් ඔවුන්ගේ රසඥතාව ඉහළ මට්ටමකට ගෙන ආ හැකි බව විශ්වාස කෙරුණු හෙයිනි. ඉන් පසුව, දේශීය ලේඛකයන්ගේ ප්‍රකට සාහිත්‍ය කෘති ද දිගින් දිගට ම ගුවන්විදුලියට සකස් කරන්නට පටන් ගති. මාර්ටින් වික්‍රමසිංහගේ "රෝහිණී", "ගම්පෙරළිය" හා "විජිතා" ලෙනාඩ් වුල්ෆ්ගේ "බැද්දේගම", ආර්. එල් ස්පිට්ල්ගේ "වනසරණ" හා "මැකීගිය දඩමං", දොස්තර ලූෂන් ද සිල්වාගේ "දේවක්‍රීඩා" හා "චණ්ඩාල ස්ත්‍රිය", පියදාස සිරිසේනගේ "ජයතිස්ස හා රොසලින්" ආදී සාහිත්‍ය කෘති ගුවන්විදුලි මාධ්‍යයට පෙරළුණු අතර පහත දැක්වෙන්නේ ඒ සම්බන්ධ දින වකවානු සහිත සරල සටහනකි.

1951 පෙබරවාරි 18 - මාර්ටින් වික්‍රමසිංහගේ රෝහිණී කෘතිය ගුවන්විදුලි නාට්‍යයක් ලෙස කොටස් වශයෙන් ප්‍රචාරය කිරීම ඇරඹිණි.

1951 අප්‍රියෙල් 14 - එස්. පියසේනගේ ජනප්‍රිය රහස් පරීක්ෂක නවකතාව මාරක ගින්න ගුවන්විදුලි නාට්‍යයක් ලෙස සතිපතා ප්‍රචාරය කිරීම ඇරඹිණි.

1952 ජනවාරි 18 - උපහාස කතා විශේෂඥ ටී. ජී. ඩබ්ලිව්. ද සිල්වාගේ මහ රෑ හමු වූ ස්ත්‍රිය අලළා සකස් වූ නාට්‍යය ප්‍රචාරය කිරීම ඇරඹිණි.

1952 ජුනි 20 - ලෙනාඩ් වුල්ෆ්ගේ Village in the Jungle කෘතිය ඇසුරෙන් බැද්දේගම නාට්‍යයේ ප්‍රචාරය ඇරඹිනි. ඒ. පී. ගුණරත්න විසින් පරිවර්තනය කරන ලද මෙය කුලසිරි අමරතුංග විසින් ගුවන්විදුලියට සකස් කරන ලදී. කොටස් දහයකින් යුක්ත වූ මෙම නාට්‍ය 1952 අගෝස්තු 22 දින දක්වා ප්‍රචාරය කෙරිණි.

1952 අගෝස්තු 29 - මාර්ටින් වික්‍රමසිංහගේ "ගම්පෙරළිය" නවකතාව ඇසුරෙන් පී. දේවසිරි පෙරේරා සකස් කළ ගුවන්විදුලි නාට්‍යයේ ප්‍රචාරය ඇරඹිණි. කොටස් දහයකින් පසුව 1952 ඔක්තෝබර් 10 වෙනිදා අවසන් කෙරිණි.

1953 ජනවාරි 04 - පී. කේ. ඩී. සෙනෙවිරත්නගේ කුරුළුබැද්ද නවකතාව පී. වැලිකලගේ අතිශය ජනප්‍රිය ගුවන්විදුලි නාට්‍ය නිෂ්පාදනයක් ලෙස ප්‍රචාරය ආරම්භ කෙරිණි. කොටස් 218 කින් යුක්ත වූ මෙම නාට්‍ය 1957 මාර්තු 30 වෙනිදා දක්වා ප්‍රචාරය කෙරිණි.

1953 අප්‍රියෙල් 01 - දොස්තර ආර්. එල්. ස්පිට්ල්ගේ වනසරණ නවකතාව ඒ. පී. ගුණරත්න විසින් ගුවන්විදුලි නාට්‍යයක් ලෙස සකස්කරන ලද අතර 1953 මැයි 31 වෙනිදා දක්වා එය ප්‍රචාරය කෙරිණි.

1953 මැයි 10 - මාර්ටින් වික්‍රමසිංහගේ විජිතා නවකතාව ආචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් ගුවන්විදුලි නාට්‍යයක් ලෙස සකස් කොට ප්‍රචාරය කිරීම ඇරඹිණි.

1953 ජුනි 07 - දොස්තර ලූෂන් ද සිල්වාගේ චණ්ඩාල ස්ත්‍රිය ගීතා එගොඩගේ විසින් ගුවන්විදුලියට සකස් කරන ලදී. මෙය පී. වැලිකලගේ නිෂ්පාදනයකි.

1953 ඔක්තෝබර් 18 - දොස්තර ආර්. එල්. ස්පිට්ල්ගේ මැකීගිය දඩමං නවකතාව ඒ. පී. ගුණරත්න විසින් ගුවන්විදුලි නාට්‍යයක් ලෙස සකස්කොට ප්‍රචාරය කිරීම ඇරඹිණි.

1953 නොවැම්බර් 07 - පියදාස සිරිසේනගේ අතිශය ජනප්‍රිය නවකතාවක් වූ ජයතිස්ස සහ රොසලින් ගුවන්විදුලි නාට්‍යයක් ලෙස ප්‍රචාරය ඇරඹිණි. ගුවන්විදුලියට සකස් කරන ලද්දේ අමර ගුණසේකර විසිනි.

1953 දෙසැම්බර් 06 - දොස්තර ලුෂන් ද සිල්වාගේ "දේවක්‍රීඩා" හා නවකතාව ගීතා එගොඩගේ විසින් ගුවන්විදුලියට සකස් කොට ප්‍රචාරය ඇරඹිණි. 1954 ජනවාරි 10 දක්වා මෙම නාට්‍ය විකාශය කෙරිණි.

1954 ජනවාරි 12 - මුදලිඳු එඩ්මන් ගුණරත්නගේ ජයග්‍රහණය නවකතාව ගුවන්විදුලි නාට්‍යයක් ලෙස ප්‍රචාරය කිරීම ඇරඹිණි. විමල් ජේ. අබේසිරි විසින් මෙය ගුවන්විදුලියට සකස් කරන ලදී.

එවකට ජනප්‍රියව තිබූ සිංහල නවකතා මේ අයුරින් ගුවන්විදුලි නාට්‍ය ලෙස ප්‍රචාරය වීම නිසා තවත් විශාල පිරිසක් මෙම මාධ්‍ය වෙත කන් දෙන්නට උත්සුක වූ බැව් පැවසේ. ඉහත සඳහන් කළේ ඒ සඳහා නිදසුන් කිහිපයක් පමණි. මීට අමතරව දේශීය කෙටිකතාකරුවන්ගේ නිර්මාණ ද ඒ සඳහා පාදක කොට ගැනිණි. මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ලිව්. ඒ. සිල්වා, ජී. බී. සේනානායක, හේමපාල මුණිදාස, ගුණදාස අමරසේකර, ඩී. එම්. කොළඹගේ, ටී. ජී. ඩබ්ලිව්. ද සිල්වා, එදිරිවීර සරච්චන්ද්‍ර, ඒ. පී. ගුණරත්න ආදීන්ගේ නිර්මාණ ද ඒ අතර විය. ටී. ජී. ඩබ්ලිව්. ද සිල්වාගේ වැදිබණ කාරයෝ කෙටිකතාව ගුවන්විදුලි නාට්‍යයක් ලෙස ප්‍රචාරය වූ මුල්ම කෙටිකතාව යි. 1951 දෙසැම්බර් 29 වෙනිදා මුල්ම වතාවට ප්‍රචාරය කෙරුණු එය වික්ටර් මිගෙල්ගේ නිෂ්පාදනයකි.

එකල සමාජ නාට්‍ය මෙන්ම ආගමික හා ඓතිහාසික නාට්‍යය ද ප්‍රචාරය විය. නීතිඥ ජෝන් ද සිල්වා, චාල්ස් ඩයස් හා සිරිසේන විමලවීර යන නාට්‍යකරුවන්ගේ නිර්මාණ බොහෝ ගණනක් ගුවන්විදුලි නාට්‍යානුසාරයෙන් ප්‍රචාරය කරන්නට කටයුතු කෙරිණි. ඊට අමතරව ටවර් නෘත්‍ය ශාලාවේ රඟදැක්වූ නෘත්‍ය කොටස් ද විසුරුවා හරින්නට කටයුතු සලස්වා තිබූ බව කියැවේ. නවකතාවක්, කෙටිකතාවක් හෝ වේදිකා රංගනයක් හෝ වේවා මේ කවර ක්ෂේත්‍රයකින් වුව ද, ගුවන්විදුලි නාට්‍යයට පෙරළුනේ උසස් මට්ටමේ සාහිත්‍ය කෘතියකි. ඒ, උසස් රසිකත්වයක් සහිත ශ්‍රාවක ප්‍රජාවක් ගොඩනැගීම එවක රාජ්‍ය ගුවන්විදුලි සේවාවෙහි ප්‍රමුඛතම පරමාර්ථයක්ව තිබූ බැවිනැයි සිතේ.

මුල මැද අග සහිත හුදු කතන්දරයක් කියනු වෙනුවට ජීවිතාවබෝධය ලැබිය හැකි ගැටුම් හා විසඳුම් ද සහිත ව සිද්ධියක් හෝ සිද්ධිදාමයක් ශ්‍රව්‍යගෝචර වන පරිදි නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම ගුවන්විදුලි නාට්‍යයකින් සිදු කෙරෙන බව වඩා ත් ප්‍රශස්ත ව පෙන්නුම් කෙරුණේ 1960 හා 1970 දශකයේ දී යැයි කීම සාවද්‍ය නොවේ. උසස් දෙස් විදෙස් සාහිත්‍ය කෘති පිළිබඳ විචාර, විමර්ශන හා සම්මර්ශන යන සහෘද ක්‍රියාදාමයන් කෙරෙහි ශ්‍රාවකයා පෙලඹවීම ඊට ආභාස වූ බව පෙනේ.

1950 අගෝස්තු මස ආචාර්ය සරච්චන්ද්‍රයන් විසින් ආරම්භ කරන ලද "යෞවන සමාජය" ද ඔහු විසින් ම 1952 ජනවාරි 31 වෙනිදා සිට ඉදිරිපත් කරන ලද "ද්විතීය සංග්‍රහය" හා අඟහරුවාදා දිනවල

ප්‍රචාරය වූ "රේඩියෝ රඟමඬල" ද ගුවන්විදුලි නාට්‍යයට ප්‍රශස්ත බව ප්‍රවේශ කරවීම සඳහා මං හෙළි පෙහෙළි කළ බව පිළිගත යුතු ය. 1960 වර්ෂයේ පටන් ප්‍රචාරය කෙරුණු "විශ්ව සාහිත්‍යයෙන්" නම් වැඩසටහන තුළින් සෘජුවම ශ්‍රාවක රස වින්දනය ඉහළ තලයකට කැඳවීම සිදු කළ බවට සාක්ෂි ඇත. එකී වැඩසටහන පිළිබඳ ව 1951 දෙසැම්බර් 21 වන දින ලංකා ගුවන්විදුලි සඟරාවේ 5වන පිටුවේ සඳහන් පූර්ව දැන්වීමක් මෙසේ උපුටා දක්වමි.

> "කෙටිකතා සාහිත්‍යයෙන්" නම් වැඩසටහන වෙනුවට 1960 වර්ෂයේ පටන් "විශ්ව සාහිත්‍යයෙන්" නම් වැඩසටහන ප්‍රචාරය කෙරේ. මීට වර්ෂ කිහිපයකට ඉහත දී මේ වැඩසටහන යටතේ "වානරයා", "වනසරණ", "අපරාධය හා දඬුවම", "රාමායනය" යනාදී සුප්‍රකට ග්‍රන්ථ නාට්‍යානුසාරයෙන් කොටස් වශයෙන් ප්‍රචාරය විය. මෙතෙක් පරිවර්තනය නොකළ විශ්ව කෘතීන් කොටස් වශයෙන් ඉදිරිපත් කරන මෙම වැඩ සටහන සඳහා පළමුවෙන් ම තෝරා ගෙන ඇත්තේ පියදෝර් දොස්තොවොස්කි නම් සුප්‍රකට රුසියන් ලේඛකයාගේ "The Insulted and the Humitiated" නම් නවකතාව යි "නින්දාපහාස ලද්දෝ" නමින් මෙය ගුවන්විදුලියට සකස් කරන්නේ ගුවන්විදුලි රචකයකු හා පරිවර්තකයකු වශයෙන් මනා පළපුරුද්දක් ඇති කෘතහස්ත ලේඛකයකු වන ඒ. පී. ගුණරත්න මහතා යි. නිෂ්පාදනය පී. වැලිකල විසිනි."

"යෞවන සමාජය", "ශාස්ත්‍රීය සංග්‍රහය", "ද්විතීය සංග්‍රහය", "විශ්ව සාහිත්‍යයෙන්" හා "රේඩියෝ රඟමඬල" ආදී වැඩසටහන්වලින් ගුවන්විදුලි නාට්‍ය පිළිබඳ ව ඇති කළ යථාර්ථවත් ප්‍රබෝධය පරිපාකයට පත්වූයේ 1970 දශකය තුළ දී යැයි කීම නිරවද්‍ය වෙයි. ඒ, 1969 ජූලි 01 වෙනිදා ප්‍රකට නාට්‍යකරුවෙකු මෙන් ම සාහිත්‍යකරුවෙකු ද වන සුගතපාල ද සිල්වා ගුවන්විදුලියේ "රඟමඬල" නිෂ්පාදනය කරන්නට පටන්ගත් පසුව බව අවධාරණය කිරීම අතිශයෝක්තියක් නොවේ.

"අසුබ හැන්දෑව", "පතල්කාරයෝ", "පාරඅද්දර ගෙදරක්", "වැල්ලට ගිය ගැහැනිය" හා "එකොළහෙ කාමරය" බඳු නාට්‍ය නිර්මාණ තුළින් ඔහු කෘතහස්ත රචකයකු බව ත්, හුදු කතාන්දර කරුවෙකුගේ සීමාවෙන් ඈතට ගිය යථාර්ථවාදී නිර්මාණකරුවෙකු මෙන්ම හොඳ සාහිත්‍ය රසිකයෙකු බව ත්, තහවුරු කරන්නට සමත් විය. පැතලි චරිත කිහිපයක් විනාඩි 30 ක් පුරා හුදෙක් සංවාද ගනුදෙනු කරනු වෙනුවට සංකීර්ණ මානසික සංඝට්ටනයක් මගින් විවිධ චරිත ගැඹුරින් ප්‍රතිනිර්මාණය කිරීමට ත්, එ මගින් මසින් ලෙයින් පිරුණු සජීවී චරිත නිර්මාණය කොට ගුවන්විදුලි නාට්‍ය වෙත යථාර්ථවාදී නිර්මාණකරණයේ මුද්‍රාව තබන්නට ත් ඔහුට හැකි විය. ඒ, විශ්ව සාහිත්‍ය පිළිබඳ ප්‍රාමාණිකතා සහිත, උත්තම සාහිත්‍ය රසය පතළ කළ හැකි කුසලතාපූර්ණ නිර්මාණකාර පර්ෂදයක මහිමයෙනි. ඔහු නිෂ්පාදනය කළ "ගුවන්විදුලි රඟමඬල" එහි කේන්ද්‍රස්ථානය වී තිබිණ.

ඇරැව්වල නන්දිමිත්‍ර, කරුණා පෙරේරා, සුමිත්‍රා රාහුබද්ධ, සුනන්ද මහේන්ද්‍ර, කැත්ලීන් ජයවර්ධන, කරුණාරත්න අමරසිංහ, මීගල මුදියන්සේ, රෝහණ කස්තුරි, සිරිලාල් කොඩිකාර, බොබි බී. බොතේජු, සෝමා ජයකොඩි, පෙ.දු. ජිනදාස, අශෝක කොළඹගේ, භද්‍රජි මහින්ද ජයතිලක, ස්වර්ණ ශ්‍රී බණ්ඩාර, කරුණාතිලක හඳුවල හා කපිල කුමාර කාලිංග ආදීන් ඇතුළත් තවත් කෘතහස්ත නිර්මාණකරුවන් පරපුරක් ගොනු වූයේ ඔහුගේ කාලයේ දී ය. එය ම ඔහුගේ ප්‍රශස්ත මෙහෙවරට සාක්ෂි වෙයි. ගුවන්විදුලි

නාට්‍යය යනු අතිශය බලපෑම්කාරක සන්නිවේදන ක්‍රමෝපායකි. එය හුදෙක් බාහිර ලක්ෂණයන් පමණක් වනමින් කෙරෙන වාගාලාපයක් නොව, මිනිස් සිත් පතුල හාරා අවුස්සා පිරික්සා එහි ගැඹුර විනිවිද දැකීමෙහි ශක්‍යතා ඇති වෙසෙස් සාහිත්‍යමය නිර්මාණ කාර්යයක් බව ගැඹුරින් පසක් කළේ ඔහු ය. ඒ අනුව, කලාව පිළිබඳ ව ඔහු සතු ව තිබූ දෘෂ්ටිය පුළුල් ය. ගැඹුරු ය. හුදු රසාස්වාදන සම්පාදනයට ඔබ්බෙන් වූ ඥාන ගවේෂණය එහි අනන්‍යතාව යි. ගුවන්විදුලි නාට්‍ය සන්නිවේදනයට ද අදාළ වන සේ ඔහුගේම "හඬ නළුව" කෘතිය තුළ කලාව විග්‍රහ කරන අයුරු විමසමු.

> "කැමරාකරුවෙක් කිසිඳු හෝ සූදානමකින් තොර ව ජීවිතයේ අංශුවක් කැමරාවට අල්ලා ගනී. එහෙත්, ඔහු ස්වකීය කැමරාව මානන විට - කාචය නාභිගත කරන විට කැමරාව ඈත් මෑත් කරන විට යෙදෙන්නේ කිසියම් තෝරා ගැනීමක ය. ඔහු විකල්ප ප්‍රතිරූප සමුදායකින් උචිත රූපය තෝරයි. එහෙයින් ම යෙදෙන්නේ කිසියම් සකස් කිරීමක ය. කැමරාකරුවෙකු ඡායාරූප ශිල්පියෙකු බවට පත් වන්නේ මේ උචිත තෝරාගැනීම ඇසුරු කොට ගෙන ය. එය ශිල්පීය කලාවක් ද වෙයි. මෙ ලෙස ජීවිතය ආදර්ශයට ගත යුතු යැයි කියන රචකයා ද ජීවිතයෙන් පෙති ගසා ගන්නේ ජීවිතය හෝ සමාජය හෝ පිළිබඳ වැදගත් දෙයක් කියා පෑමට ඉවහල් වන තමාගේ අවශ්‍යතාවට සරිලන සේ සකස් කර ගත් කොටස කි. මේ සකස් කිරීම ප්‍රබල ඵලදායී තත්ත්වයක පවතින විට යෝග්‍ය ආකෘතිය හා සංකලනය වූ තැන අපි ඒ කලාව සේ දකිමු."

ඒ ඔහුගේ දැක්ම විය. එ මගින් ඔහු ගුවන්විදුලි නාට්‍යයට නව හැඳුනුම්පතක් නිර්මාණය කළේ යැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවේ. උත්තම සාහිත්‍ය රසාස්වාදනයෙන් නිෂ්පන්න බුද්ධි ප්‍රබෝධය එහි අනන්‍යතාව යි. එකී ශක්‍යතාව දුලබ ය. එය ද කලාව කි. බොහෝ කලාවන්ගෙන් එය වෙසෙස් වෙයි. පසු කලෙක හොඳ නාට්‍ය පිටපත් රචකයින්ගේ හිඟ බව කෙතරම් ද යත් ඒ පිළිබඳ ව ඔහු මෙසේ කීය.

> "ඉකුත් දුරුත්තේ දී ගුවන්විදුලි සංස්ථාවේ ඇරයුමක් ලැබ මම ගුවන්විදුලි නාට්‍ය හයසීයකට ආසන්න සංඛ්‍යාවක් සමීක්ෂණය කළෙමි. ප්‍රචාරය සඳහා තෝරාගත හැකි වූයේ පිටපත් හතරක් පමණ ය. පළපුරුදු නාට්‍ය රචකයෝ සරු කෙත් සොයා ගොස් ය."

කාලයාගේ ඇවෑමෙන් ගුවන්විදුලි නාට්‍ය ක්ෂේත්‍රයේ සිදු ව ඇති අවගමනය පිළිබඳ ඊට වඩා සුදුසු සාක්ෂියක් තවත් ඇත්දැයි සැක සහිත ය. මේ වන විට ද ගුවන්විදුලි නාට්‍ය රචනය සම්බන්ධයෙන් හැකියාවන් ඇති ප්‍රවීණයින් රැසක් ඇත ත්, දෘශ්‍යකලා ඇතුළු වෙනත් විවිධ විද්‍යුත් මාධ්‍යයන්ගේ බිහිවීම ත්, ප්‍රචාරණය හා වාණිජ ප්‍රතිලාභ අතින් බොහෝ ඒවා ගුවන්විදුලියට වඩා ඉහළ මට්ටමක පැවතීම ත් හේතුකොට ගෙන දක්ෂ රචකයෝ ගුවන්විදුලියෙන් ඈත් ව සිටින බව පෙනේ.

කෙසේ වෙතත්, 50 දශකයේ මුල් භාගයේ දී ම ලාංකේය ගුවන්විදුලි ශ්‍රාවකයාගේ රසමනස පෝෂණය කිරීමෙහි ලා ප්‍රවිෂ්ටය නිර්මාණය කළ ගුවන්විදුලි නාට්‍යය, 70 දශකයේ අගභාගය වන විට වඩා ත් ප්‍රශස්ත තලයකට ශ්‍රාවකයා කැඳවාගෙන යන්නට සමත් වූ බව අවධාරණය කළ හැකි ය. පී.

වැලිකල, ජේ. එච්. ජයවර්ධන, සුගතපාල ද සිල්වා, තිලක සුදර්මන් ද සිල්වා, ඇග්නස් සිරිසේන, බන්ධුල විතානගේ, ලුෂන් බුලත්සිංහල, නන්දා ජයමාන්න, මහින්ද අල්ගම, තිලක් ජයරත්න, පාලිත පෙරේරා, වජිර ඉන්දික කරුණාසේන ආදීහු එකී සද්මෙහෙවරට දායක වූ ගුවන්විදුලි නාට්‍ය නිෂ්පාදකවරුන් අතර කිහිප දෙනෙක් වෙති. උසස් සාහිත්‍යය වූ කලී ශ්‍රාවක රසඥතා වර්ධනයෙහි ලා ගුවන්විදුලි නාට්‍යයෙහි අත්‍යවශ්‍ය ප්‍රවේශයක් බව ඔවුහු දැන සිටිය හ. දෙස්විදෙස් සාහිත්‍යය, ලාංකේය ගුවන්විදුලි නාට්‍ය සන්නිවේදනයේ පෝෂණය කෙරෙහි ඉවහල් වූයේ එපරිද්දෙනි.

මූලාශ්‍ර

රත්නකාර, තිලක්. (1961). සාහිත්‍ය හා රසාස්වාදය (ලිපිය), සංස්කෘති ත්‍රෛමාසිකය (සංස්කරණය කේ. සී. පෙරේරා පියදාස මහින්දසිරි) 9 කලාපය 3 සඟරාව, කැලණිය.

දිසානායක, විමල්. (1963). පරිවර්තන සාහිත්‍යය (ලිපිය), තිසර (සංස්කරණය හිනිදුම සරණංකර හිමි ඇතුළු පිරිස), 1 වෙළුම 1 කලඹ, සරසවි ශාස්ත්‍රීය සංවිධානය. නුගේගොඩ.

සිල්වා, සුගතපාල ද. (1993). හඬනළුව හෙවත් ගුවන්විදුලි නාට්‍යය (හැඟවීම), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

මහේන්ද්‍ර, සුනන්ද. (1979). ගුවන්විදුලි නාට්‍ය හතක් (පළමු මුද්‍රණය), ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, කොළඹ.

ලංකා ගුවන්විදුලි සඟරාව, Radio Ceylon, මැයි 4, 1953,

ලංකා ගුවන්විදුලි සඟරාව, Radio Ceylon, ජනවාරි 26, 1953,

ලංකා ගුවන්විදුලි සඟරාව, Radio Ceylon, අප්‍රේල් 4, 1955.

ලංකා ගුවන්විදුලි සඟරාව, Radio Ceylon, 1955-60 අතර කාලය තුළ සඟරාවේ නිතර පළකරන ලද දැන්වීමකි.

ලංකා ගුවන්විදුලි සඟරාව, Radio Ceylon, දෙසැම්බර් 21, 1959,

17

ලාංකික අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය හා පුවත්පත

රෝහණ ලක්ෂ්මන් පියදාස

ජනතාව පාලනය කිරීම හා සංවිධානය කිරීම මෙහෙයවීම සඳහා ඒ ඒ රටවල පාලකයින් විවිධ තරාතිරමෙන් සාමාන්‍ය ජනතාවගේ ආගමික හැඟීම්, ඇදහීම් භාවිත කළ ආකාරය ලෝකය පුරාම විවිධ සමාජ ආශ්‍රිතව දැකිය හැකි ය. ඓතිහාසික වහල් වැඩවසම් සමාජ වලදී මෙන්ම ඉන්පසු ගොඩනැගෙන ධනවාදී ආර්ථික සමාජ වටපිටාවන් තුළ ද මෙම ලක්ෂණය දැකිය හැකි ය. ආසියානු අප්‍රිකානු හා ලතින් ඇමරිකානු යටත් ප්‍රදේශ පවත්වාගෙන ගිය විවිධ යටත්විජිත පාලකයින් යටතේ මෙම ලක්ෂණය 18, 19 ශතවර්ෂ වලදී වඩා හොඳින් දැකිය හැකි විය. පෘතුගාල යටත්විජිතවාදීන්, ලන්දේසි යටත්විජිතවාදීන්, ප්‍රංශ යටත්විජිතවාදීන්, ඉංග්‍රීසි යටත්විජිතවාදීන්, ස්පාඤ්ඤ යටත්විජිතවාදීන් පවත්වාගෙන ගිය යටත් ප්‍රදේශවල මෙය ක්‍රියාත්මක වූ ආකාරය ලොවපුරාම උදාහරණ වෙති.

ලාංකික සමාජ ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී ද මෙය ඉතා හොඳින් වටහා ගත හැකි ය. 16 වන සියවසේදී මෙරට ආක්‍රමණය කළ පෘතුගාල ආක්‍රමණිකයින් හා ඉන්පසු ආක්‍රමණය කළ ලන්දේසින් හා ඉංග්‍රීසින් යටතේ මෙය ඉතා හොඳින් ලාංකික සමාජය තුළ දැකිය හැකි ය. 1815 සමස්ත ලංකාවම යටත් කරගත් බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන් ඉතා උපක්‍රමශීලිව මෙම තත්ත්වය උපයෝගී කරගත්තේ ය. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලකයින් යටතේ 1812 දී මෙරටට ඔවුන්ගේ ආශිර්වාදය යටතේ පැමිණි බැප්ටිස්ට් මිෂනාරීන් 1814 පැමිණි වැස්ලියන් මිෂනාරීන් 1816 දී පැමිණි ඇමරිකානු මිෂනාරීන් 1818 දී පැමිණි ඇංග්ලිකානු මිෂනාරීන් ආගම ප්‍රචාරයට මෙරටට පැමිණි අතර සිය ආගම ප්‍රචාරයට සංවිධානාත්මක සන්නිවේදන ව්‍යාපාරයන් පවත්වාගෙන යාමට මුද්‍රණාල ද යුරෝපයෙන් ගෙන්වනු ලැබී ය. මෙරටට මුලින්ම මුද්‍රණාල ගෙන්වනු ලැබුවේ ඉංග්‍රීසින්ට පෙර මෙරට ආක්‍රමණය කළ ලන්දේසින් විසිනි. ඔවුන් මෙරට ට මුද්‍රණාල ගෙනාවා පමණක් නොව මෙරට බහුතර සිංහල ජනතාව වෙනුවෙන් මුද්‍රණ සන්නිවේදනය සඳහා සිංහල අකුරු නිෂ්පාදනය කොට සිංහලෙන් මුල් වරට මුද්‍රණ කටයුතු ද ආරම්භ කළෝ ය.

මෙම මුද්‍රණ ව්‍යාපාරයට අමතරව ඔවුන්ගේ මූලික සන්නිවේදන කටයුතු ඉතා සංවිධානාත්මකව ගොඩ නගන ලද්දේ ඔවුන් විසින් පිහිටුවන ලද කිතුනු ආගමික දේවස්ථාන හා ඒ ආශ්‍රිතව ඉදි කළ පාසැල් අධ්‍යාපන කටයුතු මගිනි. 1815 වන තෙක් වෙරළබඩ සහ දෙවන අඩතැන්න තෙක් රටවටා වර්ධනය වෙමින් තිබුණ යුරෝපීය පාලනය (පෘතුගීසින්, ලන්දේසින්) ශතවර්ෂ දෙකකට අධික කාලයක් පැතිර. ගොස් තිබුණි. ඒ යටතේ මෙරටට ආගන්තුක වැවිලි කර්මාන්ත කටයුතු පරිපාලන ආයතන යුරෝපීය ආගමික ආයතන, වාණිජ ව්‍යාපාර, වරාය, අධිකරණ කටයුතු, පරිපාලන කටයුතු හා වෙළෙඳාම් කටයුතු තහවුරු වී තිබිණි. 1815 පසු මේ තත්ත්වය තවත් දිවයින පුරාම ව්‍යාප්ත වන ආකාරය හඳුනා ගත හැකිය.

මධ්‍ය කඳුකරයේ ස්වාධීන රාජ්‍යය අල්ලා ගැනීමට 1505 සිට 1815 දක්වා විවිධ අවස්ථාවල ආක්‍රමණ ඇති කළ ද ඒවා මුලුමනින්ම කෙටිකාලීන සමහර ජයග්‍රහණ යළි පසුබෑමට ලක්විය. සාර්ථක වුයේ නැත. අවසානයේදී ඉතා සැලසුම් සහගත බුද්ධිමය මෙහෙයුමක් ඔස්සේ මධ්‍යම කඳුකරයේ ස්වාධීන කන්දේ රාජ්‍යය ද බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් යටත් කර ගන්නා ලද්දේ ස්වදේශීක ප්‍රභුවරුන්ගේ ද සහභාගිත්වය සමග ය. මෙහිද තීරණාත්මක කාර්යභාරය ඉංග්‍රීසි ආණ්ඩුවේ ප්‍රධාන නිලධාරියකු වූ ජෝන් ඩොයිලි ඉටුකළේය. යටත්විජිත පාලනය තහවුරු වීම පිළිබඳ මුල් අවස්ථාවේදී කන්ද උඩරට ප්‍රභුවරුන් හා ජනමතය මෙහෙය වූ මල්වතු අස්ගිරි මහාවිහාර ප්‍රධාන භික්ෂූන් වහන්සේලා අතර ඇති වන නොසන්සුන්තාවන්, කලකිරීම් අවසානයේදී අධිරාජ්‍යය විරෝධී සන්නද්ධ අරගල දක්වා වර්ධනය වන ආකාරය 1818 ඌව වෙල්ලස්ස කැරැල්ල, 1848 මාතලේ කැරැල්ල වශයෙන් එය වටහා ගත හැකිය. මෙම සන්නද්ධ නැගිටීම් ස්වදේශික දේශප්‍රේමීන්ට පරාජය අත්පත් කරදෙමින් කෙලවර වන්නේ මහා විනාශයන් හා සහාසික මර්ධනයන් සමඟ ය.

ශ්‍රී ලාංකික අධිරාජ්‍යය විරෝධී අරගලයේ දෙවන පියවර ලෙස හඳුනා ගත හැක්කේ ඉන්පසු එළඹෙන යුගයයි. සන්නද්ධ ගැටුම් වලින් ලද වේදනාකාරී අත්දැකීම්වලින් පසු නැවත එවැනි සන්නද්ධ නැගිටීම් සංවිධානාත්මකව හඳුනාගත නොහැකි ය. ඉන්පසු මෙරට අධිරාජ්‍ය විරෝධී අරගලය නැවත අවදිවන්නේ බුද්ධිමය හා ශාස්ත්‍රීය වශයෙන් වූ ව්‍යාපාරයක් වශයෙනි. දිගු කලක් තිස්සේ රාජ්‍ය අනුග්‍රහයක් නොමැතිව පිරිහෙමින් හා හුදකලා වෙමින් පමණක් නොව විවිධ සොර සතුරන්ගේ ග්‍රහණයට හසු වෙමින් පැවති බෞද්ධ ආගමික ස්ථාන හා ගිහි පැවිදි පඬිවරුන්ගේ ප්‍රමාණය ඉතා සීමා වෙමින් පැවතුණි. යටත්විජිත පාලකයන්ගේ අනුග්‍රහයෙන් යුරෝපයෙන් පැමිණි මිෂනාරිවරුන්ගේ වරප්‍රසාද සංවිධානාත්මක කටයුතු හේතු කොට මෙරට දිළිඳු ග්‍රාමීය ජනයා පමණක් නොව බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන්ගේ වාණිජ ව්‍යාපාර කටයුතු හා වරප්‍රසාද කෙරේ ලොල් වූ මැද පන්තික හා ප්‍රභු සමාජ කණ්ඩායම් ද එම ව්‍යාපාර වලට ඇදීයමින් තිබුණි. මෙවැනි වටපිටාවක් තුළ යටත්විජිත පාලනය ප්‍රශ්න කිරීම හා එයට එරෙහි වීම හඳුනාගත හැක්කේ මේ වන විට දකුණු ලක සීමිතව වර්ධනය වෙමින් පැවති බෞද්ධ ගිහි පැවිදි පඬිවරුන්ගේ ව්‍යාපාරයයි.

සුප්‍රකට අප්‍රිකානු ජාතික සමාජ මානව විද්‍යාඥයකු වූ ෆ්‍රාන්ස් ෆැනොන් සිය "මිහිතලයේ අසරණයෝ" ග්‍රන්ථයෙන් පෙන්වා දෙන පරිදි අධිරාජ්‍යය විරෝධී පාලනයට දිගු කලක් තිස්සේ ගොදුරුවන රටවල නැවත අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයන් ගොඩ නැගෙන්නේ එම ස්වදේශිකයන්ගේ දේශීය ආගම්, භාෂා, සංස්කෘතික උරුමයන් රැක ගැනීමේ ව්‍යාපාර වශයෙනි. එම යථාර්ථය ආසියානු, අප්‍රිකානු බොහෝ යටත් ප්‍රදේශ වලට මෙන්ම ශ්‍රී ලංකාවට ද පොදු වූ බව හඳුනා ගත හැකි ය. මෙරට

බහුතර සිංහල බෞද්ධ ජනතාව අතරින් මේ වන විට මෙම වාතාවරණය වටහා ගනිමින් සිටි උගත් බුද්ධිමත් භික්ෂූන් වහන්සේලා හා උගත් ගිහි පඬිවරුන්ගේ මූලිකත්වයෙන් මෙම ව්‍යාපාරය ගොඩනැගෙන ආකාරය හඳුනා ගත හැකි ය. විශේෂයෙන්ම මේ යුගයේදී මෙම ව්‍යාපාරයට නායකත්වය දෙන බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා පඬිවරුන් කීප දෙනෙකු හඳුනාගත හැකි ය. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්, හික්කඩුවේ සුමංගල හිමියන්, වස්කඩුවේ සුභූති හිමියන්, බුලත්ගම ධම්මාලංකාර හිමියන්, දොඩන්දූවේ පියරතන හිමියන් ඉන්කිහිප නමකි. බටුවන්තුඩාවේ පඬිතුමා, අනගාරික ධර්මපාල, සී. දොන්බස්තියන් ප්‍රධාන ගිහියන් ද මෙහි කැපී පෙනේ.

මේ වකවානුව වන විට මිෂනාරිවරුන් සිය පල්ලි ආශ්‍රිතව ගොඩනගා තිබූ පාසල් ආශ්‍රිතව සිය සංස්කෘතික ආක්‍රමණය ඉතා ක්‍රමවත්ව පවත්වාගෙන ගිය අතර එම අධ්‍යාපනය යටතේ යටත්විජිත හිමියාගේ ආගම, භාෂාව, සිරිත් විරිත්, පරිපාලනයට අවශ්‍යය වන මනෝභාවයන් හා ශික්ෂණයන් ඉතා හොඳින් තහවුරු කරමින් පැවතුනි. මේ වටපිටාව කෙතරම් පරාධීනව පැවතියේද යත්, තමන් සිංහල බව, බෞද්ධ බව පිළිගැනීම ගෞරවනීය නොවන සාධකයන් බවට පත් වී තිබුණි. මෙම වාතාවරණය සෙසු සුළු ජන කණ්ඩායම් ආශ්‍රිතව ද දැකිය හැකි විය. කෙසේ නමුත් මෙම වාතාවරණය පිලිබඳ අභියෝග කිරීම සඳහා වූ බුද්ධිමය හා ශාස්ත්‍රීය අරගලය මීළගට මතු වන්නේ ධර්මශාස්ත්‍රිය හා දේශනා වශයෙනි. ඊට හේතු වූ ප්‍රධාන පසුබිම නිර්මාණය වන්නේ ද යටත්විජිත පාලකයින් විසින් ඇති කරන ඒක පාර්ශවීය ආගමික සන්නිවේදන ව්‍යාපාරයන් ය.

බ්‍රිතාන්‍ය පාලනය යටතේ ගෙනෙන ලද මුද්‍රණාල ඔස්සේ කිතුනු ආගමික ලේඛන පල කිරීමට අමතර බුදුදහමට හා බුද්ධ චරිතයට අපහස වන පරිදි මෙන්ම බුදු සමයේ ආගමික ලේඛන විකෘති කරමින් කළ විවේචනයන් පදනම් කරගෙන පල කළ පතපොත විශාල වශයෙන් පැතිරවීම හේතු කොට ගෙන එම වාතාවරණය වඩාත් උත්සන්න වෙමින් පැවතුනි.මේ බව 1831 දී මෙරටට පැමිණි කෝල්බෲක් කොමසාරිස්වරයාගේ වාර්තාවේ මෙසේ සඳහන් වෙයි.

''කොළඹ පිහිටි ඉතාමත් සීමිතව කටයුතු කරන්නා වූත් අඩුපාඩු වලින් යුක්ත වූත් රජයේ මුද්‍රණාලය හැරුණු විට විට එක් එක් මිෂනාරි සමාගම් මගින් පවත්වාගෙන යනු ලබන කුඩා මුද්‍රණාලයන් ද වෙයි. ආගමික පොත් හා කෙටි දේශනා ඉංග්‍රීසියෙන් හා ස්වභාෂාවන්ගෙන් මුද්‍රණය කොට ප්‍රචාරය කිරීමට මේවා භාවිත කෙරිණ. මෙම මුද්‍රණාලවල වැඩකටයුතු වල සීමිත බව සුචරිත වන්දනයට හා බුදුන් වහන්සේ බාධාවක් වී ඇත (Mendis G.C.-Colbrook Cemeron Parpers- vol.1 oxford P-75). මිෂනාරිවරුන් සතු සංවිධානාත්මක මුද්‍රණාල වලින් පතපොත පල කළ හැකි වුවත්, ඊට පිළිතුරු දීමට එවැනි සංවිධානාත්මක මුද්‍රණාල බෞද්ධ සමිති සමාගම් සතුව පැවතියේ නැත. මේ නිසා මීට විකල්ප වශයෙන් මුහුණ දීමට දකුණුලක පිබිදෙමින් තිබූ ජාතික ව්‍යාපාරයේ සටන්කාමී නායකයකු වූ තරුණ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ඊට එරහිව පිළිතුරු දීම සඳහා දේශනා දීම ආරම්භ කළේ ය.

තරුණ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් වෙස්ලි විද්‍යාලය යටතේ අධ්‍යාපනය ලැබුවේ සිය වැඩිහිටියන් හා ගුරුවරුන්ගේ උපදෙස් මත කිතුනු පූජකවරයකු වීම සඳහා ය. ඒ අනුව ඔහු බයිබලය ඇතුළු කිතුනු ආගමික සාහිත්‍ය ඉතා හොඳින් ප්‍රතිවේද කොට තිබුණි. මේනිසා උන්වහන්ස්සේට මිෂනාරිවරුන්ගේ විවේචනයන්ට නිර්දය හා ප්‍රහාරාත්මකව පිළිතුරු දීමට හැකියාව ලැබුණි.

උන්වහන්සේගේ ධර්ම දේශනා ව්‍යාපාරය කෙතරම් ආකර්ෂණීය හා ජනප්‍රිය වුයේ ද යත් එක් වර්ෂයක් තුළ සමහර කාලවල එවැනි දේශනා දෙදහසකට (2000) වැඩි ප්‍රමාණයක් පවත්වන ලදී. මෙම ව්‍යාපාරය කෙතරම් ජනප්‍රිය වුයේද යත් මිෂනාරින්ට විරුද්ධව සමහර පෙරහැරවලදී මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ පිළිරූ බෝඩ් වල ඇඳ ඔසවාගෙන ගිය බව කියනු ලැබේ.

යටත් විජිත පාලනය මෙරට ස්ථාපනය වීම කෙතරම් බලවත්වීද යත් ජාතික, ආගමික වශයෙන් ගොඩනැගෙමින් තිබුණු මෙම උණුසුම් වාතාවරණය ධර්ම ශාස්ත්‍රීය වාදවිවාද සහ මිෂනාරිවරුන් හා බෞද්ධ නායකයින් අතර ඇතිවන ප්‍රසිද්ධ වාදවිවාද දක්වා ඉදිරියට ඇදී ගියේ ය. මෙහි සුප්‍රකට සන්ධිස්ථානය වන්නේ 1873 දී ඇති වූ ඓතිහාසික පානදුරාවාදයයි. මේ වනවිට උත්සන්න වෙමින් තිබුණු යටත්විජිත හිමියා නියෝජනය කළ මිෂනාරිවරුන්ගේ ප්‍රචාරක කටයුතු බුදුසමය, බුද්ධ චරිතය, ශාස්ත්‍රීය වශයෙන් ඉක්මවා පෞද්ගලික මෙන්ම නිර්දය විවේචනයන් දක්වා පිරිහෙමින් තිබුණි. පානදුරාවාදය ඓතිහාසිකමය වශයෙන් වැදගත් වන්නේ මෙම සන්දර්භය තුළය. මේ නිසාම මෙම සමාජ, දේශපාලනමය සිදුවීම රටේ වැදගත් ඓතිහාසිකමය බලපෑමක් එල්ල කළ අවස්ථාවක් විය.

බෞද්ධ පාර්ශ්වය වෙනුවෙන් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි නායකත්වය ගත් අතර කිතුනු මිෂනාරීන් වෙනුවෙන් පානදුර වැස්ලියන් පල්ලියේ ප්‍රධාන කතිසේරු ඩේවිඩ් ද සිල්වා ප්‍රධාන පිරිස සහභාගී විය. ඓතිහාසික මෙම සිදුවීම දැකබලා ගැනීමට දෙස් විදෙස් විශාල පිරිසක් ඊට සහභාගී විය. එවකට ලංකාවේ ජනප්‍රිය පුවත්පත වූ සිලෝන් ටයිම්ස් පුවත්පතේ ප්‍රධාන කර්තෘ ජෝර්ජ් කැපර් සිංහලෙන් සිදු වූ මෙම වාදය කොළඹ උසාවියේ ප්‍රධාන තොල්කමුදලි ඊ.ඩබ්ලිව්.ප්‍රේරා මහතා ලවා ඉංග්‍රීසියට පරිවර්තනය කර එම වාදය කොටස් වශයෙන් පළ කළේය.මෙම වාර්තාව එම වාද අවස්ථාවට සහභාගී වූ ඇමරිකානු ජාතික ජේ.එම්.පිබර්ස් පඬිතුමා විසින් ඇමරිකාවට රැගෙන ගොස් එහිදී එම වාදයේ කරුණු කුඩා පොත්පිංචක් ලෙස පලකරන ලදී. ඊට පෙරවදනක් ලියන එතුමා මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිගේ වාග්චාතුර්යය හේතුවෙන් බෞද්ධ පාර්ශ්වය ජයගත් බව එහි සඳහන් කළේ ය.

පසුකාලීන ශ්‍රී ලංකාවේ ජාතික, ආගමික, ප්‍රබෝධයට පදනම වූ කර්නල් ස්ටිල් ඕල්කොට් තුමා පැමිණීමට පදනම ලැබුනේ ජේ.එම්.පිබර්ස්පඬිතුමා විසින් ලියන මේ ග්‍රන්ථය එතුමන්ට කියවීමෙන් පසුව ඇති වූ බුද්ධිමය ප්‍රබෝධය පසුබිම් කරගෙනය. එම ග්‍රන්ථය කියවූ ඕල්කොට්තුමා එම වාදයට සහභාගී වූ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි,සුමංගල හිමි ප්‍රධාන ගිහිපැවිදි නායකයන් සමග ලිපි හුවමාරු කරගත් බවත් ඉන්පසු එතුමා ලංකාවට පැමිණීම හා මෙරට පරමවිඥානාර්ථ සමාගමේ ශාඛාවක් මෙරට පිහිටුවීම සහ මෙරට යටත්විජිත හිමියාගේ සංස්කෘතිය මතවාදය ව්‍යාප්ත කිරීමට නායකත්වය දුන් මිෂනාරි ආගමික ස්ථාන කේන්ද්‍ර කරගෙන පිහිටුවන ලද පාසල් වෙනුවට මෙරට විකල්ප බෞද්ධ අධ්‍යාපන පාසල් ආයතන පිහිටුවීම ඇරඹී ය.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය මෙරටට පැමිණි මිෂනාරි ආගමික ආයතන යටතේ ආරම්භ වූ මුද්‍රණාල යටතේ ආගමික ප්‍රකාශන බිහි වීම ඇරඹුණි. මේ යටතේ බිහි වූ ප්‍රථම ජනමාධ්‍ය වන්නේ සඟරා ප්‍රකාශනයයි. 1832 ඇරඹි මාසික තෑග්ග, 1840 ඇරඹි ලංකා නිධානය සිය කිතුනු මිෂනාරි අදහස් ව්‍යාප්ත කිරීමට මෙන්ම බහුතර දෙනාගේ පිළිගැනීමට ලක් වූ බුදු සමය හා එහි වත්පිළිවෙත් ප්‍රශ්න කිරීමට හා විවේචනය කිරීමට උනන්දු වී තිබුණි.

යටත් විජිත පාලකයන් ගේ මෙම සංවිධානාත්මක ආගමික ප්‍රචාරණ වැඩපිළිවෙළට විකල්ප ලෙස සැරසී වාද විවාද ව්‍යාපාරය අවසානයේ බෞද්ධ මුද්‍රණාල අරමුදල අරඹන ලද්දේ බුලත්ගම ධම්මාලංකාර හිමිගේ ප්‍රධානත්වයෙනි. ඒ අනුව 1860 ගාල්ලේ දංගෙදර වීදියේ ලංකෝපකාර මුද්‍රණාලය ඇරඹී අතර දෙවන බෞද්ධ මුද්‍රණාලය 1862 මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිගේ ප්‍රධානත්වයෙන් කොටහේනේ දී විවෘත විය. 1864 දී ලංකාභිනව විශ්‍රැත ශාස්ත්‍රාලය ආරම්භ විය.

මෙම මුද්‍රණාලය මඟින් මිෂනාරි ආගමික ලේඛන වලට එරෙහි විකල්ප පතපොත පල වීම වර්ධනය වන අයුරු දැකගත හැකි ය.

මෙරට ප්‍රථම සිංහල පුවත්පත වූ "ලංකාලෝකය" බිහි වන්නේ 1860 දී ප්‍රථම බෞද්ධ මුද්‍රණාලය පදනම් කරගෙන ය. මේ අනුව ක්‍රමයෙන් අවධි වන අධිරාජ්‍ය විරෝධී ජාතික අරගලය 19 වන සියවස අග භාගය 20 වන සියවස මුල භාගයේ මහත් උණුසුම් ලෙස අවධි වන්නට පටන් ගත්තේ ය.

මෙම ජාතික ප්‍රබෝධය සමඟ මෙරට අධිරාජ්‍ය විරෝධී ජාතික ව්‍යාපාරයේ නායකයන් රැසක් ගොඩනැගෙන ආකාරය හඳුනාගත හැකිය. අනගාරික ධර්මපාලතුමා, පියදාස සිරිසේන, ඩී.ඩබ්ලිව්. වික්‍රමාරච්චි, ජෝන් ද සිල්වා, සි.දොන් බස්තියන් මෙයින් කිහිපදෙනෙකි. මෙම ආගමික ජාතික හැඩයෙන් යුතු ව්‍යාපාරය සංවිධානාත්මක සන්නිවේදන ව්‍යාපාරයක් දක්වා වර්ධනය වන ආකාරය හඳුනාගත හැකිය. ධර්ම දේශනා, සංවාද, වාදව්‍යාපාර, මුද්‍රණාල ඇරඹීමේ ව්‍යාපාර, පුවත්පත් ඇරඹීම මගින් ඒ වනවිට පැවති ලොව දියුණුම සන්නිවේදන මාර්ගය වූ පුවත්පත ගොඩනැගීමට මෙම ව්‍යාපාරය සමත් විය. මේ වනවිට යටත් විජිත පාලකයන් විසින් මෙරට පුවත්පත් අරඹා තිබුණි. ඉංග්‍රීසි පාලකයන්, පරිපාලන නිලධාරීන්, යටත් විජිත ව්‍යාපාරිකයින් හා මෙරට ප්‍රභූ සමාජ කණ්ඩායම් මෙම පුවත්පත්වල පාඨකයන් වී සිටියේ ය.

අධිරාජ්‍ය විරෝධී ජාතික ව්‍යාපාරය යටතේ ජාතිය ආගම භාෂාව සිය අනන්‍යතාව වෙනුවෙන් වූ ව්‍යාපාර දකුණේ සිංහල සමාජය තුළ මෙන්ම මෙරට උතුරු ප්‍රදේශයේ යාපන අර්ධද්වීපයේ දෙමළ සමාජයෙන් ද රට මැද වාසය කළ මුස්ලිම් සමාජය තුළ ද මතුවන ආකාරය යාපනයේ නල්ලූර් ප්‍රදේශයේ ආරුමුගර් නාවලර්තුමා කේන්ද්‍ර කරගෙන ඇරඹූ "උදයභානු" පුවත්පත හා එතුමාගේ ආගමික සංස්කෘතික ව්‍යාපාර මෙන්ම මහනුවර නගරයේ සිද්දි ලෙබ්බේ තුමාගේ ප්‍රධානත්වයෙන් ඇරඹී "මුස්ලිම් නේෂන්" පුවත්පත හා එම ව්‍යාපාරය පෙන්වා දිය හැකිය.

මේ අවධියේදී ලංකික සමාජයේ සිදුවෙමින් පැවති අධිරාජ්‍ය විරෝධී මතවාද මතු සංවිධානයක් වූයේ අමද්‍යප ව්‍යාපාරයයි. සමකාලීන යටත්විජිත පාලකයන් රට පුරා සුරාසැල් විවෘත කිරීමට එරෙහිව මතු වූ මෙම ව්‍යාපාරය වඩාත් උණුසුම් වන්නේ ඒ හා බැඳුනු අධිරාජ්‍යය විරෝධය සමගය. සන්ධිස්ථානමය සිද්ධියක් ලෙස 1915 ඇති වන ජාතිවාදී කෝලාහලය පෙන්වා දිය හැකි ය. එහි ප්‍රධාන තීරණාත්මක අවස්ථාව වනවිට රටේ නිෂ්පාදන හා සේවා කාර්යයන් ක්‍රියාවලින් තීරණාත්මක ලෙස යටත්විජිත හිමියාගේ බ්‍රිතාන්‍ය පාලකයන්ගේ ඕනෑ එපාකම් වලට සමපාත වෙමින් තිබුණි. 1915 වන විට බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරට සංවිධානාත්මකව කෝපි වගාව තේ වගාවට මාරු වෙමින් රටේ දෙවැනි අඩතැන්න හා මාධ්‍ය කඳුකරය වසා ගෙනයමින් තිබුණි. රට මධ්‍යයේ තේ කර්මාන්ත ශාලා මෙන්ම වරාය

ආසන්නයේ ගබඩා සංවිධානත්මකව භාණ්ඩ සේවා ප්‍රවහනයන් ආරම්භව තිබුණි. මෙම තත්ත්වය සමඟ රටේ ජන ජීවිතයද යම් ආකාරයකට පරිවර්තනය වන ආකාරය දැකිය හැකිය.

විශේෂයෙන් ඉන්දියාවෙන් මෙරටට ගෙන්වනු ලැබූ ඉන්දීය වතුකම්කරුවන් හේතුකොටගෙන රට මධ්‍යයේ ස්වදේශික පාරම්පරික ජනතාව වෙනුවෙන් සිය පාරම්පරික වාසස්ථාන අහිමිවීම හා ඉඩම් ප්‍රශ්නයක් ජනිත විය. රට මැද පදිංචි කළ ඉන්දීය වතු කම්කරුවන් සමග ජන වාර්ගික ප්‍රශ්නයක් ජනිත කළ ආකාරය දැකිය හැකිය. එම වාතාවරණය ඉදිරියට ඇදී යන්නේ යටත් විජිත පාලනය සමාජීය ප්‍රතිසංස්කරණ හේතුවෙන් බිහිවන දේශීය ඉඩම් හිමි වැවිලිකාර, ව්‍යාපාර කණ්ඩායම්වල බලපෑම් හේතුවෙනි. එම ඉඩම් හිමි වැවිලිකරුවන් මෙන්ම සේවා සැපයූ ධනපතීන් තමන් උපයා ගත් අසීමිත ලාභය මත සිය දරුවන් යටත්විජිත මව් රටවල් වෙත අධ්‍යාපනයට යොමු කිරීම හා වසර ගණනකට පසු ඔවුන් පෙරලා මෙරට පැමිණීම සමග ය.

මේ වනවිට වැඩෙමින් තිබුණු ජාතික ව්‍යාපාරය යටතේ ඇරඹුණු පුවත්පත් ලංකාලෝකය, සරසවි සඳරැස, ලක්මිණි පහන, සිංහල බෞද්ධයා, ස්වදේශ මිත්‍රයා, සිංහල බලය, සිංහල ජාතිය, සිංහල මිත්‍රයා, රුහුණු හඬ, උඩරට තරුණයා, දිනමිණ, දිනපතා ප්‍රවෘත්ති මෙන්ම දෙමළ මාධ්‍යයෙන් පළ වූ උදයභානු, මුස්ලිම් නේෂන් වැනි පුවත්පත් වලින් මතුකළ අධිරාජ්‍ය විරෝධී මනෝභාවය මෙරට කෙතරම් බලවත් විද යත් 1915 ගැටුම් පදනම් කරගෙන එවකට පොලිස්පතිව සිටි හර්බට් ඩව්බිගිනි පොලිස්පතිවරයා බ්‍රිතාන්‍ය ආණ්ඩුවට රහස් ලිපියක් යවමින් මෙම ජාතික ආගමික ව්‍යාපාර සියල්ල කේන්ද්‍ර වී ඇත්තේ බ්‍රිතාන්‍ය පාලනයෙන් ස්වාධීන අභ්‍යන්තර පාලනයක් ලබා ගැනීමට බව පෙන්වා දී තිබුණි. ඒ අනුව මෙම පුවත්පත් තහනම් කිරීමට හා කතෘවරුන්, ප්‍රකාශකයින් අත්අඩංගුවට ගැනීමට නිර්දේශ කළේ ය.

බ්‍රිතාන්‍ය පාලනයේ ව්‍යාප්තිය සමඟ මෙරට දේශ.ය ව්‍යාපාරික ප්‍රභූ සමාජයක් නිර්මාණය වන ආකාරය ද කැපී පෙනුණි. විවිධ භාණ්ඩ හා සේවා සපයන්නන් ලෙස ඔවුන් 19 සියවස හා 20 සියවස මුල මෙරට තහවුරු විය. යටත් විජිත පාලකයන්ගේ හොඳ හිත දිනාගත් ඔවුන් සිය දහම ලබ්ධිය වෙනස් කරමින් යටත් විජිත පාලකයන් යටතේ විවිධ නම්බුනාම වරප්‍රසාද ලබාගත් කළු සුද්දන්ගේ පංතියක් බවට පත් වී තිබුණි. ඔවුන් සිය ධනය යොදා සිය දරුවන් විදේශ ගතකොට ඉගැන්වීමට යවන ලදි. සිය අධ්‍යාපනය හමාර කොට මෙරටට එන ඔවුන් මීළඟට මෙරට දේශපාලනයට අවතීර්ණ වීම දැකගත හැකිය. ඊට එරෙහිව මතුවන මෙම ව්‍යාපාරය 20 වන සියවස මුල භාගයේ යම් ආකාරයක සමාජ දේශපාලන ක්ෂේත්‍රයේ පාලනය වීමක් හෝ සිමාවීමක් විදේශීය අධ්‍යාපනය හමාර කර මෙරටට පැමිණෙන උගත් ව්‍යාපාරික තරුණයන්ගේ ව්‍යාපාර මඟින් සිදු වූවා යැයි හඳුනාගත හැකි ය. මේ වනවිට ජාතික, ආගමික ප්‍රබෝධ ව්‍යාපාරය යටතේ වැඩෙමින් තිබුණු සන්නිවේදන ව්‍යාපාරය සමාජයේ හුදු පොදු මග ජනතාව අතර යටත්විජිත වාදයේ සාහසිකත්වය, ප්‍රචණ්ඩත්වය සහාසික බව ඔවුන්ට දැනෙන අයුරින් තේරුම් කරදීමට ඊට එරෙහි වීමට සංවිධානය වීමට සමත් විය. එහෙත් ඊට එරෙහිව ගතහැකි විකල්ප ක්‍රියා මාර්ග හෝ විකල්ප යෝජනා මේ ජාතිමාමාකයින් අතින් ඉදිරිපත් නොවී ය.

මේ සඳහා නායකත්වය දීමට ඉදිරිපත් වන සංවිධානාත්මක ව්‍යාපාරයන් හමුවන්නේ 20 වන සියවස මුල භාගයේදී විදේශ අධ්‍යාපනය හමාරකර මෙරටට පැමිණෙමින් සිටි ප්‍රභූ සමාජයේ උගත් තරුණයන් විසිනි. ඉඩම්හිමි වැවිලිකරුවන්, යටත් විජිත පාලකයින්ගේ ආයතන වලට භාණ්ඩ හා සේවා

සපයන්නන් වශයෙන් ඔවුන් කැපී පෙනිණි. ලංකා ප්‍රතිසංස්කරණ සංගමය, ලංකා ජාතික සංගමය වශයෙන් මෙම කණ්ඩායම් සංවිධානය වන ආකාරය හඳුනා ගත හැකිය. මෙම කණ්ඩායමට අයත් ඩී.ආර් විජේවර්ධන මෙරටට පැමිණෙන්නේ නීතිඥවරයකු වශයෙන් වුව ද ඔහුගේ අපේක්ෂාව වූයේ මෙරට බටහිර තාලයේ සංවිධානාත්මක කළමනාකාරිත්වයෙන් යුතු පුවත්පත් ආයතනයක් මෙරට පිහිටුවීමයි.

ඒ සඳහා මෙරට කීර්තිමත් මෙන්ම නමක් හදාගෙන සිටි ජනප්‍රිය පුවත්පත් කිහිපයක් මිළදී ගැනීමට ඔහු සමත් විය. 1909 දී ඇරඹි මෙරට ජාතික ව්‍යාපාරයේ කීර්තිමත් පුවත්පතක් වූ එස්.එච්.පෙරේරාගේ කර්තෘත්වයෙන් පළ වූ දිනමිණ පුවත්පතේ නමේ අයිතිය ඔහු මිළදී ගත්තේය. කීර්තිමත් ඉංග්‍රීසි පුවත්පතක් වූ "සිලනීස්" පුවත්පතේ නමේ අයිතිය ද "ඔබ්සර්වර්" පුවත්පතේ නමේ අයිතිය ද ඔහු මිළදී ගත්තේ ය. ලංකා ජාතික සංගමයේ ප්‍රකාශන මාධ්‍යය බවට පත්වූයේ මේ පුවත්පත් ය. විශේෂයෙන් ලංකා ජාතික සංගමයේ අදහස් පෙත්සම් යැවීමේ ව්‍යාපාර ඒ හා සම්බන්ධව ප්‍රධාන නගරවල ශාලාවන්හි ඉඩම් හිමි වැවිලිකරුවන් ප්‍රභූවරුන් සමඟ පවත්වාගෙන ගිය රැස්වීම් වාර්තා කිරීමට හා ඒ හා බැඳුනු ජනමතය මෙහෙයවීමේ ව්‍යාපාරයට ඔවුන් මැදිහත් විය. සන්නිවේදන ව්‍යාපාරයක් වශයෙන් ලංකා ජාතික සංගමය වෙනුවෙන් ඩී.ආර්.විජේවර්ධනගේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමගම් ව්‍යාපාරය මීට පෙර ජාතික ව්‍යාපාරයේ පුවත්පත් සන්නිවේදනයට වඩා කළමනාකරණමය වශයෙන් සංවිධානාත්මක විය. කර්තෘමණ්ඩල අංශය, කළමනාකරණ හා දැන්වීම් අංශය, බෙදාහැරීම් අංශය, අලෙවි අංශය වශයෙන් විධිමත්ව පැවතුණි. පෙර කි කර්තෘ මූලික පුවත්පත්වල සමස්ත ක්‍රියාවලියම කතෘවරයා හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටි සමිති සමාගම් මත තීරණය විය.

එපමණක් නොව කර්තෘ මූලික පුවත්පත් සංවිධානාත්මක පුවත්පත් ව්‍යාපාරය සමඟ තරග කිරීමට නොහැකිව අකර්මන්‍යව නවතිද්දී එම කතෘවරුන් විජේවර්ධන මහතා සිය වාණිජ පුවත්පත් ව්‍යාපාරයට එකතු කර ගත්තේ ය. ලංකා ජාතික සංගමය පසුකාලීනව එක්සත් ජාතික පක්ෂය ලෙස සංවර්ධනය වීම සමඟ ඩී.ආර් විජේවර්ධනයන්ගේ පුවත්පත් ව්‍යාපාරයද ඊට අනුකූලව හැඩගැසෙන අයුරු දැකගත හැකිය. ඩී.ආර් විජේවර්ධනගේ පුවත්පත් හා මේ වනවිට වැඩෙමින් පැවති ජාතික ව්‍යාපාරයේ සමිති සමාගම් පුද්ගලයන් අතර ප්‍රතිවිරෝධතාවයන් උත්සන්න වෙමින් පැවතී අතර එහි ප්‍රතිපලයෙන් සමාජ දේශපාලනික මතවාදය ද විවිධ වෙනස්කම් හඳුනාගත හැකිය.

ඩී.ආර්. විජේවර්ධනයන්ගේ පුවත්පත් ලංකා ජාතික සංගමයේ මූලික මතවාදය වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හරහා දේශපාලන බලයට ස්වදේශිකයන් මැදිහත් වීම වෙනුවෙන් පෙනී සිටියේ ය. එම උද්ඝෝෂණ මුළුමනින්ම අධිරාජ්‍ය පාලනයක් යටතේ සිටීමට වඩා ප්‍රගතිශීලි නිදහස සඳහා ඇදී යන ව්‍යාපාරයක් වශයෙන් හැඳින්විය හැකි ය. මේ නිසා දිනමිණ ඇතුළු එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ පුවත්පත්ද එක්තරා ආකාරයට අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයට සම්බන්ධ වුවා යැයි සඳහන් කළ හැකිය. 20වන සියවස මුල භාගයේදී විදේශ අධ්‍යාපනය හමාර කර මෙරටට පැමිණෙමින් සිටි විදේශ තරුණයන් අතර තවත් කණ්ඩායමක් වෙනමම හඳුනා ගතහැකි ය.

මේ වනවිට ලෝකයේ සිදුවෙමින් තිබුණු විවිධ ජාත්‍යන්තර මට්ටමේ අධිරාජ්‍ය විරෝධී විමුක්ති ව්‍යාපාර, වෘත්තීය සමිති ව්‍යාපාර 1917 ඔක්තෝම්බර් රුසියානු විප්ලවයේ බලපෑම් කියවමින් ආශ්වාදනය කරමින් සිටි ඔවුන් ඒ වන විට උණුසුම් වෙමින් තිබුණු ඉන්දීය නිදහස් ව්‍යාපාරයේ සම්බන්ධතාවයන් ද

සමග මෙරටට පැමිණියෝය. මෙරට පුරෝගාමී වාමාංශික ව්‍යාපාරය ලෙස හඳුනා ගන්නා ඔවුන් මුලින්ම සංවිධානය වන්නේ ඒ වන විට යටත් විජිත සොල්දාදුවන් වෙනුවෙන් ආධාර ලබා ගැනීමේ පොපිමල් ව්‍යාපාරයට විකල්පයක් වශයෙන් ඇරඹි සූරියමල් ව්‍යාපාරය සංවිධාන කරමිනි. මෙරට තීරණාත්මක පූර්ණ ස්වරාජ්‍ය සඳහා වූ අධිරාජ්‍ය විරෝධී නිදහස සඳහා දැනුවත් සන්නිවේදන ව්‍යාපාරය ඇරඹෙන්නේ මෙම ව්‍යාපාරය හරහාය.

20වන සියවස 3වන දශකය වන විට මෙරට පැතිර යන ලෙඩ රෝග වසංගත විශේෂයෙන් මැලේරියාව වසංගතයක් සේ පැතිර යද්දී සහනාධාර සහ උපකාර සේවාවන් වශයෙන් සහනාධාර ලබාදීම බේත්හේත් බෙදාහැරීම සඳහා සූරියමල් ව්‍යාපාරයේ ක්‍රියාකාරීන් ක්‍රියාකාරිව සහභාගී විය. 1934 දි සූරියමල් ව්‍යාපාරය යටතේ මෙරට පූර්ණ නිදහස හෙවත් ස්වරාජ්‍ය සඳහා වූ ඉල්ලීම සහිත හඬ නැගූ ප්‍රථම පුවත්පත ලෙස හඳුනාගතහැකි වන්නේ සූරියමල් ව්‍යාපාරය යටතේ පලකරන ලද කම්කරුවා පුවත්පතයි. බී.ජේ.ප්‍රනාන්දුගේ කර්තෘත්වයෙන් පළ වූ කම්කරුවා පුවත්පත සාමාන්‍ය ජනතාවට දැනෙන තේරෙන අයුරින් රට යටත්විජිත භාවයෙන් මුදාගැනීමේ අවශ්‍යතාව පූර්ණ ස්වරාජ්‍ය අත්කරගැනීම පමණක් නොව ඉන් අනතුරුව බිහිවිය යුතු පාලන ක්‍රමය රුසියාවේ පවතින්නක් මෙන් සමසමාජවාදී පාලනයක් විය යුතු බව විස්තර කළේ ය.

මේ අනුව මෙරට ජාතික අරගලයේ තීරණාත්මක සංධිස්ථානයක් ලෙස මෙම පුවත්පත පෙන්වා දිය හැකි ය. මෙයින් අනතුරුව 1935 දි බිහිවන ලංකා සමසමාජ පක්ෂය කම්කරුවා පුවත්පතින් ගෙන ගිය පණිවිඩය වඩාත් සංවිධානාත්මකව ගෙන යාමට සිංහල මාධ්‍යයෙන් සමසමාජය, දෙමළ මාධ්‍යයෙන් සමධර්මම්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමසමාජිස්ට් වශයෙන් පුවත්පත් තුනක් ආරම්භ කරන ආකාරය හඳුනා ගතහැකිය. ඉතා ජනප්‍රිය වූ මෙම පුවත්පත් සඳහා ලිපි ලියූ ලේඛකයන් අතර එම යුගයේ කීර්තිමත් පඬිවරුන් බුද්ධිමතුන් කවීන් ලේඛකයන් රැසක් සම්බන්ධ වූ ආකාරය හඳුනාගත හැකිය. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි, ගුණපාල මලලසේකර, ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම් ඉන් කැපී පෙනෙන තිදෙනෙකි.

20වන සියවසේ අධිරාජ්‍ය විරෝධී අරගලය තීරණාත්මක හා බලපෑමක් කළ සමසමාජ ව්‍යාපාරය එහි සන්නිවේදන ව්‍යාපාරය සාමාන්‍ය ජනතාව විවිධ වෘත්තිකයන්, විවිධ සමාජ කණ්ඩායම් හරහා එම අධිරාජ්‍ය විරෝධී මතවාදය ගෙන යාමට මැදිහත් වූ ආකාරය හඳුනාගත හැකිය. කෙසේ නමුත් රටේ තීරණාත්මක සමාජ බලපෑමක් කිරීමට සමත් වූ මෙම ව්‍යාපාරය 1940 දශකයේදී වර්ධනය වන ලෝක ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයෙන් මෙරට ඇතිවන විවිධ ආර්ථික ගැටළු හා හේතුවෙන් සහ දෙවන ලෝක යුද්ධයේ බලපෑමෙන් පසු ඇතිවන න්‍යායාත්මක ගැටළු මතභේද හේතු කොටගෙන මෙරට පුරෝගාමී වාමාංශික ව්‍යාපාරයේ භේද ඇතිවන ආකාරය හඳුනා ගත හැකිය. මෙහි ඊළඟ ප්‍රතිවිපාකය වන්නේ එම ශක්තිමත් අධිරාජ්‍ය විරෝධී මහජන සන්නිවේදන ව්‍යාපාරයද භේද වී බිඳ වැටීමයි.

මෙම සන්ධිස්ථාන යටතේ මෙරට මහත් බලාපොරොත්තු සහගත තත්ත්වය 19වන සියවසේ ආරම්භ වන අධිරාජ්‍ය විරෝධී ජාතික අරගලය යම් ආකාරයක විකෘතියකට ලක්වූවා යැයි සිතේ. වෙනත් යටත්විජිතවල දැක්වූ අධිරාජ්‍ය විරෝධී අරගල යම් ඓතිහාසික පරිණාමයකට ගොදුරු වී තීරණාත්මක සන්ධිස්ථානයකින් ස්වාධීනත්වය අත්පත්කර ගත්ත ද 1948 ඩොමීන්යන් තත්ත්වයෙන් මිදී නිදහස් රටක්

ලෙස ප්‍රකාශයට පත් වීම වටහාගත යුත්තේ අධිරාජ්‍ය විරෝධී ජාතික ව්‍යාපාරයේ යුගවල සටන් කරුවන්ගේ ප්‍රාර්ථනයේ විශිෂ්ටාර්ථය නොවේ යැයි සිතේ.

මේ නිදහස ලේ නොසෙල්වා ගත් නිදහසකැයි 1948 නිදහස ලද නායකයින් කීමෙන් ගම්‍ය වන්නේ එය නොවේද?

මූලාශ්‍ර

Mendis G.C.-Colbrook Cemeron Parpers- vol.1 oxford

අයිවන්, වික්ටර් (1999). ශ්‍රී ලංකාවේ නූතන කැරලිකරුවන්ගේ සමාජ පසුබිම, රාවය ප්‍රකාශකයෝ: මහරගම

ජයවර්ධන, කුමාරි. (1985). ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, ග්‍රෙගරි පාර: කොළඹ 07

ජයවර්ධන, කුමාරි. (1975). කම්කරු පංතියේ නැගීම හා 1893 කම්කරු වැඩ වර්ජනය, සී කරුණාරත්න සහ සහෝදරයෝ: කොළඹ 10.

ප්‍රනාන්දු, ලක්සිරි. (1974). ජාතික ව්‍යාපාරය හා වාමාංශික ව්‍යාපාරය: දීපානී මුද්‍රණාලය: නුගේගොඩ

පීරිස්, ජීනදාස. (2007). ජාතික ගැටලුව, ගෝත්‍රික රාජ්‍යයේ සිට ගෝලීය රාජ්‍ය දක්වා: පික්ස් ඇන්ඩ් වර්ඩ්ස්

සරත්, ලයනල්. (2000). ලංකාවේ වාමාංශික සන්නිවේදනය, එස්. ගොඩගේ සහෝදරයෝ: කොළඹ 10.

18

නිදහසින් පසු (1948 සිට 2015 දක්වා) ලාංකේය දේශපාලන ව්‍යාපාරය තුළ භික්ෂුවගේ ගමන් මග

අයේෂ් විජයසිංහ

භික්ෂුව වනාහි සසරෙහි පවත්නා බිහිසුනු, භයංකාරත්වය අවබෝධයෙන් යුතු ව, සසර විමුක්තිය පරමාභිලාශ කොට ගෙන අගාරික ජීවිතයෙන් මිදී අනගාරික ජීවිතය ට පත් ව ආගමික ජීවිතයක් ගත කරන තැනැත්තෙකි. 'භික්ෂූත්වය' යනු කිසියම් පදවියකට අයත් නිල නාමයක් නොව්. භික්ෂුව සිංහල සමාජයේ ජනතාවගේ අභිවෘද්ධියට මග කියාදෙන උපදේශකයෙක්, ගුරුවරයෙක් මෙන්ම මිත්‍රයෙක් ද විය. ගිහි සමාජයේ දියුණුවට උපදෙස් දෙන නිසා භික්ෂුවගේ අවශ්‍යතා පිළිබඳව සොයා බලා ඒවා සපයා දීම ගිහි සමාජයේ යුතුකමක් විය. එමනිසා ගිහියාට 'දායකයා' යන ශාසනික නම යෙදී ඇත. ස්වකීය අවශ්‍යතා සපුරාදෙන ගිහියාගේ දියුණුවට අනුශාසනා කිරීම හා ඉගැන්වීම භික්ෂුවගේ ද යුතුකමකි. භික්ෂුව හා සමාජය අතර සම්බන්ධයේ පදනම දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රයෙහි දක්වා ඇත. ඒ අනුව ගිහියා දැනුම්වත් කිරීම (අස්සුතංසාවේති) භික්ෂුවගේ මූලික යුතුකමකි. (අරියසේන හිමි. 1999:07). මෙලෙස භික්ෂුව ගිහි සමාජය සමඟ පවත්වනු ලබන ඍජු සම්බන්ධතාවය හේතුවෙන් භික්ෂුව පිළිබඳව ගිහි සමාජය තුළ යම් ප්‍රතිරූපයක් ගොඩනැගී ඇත.

මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමඟ භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් මෙරට අධ්‍යාපන, සදාචාර, සෞඛ්‍ය, සාහිත්‍ය, කලා ශිල්ප ආදී වූ සෑම ක්ෂේත්‍රයක ම විශාල දියුණුවක් ඇති විය. එහි දී භික්ෂූන් වහන්සේ එවකට පැවති සෑම විෂයක් ම උසස් ලෙස හදාරා ඒවා රට වැසියාට ඉගැන්වූහ. පොත් පත් රචනා කළේය. රජ කුමාරයාගේ සිට ගම්බද දරුවා දක්වා සෑම තරාතිරමක ම අයට භික්ෂූන් වහන්සේ ශාස්ත්‍ර ඉගැන්විය. සෑම පන්සලක් ම ආගමික මධ්‍යස්ථානයක් පමණක් නොව අධ්‍යාපන ආයතනයක් ද විය (සෝමරංසි හිමි.1996:33). මුල් කාලයේ පටන් ගමේ විහාරස්ථානය ගම් වැසියාගේ ජීවිතයේ යම් යම් මූලික අවශ්‍යතා සපුරා දෙන වැදගත් ස්ථානයක් විය. දරුවන්ගේ අධ්‍යාපනය, සදාචාරය, සංස්කෘතිය මෙන්ම සෞඛ්‍ය ආදී අවශ්‍යතාවන් සපයා ගත්තේ භික්ෂූන් වහන්සේගෙනි. මෙම

ජනතා සේවය පදනම් කරගනිමින් ගමත් පන්සලත් අතර ඉතා කිට්ටු සබඳතාවයක් ගොඩනැගුණු අතර එමගින් භික්ෂුවගේ ප්‍රතිරූපය සමාජය තුළ ඉතා ප්‍රබල ලෙස ඉස්මතු වන්නට විය.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ, දන්ත ධාතුන් වහන්සේ, පාත්‍රා ධාතුන් වහන්සේ, කේශ ධාතුන් වහන්සේ වැනි සියලුම බෞද්ධ පූජනීය වස්තු බෞද්ධයන්ට අයත් ජාතික පූජ්‍ය වස්තු ලෙස රජය විසින් ආරක්ෂා කරන ලදී. සෑම රජෙකුම දන්ත ධාතුව දිවි හිමියෙන් ආරක්ෂා කළේය. සංඝයා වහන්සේ ගේ අනුමැතිය නැතිව ජනයාගේ සහය ලබා ගැනීම දුෂ්කර විය. සංඝයා වහන්සේ ගේ අනුමැතිය ලබා ගැනීම ජනතාවගේ අනුමැතිය ද ලැබීමක් බව රජු සිතුවේය. බෞද්ධ භික්ෂූන් වහන්සේ රාජ්‍ය පාලනය කිරීමට නොගිය ද රාජ්‍ය පාලකයන් තෝරා පත් කර ගැනීමට මැදිහත් වූ අවස්ථා දැකිය හැකිය. එහි දී, වසර ගණනක් පුරා අඛණ්ඩව පැවත ආ සම්ප්‍රදායන් පවා උල්ලංඝණය කරමින් භික්ෂූන් වහන්සේ රාජ්‍ය පාලකයෙකු තෝරා ගන්නෙකු ලෙස මැදිහත් වී ඇත්තේ ලාංකේය සමාජය තුළ භික්ෂූන් වහන්සේ විසින් ගොඩනගා ගෙන තිබූ දේශපාලන ප්‍රතිරූපය හේතුවෙනි. විටින් විට රාජ්‍යත්වයට පත් වූ රජවරුන් හා සංඝයා වහන්සේලා අතර ගැටුම් හට ගත්ත ද ඒ සෑම ගැටුමක්ම ඉක්මනින් නිරාකරණය කිරීමට දෙපාර්ශවය විසින් කටයුතු කරන ලදී. ඒ ඔස්සේ රාජ්‍ය පාලනය වෙනුවෙන් භික්ෂු සංස්ථාවේ බලපෑම් කිරීමේ හැකියාව තව දුරටත් වර්ධනය විය.

යටත්විජිත යුගය හා භික්ෂු දේශපාලනය

යටත් විජිත යුගය තුළ දියත් කළ නිදහස් අරගලයන් හි දී ප්‍රධාන භූමිකාවක් බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් ඉටු කරන ලදී. පෘතුගීසීන් (1505-1685) හා ඕලන්ද (1658-1796) පාලන සමය තුළ නිදහස් අරගල ඉතා සීමිත වූ අතර, එහි දී භික්ෂූන් වහන්සේ ගේ භූමිකාව පිළිබඳව පැහැදිලි දත්ත හැඳිනගත නොහැකිය. එහෙත් ඉංග්‍රීසි පාලන සමය (1796-1948) තුළ නිදහස් අරගල හා සම්බන්ධව කටයුතු කළ භික්ෂූන් වහන්සේ පිළිබඳ තොරතුරු අනාවරණය වේ. වර්ෂ 1815 මාර්තු 02 වන දින උඩරට ගිවිසුම ඔස්සේ බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම ඇතුළු පොරොන්දු ගණනාවක් සමඟ ඉංග්‍රීසීන් ලංකාව යටත් කර ගත්ත ද, වැඩි කලක් යාමට මත්තෙන් එම පොරොන්දු කඩ කරන්නට විය. වර්ෂ 1818 ඌව වෙල්ලස්ස කැරැල්ල ඉංග්‍රීසි පාලනයට විරද්ධ ව බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙය වන ලදී. කැරැල්ලට සම්බන්ධ භික්ෂූන් වහන්සේලා පිළිබඳ අවබෝධයකින් සිටි ඉංග්‍රීසි පාලකයන්, එක්තරා කැරලිකරුවෙකු පිළිබඳ රහස් හෙළි නොකිරීම නිසා කුඩාපොල හිමියන්ට වෙඩි තබා ඝාතනය කරන ලදී. වර්ෂ 1818 කැරැල්ල අවසන් වන්නේ භික්ෂූන් වහන්සේලා රැසකගේ ජීවිත අහිමි කරමින් ය. වර්ෂ 1823, 1834 හා 1832 දී සිදු වූ කුමන්ත්‍රණ හා කැරලි සංවිධානය කරන්නේ ද භික්ෂූන් වහන්සේ විසිනි. වර්ෂ 1832 කුමන්ත්‍රණයේ දී ගංගාරාමයේ උඩුවේ හිමියෝ ද වර්ෂ 1842 කුමන්ත්‍රණයේ දී චන්ද්‍රජෝති හිමියෝ ද වර්ෂ 1848 කැරැල්ලේ දී කුඩාපොල හිමියෝ ද බෞද්ධ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට ක්‍රියාකාරී වූහ. වර්ෂ 1848 දී ඉංග්‍රීසි පාලනයට විරුද්ධව ඇති වූ මාතලේ හටන (මාතලේ කැරැල්ල) තුළදී ද භික්ෂූන් වහන්සේ ප්‍රධාන භූමිකාවක් ඉටු කරන ලදී (ප්‍රදීප්.2010:731). එම කැරැල්ල පරාජයවීමත් සමඟ නිදහස් අරගලයන් හි නිමාව සනිටුහන් විය.

නමුත් කළුතර, පානදුර, මොරටුව ආදී ප්‍රදේශවල භික්ෂූන් ක්‍රිස්තියානි දහම් ප්‍රචාරණයට එරෙහිව නැගී සිටි බව ඩික්සන් නැමැති පූජකයා පෙන්වා දී ඇත. බෞද්ධ ආගමික ප්‍රබෝධයේ මුල් පියවර ලෙස වර්ෂ 1842 දී වලානේ සිද්ධාර්ථ හිමියන් විසින් රත්මලානේ ශාස්ත්‍ර ශාලාව පිහිටු වීම හැඳින්විය හැකිය.

මෙම ආයතනය මගින් හික්කඩුවේ සුමංගල හිමි, රත්මලානේ ධම්මාලෝක හිමි, ඈපා අප්පුහාමි, කොග්ගල ධම්මතිලක හිමි, සුමනතිස්ස හිමි, ධම්මාලංකාර හිමි වැනි ආදී විද්වතුන් බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය වෙනුවෙන් සූදානම් කළේය. වලානේ සිද්ධාර්ථ හිමියන් 1862 දී ප්‍රථම සිංහල පුවත්පත වූ 'ලක්මිණි පහන' ආරම්භ කළ අතර මෙම වර්ෂයේ දී ම සියම් දේශයෙන් ලැබුන ආධාර මත ලංකාවේ ප්‍රථම සිංහල මුද්‍රණාලය ද ආරම්භ විය. මෙපමණ කලක් මිෂනාරීන් විසින් මුද්‍රණ පත්‍රිකා ආධාරයෙන් නොයෙක් චෝදනාවන් බුදු දහමට එල්ල කරනු ලැබූ අතර එයට එරෙහිව නැගී සිටීමට තරම් ශක්තියක් ස්වදේශිකයන්ට නොවුණ ද භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් ඇරඹී මෙම මුද්‍රණාලය හේතුවෙන් එම ශක්තිය තව දුරටත් වර්ධනය විය(අයිවන්.2006:98).

මෙම කාලයේදී බුද්ධාගම හා ස්වදේශිකත්වය මතවාදී වශයෙන් ජාතික හා අන්තර්ජාතික ව ව්‍යාප්ත කිරීම වෙනුවෙන් දායක වූ ප්‍රධාන අංගයක් ලෙස මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ගේ මූලිකත්වයෙන් ඇරඹී වාද විවාද හැඳින්විය හැකිය. එහිදී පානදුරාවාදයෙන් ආරම්භ වූ මෙම වාද මාලාව අනතුරුව බද්දේගම, වරගොඩ, උදම්විට, ගම්පල ආදී වශයෙන් පංච මහා වාදයන් බවට පත්විය. මෙම වාද මගින් ගිහි පැවිදි විශාල පිරිසක් අධිරාජ්‍ය විරෝධී මතවාදීමය අරගලය වෙත ඒකරාශී විය. අනතුරුව 1854 දී සවිසත්දම් වාදය, 1889 දී සිදත් සඟරා වාදය, 1891 දී ජානකීහරණය වාදය ආදී වාදයන් 19 වන සියවසේ දෙවන භාගයේදී ඇති වීම හේතුවෙන් බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය තව තවත් දියුණුවට පත්විය(රාහුල හිමි.1992:87) බ්‍රිතාන්‍ය මිෂනාරි අධ්‍යාපන ක්‍රමය හේතුවෙන් ස්වදේශීය අධ්‍යාපන ක්‍රමයට එල්ල වූ බලවත් අභියෝගය භික්ෂූන් වහන්සේ ගේ මැදිහත් වීමෙන් නැවත වරක් යථා තත්ත්වයට පත්වීම ආරම්භ විය. වලානේ සිද්ධාර්ථ හිමියන්ගේ ශාසනික ප්‍රබෝධයෙන් පසුව බෙන්තර අත්ථදස්සී හිමියන් විසින් බෙන්තර වනවාසී විහාරය ද, අඹගහවත්තේ සරණංකර හිමි විසින් පයාගල විහාරය ද, වැලිගම සුමංගල හිමි පානදුරේ ද වාසය කරමින් භික්ෂූන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍රය ලබා දෙන ලදී. (සරත්චන්ද්‍ර.1968:10). ඉන් අනතුරුව පිරිවෙන් අධ්‍යාපනය නව මගකට යොමු කරමින් 1873 දී විද්‍යෝදය පිරිවෙන හා 1875 දී විද්‍යාලංකාර පිරිවෙන් ආරම්භ වූ අතර මෙම පිරිවෙන් ද්විත්වයේ ආරම්භයත් සමඟ සෙසු පළාත් වල ද පිරිවෙන් ඇරඹිණි. මෙමගින් බෞද්ධ චින්තනය හා ජාතිකත්වය පිළිබඳව නව අදහස් වර්ධනය වීම ද ආරම්භ විය.

මෙම අවධියේ දී බෞද්ධ භික්ෂුවගේ ම මූලිකත්වයෙන් ග්‍රන්ථ රචනා කිරීම මෙන්ම සංස්කරණය කිරීම ද සිදු විය. එහ දී සිදත් සඟරාව, නව සන්නය, සියබස්ලකර, ධර්ම ප්‍රදීපිකාව, අමාවතුර, බුත්සරණ, මුව දෙව්දාවත ආදී සම්භාව්‍ය කෘති සංස්කරණය කර පළ කිරීම කාලීන අවශ්‍යතාවක් සපුරාලීම මෙන්ම ලාංකේය ජාතිකත්වය පුබුදුවාලීමට ද හේතු විය. එපමණක් නොව හෙන්රි ස්ටීල් ඕල්කට් හා බ්ලැවැට්ස්කි මැතිණිය වැනි විදේශික උගතුන් ගේ මූලිකත්වයෙන් 1880 දී ඇරඹී පරම විඥාර්ථ සමාගම මගින් බෞද්ධ පාසැල් ආරම්භ කිරීමට පෙරමුණ ගත්තේ ද බෞද්ධ භික්ෂූන් වහන්සේ විසිනි (තලවත්ත.2006:799)

1854 දී බටුවන්තුඩාවේ ගේ සංස්කරණයෙන් ප්‍රථම සිංහල සඟරාව ලෙස 'යතිබල' සඟරාව පළවිය (ජයවර්ධන.1972:43). ඉන් අනතුරුව ලක්මිණි පහන, දුර්ලබ්ධි විනෝදනීය, සාරාර්ථ ප්‍රදීපිකාව ආදී සඟරා ආරම්භ වීමත් සමඟ ජාතික ආගමික නැඹුරුවක් ඇති වී තව දුරටත් පොත පත පළවන්නට විය. එහිදී සතර සමුච්චය, සමය සංග්‍රහය, ඥාණාවභාෂය, දිනකර ප්‍රකාෂය ආදී පුවත්පත් ද බිහි වේ.

මෙම කටයුතුවලට ආගමික පුනර්ජීවන ව්‍යාපාරය හා අමධ්‍යප ව්‍යාපාරය කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක වූ අතර ඒ තුළ බෞද්ධ භික්ෂූන් වහන්සේ විසින් කැපී පෙනෙන භූමිකාවක් ඉටු කරන ලදී. මෙහිදී දොඩන්දූවේ පියරතන, මිගෙට්ටුවත්තේ ගුණාන්ද, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක, හික්කඩුවේ ශ්‍රී සුමංගල, වැලිගම ශ්‍රී සුමංගල, බටුවන්තුඩාවේ දේවරක්ඛිත සහ කරතොට සෝභිත යන හිමිවරුන් ප්‍රධාන වේ. මෙම භික්ෂූන් වහන්සේ ඉංග්‍රීසින්ගේ පාලනය බිඳ දැමීම සඳහා 1919 දී ජාතික සංගමය පිහිටුවීමට ද සක්‍රීයව කටයුතු කළෝය.

සර්වජන ඡන්ද බලය හිමි වීම හා බෞද්ධ භික්ෂුවගේ දේශපාලන සහභාගිත්වය

සර්වජන ඡන්ද බලය වර්ෂ 1928 ඩොනමෝර් කොමිසමේ නිර්දේශයන්ට අනුව වර්ෂ 1931 දී ශ්‍රී ලංකාවට හිමි විය. මෙසේ සර්වජන ඡන්ද බලය හිමිවීමත් සමඟ බෞද්ධ භික්ෂූන් වහන්සේ ශ්‍රී ලාංකේය දේශපාලනයට විවිධ අයුරින් සම්බන්ධ විය. එනම්, භික්ෂූන් වහන්සේ රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයන්ට ඉදිරිපත් නොවුන ද, වක්‍රාකාරයෙන් මැතිවරණ දේශපාලනය හා සම්බන්ධ වෙති. වර්ෂ 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණය වෙනුවෙන් ඉදිරිපත් වූ බොහෝ අපේක්ෂකයන් බහුතරයක් ඉංග්‍රීසි සංස්කෘතිය තුළ හැදී වැඩුණු ඉංග්‍රීසි කථා කරන, පොදු ජනයාගෙන් දුරස්ථ ප්‍රභූන් පිරිසක් වූහ. එහෙත් මොවුන්ට ජයග්‍රහණය කිරීම සඳහා සාමාන්‍ය ජනයා ගේ ඡන්දය ලබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් විය. එම කාර්යයේදී ඔවුහු සාමාන්‍ය ජනතාව වෙත ළඟා වීමට භික්ෂූන් වහන්සේ අතරමැදියෙකු ලෙස භාවිත කරන ලදී (Senevirathne.1999:59). මෙහිදී ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේට තිබූ ගෞරවය හා උන්වහන්සේ විසින් සමාජය තුළ ගොඩනගා ගෙන තිබූ ප්‍රතිරූපය මත, භික්ෂූන් වහන්සේ සමඟ සබඳතා පැවැත් වූ ප්‍රභූ අපේක්ෂකයන් ට ජනතාව ඡන්දය ලබා දෙන ලදී.

මේ අනුව සමාජීය කටයුතු වෙනුවෙන් ඉදිරියෙන් සිටි ලාංකේය භික්ෂුව වර්ෂ 1946 දී පටන් දේශපාලනයට යොමු වීමට පටන් ගත්තේය. බලංගොඩ ආනන්ද මෛත්‍රීය හිමි, නාරවිල ධම්මරක්ඛිත හිමි, උඩකැන්දවල සරණංකර හිමි සහ වල්පොල රාහුල හිමි වැනි භික්ෂූන් වහන්සේ තුළ පැවති වාමාංශික නැඹුරුව ඩී.එස් සේනානායකගේ කෝපයට හේතු විය. වර්ෂ 1946 ජනවාරි මස ප්‍රසිද්ධ රැස්වීම් වලදී ඩී.එස් සේනානායක වාමාංශික දේශපාලනයේ නිරත එම භික්ෂූන් වහන්සේලා ප්‍රසිද්ධියේ විවේචනය කළ අතර වර්ෂ 1946 ජනවාරි 26 දින කොටහේන කුමාර විද්‍යාලයේ පැවති රැස්වීමක් අමතා වල්පොල රාහුල හිමියන් විසින් එම විවේචනයන් ට පිළිතුරු ලබා දුන්නේය. මෙම දේශනය රට තුළ විශාල ආන්දෝලනයක් ඇති කළ අතර රාහුල හිමියන්ට පක්ෂව මෙන්ම විපක්ෂව ද පුවත්පත් වල ලිපි පල වන්නට විය. යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම, නාරවිල ධම්මරක්ඛිත, කොටහේනේ ප්‍රඥ්ඤාකිත්ති, බඹරැන්දේ සිරි සීවලී සහ කලල්ඇල්ලේ ආනන්ද සාගර යන හිමිවරුන් මෙම දේශනය සමඟ මතු වූ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව භික්ෂු දේශපාලනය පිළිබඳව ගත් තීරණය ජනතාවට දැන ගැනීම පිණිස ප්‍රකාශයට පත් කිරීමට ද තීරණය කළේය. ඒ අනුව යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම හිමි ධර්ම විනය හා ශාසන විනයට අනුකූල රාමුවක පිහිටා ප්‍රකාශය කෙටුම්පත් කළේය. එම කෙටුම්පත වෙත පිරිවෙන් පාලන සභාවේ හා ආචාර්ය මණ්ඩලයේ අනුමැතිය ලැබුනු පසු 'විද්‍යාලංකාර ප්‍රකාශනය' නමින් පරිවේණාධිපති කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර හිමියන්ගේ අත්සනින් යුතුව කෙටුම්පත පුවත්පත් මගින් ප්‍රකාශයට පත් කළ අතර පත්‍රිකාවක් ලෙස ද මුද්‍රණය කර ජනතාව අතරේ බෙදා හරින ලදී.

"භික්ෂු සංඝයා කැමති නම්, බුද්ධානු බුද්දික විනය ශික්ෂා පද වෙනස් කර ගැනීමට බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලැබී තිබේ. එසේ නමුත් මේ දක්වා කිසිඳු අවස්ථාවක ථේරවාදී භික්ෂූන් විනය ශික්ෂා පද වෙනස් කළ බවක්, ඉතිහාසයෙන් ඔප්පු නොවේ. එහෙත් බුද්ධ කාලයේ පැවති ආර්ථික, සාමාජික, දේශපාලන තත්ත්වයන්ට වඩා අද තත්ත්වය වෙනස් වී තිබෙන බවත් එහෙයින් එකළ පැවති භික්ෂු ජීවිතයට වඩා අද භික්ෂු ජීවිතය වෙනස් වී තිබෙන බවත් පිළිගත යුතුය. අධ්‍යාපන කටයුතු, අපරාධ මර්දන කටයුතු, සහනදායී කටයුතු, අමධ්‍යප කටයුතු, සාමාජික කටයුතු ආදියට මූලිකව සම්බන්ධ ක්‍රියාකරමින් අදත් භික්ෂූන් වහන්සේ දැන හෝ නොදැන දේශපාලන කටයුතුවල යෙදී සිටිති. භික්ෂූන් වහන්සේ මෙම කටයුතු වල යෙදීම වරදක් යැයි අප නොදකිමු" (රාහුල හිමි.1992:133-135) ඒ අනුව ඉතිහාසයේ ප්‍රථම වරට විද්‍යාලංකාර ප්‍රකාශනය මගින් භික්ෂුව දේශපාලනය වෙනුවෙන් සම්බන්ධ වීම නැතහොත් භික්ෂු දේශපාලනය සාධාරණීකරණය කළේය. එමනිසා මෙම ප්‍රකාශනය ලංකාව තුළ විශාල ආන්දෝලනයක් ඇති කළ අතර එය සම්මත කිරීමට මුල් වූ හිමිවරුන් මහානායක හිමිවරුන් ඇතුළු විවිධ පාර්ශ්වයන් ගේ විවේචනයට ලක්විය. එහිදී ඩී.එස් සේනානායක, ආර්.ඩී සේනානායක වැනි දේශපාලඥයන් මෙන්ම ලේක් හවුස් පුවත්පත් හා "සිංහල බෞද්ධයා" පුවත්පත මගින් ද මෙම දේශපාලන භික්ෂු ප්‍රවණතාවය විවේචනය කළේය. නමුත් තම ප්‍රතිපත්ති වෙනස් කරනවා වෙනුවට විවේචනයන්ට එරෙහිව පිළිතුරු දීම වෙනුවෙන් එම භික්ෂූන් වහන්සේලා විසින් "කාලය" නමින් මාසික සඟරාවක් ආරම්භ කළ අතර රට පුරා රැස්වීම් ද පවත්වන ලදී. වර්ෂ 1946 මාර්තු 09 දින ආචාර්ය ඒ.පී ද සොයිසාගේ ප්‍රධානත්වයෙන් මහනුවර නගර ශාලාවේ පවත්වන ලද රැස්වීමක් අමතා "භික්ෂුවගේ කාර්යභාරය" මැයෙන් වල්පොළ රාහුල හිමියන් විසින් දේශනයක් පැවැත් වූ අතර එහි කරුණු ආශ්‍රය කර ගනිමින් වර්ෂ 1949 දී "භික්ෂුවගේ උරුමය" නමින් කෘතියක් ද පළ කළේය. එම ග්‍රන්ථය එකළ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන අත් පොත වූ අතර, එය නිදහසින් පසු ශ්‍රී ලංකා භික්ෂු දේශපාලනයේ ආරම්භය ලෙස ද සැලකිය හැකිය. (අයිවන්.2006:187)

වාමාංශික දේශපාලන ව්‍යාපාර තුළ භික්ෂූන් වහන්සේගේ සහභාගිත්වය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය ලෙස ඉතිහාස ගත වන්නේ වර්ෂ 1935 දී වමාංශික පක්ෂයක් ලෙස පිහිට වූ ලංකා සමසමාජ පක්ෂයයි. මෙම පක්ෂයේ ආරම්භයේ පටන් මුලින් ම ක්‍රියාකාරී වන්නේ "දේශපාලන භික්ෂූන්" නමින් හැඳින් වූ භික්ෂූන් පිරිසයි. මොවුහු "ලංකා එක්සත් භික්ෂු මණ්ඩලය" නමින් පිහිටුවාගත් සංවිධානය ඔස්සේ වාමාංශික දේශපාලනයට සම්බන්ධ වෙති. ලංකා සමසමාජ පක්ෂය ආරම්භ කරන විට එයට ප්‍රසිද්ධියේ ආධාර කල භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් විය. බලංගොඩ ආනන්ද මෛත්‍රී, නාරවිල ධම්මරක්ඛිත යන හිමිවරු සමසමාජ පක්ෂයේ සාමාජිකයෝ වූහ. සමසමාජ පක්ෂය වෙනුවෙන් එම හිමිවරුන් දෙදෙනා ගම්බද ගොවි ජනතාව අතර වැඩ කළහ. එමෙන්ම උඩකැන්දවල සරණංකර, වල්පොළ රාහුල, බඹරන්දේ සිරිසීවලී, කල්ඇල්ලේ ආනන්ද සාගර සහ කොටහේනේ පඤ්ඤාකිත්ති යන හිමිවරු සමසමාජ පක්ෂ වේදිකාවේ ප්‍රධාන කථිකයෝ වූහ. මීට අමතරව ගෙයින් ගෙට ගොස් සමසමාජ පක්ෂයේ අපේක්ෂකයන් සඳහා ඡන්දය ලබා ගැනීමේ මැතිවරණ ප්‍රචාරණයේ ද නිරත වූහ. මෙසේ භික්ෂූන් වහන්සේලා ක්‍රියාකාරීව දේශපාලන කටයුතු වල නිරත වුව ද එය එතරම් පහසු කාර්යයක් නොවූ අතර වල්පොළ රාහුල හා කලුපහන රේවත වැනි හිමිවැරුන්ට මැර ප්‍රහාර වලට පවා ලක්වීමට සිදු විය. (Tambaiah.1992:10-30) ලංකාවේ වාමාංශික ව්‍යාපාර තුළ ඇති වූ

න්‍යායාත්මක ගැටලු මත වාමාංශික පක්ෂ විවිධ කණ්ඩායම් වලට බෙදී ගියේය. ඒ ආකාරයෙන් බෙදී ගිය සෑම කණ්ඩායමක ම පාහේ සැලකිය යුතු භික්ෂු සහභාගිත්වයක් දක්නට ලැබුණි. මෙයට කදිම නිදසුන ලෙස පෙන්වා දිය හැක්කේ දේශපාලනික මතයන් හේතුවෙන් ඇති වූ ගැටලුවක් මුල් කර ගනිමින් වර්ෂ 1943 දී සමසමාජ පක්ෂයෙන් වෙන් වූ කණ්ඩායමක් විසින් පිහිටුවා ගත් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ආරම්භක සභාපතිවරයා ලෙස උඩකැන්දවල සරණංකර හිමි පත්වීමයි.

භික්ෂූන් වහන්සේ සංවිධානාත්මක ව විශාල වශයෙන් පක්ෂ දේශපාලනයට සම්බන්ධ කරගත් වාමාංශික දේශපාලන පක්ෂය වන්නේ වර්ෂ 1965 දී බිහිකරගත් ජනතා විමුක්ති පෙරමුණයි. වර්ෂ 1980 සිට ජ.වි.පෙ බලය බලය නැංවීමෙහි ප්‍රධාන කාර්යභාරයක් හිමිව තිබෙන්නේ ද භික්ෂූන් වහන්සේටය. එනම් ජ.වි.පෙ තුළ පිහිටුවා ඇති දේශප්‍රේමී භික්ෂු සංවිධානය, මානව හිතවාදී භික්ෂු සංවිධානය, සමස්ථ ලංකා ප්‍රගතිශීලී භික්ෂු සංවිධානය නමින් රටපුරා පැතිරුණු භික්ෂු සංවිධාන ජාලයක් පවත්වා ගනිමිනි. ජනතා විමුක්ති පෙරමුණ සංවිධානය කරන සියලුම දේශපාලනික කටයුතු වෙනුවෙන් මෙම භික්ෂු සංවිධානයන්හි පූර්ණ සහයෝගය හිමි වේ. වර්තමානයේ ජනතා විමුක්ති පෙරමුණ තම පක්ෂ සම්ප්‍රදායන්ට විරුද්ධ වූ මහානායක හිමිවරුන් බැහැදැකීම වැනි කාර්යයන් වල නිරත වේ. ඒ අන් කවර හේතුවක් නිසාවත් නොව භික්ෂුවගේ සහාය ලැබෙන ප්‍රමාණයට සාපේක්ෂව ජනතාව තම පක්ෂය පිළිගන්නා බව දේශපාලන පක්ෂ විශ්වාස කිරීමයි. (ප්‍රදීප්.2010:735)

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයන් තුළ භික්ෂුවගේ සහභාගිත්වය

ලංකාවේ ප්‍රධාන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂය ආරම්භයේදී භික්ෂූන් වහන්සේ දේශපාලනයේ නිරත වනවාට කැමැත්තක් දැක්වූයේ නැත. ඒ මුල් කාලීන ව භික්ෂූන් වහන්සේලා වාමාංශික පක්ෂ වෙත සහයෝගය ලබා දීම නිසාවෙනි. එහිදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන නායකයන් පෞද්ගලිකව ම මෙම භික්ෂූන්ගේ දේශපාලනය පිළිබඳව ප්‍රසිද්ධියේ විවේචනය කළේය. නමුත් වර්ෂ 1951 දී පිහිට වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හේතුවෙන් එ.ජා.ප යට තම භික්ෂු විරෝධී ප්‍රතිපත්ති අතහැර දැමීමට සිදු විය. මන්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තම ජයග්‍රහණයන් වෙනුවෙන් භික්ෂුවගේ දායකත්වය ඉතා බහුල ලෙස යොදා ගත් බැවිනි. ඒ අනුව වර්ෂ 1965 මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සහය දැක්වූ තල්පාවිල සීලවංශ, දැවමොහොට්ටාවේ අමරවංශ වැනි භික්ෂූන් වහන්සේලා මෙන්ම මාලේවන ඥානේස්වර, මැදගොඩ ධම්මජෝති හා මීටියාගොඩ ගුණරතන ආදී භික්ෂූන් වහන්සේලාගේ සහාය එක්සත් ජාතික පක්ෂයට හිමි වූ අතර එම මැතිවරණයේ එ.ජා.ප ජයග්‍රහණයට බලපෑ ප්‍රධාන හේතුව එය විය. එතැන් පටන් වර්තමානය දක්වා එ.ජා.ප යට සහාය දක්වන භික්ෂූන් වහන්සේලා රාශියක් සිටිති. (ප්‍රදීප්.2010:736).

1951 දී සිංහල ජාතිකවාදී හා බෞද්ධ ආගමික අරමුණු මත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කේන්ද්‍ර කිරීම මත එක්සත් ජාතික පක්ෂයට වඩා පුළුල් භික්ෂු පදනමක් විය. එම තත්ත්වය මත 1956 දී සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු ආදී ලෙස භික්ෂූන් වහන්සේ පෙරටු කරගත් පංච මහා බලවේගයන් මත පදනම් වූ මහජන එක්සත් පෙරමුණ ජයග්‍රණය කරන්නේ බෞද්ධ භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ මහජන භික්ෂු පෙරමුණ ඉටු කළ කාර්ය නිසාවෙනි. එය හාවඩ් රිගින්ස් පහත පරිදි පෙන්වා දෙයි,

"මැතිවරණයට සති තුන හකරකට පෙර ගම්බද, පළාත්බද විශේෂයෙන් ම මධ්‍යම හා සබරගමු පළාත් වල හා බටහිර පළාතේ අභ්‍යන්තරයේ පිහිටි ඡන්ද කොට්ඨාශවල භික්ෂූහු ප්‍රසිද්ධියේ ම ඡන්ද කටයුතු කළහ. දීප්තිමත් කහ සිවුරු පොරවගෙන මග දිගේ ගමන් කරනවා ත්, කුඩා පිරිස් සමඟ කතාබහ කරනවා ත්, ගෙයින් ගෙට ගොස් ගිහියන් හමුවෙනවා ත් දක්නට ලැබුණි. කහ සිවුරු හැඳගත් භික්ෂූන්ගෙන් පිරුණු එම්.ඊ.පී නිල් කොඩියෙන් සැරසුණු රථවාහන හැම තැනකදීම දක්නට ලැබුණි" (Wriggins.1960:343) එහිදී මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් ජනතාව වෙත ගොස් මැතිවරණ ප්‍රචාරණයේ නිරත වීම, ජනහමු ඇමතීම, ලිපි ලේඛන ප්‍රකාශයට පත් කිරීම හා පුවත්පත් නිවේදන නිකුත් කිරීම ආදී කටයුතුවල භික්ෂූන් වහන්සේ නිරත වූහ. කොටහේනේ පඤ්ඤාකිත්ති, බඹරන්දේ සිරිසීවලී වැනි භික්ෂූන් වහන්සේලා ඉතා ක්‍රියාකාරී ලෙස මැතිවරණ ව්‍යාපාරයට දායක වූහ. කලල්ඇල්ලේ ආනන්ද සාගර භික්ෂූන් වහන්සේ විසින් උපැවිදිව සාගර පලන්සූරිය නමින් මැතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රහණය කරන ලදී. තල්පාවිල සීලවංශ හා මාපිටිගම බුද්ධරක්ඛිත වැනි භික්ෂූන් වහන්සේලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විධායක කාරක සභාවට පවා තේරී පත්වීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභ්‍යන්තර දේශපාලන ව්‍යුහයට ඍජුව සම්බන්ධ අවස්ථා වේ. මෙම නෛතික ක්‍රියාවලිය ඉක්මවා ගොස් අගමැතිවරයා වූ එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක ගේ දේශපාලන තීන්දු වෙනුවෙන් භික්ෂුවගේ මැදිහත් වීම එම කාලය තුළ සුවිශේෂී කරුණක් ලෙස දැක්විය හැකිය. එහිදී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම, විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කිරීම හා 1957 බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ඉරා දැමීම වැනි සිද්ධීන් භික්ෂූන් වහන්සේගේ ඍජු බලපෑම මත සිදු වූ දේ ලෙස හැඳින්විය හැකිය. අගමැති ගේ දේශපාලන හිතවතෙකු වූ මාපිටිගම බුද්ධරක්ඛිත හිමි විසින් කැබිනට් මණ්ඩලය තුළ අර්බුධ ගණනාවක් ඇති කිරීම ද එම බලපෑම පිළිබඳ පැහැදිලි කරන්නක් විය. බණ්ඩාරනායක මහතාගේ අභාවයෙන් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට පත් වූ සිරිමාවෝ බණ්ඩාරනායක විසින් 1971 දී පිහිට වූ ආණ්ඩුවට තල්පාවිල සීලවංශ, දේවමොහොට්ටේ අමරවංශ, හේන්පිටගෙදර ඥාණසීහ, කොටගම වාකීශ්වර සහ නාත්තන්ඩියේ ප්‍රඥාකර වැනි භික්ෂූන් වහන්සේ පූර්ණ සහයෝගය දැක් වූහ. 1977-1994 එ.ජා.ප පාලන සමය තුළ ඊට එරෙහිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙහෙය වූ විරෝදධතා ව්‍යාපාර රැසකට මෙන්ම 2005 ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂ ජනාධිපති බවට පත් කිරීමේදී ප්‍රධාන කාර්යයක් භික්ෂූන් වහන්සේලා විසින් ඉටු කරන ලදී. වර්තමානයේ පවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන කටයුතු වෙනුවෙන් ක්‍රියාශීලී භික්ෂු දායකතත්වයක් ලැබේ. (ප්‍රදීප්.2010:738).

මැතිවරණ අපේක්ෂකත්වය හා භික්ෂු දේශපාලනය

1940 දශකයේ සිට භික්ෂූන් වහන්සේ විවිධ අයුරින් ලාංකේය දේශපාලනය වෙනුවන් සම්බන්ධ වුවත් මැතිවරණ සඳහා ඉදිරිපත් වී ඇත්තේ කිහිප අවස්ථාවකදී පමණි. එහිදී භික්ෂූන් වහන්සේ ප්‍රාදේශීය සභා සහ නගර සභා ආදී මැතිවරණයන්ට අපේක්ෂකයන් ලෙස ඉදිරිපත්ව එම ආයතනයන්හි සභිකයන් ලෙස කටයුතු කළේය. එහිදී ජාතික හෙළ උරුමය පක්ෂයේ උඩවත්තේ නන්ද හිමි මහනුවර මහ නගර සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළේය. ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ පාර්ලිමේන්තු මැතිවරණයකින් ජයග්‍රහණය කළ පළමු භික්ෂූන් වහන්සේ වන්නේ බද්දේගම සමිත හිමියන් ය. 2000 වර්ෂයේ පාර්ලිමේන්තු මැතිවරණයෙන් ගාල්ල දිස්ත්‍රික් පොදුජන එක්සත් පෙරමුණු මන්ත්‍රීවරයෙකු ලෙස උන්වහන්සේ තේරී පත්වූහ. මීට ප්‍රථම උන්වහන්සේ වර්ෂ 1992 පළාත් සභා මැතිවරණයට තරග කර එහි අසුනක් දිනා

ගත්තේය. කෙසේ වුව ද 2004 පෙබරවාරි මස ජාතික හෙළ උරුමය නමින් පක්ෂයක් බිහිවන තෙක් ම මැතිවරණ සඳහා ඉදිරිපත් වූයේ ඉතා අඩු භික්ෂූන් වහන්සේලා පිරිසකි.

ශ්‍රී ලාංකේය භික්ෂුව තීරණාත්මක ලෙස ඍජුව මැතිවරණයක් සඳහා ඉදිරිපත් වන්නේ 2004 පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙනි. එහි දී නාමයෝජනා භාර දීමට පෙර දිනයේ බිහි වූ දේශපාලන පක්ෂයක් වූ ජාතික හෙළ උරුමය පක්ෂය තුළින් ඉතිහාසයේ ප්‍රථම වරට ඡන්ද අපේක්ෂකයන් ලෙස භික්ෂූන් වහන්සේ 260ක් මැතිවරණයට තරග කළ අතර බෞද්ධ චාරිත්‍රයන්ට මුල් තැන දෙමින් තම මැතිවරණ ප්‍රචාරණය දියත් කළ ජාතික හෙළ උරුමය විසින් බෞද්ධ කොඩිය, ධර්ම චක්‍රය වැනි ආගමික සංකේත බහුලව භාවිත කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහ මැතිවරණය තුළදී ඡන්ද 5,54,076 ක් ලබා ගනිමින් පාර්ලිමේන්තු ආසන 9ක් දිනා ශ්‍රී ලංකාවේ තුන් වන ප්‍රධාන පක්ෂය වීමට ජාතික හෙළ උරුමයට හැකියාව ලැබිණ (ප්‍රදීප්.2010:740).

ජාතික හෙළ උරුමය බිහිවීමට හා භික්ෂූන් වහන්සේ සංවිධානාත්මක ව දේශපාලනයට පිවිසීම කෙරෙහි ගංගොවිල සෝම හිමි යන සාධකය ද ඍජු බලපෑමක් එල්ල කළේය. ඔස්ට්‍රේලියාවේ විහාරස්ථානයක කටයුතු කරමින් සිට ශ්‍රී ලංකාවට පැමිණි සෝම හිමි ඉතා කෙටි කලකින් ශ්‍රී ලංකාවේ ජනප්‍රියම ධර්ම කථික භික්ෂූන් වහන්සේ බවට පත්විය. ජනමාධ්‍ය මගින් තමන් වටා එක් රැස් වූ ජන රැල්ල දේශපාලන බලය ලබා ගැනීමේ මාධ්‍යයක් ලෙස භාවිත කිරීමට සෝම හිමි උත්සාහ කළ අතර, ඒ සඳහා 2002 වසරේදී 'ජනවිජය' නමින් පදනමක් ද ආරම්භ කළේය (අයිවන්.2006:238). එහෙත් උන්වහන්සේගේ හදිසි අපවත් වීමත් සමඟ එම වැඩපිළිවෙළට නව අරුතක් ලබා දෙන්නේ සිහල උරුමය පක්ෂයයි. මෙම අභාවයත් සමඟ නිහඬව සිටි ජාතිවාදී බලවේගයන් උපායමාර්ගික ව අවදි කිරීමට සිහල උරුමය සමත් විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ ජාතික හෙළ උරුමය පක්ෂය බිහිවීමයි.

2004 පෙබරවාරි මස ජාතික හෙළ උරුමය නම් දේශපාලන පක්ෂය නිර්මාණය කරගනු ලබන්නේ, අප්‍රේල් මස පැවැත්වීමට නියමිත 13 වන පාර්ලිමේන්තු මැතිවරණය ඉලක්ක කරගනිමින් ය. මැතිවරණයට නාම යෝජනා භාර දීමට නියමිත දිනට පෙර දින බිහිවූ දේශපාලන පක්ෂයක් ලෙස ජාතික හෙළ උරුමයට මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා පැවතියේ සීමිත කාලයකි. එමනිසා මැතිවරණ ප්‍රචාරණ කටයුතු කේන්ද්‍ර ගත වූයේ ග්‍රාමීය ප්‍රදේශ වලට වඩා නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශයන් වටාය. එම ප්‍රදේශයන්හි පුද්ගලික ව්‍යාපාරිකයන් විශාල දායකත්වයක් මෙම පක්ෂයට ලබා දුන්නේය. එහි ප්‍රතිඵලය ලෙස පාර්ලිමේන්තු ආසන 9ක් දිනා ගැනීමට හෙළ උරුමයට හැකියාව ලැබිණ. එම ආසන වෙනුවෙන් තේරී පත් වූ භික්ෂූන් වහන්සේලා හා ඔවුන් හිමි කරගත් මනාප ගණන දිස්ත්‍රික්ක අනුව පහත පරිදි දැක්විය හැකිය.

දිස්ත්‍රික්කය/ජාතික ලැයිස්තුව	නම	ලබා ගත් මනාප සංඛ්‍යාව
කොළඹ	උඩුවේ ධම්මාලෝක හිමි	42,850
	කොටපොල අමරකිත්ති හිමි	26,539
	කතළුවේ රතනසීහ හිමි	10,512
ගම්පහ	කොළොන්නවේ සිරි සුමංගල හිමි	25,154
	අපරැක්කේ පඤ්ඤානන්ද හිමි	7389
කළුතර	අතුරුලියේ රතන හිමි	10,772
මහනුවර	උඩවත්තේ නන්ද හිමි	10,846
ජාතික ලැයිස්තුව	එල්ලාවල මේධානන්ද හිමි	-
	ඕමල්පේ සෝභිත හිමි	-

හෙළ උරුමයට පාර්ලිමේන්තුව තුළ තීරණාත්මක බලයක් හිමි වූ අතර පාර්ලිමේන්තුවේ තුන්වන බලවේගය බවට ද පත්විය. මැතිවරණ ප්‍රතිඵල විශ්ලේෂණය මගින් හෙළි වන කරුණ නම් හෙළ උරුමය නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශයන්හි සැළකිය යුතු ජයක් ලබා ඇති බවයි. මීට මූලික හේතු වන්නේ හෙළ උරුමය මගින් මැතිවරණයට ඉදිරිපත් කළ ජනප්‍රිය ධර්ම කථිකයන් සියල්ලක්ම පාහේ ප්‍රධාන නගර කේන්ද්‍ර කර ගනිමින් ජනතා ආකර්ෂණය දිනාගත් භික්ෂූන් වහන්සේලා වීමයි.

ජාතික හෙළ උරුමයෙන් පසුව භික්ෂූන් වහන්සේලා මැතිවරණයක් වෙනුවෙන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කළ පක්ෂ වන්නේ බොදු ජන පෙරමුණ හා ජනසෙත පෙරමුණ යන පක්ෂයි. මුස්ලිම් අන්තවාදයට එරෙහි සංවිධානයක් ලෙස ආරම්භ වූ බොදු බල සේනාව 2015 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා බොදු ජන පෙරමුණ නමින් පක්ෂයක් ලෙස ඉදිරිපත් වූ අතර භික්ෂූන් වහන්සේලා ද අපේක්ෂකයන් විය. නමුත් පාර්ලිමේන්තුව තුළ එක් ආසනයක් හෝ දිනා ගැනීමට එම පක්ෂයට හැකියාවක් නොලැබිණි. සිංහල බෞද්ධයන් වෙනුවෙන් සිදුවන අසාධාරණකම් හා අකටයුතුකම් වෙනුවෙන් පෙනී සිටිමින් ඊට එරෙහි වීමට අවශ්‍ය දේශපාලනික බලය දිනා ගැනීමේ පළමු පියවර ලෙස 2015 මහමැතිවරණය වෙනුවෙන් ඉදිරිපත් වූ බොදු ජන පෙරමුණ, මෙහිදී තම සංවිධානය පක්ෂ දේශපාලනයෙහි නිරතව සිටින බව පෙන්වීමට පමණක් උත්සාහ කළ බවක් දක්නට ලැබේ.

බොදු ජන පෙරමුණ මෙන්ම 2009 ජූනි 22 පිහිටුවනු ලැබූ ජනසෙත පෙරමුණ ද මැතිවරණයන් වෙනුවෙන් අපේක්ෂකයන් ලෙස භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් කළ පක්ෂයකි. මෙම පක්ෂයේ නායක බත්තරමුල්ලේ සීලරතන හිමි විසින් 2010 හා 2015 යන වසර වල පැවැත් වූ ජනාධිපතිවරණයන්

වෙනුවෙන් ජනාධිපතිධුර අපේක්ෂකයෙකු ලෙස තරග වැදුන අතර 2015 මහ මැතිවරණය වෙනුවෙන් ද තරග කළේය. නමුත් එම පක්ෂයට සැළකිය යුතු මට්ටමේ ජයග්‍රහණයක් ලැබීමට හැකියාවක් නොලැබිණ.

බලපෑම් කණ්ඩායම් දේශපාලන ව්‍යාපාරයන් හා භික්ෂුව

දේශපාලන පක්ෂ විවිධ අරමුණු පදනම් කරගනිමින් භික්ෂුවගේ ප්‍රතිරූපය දේශපාලන ව්‍යාපාර වල යෙදා ගැනීමට අමතරව භික්ෂූන් වහන්සේලා විසින් ම ජන සමාජයේ ගොඩනගා ගත් තම ප්‍රතිරූපය වෙනත් මාර්ගයන්ගෙන් දේශපාලන ව්‍යාපාර තුළ යොදා ගැනීම ද දක්නට ලැබේ. එහිදී ප්‍රධාන වශයෙන්ම තම භික්ෂු ප්‍රතිරූපය යොදා ගනිමින් බලපෑම් කණ්ඩායමක් ලෙස ක්‍රියා කරමින් පවතින රජය වෙත බලපෑම් කිරීම මෑත ඉතිහාසය තුළ බහුල ලෙස දක්නට ලැබෙන දෙයකි. එහිදී කණ්ඩායම් වශයෙන් මෙන්ම තනිව භික්ෂූන් වහන්සේ පවතින රජයට අභියෝගයක් වන ලෙස කටයුතු කළ සංවිධානයන් පහත පරිදි දැක්විය හැකිය,

I. බොදු බල සේනාව, සිංහල රාවය හා රාවණා බලය සංවිධාන.

II. මාදුළුවාවේ සෝභිත හිමි හා සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය.

බොදු බල සේනාව, සිංහල රාවය හා රාවණා බලය සංවිධාන

මෑතකාලීන ඉතිහාසය තුළ සිංහල ජාතිය හා බුද්ධාගම වෙනුවෙන් පෙනී සිටිමින් සිංහල බෞද්ධයන්ට සිදුවන අසාධාරණකම් වෙනුවෙන් ආණ්ඩුව වෙත ප්‍රබල බලපෑමක් එල්ල කළ කණ්ඩායම් ලෙස මෙම සංවිධානයන් හැඳින්විය හැකි ය. එහි දී විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ශ්‍රී ලාංකේය බෞද්ධයන්ගේ අයිතිවාසිකම් හා උරුමයන් ආරක්ෂා කරගැනීම වෙනුවෙන් කටයුතු කිරීම මෙම සංවිධානයන් ගේ අභිලාෂය වූ බව පෙනෙන්ට තිබුණි.

මෙහි දී මෙම සංවිධානයන් ත්‍රිත්වයෙ හි ක්‍රියාකාරීත්වය සාමාන්‍ය ජනයා වෙත ඉතා ඉක්මනින් සමීප වන්නේ මෙම සංවිධානයන් මෙහෙය වූ ප්‍රධාන භික්ෂූන් වහන්සේලා ගේ ප්‍රතිරූපයන් නිසාවෙනි. එහි දී බොදු බල සේනාවේ මහ ලේකම් ගලගොඩඅත්තේ ඥාණසාර හිමි, රාවණා බලයේ සභාපති ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි හා සිංහල රාවයේ සභාපති අක්මීමණ දයාරතන හිමි යන හිමිවරුන් විශේෂයෙන් සඳහන් කළ හැකිය. මෙම භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ සංවිධාන අවුරුදු 5ක් වැනි කෙටි කාලයක් තුළ බෞද්ධ ජන සමාජයේ වීරයන් බවට පත්වන්නේ එක සමාන සිද්ධි මාලාවක් වෙනුවෙන් සිදු කළ මැදිහත්වීම නිසාවෙනි. ඒ සිද්ධි පහත පරිදි දැක්විය හැකි ය,

I. දෙවනගල සෙල් ලිපිය ආරක්ෂා කිරීම.

II. ගව ඝාතනය තහනම් කිරීම.

III. විල්පත්තුව ආරක්ෂා කිරීම.

IV. කුරගල ආරක්ෂා කිරීම.

මීට අමතරව තම විරෝධය පළ කිරීම වෙනුවෙන් විවිධ ස්ථාන වැටලීම් ද මෙම සංවිධානයන් විසින් සිදු කරනු ලැබීය. එම ස්ථාන නම්,

I. මැද පෙරදිග විදෙස් ශ්‍රමිකයන්ගේ ගැටලු නිරාකරණය වෙනුවෙන් විදේශ සේවා නියුක්ති කාර්යංශය වැටලීම.

II. ආගමික කටයුතු වෙනුවෙන් පොලීසියක් පිහිටුවීමට විරුද්ධව බුද්ධ ශාසන අමාත්‍යංශය වැටලීම.

III. අල්ලස් හා දූෂණ කොමිසමේ අධ්‍යක්ෂවරිය ඉවත් කරන ලෙස ඉල්ලා එම කොමිශන් සභා කාර්යාලය වැටලීම.

IV. බුදු දහමේ සංකේතවලට නිගරු වන ලෙස පවත්වාගෙන ගිය මීගමුව ඉඳුරුව හෝටලය වැටලීම.

මෙම සිද්ධීන් ලාංකේය සමාජය තුළ යම් ආකාරයක බලපෑමක් එල්ල කළ සිද්ධීන් බවට පත් වූයේ භික්ෂු ප්‍රතිරූපයන් සමඟ සෘජුව බැඳී තිබීම හා ඊට ලැබුනු මාධ්‍ය ආවරණය නිසාවෙනි. කෙසේ වුව ද මෙම සංවිධානයන් අතුරින් ලාංකේය සමාජයෙ හි කැළඹීමක් ඇති කරන්නට සමත් වූයේ බොදු බල සේනාව දියත් කළ මුස්ලිම් විරෝධී ව්‍යාපාරයයි. එහිදී පහත කටයුතු වෙනුවෙන් බොදු බල සේනාව සක්‍රීය ලෙස මැදිහත් විය.

I. හලාල් විරෝධය.

II. බුර්කාව තහනම් කිරීම.

III. අන්‍යාගමීකරණයට එරෙහි වීම.

IV. මුස්ලිම් අන්තවාදී සංවිධානයන්ට එරෙහි වීම.

V. ක්වාසි උසාවි පිහිටුවීමට එරෙහි වීම.

VI. ශරියා බැංකු පිහිටුවීමට එරෙහි වීම.

මෙම සිද්ධි දාමය හේතුවෙන් සිංහල බෞද්ධ සමාජය තුළ වීරයාගේ භූමිකාවත් හා මුස්ලිම් සමාජය තුළ දුෂ්ටයා ගේ භූමිකාවත් එකවර නිරූපණය කිරීමට බොදු බල සේනාව සමත් විය. මෙම තත්ත්වය තුළ එවකට පැවති මහින්ද රාජපක්ෂ ආණ්ඩුව බහුතර බෞද්ධයන් ගේ සිත දිනා ගැනීම වෙනුවෙන් බොදු බල සේනාවේ ක්‍රියාකලාපය වක්‍රාකාරව අනුමත කළ ආකාරයක් දක්නට ලැබුනු අතර ඊට ආරක්ෂක ලේකම්වරයාගේ ද සහාය ලැබුනු බව ට විවිධ මත පළ විය. මෙහි දී බොදු බල සේනාව තම ව්‍යාපාරය තුළ ගොඩනැගුණු භික්ෂු ප්‍රතිරූපය ජනතා ගත කිරීම වෙනුවෙන් පහත පියවරයන් අනුගමනය කළේය,

I. මාධ්‍ය සාකච්ඡා.

II. රජයේ ආයතන වැටලීම.

III. උද්ඝෝෂණ ව්‍යාපාර.

IV. බොදු මහ සමුළු පැවැත්වීම.

V. බුද්ධානුස්මෘති වැඩසටහන් පැවැත්වීම.

VI. ආශිර්වාද පූජා.

VII. සුභසාධන ව්‍යාපෘති.

VIII. පුවත්පත් මුද්‍රණය.

මෙවැනි ක්‍රියාමාර්ගයන් මගින් බෞද්ධ සමාජය තුළ මුස්ලිම් අන්තවාදයට එරෙහිව කටයුතු කිරීම නිසාවෙන් ඒ වටා විශාල ජනකායක් ඒකරාශී විය. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාර වෙනුවෙන් නිකුත් කළ හලාල් සහතිකය පවා ඉවත් කිරීමට රජයට සිදු විය. මෙවන් වටපිටාවක් නිර්මාණය වන්නේ පැවති ආණ්ඩුවේ ආශිර්වාදය මතය. 2015 ජනාධිපතිවරණ යේ අවසන් ප්‍රතිඵලය වෙනුවෙන් ද බලපෑවේ මෙම තත්ත්වය බව දේශපාලන විචාරකයින්ගේ මතයයි. එනම් බොදු බල සේනාවේ ක්‍රියාකාරීත්වය ආණ්ඩුව අනුමත කිරීම මත සුළු ජාතික ඡන්ද මහින්ද රාජපක්ෂට එරෙහිව භාවිත වීම හේතුවෙන් ඔහුට ජනාධිපතිවරණය පරාජය වීමට සිදු විය.

ඒ අනුව බොදු බල සේනාව, සිංහල රාවය හා රාවණා බලය යන සංවිධානයන් භික්ෂු ප්‍රතිරූප භාවිත කරමින් දියත් කළ මුස්ලිම් විරෝධී ව්‍යාපාරයන් ගේ ප්‍රතිඵලය වූයේ සුළු ජාතික ඡන්ද ප්‍රතිශතය අවම වීම මත හිටපු ජනාධිපති මහින්ද රජපක්ෂ ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වීමයි.

මාදුළුවාවේ සෝහිත හිමි හා සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය.

මෑත ඉතිහාසයේ පැවති ආණ්ඩු සිදු කළ අකටයුතුකම් වලට එරෙහිව නිර්භය ව ප්‍රබල බලපෑමක් එල්ල කළ භික්ෂු ප්‍රතිරූපයක් ලෙස මාදුළුවාවේ සෝහිත හිමියන් හැඳින්විය හැකිය. ජේ. ආර් ජයවර්ධන පාලන සමයේ සිට මහින්ද රාජපක්ෂ පාලන සමය දක්වා පැවති රජයන් විවිධ අකටයුතුකම් වෙනුවෙන් සිය බලය යොදවන විට ඊට එරෙහිව හඬ නැගූ සෝහිත හිමි ජාති, ආගම්, කුල භේද නොසළකමින් කටයුතු කළේය. එමනිසා ශ්‍රී ලංකාව තුළ ජීවත් වූ සියලුම ජාතීන්ගේ හා ආගම්වල ජනතාවගේ මනසේ සෝහිත හිමිගේ ප්‍රතිරූපය රැඳී තිබුණේය.

සෝහිත හිමි මෙරට දේශපාලන ව්‍යුහය තුළ කැපී පෙනෙන ප්‍රතිරූපයක් බවට පත්වීම ආරම්භ වන්නේ 1980 දශකයේය. මෙම කාල වකවානුව තුළ උතුරේ ක්‍රියාත්මක වූ බෙදුම්වාදී ත්‍රස්ථවාදී කටයුතු නිසා මෙන්ම දකුණේ ක්‍රියාත්මක වූ රාජ්‍ය ත්‍රස්ථවාදය නිසාවෙන් රටම කැළඹී සිටයේය. මෙවන් භීෂණකාරී තත්ත්වයක් නිර්මාණය වීම පිළිබඳව වර්ෂ 1986 අගෝස්තු මස 'රාවය' සඟරාව වෙනුවෙන් ලිපියක් සම්පාදනය කරන සෝහිත හිමි එමගින් අවස්ථාවාදී දේශපාලකයන්, රාජ්‍ය ත්‍රස්තවාදය හා එහි අනිසි ප්‍රතිඵල පිළිබඳව විවේචනාත්මකව කථා කරයි. එතැනින් සෝහිත හිමි ආරම්භ කළ ගමන චන්ද්‍රිකා බණ්ඩාරනායක හා මහින්ද රජපක්ෂ රජයන් ක්‍රියාත්මක වන අවධීන් හී දී ඉතා ප්‍රබලව ඉස්මතු විය. එම අවස්ථා පහත පරිදි දැක්විය හැකිය,

I. විධායක ජනාධිපතිධූරය අහෝසි කිරීමේ ව්‍යාපාරය.

II. නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීමේ ව්‍යාපාරය.

III. ඉන්දු ලංකා ගිවිසුම ට එරෙහි ව්‍යාපාරය.

IV. හිටපු හමුදාපති සරත් ෆොන්සේකා නිදහස් කිරීමේ ව්‍යාපාරය.

V. අමද්‍යප ව්‍යාපාරය.

VI. මහින්ද රාජපක්ෂ පාලනය බිඳ දැමීමේ ව්‍යාපාරය.

VII. එක්සත් ජාතික පෙරමුණ ප්‍රමුඛ යහපාලන ආණ්ඩුවක් පිහිටුවීමේ ව්‍යාපාරය.

ඉහත සඳහන් අවස්ථා තුළ සෝභිත හිමිගේ ප්‍රතිරූපය ජනතාවගේ සිත් තුළට තදින්ම කාවැදුනු අතර ජනතාව උන්වහන්සේ සමඟ ඒකරාශී වීම නිසාවෙන් එය ආණ්ඩුවට ප්‍රබල තර්ජනයක් ද විය. 80 දශකයේදී ජේ. ආර් ජයවර්ධන විසින් හඳුන්වාදුන් විධායක ජනාධිපතිධූරයට මෙන්ම ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව සංවිධානය කළ උද්ඝෝෂණ මාලාව හා විරෝධතාවයන් හි ඉදිරි පෙළ කථිකයා වූයේ සෝභිත හිමිය. ආක්‍රමණශීලී ප්‍රවේශයකින් එම විරෝධතා ව්‍යාපාරයන් හි සෝභිත හිමි හැසිරීම මත සමහර විද්වතුන්ගේ හා දේශපාලකයින්ගේ දෝෂාරෝපණයට ද ලක්විය.

80 දශකය තුළ සෝභිත හිමි දේශපාලනික වශයෙන් දායක වූ කටයුතු වෙනුවෙන් ජනමාධ්‍ය ලබාදුන් ප්‍රචාරය ලාංකේය ජනතාව අතර ප්‍රභල ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට සෝභිත හිමි උපකාර විය. එසේ ගොඩනගාගත් ප්‍රතිරූපය පදනම් කරගනිමින් මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව හඬ නැගීම වෙනුවෙන් අමද්‍යප ව්‍යාපාරය ගොඩනැගීය. ඒ ඔස්සේ විවිධ වැඩසටහන් මාලාවන් සංවිධානය කරමින්, දේශන පවත්වමින් තරුණ පරපුර ඉන් මුදවා ගැනීමට මහත් පරිශ්‍රමක් දැරීය. සුනාමි ව්‍යසනය සිදු වූ අවස්ථාවේ ඊට මුහුණ දුන් පොදු ජනතාව නගා සිටුවීම වෙනුවෙන් භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් නායකත්වය දෙන්නේ සෝභිත හිමිය. එම තත්ත්වය මත ද සෝභිත හිමිගේ ප්‍රතිරූපය තව තවත් ජනතාවට සමීප විය.

මෙසේ ගොඩනගා ගත් ප්‍රතිරූපය පදනම් කරගනිමින් මෑත ඉතිහාසයේ උන්වහන්සේ හඬ නැගූ ප්‍රධාන කරුණක් වන්නේ හිටපු හමුදාපති සරත් ෆොන්සේකා, මහින්ද රාජපක්ෂ රජය විසින් සිරගත කළ අවස්ථාවේ දී ඊට එරෙහිව කටයුතු කිරීමයි. මෙහිදී මාධ්‍ය සාකච්ඡා, විරෝධතා ව්‍යාපාර, අධිෂ්ඨාන පූජා, ජනතා පෙත්සම් වැනි විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් එම ක්‍රියාවට එරෙහිව ජනතා බලගවේයක් ගොඩනැගීමට උන්වහන්සේ සමත් විය. වරෙක සරත් ෆොන්සේකාගේ නිදහස වෙනුවෙන් තමන් ඇතුළු භික්ෂූන් වහන්සේලා කිහිප නමක් සිරගත වීමට සූදානම් බව පවා උන්වහන්සේ ප්‍රකාශ කළේය. මෙම සියලුම ක්‍රියාමාර්ගයන් හේතුවෙන් ආණ්ඩුවට එල්ල වූ ජාතික හා අන්තර්ජාතික පීඩනය මත අවසානයේ සරත් ෆොන්සේකා නිදහස් කිරීමට පැවති ආණ්ඩුවට සිදුවිය. ඊට මූලික සාධකය වූයේ සෝභිත හිමි දියත් කළ ව්‍යාපාරයයි.

විධායක ජනාධිපතිධූරය අහෝසි නොකරමින් 19 වන ව්‍යවස්ථා සංශෝදනය මගින් එහි බලය තවත් වර්ධනය කරමින් සිටි මහින්ද රාජපක්ෂ පාලනය අවසන් කිරීමට ද ප්‍රමුඛ වන්නේ සෝභිත හිමිය. එහිදී සිවිල් සංවිධාන එකමුතු කරමින් පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේනගේ ජයග්‍රහණය වෙනුවෙන් ජනතාව පෙළගස්වන්නේ ද සෝභිත හිමිය. එහි දී මාධ්‍ය සාකච්ඡා, දැනුවත් කිරීම්, ජනරැලි අමතමින් මහින්ද රාජපක්ෂ විරෝධී මතයක් ඇති කිරීමේ ගාමක බලවේගය බවට සෝභිත හිමි පත්විය. විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ එක් පොදු විපක්ෂයක් බවට ගොඩනගා 2015 ජනාධිපතිවරණයේ දී බල පෙරළියක් සඳහා පසුබිම තනා එය යථාර්ථයක් බවට පත්කරන්නේ සෝභිත හිමිය. අවුරුදු 20ක් යන තුරු බිඳදැමිය නොහැකි යයි ප්‍රකාශ කර තිබූ රාජපක්ෂ පාලනය බිඳ දැමීමට මූලික හේතුව සෝභිත හිමිගේ ප්‍රතිරූපය කේන්ද්‍ර කරගනිමින් ඇති වූ ජනතා ව්‍යාපාරය බව සඳහන් කළ හැකිය.

එමෙන් ම 2015 මහමැතිවරණය තුළින් නැවත වරක් බලයට පැමිණීමට උත්සාහ දැරූ මහින්ද රාජපක්ෂ ඇතුලු කණ්ඩායම පරාජයට පත්කර යහපාලනය වෙනුවෙන් වූ එක්සත් ජාතික පෙරමුණ බලයට ගෙන ඒමට ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේ සෝභිත හිමිය. එහිදී සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය වෙනුවෙන් 'දස විධ ප්‍රතිපත්තියක්' වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂය පොරොන්දු කරවා ගනිමින් ඊට සහය දක්වන ලෙස ජනතාවට ප්‍රකාශ කළේ සෝභිත හිමිය. 2015 මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පෙරමුණ ජයග්‍රහණය කරන්නේ සෝභිත හිමි ලාංකේය ජන සමාජය තුළ ගොඩනගා ගෙන තිබූ ප්‍රතිරූපය මත උන්වහන්සේ වෙත ජනතාව තැබූ විශ්වාසය නිසාවෙනි.

ඒ අනුව බලපෑම් කණ්ඩායමක් ලෙස කටයුතු කරමින් ජාතික ගැටලු වෙනුවෙන් පැවති ආණ්ඩු වෙත බලපෑම් කරමින් ඒවා දිනා ගැනීම සඳහා තම ප්‍රතිරූපය භාවිත කළ හිමි නමක් ලෙස මාදුළුවාවේ සෝභිත හිමි හැඳින්විය හැකි ය.

මේ ආකාරයට බුදුදහම මෙරටට හඳුන්වා දුන් දින සිටම භික්ෂූන් වහන්සේ හා මෙරට දේශපාලනික ව්‍යුහය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් ගොඩ නැගී ඇත. ඉහත සඳහන් කළ අන්දමට නිදහසින් පසුව ලංකාවේ දේශපාලන ප්‍රවාහය තුළ ඉතා තීරණාත්මක කාර්යභාරයක් භික්ෂූන් වහන්සේලා විසින් ඉටු කර ඇත. වරෙක ආණ්ඩු පිහිටුවීමට උපකාරී වූ භික්ෂු ප්‍රතිරූපය තවත් වරෙක ආණ්ඩු පෙරළීමට නැතිනම් බිඳ දැමීමට යොදා ගත් අවස්ථා නිදහසින් පසුව අවස්ථා කිහිපයකම දක්නට ලැබේ. මේ ආකාරයෙන් නිදහසින් පසුව ලාංකේය දේශපාලන ව්‍යාපාරය තුළ භික්ෂූන් වහන්සේගේ ගමන් මග පැහැදිලි වේ.

මූලාශ්‍ර

අයිවන්, වික්ටර්. (2006). පන්සලේ විප්ලවය. මහරගම, රාවය ප්‍රකාශකයෝ.

ආරියසේන, කඹුරුපිටියේ (1997). බුදු සමය හා රාජ්‍යය. කොළඹ, බුද්ධ ශාසන අමාත්‍යංශය.

ද සිල්වා, ප්‍රේමකුමාර; උයන්ගොඩ, ජයදේව; පෙරේරා, රංජිත් (2008). ප්‍රවාදගත කියවීම් 1. කොළඹ 05, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

පඤ්ඤාසේකර හිමි, මහකච්චකොඩියේ (2014). වෙනස් වන සමාජය තුළ භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල හිමි, වල්පොළ. (1999). භික්ෂුවගේ උරුමය. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ලියනගේ, ගුණදාස. (1994). වල්පොල රාහුල හාමුදුරුවෝ. දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

විජේසූරිය, සරත්. (2009). ගරුතර සංඝරත්නයෙන් අවසරයි. බොරැල්ල, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

විජේසූරිය, සරත් (2015). තුන්කල් දැක්ම. පුංචි බොරැල්ල, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

විජේසූරිය, සරත් (2012). ප්‍රගතිශීලී භික්ෂුවකගේ කැපවීම සහ වගකීම. පුංචි බොරැල්ල, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

විපුලතිස්ස හිමි, මාගල්ලේ (2014). භික්ෂු සමාජය, එහි ලාංකික මුහුණුවර හා උරුමය සහ එයට එරෙහි ආක්‍රමණික බලවේගයන්හි නව ප්‍රවණතා. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිල්වා, නලින්ද. (2004). මැතිවරණය සහ හාමුදුරුවෝ, චින්තන පර්ෂදය

සුමංගල, ශ්‍රී හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, සිල්වා ද අන්ඩ්‍රිරිස්, දොන් (පරි.) (1952). මහාවංශය. කොළඹ, ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

දේශීය ශාස්ත්‍රීය ලිපි

අරියවිමල හිමි, කොස්වත්තේ (1999). භික්ෂූන් වහන්සේගේ සමාජ සහභාගීත්වය කෙබඳුද. ලෝචන ශාස්ත්‍රීය සංග්‍රහය.

අරියසේන හිමි, කඹුරුපිටියේ (1999). භික්ෂුව හා 21 වන සියවස. ලෝචන ශාස්ත්‍රීය සංග්‍රහය.

ධම්මසිරි හිමි, කිරිමැටියාවේ (2012). ශ්‍රී ලාංකේය භික්ෂුවගේ වත්මන් දේශපාලන ගමන් මග පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණය. ප්‍රවචන ශාස්ත්‍රීය සංග්‍රහය.

ප්‍රදීප් ,එච්.යූ.එස් (2010). ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේගේ දේශපාලන සබඳතා. සම්භාෂා - හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි අනුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය.

සුමනජෝති හිමි, බෝධාගම (2014). විශුද්ධි මාර්ගයෙන් හෙළිවන තත්කාලීන භික්ෂු ජීවිතය පිළිබඳ විමසුමක්. ප්‍රඥාසාර ශාස්ත්‍රීය සංග්‍රහය - මංගල කලාපය.

විදේශීය ග්‍රන්ථ හා පර්යේෂණ නිබන්ධන

Seneviratne, H.L (2001). Buddhist Monks and Ethnic Politics: A War Zone in an Island Paradise. Anthropology Today, April 2001, vol.17, no.2, pp.15-21.

Seneviratne, H.L (1999). The work of Kings: The New Buddhism in Sri Lanka. London, The University of Chicago Press.

Tambiah, S. J. (1992). Buddhism Betrayed? Religion, Politics and Violence in Sri Lanka.

London, The University of Chicago press.

Wriggins, W. Howard (1960). Ceylon: Dilemmas of a New Nation. Princeton, The Princeton University Press

19

සෑම ටෙලිනාට්‍යක්ම සෝප් ඔපෙරාවක් නොවේ

අතුල සමරකෝන්

හැඳින්වීම

සෝප් ඔපෙරාව ටෙලිවිෂන් නාටක ශානර අතර එක් උපශානරයකි. එය ජනප්‍රියත ම උප ශානරයක් ද වෙයි. ලොව පුරා ඕනෑම රටක ප්‍රේක්ෂකයන්ගේ වැඩිම මනාපය සහිත වැඩසටහන් දහය අතර, මුල්ම වැඩසටහන් පහ අතරට සෝප් ඔපෙරාවක් පැමිණෙයි. එම සාධකයෙන් ම පෙනෙන්නේ සෝප් ඔපෙරාවේ ජනප්‍රියතාව කොතරම් ද යන්නයි. ජනප්‍රිය පුවත්පත් සහ ටැබ්ලොයිඩ් පුවත්පත්වල වැඩි වශයෙන්ම පුවත් මවන්නේ සෝප් ඔපෙරාවයි. මෙම පුවත්පත් සෝප් ඔපෙරා උත්කර්ෂයට නංවන අතරම, අලෙවිය සඳහා සෝප් ඔපෙරාව අවභාවිතයේ ද යොදවයි.

ටෙලිවිෂන් ශානර අතර ආකර්ෂණීය ම ටෙලිනාටක ශානරයක් වන සෝප් ඔපෙරාව පිළිබඳ ලියවෙන මෙම රචනය, සෑම ටෙලිවිෂන් නාට්‍යක්ම සෝප් ඔපෙරාවක් ය යනුවෙන්, ලංකාවේ මුල් බැස ඇති, වැරදි ප්‍රවාදයක් ප්‍රශ්න කිරීම සඳහා ලියවෙයි. සෝප් ඔපෙරාවේ ස්වීය ලක්ෂණ, ගුවන්විදුලි නාටකය හා සාහිත්‍යය සමඟ එහි ඇති සම්බන්ධය, යථාර්ථවාදය, වින්දනය හා සෝප් ඔපෙරා ප්‍රේක්ෂකයා ගැන ද සාකච්ඡා කරයි. සෝප් ඔපෙරාව හා අතිනාටකය අතර ඇති සම්බන්ධයට අමතරව, මෙම ලිපියේ ලාංකික සෝප් ඔපෙරාවේ ගති ලක්ෂණ පිළිබඳව ද අදහස් ඉදිරිපත් කෙරෙයි.

ටෙලිනාට්‍ය ශානර (TV Drama Genres)

සෑම ටෙලිවිෂන් නාටකයක් ම සෝප් ඔපෙරාවක් නොවේ. ටෙලිවිෂනය සම්පූර්ණයෙන් ම ආඛ්‍යානය මත රැඳෙන මාධ්‍යයක් බව අපි දනිමු. ජාතියේ කතන්දර කියන්නා යනුවෙන් ටෙලිවිෂනය හඳුන්වන්නේ එබැවිනි. ලෝකයේ ජනප්‍රියම ටෙලිනාටක ශානරය සෝප් ඔපෙරාව වන්නේ, එය කතන්දර ආකෘතිය මත පිහිටන බැවිනි.

තේමාවන් අනුව ටෙලි නාටක ශානර රාශියක් පැවතුනත්, ප්‍රධාන ටෙලිනාටක ප්‍රවර්ග ඇත්තේ කිහිපයකි. හාස්‍යමය (Comedy) ළමා, (Children) ක්‍රියාදාම (Action) විද්‍යා ප්‍රබන්ධ (Science Fiction) යනුවෙන් ටෙලිනාටක වර්ග කෙරෙන්නේ තේමාවන් අනුවයි. එහෙත් ටෙලිනාටකයේ ව්‍යුහය අනුව ප්‍රධාන ටෙලිනාටක ප්‍රවර්ග පහත පරිදි නම් කළ හැකිය. ඒකාංගික නාටකය (Single Episode), ප්‍රාසාංගික නාටකය (Serial), මාලා නාටකය (Series), ටෙලි විෂනයට තැනූ චිත්‍රපටය (TeleFilm), කුඩා මාලා නාටකය (Mini Series), ඇන්තොලොජි මාලා නාටකය (Anthology Series), හා සෝප් ඔපෙරාව (Soap Opera) යනු එම ප්‍රධාන ටෙලි නාටක ශානර කිහිපයයි.

සෝප් ඔපෙරාව බොහෝවිට ප්‍රාසාංගික නාටකයේ ව්‍යුහයන්ගෙන් ඉදිරිපත්වන නිසා දීර්ඝ ප්‍රාසාංගික ටෙලිනාටක සියල්ලම සෝප් ඔපෙරාව ලෙස නම්කිරීමේ වැරදි ව්‍යවහාරයක්, ලංකාවේ ටෙලිවිෂන් කතිකාව තුළ බිහිව තිබෙන බව පෙනේ. සෑම ටෙලිවිෂන් නාටකයක්ම සෝප් ඔපෙරාවක් නොවන බව මුලින්ම වටහාගත යුතුය. සෝප් ඔපෙරාව හඳුනාගැනීමට ප්‍රථම, ප්‍රධාන ටෙලිවිෂන් ශානර දෙකක්වන මාලා නාටකයේත්, ප්‍රාසාංගික නාටකයේත්, වෙනස හඳුනාගත යුත්තේ ප්‍රධාන හේතු දෙකක් නිසයි. පළමුවැන්න සෝප් ඔපෙරාව බොහෝවිට නිමවන්නේ ප්‍රාසාංගික ආකෘතිය භාවිත කරමිනි. සති ගණනාවක් පුරා ඇදීයන කතා පුවතක් ප්‍රාසාංගික නාටකයට තිබෙන නිසා, සියලුම ප්‍රාසාංගික නාටක සෝප් ඔපෙරා ලෙස වැරදියට අර්ථකථනය කරගැනීම දෙවැන්නයි.

ප්‍රාසාංගික නාටකය සහ මාලා නාටකය, (Serial and Series)

මාලා නාටකය යනු රචකයෙක් හෝ රචකයන් කිහිපදෙනෙකු රචනා කළ වෙන් වෙන් නාටක මාලාවකි. ඒ තුළ නැවත නැවත හමුවන චරිත කිහිපයක් ඇත. බොහෝවිට මෙම චරිත සැරිසරන්නේ නිෂ්චිත ඉසව්වකය. චරිත විකාශනයක් ඇත්තේ ඉතාම කලාතරකිනි. මෙම චරිත පැතලිය. සෑම චරිතයක ම ප්‍රේක්ෂකයා දකින්නේ එක් පැතිකඩකි. එක් කොටසකට එක් තේමාවක් තිබේ. එක් දවසකට එක් කතා පුවතකි. අනෙක් දවසට වෙනත් කතා පුවතකි. Robinhood, X Files මාලා නාටක සඳහා ජනප්‍රිය නිදසුන් කිහිපයකි.

සතිපතා විකාශනය වන, වර්ධනය වන, අඛණ්ඩ කතාවක් ප්‍රාසාංගික නාටකයේ දැකිය හැකිය. විවිධ චරිත ලක්ෂණ සහිත සංකීරණ චරිත හමුවේ. මෙම චරිතවල වර්ධනයක් පවතියි. සෑම කතාංගයක්ම අවසානයේ දී ඊළඟ කතාංගයට සම්බන්ධවන ලෙස කුතුහලය ඇතිවෙන පරිදි Cliffhanger එකකින් අවසන් වේ. Cliffhanger යනු ඊළඟ කතාංගය නැරඹීමට ප්‍රේක්ෂකයා රඳවා තබාගන්නා උද්‍යෝගිමත් රඳවනයයි. ප්‍රැටීෂියා හොලන්ඩ් ප්‍රාසාංගික නාටකය හඳුන්වන්නේ සති ගණනක් වර්ධනය වන වස්තු බීජයක් ඇති ටෙලිනාට්‍ය ලෙසයි (Holland,1997:114) . ප්‍රාසාංගික නාටකය හා මාලා නාටකය යනු පැහැදිලි ලෙසම ස්වාධීන ගති ලක්ෂණ පෙන්වන ටෙලිනාටක ප්‍රවර්ග දෙකකි.

සෝප් ඔපෙරාව ප්‍රාසාංගික ආකෘතියේ පිහිටිය ද සාමාන්‍ය ප්‍රාසාංගික නාටකය අන්තර්ගතයේ හා චරිත නිරූපණයේ ඇති තීව්‍රතාව අතින්, ද සමාජ යථාර්ථය හසුකරගැනීම, ප්‍රශ්න කිරීම සහ අත්දැකීමක් අල්ලා ගැනීමේදී පෙන්වන සංකීර්ණ බව අතින් ද සෝප් ඔපෙරාවට වඩා වෙනස් වෙයි. ඇතැම් විට පර්යේෂණාත්මක ද වෙයි. පුද්ගලත්වය හා දේශපාලනය අතර ඇති නව සම්බන්ධතා පෙන්වාදීම අතින් ද ප්‍රාසාංගික නාටකය සෝප් ඔපෙරාවට වඩා බරපතල සහ සංකීර්ණ ටෙලිනාට්‍ය ශානරයකි(Creeber,2004:08).

සෝප් ඔපෙරා සම්ප්‍රදායන්

ඇමෙරිකානු හා බ්‍රිතාන්‍යය යනුවෙන් සෝප් ඔපෙරාවේ ප්‍රධාන සම්ප්‍රදායන් දෙකක් දැක ගැනීමට පුළුවන. ඇමෙරිකානු සෝප් ඔපෙරා සම්ප්‍රදාය ප්‍රධාන වශයෙන්ම අතිනාටකීය හා රොමැන්තික ස්වරූපයක් දරන විට බ්‍රිතාන්‍යය සෝප් ඔපෙරා සම්ප්‍රදාය අයත් වන්නේ සමාජ යථාර්ථවාදී (Social Realism) සම්ප්‍රදායටයි. එදිනෙදා ජීවිතයේ චරිත අවස්ථා හා සංවාද රැගත් බ්‍රිතාන්‍ය සෝප් ඔපෙරාවල පසුතලය සඳහා බොහෝවිට වැඩ කරන පන්තියේ ප්‍රජාව වෙසෙන ප්‍රදේශයක් තෝරා ගැනෙයි.

මේ සඳහා පිළිවෙළින් ඩලාස් නොට්ලැන්ඩින්, කෝල්බිස් ඩිනස්ටි අමෙරිකානු සම්ප්‍රදායේ සෝප් ඔපෙරා සඳහා නිදර්ශන වෙයි. කොරනේෂන් ස්ට්‍රීට්, ක්‍රොස් රෝඩ්ස් කැපී පෙනෙන බ්‍රිතාන්‍ය සම්ප්‍රදායේ සෝප් ඔපෙරා ලෙස නම් කිරීමට පුළුවන. ඉහත ප්‍රවණතාවන්ට අමතරව ආසියානු හා ලතින් අමෙරිකානු රටවල ද සෝප් ඔපෙරා ජනප්‍රිය ශානරයක් ව පවතියි. ලතින් අමෙරිකානු ටෙලිනවලා (Telenovela) ශානරය එම කලාපයේ ඉතා ජනප්‍රිය සෝප් ඔපෙරා හැඩයකි. ඉන්දියාව හා ශ්‍රී ලංකාව මේ සඳහා කැපීපෙනෙන නැඹුරුවක් දක්වන ආසියානු රටවල් දෙකකි. මහගෙදර, ශාන්ති, දූ දරුවෝ,[1] සත්පුර වැසියෝ, නැදෑයෝ, මේ සඳහා කැපීපෙනෙන ගැළපෙන නිදර්ශන ලෙස පෙන්වාදීමට පුළුවන.

සෝප් ඔපෙරාවේ ජනප්‍රියම අවධිය වන 1970 හා 80 දශකයන්හි දී අමෙරිකානු සෝප් ඔපෙරාවන් විසින් බ්‍රිතාන්‍යය ටෙලිවිෂනයේ හොඳම ගුවන් කාලයන් PrimeTime ආක්‍රමණය කළ බවක් පෙනේ (Casey and Betnedtta,2004:223). කෙසේ නමුත් 80 දශකයේ අවසානය වන විට අමෙරිකානු සෝප් ඔපෙරාවන් කෙරෙහි තිබූ ජනප්‍රියත්වය බ්‍රිතාන්‍යය තුළ අඩුවන්නට වීම නිසා ඔස්ට්‍රේලියානු සෝප් ඔපෙරාවන් වෙත බ්‍රිතාන්‍යය වැඩ සටහන් ආනයනයකරුවන් හැරෙන්නේ මින් අනතුරුවයි. ඒකාකාරී කතාවන් හා අභව්‍ය කතා පුවත් නිසා ප්‍රේක්ෂකයන් වෙහෙසට පත්වීම මෙයට හේතුවයි. ඉතා අඩු මුදලකට නිපද වූ Neighbours, Home and Away ඕස්ට්‍රේලියානු සෝප් ඔපෙරා බ්‍රිතාන්‍යයේ ජනප්‍රිය වූයේ ඉන් අනතුරුවයි. East Enders සෝප් ඔපෙරාවේ ජනප්‍රියතාව වැටීමත් සමඟ ම එම ගුවන් කාලය දිනා ගන්නේ Neighbours විසිනි. ඒ තුළ වූ සරල කතා පුවත හා තරුණ නළුනිළි කැළ මෙම ජනප්‍රියත්වයට හේතුවයි. (Casey and Betnedtta,2004:223)

සෝප් ඔපෙරාව ගුවන් විදුලියෙන් ටෙලිවිෂනයට

සෝප් ඔපෙරා යන යෙදුම මුලින්ම භාවිතා වූයේ 40 දශකවල අමෙරිකානු ගුවන් විදුලියේ විකාශය වුනු ප්‍රාසාංගික වර්ගයේ නාටකයන් හැඳින්වීම සඳහායි.[2] එය එසේ වූයේ එම වැඩ සටහන් සඳහා අනුග්‍රහය දක්වනු ලැබූයේ සබන් හා රෙදිසෝදන ද්‍රව්‍ය නිෂ්පාදන සමාගම් විසිනි. මෙම නාටකයන්හි ඉලක්කගත ප්‍රේක්ෂකයන් වූයේ ගෘහණියන් බැවින් අනුග්‍රාහක ආයතන වල නිෂ්පාදන භාණ්ඩවල අලෙවිය වාර්තාගත ලෙස ඉහළ ගොස් තිබේ. මේ සඳහා අනුග්‍රහය දැක්වූ සමාගම් ලෙස Procter and Gamble, Colgate Palmolive වැනි සමාගම් හඳුන්වා දිය හැකිය. පවුලේ කතා තේමාවන් සහිත වූ මෙම ප්‍රවර්ගය ගෘහස්ත නාටකය ලෙස ද හැඳින්විය. ප්‍රසාංගික හැඩයකින් යුත් මේ නාටකය 1930 දශකය වන විට ඉතා ශීඝ්‍රයෙන් ජනප්‍රිය වූ අතර එය දහවල් ගුවන් විදුලියේ මුද්‍රාව බවට පත්විය. (Allen,1985:48 54)

උදේ 9.00 සිට සවස 3.00 දක්වා අතර කාලයේ නිවසේ සිටින ගෘහණියන් ඉලක්ක කරගෙන මෙම වැඩ සටහන් විකාශය විය සෝප් ඔපෙරාවේ ප්‍රධාන චරිත කේන්ද්‍රය වූයේ කාන්තා චරිත වටා වීම විශේෂත්වයකි. ගුවන් විදුලි සෝප් ඔපෙරාවේ මුල් අදියරේ දී බොහෝ විට වෘත්තීය පසුතලයන් භාවිතකොට ගැනිණි. විශේෂයෙන් වෛද්‍ය වෘත්තියට හෝ නීතිඥ වෘත්තියට අදාල පසුතලයක් මෙම සෝප් ඔපෙරාවේ නිතරම දැක ගත හැකි විය. නාට්‍යය ගොඩනැංවීමේදී හැඟීම්බර ස්වභාවයක් මතු කිරීමට විශේෂයෙන් උත්සහ ගන්නා ලදී. ඉතා ඉක්මණින් ජනප්‍රිය වූ මෙම නාට්‍යය ප්‍රභේදය 1950 දශකය වන විට ටෙලිවිෂනයේ ජනප්‍රියත ම වැඩ සටහන් ප්‍රවර්ගය බවට පත් විය. ප්‍රාසාංගික ආකෘතිය ම භාවිතවට ගෙන ටෙලිවිෂනය සඳහා නිර්මාණය වුණු එවැනිම නාට්‍යය සඳහා සෝප් ඔපෙරා යන නම ම භාවිතවට ගැනිණි.

අමෙරිකාවේ පමණක් නොව මෙය ඔස්ට්‍රේලියානු ටෙලිවිෂනයේ ද ජනප්‍රිය වන්නට පටන් ගන්නේ මේ කාලයේදී ය. බොහෝ විට අමෙරිකානු සෝප් ඔපෙරා ඔස්ට්‍රේලියාවේ විකාශය කිරීම ඇරඹෙන්නේ ද මෙම කාල වකවානුවේදී ය. ඉතාමත් ඉහළ ජනාදරයක් දිනාගත් සෝප් ඔපෙරාවන් වන Dr Paul, Portia Faces Life අමෙරිකාවේ පමණක් නොව ඕ විකාශය වී ජනප්‍රියත්වයක් අත්කර ගෙන තිබේ.(Glaessner,1993:117)

සෝප් ඔපෙරාව සිය අඛ්‍යාන ව්‍යුහය සකස් කර ගන්නේ 19 වන සියවසේ ජනප්‍රිය වූ කාන්තාවන් වෙනුවෙන්ම , ප්‍රසාංගික නවකතාවෙන් Sevrial Noval හා 1920 හා 1930 දශකයන්වල කාන්තා සඟරාවල අතිෂය ජනප්‍රියතාවක් දිනාගත්, කොටස් වශයෙන් පළ වූ, කතා වලිනි. Painted Dreams සෝප් ඔපෙරාවේ සිටම ඊට පසුව පැමිණි සෝප් ඔපෙරාවලත් ප්‍රසාංගික ව්‍යුහයේ ලක්ෂණ මුලින්ම දැක ගැනීමට හැකිවිය. ඒ අනුව මෙම ආඛ්‍යාන ආකෘතිය ගුවන් විදුලි නාට්‍යයෙන් පසුව ටෙලිවිෂන් නාටකයටත් ඉතා පහසුවෙන් අනුවර්තනය විය.

බ්‍රිතාන්‍ය සෝප් ඔපෙරා සම්ප්‍රදාය

බ්‍රිතාන්‍ය තුළ ඉතා ජනප්‍රිය සංස්කෘතික නිෂ්පාදකයෙක් වන්නේ සෝප් ඔපෙරාවයි. එය නොකඩවාම ජනප්‍රියම වැඩ සටහන් ශානරය ලෙස ඉහළ ප්‍රතිචාර ලබා ගනිමින් තවමත් ඉදිරියෙන් සිටියි. බ්‍රිතාන්‍යයේ ප්‍රකටම ටෙලිවිෂන් සෝප් ඔපෙරාව ආරම්භ වන්නේ 1954 දීය. ඒ The Grove Family නම් නාටකයයි. අදටත් ජනප්‍රිය Cronation Street බ්‍රිතාන්‍යය සෝප් ඔපෙරාව මුලින් විකාශය ආරම්භ කරන ලද්දේ 1960 දී මැන්චෙස්ටර් නගරවාසීන් වෙනුවෙනි. එහෙත් ඉතා කෙටි කාලයකින් ජනප්‍රිය වූ එය, දීප ව්‍යාප්ත වැඩි කලක් ගත වූයේ නැත. අද දක්වාම ජනප්‍රිය මෙම සෝප් ඔපෙරාව මිලියන 13 කට වඩා ජනතාවක් නරඹන සෝප් ඔපෙරාවක් ලෙස ඇලෙක්සැන්ඩර් හා කොන්සෙන්ස් හඳුන්වා දෙයි. (Alexander and Consens,2004:26)

මීට අමතරව Cross roads, Brookside, Emmerdale, EastEnders , Hollyoaks යන සෝප් ඔපෙරා බ්‍රිතාන්‍යයේ ඉතා ජනප්‍රිය සෝප් ඔපෙරා ලෙස සැලකේ. කලින් සඳහන් කල පරිදි බ්‍රිතාන්‍ය සෝප් ඔපෙරා නාගරික අනන්‍යතාවක් දරන බැවින් ඒ සඳහා ඉහත සෝප් ඔපෙරා නිදර්ශන ලෙස පෙන්වා දිය හැකිය. මේවා පිළිවෙළින් Birmingham, Liverpool,Yorkshire, London,Chester යන නගර පසුබිම් කරගෙන නිර්මාණය වූ නාගරික අනන්‍යතාවක් සහිත සෝප් ඔපෙරා වන අතර ඒවා තුළ බ්‍රිතාන්‍ය සෝප්

ඔපෙරාවේ අනෙක් අනන්‍යතාව ලෙස පිළිගැනෙන සමාජ යථාර්ථය, (Social Reality) එවාට ම අනන්‍ය ලෙස නිරපණය වෙයි. මෙය බ්‍රිතාන්‍යය සෝප් ඔපෙරාවේ සුවිශේෂ අනන්‍යතාවක් ලෙස සඳහන් කල හැකිය.

ඉහත විස්තර කළ කරුණු අනුව පෙනීයන ප්‍රධාන අදහස් දෙකක් වන්නේ සෝප් ඔපෙරාව ලොව පුරා ඉතා ජනප්‍රිය ටෙලිවිෂන් ශානරයක් බවත්, ඒවා ඉතා දීර්ඝ කාලයක් පුරා විකාශවන නාටක විශේෂයක් බවත් ය. එහෙත් මෙහිදී අප් විශේෂයෙන් හඳුනාගත යුතුව ඇත්තේ දීර්ඝ කාලයක් පුරා විකාශය වන පමණින්ම ටෙලිනාටකයක් සෝප් ඔපෙරාවක් නොවන බවයි. දීර්ඝ කාලයක් විකාශයවන ලංකාවේ සෑම ටෙලි නාටකයක්ම සෝප් ඔපෙරා ලෙස හඳුන්වා දෙමින් වැරදි අර්ථ සපයනු ලබන බව පෙනේ. එසේ නම් සෝප් යනු කවරක්ද? සෑම දීර්ඝ ටෙලි නාට්‍යයක්ම සෝප් ඔපෙරාවක්ද? සරල පිළිතුර නැත යන්නයි.

සෝප් ඔපෙරාවේ ස්වීය ලක්ෂණ

සෝප් ඔපෙරාව අනෙකුත් ටෙලිනාටක ශානරයන්ට වඩා වෙනස් ගති ලක්ෂණ පෙන්වන තවත් උප ශානරයකි. එය අන්තර්ගතයෙන්, (Content) හැඩයෙන් (Form), නිෂ්පාදන විධික්‍රමයෙන් (Production Method) හා ප්‍රේක්ෂකයා සම්බන්ධවන ස්වභාවය (Audience Participation) අනුවත් ස්වීය ලක්ෂණ පෙන්වයි. සෝප් ඔපෙරාව පිළිබඳ පර්යේෂණ ගණනාවක් සිදුකර තිබේ. ඒ පිළිබඳ විශේෂඥවරියක් වන **මේරි ඇලන් බ්‍රවුන්** විසින් සෝප් ඔපෙරාවේ ශානරීය ගති ලක්ෂණ 8 ක් හඳුනාගෙන තිබේ. (Brown,1994:48)

1. ක්‍රියාදාමවලට වඩා දෙබස් හා සංවාද, ගැටලු නිරාකරණය සහ සංවේදී සාකච්ඡා බහුල වීම.
2. අවසානයක් දැකිය නොහැකි ලෙස ඇදෙන ආඛ්‍යානයක් සහිත ප්‍රාසාංගික ව්‍යුහය.
3. පිරිමි චරිත සංවේදී හා දුර්වල චරිත ලෙස නිරූපණය වීම.
4. ස්ත්‍රී චරිත බලවත් චරිත ලෙස නිරූපනය වීම. නිවසේත් නිවසෙන් පිටත් මේ චරිත ඉතා විශාල බලයක් හිමිකර ගනී. මෙම චරිත වෙත කිසියම් වෘත්තීය පසුබිමක් සහිතව නිරූපණය වෙයි.
5. ප්‍රධාන දර්ශන තලය නිවසකි. මෙය එසේ නොමැතිව, වෙනත් පසුතලයක් භාවිතවන අවස්ථාවලදී පවා එම පසුතලය නිවසක් ලෙස ක්‍රියාකරණ ස්වභාවයක් පවතියි.
6. කොටස් අතර විඛණ්ඩනය හදිසියේ ඇතිකිරීම එකිනෙකට අසම්බන්ධ පැවත්මක් පැවතීම.
7. නාටකයේ කාලය සැබෑ කාලයට සමාන්තර ස්වභාවයකින් නිරූපණය වීම. ප්‍රේක්ෂකයන් විසින් නැරඹුවත් නැතත් සිදුවීම් ගලාගෙන යනවා යන අදහසක් ඇතිවන ලෙස සිදුවීම් නිරූපණය වීම.
8. කතාවස්තු බොහොමයක් හා චරිත බොහොමයක් වටා කතාව ගොඩ නැංවීම.

දූ දරුවෝ වැනි සෝප් ඔපෙරාවකට ඉහත ගති ලක්ෂණ ආදර්ශ කලහොත් මේරි ඇලන් බ්‍රවුන්ගේ අදහස් වටහා ගැනීමටත්, දූ දරුවෝ සෝප් ඔපෙරාවක් බව හඳුනා ගැනීම අපහසු නැත.

සංවාද

දූ දරුවෝ ඇතුළු එක දිගට විකාශනය වූ සෝප් ඔපෙරාවල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වූයේ එම නාටක සියල්ල සංවාද මත රැඳී පැවතීමයි. නාට්‍ය නැරඹීමට නොව අසා සිටීමට නිමවූ ඒවා බව පැහැදිලිව දැක ගත හැකිය. මෙම සෝප් ඔපෙරාවල ක්‍රියාකාරීත්වක් දක්නට නැත. ඇත්තේ සංවාද පමණි. එම නිසා නැරඹීමට අවශ්‍ය නැත. අසා සිටීම ප්‍රමාණවත් ය. සෝප් ඔපෙරාවක නිෂ්පාදන වියදම අඩුවීමට මෙම කරුණ ද තීරණාත්මක ලෙස බලපානු ලබයි. ක්‍රියාදාම මුල්කරගත්, සිදුවීම්වලට වඩා සංවාද මගින් විස්තර කිරීම පහසුය. ලාභදායී ය. සෝප් ඔපෙරාව රූප සහිත රෙඩියෝව Radio with Pictures. යනුවෙන් හැඳින්වෙන්නේ එබැවිනි. වෙන කාර්යයක නිරතවන අතරතුර සවන් දීමෙන් රසවිඳිය හැකි ස්වභාවය නිසාම, කම්කරුවන්, වැඩ කරන ජනතාව සහ අන්ධ ප්‍රේක්ෂකයන් අතර සෝප් ඔපෙරාව ජනප්‍රිය වන්නට ඉහත ලක්ෂණය හේතු වන බව මේරි ලිස් පවසන්නේ මේ හේතුවෙනි (Liss,1981:28).

සම්ප්‍රදායික අඛ්‍යානය ගොඩනැගී ඇත්තේ මුලක්, මැදක් සහ අගක් සහිතවයි. එහෙත් සෝප් ඔපෙරාවේ අඛ්‍යානය කිසිදා අවසන් වන්නේ නැත. අනන්තයට දිග ඇදෙන, දීර්ඝ මැදක් සහිතවයි සෝප් ඔපෙරාව ලියවෙන්නේ. අනෙක් ටෙලිනාට්‍ය ප්‍රවර්ග සුසාදිත අඛ්‍යානයක් ගොඩ නගන විට, සෝප් ඔපෙරාව ඉතා දීර්ඝ, අවසානයක් නොමැති, ලුහු කතා පුවතක් ගොඩනගයි. සෝප් ඔපෙරාව කලාත්මක ප්‍රකාශනයක් ලෙස විචාරකයන් විසින් බාර නොගැනීමට මෙම ලක්ෂණය ප්‍රබලව හේතු වෙයි.

ආඛ්‍යානය

දීර්ඝ කාලයක් පුරා විකාශනය වන කතාව නැතහොත් ඇදෙන කතාව නිසා සෝප් ඔපෙරාවේ ආඛ්‍යානය සමතලතාවයකට, නිශ්චලතාවයකට (Equilibrium) පත් නොවේ. සියලු ප්‍රශ්නවලින් තොර ස්ථාවර, සතුට පිරුණු, පවුල් ඒකකයක් සෝප් ඔපෙරා අඛ්‍යානයේ යටින් ඇඟවුන් ද, නාටකය අවසානයේදී එවැනි පවුලක් ප්‍රේක්ෂකයාට දැක ගැනීමට නොලැබෙන්නේ යැයි ජෝන් ෆිස්ක් පවසන්නේ, සෝප් ඔපෙරාවේ පවතින අනවශ්‍ය ලෙස දිග ඇදෙන කතා පුවත නිසයි. (Fisk,2003:470)

දූ දරුවෝ, සත්පුර වැසියෝ, නෑදෑයෝ වැනි සියලුම සෝප් ඔපෙරාවල කතා පුවත් දිග් ගැසෙන්නේ තර්කානුකූලව නොවේ. එම නාටක කිසිදා සුසාදිත අඛ්‍යානයක් උදෙසා ලියූ නාටක නොවේ. ඉතා දීර්ඝ මැදක් සහිත වූ එම සෝප් ඔපෙරා තුළ තීව්‍රර අවසානයක් දැකගත හකි නොවීය. කුමක් හෝ හේතුවක් මත එදිනෙදා කතා පුවත එදිරියට ඇඳුණි. අඛ්‍යානයේ සිදුවන අනවශ්‍ය ඉදිරියට ඇදීම නිසාම සෝප් ඔපෙරාව ස්වභාවිකත්වයෙන් ඈත් වීමට ද හේතු වේ. නිෂ්පාදනයට සම්බන්ධ ප්‍රායෝගික ගැටලු මතුවන විට, ඊට අනුව කතාව වෙනස්වීමට ලක්වේ. හදිසියේ චරිත මිය යෑමට ද පැහැර ගැනීම් වලට ද අතුරුදහන් වීම් වලට ද ලක්වනු දැක ගත හැකිය. නිෂ්පාදනය සමඟ දීර්ඝ කාලයක් රැඳී සිටිය නොහැකි නළු නිළියන්ගේ චරිත එසේ හදිසියේ වෙනසකට ලක්වෙනු සෝප් ඔපෙරාවේදී සිදුවේ. හදිසියේ ඉවත්ව යන, මිය යන, චරිත නැවත පැමිණිය හැකිය. මියගිය පුද්ගලයාට නැවත පණ ඒමට සෝප් ඔපෙරාවේ දී පුළුවන් බව ජෝන් ෆිස්ක් පවසයි. චරිත මිය ගිය ද ජීවත් වන චරිතයන්ගේ මතකය තුළින් ද පෙර සිටි චරිත, නැවත මතුවීමේ ඉඩක් සෝප් ඔපෙරාවේ පවතියි (Fisk,2003:470). Days of our life එවැනි චරිත හඳුන්වා දුන් එක් සෝප් ඔපෙරාවකි.

දීර්ඝ කාලයක් විකාශය වූ සෝප් ඔපෙරාවක් අවසන් වී වෙනත් සෝප් ඔපෙරාවක් ආරම්භ වූ විට, මුල් සෝප් ඔපෙරාවේ චරිත හා සිදුවීම් අලුත් සෝප් ඔපෙරාවේ හමුවන අවස්ථා ද බහුලය. 1982 දී NBC සේවය ආරම්භ කළ Texas නම් සෝප් ඔපෙරාව හඳුන්වා දෙනු ලැබුයේ ඊට ඉහත, එම නාලිකාව විසින්ම ආරම්භ කළ Another World නම් සෝප් ඔපෙරාවේ චරිතයක් මුල් කර ගනිමිණි. ඒ හැරුණු කොට විධිමත් ආරම්භයක් එම සෝප් ඔපෙරාවට නොවීය (Cantor and Pingree,1983:22).

පුරුෂ නිරූපණය

සෝප් ඔපෙරාවේ පිරිමි චරිත ඉතා සංවේදී මෙන්ම දුර්වල චරිත වෙති. එනම් පෞරුෂය බිඳ වැටුණු චරිත වේ. නිදසුනක් ලෙස දූ දරුවෝ නාටකයේ ඩයස්. සත්පුරවැසියෝහි පැතුම් යන චරිත ඉතා සංවේදී මෙන්ම දුර්වල චරිත වෙති. ඩයස් තීරණ ගැනීමට මැදිහත් වන්නේ නැත. එම පවුලේ තීරණ ගන්නේ ඩයස්ගේ බිරිඳවන කුසුමලතා විසිනි. ඩයස් කලාතුරකින් හෝ තීරණයක් ගතහොත් එය කෙළවර වන්නේ අසාර්ථකවීමෙන් හෝ විනාශයකිනි. එම පවුල පවත්වාගෙන යන්නේ ඔහුගේ බිරිඳගේ ශක්තියෙනි. විධිමත් අදායමක් සොයන්නේත්, කාර්යයන් වගකීමකින් හා විශ්වාසයකින් පවත්වාගෙන යන්නේත් ඩයස්ගේ බිරිඳයි. ඩයස්ගේ සියලු ව්‍යාපාර අසාර්ථක වෙයි. ඔහු අත තබන අත තබන ව්‍යාපාර බංකොලොත් වෙයි. '**කරෝලිස්** 'ගේ කඩකෙරුම් ඩයස්ට වඩා හොඳය.

පැතුම් සංවේදීය. අහිංසාට ආදරණීය ය. සමීපය. එහෙත් ඔහුට කිසිඳු දිනෙක තනියෙන් තීරණ ගත නොහැකිය. තීරණාත්මක ප්‍රශ්න හමුවේ ඔහු පලා යයි. තීරණ ගැනීමේදී සහ සැලසුම් කිරීමේදී, අහිංසා පැතුම්ට වඩා ඉදිරියෙන් සිටියි. ව්‍යාපාරිකයන්, ආයෝජකයන් වැනි මුදල් හදල් තිබෙන චරිත සෝප් ඔපෙරාවේ දක්නට නැති බව මින් අදහස් නොකෙරේ. එවැනි චරිත බහුල වශයෙන් සෝප් ඔපෙරාවේ හමු වේ. එහෙත් එම චරිත තීරණාත්මක චරිත වන්නේ නැත. එම චරිත පෞරුෂයක් සහිතව, බලපෑම්කාරී චරිත ලෙස සෝප් ඔපෙරාවේ මතුවන්නේ නැත. සෝප් ඔපෙරවේ පිරිමියා කොන්දක් නැති චරිතයකි. මෙවැනි පුරුෂ චරිත සෝප් ඔපෙරා ප්‍රජාවෙන් (Soap Opera Community) ඉවතට විසිවෙන චරිත වේ. සෝප් ඔපෙරාවේ පෙන්වන සමාජයට, පවුලට, පිරිමියාව වද්දා ගන්නේ, නැතහොත් බාර ගනු ලබන්නේ, ඔහු ඉතා සංවේදී, සියුම්, ස්ත්‍රී ගති ලක්ෂණ පෙන්වන අවස්ථාවේදී පමණි.(Clark,1990:34)

කාලය

සෝප් ඔපෙරාවේ කාලය සැබෑ කාලයට සමපාත හා සමීප බවක් දිස්වෙයි. එහි ක්‍රියාකාරීත්වයන් එදිනෙදා ජීවිතයේ කාලයට සමීප ලෙස ඉදිරිපත් වෙයි. මේ නිසාම එදිනෙදා ජීවිතයේ සිදුවන දේවල් පවා සෝප් ඔපෙරාවට පැමිණිය හැකිය. වෙළඳපලේ බඩු මිළ ඉහළ යන විට, එම වෙනස සෝප් ඔපෙරාවේ චරිතවලට බලපාන අයුරු, නිරූපණය විය හැක. දූ දරුවෝ නාටකය විකාශය වන සමයේදී වෙළඳපලේ බඩු මිළ ඉහළ යෑම ඩයස් ගේ හා ඩල්සිගේ පවුල් වලට එය බලපනු ලැබිනි. මුදල් එකතු කරමින් ඔවුහු ගෙදරට බඩු මුට්ටු ගෙන එති. එම කාලයේදීම වෙළඳපොළේ බඩු මිල ද ඉහළ ගිය බව අපි දනිමු. සෝප් ඔපෙරා දිනපතා රූපගතකර විකාශයකරන නාටක විශේෂයක් වීම නිසා සමාජ චලනයන් ක්ෂණිකව ග්‍රහණය කරගැනීමේ හැකියාවක් සෝප් ඔපෙරාව සතුය.

රිද්මය

සෝප් ඔපෙරාවේ ලය මන්දගාමීය. අනෙක් නාටකවලට වඩා සෝප් ඔපෙරාව මන්දගාමීය Slow Pace මරියල් කැන්ටර් හා සුසාන් පින්ග්‍රී වැන්නන් සෝප් ඔපොරාවේ මන්දගාමී ලය කාන්තා ප්‍රේක්ෂකයන් හා සම්බන්ධ කරති. නිවසේ එදිනෙදා වැඩ කරන කාන්තාවන් ඉලක්ක කරගෙන සෝප් ඔපෙරාව නිර්මාණය වන නිසා ඔවුන්ට, එම කාර්යය නිරත වන අතර තුර ටෙලි නාට්‍යයට සම්බන්ධ වියහැකි පරිදි, සෝප් ඔපෙරාවේ ලය මන්දගාමී වන බවට ඔවුහු තර්ක කරති.(Cantor and Pingree,1983:23). යුරෝපයේ හා ඇමෙරිකාවේ සෝප් ඔපෙරා වැඩිපුර විකාශය වන්නේ දහවල් කාලයේදී බව වටහා ගැනීම ඉහත තර්කය අවබෝධකර ගැනීමට අවශ්‍ය වේ. නිවසේ එදිනෙදා වැඩ කටයුතුවල නිරත වන අතර නැරඹීමට තිබෙන ශානරයක් බැවින්, ඒ හා ගැළපෙන රිද්මයකින් සෝප් ඔපෙරාව නිර්මාණය වන බව මින් අදහස් වෙයි.

මන්දගාමී ලයට හේතු සාධකවන තවත් කරුණු දෙකක් වන්නේ නිතර නිතර භාවිතවන දෙබස් හා අතීතාවර්ජනයි. මේ නිසා එකම සිදුවීම නැවත නැවතත් පෙන්වීමෙන්, සෝප් ඔපෙරාවේ ලය මන්දගාමී වෙයි. මේ හේතුව නිසාම, ප්‍රේක්ෂකයාට සෝප් ඔපෙරාව අඛණ්ඩව නැරඹීමට අවශ්‍ය නැත. කොටස් ගණනාවක් නැරඹීමට නොහැකි වුව ද නාටකය සමඟ නැවත සම්බන්ධ වීමේ අපහසුතාවයක් ප්‍රේක්ෂකයාට පැන නගින්නේ නැත්තේ, යළි, යළි පෙන්වන අතීතාවර්ජන මගින් අත හැරුණු සිදුවීම් නැවත දැක ගැනීමේ අවස්ථාව උදාවන බැවිණි.

දූ දරුවෝ, සත්පුර වැසියෝ, නෑදෑයෝ, මහ ගෙදර වැනි සෝප් ඔපෙරා වේගවත් ලයක් දැක්වූ නාටක නොවේ. ඇතැම් සෝප් ඔපෙරාවලදී මන්දගාමී ලය වෙනස් විය හැකිය. සියලුම සෝප් ඔපෙරාවල වේගය එක සමාන වන බවක් මින් අදහස් නොවේ.

වෙනත් මාධ්‍ය

සෝප් ඔපෙරා සඳහාම වෙන්වුණු සඟරා හා පුවත්පත් ඒ ඒ සතියේ විකාශය වූ සෝප් ඔපෙරාව පිළිබඳ තොරතුරු ගෙන එන බැවින් මග හැරෙන කොටස් පිළිබඳ තොරතුරු ප්‍රේක්ෂකයාට පුවත්පත් හරහා දැන ගැනීමට අවකාශ සැලසේ. කථාංග මගහැරීම නිසා රසවින්දනයට ඇතිවන බාධාවන් සෝප් ඔපෙරා සඳහා ම වෙන්වුණු පුවත්පත් විසින් මග හරිනු ලබයි. සෝප් ඔපෙරා ප්‍රේක්ෂකයා, මග හැරෙන කථාංග පිළිබඳ තොරතුරු, සිය මිතුරන්ගෙන් දැන ගනී. මෙසේ සිදු වන්නේ සෝප් ඔපෙරා සඳහා ම වෙන්වුණු ප්‍රේක්ෂක පිරිසක් සිටින බැවිනි. විකාශයට පසු විශාල වශයෙන් සමාජ කතිකා ඇති කිරීමට හැකි ශානරයකි සෝප් ඔපෙරාව. දිනපතා සෝප් ඔපෙරා නරඹන සමාජ උප කණ්ඩායම් සිටින බව විද්වතුන්ගේ මතයයි. (CantorandPingree,(1983),Brunsdon(1997), Modleski,(1982). දිනපතා විකාශය වූ සෝප් ඔපෙරාවන් පිළිබඳ සංවාද ඇතිවන බැවින් මග හැරුණු කථාංග පිළිබඳ ව වටහා ගැනීමට ප්‍රේක්ෂකයාට අපහසු නැත. සෝප් ඔපෙරාවේ මෙම විශේෂ ප්‍රේක්ෂකත්වය පිළිබඳව විවිධ විද්වතුන්ගේ විශේෂ අවධානයක් ලක්ව තිබේ.

ස්ත්‍රී නිරූපණය

සෝප් ඔපෙරාවේ ස්ත්‍රිය අතිශයින්ම බලවත්වන්නා සේම බලපෑම්කාරී ය. මෙය අනෙක් ශානරවලින් සෝප් ඔපෙරාව වෙනස්වන තීරණාත්මක කරුණකි. පවුලේ හෝ රාජකාරී ස්ථානයේ හෝ වෙනත් තැනක වැදගත්ම තීරණ ගන්නේ ස්ත්‍රියයි. නාටකයේ නිරූපණය වන්නේ පවුලක් නම් එම පවුලේ බලවත් ම චරිතය, පවුල මෙහෙයවන චරිතය ස්ත්‍රියයි. එසේම ඇයට අනෙක් අයගේ ජීවිතවලට තීරණාත්මක ලෙස බලපෑම් කර ඔවුන්ගේ ජීවිත වෙනස් කළ හැකිය.

දූ දරුවෝ නාටකයේ ප්‍රධාන චරිතය **ඩල්සි** ය. එම පවුලේ සෑම දෙනාගේම ජීවිතය තීරණය කරන තීරණාත්මක චරිතය ඇයයි. ඩයස්ගේ පවුලේ තීරණ ගනු ලබන්නේ ද ඩයස්ගේ බිරිඳ විසිනි. එම පවුල පවත්වාගෙන යන්නේ ඔහුගේ බිරිඳගේ ශක්තියෙනි. සෝප් ඔපෙරාවේ කාර්යයන් සාර්ථක වන්නේ ස්ත්‍රියගේ මැදිහත් වීමෙනි. පුරුෂයාට තැනක් නැත. සෝප් ඔපෙරාවේ පවුල මෙහෙයවන්නේත්, වෙනස් කරන්නේත්, නැවත පිහිටවන්නේත් ස්ත්‍රිය විසිනි. මහගෙදර නාටකයේ සියලු පවුල් මෙහෙයවන්නේ **තුල්සිය**. **තුල්සි** බලපෑම්කාරීය. නිවසේ යතුර, පාලනය, මෙහෙයවීම ඇත්තේ ඇය අතෙහිය. ඒ අනුව සෝප් ඔපෙරාවේ ස්ත්‍රිය නිරූපණය වන්නේ ඉතා බලවත්, තීරණ ගැනීමේ හැකියාව ඇති, බලපෑම්කාරී, ශක්තිමත් ගැහැණියක් ලෙසයි. මෙම තත්ත්වය වෙනත් ටෙලිවිෂන් නාටක ශානරයන් සමඟ සැසඳීමෙන් හඳුනාගැනීම පහසු ය. ගම්පෙරළිය හෝ මවකගේ ගීතය වැනි ටෙලි නාටකවල ප්‍රධාන චරිත ස්ත්‍රීන් වුවත් ඔවුහු තීරණාත්මක හෝ බලවත් ලෙස අනෙක් අයගේ ජීවිතවලට බලපාන සහ අනෙක් ජීවිත මෙහෙයවන චරිත නොවෙති. එම නාටකවල ස්ත්‍රිය පුරුෂයාට යටත්ය. නැතහොත් පුරුෂයාට සහයවන චරිතයක් මිස, ස්වාධීන ගතිලක්ෂණ පෙන්වන, ශක්තිමත් සහ බලපෑම්කාරී චරිත නොවේ. එහෙත් සෝප් ඔපෙරාවේ ස්ත්‍රිය සියල්ල තීරණය කරයි, මෙහෙයවයි, හසුරුවයි. ඇයගේ මැදිහත්වීමක් නොමැතිව සෝප් ඔපෙරාව තුළ කිසිවක් සිදු නොවේ.

ස්ත්‍රී චරිත නිරූපණයේදී එම චරිතවලට මේ තරම් බලයක් හා ස්වාධීන බවක් සෝප් ඔපෙරාවේ හැර වෙනත් ටෙලි නාටක ශානරවල දැකගැනීමට නොහැකි ය. දූ දරුවෝ හි **ඩල්සි**, **ඩයස්ගේ බිරිඳ කුසුමලතා**, මහගෙදර සෝප් ඔපෙරාවේ **තුල්සි** යන චරිත මේ සඳහා නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. **ක්‍රිස්ටීන් ජෙරට්** පෙන්වා දෙන්නේ අනෙක් ශානරයන්ට වඩා සොප් ඔපෙරා ශානරය විසින් වැඩිහිටි, තලත්තෑනි ගැහැණු චරිත ප්‍රධාන චරිත ලෙස ඉදිරියට ගන්නා බවයි. ආච්චි හෝ තලත්තෑනි ස්ත්‍රී චරිත, බලපෑම්කාරී චරිත ලෙස ඉදිරියට නිරූපණය කරන බවය (Geraghty,1991:17). රිචර් ඩයර් මේ සම්බන්ධව පවසන්නේ අනෙක් නාටකවලට වඩා සෝප් ඔපෙරාව විවිධ වයස් කණ්ඩායම්වලට අයත් චරිත සහ හුරුපුරුදු වර්ග චරිත (Streotype) ඉතා බලවත් ආකාරයෙන් නිරූපණය කරන බවයි. අත්තම්මාගේ චරිතය, ආකර්ශණීය පෙනුමකින් යුතු පරිනත, වැඩිහිටි ස්ත්‍රීය, චපල තරුණ ස්ත්‍රිය බ්‍රිතාන්‍ය සෝප් ඔපෙරාවේ බහුලව හමුවන බව ඔහු වැඩිදුරටත් පවසය. (Dyer,1981:33). ලාංකික සෝප් ඔපෙරාවේත් අත්තම්මාගේ චරිතය, පරිනත, වැඩිහිටි ස්ත්‍රීය, ඉදිරියට පැමිණ ඇත.

අවිවාහක ස්වාධීන ස්ත්‍රිය ද දූදරුවෝ සෝප් ඔපෙරාවේ දීප්ති ගේ චරිතය තුළින් නිරූපණය වන්නේයැයි කිවහැකිය. දූදරුවෝ විකාශය වූ කාලයට සාපේක්ෂව ඇය වැලි බයිසිකලයක් පදින, නිදහසේ සැරිසරන, ස්වාධීන ගතිලක්ෂණ පෙන්වූ අවිවාහක ස්ත්‍රියකි. එම භූමිකාව එම යුගයට සාපේක්ෂව ඉදිරියෙන් තිබූ භූමිකාවකි.

පසුතලය

සෝප් ඔපෙරාව හඳුනාගත හැකි අනෙක් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ පසුතලයයි (Setting). බොහෝ විට සෝප් ඔපෙරාව ප්‍රධාන පසුතලය ලෙස තෝරාගන්නේ නිවසකි. දූ දරුවෝ, සත්පුර වැසියෝ, නෑදෑයෝ, මහගෙදර සෝප් සිහියට නැගීමෙන් මෙම කරුණ වටහා ගැනීමට පහසුය. වෙනත් පසුතලයක් තෝරාගන්නේ නම් විශේෂයෙන් කාර්යාලයීය පසුතලයක් වැනි ස්ථානයක් තෝරා ගත හොත්, එය ද නිවසක් ලෙසම ක්‍රියත්මක වනු දැක ගැනීමට හැකිය. එවිට කාර්යාලයීය පසුතලය ද නිවසක් ලෙසම ක්‍රියාත්මක වෙයි.

නිවස ප්‍රධාන පසුතලය වනනේය යන්නෙන් අදහස් කෙරන්නේ එයට පරිබාහිර ස්ථාන රූපගත කිරීම සඳහා භාවිත නොවන්නේ ය යන්න නොවේ. හැමවිටම ප්‍රධාන පසුතලය නිවසක් වන බවයි. සෝප් ඔපෙරාවේ තීරණාත්මක සිදුවීම් සිදුවන්නේ නිවස තුළයි. ප්‍රධාන පසුතලය නිවසක් නොවන විටකදී නම් බොහෝ විට එය කිසියම් ප්‍රජාවන් වෙසෙන වීදියක් හෝ කුඩා ප්‍රදේශයක් හෝ රාජකාරී ස්ථානයක් තෝරා ගැනේ. කුමන ස්ථානයක් පසුතලය ලෙස තෝරා ගත්ත ද එම අවකාශය තුළ සමීපව සිටින පුද්ගලයන් පිරිසක් ලෙස අදාල චරිත නිරූපණය වෙයි.

ප්‍රකට සෝප් ඔපෙරාවක්වන Neighbours හි පසුතලය වන්නේ ඔස්ට්‍රේලියාවේ Ramsay Street පෙදෙසයි. East Enders නාටකයේ පසුතලය පෙරදිග ලන්ඩනය අවට Walford නම් ප්‍රබන්ධනාත්මක අවකාශය ප්‍රධාන පසුතලය වෙයි. ආඛ්‍යානයේ සිදුවීම්, ප්‍රධාන පසුතලයට පිටින් සිදුවන්නේ ඉතා කලාතුරකිනි. සෝප් ඔපෙරාවේ නිරූපණයවන චරිත ජීවත්වන පරිසරය හා ගැවසෙන පරිසරය මෙම පෙදෙසය යන අදහස නිතර නරඹන ප්‍රේක්ෂකයාට, නිතර ඒත්තු ගැන්වෙන ලෙස නිරූපණය කිරීම මෙහි අරමුණයි.

පැහැදිලිව හඳුනාගතහැකි ඉතා සමීප ප්‍රජාවක් හෝ සාමාජික පිරිසක් නිරූපණය කිරීම සෝප් ඔපෙරාවේ ආකර්ෂණයට ප්‍රධාන හේතුවක් බව පවසේ (Alexander and Consens,2004:26). දීර්ඝ කාලයක් විකාශයවන නිසා ප්‍රේක්ෂකයන්ට මෙම පරිසරයන් හා ප්‍රජාවන් ඉතා හුරුපුරුදු හා සමීප ලෙස දැනේ. සෝප් ඔපෙරාවේ පසුතලය පිළිබඳ අදහස් දක්වන **ක්‍රිස්ටීන් ජෙරට්** දීර්ඝ කාලයක් පුරා විකාශයවන සෝප් ඔපෙරාවේ පසුතලය, පරිසරය, සමීප හා සතුට උපදවන තැනක් ලෙස හැඟී යන පරිදි නිරූපණය කළයුතු බව පවසයි. ඉතා සමීප, හුරු පුරුදු පරිසරයක් සහ පුද්ගලයන් හඳුනා ගැනීමට හැකිවීම, සෝප් ඔපෙරා ප්‍රේක්ෂකයන් ලබන එක් වින්දනයක් බව ඇය වැඩි දුරටත් කියා සිටියි (Geraghty,1991:26).

විවිධ කතා

සෝප් ඔපෙරාවේ ආඛ්‍යානය වස්තු බීජයන් කිහිපයක් හා චරිත කිහිපයක් වටා ගොඩ නැගෙයි. බහු වස්තු බීජ මුල් කර ගැනීම සෝප් ඔපෙරාවේ විශේෂ ලක්ෂණයකි. එක් කතාංගයකදී Episode නැතහොත් එක් දිනක එක් කොටසකදී සාමාන්‍යයෙන් වස්තුබීජ තුනක් වටා අඛ්‍යානය ගොඩ නැගීම, දූ දරුවෝ, සත්පුර වැසියෝ, නෑදෑයෝ වැනි ලාංකික සෝප් ඔපෙරාවේ සිදුවිය. **කුසුමලතාගේ පවුලේ , සුධර්මාගේ පවුලේ ,නන්දනීගේ පවුලේ, සහ ඩල්සිගේ පවුලේ** ගැටලුවක් යන ප්‍රධාන ගැටලු හතරක් හෝ තුනක් සෑම කොටසකම දිග හැරෙයි. ඒ අනුව පැය භාගයක කොටසක් තුළ වස්තු බීජ, ගැටලු

තුනක් හෝ හතරක් සාකච්ඡාවට ගැනේ. එක් ගැටලුවක් විසඳෙන විට තවත් ගැටලුවක් පැන නැගෙයි. අවසානයක් හමු නොවෙයි. ගැටලුවෙන් ගැටලුවට අඛ්‍යානය ඉදිරියට ඇදෙයි.(Fisk,2003:472).

දෘශ්‍ය විලාසය

සෝප් ඔපෙරාවේ දෘශ්‍ය විලාසය ඉතා සරලය. සංකීර්ණ රූප රචනා නැත. ඒ වෙනුවට ඇත්තේ සමීප රූප හා මධ්‍යම සමීප රූපවලින් සෑදුනු ඉතා සරල රූපාවලියකි. සංගීතය භාවිත වන්නේ අවම වශයෙනි. රූප සම්බන්ධ වන්නේ සරල ඡේදනය මගිනි. ඉහත කී සරල දෘශ්‍යම ය විලාසය දූ දරුවෝ, සත්පුර වැසියෝ, නෑදෑයෝ, වැනි සෝප් ඔපෙරාවල ද දැක ගැනීමට හැකි විය. ඉන්දියානු සෝප් ඔපෙරාව ඉහත කී සරලත්වය වෙනස් කර තිබේ. වේගවත් චලනයන් සහිත කැමරා භාවිතාව විශේෂයෙන් යුමුහු කිරීම Zoom , එක මත එක වැටෙන වේගවත් ඡේදනය, අධික සංගීත භාවිතය වැනි ලක්ෂණ ඇතුලත් කරගෙන තිබේ. එය ඉන්දියානුකරණය වූ සෝප් ඔපෙරාවේ ස්වරූපයයි. සෝප් ඔපෙරාවේ සමීප රූප භාවිතය පිළිබඳ අදහස් දක්වන ටානියා මොඩලිස්කි එම භාවිතය පිළිබඳ සිත් ඇදගන්නා අදහසක් ඉදිරිපත් කරයි. ඇය පවසන්නේ හේතු කිහිපයක් මත සමීප රූපය ස්ත්‍රී සංස්කෘතිය නියෝජනය කරණ ඉතා වැදගත් විධියක් බවයි. **මිනිසුන්ව** කියවීමේ ස්ත්‍රීන්ට පවතින හැකියාවට සමීප රූපය **විසින් පුහුණුවක් ලබාදෙන** බව ඇය **ඉදිරිපත් කරන එක් තර්කයකි. කියනු ලබන දෙය හා අදහස් කරණු ලබන දේ අතර පවතින පරතරය වටහා ගැනීම සඳහා ස්ත්‍රීන්ට පවතින හැකියාව පාවිච්චිකරනු ලබන ක්‍රමයක් ලෙසත්, ඇය සමීප රූපය හඳුන්වා දෙයි. තිරය මත පෙනෙන චරිතවල ජීවිතයන්ට සම්බන්ධවීමට,** සමීපවීමට ස්ත්‍රියට ඇති ආශාව ධෛර්මත් කිරීමට සමීප රූපයට හැකියාවක් පවතින බවත් ඇය වැඩි දුරටත් කියා සිටියි. (Modleski,1982:99 100) කෙසේ නමුත් ලංකාවේ සෝප් ඔපෙරාව වැඩි වශයෙන් භාවිත කළේ සමීප රූපය නොව මධ්‍යම රූපය හා මධ්‍යම සමීප රූපයයි.

පවුල හා පවුලේ සාමාජිකයන් සෝප් ඔපෙරාවට තීරණාත්මක ය. පවුලේ කතා රැගත් ටෙලි නාටක ලෙස මේවා බොහෝ විට හඳුන්වන්නේ එබැවිනි. එකිනෙකාට සමීප, හොඳින් හඳුනන, එකිනෙකාගේ සුව දුක් සොයා බලන, එකට වැඩ කරන පිරිසක් හෝ සාමාජිකයන් පිරිසක්, නිෂ්චිත ප්‍රජාවක්, බොහෝ විට පවුලක් සෝප් ඔපෙරාවේ චරිත බවට පත්වෙති. මෙම ලක්ෂණය නිසාම විචාරකයන් විසින් නිතරම සෝප් ඔපෙරාව විවේචනයට ලක්වේ. සෝප් ඔපෙරාව නූතන සමාජ ජීවිතය නියෝජනය නොකරන්නේ ය පමණක් නොව සෝප් ඔපෙරාව යථාර්ථවාදී නොවන්නේ ය යනුවෙන් විචාරකයන් තර්ක කෙරෙන්නේ එබැවිනි.

සෝප් ඔපෙරාව හා පවුල

පවුලේ හෝ ප්‍රජාවගේ ප්‍රධාන චරිතය බවට පත්වන්නේ ගැහැනියයි. පවුලේ සාම්ප්‍රදායික භූමිකාව බලපෑම්කාරී ලෙස සෝප් ඔපෙරාවේ නියෝජනය වෙයි. ඉතා ශක්තිමත්, **මව්පාර්ෂවීය** කාන්තා චරිතයක් හෝ එවැනි චරිත කිහිපයක් පවුලේ සියල්ල මෙයෙහවයි. මහගෙදර තුල්සි, දූ දරුවෝ සුදු ආච්චි, හා මේ සඳහා නිදසුන් ලෙස පෙන්වාදීමට පුළුවන. නිතර දැකිය හැකි චරිත වර්ග කිහිපයක් ලාංකික සෝප් ඔපෙරාවේදී හමුවෙයි ඒවා නම් අත්තම්මා, විවාහක මැදිවියේ ජෝඩු, විවාහ වීමට ආසන්න තරුණ පෙම්වතුන්, එසේ නිතර හමුවෙන චරිත වෙති. කතා පුවත ඉදිරියට යන්නේ ඉහත දැක්වූ ප්‍රධාන චරිත වර්ග කිහිපයෙනි.

වෙළඳ දැන්වීම් ඇතුලු, බොහොමයක් ටෙලිවිෂන් ශානරවල පවුල නැමැති ඒකකය නියෝජනය වන්නේ දෙමව්පියන් හා දරුවන් දෙදෙනෙකු සිටින (බොහෝ විට දියණිය හා පුතා) සුවපහසු ඒකකයක් ලෙසයි. මීට වෙනස්ව සෝප් ඔපෙරාව පවුල නැමති ඒකකය ම නියෝජනය කරන්නේ, ප්‍රේක්ෂකයාට ප්‍රශ්න කල හැකි, අනාවරණය කරගත හැක, ඒකකයක් යන අදහස දක්වන අකාරයටයි.

උත්සව

උත්සව හා පවුලේ උත්කර්ෂවත් අවස්ථා, විශේෂයෙන් විවාහ මංගල්‍යයන් වැනි අලංකාර අවස්ථා බහුල වශයෙන් සෝප් ඔපෙරාවේ හමුවේ. විවාහ මංගල්‍යය වැනි අවස්ථා අනෙක් ටෙලිවිෂන් ශානරවල යොදාගනු ලබන්නේ සතුට දැනවීමට හෝ ධනාත්මක අවස්ථාවක් ලෙසයි. විශේෂයෙන් ආඛ්‍යානයේ අවසන් කිරීමේදී බොහෝ ටෙලිනාටකවල මංගල උත්සව හෝ වෙනත් ජයග්‍රාහී හෝ සුභදායක අවස්ථාවන් බහුල වශයෙන් යොදා ගනී. එහෙත් සෝප් ඔපෙරාව මංගල්‍යයන් යොදාගන්නේ ගැටුම්කාරී අවස්ථාවන් ගොඩනගාගැනීම සඳහාය. බොහෝ ගැටලු මතුවන්නේ, නොදන්නා දේ හෙළිවන්නේ, අනියම් සම්බන්ධතා හෙළිවන්නේ, පිරිමියා අපහසුතාවයට පත්වන්නේ, සෝප් ඔපෙරාවල දී විවාහ මංගල්‍යයකදීය. ඒ අනුව මංගල්‍යය ආඛ්‍යානය තවත් ඉදිරියට ගෙන යන අවස්ථාවක් බවට සෝප් ඔපෙරාවේදී පත්වෙයි.

තේමා

ලොව පුරා නිර්මාණය වන සෝප් ඔපෙරා විශාල ප්‍රමාණයක තේමාවන්වල පොදු බවක් දැකිය හැකිය. සෝප් ඔපෙරාවේ නිරන්තර හමුවන තේමාවන් කිහිපයක් ඒටාල් ස්ටුවර් හඳුනා ගනී. ආදරය, ගැටුම, රහස් හා විශ්වාසවන්තභාවය, අසනීප තත්ත්ව හා තුවාල, පවුලේ ඇති රහස්, සැලසුම් වැරදීයාම. ස්ටුවර්ට්ට අනුව නිතරම හමුවන තේමාවන් වෙති.(Stewart,2001:15).

හඬකැවූ ඉන්දියානු සෝප් ඔපෙරාව තුළ තේමාවන්ට ආසන්න තේමා හමුවුන ද, ලංකාවේ සෝප් ඔපෙරාවේ මෙම තේමාවන් වැඩි වශයෙන් දක්නට නොවීය. ඒ වෙනුවට අවිනිශ්චිත බව හා අනාරක්ෂිත බව ප්‍රබලම තේමාව ලෙස බොහෝමයක් ලාංකික සෝප් ඔපෙරාවට විෂය වූ බව දැකගත හැකිය. දීර්ඝ කාලයක් පුරා යුද්ධයෙන් පීඩා වින්ද ජනතාවක් ලෙස සමාජයේ පැවති අවිනිෂ්චිතතාව හා අනාරක්ෂිත බව අනුග්‍රාහකයන්ගේ අවශ්‍යතාවයන් සමඟ මැනවින් ගළපාගෙන ලාංකික සෝප් ඔපෙරාව රචනා විය. අනාරක්ෂිත අවිනිෂ්චිත සමාජයක රක්ෂණය හොඳින් තහවුරු කළ හැකිය. නිවසෙන් එළියට බසින පුද්ගලයකු නැවත ගෙදර ඒදෝ නොඒදෝ අවිනිශ්චිතතාවකින් වැසී තිබුණ ශ්‍රී ලාංකික සමාජයට, රක්ෂණ අලෙවි කිරීම සඳහා ලංකික සෝප් ඔපෙරාව පෙනී සිටියේ යැයි පැවසිය හැකිය. විය හැකි පරිදිම සෝප් ඔපෙරාව වෙළඳ අවශ්‍යතාවකි. ලංකික සෝප් ඔපෙරාවේ සිදු වූයේ ද, වර්තමානයේ සිදුවන්නේ ද, විය හැක්කේ ද, එම වෙළඳ අවශ්‍යතාව ඉටුකිරීමයි.

සෝප් ඔපෙරාව හා ගෘහස්ත නවකතාව

සෝප් ඔපෙරාව බිහිවීම කෙරෙහි සාහිත්‍යයේ ද බලපෑමක් ඇත. ඉතා ඉහළ සාර්ථකත්වයක් ඉසිලූ ඉංග්‍රීසි ගෘහසත නවකතාව (Domestic Novel) ඒ සඳහා තීරණාත්මක ලෙස බලපා තිබෙන බව ස්ටෙඩ්මන් සහ වයිබල් යන විද්වත්හු දෙදෙනාම පවසති (Stedman,1977:08),(Weibel,1977:04). ගුවන්විදුලි සෝප් ඔපෙරාව නිර්මාණය කිරීමේදී ද රචකයන් විසින් ඉංග්‍රීසි ගෘහස්ථ නවකතාවෙන් විශාල අභාසයක් ලබා තිබේ. 18 වන සියවසේ බිහි වූ සංවේදී ඉංග්‍රීසි නවකතාව (English Sentimental Novel) සහ සෝප් ඔපෙරාව අතර පොදු ලක්ෂණ රාශියක් ඇති බව ජෝන් කීලර් පෙන්වා දෙයි (Keeler,1980:20). ප්‍රථම නූතන නවකතාව ලෙස ඇතැම් අය විසින් පිළිගනු ලබන 1740 දී නිර්මාණය වූ Pamela නවකතාව මෙන්ම ඊට පසු බිහිවුනු බොහෝ නවකතාවන් සඳහා තේමා වූයේ සාමාන්‍ය මිනිසුන් හා ඔවුන් එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ගැටළුයි.

ගුවන් විදුලිය මෙන්ම ඊට පසු බිහිවූ ටෙලිවිෂන් සෝප් ඔපෙරාව ද තේමා කොට ගන්නේ සාමාන්‍ය පන්තියේ මිනිසුන් ය. ඉංග්‍රීසි ගෘහස්ථ නවකතාවන් ඇසුරින් බිහි වූ, දිවා කාලයේ විකාශය වූ ගුවන් විදුලි සෝප් ඔපෙරාවන් ද, ඒ ඇසුරෙන් බිහි වූ ටෙලිවිෂන් සෝප් ඔපෙරාවන් ද ප්‍රධාන වශයෙන් ඉලක්ක කරගන්තේ කාන්තා ප්‍රේක්ෂකයාවයි. මෙම කතා පුවත් සියල්ල තත්කාලීන කතා පුවත් වූ අතර ඒවයේ ප්‍රධාන පසුතලය වූයේ නිවසයි. 19 වන සියවසේ ගෘහස්ත නවකතා වැඩි වශයෙන් ලියනු ලැබූවේ කාන්තාවන් විසින් වූ අතර, දිවාකාලයේ විකාශය වූ ගුවන් විදුලි නාටක බොහෝමයක් ලියනු ලැබුවේ ද කාන්තාවන් වීම විශේෂත්වයකි. සෝප් ඔපෙරාව ටෙලිවිෂනයට මාරු වීමේදී මේ ගතිලක්ෂණ බහුතරයක් ටෙලිවිෂන් සෝප් ඔපෙරාව ද උරාගන්නේ ඉතා පහසුවෙනි. දිවා කාලයේ විකාශය වූ රේඩියෝ සෝප් ඔපෙරාව සඳහා ප්‍රධාන වශයෙන්ම තුන් ආකාරයක කතා පුවත් විෂය කරගත් බවක් පෙනෙයි.

1. තනිව ජීවත්වන ගැහැනිය පිළිබඳ කතා.
2. විවාහයේ ගැටලු පදනම් කරගත් කතා.
3. පවුලේ කතා.

19 වන සියවසේ ඉංග්‍රීසි නවකතාවේත්, ගුවන් විදුලි නාටකයේත්, තනි ගැහැනිය පිළිබඳ කතාව බහුලව දැකගත හැකි වුවත්, එය වැඩිවශයෙන් ටෙලිවිෂන් සෝප් ඔපෙරාවට පැමිණ නැත. පිරිමි සහකරුවෙකු නැතිව තනිවම ජීවිතය ජයගන්නා ආකාරය පිළිබඳවයි තනි ගැහැනිය පිළිබඳ කතාවෙන් වැඩි වශයෙන් කියවී ඇත්තේ.

ටෙලිවිෂන් සෝප් ඔපෙරාව කැමැත්තෙන් වැළඳ ගන්තේ පවුලේ කතාවයි. විස්තෘත පවුල් දෙකක් හෝ තුනක් සහිතව, ගොඩ නැගෙන අඛ්‍යානය ඔවුන් අතර ඇති සම්බන්ධතා හා ගැටලු සාකච්ඡාවට ගනී. විවාහය සම්බන්ධ ගැටලු, සහකරුවෙකු හෝ සකකාරියක් සොයා ගැනීමේ ප්‍රශ්නය, පවුලේ කතාවල ප්‍රධානත ම ගැටලු ලෙස නිරූපණය වෙයි.

අවිවාහක කාන්තාව යොදා ගනිමින් ලියවුනු සෝප් ඔපෙරා තිබුන ද ඒවායේ ද ඇයගේ පවුලේ අනෙක් සාමාජිකයන්, ප්‍රේමවන්තයන් හා අනියම් බිරින්දෑවරුන් පිළිබඳ සම්බන්ධතා හා ගැටලු ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ගැනෙන ආකාරයටයි එවැනි සෝප් ඔපෙරා ලියවෙන්නේ. කෙසේ නමුත් කාලයත්

සමඟ සෝප් ඔපෙරාව විශාල වෙනස්කම් රැසකට ලක් වී තිබේ. රටින් රටට එය සුවිශේෂ ගතිලක්ෂණ වෙනස්කම් උරුමකරගෙන තිබෙන බව පැහැදිලිය. මේ සියලු වෙනස්කම් යටතේ වුව ද ටෙලිවිෂන් සෝප් ඔපෙරාව ගෘහස්ථ නවකතාවට ඇති සම්බන්ධය තවමත් අත හැර නැත (Cantor and Pingree,1983:22)

ස්ත්‍රිය, පුරුෂයා,සතුට සහ සෝප් ඔපෙරාව
Woman, Man, Pleasure and Soap Opera

සොප් ඔපෙරාව ස්ත්‍රී චරිත, එදිනෙදා ජීවිතයේ ගැටලුවලට මුහුණ දෙන ආකාරය තේමා කොට ගනී. විවිධ ප්‍රේක්ෂකයන් විසින් සෝප් ඔපෙරාව නරඹනු ලැබුවත් සෝප් ඔපෙරාව ඍජුව ම ඉලක්ක කර ගන්නේ කාන්තා ප්‍රේක්ෂකයන්ව බවයි සෝප් ඔපෙරාව පිළිබඳ අදහස් දක්වන විද්වතුන් ගේ මතය වන්නේ. ප්‍රේක්ෂකයාගේ ස්ත්‍රී පුරුෂභාවය සෝප් ඔපෙරා පෙළ තුළ ම අන්තර්ගත වන බවයි. ඔවුන්ගේ මතය (Geraghty,1991:57), (Brunson,1997). මේ නිසාම කාන්තා ප්‍රේක්ෂකයන් සෝප් ඔපෙරා නැරඹීමෙන් විශේෂ වින්දනයක් ලබන බවයි ඔවුන් වැඩි දුරටත් තර්ක කරන්නේ.

සෝප් ඔපෙරාව අදහස් ප්‍රකාශ කරන්නේ රූපයෙන් නොව සංවාද තුළින් නිසාම, එය ටෙලිවිෂන් නාටකයට වඩා සමීප වන්නේ ගුවන් විදුලි මාධ්‍යයට බව අපි දනිමු. සෝප් ඔපෙරා නැරඹීමට ප්‍රේක්ෂකයන් වැඩි කැමැත්තක් දක්වන්නේ ද සංවාද බහුල නිසයි. සෝප් ඔපෙරාවේ සංවාද වටා ප්‍රේක්ෂකයන්, විශේෂයෙන් කාන්තා ප්‍රේක්ෂකයන් සුවිශේෂ සම්බන්ධතා පවත්වන බව කියවේ (Hobson,1982:17).

කාන්තාවෝ තම ජීවිත ගැටලු සහ අනෙක් අයගේ ජීවිතවල ගැටලු පිළිබඳවත්, ඔවුනොවුන්ගේ ආකල්ප පිළිබඳවත්, වක්‍ර මාර්ගයෙන් කතා කිරීම, සාකච්ඡා කිරීම සඳහා සෝප් ඔපෙරාවේ කතා සහ සංවාද භාවිතයට ගනිති. මින් අදහස් වන්නේ දෙබස්වලින් සහ කතා පුවතෙන් කියවෙන දේ පිළිබඳව කාන්තාවන් විසින් ඊට පසු රැකියා ස්ථානයේ හෝ නිවසේ හෝ සෝප් ඔපෙරාව මතු කළ ගැටලු කාන්තාවන් විසින් සාකච්ඡාවට ගන්නා බව මින් අදහස් කෙරේ. විකාශයට පසුව සෝප් ඔපෙරාව සාකච්ඡාවන්, සංවාද හා විවිධ කතිකා ඇති කිරීමට කාන්තාවන් මෙහෙයවන බව **හොබ්සන්** පවසන්නේ. ඒ අනුවයි (Hobson,1982:17).

සමාජයට අදාල දෘෂ්ටිවාදාත්මක හා ආචාරවිද්‍යාත්මක රාමුව සැකසී තිබෙන්නේ ඕපාදූප මත බවත්, සෝප් ඔපෙරාව විසින් ඕපාදූප මුල්කරගත් කතිකාවන් ඇති කරන බවත්, ඒ සඳහා මුල් වන්නේ සෝප් ඔපෙරාවේ දෙබස් බවත් **වැලට් බ්‍රන්සන්ගේ** අදහසය(Brunson,2000: 28). දෙබස් අධික සෝප් ඔපෙරාව මගින් පුද්ගල හැසිරීම් හා ආකල්ප හෙළිදරව් කරමින් එය පරීක්ෂාවට ලක්කෙරෙයි. ක්‍රියාදාම සහිත අනෙක් ටෙලි නාටක ප්‍රවර්ග වලට වඩා, සෝප් ඔපෙරාව ප්‍රේක්ෂකයන් සමඟ පවත්වන එක් විශේෂ සම්බන්ධයකි. ඉතා රහස්‍ය හා සංවේදී කතා බහ, ගැටලු විසඳීම, වැනි දේ සෝප් ඔපෙරා ආඛ්‍යානයේ බහුලව දැකගත හැකි ලක්ෂණ නිසා, සෝප් ඔපෙරාවේ ස්ත්‍රී චරිත මේවා හා නිතර නිතර සම්බන්ධ වෙති.

සැබෑ ජීවිතයේ සිදුවීම්වලට සමාන වේගයකින් දිග හැරෙන සෝප් ඔපෙරාවේ කතාංග මගින් ප්‍රේක්ෂකයා තුළත්, ඕපාදූප පිළිබඳ උනන්දුවක් ඇති කරනු ලබයි. මේ මන්දගාමී වේගය, කතාපුවත හා චරිත පිළිබඳව අනාවැකි පලකිරීමටත්, ඒ පිළිබඳ තීරණවලට එළඹීමේ පහසුවත්, ප්‍රේක්ෂකයන්ට ලබා

දෙන බව **විවියන් ක්ලාර්ක් සහ ජේම්ස් බේකර්** තර්ක කරති (Clark,1990:34), (Baker,1989:06). පවුලක් තුළ හෝ නිශ්චිත ප්‍රජාවක් තුළ සෑහෙන කාලයක් පුරා, මන්දගාමී වේගයකින් දිග හැරෙන, හැඟීම්බර, ගැටුම්වලින් පිරිණු, කුමන්ත්‍රණ හා කුතුහලයෙන් යුත්, කතා පුවත් හා වටපිටාව විසින් ප්‍රේක්ෂකයා තුළ, සෝප් ඔපෙරාව තමාගේ එදිනෙදා ජීවිතයේ වේගයට සමීප, හුරු පුරුදු බවක් ඇතිකරයි (McCarthy,2001:47).

සෝප් ඔපෙරාවේ චරිත එකිනෙකා පිළිබඳව දක්නා දේට වඩා ඔවුන් ගැන ප්‍රේක්ෂකයෝ දැනගනිති. චරිතවල අනාගත හැසිරීම්, චර්යාවන් පිළිබඳ ප්‍රේක්ෂකයා විසින්, විශේෂයෙන් කාන්තා ප්‍රේක්ෂයන් විසින් සාකච්ඡාවට ගනු ලැබෙයි. චරිතවලට වඩා ප්‍රේක්ෂකයා ඔවුන් ගැන දන්නාදේ වැඩිය. ඒ අනුව චරිතවලට වඩා, ප්‍රේක්ෂකයා ලබන වරප්‍රසාදය තව තවත් තීව්‍ර වන්නේ සෝප් ඔපෙරා පිළිබඳ පළවන ටැබ්ලොයිඩ් පුවත්පත්, සඟරා හා වෙබ් ජාලා නිසයි. ආඛ්‍යානයේ අවස්ථා සිදුවීමට පෙර ප්‍රේක්ෂකයාට දැන ගැනීමට ලැබීම නිසා දැනුවත් වූ ස්ථාවරයක සිටිමින් සෝප් ඔපෙරාව පිළිබඳ සාකච්ඡා කිරීමේ විශේෂ වරප්‍රසාදයක් ප්‍රේක්ෂකයාට ලැබේ. සෝප් ඔපෙරාවට කැමති ප්‍රේක්ෂකයන්ගේ ප්‍රජාවට එකතුවීමේ වරප්‍රසාදයක් ඔවුනට ලැබේ. සෝප් ඔපෙරාව ප්‍රේක්ෂකයාට ලබාදෙන එක් වින්දනයකි. මෙම වින්දනය වෙනත් ශානරවල දී විඳගැනීමට ලැබෙන්නේ අවම වශයෙනි. ඉහත වරප්‍රසාදය වැඩි වශයෙන් අත්විඳින්නේ කාන්තා ප්‍රේක්ෂකයා විසිනි.

අනෙක් ශානරවලට වඩා විවිධ වර්ගයේ ස්ත්‍රී චරිත ගණනාවක් සෝප් ඔපෙරාවේ දක්නට ලැබේ. එසේම බලපෑම්කාරී, පවුලේ නායකත්වය දරණ, ස්ත්‍රී චරිත බහුලව සෝප් ඔපෙරාවේ නියෝජනය වෙයි. ක්‍රියාදාමවලට වඩා සංවාද හා සාකච්ඡා බහුල බැවින්, බලපෑම්කාරී, ස්වාධීන කාන්තා චරිතවලට සෝප් ඔපෙරා ආඛ්‍යානයේ ආධිපත්‍ය දැරීමේ වැඩි ඉඩක් ලැබේ. කාන්තාවට වැඩි බලයක් හා ඉඩක් නොලැබෙන අනෙක් ශානරවලට වඩා සෝප් ඔපෙරාව තුළ කාන්තාවට ලැබෙන මෙම ඉඩ, බලය හේතු කරගෙනම කාන්තා ප්‍රේක්ෂකයෝ මෙම ටෙලිනාටක විශේෂයට විශේෂ කැමැත්තක් දක්වති.

නිවස, ගෘහණියට සාම්ප්‍රදායිකව ම වැඩි ඉඩක් ලබාදෙන ස්ථානයකි. ස්ත්‍රීය පිළිබඳ Stereotype අදහස වන්නේ ස්ත්‍රී අයිති නිවස බවත්, එහි පාලනය, මෙහෙයවීම හා සාමාජිකයන්ගේ දුක සැප බලන්නේ ඇය විසින් බවයි. සෝප් ඔපෙරාවේ ස්ත්‍රීය ද සිය චර්යාව සහ පැවැත්ම මගින් පවුලේ සාමාජිකයන්ගේ රැකවරණය, ආරක්ෂාව බලාගන්නා තැනැත්තිය බවට පත්වෙයි. සාම්ප්‍රදායික ව ස්ත්‍රියට පවරා ඇති මෙම හැකියාව නැවත නැවතත් සෝප් ඔපෙරාව තුළ තහවුරු වීම නිසා ස්ත්‍රී ප්‍රේක්ෂකයාට සෝප් ඔපෙරාව ඉතා සංවේදී ශානරයකි. ඇයව උත්කර්ෂයට පත්වීම නිසාම, සෝප් ඔපෙරාව ස්ත්‍රී ප්‍රේක්ෂකයාට සුවිශේෂ වින්දනයක් ලබා දෙන ශානරයක් බවට පත් වෙයි. **ටානියා මොඩල්ස්කි** සෝප් ඔපෙරාව නරඹන ස්ත්‍රිය Omniscient ideal Mother කෙනෙකු බවට පත් කරන බව තර්ක කරන්නේ මේ නිසයි(Modleski,1982:99 100).

සෝප් ඔපෙරා ආඛ්‍යානයේ පවතින ඉදිරියට ඇදෙන අවසන් නොවන ස්වභාවය ද ස්ත්‍රීත්වය හා සම්බන්ධ කෙරේ. මෙය ස්ත්‍රියට වින්දනයක් ලබාදෙන අත්දැකීමක් ලෙස විග්‍රහ කෙරේ. දීර්ඝ ව ඇදී යන ආඛ්‍යානයෙන් කාන්තාව ලබන වින්දනය අඛ්‍යාන අවසානය සොයන පුරුෂ වින්දනයක ප්‍රතිපක්ෂව අර්ථකථනය කිරීමයි මෙහිදී සිදුවන්නේ. කූටප්‍රාප්තිම ය ඉක්මන් අඛ්‍යානයක් අපේක්ෂා කරන පුරුෂ

වින්දනයට වෙනස්ව, චක්‍රමය, ඉදිරියට ඇදෙන ස්ත්‍රී වින්දනයට, සෝප් ඔපෙරාවේ ආඛ්‍යානය සම කරමින් **ටානියා මොඩල්ස්කි** පවසන්නේ සෝප් ඔපෙරාව කාන්තාවගේ වින්දනය සඳහාම නිමවුණු ශානරයක් බවයි (Modleski,1982:99 :55).

තරුණ ස්ත්‍රියගේ පමණක් නොව, සෝප් ඔපෙරාව මැදිවියේ හෝ වැඩි හිටි ස්ත්‍රියගේ ද ලිංගිකත්වය අගය කරන, උත්කර්ෂයට නංවන ශානරයකි. විශේෂයෙන් මැදිවියේ ස්ත්‍රියගේ ලිංගික සම්බන්ධතා පිළිබඳ වැඩි වශයෙන් සාකච්ඡාවට ගැනෙන ශානර කිහිපයකින් එකකි සෝප් ඔපෙරාව. ඩේවිස්ගේ අදහස සෝප් ඔපෙරාවේ ලිංගිකත්වය හැඟීම්බර හා කාමයට පොළඹවන ස්වභාවයක් පවතින බවය (Davis,1984:31 33). සෝප් ඔපෙරාව ස්ත්‍රියගේ ලිංගිකත්වය හා ශරීරය පිරිමියාට විරුද්ධ ව පාවිච්චි කරන ආකාරය පෙන්වාදෙන ශානරයකි.

බහුතරයක් ටෙලිවිෂන් ශානරවල මැදිවියේ ස්ත්‍රියගේ ලිංගිකත්වය හා ලිංගික ආශාව යටපත් කරන විට, සෝප් ඔපෙරාව එය ඉදිරියට ගනියි. ස්ත්‍රිය නිරූපණය කිරීමේදී දිවා කාලයේ විකාශය වන සෝප් ඔපෙරාවට වඩා රාත්‍රි කාලයේ විකාශයවන සෝප් ඔපෙරාවේ ස්ත්‍රී නිරූපණය සාම්ප්‍රදාය ඉක්මවායන ස්වරූපයක් දක්වන බව **ජෙරපි** ගේ අදහසයි. ඔහු කියන්නේ රාත්‍රී කාලයේ සෝප් ඔපෙරාව ලිංගිකම ය බලයට අමතරව, ආර්ථිකමය බලයක් ද සහිත ස්ත්‍රියක් නිරූපණය කරන බවයි(Geraghty,1981: 9 26). සෝප් ඔපෙරාවේදී ස්ත්‍රියගේ ලිංගිකත්වය පුරුෂයාගේ වස්තුවක් නොව, පුරුෂ මූලික ලෝකයේ ඇයට බලය ලබාදීමක් බවට පත් වෙයි. ඇය ධනාත්මය, බලවත්ය, බලපෑම්කාරීය. ඇය තවදුරටත් පුරුෂයාගේ වස්තුවක් නොවේ. **ජෝන් ෆිස්ක්** පවසන්නේ පිරිමියාව පාලනය කිරීමටත්, බලපෑම් කිරීමටත්, ස්ත්‍රියට ඇති බලය කිසිදා ලඟා කරගත නොහැකි වුවත්, එය අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස සෝප් ඔපෙරාව තුළ නියෝජනය වන බවයි (Fisk,2003:470).

සෝප් ඔපෙරාවේ පිරිමියා ඉතා දුර්වල චරිතයකි. පවුලේ නායකත්වය දරන්නේ පිරිමියා නොව ස්ත්‍රියයි. පවුල හෝ ප්‍රජාව මෙහෙයවන්නේ, පවුලේ නීති රීති සොයා බලන්නේ, ස්ත්‍රියයි. පිරිමියා හාස්‍යයට ලක්කරීම, පරාජයට පත්කිරීම, ලැජ්ජාවට පත් කිරීම සෝප් ඔපෙරාවේ සිදු වේ. ලැජ්ජාවට, අපහසුතාවට පත්වන පිරිමි සෝප් ඔපෙරාවේ බහුලය. අවසානයේ පිරිමියාගේ සියලු සම්බන්ධතා හෙළිවෙයි. එයින් ඔහුව ලැජ්ජාවට පත්වෙයි. ඇතැම් විට, තාවකාලික ව හෝ පවුලෙන් නෙරපා හැරේ. වෙනත් ශානරවල ශක්තිමත් බව, බලපෑම්කාරී බව පුරුෂායා වටා ගොඩනැගෙන විට, සෝප් ඔපෙරාව එය ප්‍රතික්ෂේප කරයි. සංවේදී, ආදරණීය, බයාදු, කරුණාවන්ත, රැකබලාගන්නා ව, ගති ලක්ෂණවලින් යුතු පිරිමි චරිත පමණක්, පවුලට බාරගනු ලබන අතර, අනෙක් පුරුෂ චරිත සෝප් ඔපෙරාවේදී ඉවතට විසිවේ. වරදකාරී, කරදරකාරී පිරිමියෙකු පවුලට බඳවාගනු ලබන්නේ, ඔහු ලැජ්ජාවට පත්වූවාට පසු, වරදට සමාව දීමෙනි. සෝප් ඔපෙරා අවකාශය තුළ පිරිමියාට අත්වෙන මෙම ශෝකජනක ඉරණම, කාන්තා ප්‍රේක්ෂකයාගේ සතුටට, වින්දනයට හේතුවක් වෙයි. ලැජ්ජාවට, හාස්‍යයට පත්වන, වරදට සමාව දී ගෙදරට ගනු ලබන පිරිමියාට අත්වෙන ඉරණම, සෝප් ඔපෙරාව නරඹන කාන්තා ප්‍රේක්ෂකයා ලබන වින්දනයක් බව **පැවසේ** (Davis,1984:32).

සෝප් ඔපෙරාව, ප්‍රේක්ෂකයා හා යථාර්ථවාදය
(Soap Opera Audience and Realism)

සෝප් ඔපෙරාව ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රියවීමට බලපාන තවත් එක් කරුණක් වන්නේ එහි නියෝජනය වන යථාර්ථවාදී ස්වරූපයයි. දීර්ඝ කාලයක් විකාශයවන කතා පුවත, එහි ඇති සැබෑ ජීවිතයේ අත්දැකීම්වලට සමපාත වෙමින්, මන්ද ලයකින් ඉදිරියට ඇදෙන ස්වභාවය වැනි කරුණු නිසාම එය වඩාත් යථාර්ථවාදී, සැබෑ ජීවිතයට සමීපබවක් උසුලයි. සැබෑ ජීවිතයේ සිදුවීම් සිදුවන කාලයට සමපාත වන ආකාරයෙන් ,බොහෝ සෝප් ඔපෙරාවල සිදුවීම්වල කාලය ද සමාන බවක් හැඟෙන නිසා ඒවා යථාර්ථවාදී නාට්‍ය ලෙස ප්‍රේක්ෂකයාට ඒත්තු යන බව ලෝරා මම්ෆෝඩ් ප්‍රකාශ කරයි(Muford,1995:45) දිනපතා විකාශය වන නිසා, ප්‍රේක්ෂකයාගේ එදිනෙදා ජීවින චක්‍රයේ ගලායාමයි. සෝප් ඔපෙරාවේ එදිනෙදා චක්‍රයේ ගලායාමයි, සමපාත බවක් හැඟීයාම නිසාත්, සෝප් ඔපෙරාව යථාර්ථවාදී ලෙස හැඟී යයි. එහි දෘශ්‍ය විලාසය ද සැබෑ ජීවිතයට සමීපව පෙනෙන ලෙස ගොඩනගන නිසා මෙය යථාර්ථවාදී ශානරයක් ලෙස පෙනී යනු ඇත. කෙසේ නමුත් මෙහි ඇති යථාර්ථාවාදී ස්වභාවයේ ප්‍රශ්නකාරී බව ද සාකාච්ඡාවට ලක්කෙරේ. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් තර්කයක් ඉදිරිපත් කරන්නේ ස්ටුවර්ට් එම් අල් විසිනි. ඔහු පහත සඳහන් තර්ක ඉදිරිපත් කරයි.

1. සෝප් ඔපෙරාවේ චරිත මුහුණ දෙන ගැටලු, බාහිර සමාජයේ පුළුල් ලෝකයට සම්බන්ධ වන බවක් දැකිය නොහැකි බව ඔහු කියයි. රැකියා විරහිත බව නිදසුනකට ගතහොත් ඔහු පවසන්නේ එය හුදු තනි පුද්ගලයෙකුට බලපාන ආකාරයට පමණක් ඉදිරිපත් කරන බවයි.

2. සෝප් ඔපෙරාව යථාර්ථවාදී සමාජයක්, පරිසරයක්, පවුල් නියෝජනය කල ද සුළු ජාතීන්ව ප්‍රමාණාත්මකව නියෝජනය නොකරයි. මිනිසුන්ගේ එදිනෙදා ජීවන වෘත්තීන්, ඔවුන් ජීවත්වන ආකාරය, වෙහෙසකර ජීවන අරගලය, නිරූපණය කරන්නේ නැත.

3. සෝප් ඔපෙරාව සදාචාරවාදී වුවත්, සදාචාරයට පිටින් යන පුද්ගලයන්ට දඬුවම් විඳීමට සිදුවන බව නිරූපණය කරන ශානරයක් වුවත්, සැබෑ ලෝකයේදී එය එසේ වන්නේ නැති බව ඔහු ප්‍රකාශ කරයි.

4. දීර්ඝ කාලයක් පුරා, ජීවිතයට සම්බන්ධ කතා පුවත්, ඉදිරියට ඇදී ගියත්, සමාජයේ සිදුවන ඇතැම් බරපතල සිදුවීම් හෝ සුවිශේෂ අවස්ථා, සෝප් ඔපෙරා ග්‍රහණය කරගත්නේ නැති බව ඔහු කියයි. (Stewart,2001:36).

ස්ත්‍රිය සාම්ප්‍රදායිකව ම ගෘහණියක්, මවක්, විය යුතුය යන ප්‍රධාන මතවාදය වපුරණ සෝප් ඔපොරාව, ඒ සඳහාම ස්ත්‍රී ප්‍රේක්ෂකයාව ඉලක්ක කරණ බැවින්, සෝප් ඔපෙරාව විකාශයවන, ගුවන් කාලය ද තීරණය වෙන්නේ ගෘහණියගේ චර්යාවට සාපේක්ෂව බව අපි දනිමු. දහවල් කාලයේ වැඩිපුර සොප් ඔපෙරා විකාශය වන්නේ එබැවිනි. කාන්තාවගේ ජීවන චර්යාවේ සිදුවී තිබෙන වෙනස්වීමට සාපේක්ෂව, සෝප් ඔපෙරාව විකාශනයවන කාලයේ ද වෙනසක් සිදුවී තිබේ. මේ තත්ත්වය ද සෝප් ඔපෙරාව හා යථාර්ථය අතර පවතින සම්බන්ධය පිළිබඳ ඉඟි සපයයි.

වර්තමානයේ සෝප් ඔපෙරා වැඩි වශයෙන් විකාශය වන්නේ දහවල් කාලයට වඩා රාත්‍රියේ, වැඩි ප්‍රේක්ෂකයන් පිරිසක් නරඹන වේලාවන් හිඳීය. වැඩසටහන් පෙළ ගැස්මේ සිදු වී තිබෙන වෙනස අනුව, ස්ත්‍රිය තව දුරටත්, නිවසටම සීමා වී නැති බව පෙනෙයි. දහවල් කාලයේ ඇය රැකියාවට යන බැවින් වර්තමානයේ දී සෝප් ඔපෙරා වැඩි වශයෙන් විකාශය වන්නේ රාත්‍රී කාලයේදී ය. මෙම වෙනස බ්‍රිතාන්‍ය හා ඇමෙරිකානු ටෙලිවිෂනයේ විශාල වශයෙන් දැකගැනීමට පුළුවන.

එසේම පෙරට වඩා, පුරුෂ ප්‍රේක්ෂක පිරිසක් සෝප් ඔපෙරාව වෙත ආකර්ෂණය වී ඇති බව ද උපකල්පනය කළ හැකිය. බ්‍රිතාන්‍ය සෝප් ඔපෙරාවේ සාම්ප්‍රදායික ගතිලක්ෂණවල සිදුවී තිබෙන වෙනස ගැන සිතීමේ දී මේ තත්ත්වය හොඳින් පැහැදිලි වෙයි. වර්තමාන බ්‍රිතාන්‍ය සෝප් ඔපෙරාවේ ප්‍රධාන චරිත ලෙස පුරුෂ චරිතවල වැඩිවීමක් පෙනේ. එසේම සෝප් ඔපෙරාවේ ක්‍රියාදාම මුසු කතා පුවත් වල වැඩි වීමක් ද සිදුව තීබීමෙන් පෙනෙන්නේ පුරුෂ ප්‍රේක්ෂකයන්ගේ පමණක් නොව ස්ත්‍රී ප්‍රේක්ෂකයන්ගේ ද කැමැත්ත වෙනස් වී ඇති බවයි.

ප්‍රකට විචාරිකාවක් හා සෝප් ඔපෙරා පිළිබඳ විශේෂඥවරියක් වන **ඉයන් ඇන්** සෝප් ඔපෙරාවේ යථාර්ථවාදය පිළිබඳව අදහස් දක්වමින් කියා සිටින්නේ, සෝප් ඔපෙරාව **හැඟීම්බර යථාර්ථවාදයක්** හෙළිකරන බවයි (Emotonal Reality). යථාර්ථවාදී නොවන වස්තුබීජ හා ක්‍රියාදාම තිබියදීත් ප්‍රේක්ෂකයන්ට චරිතවල මනෝවිද්‍යාව හඳුනාගත හැකි බවත්, චරිතවල හැඟීම් ප්‍රේක්ෂකයන් අතර හුවමාරු කිරීමේ හැකියාවක් සෝප් ඔපෙරාව සතු බව ඇය වැඩිදුරටත් පවසයි(Ang,1991:47)

සෝප් ඔපෙරාව හා ප්‍රේක්ෂකයා අතර සම්බන්ධය, නැරඹීමේ පුරුද්ද, වටහා ගැනීමේ දී, සෝප් ඔපෙරාව සමඟ ප්‍රේක්ෂකයා දක්වන සුවිශේෂී ගනුදෙනුව හඳුනා ගත යුතුය. සෝප් ඔපෙරාවේ අන්තර්ගතය සකස්කිරීමේ දී, එහි ස්වරූපය තීරණය කිරීමේ දී ප්‍රේක්ෂකයා බරපතල ලෙස එයට මැදිහත් වෙයි. ලාභ ඉපයීමට හා ජනප්‍රියවීමට අවශනම්, ප්‍රේක්ෂකයන් වැඩිපුර ඉල්ලන සෝප් ඔපෙරාවන් නිෂ්පාදනය කිරීමට ගැනීම නිර්මාණකරුවන්ට සිදුවේ. ඒ අනුව නිෂ්පාදනයෝ සෝප් ඔපෙරාවේ අන්තර්ගතය සකස්කිරීම සඳහා ප්‍රේක්ෂකයන්ට ආරාධනා කරති. ඒ වෙනුවෙන්ම ප්‍රේක්ෂකයන් ගෙන්වා ගැනීමට, අවස්ථා නිර්මාණය කරමින් නාටකයේ අන්තර්ගතය වෙනස් කිරීම නිතර සිදුවන දෙයකි(Hayward,2003:514).

ඉදිරියේ විකාශයවීමට නියමිත කොටස් ආරාධිත ප්‍රේක්ෂකයන්ට පෙන්වා, එහි ගුණදොස් විමසා, ඉදිරි කතාංග හා චරිතවල හැසිරීම් වෙනස් කිරීම සෝප් ඔපෙරාවේ නිරන්තරව සිදුවේ. හැම කතා අංගයක්ම වෙනුවෙන් ප්‍රේක්ෂකයන් එවන ලියුම්, ප්‍රතිචාර එකතු කිරීම සඳහා වෙනම ඒකක ස්ථාපනය කර, ලිපි වල ඇති අදහස්, ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස විග්‍රහයට ලක් කෙරේ. චරිතයක් ගැන හෝ කතා පුවතේ වර්ධනය පිළිබඳව හෝ දැඩි විරෝධයක් ප්‍රේක්ෂකයන් වෙතින් එල්ල වුවහොත් ඒවා සැලකිල්ලට ගනිමින්, කතා පුවතේ හා චරිතයේ වෙනස්කම් සිදුකිරීමට රචකයන්ට හා නිර්මාණකරුවන්ට සිදු වේ. ප්‍රේක්ෂකයන්ගේ රුචිය අනුව, බලපෑමට අනුව සෝප් ඔපෙරාවේ ස්වරූපය වෙනස් වන බවයි මේ අනුව පෙනී යන්නේ.

අන්තර්ජාලය ඔස්සේ සෝප් ඔපෙරාව පිළිබඳ ප්‍රේක්ෂකයන්ගේ විශේෂ සංවාද, විවාද හා අදහස් හුවමාරු වෙයි. අන්තර්ජාල මිතුරු ජාල විසින් ඔවුනොවුන්ට සෝප් ඔපෙරාව ලබාදෙන රසය, වින්දනය

පිළිබඳ විවිධ සංවාද පළකරනු ලැබේ. අතහැරුණු, මග හැරුණු කතාංග පිළිබඳ තොරතුරු, විස්තර අන්තර්ජාලය හරහා පළවෙන නිසා මගහැරුණු කතාංග පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට රසිකයන්ට අපහසුවක් නැත. ඒ අනුව සෝප් ඔපෙරාවේ ප්‍රේක්ෂකත්වය අනෙක් ශානරයක ප්‍රේක්ෂකයන්ට වඩා ක්‍රියාශීලි හා වෙනස්ය.

සෝප් ඔපෙරාව අතිනාටකයක් ලෙස
(Soap Opera as Melodrama)

සෝප් ඔපෙරාව පිළිබඳ සිදුකර තිබෙන අධ්‍යයනයන්හි දී ඇතැම් අධ්‍යයනයන් එය, අතිනාටකය (Melodrama) සමඟ සම්බන්ධ කරනු දැකිය හැකිය. සෝප් ඔපෙරාව අතිනාටකීය ලක්ෂණ පෙන්වන, ශානරයක් ලෙසයි. මෙම සාකච්ඡාවේදී අර්ථ දැක්වෙන්නේ. **ඉයන් ඈන්,ජේන් ෆියර්, ටානියා මොඩල්ස්කි** යන විද්වතුන් තිදෙනා මේ පිළිබඳව දීර්ඝ වශයෙන්ම අදහස් දක්වා තිබේ. ඔවුන් තිදෙනා විසින් ලියා තිබෙන අතිශයෙන් වැදගත් කෘතීන් තුනක් වන Watching Dallas, Seeing Through The Eighties, Loving With a Vengeance කෘතීන්වල මේ සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා කෙරේ. සෝප් ඔපෙරාවේ අතිනාටකීය බව පිළිබඳව සාකච්ඡා කිරීමේදී මොවුන් තිදෙනාගේම අවධානය යොමුවන්නේ ලොව පුරා ඉතා ජනප්‍රිය වූ සෝප් ඔපෙරා ද්විත්වයක් වන Dallas, Dynasty වෙතයි.[3]

සුවිශේෂ ස්ත්‍රී දැක්මක් නියෝජනය කරන සෝප් ඔපෙරාව, සිදුවීම්වලට වඩා හැඟීම් උත්කර්ෂයට නංවන බවත්, මෙම හැඟීම්, විශේෂයෙන් පවුලේ අවස්ථාවන් හා ගැටලු හරහා මතුකරවන බවත් හඳුනාගත හැකිය. Dallas හා Dynasty ඉතා අලංකාර පසුතල, වස්ත්‍රාභරණ, දැවැන්ත පෙනුමක් සහිතව, හැඟීම් ප්‍රකාශ කරන, අතිනාටකීය සෝප් ඔපෙරා ද්විත්වයක් බවයි ඔවුන්ගේ අදහස වන්නේ.

අතිනාටකයේ ගතිලක්ෂණත්, සෝප් ඔපෙරා අඛ්‍යානයේ වන ව්‍යුහයන් එකට මුසු කරගනිමින් Dallas සෝප් ඔපෙරාව, හැඟීම්වල ඛේදාත්මක ව්‍යුහයන් Tragic Structure of feelings නිර්මාණය කරන බව **ඉයන් ඈන්** පවසයි.[4] Dallas අර්ථ ව්‍යුහයන් තුළ ඉහත කී හැඟීම්වල ඛේදාත්මක ව්‍යුහය කාවැදී ඇති බවත්, ප්‍රේක්ෂකයකු විසින්, තමාවම Dallas චරිත වෙත ප්‍රක්ෂේපනය කරගත හොත් පමණක්, ඇය කියා සිටින හැඟීම්වල ඛේදාත්මක ව්‍යුහය අවබෝධකරගත හැකි බවත් ඇය වැඩි දුරටත් කියා සිටිය (Ann,1991:47).

සෝප් ඔපෙරාවේ අතිනාටකීය ස්වභාවය පැමිණෙන්නේ Douglas Sirk නම් සිනමාකරුවාගේ Written on The Wind වැනි චිත්‍රපට හරහා බවත්, සෝප් ඔපෙරාවේ විෂය පථය වන්නේ, සිදුවීම් විසින් උත්කර්ෂයට නංවන හැඟීම් බවත් **ජේන් ෆියර්** වැඩි දුරටත් කියා සිටියි. (Feuer, 1995:115)

සෝප් ඔපෙරාවේ අතිනාටකීය බව පිළිබඳව අසහස් දක්වන **ටානියා මොඩල්ස්කි**ගේ එක් අදහසක් වන්නේ, සෝප් ඔපෙරාව ස්ත්‍රිය වෙනුවෙන්ම නිර්මාණය වන්නක් පමණක් නොව, ගෘහස්ත හා පුද්ගලික ලෝකයක් ඉතා සමීපව නැවත නිර්මාණය කරමින් ස්ත්‍රියගේ ආශාවන් හා බැඳුනු දැක්මක්, තත්ත්වයක් ප්‍රේක්ෂකයාට ලබා දෙන බවයි.(Modleski,1982:99 :23).

කෙසේ නමුත් වැඩි වශයෙන් ස්ත්‍රිය වෙනුවෙන් හා ස්ත්‍රිය විසින් නරඹන සෝප් ඔපෙරාව අතිනාටකයේ ගති ලක්ෂණයත්, සමාජ යථාර්ථයත්, ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න අනාවරණය කරගැනීම ඉතා වැදගත් බව **ග්ලැස්නර්** පෙන්වා දෙයි.(Glaessner,1993:126)

නිගමනය

සෝප් ඔපෙරාව ඉතා ජනප්‍රිය නාටක ප්‍රවර්ගයකි. එය එයටම උරුම ශානරීය ගති ලක්ෂණ සහිතව වර්ධනය වන්නකි. ස්ත්‍රී ප්‍රේක්ෂකයා ඉලක්කකර ගෙන ප්‍රධාන වශයෙන් නිර්මාණය වන මෙම ශානරය ස්ත්‍රියගේ ආශාවන් නියෝජනය කරන, සුවිශේෂ වූ ස්ත්‍රී දැක්මක් මූර්තිමත් කරන, ටෙලිනාටක ශානරයකි. තාක්ෂණයයේත් සමාජ චලනයේ වෙනස්කම්වලටත්, රටින් රට, කලාපයෙන් කලාපයටත්, සමාජ සංස්කෘතික වෙනස්කම්වලටත්, ටෙලිවිෂන් කර්මාන්තයේ ස්වභාවයන් අනුවත්, යම් යම් වෙනස්කම්වලට, පරිවර්තනයන්ට, ලක්වෙමින් යන ඉතා ජනප්‍රිය ටෙලිවිෂන් ශානරයකි. සෝප් ඔපෙරාව ස්වාධීන සහ අනන්‍ය ගතිලක්ෂණ සහිත ටෙලි නාටක ප්‍රවර්ගයක් වනබවට පැහැදිලිව පෙනෙන්නට තිබිය දී, ප්‍රාසාංගික නාටකයේ ගතිලක්ෂණ කිහිපයක් උරුම කරගන්නා නිසාම, සෑම ටෙලි නාටකයක්ම සෝප් ඔපෙරාවක් ලෙස හඳුනා ගැනීම අර්ථ විරහිතය.

සටහන්

1. දූදරුවෝ සෝප් ඔපෙරාව පිළිබඳ ශාස්ත්‍රීය විග්‍රහයක් සඳහා බලන්න. රංජිත් පෙරේරා, දූදරුවෝ: සෝප් ඔපෙරාව, රූපවාහිනිය, ජනප්‍රිය සංස්කෘතිය සහ ජනප්‍රිය සංස්කෘතික ප්‍රාග්ධනය. ප්‍රවාද සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ. 2001, ජනවාරි මාර්තු,109 118 පිටු.

2. පළමු ගුවන්විදුලි සෝප් ඔපෙරාව ලෙස සැලකෙන්නේ Irna Phillips විසින් චිකාගෝ ගුවන්විදුලි සේවාවට ලියූ Painted Dreams නැමැති නාටකයයි.

3. සෝප් ඔපෙරා අධ්‍යයනයේදී අවශ්‍යවන ලොව වැදගත්ම සෝප් ඔපෙරාවන් විකාශය කිරීමට 80 දශකයේ දී ජාතික රූපවාහිනිය පියවර ගෙන තිබේ. සෝප් ඔපෙරා පමණක් නොව, අනෙකුත් සංධිස්ථානම ය ටෙලිවිෂන් වැඩසටහන් ද විකාශය කිරීමට 80 දශකයේ දී ජාතික රූපවාහිනිය පියවර ගෙන තිබේ.

4. සෝප් ඔපෙරාව හා එහි ප්‍රේක්ෂක මැදිහත් වීම පිළිබඳව ප්‍රබල විග්‍රහයක් සඳහා ඉයන් ඇන් රචනා කරන ලද Watching Dallas කෘතිය බලන්න.

මූලාශ්‍ර

Alexander, L and Consens, A.(2004) *Teaching Soap,* London:BFI

Allen, R.(1985) *Speaking of Soap Opera,* Chapel Hill: Unverity of North Carolina press.

Ang, Ien.(1991) *Watching Dallas,* London: Routledge.

Baker, M. (1989) *Comics: Ideology, Power and the Critics,* Manchester Manchester University Press

Brown, A.(1994) *Soap opera and Women s Talk,* London Sage.

Brunsdon, C.(2000) *The Feminists, Housewife, and the Soap Opera*, Oxford: Oxford University Press.

Brunsdon, C, D Acci and Julie, (eds) (1997), *Feminist Television Criticism: A Reader,* Oxford: Oxford University Press.

Cantor, M. and Pingree, S. (1983) *The Soap Opera,* London: Sage Publication.

Casey and Betnedtta.(2004) *Key Concepts in Television Studies,* London: Routledge.

Davis, J.(1984) *Soap and Other Operas,* London:Metro.

Dyer, R. (ed) (1981), *Coronation Street,* London: BFI Publishing.

Feuer, J. (1995) *Seeing Through the Eighties,* Durham: Duke University Press.

Fisk, J. (2003) "Gendered Television " in Gail Dines and Jean Humes (ed), *Gender, Race, and, Class in Media,* London: Sage Publication.

Geraghty, C. (1991) *Women and Soap Opera:* A Study of Prime Time Soap, Cambridge: Polity Press.

holland, P. (1997) *the Television Hand Book,* London: Routledge.

Clark, D. (1990) "Cagney and Lacey: Feminist Strategies of Detection," in M.E.Brown (ed) *Television and women s Culture,* London :Sage Publication.

Creeber, G. (2004) *Serial Television,* London: BFI.

Glaessner, V.(1993) "Gendered Fictions"in Andrew Goodwin and Garry Whannel (ed), *Understanding Television,*London: Routledge.

Geraghty, C. (1981) 'The Continues Serial "in Richard Dyer (ed), *Coronation Street,* London: BFI Publishing.

(Hayward, J(.2003) "Consuming Pleasures" in Gail Dines and Jean Humes (ed), *Gender, Race, and, Class in Media,* London: Sage Publication.

Hobson, D.(1982*) Crossroads: The Drama of a Soap Opera,* London: Methuen.

Keeler,J.(1980) in Cantor, M. and Pingree, S. (1983) *The Soap Opera,* London: Sage Publication.

Liss, M.(1981) "Blind and deaf viewers "in Cantor Muriel and Susanne Pingree, *The Soap Opera:* London :Sage Publication.

McCarthy, A. (2001) "Studying Soap Opera "in Creeber, G. (ed), *The Television Genre,* London: BFI Publishing.

Modleski, T.(1982) *Loving With Vengeance:* Mass produced fantasies for women, London: Methuen

Muford, S.(1995) *Love and Ideology in the Afternoon: Soap opera Women and Television Genre,* Bloomington: Indiana University Press.

Stedman, R. (1977) *the Serial: Suspense and Drama by Installments.* Norman: University of Oklahoma Press..

Stewart, et al (2001) *Media and Meaning an Introduction,* London: BFI Publishing.

Weibel, K.(1977) *Mirror, Mirror: Image of Popular Culture,* New York: Anchor.

20

ජනමාධ්‍ය පර්යේෂණ හා අන්තර්ගත විශ්ලේෂණය

සේනානි හරිශ්චන්ද්‍ර

ජනසන්නිවේදන සංදේශ වත්මන් සමාජයෙහි අතිශය ප්‍රබල පරිවර්තන කාරකයකි. වරෙක එය විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පිරිස් ඒකරාශි කිරීමට හේතු වන අතර තවත් විටක සමාජය තුළ විවිධ මතිමතාන්තර හා දෘෂ්ටිවාද ජනිත කිරීමට හා ව්‍යාප්ත කිරීමට පාදක වෙයි. ජනමත සංවිධානයට මෙන්ම එය වෙනස් කිරීමටත් ඉන් නොනැවතී විවිධ සමාජ, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික පරිවර්තනයන් යථාර්ථයන් බවට පත් කිරීමටත් ජනමාධ්‍ය සංදේශ සතුව ඇත්තේ අවතක්සේරු නොකටයුතු ශක්‍යතාවකි.

ජනමාධ්‍ය අන්තර්ගතය අධ්‍යයනය පිළිබඳව සමාජ විද්‍යාඥයන්ගේ අවධානය යොමු වන්නේ විසිවන සියවසේ මුල් භාගයේදී ය. මේ නිසා ම සෙසු සාමාජීය විද්‍යා පර්යේෂණවලට සාපේක්ෂව ජනමාධ්‍යයන්ගේ හැසිරීම මෙන්ම එහි අන්තර්ගතයේ ස්වභාවය නිරීක්ෂණය කිරීම හා අවබෝධ කරගැනීම සම්බන්ධයෙන් වන ජනමාධ්‍ය පර්යේෂණවලට ඇත්තේ කෙටි ඉතිහාසයකි. එකී කෙටි ඉතිහාසය තුළ විශේෂයෙන් ජන මාධ්‍ය සංදේශ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමට ඇති ප්‍රබලතම ක්‍රමවේදය ලෙස ඉස්මතුව පෙනෙන්නේ 'අන්තර්ගත විශ්ලේෂණය'යි.

ජනමාධ්‍ය හා සම්බන්ධ අන්තර්ගත විශ්ලේෂණ පර්යේෂණවල දී බොහෝ විට සිදු වන්නේ තථ්‍ය ලෙස පවතින විවිධ සංකල්ප, ලක්ෂණ, ගුණාංග, කණ්ඩායම් ආදී ප්‍රපංචයන් යථාර්ථවාදී ප්‍රමිතියකට අනුව කිසියම් තක්සේරුවකට භාජනය කර අදාළ සන්දර්භය හා එකී ප්‍රපංචයන් අතර ඇති සම්බන්ධතාවය පරීක්ෂාවට භාජනය කිරීමයි.

1920 - 30 දශකයන්හි එවකට වේගයෙන් ප්‍රචලිත වෙමින් පැවති විනෝදාස්වාද සම්පාදන මාධ්‍යයක් වූ චිත්‍රපටවල අන්තර්ගතය අධ්‍යයනය කිරීමට අන්තර්ගත විශ්ලේෂණය යොදා ගත් බව කියැවේ. සුප්‍රසිද්ධ සන්නිවේදන විද්වතෙකු වන හැරල්ඩ් ලැස්වෙල් (1927) ප්‍රචාරණය සම්බන්ධයෙන් සිදුකළ සිය අධ්‍යයනයන් සඳහා මුල්වරට අන්තර්ගත විශ්ලේෂණය යොදාගත් බවට ද මත පළ වී තිබේ.

දෙවන ලෝක යුද සමයෙහි සිදුකළ විවිධ සන්නිවේදනයන් විමර්ශනය සඳහා අන්තර්ගත විශ්ලේෂණය භාවිත කළේය යන්න තවත් අදහසකි. විශේෂයෙන් රූපවාහිනී මාධ්‍යයේ ආගමනයත් සමග එහි අන්තර්ගතය පරීක්ෂා කරනු වස් මෙම පර්යේෂණ ක්‍රමය බහුල ලෙස යොදා ගන්නා ලදී. විසිවන සියවසෙහි අවසාන දශක කිහිපයෙහි සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ ජනසන්නිවේදන පර්යේෂණ විධි ක්‍රමය ලෙස ද අන්තර්ගත විශ්ලේෂණය සැලකේ. ජාත්‍යන්තර කීර්තියක් උසුලන *Journalism & Mass Communication Quarterly* සඟරාවෙහි 1971 දී ඇතුළත්ව තිබූ 6.3% ක් වූ අන්තර්ගත විශ්ලේෂණය පාදක පර්යේෂණ අධ්‍යයන ලිපි ප්‍රමාණය 1997 වන විට 34.8% දක්වා හය ගුණයකට අධික ප්‍රමාණයකින් වර්ධනය වීම යට කී තත්ත්වය තහවුරු කරන්නා වූ ප්‍රබල සාක්ෂියකි.

අද වන විට අන්තර්ගත විශ්ලේෂණය සන්නිවේදන සංදේශයන්ගේ ගුණාත්මක මට්ටම තක්සේරු කිරීම සඳහා බහුල ලෙස භාවිතයට ගනු ලබයි. එහි ඇති ක්‍රමානුකූලබව සහ විෂයමූලිකබව අභිනතීන්ගෙන් තොරව නිගමනවලට එළඹීමට අවශ්‍ය මූලික පදනම සකස් කරන බව පෙනේ. **ටයිටර් සහ ඩොමිනික්** දක්වන ආකාරයට දුරකතන ඕපාදූපවල සිට ආගමික ලියවිලි දක්වා වූ නේක විද සංදේශ අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණ ක්‍රමය යොදා ගත හැකි වේ. පුවත්පත්, සඟරා, වෙළඳ දැන්වීම්, කවි, සිංදු, දේශපාලන කථා, පෙළ පොත්, නවකතා, පින්තූර ආදී බොහෝ සන්නිවේදනයන්ගේ අන්තර්ගතයෙහි ස්වභාවය පරීක්ෂා කිරීම සඳහා මෙම පර්යේෂණ ක්‍රමය නිතර භාවිත කෙරේ.

සමාජීය විද්‍යා පර්යේෂණ බහුතරයක දී අධ්‍යයනයට පාත්‍ර වන්නේ ජනතාව නැතහොත් පුද්ගලයින් වේ. ඔවුන්ගේ ස්වභාවය, හැසිරීම්, ආකල්ප, විශ්වාස, චරිතාකම්, චාරිත්‍ර ආදී බොහෝ දෑ එහිදී විමර්ශනයට ලක් විය හැකියි. එහෙත් අන්තර්ගත විශ්ලේෂණයේදී පුද්ගලයින් වෙනුවට අධ්‍යයනයට පාත්‍ර වන්නේ එකී පුද්ගලයින් විසින් නිර්මිත සංදේශයන් වීම මෙම පර්යේෂණ ක්‍රමයේ සුවිශේෂතම ලක්ෂණයයි. සන්නිවේදන ක්ෂේත්‍රයේ භාවිත ප්‍රධාන පර්යේෂණ ක්‍රම අතරින් මෙම ක්‍රමය වෙනස් වන්නේද ඒ නිසාමයි.

නූතන සමාජවිද්‍යා පර්යේෂණයන්හි දී පිළිගෙන පිළිපදිනු ලබන ලබන විද්‍යාත්මක ක්‍රමයෙහි ලා භාවිත සෑම ප්‍රධාන පියවරක් ම අන්තර්ගත විශ්ලේෂණයේ දී ද අනුගමනය කරනු ලබයි. නමුත් පර්යේෂණ සැලසුමේ දී (research design) අන්තර්ගත විශ්ලේෂණයට ම විශේෂිත වෙනස්කම් සමහරක් දෘෂ්‍යමාන වීම ස්වභාවික තත්ත්වයකි.

අන්තර්ගත විශ්ලේෂණ පර්යේෂණ අධ්‍යයනයක මූලික පියවර සැකෙවින් මෙසේ දැක්විය හැකියි.

- පර්යේෂණ ගැටලුව නිශ්චය කර ගැනීම
- සාහිත්‍ය විමර්ශනය
- පර්යේෂණ ප්‍රශ්න හෝ උපන්‍යාස ගොඩනගා ගැනීම
- සංගහනය තීරණය කිරීම
- නියැදිය හඳුනා ගැනීම
- විශ්ලේෂණ ඒකකය තීරණය කිරීම

- විශ්ලේෂණයට භාජනය කිරීමට අපේක්ෂිත කාණ්ඩ හඳුනා ගැනීම
- ප්‍රමාණකරණය සඳහා කේත අර්ථකථනය කර ගැනීම
- නියමු පරීක්ෂණයක් සිදු කිරීම
- අර්ථකථනයන් අනුව අන්තර්ගතය කේතකරණය කිරීම
- රැස් කරගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීම
- ඉස්මතුවන අනුමිතීන් ඇසුරින් නිගමනවලට එළඹීම

විශ්ලේෂණ ඒකකය (unit of analysis) තීරණය කිරීම සහ කේතකරණය (coding) ඉහත පියවර අතර විශේෂ වැදගත්කමකින් යුක්ත වෙයි.

අන්තර්ගත විශ්ලේෂණයේ දී සැබෑ තක්සේරුකරණයට නැතහොත් ප්‍රමාණාත්මකව ගණනය කිරීමට භාජනය කෙරෙන්නේ මෙකී විශ්ලේෂණ ඒකකයි. එම අර්ථයෙන් බලන කළ අන්තර්ගත විශ්ලේෂණයක ඉතා ක්ෂුද්‍රතම මෙන්ම වැදගත්ම අංගය වන්නේද මෙයයි. කවර ජනමාධ්‍යයක් සම්බන්ධයෙන් වුවද විශ්ලේෂණ ඒකකය තීරණය කිරීම ඉතා ප්‍රවේසමෙන් හා පරීක්ෂාවෙන් සිදු කළ යුතු කාර්යයකි. අන්තර්ගත විශ්ලේෂණය භාවිත කරන පළපුරුදු පර්යේෂකයන් පවා මේ සම්බන්ධයෙන් තීරණයකට එළඹීමට ප්‍රථම ඒ සඳහා බොහෝ කාලයක් වැය කරමින් නැවත නැවත පරීක්ෂා කිරීමට පෙළඹීමෙන් මේ බව මොනවට පැහැදිලි වේ.

මුද්‍රිත මාධ්‍ය සම්බන්ධ අන්තර්ගත විශ්ලේෂණ අධ්‍යයනයකදී 'විශ්ලේෂණ ඒකකය' එකී ලේඛනයේ ඇතුළත් වචනයක්, නමක්, සංකේතයක්, වාක්‍ය ඛණ්ඩයක්, එකී සිද්ධිය වාර්තා කිරීම සඳහා වෙන් කර ඇති කොලම් සෙන්ටිමීටර ප්‍රමාණය හෝ සමහර විට සමස්ත ලේඛනය ම විය හැකියි. අනෙක් අතට රූපවාහිනී හෝ ගුවන්විදුලි මාධ්‍ය සම්බන්ධ අධ්‍යයනයකදී මෙය එහි ඇතුළත් චරිතයක්, ක්‍රියාවක්, සංගීත ඛණ්ඩයක්, තේමාවක් වැනි යමක් හෝ සමස්ත වැඩසටහනම වීමට ද පුළුවන.

නිදසුනක් ලෙස කිසියම් රූපවාහිනී වැඩසටහනක 'ප්‍රචණ්ඩත්වය' පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන අවස්ථාවක් ගනිමු. මෙහිදී පර්යේෂකයා විසින් ප්‍රථමයෙන් සිදු කළ යුත්තේ ප්‍රචණ්ඩත්වය යනු කවරේදැයි පැහැදිලිව අර්ථකථනය කර කවර පුද්ගල හැසිරීම් මගින් එය නියෝජනය වන්නේදැයි හඳුනා ගැනීමයි. ප්‍රචණ්ඩත්වය විවිධාකාර ස්වරූපයන්ගෙන් නිරූපනය විය හැකියි. රැවීම්, බැණීම්වල සිට පහරදීම්, බරපතල තුවාල කිරීම් හෝ මරණය සිදු කිරීම දක්වා එම තත්ත්වය ව්‍යාප්තව තිබිය හැකියි. මේ හැම අංගයක් ම ප්‍රචණ්ඩත්වය නියෝජනය කරන ඒකක (units) බවට පත්වේ. එනිසා ප්‍රස්තුත තේමාවට අදාළ විය හැකි ඒකක මොනවාද යන්න පිළිබඳව පර්යේෂකයා විසින් විශ්ලේෂණය සිදු කිරීමට පෙර නිශ්චිතව හඳුනාගෙන තිබීම වැදගත්ය. අනතුරුව මේවා ගොනු නැතහොත් කාණ්ඩ ලෙස පිළියෙල කරනු ලබයි.

කිසියම් විශ්ලේෂණ ඒකකයක් යටකී කාණ්ඩයකට ඇතුළත් කිරීම සිදු කෙරෙන්නේ කේතකරණය (coding) පදනම් කරගෙනයි. ඉහත නිදර්ශනයේ සඳහන් 'රැවීම' යන්නෙන් කුමන ආකාරයේ බැල්මක්

අදහස් කෙරෙන්නේද? 'බැණීම' යන්නෙන් කවරාකාරයේ ප්‍රකාශයක් අර්ථ ගැන්වේද? වැනි කාරණා පිළිබඳ අවධානය යොමු කිරීමෙන් මේ තත්ත්වය වඩාත් හොඳින් අවබෝධ කර ගත හැකිවේ. එමගින් පැහැදිලි වන්නේ විශ්ලේෂණ ඒකකයක් කිසියම් ගොනුවකට ඇතුළත් කිරීමට නම් අදාළ කේතය කවර ලක්ෂණ නියෝජනය කරයිද යන්න පිළිබඳ නිශ්චිත අර්ථකථනයන් දක්වා තිබිය යුතු බවයි. එසේ නොවුවහොත් විශ්ලේෂණය දෝෂ සහගත විය හැකි ය.

කෙසේ නමුත් අන්තර්ගත විශ්ලේෂණය ජනමාධ්‍ය පර්යේෂණ අතර වෙනස් මාදිලියක ප්‍රවේශයක් සහිත පර්යේෂණ ක්‍රමයකි. එය කිසියම් මාධ්‍යයක් ග්‍රාහක ක්ෂේත්‍රය වෙත ඉදිරිපත් කර ඇති සංදේශයක ස්වභාව තේරුම් ගැනීමට අතිශය ප්‍රයෝජනවත් ය.

References

Hansen, A., Cottle, S., Negrine, R., & Newbold, C. (1998). Mass communication research methods. London: Macmillan.

Neuendorf, K. (2002). The Content Analysis Guidebook, Thousand Oaks, CA: Sage Publications.

Riffe, D., & Freitag, A. (1997). A content analysis of content analyses: twenty-five years of Journalism Quarterly. Journalism and Mass Communication Quarterly

Wimmer, R. D., & Dominick, J. R. (2014). Mass media research: An introduction (10th ed.). Boston, MA: Cengage Learning.

21

ශ්‍රී ලාංකීය ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා බිහිවීම

ධම්මික බණ්ඩාර හේරත්

ජාතික ගුවන්විදුලි සේවාවකට සමස්ත රටක් ආවරණය කිරීමට නොහැකි අවස්ථාවන්හී දී, විවිධ ප්‍රාදේශීය අවශ්‍යතා ඉටුකිරීම අරමුණු කරගත් ගුවන්විදුලි මාධ්‍ය ප්‍රාදේශීය සේවා ලෙස විග්‍රහ කරගත හැකිය. ඊට නිශ්චිත ප්‍රාදේශීය භූමි සීමාවක් පැවතිය ද ශ්‍රවණ කලාපය එම ප්‍රාදේශීය සීමාව ඉක්මවා විසිරී පැවතිය හැකිය. සමස්ත රටක පවත්නා භෞමික විශාලත්වය, සංස්කෘතික විවිධත්වය, ආර්ථික විෂමතා, විශේෂ අවශ්‍යතා යනාදී සාධක මත ජාතික ගුවන්විදුලියේ කාර්යභාරයෙන් එම ප්‍රදේශය ආවරණය නොවන අවස්ථාවලදී, ඊට විසඳුම වන්නේ ප්‍රාදේශීයව පිහිටුවනු ලබන ගුවන්විදුලි මධ්‍යස්ථානයි. ඒ අනුව ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවක් යනු,

> *"භූගෝලීය, සමාජීය, සංස්කෘතික, දේශපාලන හා ආර්ථික යනාදී සාධක මත රටක සමස්ත භූමි සීමාව තුළ ජීවත්වන ශ්‍රාහක පිරිස ආවරණය කළ නොහැකිවන තත්ත්වයක දී, හඳුනාගත් විශේෂ ප්‍රදේශ ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ගුවන්විදුලි සේවාවයි."*



ප්‍රාදේශීය ගුවන් විදුලිය හා ලාංකීය ජන සමාජය

ගුවන්විදුලි මාධ්‍ය මෙරට ස්ථාපනය වන්නේ යටත් විජිත ප්‍රතිඵලයක් ලෙසිනි. ඒ අනුව යටත් විජිත අවශ්‍යතා වෙනුවෙන් ආරම්භ වන ගුවන්විදුලි මාධ්‍ය කල්යත්ම මෙරට සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අවශ්‍යතාවයන් නියෝජනය කිරීමේ ආකෘතියක් දක්වා ගමන් කරනු ලබයි. යටත් විජිත පාලනය මඟින් සංවර්ධනය වන ලෝකයට ඔවුන්ගේ ගුවන්විදුලි ආකෘතී හඳුන්වාදීමේදී එය අදියර තුනක් ඔස්සේ සිදුවන බව කැට්ස් හා වෙඩෙල් විසින් පෙන්වා දී ඇත. එය ලාංකීය සමාජය තුළ ගුවන් විදුලියේ ගමන් මග පිළිබඳ විමසීමේදී ද සත්‍යයක් බව පැහැදිලි වෙයි.

1. මුල් අදියර

යටත් විජිතවාදි ගුවන් විදුලි ආකෘතීන් මෙම රටවලට පැමිණීම සිදුවිය. මෙම අවස්ථාව දීර්ඝ කාලපරිච්ඡේදයකින් යුක්ත වූවකි. යටත් විජිත යුගයේදී පිහිටු වූ ගුවන්විදුලි සේවා මෙම අවස්ථාවේදී ක්‍රමයෙන් නිදහස ලබාගැනීම දක්වා ව්‍යාප්ත වෙයි.

2. දෙවන අදියර

දෙවන අවස්ථාවේදි මෙම ගුවන්විදුලි ආකෘතින් එම රටවල සමාජ දේශපාලනික හා ආර්ථික සන්දර්භයට අනුවර්තනය කිරීමට වෑයම් කිරීමක් සිදුවෙයි. සමහර රටවල නිදහස ලැබීමෙන් පසුව මුලදි පැවති අතිනාගරික ගුවන්විදුලි ආදර්ශයන් පැවතියේ කෙටි කාලයක් පමණි. එහෙත් සමහර රටවල මෙම ආදර්ශයන් අදත් අඛණ්ඩව පවතී. එසේ පැවතීමට හේතුව මෙම ආදර්ශයන්හී පැහැදිලි ලෙස පැවැති දේශපාලනික ගති ලක්ෂණ, මතුවන දේශපාලන ව්‍යුහයන්ට වඩා සුදුසු වීමයි.

3. තුන්වන අදියර

යටත් විජිත පාලන සමයේ හඳුන්වා දුන් ගුවන්විදුලි ආකෘති මේ අවස්ථාව වන විට වඩාත් දේශීය නැඹුරුවක් ගනී. මුලදී හඳුන්වා දෙන අදියරේ සිට කාලයක් තිස්සේ පැවති විවිධ සංවර්ධන රටාවන්ගෙන් ඈත්ව දේශීය සංස්කෘතියට උචිත ලෙස ගුවන් විදුලිය හැඩගැසීමේ හා චින්තනයක් හෝ නව දේශීය ප්‍රවණතාවලට අනුකූල ලෙස ගුවන්විදුලිය හැඩගැසෙන අවදිය සේ හැඳින්වීම නිවැරදිය (කරුණානායක, 1990, පි.22).

ඕනෑම රටක දේශපාලන ආර්ථික මෙන්ම සමාජීය සන්දර්භය නිවැරදිව තේරුම්ගෙන ජාතික සංවර්ධන කර්තව්‍යයන් උදෙසා සෘජුව දායක වීමේ ශක්‍යතාවක් ගුවන්විදුලි මාධ්‍ය සතු ය. එහෙයින් සංවර්ධන ක්‍රියාවලිය උදෙසා වඩාත් ඵලදායී කාර්යභාරයක් ලංකාව තුළ සිදුකිරීමට ගුවන්විදුලිය මගින් හැකියාව පවතින බව මුල්කාලීන ගුවන්විදුලි මාධ්‍ය විශේෂඥයින් පවා පෙන්වා දී ඇත. එහිදි අවධාරණය වූ ප්‍රධාන සාධකයක් වූයේ ගුවන්විදුලිය ආරම්භ වී වසර දහයක් ගතවන්නට පෙර සිටම දුරස්ථ ග්‍රාමීය ජනතාව පිළිබඳ ගුවන්විදුලියේ අවධානය යොමු වීමයි. ජාතික ගුවන්විදුලිය ගමට ගෙනයාම මෙන්ම ජාතික ගුවන්විදුලිය මගින් ගමේ හඬ නියෝජනය කිරීමට විවිධ අවස්ථාවලදී ගත් පියවරයන් ගුවන් විදුලියේ ඉතිහාස ගමන්මග පිරික්සීමේදී පැහැදිලි වේ. ජාතික ගුවන්විදුලිය මෙරට සියලු සමාජ ආර්ථික

හා භූගෝලීය සීමා ආවරණය කිරීමට ගත් උත්සහයේ දී ගුවන්විදුලිය ආරම්භ වී වසර 54 ට පසුව ගනු ලබන පියවර වන්නේ ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා ආරම්භ කිරීමයි. නමුත් ඊට පෙරාතුව ප්‍රාදේශීය වශයෙන් ගුවන්විදුලිය ස්ථාපනය කිරීමට ගනු ලැබූ තීන්දු හා පියවර මෙරට ප්‍රාදේශීය සේවා පිහිටුවීම කෙරෙහි ඍජුව හා වක්‍ර ලෙස බලපෑම් කර ඇති බව ඒ පිළිබඳ සියුම් නිරීක්ෂණයේදී පැහැදිලි වෙයි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ ගුවන්විදුලිය මගින් ආවරණය කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳ අවධානය මෙරට ගුවන්විදුලියේ ආරම්භක අවදියේදීම සාකච්ඡාවට බඳුන් වූවකි. එය ක්‍රම ක්‍රමයෙන් ජය ගැනීම සඳහා ඉදිරිපත් වන යෝජනා හා ක්‍රියාමාර්ගයන් ප්‍රධාන ධාරාවන් දෙකක් ඔස්සේ හඳුනාගත හැකිය.

1. ජාතික ගුවන්විදුලිය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සහ ග්‍රාමීය සේවා හා වැඩසටහන් ආරම්භ කොට ගුවන්විදුලිය තුළ ගමට කාලය වෙන්කර දීම.
2. ජාතික ගුවන්විදුලිය විමධ්‍ය ගතකොට ප්‍රාදේශීය අනන්‍යතාව අනුව ගොඩනැගෙන ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා ආරම්භ කිරීම.

ශ්‍රී ලංකා ගුවන්විදුලියේ නිර්මාතෘවරයා ලෙස සලකනු ලබන එඩ්වඩ් හාර්පර් (Edward Harper) මහතා ලාංකීය ගුවන්විදුලියේ ඉදිරි ගමන්මග පිළිබඳ 1935 ජනවාරි මාසයේ රේඩියෝ ටයිම්ස් (Radio Times) සඟරාවට ලබාදෙන අදහස ලාංකීය ගුවන්විදුලිය ප්‍රාදේශීයව ව්‍යාප්තවීමේ අවශ්‍යතාව දැඩිලෙස අවධාරණය කරයි.

> *"දැනට ගම්වල වෙසෙන බහුතර කොටසක් අකුරු නූගත් බව පිළිගත් කරුණකි. රජය ගෙනයන අන්දම ආදී කරුණු රටවැස්සන්ට හරිහැටි අවබෝධ නොවුනහොත් ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩු ක්‍රමයක් නිසි පරිදි ක්‍රියාවේ යෙදවීම අපහසු බව විවාදයෙන් තොරව පිළිගතයුතු සත්‍යයකි...."*
>
> *"ලංකාව වැනි වෙනත් පහසුකම් නැති රටක දැනුම දියුණුකර ගැනීමටද ප්‍රවෘත්ති දැනගැනීමටද දිනපතා වන වැදගත් සිදුවීම් දැනගැනිමටද කෘෂිකාර්මික තොරතුරු ආදිය දැනගැනිමටද ගුවන් විදුලිය තරම් ප්‍රබල මාධ්‍යයක් නැත."*
>
> *"වැඩක් නැති මිනිසුන් සමූහයක් එකරැස් වී සිටින විට බොහෝවිට සණ්ඩු දබර කරගැනීම සිරිතය. ලංකාවේ ගම්වල අපරාධ බෙහෙවින් වැඩිය. හරිහැටි සංවිධානය කරන ලද ගුවන් විදුලි වැඩසටහන් මාර්ගයෙන් මෙම අපරාධ බොහෝ දුරට මැඩිය හැකිය" (කොළඹගේ, 1980, පි.77).*

හාර්පර් විසින් ඉදිරිපත් කරනු ලබන මෙම අදහස ලාංකීය ගුවන්විදුලියේ ඉදිරි ගමන්මග පිළිබඳ දූරදර්ශීව බලා සිදුකරන ලද්දකි. ගුවන්විදුලි මාධ්‍යයේ ප්‍රබලතා ලාංකීය සමාජයට ඵලදායී වන ලෙස භාවිතයට ගතහැකි ආකාරය පිළිබඳ මෙහිදී විස්තර කරනු ලබයි. බහුතර ජන කොට්ඨාසයක් ජීවත්වන ග්‍රාමීය ප්‍රදේශයන් ගුවන්විදුලියේ අනාගත ඉලක්කය විය යුතු බවට මෙමගින් අවධාරණය කරයි. එසේම බටහිර ආකෘතින්ට වඩා ග්‍රාමීය ප්‍රදේශ ඉලක්ක කරගත් වැඩසටහන් ආකෘති ගොඩනැංවීම මගින් ග්‍රාමීය

සමාජය දියුණු කිරීමේ ශක්‍යතාව ගුවන්විදුලිය සතු බව හාර්පර්ගේ විශ්වාසය විය. නමුත් එමගින් නිසි ප්‍රයෝජනය ලබා ගැනීමට නම් විශාල පිරිසකට ගුවන් විදුලියට සවන්දීමේ අවස්ථාව උදාකරදීම වැදගත් වෙයි.

තැපැල්පති ජේ.ආර්. වොල්ටර්ස් විසින් 1936 අප්‍රේල් 06 වන දින මංමාවත් හා කර්මාන්ත අමාත්‍යවරයා වෙත යවන ලද සංදේශයක ගුවන්විදුලිය පිළිබඳ කර ඇති සටහනක මෙරට ගුවන් විදුලියේ ප්‍රාදේශීයකරණය පිළිබඳ අවධානය යොමු කර ඇත.

> *"ගම්බද පාසලක් වැනි ප්‍රසිද්ධ ස්ථානයක් ගුවන්විදුලි යන්ත්‍රයක් සවිකොට නඩත්තුව සඳහා මාස්පතා සුළු මුදලක් අයකොට ගම්වලට ගුවන්විදුලිය ගෙනයාමේ ක්‍රමයක් ගැන ද අදහස් කොට ඇත. එමගින් ඈත පිටිසර වෙසෙන ගම්බද ජනතාවට අධ්‍යාපනය හා විනෝදය ලබාදීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරේ. එබඳු ව්‍යාපරයක් ආරම්භ කිරීමට මත්තෙන් සලකා බැලිය යුතු ප්‍රශ්න ද රැසකි. ඈත ප්‍රදේශවල බැටරි නඩත්තු කිරීම පිළිබඳ ප්‍රශ්නය ඉන් එකකි. ඒ හැර අධ්‍යාපනය හා විනෝදය මුසුකර ගැමියන්ට ගැලපෙන අන්දමේ වැඩසටහන් පිළියෙල කිරීම ඉතා පරිස්සමින් කළ යුත්තකි" (කොළඹගේ, 1980, පි.61).*

ලංකා ගුවන්විදුලියේ ආරම්භක යුගයේ පැවති වැඩසටහන් ආකෘති මගින් පමණක් ඊට පොදු ශ්‍රාවකයා වෙත සමීප වීමේ ඉඩ ප්‍රස්තාවන් සීමිත බව එවකදීම හඳුනාගෙන ඇති බව මෙයින් පැහැදිලි වෙයි. ග්‍රාමීය ප්‍රදේශවල බහුතර ජනතාවගේ අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතා හා විනෝදය ඉලක්ක කරගත් වැඩසටහන් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව මෙම ප්‍රකාශයෙන් අවධාරණය කරයි. ග්‍රාමීය රුචිය දිනා නොගෙන ගුවන්විදුලියට අනාගතයක් නොමැති බව මුල්කාලීන විද්වතුන්ගේ ද මතය විය. එසේ ප්‍රාදේශීය ජනතාව වෙත සමිපවී මේදි පැවති ගැටලුකාරී තත්ත්වයන් ද මෙම සංදේශ තුළ සිහිපත් කරයි. එනම් දිවයිනේ මැද කොටස මුහුදු මට්ටමින් අඩි 8000ක පමණ උස් වූ කඳුකරයක් වන බැවින් ගුවන් විදුලි කටයුතුවලට බාධාවකි. දිවයිනේ බොහෝ පළාත්වලට ගුවන්විදුලිය ශ්‍රවණය වීම දුර්වල වීමට මෙන්ම ශ්‍රවණය නොවීමට මෙම තත්ත්වය ප්‍රබල හේතුවක් විය. අනාගතයේදී ඊට විකල්ප සෙවීමට ගුවන්විදුලියට සිදුවන බවද මෙහිදී අවධාරණය කර ඇත.

ගුවන්විදුලිය වඩාත් දියුණු තත්ත්වයකට පත් කිරීම සඳහා ගතයුතු පියවර පිළිබඳ සොයා බැලීමට ශ්‍රීමත් කන්දයියා වෛද්‍යනාදන් මහතාගේ ප්‍රධානත්වයෙන් 1940 ඔක්තෝම්බර් 28 වන දින පත්කළ කොමිසමේ වාර්තාව ප්‍රධාන නිර්දේශ 21කින් සමන්විත වූ අතර ගුවන්විදුලිය ප්‍රාදේශීයව ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව ද එහිදී අවධානයට ගෙන ඇත.

"ගුවන්විදුලිය විනෝද මාධ්‍යයක් පමණක්ම නොව අධ්‍යාපනය හා ප්‍රවෘත්ති මාධ්‍යයක් වශයෙන්ද රටේ මනා පාලනයක් ඇති කිරීමට මාහැඟි මෙවලමක් ලෙස භාවිතා කළ යුතුය. ලංකාවේ නොදියුණු ප්‍රදේශවල ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට ගුවන්විදුලි මාධ්‍ය යොදාගත යුතුය.

පළාත් පාලන ආයතන ගුවන් විදුලිය තම බලප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා වඩාත් ක්‍රියාකාරී උනන්දුවක් ගතයුතු පමණක් නොව ගම්බද මෙන්ම නාගරික ප්‍රදේශවල පොදු මධ්‍යස්ථානවල ගුවන් විදුලි

යන්ත්‍ර සවි කිරීමට වගබලා ගත යුතුය."

දෙවන ලෝක සංග්‍රාමය හේතුවෙන් මෙම කමිටු නිර්දේශ ක්‍රියත්මක කිරීම කල්ගිය ද ලාංකීය ගුවන්විදුලි ක්ෂේත්‍රය පළාත්බදව ක්‍රියාවේ යොදවනු දැකිය හැකිය.

ඈත පළාත්වල සිට ගුවන්විදුලි විස්තර ප්‍රචාරයන් ඉදිරිපත් කිරීමට ආධාර වන පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි කෙටි තරංග සම්ප්‍රේෂණාගාර හඳුන්වාදීම මෙහිදි ගනු ලැබූ වැදගත් පියවරකි (කරුණානායක, 1990). කොළඹ ගුවන් විදුලිය ආගන්තුක දුෂ්කර පළාත්වල ජනතාවට තම ප්‍රදේශය පිළිබඳ තොරතුරු එහි සිටම ගුවන්විදුලියට ලබාදීමේ හැකියාව මෙමගින් උදාවිණි. මෙය ගුවන්විදුලිය පිළිබඳ පළාත්බද ග්‍රාමීය ජනතාව තුළ උනන්දුව ඇතිකරවීමට සමත්වන පියවරක් විය.

ජන ගී පටිගත කිරිමේ විශේෂ කමිටුව මඟින් ගම්බද ප්‍රදේශවල ජනයා සතු දුර්ලභ ජනගී එකරැස් කොට සංරක්ෂණය කිරිමේ වැඩපිළිවෙළ ද මෙම කමිටු නිර්දේශ මත ක්‍රියාත්මක වූ වැදගත් පියවරකි. ජනගී පටිගත කිරිමේ විශේෂ කමිටුවක් මඟින් ගම්බද ප්‍රදේශවලදී එවැනි ගී 200ක් පමණ පටිගත කිරීම, වෛද්‍යනාදන් කමිටුවේ තවත් විශේෂ නිර්දේශයකි. දිවයින පුරා විසිර සිටින ජනතාව සතුව පවත්නා සංස්කෘතික වටිනාකම් හඳුනාගෙන ඒවා සංරක්ෂණය කිරීමත් රටට හඳුන්වාදීමත් මෙහිදි සිදුකෙරිණි.

> *"මෙම කොමිටියේ වැඩ ක්‍රමානුකූලව ආරම්භ වූයේ 1947 දී මාතර රාහුල විද්‍යාලයේදීයයි කිව යුතුය. තම තමාගේ ගායන තැටිගත කරවා ගැනීමේ බලාපොරොත්තුවෙන් උගත් නූගත් ජනයාගෙන් යුතු විශාල පිරිසක් එහි රැස්ව සිටියෝය. තැටිගත කිරීමට සුදුස්සන් තේරීම කොමිටියේ සාමාජිකයන්ට මහත් දුෂ්කර කාර්යයක් විය. මුළු උදය වරුවම ශිල්පීන් තෝරාගැනීම සඳහා ගතවූ බැවින් තැටිගත කිරීම ආරම්භ කරන ලද්දේ සවස් වරුවේදීය. ජනගී, තොවිල් කවි, මන්තර, සවුදන් ආදී අංක 23ක් තැටිවලට ගන්නා ලදී'' (කොළඹගේ,1980, පි.46).*

මෙමගින් සමාජයේ සැඟව පවතින වටිනා ජනශ්‍රැතික අංගයන් සංරක්ෂණය වූවා පමණක් නොව ගුවන් විදුලි මාධ්‍ය පිළිබඳ උනන්දුවක් හා දැනුමක් ද එම ප්‍රදේශවල ජනතාවට ලැබුණි. ඊට අමතරව කෘෂිකර්මය, ආහාර නිෂ්පාදනය සමුපකාරය, සත්ව පාලනය, කුඩා කර්මාන්ත, සෞඛ්‍ය හා පෝෂණය, රෝග වැලැක්වීම, ස්වස්ථනාව මෙන්ම ග්‍රාමීය ජන ජීවිතයට අවශ්‍ය වන විෂය රැසකට අදාළ වැඩසටහන් සම්පාදනය කෙරිණි. ගුවන්විදුලිය ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත වීමට මෙම පියවර හේතු වූ බව පැහැදිලි වෙයි.

ශ්‍රී ලංකා ගුවන්විදුලියේ වර්තමාන ස්වභාවය හා ඒ පිළිබඳ එල්ල වෙමින් තිබූ චෝදනා පිළිබඳ සොයා බලා වාර්තා කිරීමට 1953 රාජ්‍ය නිතීඥ එන්.ඊ. වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් කොමිසමක් පත් කෙරුණි. එහිදී ගුවන් විදුලිය වැඩි දියුණු කිරීමට කළ යුතු යෝජනා ඉදිරිපත් කිරිමේ කාර්යය ද කොමිසමට පැවරුණි. ඒ අනුව ගුවන්විදුලිය ප්‍රාදේශීයව හා ග්‍රාමීයව ව්‍යාප්ත කිරීම කෙරෙහි වැදගත් යෝජනා රැසක් මෙම කමිටු නිර්දේශ මගින් ඉදිරිපත් කර ඇත. පසුකාලීනව මෙරට ප්‍රාදේශීය සේවා ආරම්භ කළ පසු පවත්වාගෙන යනු ලබන්නේ ද ඊට සමාන වූ වැඩපිළිවෙලකි.

ජාතික සංවර්ධනයේ වැදගත් කොටසක් වන ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය සඳහා ගුවන්විදුලි මාධ්‍ය භාවිතයට ගැනීමෙන් වඩාත් ඵලදායි කාර්යභාරක් සිදුකළ හැකිබව කොමිසමේ නිර්දේශය විය.

එමෙන්ම ගුවන්විදුලියේ සිංහල හා දෙමල භාෂාවෙන් ග්‍රාමීය ජනතාව ඉලක්ක කරගත් වැඩසටහන් සම්පාදනය කිරිමේදී

- ජන ජීවිතයේ විවිධ අංශයන් හා කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා තොරතුරු එම ජනතාව වෙත ගෙන යා යුතුය.
- ජාතික වශයෙන් පවත්නා තත්ත්වයන් හා ගැටලු පිළිබඳ එම ප්‍රදේශවල ජනතාවගේ දැනුම පුළුල් කළ යුතුය.
- එම ජනතාවගේ දෛනික කටයුතු අවසානයේ ඔවුනට විනෝදාස්වාදය ලබාදීමට කටයුතු කළ යුතුය (වීරසූරිය කමිටු වාර්තාව, 1953, පි.88)

දැනට ගුවන්විදුලියේ සමස්ත කාලයෙන් ප්‍රාදේශීය ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් වෙන්කර ඇති ගුවන් කාලය 3.4 ප්‍රතිශතයක් බව පෙන්වා දෙන කොමිසම එය ප්‍රමාණවත් නොවන බවද වැඩසටහන්කරණයේදී අධ්‍යාපනය විනෝදය හා තොරතුරු එම ග්‍රාමීය ජනතාව වෙත සමීප කරවීමේදී කෘෂිකර්මය, ආහාර නිෂ්පාදනය, සහයෝගය, සත්ව පාලනය, ගෘහ කර්මාන්තය, සෞඛ්‍ය හා පෝෂණය, සනීපාරක්ෂාව, ලෙඩ රෝගයන්ගෙන් වැලකීම හා ප්‍රවේසම් විම, ප්‍රජාචාරය, වැඩිහිටි අධ්‍යාපනය, ඉතිහාසය, භූගෝලීය පාරිසරික දැනුම සහ සාමාන්‍ය දැනීම යනාදි ක්ෂේත්‍රයන් විෂයමූලික කරගත යුතු බව අවධාරණය කෙරිණි. එමෙන්ම මෙම වැඩසටහන් ඉතා සරල අත්දැකීමකින් ගැමි ජනතාවට තේරුම්ගත හැකි ආකාරයට ඉදිරිපත් කළ යුතු විය.

තොරතුරු හා උපදේශයන් ලබාදෙන අතරතුර පළාත්බදව ව්‍යාප්ත වී ඇති නාට්‍ය, ජන සංගීතය, ජනශ්‍රැතිය යනාදි සංස්කෘතික අංගයන් භාවිත කිරීම නිර්දේශය විය. ඒ අනුව ඇතැම් වැඩසටහන් ජනතාව සමඟ සෘජුව ගනුදෙනු කරන රාජ්‍ය ආයතනයන්හී නිලධාරීන්ගේ ද මැදිහත්වීම ඇතිව සකස් කිරීම වඩාත් ඵලදායි වෙයි.

වැඩිහිටි අධ්‍යාපනය සම්බන්ධ යුනෙස්කෝ සංග්‍රහයේ වැදගත් කරුණු ගුවන් විදුලිය මගින් වැඩසටහන් සම්පාදනයේදි ප්‍රයෝජනයට ගත යුතු බව කමිටුව නිර්දේශ කරයි. ඒ අනුව ආර්ථිකමය වශයෙන් සංවර්ධනය වීමට අවශ්‍ය වෘත්තීය දැනුම, ගෘහාශ්‍රිතව ජීවත්වීමේදි සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කර ගැනිමට අවශ්‍ය දැනුම ද, පුද්ගල කුසලතා මත ඉදිරිපත් වන කලා කෞෂල්‍යයන්, ස්වාභාවික පරිසරය සමඟ ජීවත්වීමට අවශ්‍ය දැනුම ද, සමහර සංවිධාන නීතිය, පාලනය, ආර්ථිකය යනාදිය එහිදී වැදගත් වේ.

මෙම කමිටුව මගින් ඉදිරිපත් කළ තවත් වැදගත් නිර්දේශයක් වූයේ රටපුරා ව්‍යාප්ත ග්‍රාමීය කලාකරුවන්ට වැඩසටහන් සඳහා සහභාගීවීමට ප්‍රමාණවත් ඉඩප්‍රස්තාව ලබාදීමයි. පටිගතකිරීමේ පහසුකම් සහිත රථයක් ප්‍රාදේශීයව හා ග්‍රාමීයව තැනින් තැන ගොස් සාකච්ඡා, ජනගීත, වැනි සංස්කෘතික

අංග එම ස්ථානයන්හිදී ම පටිගත කරගැනිම අවශ්‍ය බව මෙහිදී අවධාරණය කෙරිණි. මෙතෙක් එම ක්‍රියාවලිය ප්‍රශස්ත මට්ටමකින් සිදු කෙරී නොමැති බවත්, දැනට ග්‍රාමීය කලාකකරුවන් ඈත දුෂ්කර ග්‍රාමීය පළාත්වල සිට කොළඹ ප්‍රධාන මැදිරියට කැඳවීම ඔවුන්ට ඉතා දුෂ්කර බවත් මෙහි සඳහන් වෙයි. එබැවින් ප්‍රාදේශීය වශයෙන් පටිගත කිරිමේ මධ්‍යස්ථාන පිහිටුවීම කමිටුවේ නිර්දේශය වූ අතර යාපනය, අනුරාධපුරය, නුවර, බදුල්ල, මඩකලපුව සහ මාතර යන ප්‍රදේශ ඒ සඳහා නම්කරන ලදී.

අන්තර් පළාත් සහ අන්තර් දිස්ත්‍රික් වශයෙන් සංවිධානය කෙරෙන නාට්‍ය, සංගීත තරග මගින් දක්ෂ කලාකරුවන් හඳුනාගැනීමට මෙන්ම ඔවුන්ගේ කුසලතා හෙළිකරගැනීමට ද හැකිවන අතර ඒවා සංවර්ධනය කරගැනීමට ගුවන්විදුලිය මගින් විශාල දායකත්වයක් ද සැපයිය හැකිය. එමෙන්ම දිස්ත්‍රික්ක ඉලක්ක කරගනිමින් සම්පාදනය කරනු ලබන විශේෂිත වූ වැඩසටහන් මගින් ද ග්‍රාමීය ජනතාව තුළ ගුවන්විදුලිය පිළිබඳ උනන්දුව වැඩිදියුණු කළ හැකිය. ප්‍රාදේශීය විශේෂතා හඳුනා ගනිමින් ඔවුන් නියෝජනය කෙරෙන පරිදි නිෂ්පාදනය කෙරෙන වැඩසටහන් සඳහා එම ප්‍රදේශයන්හී ඉහළ ප්‍රතිචාර හිමිවන අතර එයට රටේ සමස්ත ජනතාව ද කැමැත්තක් දක්වනු ඇති බවට මෙම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

වීරසූරිය කොමිසමේ මෙම නිර්දේශයන් ක්‍රියාත්මක තලයට රැගෙන ඒමට අපොහොසත් වුවද උක්ත බොහොමයක් නිර්දේශ තුළ ගැබ්ව ඇත්තේ ගුවන් විදුලිය ප්‍රාදේශීයව හා ග්‍රාමීය වශයෙන් ශ්‍රාවකයා තුළට ව්‍යාප්ත වීමේ අවශ්‍යතාවයි. එහිදී කොළඹ කේන්ද්‍රීය ගුවන් විදුලියට මුහුණදීමට සිදුවන සීමාවන් පිළිබඳ මනා අවබෝධයක් මෙම කමිටුවට පැවති බව නිර්දේශයන් ඉතා සැලකිල්ලෙන් විමසා බැලිමේදී පැහැදිලි වෙයි. ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාවක් ආරම්භ කිරීම පිළිබඳ සෘජු ප්‍රකාශයක් මෙම නිර්දේශ තුළ නොමැති වුව ද පසුකලෙක එවැනි පියවරකට යොමුවීමට අවශ්‍ය මූලික පසුබිම මෙම නිර්දේශයන් මගින් ගොඩනගා ඇත. 1954 වසරේ මාර්තු මස මෙම කොමිසමේ සාමාජිකයන් තිදෙනෙකු ඉන්දියාවේ නව දිල්ලි නුවර සමස්ත ඉන්දීය ගුවන්විදුලියේ (All India Radio)සහ මදුරාසි හා ට්‍රිචිනොපොලි හි පිහිටි ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථානය වෙත යොමුකර ඔවුන්ගෙන් ලබාගත් තොරතුරු මෙම නිර්දේශය සැකසීමේදි සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ඉන්දීය ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා සංකල්පය මෙරට ගුවන්විදුලියේ ප්‍රාදේශීය ව්‍යාප්තිය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරිමේදි විරසූරිය කොමිසම විසින් උපයෝගි කරගැනීම ද විශේෂත්වයකි.

1966 වසරේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනතේ සඳහන් වන පරිදි සංස්ථාව ක්‍රියාත්මක වන ස්වරූපය පිළිබඳ 3(1)a වගන්තිය මඟින් පැහැදිලි කරයි.

> *''මහජන යහපත ඉලක්ක කරගනිමින් කලින් කල සංවර්ධනය කරමින්ද, සේවා ව්‍යාප්ත කරමින්ද, වඩාත් යහපත් බවට පත් කරමින්ද රට තුළ ගුවන්විදුලි සේවා පවත්වාගෙන යාම'' ලාංකීය ගුවන් විදුලිය ක්‍රියාත්මක වීමේ ක්‍රමවේදයයි. (S.L.B.C. Act 1966, P.13).*

මහජන යහපත ඉලක්ක කොට ගනිමින් ගුවන්විදුලිය ව්‍යාප්ත කිරීම පිළිබඳ මෙහි සඳහන් කර ඇති අතර එය පසුකාලීනව ප්‍රාදේශීය සේවා ආරම්භ කිරිමේදී ගුරුකොටගත් මූලධර්මයකි. විශේෂයෙන් සියලු ජන කොටස් කෙරෙහි බලපවත්නා ජාතික යහපත වෙනුවෙන් ක්‍රියාකරන අතර විවිධ ජනකොටස්

වෙනුවෙන් පොදුජන යහපත ඉටුකිරිමේදී ගුවන් විදුලිසේවා ව්‍යාප්ත කිරීමට පියවර ගැනිමට මෙම පනත ක්‍රියාත්මක වී දස වසරකට පමණ පසු අවධානය යොමු කරන ආකාරය දැකිය හැක.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙකු වූ නෙවිල් ජයවීර මහතා නව සංස්ථාව යටතේ ගුවන් විදුලි ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්යය සිදුකරන ලදී. එහිදී ඔහු වාර්තා කරනු ලැබුවේ

> *"දිවයින පුරා විසිර සිටින කුසලතා පිරි ශිල්පීන් සොයා වැඩසටහන් වලට සම්බන්ධ කරගැනිමට විධිවිධාන යොදා ඇති අතර, මධ්‍යම තරංග ගුවන් විදුලි වැඩපිළිවෙලක් දියත් කිරීමට සැලසුම් කොට ඇත. ග්‍රාමීය ශ්‍රවණ තත්ත්වය නගාලීමටත්, ප්‍රාදේශීය ගුවන්විදුලි සංවර්ධනය ඇතිකරලීමටත් දිවයින පුරා මධ්‍යම තරංග විකාශනාගාර 08ක් ඇති කිරීමටත් පියවර ගෙන ඇත. දීප ව්‍යාප්ත පර්යේෂණයක්ද අරඹා ඇත"* යනුවෙනි (කරුණානායක, 1990, පි.113).

ලංකා සිවිල් සේවයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ නෙවිල් ජයවීර මහතා ගුවන්විදුලිය ග්‍රාමීය ජනතාවට සමීප කරවමින් සමාජ සංවර්ධනය උදෙසා එය යොදා ගත යුතු ආකාරය පිළිබඳ විවිධ අත්හදාබැලිම් සිදුකළ අයෙකි.

- ග්‍රාමීය අසන්නන්ගේ සමාජ සංවිධානය කිරීම
- ගුවන්විදුලි ගොවි සමාජ අතර තරග සංවිධානය කිරීම
- සරල භාෂාවක් යොදාගනිමින් ජනතාවගේ එදිනෙදා ගැටලු සාකච්ඡා කිරීම

යනාදී පියවර මඟින් ගුවන්විදුලිය ග්‍රාමීය ජනතාව අතර වඩාත් ප්‍රචලිත මෙන්ම වඩාත් ඵලදායී මාධ්‍ය මෙවලම් බවට පත්විය. ගුවන්විදුලියේ සියලු වැඩසටහන් නිෂ්පාදනය කිරිමේදී කෘෂිකාර්මික සංවර්ධනය ඉලක්ක කරගනිමින් මෙරට වගා ව්‍යාපාරයට ජනතාව පොළඹවාලීමේ වගකීම ගුවන් විදුලිය වෙත පවරා ගන්නා ලදී.

> *''ජාතික සංවර්ධන සැලැස්ම ගැන ගුවන්විදුලි මාධ්‍ය තුළින් මූලික වශයෙන් අවබෝධයක් හා හැඟීමක් ජනතාව අතර ඇති කිරීමෙන් පසුව ගැමියන් හා ගැමි කණ්ඩායම් අතර තරග සංවිධානය කිරීම හා උනන්දුව අඛණ්ඩව පවත්වාගෙන යා හැකි බවත් මුලදී ඇති කළ අවබෝධය මධ්‍යම තරංග විකාශන භාවිත කොට ප්‍රාදේශීය මට්ටමින් සිදු කළ යුතු බවත් ජයවීර මහතාගේ අදහස විය.'' (කරුණානායක, 1990, පි.128).*

රාජ්‍ය අමාත්‍ය ආනන්ද තිස්ස ද අල්විස් මහතා 1978 සැප්තැම්බර් 25 වන දින ගුවන්විදුලි සංස්ථා මණ්ඩලය සමඟ කළ සාකච්ඡාවේදී මෙරට ගුවන්විදුලිය පිළිබඳ කරුණු කිහිපයක් පිළිබඳ අවධානය යොමු කරන ලදී. එනම් කොළඹින් පමණක් ගුවන්විදුලි ප්‍රචාරක කටයුතු සිදු කිරීමෙන්

- ප්‍රාදේශීය වශයෙන් වැදගත් කරුණුවලට තැනක් දීමට නොහැක.
- පළාත්වලට පමණක් ආවේණික වූ විවිධ සංස්කෘතික අංගයන් පොදු මහජනතාවගේ දැනගැනීම පිණිස එළිදරව් කිරීමට නොහැක.
- ගම්බදව සැඟවී ඇති සහජ කුසලතා ජනතා අවධානය පිණිස ගෙන ඒමට නොහැක.

ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලිය වන රජරට සේවය 1979 අප්‍රේල් මස 02 දින විවෘත කරමින් ගුවන් විදුලියේ එවකට සභාපති ඒමන් කාරියකරවන මහතා ප්‍රකාශ කළේ,

"ජනතාව ගුවන්විදුලිය වෙත ගෙනයනවා වෙනුවට ගුවන්විදුලිය ජනතාව වෙත ගෙනයාම පිළිබඳ මුලින්ම අදහස ඉදිරිපත් කළේ රාජ්‍ය අමාත්‍ය ආනන්ද තිස්ස අල්විස් මහතායි. පළමු ප්‍රචාරක ස්ථානය රජරට පිහිටවිය යුතුයැයි ද එතුමා තරයේ කියා සිටියා." (HSB 2012 තැටිය).

1993 වසරේ ජුනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා විසින් සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වෙත යවනු ලබන ප්‍රාදේශීය හා ප්‍රජා ගුවන්විදුලි සේවා පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවේ ප්‍රාදේශීය සේවා ආරම්භ කිරීමේ අරමුණු පිළිබඳ සඳහන් කරයි.

1. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සිය ප්‍රාදේශීය සේවා ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ කොළඹ පිහිටි ගුවන් විදුලි මයික්‍රොෆෝනය ඈත ගම් දනව් කරා ගෙනයාමත් එමඟින් රටපුරා විසිරී සිටින ශ්‍රාවක පිරිස් දැනුවත් කිරීමත් රටේ වේගවත් සංවර්ධන ක්‍රියාදාමයකට ජනතාව සහභාගී කරගැනීමත්, ලොවපුරා දිනපතා ඇති අලුත් පුවත් ඔවුන් වෙත ගෙනයාමත් වෙයි.
2. මෙම ප්‍රාදේශීය සේවා මඟින් දිවයින පුරා විසිරී සිටින කලාකරුවන්ට, සංගීතඥයන්ට, නාට්‍යකරුවන්ට, විවිධ ක්ෂේත්‍රවල නියැලුණු අයට ඔවුන්ගේ දක්ෂතා අනුව ගුවන්විදුලි වැඩසටහන්වලට සහභාගී වීමේ අවස්ථාව සලසා දීම.
3. ප්‍රාදේශීය සේවා හී ප්‍රචාරය වන වැඩසටහන් එම ශ්‍රවණ කලාපයන්හී සම්පත් උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ඉදිරිපත් කිරීම හා ශ්‍රාවක පිරිස්වල අවශ්‍යතා අනුව සැලසුම් කොට ඉදිරිපත් කිරීම.
4. දුෂ්කර පළාත්වල සිටින ශ්‍රාවකයන්ට හොඳ ශ්‍රවණ තත්ත්වයක් ලබා දිම.
5. ජනතාව වඩ වඩාත් ගුවන්විදුලියට සමීප කරගැනීම
6. අධ්‍යාපනික වැඩසටහන් ප්‍රචාරය මඟින් ප්‍රදේශයේ ජනතාවගේ දැනුම වර්ධනයට කටයුතු කිරීම
7. වෙළෙඳ වැඩසටහන් හා දැන්වීම් ප්‍රචාරය කිරීම මඟින් ප්‍රාදේශීය ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින අයට අවශ්‍ය ප්‍රචාරණ කටයුතු ඉතා අඩු මුදලකට ලබා දීම.

මෙතෙක් ජාතික ගුවන්විදුලිය ක්‍රියාත්මක වූ ස්වරූපයෙහි පැවති යම් යම් දුර්වලතා හඳුනාගෙන තිබුන ද ඒවා නිවැරදි කරගැනීම සඳහා ජාතික ගුවන්විදුලියට තිබූ අවම හැකියාවන් පසෙකලා ප්‍රාදේශීය ගුවන්විදුලිය රට පුරා ව්‍යාප්ත වෙයි. සංදේශ සහ තොරතුරු ඉහළ සිට පහළට පමණක් ගලායාමත් සංකීර්ණ වූ ග්‍රාහක සමාජයේ අනන්‍යතා මෙන්ම අවශ්‍යතා පිළිබඳ ජාතික ගුවන්විදුලියට තිබූ අඩු අවබෝධයත් මත සැලසුම් කළ වැඩසටහන් ගුවන් විදුලිය අපේක්ෂා කළ අරමුණු ඉටුකරලීමට සමත් නොවීය. එමෙන්ම රටපුරා සිදුවන සංවර්ධන ක්‍රියාදාමයේ ස්වරූපය මෙන්ම ඊට ලැබිය යුතු ජනතා සහය පිළිබඳ අවබෝධයත් ජාතික ගුවන්විදුලිය සතු නොවීය. සිය අසන්නන්ගේ ජීවිත ප්‍රගතිය මෙන්ම ඔවුන්ගේ දිළිඳුකම, රැකියා හිඟය, නූගත්බව, මන්දපෝෂණය, බෝවන රෝග, පරිසර දූෂණය, ජනතා සිතුම් පැතුම්, චර්යා පද්ධතිය, සංස්කෘතිය, කලාව හා ඔවුන්ගේ නිර්මාණ කුසලතා හඳුනාගැනිමේ මෙන්ම සංවර්ධනය කිරීමේ නිසි ක්‍රමවත් වූ වැඩපිළිවෙලක් ගොඩනැංවීමට ජාතික ගුවන්විදුලියට කළ හැකි මෙහෙවර සීමාසහිත වී පැවතුණි. ඒ අනුව ප්‍රාදේශීය වශයෙන් ජීවත්වන ශ්‍රාවකයන්ගේ ''හද ගැහෙන රාවය'' හඳුනා ගනිමින්, ඊට උචිත තේමා නිර්මාණය කරගන්නා ගුවන් විදුලියක අවශ්‍යතාව ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා ආකෘතිය මගින් ඉටුකර ගැනිමට අපේක්ෂා කෙරිණි. ඒ අනුව ප්‍රාදේශීය ජනතාවගේ අත්දැකීම් හුවමාරු වන, ඔවුනට වඩාත් සමීප, සරල පැහැදිලි සමීප බසකින් අමතන, ඔවුන්ගේම ආකෘතිය මත ගොඩනැගෙන වැඩසටහන් අන්තර්ගතයකට ශ්‍රාවකයා යොමු කරවීම ප්‍රාදේශීය ගුවන්විදුලියේ අරමුණ බවට පත්විය.

මූලාශ්‍ර

කරුණානායක, එන්. (1990). *හැටහය වසරක ගුවන්විදුලිය.* මොරටුව : ජන කේන්ද්‍රය.

කොළඹගේ, ඩී. එම්. (1980). *ගුවන්විදුලි වංශය.* කොළඹ : එම්. ඩී. ගුණසේන සමාගම.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත, 1966

HSB 2012 තැටිය, තැටි පුස්තකාලය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07.

พาทิดวิภาพ หา วิฐาทิพ

22

සෞඛ්‍ය සන්නිවේදනය සංස්කෘතිය සහ චර්යා වෙනස්කම්

මාපා තිලකරත්න

සෞඛ්‍ය සන්නිවේදනය යනු විශාල ජනකොටසකගේ සෞඛ්‍ය පුරුදු ක්‍රමාණුකූලව ධනාත්මක කිරීම සඳහා යොදාගන්නා වූ සන්නිවේදන ක්‍රියාවලියකි. ඔවුන්ගේ සෞඛ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් වැඩි වර්ධනය කිරීම සහ ඒවා උසස් සෞඛ්‍ය තත්ත්වයන් බවට හැරවීම මෙම සෞඛ්‍ය සන්නිවේදන ක්‍රියාවලියෙහි ප්‍රාථමික අරමුණයි. එසේ වුව ද මෙම ක්ෂේත්‍රයෙහි, කාර්යයෙහි නියැලී සිටින බොහෝ වෘත්තිකයින් මෙය සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක කිරීමේදී සෞඛ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍ය සන්නිවේදනය, සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ තොරතුරු, අධ්‍යාපන සහ සන්නිවේදනය යනාදී අංශවල නියමයන් සම්බන්ධයෙන් යම් යම් වෙනස් කිරීම් සිදුකිරීම නිසා යම් පැටලිලි ස්වභාවයක් ද හටගෙන ඇත. මෙහිදී අප භාවිත කරන සන්නිවේදකයා යන වචනයෙන් හඳුන්වන පුද්ගලයා මෙම විෂය ක්ෂේත්‍රය තුළ සුවිශේෂ පුහුණුවක් ලත් කෙනෙකු ලෙස නොසැලකේ. එනමුත් යහපත් සෞඛ්‍ය පුරුදු ඇති කිරීම සඳහා වන මෙම සන්නිවේදන වැඩසටහනට ඕනෑම මහජන සෞඛ්‍ය වෘත්තිකයකු හට සම්බන්ධ වී වැඩ කළ හැකි ය.

ඵලදායී සෞඛ්‍ය සන්නිවේදනය යනු කලාවේ සහ විද්‍යාවේ සම්මිශ්‍රණයකි. එසේ වුවද ලැබූ සාර්ථකත්වයට හේතු වූ කාරණා අතර ප්‍රධාන කාරණාවන් වන්නේ මහජන සෞඛ්‍ය ප්‍රශ්න වලට ඵලදායී වශයෙන් විද්‍යාත්මක සහ සෞඛ්‍ය සන්නිවේදන විධික්‍රම ක්‍රමාණුකූලව භාවිත කිරීම ය. එනමුත් සෞඛ්‍ය සන්නිවේදනයේ වර්ධනයට උපකාරවන නියම සන්නිවේදන උපායමාර්ග සිත් ඇදගන්නා සුළුය. ඒවා රටකින් රටකට වෙනස් ය. මේ සඳහා ක්‍රියාවේ යොදවන විධික්‍රමයන් ද සමාන ය. එනමුදු එක් එක් රටවල සංස්කෘතික සබඳතා සහ ඕනෑ එපාකම් සැබෑ වශයෙන්ම පරාවර්තනය වන පරිදි සන්නිවේදන වැඩසටහන් සම්පාදනය කිරීම දුෂ්කර ය.

සෞඛ්‍ය සන්නිවේදකයින් සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විකල්ප සවන්දීමකට හා පර්යේෂණ කිරීමට සහ ඒ අනුව පියවර ගැනීමට එකඟ විය යුතු ය. සන්නිවේදකයා සමාජය හරහා කථිකාවකට අවතීර්ණ වෙමින් ඉලක්කගත පිරිසක නියෝජිතයින් සමඟ ක්‍රමාණුකූලව පර්යේෂණයක්

සිදුකරයි. සමූහ අවශ්‍යතා මත පදනම් වූ සන්නිවේදන උපායමාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාකාරකම්, සංස්කෘතික සම්බන්ධතා සහ පුහුණුවීම් ආදී අදාළ ඇගයීම් අවශ්‍යතාවන් සඳහා පළමුව අප සමූහයට සවන්දිය යුතු ය. උපායමාර්ග, නියැදි සහ අනෙකුත් ද්‍රව්‍ය ජනසමාජය වෙත මහාපරිමාණයෙන් බෙදාහැරීමට පෙර අප විසින් ඒවා මනාව පරීක්ෂා කළ යුතු ය. නිශ්චිත කාලසීමාවක් තුළ සමූහයා වෙත අපගේ අවධානය යොමු කරමින් සවන් දෙමින් නිරීක්ෂණය කිරීමෙන් සහ එම පදනම මත සමූහයේ සාමාජිකයින්ගේ ප්‍රතික්‍රියා, වෙනස්කම් මෙන්ම අවශ්‍ය සන්නිවේදන උපායමාර්ග සහ ක්‍රියාකාරකම් පිළිබඳව ද විමසා බැලිය යුතුය. මෙම පර්යේෂණ සංයුතිය සහ එහි ප්‍රතිචාරය ''සේවාලාභියා රියැදුරු අසුනට දැමීමක්" වන අතර එය විශේෂයෙන්ම සේවාලාභියාගේ අවශ්‍යතාවයන්ට වගකියන සන්නිවේදන උපායමාර්ග සෑදීමක් ද වන්නේ ය. ඒ සඳහා සන්නිවේදන විධික්‍රම පියවර පහක් ඇතුලත් ය. එනම්,

- තුලනය
- සැලසුම්
- පෙර පරීක්ෂාව
- බෙදාහැරීම
- මෙහෙයවීම යනාදියයි.

මෙලෙස සෞඛ්‍ය සන්නිවේදනය වෙත අවතීර්ණ වීමේ දී එනම් සමාජීය අලෙවිකරණය, මානව විද්‍යාව, චර්යා විශ්ලේෂණය, ප්‍රචාරය කිරීම, සන්නිවේදනය, අධ්‍යාපනය සහ අනෙකුත් සමාජ විද්‍යාවන් ඇතුළු විවිධ සමාජ ශික්ෂාවන් මගින් සෞඛ්‍ය සන්නිවේදනය උත්පාදනය වන බව පෙනී යයි. මෙම ශික්ෂාවන් එකිනෙක ඌන පූරණය කෙරමින් පොදු මූලධර්ම සහ ශිල්පක්‍රම බෙදාගැනේ. සන්නිවේදන විධිවිද්‍යාවට මෙම සෑම ශික්ෂාවක්ම විශිෂ්ට දායකත්වයක් ලබාදේ. මෙහිදී සන්නිවේදන විධිවිද්‍යාව තුළ මානව විද්‍යාව, සමාජ අලෙවිකරණය, චර්යා විශ්ලේෂණය මතුවී පෙනේ. සැලසුම්කරුවාට මානව විද්‍යාව සහය වෙයි. සෞඛ්‍ය අමාත්‍යංශය, රාජ්‍ය නොවන සංස්ථා, සාමූහික කණ්ඩායම් ජනතාවගේ සංස්කෘතික ලක්ෂණ ඇතුළු විශ්වාස සහ චර්යාවන්ට ගැලපෙන ඔවුන්ගේ භාෂාවට හා වටිනාකම්වලට අනුරූප වැඩසටහන් ඉලක්කගත සමූහය වෙත ඉදිරිපත් කළ යුතුය. සෞඛ්‍ය පුහුණුව සහ අදාල ආම්පන්න වර්ධනය කිරීමට නිර්මාණාත්මක සංවිධිත උපායමාර්ග ක්‍රියාවලියක් සමාජීය අලෙවිකරණය තුළින් සැපයේ. එමගින් අවධානය යොමු කරන්නේ චර්යාධර්ම විශ්ලේෂණය මගින් සෞඛ්‍ය සන්නිවේදනයට දක්වන දායකත්වය පිළිබඳව ය.

භාවිත චර්යා ධර්ම විශ්ලේෂණය : මිත්‍යාව සහ යථාර්ථය

චර්යා ධර්ම විශ්ලේෂණය යනු චර්යා ධර්ම විද්‍යාව තුළ සුවිශේෂ සමාජ චර්යාවන් පර්යේෂණාත්මක ව විශ්ලේෂණය කර සංවර්ධනය කිරීම හා වෙනස් කර යළි නිෂ්පාදනය කිරීමට යොදාගන්නා ප්‍රායෝගික ක්‍රියාවලියකි. තවද චර්යා ධර්ම විශ්ලේෂණය ශික්ෂාවක් ද වන අතර චර්යා ධර්ම සහ (පුද්ගලාන්තර සහ ශාරීරික) පරිසරය අතර සම්බන්ධතාවය නවීකරණය කිරීම යනාදියත් එකිනෙකා අතර වැඩි වශයෙන් ක්‍රියාත්මක කළ හැකි නව චර්යා ධර්ම ප්‍රතිග්‍රහණය කිරීමත් අදහස් කෙරේ.

සෞඛ්‍ය සන්නිවේදනයට අදාළ වන චර්යා ධර්ම විශ්ලේෂණය සඳහා භාවිත කළ හැකි මූලධර්ම සතරක් මෙහි දැක්වේ.

1. බොහෝ චර්යා රටා පිළිබඳ උගත හැක්කේ සංස්කෘතික, සමාජ ආර්ථික සහ පුද්ගලික හැදෑරීම් මගින් වන අතර නැවත ඉගෙනීමෙන් හෝ නොදන්නාකම නිසා හෝ නව චර්යා රටාවන් හඳුන්වා දීම මගින් තනි තනි වශයෙන් නව සෞඛ්‍ය පුරුදු ප්‍රතිග්‍රහණය කිරීමට උගත හැකි අතර දැනට භාවිත වන දේ වඩාත් බල සහිත කිරීම.

2. සමාජීය හා භෞතික පරිසරය තුළ සිදුවීම් හා ප්‍රතිචාර (පූර්වාගත සහ ප්‍රතිවිපාක) මගින් චර්යාවන්ට ඇතුළුව සෞඛ්‍ය-ආශ්‍රිත චර්යා හැඩගැස්සීම. මෙහි තත්ත්වයන් වෙනස්වීම මගින් ද පුද්ගල චර්යා වෙනස් විය හැකි ය. මෙතෙක් ලද ප්‍රතිවිපාක ප්‍රයෝජනයට ගනිමින් ජනතාව වඩා යහපත් සෞඛ්‍ය පරිසරයකට තල්ලු කිරීම සන්නිවේදන උපායමාර්ග උපකාරීවන අතර කාලෝචිත පුහුණු කිරීම් තුළින් පෙර පුරුදු වෙනස් කිරීම කළ යුතුය. තනි තනි වශයෙන් මෙන්ම සංවිධානාත්මකව ද යහපත් පරිසරයක් ගොඩනැගීමෙන් සෞඛ්‍ය පුහුණුකිරීම් වලට සහය දැක්විය හැකි ය.

3. චර්යා ධර්ම පාලනය හැදෑරීමට අවශ්‍ය කරන තරම් වැඩි කාලයක් නව චර්යා පිළිබඳව පාරිසරික තත්ත්වයන් හැදෑරීමට අනවශ්‍ය ය. අපේක්ෂිත සමූහයකට හඳුන්වාදීමට සහ ඉගැන්වීමට සැලසුම් කෙරෙන නව චර්යාවන් පිළිබඳ වැඩසටහන් සෞඛ්‍ය ප්‍රගුණ කිරීම්වලට ආදේශ කළ හැකි දිගු කාලීන පැවැත්මක් සහිත සංවර්ධනය කළ විවිධ උපායමාර්ග වලින් සමන්විත විය යුතුය.

4. රාජ්‍ය තුළ පවතින දැනුම හා විශ්වාස පිළිබඳ ව අනුමාන වශයෙන් දැනගත හැක්කේ එහි ජනතාව කරන දෑ හෝ කියන දෑ නිරීක්ෂණය කිරීමෙන් පමණි. අපේක්ෂිත චර්යා වෙනසක් සිදු කළ හැකි සන්නිවේදන වැඩසටහන් ඍජුවම එල්ලවිය යුත්තේ එම චර්යාවන් මතට විය යුතු අතර සාමාජික සහ භෞතික පරිසරයේ (නිරීක්ෂණ අවස්ථා) සහය ද ලැබිය යුතුය. දැනුම සහ ගතිපැවතුම්වල වෙනස්කම් සිත්ගන්නා සුළු නමුදු ඔවුන් චර්යා ධර්ම වෙනසක් සඳහා යෝජනා කළ හැකි මට්ටමේ ප්‍රාථමික යාන්ත්‍රණයක් නොවේ.

ළමා ජීවිතය සඳහා වන සෞඛ්‍ය සන්නිවේදනයේ දී අප භාවිත කරන චර්යා විශ්ලේෂණ පළමුව අපේක්ෂිත චර්යාවන්ට යොමු වීමට සහය වන අතර ඍජු ප්‍රමාණවත් ප්‍රතිඵල ලැබීමට හැකි උපාය මාර්ග සැලසුම් කළ යුතු ය. එමගින් යෝජනා කරන්නේ සෞඛ්‍ය සන්නිවේදනය විධික්‍රමාවලියේ ඇති සියලුම වහා සිදුකළ යුතු බලපෑම් කළ හැකි ප්‍රායෝගික පියවර සියල්ල ගැනීමයි. සෞඛ්‍ය සන්නිවේදනය මගින් ඇසට පෙනෙන චර්යා වෙත ලඟා වෙද්දී විභාග කිරීම සඳහා අපට ලබාදෙන මූලික දෙය වන්නේ සෞඛ්‍ය චර්යාවන් සහ ඒවායේ පෙර සිදුවීම් සහ පසු සිදුවීම් වල සමීප සම්බන්ධතාවය යි. සංකීර්ණ සෞඛ්‍ය ක්‍රියාමාර්ග දෙස සූක්ෂම දර්ශකයකින් බැලුවිට ඔවුන් සමාජ හා සංස්කෘතික පරිසරයට කෙරෙන බලපෑම හඳුනාගත හැකි ය. විශේෂයෙන්ම අපි වඩාත් අවබෝධකරගත යුත්තේ කුමන පරිසර වලදී චර්යාවන් මෙහෙයවන්නේ ද සහ සෞඛ්‍යානුකූල චර්යාවන්හට සහයෝගය ලැබෙන සංස්කෘතික වශයෙන් ගැළපෙන සෞඛ්‍ය සහ සමාජ ක්‍රියාවලීන් මොනවාද යන්න කෙරෙහි ය.

චර්යා ධර්ම විශ්ලේෂණය සම්බන්ධයෙන් බොහෝ දුර්මත සහ ඒකාකෘතීන් තිබේ. සමහර මිනිසුන් විශ්වාස කරන්නේ එය ප්‍රජාතන්ත්‍ර විරෝධී යාන්ත්‍රික පිවිසුමක් ලෙසයි. එය වැඩසටහනක් තනි තනි වශයෙන් මෙහෙයවීමෙන් යෝජිතව නිර්මාණය වන්නකි. චර්යා විශ්ලේෂකයා සියලු රහස්‍ය දෑ මහජනතාවට දැන ගැනීමට පත් නොකිරීමට වගබලා ගනී. කෙසේ වුවද මෙය විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයන් වන සහ නොවන අයගේ නිර්දේශ මත සෑදුණු මූලධර්ම සහ තාක්ෂණයෙන් සෑදුනකි. ගත වූ වසර 12ක පමන කාලයක් රටවල් 20ක ට වැඩි සෞඛ්‍ය වෘත්තිකයන් සහ වැඩසටහන් අධ්‍යක්ෂකවරුන්ගේ සිට සායනික කම්කරුවන් දක්වා පිරිසක් සෞඛ්‍ය සන්නිවේදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මෙම මූලධර්ම ඉතා මැනවින් හදාරා ඇති අතර ඔවුන් සිය රටවල ජනතාවට සෞඛ්‍යානුකූල ජීවිතයක් ගතකිරීමට සහය වෙමින් සිටී.

චර්යා විශ්ලේෂණ ක්‍රමය තවත් අය විශ්වාස කරන්නේ ඉතා සරළ සහ ලඝු දෙයක් ලෙස ය. මක්නිසාද යත් ප්‍රාථමික වශයෙන් කෙරෙන නිරීක්ෂණයන් සහ තනි තනි වශයෙන් චර්යාවන් මැනීමයි. බැලූ බැල්මට එහි ඇති මානසික ක්‍රියාවලිය සහ සමාජ සංස්කෘතික බලපෑම හැදෑරිය යුතු වේ. එකිනෙකාගේ චර්යා රටාවන් ගැන චර්යා විශ්ලේෂකයාගේ අවධානය යොමු වන අතර පුළුල් පාරිසරික විසඳුම් අන්තර්ගත කරයි. සංස්කෘතික බලපෑම්, සාමාජික ප්‍රතිමාන සහ සාමාජික මැදිහත්වීම් තුළින් කෙරෙන වෙනස්කම් සහ චර්යාවන් පවත්වාගෙන යයි. සාමාජික වෙළඳ පොළ සහ මානවවේදයේ මූල ධර්ම හා තාක්ෂණ විධි සහය වන අතර සාමාජීය සහ සංස්කෘතික බලපෑම් සහ හැසිරීම් සැලසුම් කරමින් සහ පාලනය කරමින් සන්නිවේදකයා සන්නිවේදන වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

අපේ අත්දැකීම්වලට අනුව ජනතාව දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒකාකෘතීන් නොසලකා හැරීම හා ඔවුන් කිසිම න්‍යායාත්මක සන්නිවේදන සහ චර්යාවන් ගැන නොදැන සිටීම චර්යා විශ්ලේෂකයාගේ එදිනෙදා වැඩවලට පහසු ය. මානවවේදය හෝ සාමාජික වෙළඳ පොළෙහි වෘත්තිකයන් සන්නිවේදන වැඩසටහන්වලදී බොහෝ නිපුණතා පුහුණු හෝ වෙරගැන්වීමේ වැඩසටහන් වලට දායක කරගෙන තිබේ. සෞඛ්‍ය අධ්‍යාපන, සාමාජික වෛද්‍ය හෝ කෘෂිකර්මාන්තයෙහි නියැලි වෘත්තිකයන් සෘජුවම චර්යා විශ්ලේෂකයින් අගය කරයි. සෞඛ්‍ය සන්නිවේදන අත්දැකීම් වලට අනුව චර්යා විශ්ලේෂකයින් සහ අනෙකුත් ක්ෂේත්‍රවල වෘත්තිකයින් ගේ සහයෝගයෙන් මෙම අන්තර් ක්ෂේත්‍ර කෝවෙහි බලපෑම මත එය පිරිපහදු කිරීම සිදුවිය යුතු ය.

සාරාංශය

සෞඛ්‍ය සන්නිවේදනයට දරුවන්ගේ චර්යා රටා වෙනස් කිරීමට අදාළ ව වැදගත් භූමිකාවක් ඉටුකළ හැකියි. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල විවිධ රෝග පාලනය හා ප්‍රතිශක්තීකරනයට අදාල විවිධ සංස්කෘතික ක්‍රියාකාරකම් සිදුකළ හැකි ය. චර්යා විශ්ලේෂකයා මේ සඳහා අවශ්‍ය ආම්පන්න සහ ක්‍රමවේදයන් නව චර්යා සහ තාක්ෂණය මගින් හඳුන්වා දෙයි. නව ධනාත්මක චර්යා ධර්ම වෙනස්කම් ජනතාව විසින් හඳුනාගෙන පවත්වාගෙන යෑමේ ඇති එලය ගැන ප්‍රශ්න කෙරේ. චර්යා ධර්ම වෙනස් කිරීම ගැන සාර්ථක අත්දැකීම් තුළින් පැවසෙන්නේ ධනාත්මක සෞඛ්‍ය පුරුදු පවත්වාගෙන යාමට චර්යා විශ්ලේෂකයාගේ සංවර්ධන ක්‍රමෝපායන් ඉතා වැදගත් වන බවයි. අනාගත සෞඛ්‍ය සන්නිවේදන

වැඩසටහන් මගින් තවදුරටත් චර්යා ධර්ම ආශ්‍රිත උපාය මාර්ග වැඩදායක ලෙස පවත්වාගෙන යාම කෙරෙහි සෞඛ්‍ය සන්නිවේදකයින්ගේ අවධානය යොමු කෙරෙනු ඇත. සමස්තයක් වශයෙන් ගත්කල සෞඛ්‍ය සන්නිවේදනය විශ්වීය ව්‍යාප්තියක් සහිතව විශ්වීය පදනමක් යටතේ සාකච්ඡා කළ යුතු විශ්වීය විෂය ධාරාවක් වන්නේ ය.

මූලාශ්‍ර

Judth A.Graeff, John P.Eeder, (1993), Communication For Health and Behavior Change, Elizebeth Mills Booth, Jossey-Bass Publishers San Francisco.

Marketing Health Behavior Principles,Techniques and Applications, (1984), Newyork :Plenum.

23

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාවේ ගමන්මග සහ අනාගත අභියෝග

අජිත් දිසානායක

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ එහි අතීතය, වර්තමානය සහ අනාගත අභියෝග පිළිබඳ කෙරෙන පර්යේෂණ අධ්‍යයන වැඩසටහන යටතේ ඉදිරිපත් කෙරෙන ලිපියකි. 2016 වර්ෂයට ශ්‍රී ලංකාවට වොලිබෝල් ක්‍රීඩාව හඳුන්වා දී වසර සියයක් ගතව ඇත. ජාතික ක්‍රීඩාවට ශතවර්ෂයක් පිරීම මෙම පර්යේෂණ ලිපිය සැකසීම කෙරෙහි පොළඹවා ඇත. සිය වසරක තොරතුරු කැටිකරමින් වොලිබෝල් ක්‍රීඩාවේ ගමන්මග පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කෙරේ. වොලිබෝල් ක්‍රීඩාවේ ඉතිහාසය යුග තුනකට වෙන්කර දක්වා ඇත්තේ විග්‍රහයේ පහසුව සඳහා පමණකි. ප්‍රාථමික දත්ත රැස්කරගැනීම සඳහා කොටස් නියැදි ක්‍රමය භාවිත කරන ලදී. ඒ යටතේ මෙතෙක් ශ්‍රී ලංකාවේ පැවති ජාතික මට්ටමේ ශූරතා තරගමාලා, පාසැල් තරගමාලා සහ ජ්‍යෙෂ්ඨ ජාතික කණ්ඩායම මෙන්ම කනිෂ්ඨ හා යොවුන් කණ්ඩායම් නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිය දෙනෙකුගේ නියැදියක්, ජාතික වොලිබෝල් පුහුණුකරුවන් ඇතුළු පුහුණුකරුවන් විසි දෙනෙකුගේ නියැදියක් ද ජාත්‍යන්තර හා දේශීය මට්ටමේ වොලිබෝල් විනිසුරුවන් 10 දෙනෙකුගේ නියැදියක් සහ පරම්පරා තුනක් නියෝජනය වන පරිද්දෙන් ප්‍රධාන වොලිබෝල් තරගාවලි නරඹන ලද වොලිබෝල් ලෝලීන් 120කගෙන් සමන්විත නියැදියක් ද මගින් රැස් කරගන්නා ලද ප්‍රාථමික දත්ත මෙම පර්යේෂණය සඳහා භාවිත කර ඇත. දේශීය හා විදේශීය වශයෙන් වොලිබෝල් ක්‍රීඩාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කර ඇති ග්‍රන්ථ හා ලිපි ලේඛනවල සඳහන් තොරතුරු හා වර්ෂ 2002 දී නෝර්වේ හි ඔස්ලෝ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාත්‍යන්තර ගිම්හාන පාසැලේ (International Summer School) ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ඒකකයේ (Sport and Physical Education Unit) පැවැති ගෝලීය ක්‍රීඩා හා පාරිසරික ඉසව් කළමණාකරන (Global Sports and Environmental Event Management) පාඨමාලාවේ පාර්ශවීය අවශ්‍යතාවක් සපුරාලීම උදෙසා කර්තෘ විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පැවරුම් දත්ත හා තොරතුරු ඇතුළු ද්විතීක දත්ත (වොලිබෝල් ක්‍රීඩාවේ ආරම්භයේ සිට වර්ෂ 2012 දක්වා) මෙම ලිපිය සැකසීමට භාවිත කරගෙන ඇත.

ආරම්භය හා විකාශය

ඇමරිකා එක්සත් ජනපදයේ උපත ලද වොලිබෝල් ක්‍රීඩාව වර්ෂ 1895 දී ඇමරිකානු තරුණ ක්‍රිස්තියානි සංගමයේ මැසචුටෙස් ප්‍රාන්තයේ හෝලියොක් හි ක්‍රීඩා අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කළ විලියම් ජේ මෝර්ගන් විසින් ලොවට හඳුන්වාදී ඇත. මෙම ක්‍රීඩාව කෙටි කලකින් ලොව පුරා ජනප්‍රිය වූ අතර වර්ෂ 1947 දී ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනය (Federation of International Volleyball-FIVB) පිහිටුවා ගැනීම. මෙම ක්‍රීඩාවේ වර්ධනයේ හැරවුම් ලක්ෂය වශයෙන් පෙන්වා දිය හැක. වර්ෂ 1949 දී ප්‍රථම වරට ලෝක පිරිමි වොලිබෝල් ශූරතා තරගාවලියක් පැවැත්වීමත්, වර්ෂ 1952 දී කාන්තාවන් සඳහා ද මෙම තරගාවලිය ව්‍යාප්ත වීමත් එහි සාර්ථකත්වය පෙන්නුම් කිරීමකි. වර්ෂ 1957 දී බල්ගේරියාවේ සොෆියා නුවර දී පවත්වන ලද විශේෂිත වොලිබෝල් තරග මාලාවේ ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1964 දී ටෝකියෝ ඔලිම්පික් ක්‍රීඩා උළෙලට වොලිබෝල් ක්‍රීඩාව ද ඇතුලත් කරන ලදී. වර්ෂ 1964 සිට 2016 දක්වා පැවති සෑම ඔලිම්පික් ක්‍රීඩා උළෙලකදීම ඉතා වේගවත් ක්‍රීඩාවක් වශයෙන් මෙම ක්‍රීඩාව ජනප්‍රියත්වයට පත්විය. එම නිසාම වොල්බෝල් ක්‍රීඩාවේ ශාඛාවක් වශයෙන් ඊට අනුබද්ධ (Volleyball one Sport-Two Discipline) වර්ධනය වූ වෙරළ වොලිබෝල් ක්‍රීඩාව ද වර්ෂ 1996 දී ඔලිම්පික් ක්‍රීඩාවක් බවට පත්ව ඇත. ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනය මහද්වීපික වොලිබෝල් සංගම් පහක් යටතේ රටවල් 220ක සාමාජිකත්වයෙන් ඔලිම්පික් ක්‍රීඩා, ලෝක ශූරතා ක්‍රීඩා, මහද්වීපික හා කලාපීය ශූරතා තරගමාලා වශයෙන් ක්‍රියාත්මක වේ. 20 වන සියවසේ වොලිබෝල් ක්‍රීඩාවේ විශිෂ්ටයන් සැමරීමේ උළෙල වර්ෂ 2001 දී පැවැත්වීම මෙම ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විවිධාකාරයෙන් කැපකිරීම් කළ විශිෂ්ටයන්ට කරෙන ලද ගෞරවනීය උපහාරයකි.

වර්ෂ 1895 දී ලොව හඳුනාගත් වොලිබෝල් ක්‍රීඩාව ශ්‍රී ලංකාවට හඳුන්වාදෙනු ලැබුවේ වර්ෂ 1916 දීය. කොළඹ තරුණ ක්‍රිස්තියානි සංගමයේ ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂක වෝල්ටර් කැමැක් ට එකී ගෞරවය හිමි වෙයි. 1916 වර්ෂයේ අප්‍රේල් හා මැයි මාසවල නිකුත් කරන ලද (Colombo Young Men) මාසික සඟරාවේ ප්‍රථම වරට වොලිබෝල් ක්‍රීඩාව හඳුන්වාදීම පිළිබඳව සඳහන් කෙරේ. ඉන් අනතුරුව දිවයින පුරා ඉතා ඉක්මණින් මෙම ක්‍රීඩාව ජනප්‍රිය විය. මෙසේ ජනප්‍රියවීමට ප්‍රධානතම හේතුව වූයේ කුඩා භූමි භාගයක කිහිප දෙනෙකුට වුව ඉතා අඩු වියදමකින් ක්‍රීඩාවට පිවිසීමට ඇති හැකියාවයි. මුල් යුගයේ කණු දෙකක හෝ කිසියම් දුරක පිහිටි ගස් දෙකක මාළු දැලක කොටසක් හෝ ලණුවලින් වියන ලද දැලක් ගැටගසා ක්‍රීඩා පිටිය සකස් කර ගෙන ඇත. ක්‍රීඩාවේ නිරතවන්නන් දිරිමත් කිරිමට ඒ අවට නරඹන්නන් නිතර කටයුතු කිරිමත්, ප්‍රාදේශීය වශයෙන් කණ්ඩායම් අතර නිතර තරඟ පැවැත්වීමත් සමඟම තරග නරඹන්නන් ප්‍රබෝධමත් කිරීම මෙන්ම ක්‍රීඩා කණ්ඩායම් සහ ක්‍රීඩා සමාජවලට විවිධාකාර අනුග්‍රහකත්ව හිමිවීමත් ක්‍රීඩාවේ ව්‍යාප්තියට හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ වොලිබෝල් ක්‍රීඩාවේ ව්‍යාප්තිය සහ ප්‍රගතිය පිළිබඳ සලකා බැලිමේදී යුග තුනක් යටතේ හඳුනාගත හැකිය.

පළමු යුගය : වර්ෂ 1950 සිට 1970 දශකය දක්වා

ශ්‍රී ලංකාවේ වොලිබෝල් ක්‍රීඩාවට ශක්තිමත් ආරම්භයක් ලැබෙන්නේ 1950 දශකයේ ය. ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය (Sri Lanka Volleyball Federation) වර්ෂ 1951 සැප්තැම්බර් මස 4 දින පිහිටුවන ලදි. දිවයින තුළ වොලිබෝල් ක්‍රීඩාවේ සියලු නිල අයිතිය මෙම සම්මේලනය සතු වන අතර

ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ දේශීය නියෝජිතයා වශයෙන් කටයුතු කරනු ලබයි. (ගමේ දුප්පතාගේ ක්‍රීඩාව වශයෙන් පැවැති වොලිබෝල් ක්‍රීඩාව ජාත්‍යන්තර පිළිගැනීම දක්වා රැගෙන යනු ලැබුයේ ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයයි) වර්ෂ 1955 දී පළමු ජාතික පිරිමි වොලිබෝල් කණ්ඩායම බිහිවිය. මෙම කාල පරිච්ඡේදයේ ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත විය. එකී ක්‍රීඩා කණ්ඩායම් සහ ක්‍රීඩා සමාජ අතර ගම්පහ ''සෙන්ට්‍රල්'', හංවැල්ල ''ශාන්ත ජෝන් බොස්කෝ'', මීගොඩ ''විජය'', පුත්තලම ''ෂෝෂල්'', තුඩැල්ල ''සෙන්ට්‍රල්'', මීරිගම ''සෙන්ට්‍රල්'', ගල්ඔය ''කැලණි වැලි'', මිනුවන්ගොඩ ''පරාක්‍රම'', කඩුවෙල ''තරුණ තරු'', වැනි ක්‍රීඩා සමාජ හා කණ්ඩායම් කැපී පෙනෙන දක්ෂතා දක්වා විවිධ ශූරතා ජයග්‍රහණය කර ඇත. 1960 දශකයේ මිනුවන්ගොඩ ''පරාක්‍රම'', කඩුවෙල ''තරුණ තරු'', ගල්ඔය ''කැලණි වැලි'', ගම්පහ ''සෙන්ට්‍රල්'', බෝමිරිය ''තරුණ කැල'', පොලිස් ක්‍රීඩා සමාජය, යුධ හමුදා ක්‍රීඩා සමාජය, රාගම ''එක්සත් තරු'', බද්දේගම ''ක්‍රිස්තු දේව'', කෝට්ටේ ''ශාන්ත තෝමස්'', පොතුපිටිය ක්‍රීඩා සමාජය, දක්ෂතා දක්වා ඇති කණ්ඩායම් ය.

සමාජ සුභසාධනවාදී ආකල්ප සහිත රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1970 දශකයේ රටපුරා වේගයෙන් වොලිබෝල් ක්‍රීඩාව පැතිරුණි. ඒ යටතේ මීගමුව ''නවක තරු'', කොළොන්නාව ''සෙන්ට්‍රල්'', වැල්ලම්පිටිය ''මිත්‍ර'', අරකාවිල ක්‍රීඩා සමාජ, කඳන්ගමුව ''බ්ලු ත්‍රී ඩයමන්ඩ්'', මත්තේගොඩ, තුල්හිරිය සහ පූගොඩ පේෂකර්ම සංස්ථා ක්‍රීඩා සමාජ, කොස්වාඩිය ''විජය'' මාදම්පේ ''නිව්සික්ස්'', නාත්තන්ඩිය ''යුනයිටඩ්'', කෝට්ටේ ''සී එම් එස්'', කැපි පෙනෙන දක්ෂතා දක්වන ලද වොලිබෝල් කණ්ඩායම් වශයෙන් රට තුළ කීර්තියක් ලබා ඇත.

දෙවන යුගය : වර්ෂ 1980 සහ 1990 දශක

1980 දශකය ශ්‍රී ලංකා වොලිබෝල් ඉතිහාසය වෙනස් කළ කාල පරාසයකි. ආරක්ෂක සේවා වොලිබෝල් ක්‍රීඩා සමාජ රාජ්‍ය සේවා වොලිබෝල් ක්‍රීඩා සමාජ මෙන්ම ප්‍රාදේශීය වශයෙන් වොලිබෝල් ක්‍රීඩා සමාජ විශාල සංඛ්‍යාවක් පිරිමි සහ කාන්තා වශයෙන් බිහිවිය. එමෙන්ම වාර්ෂිකව විවිධාකාර තරගමාලා සංවිධානය කිරීම වොලිබෝල් ක්‍රීඩාවේ උන්නතියට හේතුවිය. එපමණක් නොව දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට රාජ්‍ය සහ අනුබද්ධිත රාජ්‍ය ආයතනවල රැකියා හිමිවීම කැපි පෙනේ. රාජ්‍ය අනුග්‍රහයෙන් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ජාතික තරුණ සේවා සභාව පිහිටුවීම සහ එකී ආයතනය වොලිබෝල් ක්‍රීඩාව අතර පැවැති ධන සහසම්බන්ධතාව නිසා ප්‍රාදේශීය වශයෙන් පිහිටුවන ලද යෞවන ක්‍රීඩා සමාජ තුළින් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල සංඛ්‍යාවක් බිහිවිය. එමෙන් ම වොලිබෝල් ක්‍රීඩා කණ්ඩායම් සඳහා විදේශ සංචාර ලබාදීම, විදේශ වොලිබෝල් කණ්ඩායම් මෙරටට පැමිණීම සහ විදේශීය පුහුණුකරුවන්ගේ සේවය ලැබීම ප්‍රදේශීය වශයෙන් වොලිබෝල් ක්‍රීඩාවේ තාක්ෂණික දැනුම බෙදාහැරීමේ පුහුණු කඳවුරු හා නේවාසික පුහුණුව ලබාදීම තුළින් වොලිබොල් ක්‍රීඩාවේ නව පරිච්ඡේදයක් ආරම්භවීමක් ලෙස පෙන්වා දිය හැකිය. මෙම දශකයේ ගම්පහ ''සියනෑ තරු'', මාදම්පේ ''නිව්සික්ස්'' , නාත්තන්ඩිය ''යුනයිටඩ්'', අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා සමාජය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ක්‍රීඩා සමාජය, ජාතික තරුණ සේවා සභාවේ ක්‍රීඩා සමාජය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රීඩා සමාජය වැනි කණ්ඩායම් කැපි පෙනෙන දක්ෂතා දක්වා ජාතික මට්ටමේ ශූරතා දිනාගන්නා ලදී. එකී ජයග්‍රහණ අතුරින් 1985, 1986 හා 1986 වර්ෂ තුන තුළ අඛණ්ඩව පිරිමි ජාතික ශූරතාව සහ වර්ෂ 1985 කාන්තා අනු

ශූරතාව 1986 හා 1987 ජාතික ශූරතාව දිනා ගැනිමට අධ්‍යාපන අමාත්‍යාංශයේ කණ්ඩායම්වලට හැකිවීම විශේෂත්වයකි. එමෙන්ම එකී කණ්ඩායම් නියෝජනය කළ සියලු ක්‍රීඩක ක්‍රීඩිකාවන් පාසැල් ක්‍රීඩා ගුරුවරුන් වශයෙන් සේවයට බඳවාගැනීම වොලිබෝල් ක්‍රීඩාව ලබා ඇති වර්තමාන දියුණුවට ප්‍රධාන හේතුවක් ලෙස පෙන්වාදිය හැකය.

1990 දශකය ශ්‍රී ලාංකීය වොලිබෝල් ක්‍රීඩාව නව ඇරඹුමක් ලෙස හඳුන්වයි. ඒ සඳහා ප්‍රධාන හේතුවක් වන්නේ 1991 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව ලෙස වොලිබෝල් ක්‍රීඩාව නිල වශයෙන් නම් කිරීමයි. මෙම කාල සීමාවේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා වොලිබෝල් කණ්ඩායම් ජාතික මට්ටමේ විවිධ ශූරතා දිනා ගැනීමට සමත්වීමයි. 1980 දශකයේදී මෙන් ම වර්ෂ 1993, 1994 හා 1995 යන වර්ෂවලදී ද අඛණ්ඩව ජාතික රූපවාහිනී ශූරතාව දිනාගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ කාන්තා ක්‍රීඩා කණ්ඩායමට හැකිවීම ද කැපී පෙනෙන්නකි. ඊට අමතරව ශ්‍රී ලංකා ගුවන් හමුදා කාන්තා කණ්ඩායම වර්ෂ 1996, 1997 හා 1998 ජාතික වොලිබෝල් ශූරතාව පිට පිටම ජය ගන්නා ලදී. වර්ෂ 1997, 1998 හා 1999 ජාතික පිරිමි ශූරතාව බියගම ''වයිට් හෝස්'' ක්‍රීඩා සමාජය විසින් දිනා ගන්නා ලදි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රීඩා සමාජය ජාතික තරුණ සේවා සභාව ක්‍රීඩා සමාජය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල ක්‍රීඩා සමාජය ජාතික ශූරතා ජයග්‍රහණය කරන ලද අනෙකුත් කණ්ඩායම් ය.

මෙම කාල පරිච්ඡේදයේ විශේෂිත ලක්ෂණයක් වන්නේ රාජ්‍ය ආයතන සේවය තුළින් රැකියා ප්‍රමුඛ වූ ක්‍රීඩා සමාජ ස්ථාපිතවීමයි. එතෙක් ආරක්ෂක සේවා සතුව පමණක් පැවැති රැකියාලාභී ක්‍රීඩාව වෙනත් රාජ්‍ය ආයතන දක්වා ව්‍යාප්ත වීම එහි දියුණුවට මෙන්ම වොලිබෝල් ක්‍රීඩාව ඇගයීමකට ලක් කිරීමක් වශයෙන්ද පෙන්වාදිය හැකිය. මෙසේ දක්ෂතා දක්වන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට රැකියා ලැබීම සහ එකී ආයතන නියෝජනය කරමින් ජාතික තරගාවලීන්ට සහභාගිවීම නිසාම ප්‍රදේශිය වශයෙන් තමන් උපන් හා ස්ථිර පදිංචියට අදාළ ප්‍රදේශ නියෝජනය කළ ක්‍රීඩා සමාජවලට සිය දායකත්වය ලබාදීමට නොහැකිවීම නිසාම එතෙක් දීප ව්‍යාප්තව පැවැති ක්‍රීඩා සමාජ ගණනාවක් අක්‍රිය තත්ත්වයට පත්විය. අනෙක් අතට මූල්‍යමය වශයෙන් හා අනුග්‍රාහක හැකියාවන් ගෙන් සමන්විත ක්‍රීඩා සමාජ කිහිපයක් ස්ථාපිත විය. පළාත් නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තම ක්‍රීඩා සමාජයේ සමාජිකත්වය සහ එකී භූගෝලීය සීමාව තුළ ස්ථිර පදිංචිය ලබාදීමට කටයුතු කර ඇත. එමගින් තවදුරටත් පිටිසර පළාත්වල ශක්තිමත්ව පැවැති වොලිබෝල් ක්‍රීඩාව කිසියම් පසුබැසීමකට ලක්විය (බොහෝදුරට මෙම ක්‍රියාවලිය ආරම්භ වනුයේ පාසැල් මට්ටමිනි. වොලිබෝල් ක්‍රීඩාවට ජනප්‍රිය පාසැල් තුළට ඈත පළාත්වල ක්‍රීඩක ක්‍රීඩිකාවන් බඳවාගැනීම).

නෙවන යුගය, වර්ෂ 2000 සිට වර්තමානය දක්වා

2000 දශකය තුළ වොලිබෝල් ක්‍රීඩාවේ පිරිමි අංශයේ ආධිපත්‍යය ශ්‍රී ලංකා ගුවන් හමුදා ක්‍රීඩා සමාජය හා යුධ හමුදා ක්‍රීඩා සමාජ සතුවීමත්, බොහෝ අවස්ථාවන්හිදී මෙම කණ්ඩායම් වල ප්‍රධාන ප්‍රතිවාදී කණ්ඩායම වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරි පිළ දක්නට ලැබුණි. වර්ෂ 2000, 2003, 2004, 2005, 2006, 2008 හා 2009 ජාතික වොලිබෝල් පිරිමි ශූරතාව ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් දිනා ගෙන ඇත. කාන්තා ජාතික ශූරතාව වර්ෂ 2000, 2001, 2002, 2003, 2005 හා 2009 ශ්‍රී ලංකා වරාය අධිකාරිය කණ්ඩායම විසින් ජයග්‍රහනය කර ඇත. මෙම දශකයේ මොවුන් සමග අවසන් මහා තරගයට සහභාගී වූ ප්‍රතිවාදී කණ්ඩායම

වූයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව වීමද කැපී පෙනෙන්නකි. ජනාධිපති රන් කුසලාන වොල්බෝල් ශූරතාවලියේදී රදාවාන ''ගෝල්ඩන් බර්ඩස්'', ''සීදූව'', ''සිරිදූව'', ක්‍රීඩා සමාජය පිරිමි අංශයෙන්ද කොස්වාඩිය, විජය, ක්‍රීඩා සමාජය කාන්තා අංශයෙන් ද වර්ෂ කිහියක් ජයග්‍රහණ අත්පත් කර ගැනීම විශේෂත්වයකි, මෙකී පිරිමි සහ කාන්තා අංශ නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බොහෝ දෙනෙකු ග්‍රාමීය අංශයෙන් විවිධ දුෂ්කරතා මැදින් පැමිණි අය වීම මෙම අධ්‍යයනය තුළින් සොයාගනු ලැබූවකි. එකී තත්ත්වය වර්ෂ 2011 සිට වර්තමානය දක්වා ද පැවැති සියලුම ජාතික ශූරතාතරගාවලි නියෝජනය කිරීම් මගින් ද තවදුරටත් තහවුරු කෙරේ.

වර්ෂ 1955 සිය වර්තමානය දක්වා ජාතික පිරිමි කණ්ඩායම් 42 ක්ද ජාතික කාන්තා කණ්ඩායම් 26 ක්ද බිහිව ඇත. මෙම කාල සීමව තුළ වොල්බෝල් ක්‍රීඩකයෝ 175 ක්ද, ක්‍රීඩිකාවෝ 137 ක්ද ශ්‍රී ලංකා ජාතික වර්ණ ලබා ඇත. කනිෂ්ඨ ක්‍රීඩකයෝ 149 ක්ද ක්‍රීඩිකාවෝ 132 ක්ද ජාතික කනිෂ්ඨ කණ්ඩායම් නියෝජනය කර ඇත. ඊට අමතරව ක්‍රීඩකයෝ 60 ක් සහ ක්‍රීඩිකාවෝ 36 දෙනෙකු ශ්‍රී ලංකා ජාතික යොවුන් බාලක සහ බාලිකා කණ්ඩායම් නියෝජනය කර ඇත.

ජාත්‍යන්තර අත්දැකීම්

ශ්‍රී ලංකාවේ වොලිබෝල් ක්‍රීඩාවේ ආරම්භයේ සිට වර්තමානය දක්වා පැමිණි ගමන හා ලබාගන්නා ලද ජාත්‍යන්තර අත්දැකීම් හා ජයග්‍රහණ පිළිබඳව අධ්‍යයන කිරීමේදී ද ප්‍රධාන යුග තුනක් යටතේ මෙම විග්‍රහ සිදුකොට ඇත. පළමු යුගය සම්ප්‍රදායික වොලිබෝල් ක්‍රීඩාව පැවැති ආරම්භක කාල පරිච්ඡේදය වශයෙන්ද දෙවන යුගය ශ්‍රී ලංකාවේ වොලිබෝල් ක්‍රීඩාවේ පරිවර්තන කාල ජරිච්ඡේදය වශයෙන්ද, තෙවන යුගය දෙවන යුගයේ ආරම්භ කරන ලද වොලිබෝල් ක්‍රීඩාවේ නවීන තාක්ෂණය භාවිත කරමින් ප්‍රතිඵල අත්පත් කරගත් කාල පරිච්ඡේදය වශයෙන්ද (තාක්ෂණික) මෙහිදී නම් කෙරේ. වර්ෂ 1956 සිට 2016 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පිරිමි කණ්ඩායම් 76 ක් ද, කාන්තා කණ්ඩායම් 36 ක් ද විදේශ සංචාර සඳහා සහභාගී වී ඇත. ඊට අමතරව ශ්‍රී ලංකාව තුළ සංචාරය කළ විදේශ පිරිමි වොලිබෝල් කණ්ඩායම් ගණන 36 ක් වන අතර විදේශ කාන්තා වොලිබෝල් කණ්ඩායම් ගණන 17 කි. මෙතෙක් ජාත්‍යන්තර වොලිබෝල් ශූරතා තරගාවලී 7 ක් දිවයින තුළ පවත්වා ඇත.

පළමු යුගය (සාම්ප්‍රදායික අවධිය)

වර්ෂ 1955 දී ඉන්දියාවේ උත්තර ප්‍රදේශ පිරිමි හා කාන්තා වොලිබෝල් කණ්ඩායම් දෙකක් දිවයිනට පැමිණ තරගවලට සහභාගී ඇත. මොවුන් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලද ප්‍රථම විදේශීය වොලිබෝල් කණ්ඩයම් ලෙස වාර්තා වේ. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පිරිමි වොලිබෝල් කණ්ඩායමක් වර්ෂ 1956 දී ප්‍රථම වරට විදේශ තරග සංචාරයක් ලෙස ඉන්දියාවේ උත්තර් ප්‍රදේශයේ සංචාරය කරන ලදි. එකී තරග සංචාරය වොලිබෝල් ඉතිහාසයේ ලාංකිකයින් ලත් ප්‍රථම විදේශීය අත්දැකීම වශයෙන් වාර්තා වේ. වර්ෂ 1959 දී පකිස්ථානයේ කරච්චි නුවර පැවැති මොහොමඩ් අලි ජින්නා අනුස්මරණ රන් කුසලාන වොලිබෝල් තරගාවලියේ දක්ෂතම ප්‍රහාරකයට හිමි සම්මානය ශ්‍රී ලංකාවේ ඩබ්.එල්. සිරිවර්ධනට හිමිවිය. වර්ෂ 1966 දී ප්‍රථම වරට විශ්වවිද්‍යාලයීය පිරිමි වොලිබෝල් කණ්ඩායම ඉන්දියාවේ තරග සංචාරයක නිතර වූ අතර එම කණ්ඩායම එකී තරගාවලියේ ශූරතාව දිනා ගැනීම ප්‍රථම ජාත්‍යන්තර වොලිබෝල්

ශූරතාවක් ජයග්‍රණය කිරීමකි. වර්ෂ 1969 ජනවාරි 03 දින ආසියානු වොලිබෝල් සම්මේලනයේ කමිටු රැස්වීමක් කොළඹ තැප්‍රොබේන් හෝටලයේ පවත්වන ලදි. ආසියානු කලාපය නියෝජනය කරමින් රටවල් හතක නියෝජිතයින් හත් දෙනෙකු ඊට සහභාගි විය.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ප්‍රථම වරට කාන්තා වොලිබෝල් කණ්ඩායමක් වර්ෂ 1970 දී ඉංදියාවේ තරග සංචාරයක් කරන ලදි. මෙම තරගාමාලාවේ ජයග්‍රහණය ශ්‍රී ලංකා කණ්ඩායම සතු වූ අතර එකී ජයග්‍රහණය ශ්‍රී ලංකා කාන්තා වොලිබෝල් කණ්ඩායමක් විදේශයකදී ලත් ප්‍රථම ජයග්‍රහණය වශයෙන් වාර්තා වේ. වර්ෂ 1976 දී පකිස්තානයේ ලාහෝර් නගරයේ පැවැති මොහොමඩ් අලි ජින්නා අනුස්මරණ රන්කුසලාන ආරාධිත තරගාවලියට සහභාගී වූ ශ්‍රී ලංකා කණ්ඩායම ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදි. එකී ජයග්‍රහණය ශ්‍රී ලංකා වොලිබෝල් පිරිමි කණ්ඩායමක් ජාත්‍යන්තර තරග මාලවක දී හිමිකරගත් ප්‍රථම පදක්කම ලෙස සැලකේ.

දෙවන යුගය (පරිවර්තන අවධිය)

වර්ෂ 1984 අගෝස්තු මස දී 1972 මියුනික් ඔලිම්පික් ශූරතාව දිනූ ජපන් වොලිබෝල් කණ්ඩාමේ නායකත්වය දැරූ සුසෝ නකමුරා විසින් ශ්‍රී ලංකාව තුළ වොලිබෝල් පුහුණු කඳවුරක් පවත්වන ලදී. එමෙන්ම 1984 අගෝස්තු මස සෝවියට් රුසියානු ජාතික වොලිබෝල් පුහුණුකරු නිකලොස් කර්පෝල් ශ්‍රී ලංකාවට පැමිණීම ලාංකික වොලිබෝල් ක්‍රීඩාවේ වර්ධනයට හේතුවිය. වර්ෂ 1985 ජුනි මස 01 සහ 02 දින වලදී ආසියානු මහාද්වීපික වොලිබෝල් සම්මේලනයේ පරිපාලන කමිටු රැස්වීම එහි සභාපති ජපන් ජාතික කේ. මත්සුහු දහිරාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ගලධාරී හෝටලයේදී පවත්වන ලදී. වර්ෂ 1985 දී බහරේන්හි පැවැති ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනය මගින් පවත්වන ලද පුහුණු පාඨමාලාවට ශ්‍රී ලාංකිකයින් පස් දෙනෙකු සහභාගි විය. 1985 මැයි මස 07 සිට 14 දින දක්වා ඇමරිකානු ජාතික වොලිබෝල් පුහුණුකරු තෝමස් එස් ඇෂන් ශ්‍රී ලංකාව තුළ පුහුණු වැඩසටහනක් පැවැත්වීම වොලිබෝල් ක්‍රීඩාවේ වර්ධනයට හේතුවුවකි. වර්ෂ 1986 නොවැම්බර් මස 01 දින ශ්‍රී ලංකා ජාතික වොලිබෝල් විනිශ්චයකරුවන් 09 දෙනාට සහතික පත් පිරිනැමීම ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ සභාපති ආචාර්ය රූබන් කොස්තා ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී. ඔහු ප්‍රධාන ආරාධිතය වශයෙන් පාසැල් වොලිබෝල් ශූරතාවය සංකේත පිරිනැමීට සහභාගි විය. 1988 මැයි මස 28 දින ජ්‍යාතන්තර වොලිබෝල් සම්මේලනයේ කලාපීය වොලිබෝල් පුහුණු මධ්‍යස්ථානය එහි උප සභාපති මොහොමඩ් හමාඩාගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම. 1988 සැප්තැම්බර් මස 01 සිය 15 දින දක්වා කොරියාවේ සියෝල් නුවර පැවැති 11 වැනි ජ්‍යාතන්තර වොලිබෝල් සම්මේලනයේ වාර්ෂික සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කිරීම, ශ්‍රී ලංකා ජපන් ක්‍රීඩා හා සංස්කෘතික මිත්‍රත්ව හුවමාරු වැඩසටහන යටතේ වර්ෂ 1988 ජූලි 15 සහ 16 දිනවල ජපානයේ මිටිෂු සමාගමේ පිරිමි සහ කාන්තා වොලිබෝල් කණ්ඩායම් තරග සංචාරයක නිරත විය. 1989 මැයි 01 දින සෝවියට් රුසියාවේ ස්ටෝනියා ප්‍රාන්ත පිරිමි වොලිබෝල් කණ්ඩායම ශ්‍රී ලංකාවේ තරග සංචාරය කිරීම. 1989 නොවැම්බර් මස 09 සිට 15 දින දක්වා ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ විනිශ්චය උපදේශක ඉරාන ජාතික ඊබ්‍රහිම් නිමාමි ශ්‍රී ලංකාවට පැමිණ වොලිබෝල් විනිශ්චයකරුවන් සඳහා පාඨමාලව පැවැත්වීම. (මෙවැනි පාඨමාලා ක්‍රීඩාවේ ජීවගුණය ආරක්ෂා කරගැනීම සඳහා ඉතා වැදගත් වනු ඇත).

වර්ෂ 1990 ශ්‍රී ලංකා ජනසතු සේවා පිරිමි වොලිබෝල් කණ්ඩායම ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේ පැවැති සුපර් ලීග් ජාත්‍යන්තර ආරාධිත වොලිබෝල් තරගාවලියට සහභාගී වී ලෝකඩ පදක්කම දිනාගන්නා ලදී. වර්ෂ 1991 දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ පිරිමි හා කාන්තා වොලිබෝල් තරගාවලිය රටවල් පහක සහභාගීත්වයෙන් කොළඹදී පැවැත්වීම. 1991 සැප්තැම්බර් මස 16 සහ 17 දින තායිලන්තයේ බැංකොක් නුවර පැවැති නව වන ආසියානු වොලිබෝල් සම්මේලන සමුළුව නියෝජනය කිරීම. ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ අදියර 111 පුහුණුකරුවන්ගේ පාඨමාලාව 1991 දී චෙකොස්ලොවැකියාවේ පැවැති අතර එයට ශ්‍රී ලංකා නියෝජිතයකු සහභාගි වීම, 1992 මැයි මස 01 සිට 10 දක්වා ශ්‍රී ලංකාවේදී ජාත්‍යන්තර විනිසුරු අපේක්ෂක පාඨමාලාව එකී පාඨමාලා අධ්‍යක්ෂ ඉරාන ජාතික ආචාර්ය ඉබ්‍රාහිම් ඉහාමි විසින් පැවැත්වීම. ජාත්‍යන්තර වොලිබෝල් පුහුණුකරු අදියර 1 පාඨමාලාව වර්ෂ 1992 මැයි මස ඉන්දියාවේ බැංග්ලෝර් නගරයේ පැවැති අතර එයට ශ්‍රී ලාංකිකයින් දෙදෙනෙකු සහභාගි වී ඇත. ස්පාඤ්ඤයේ බාසිලෝනාහි ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ 18 වන සමුළුව 1992 අගෝස්තු 20 සිට 22 දින දක්වා පැවැති අතර ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති සහ උප සභාපති ඊට සහභාගී වී ඇත. වර්ෂ 1993 දී ආසියානු වොලිබෝල් සම්මේලනයේ පරිපාලන කමිටු සාමාජිකත්වය ශ්‍රී ලංකාවට හිමිවිය. 1993 සැප්තැම්බර් මස ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති හට ජාතික ඔලිම්පික් කමිටුවේ උප සභාපති තනතුරු හිමිවිය. 1996 ඇමරිකා එක්සත් ජනපදයේ ඇට්ලන්ටා නුවර පැවැත්වූ 25 වන ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලන සමුළුව නියෝජනය කිරීම, 1998 මැයි මස 18 සිට 31 දක්වා ජාත්‍යන්තර වොලිබෝල් පුහුණු පාඨමාලා අදියර 11 ශ්‍රී ලංකාවේදී පවත්වන ලදි. එකී පාඨමාවේ අධ්‍යක්ෂ චෙකොස්ලෝවැකියානු ජාතික ආචාර්ය මිලාන් එරිත් සහ ස්ලෝවැකියානු ජාතික වොලිබෝල් පුහුණුකරු ආචාර්ය අර්නස්ට් බෙයාර් සහභාගි වී ඇත.

ශ්‍රී ලංකාවේ පැවැති ජාතික රූපවාහිනි ආරාධිත වොලිබෝල් ශූරතා තරගාවලිය වර්ෂ 1985 දී ඉන්දීය පන්ජාබ් වොලිබෝල් පිරිමි කණ්ඩායම ජයගත් අතර එහි අනු ශූරතාව බංගලාදේශයේ වාරි ක්‍රීඩා සමාජයට හිමිවීම කැපී පෙනෙන්නකි. වර්ෂ 1995 දී ඉන්දියාවේ මදුරාසි නුවර පැවැති හත්වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී ශ්‍රී ලංකා පිරිමි වොලිබෝල් කණ්ඩායම ඉතිහාසයේ ප්‍රථමවරට ඉංදියානු ජාතික කණ්ඩයම පරාජය කරන ලදි. 1998 ලෙබනනයේ පැවැති දහවන ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගිවූ ශ්‍රී ලංකා යුධ හමුදා කණ්ඩායමේ එල්. සී. ඒකනායක තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාගන්නා ලදී. 1998 චීන තායිපේ පැවැති පළමුවන ආසියානු විශ්වවිද්‍යාලයීය වොලිබෝල් තරගාවලිය සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය පිරිමි කණ්ඩායම සහභාගි විය.

නෙවන යුගය (තාක්ෂණික අවධිය)

වර්ෂ 2000 දී ස්පාඤ්ඤයේ පැවැති ''11 වන ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලන සමුළුවට ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ප්‍රධාන ලේකම් සහභාගි විය. 2003 වර්ෂයේ හොංකොංහි පැවති ආසියානු පාසල් තරගමාලාවට සහභාගි වූ ශ්‍රී ලංකා පාසල් කණ්ඩායම ලෝකඩ පදක්කම දිනා ගන්න ලද්දේ තරගාවලියේ දක්ෂතම පන්දු ඔසවන්නා සම්මානයද හිමිකර ගනිමිනි. 2004 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවැති ආසියානු මහාද්වීප වොලිබෝල් සම්මේලනයේ සභාපතිවන Jizhong Wei ආසියානු කනිෂ්ඨ කාන්තා තරගමාලාවට විශේෂ නියෝජිතයකු වශයෙන් සහභාගි විය. 2005 වර්ෂයේ ආසියානු වොලිබෝල් සම්මේලනයේ XV වන වාර්ෂික සමුළුව චීනයේ පැවැති අතර එයට ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ

සභාපති ඇතුළු තිදෙනෙකු එයට සහභාගි විය. ඔක්තෝබර් මස 24 දින සිට නොවැම්බර් 06 දක්වා ඩොමිනිකන් ජනරජයේ පැවැති ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලන අදියර 111 පුහුණු පාඨමාලාවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළ සරත් සිල්වා ඉන් සමත් විය. 2006 මාර්තු 08 සිට 12 දක්වා ප්‍රථම මධ්‍යම ආසියානු වොලිබෝල් තරගාවලිය ශ්‍රී ලංකාව, මාලදිවයින, කසකස්තානය, ඉන්දියාව සහ පකිස්තානය යන රටවල සහභාගීත්වයෙන් කොළඹ දී පවත්වන ලදී. වර්ෂ 2006 දී X වන දකුණු ආසියානු ක්‍රීඩා උලෙළේ වොලිබෝල් පිරිමි හා කාන්තා කණ්ඩායම් දෙකම අවසන් මහ තරගයට සහභාගිවෙමින් රිදී පදක්කම් දිනාගන්නා ලදි.

2006 ඔක්තෝම්බර් 23 සිට 25 දක්වා ජපානයේ පැවැති XXX වන ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලන සමුළුවට ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති සහභාගී වූ අතර එහි නීති කොමිසමට අයත් 'International Volleyball Tribunal'-IVT හි සමාජිකයකු වශයෙන් එතුමා පත්විය. වර්ෂ 2007 අප්‍රේල් මස 30 සහ 31 යන දිනවල ඉන්දුනිසියාවේ ජකර්තා නුවර පැවැති XV11 වන ආසියානු වොලිබෝල් සම්මේලන සමුළුව ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ලේකම් ඇතුළු නියෝජිතයින් දෙදෙනෙකු සහභාගි විය. X1V වන ආසියානු ජ්‍යෙෂ්ඨ පිරිමි තරගමාලාව ඉන්දුනිසියාවේ ජකර්තා නුවර පැවැති අතර එහි විශේෂ විනිශ්චය කොමිසමට ශ්‍රී ලංකා සාමාජිකත්වය හිමිවීම. වර්ෂ 2008 දී ජාතික ඔලිම්පික් කමිටුව උප සභාපති තනතුරට ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති ඩිලාන් පෙරේරාත් එහි නියෝජ්‍ය ලේකම් තනතුරට සම්මේලනයේ ලේකම් සුසිල් රණසිංහ පත්වීම. වර්ෂ 2008 දී ඩුබායිහි පැවැති XXX11 වන ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලන සමුළුවට ශ්‍රී ලංකා නියෝජිතයින් තිදෙනෙකු සහභාගිවීම. වර්ෂ 2008 ඔක්තොබර් 05 සිට 08 දක්වා දකුණු ආසියානු වරාය සහ ගුවන් තොටුපල ක්‍රීඩා උලෙළ ශ්‍රී ලංකාවේ පැවැති අතර එහි රන් පදක්කම සහ රිදී පදක්කම ශ්‍රී ලංකාව නියෝජනය කළ කණ්ඩායම් සතුවිය. වර්ෂ 2009 බංගලාදේශයේ පැවැති ආසියා පැසිපික් වෙරළ වොලිබෝල් තරගමාලාව නියෝජනය කළ ශ්‍රී ලංකා කණ්ඩායම ප්‍රථමවරට ජාත්‍යන්තර පදක්කමක් දිනාගැනීම. සැප්තැම්බර් මස 25 සහ 26 දිනවල පිලිපීනයේ මැනිලා නුවර පැවැති ආසියානු වොලිබෝල් සම්මේලනය වන සමුළුව නියෝජනය කිරීම. දෙසැම්බර් මස 05 සහ 06 දිනවල ඩොමිනිකන් ජනරජයේ පවත්වන ලද FIVB-1V Beach Volleyball Clinic පුහුණු සම්මන්ත්‍රණය නියෝජනය කිරිම. 2009 චීනයේ පැවැති ශ්‍රේණිගත (Ranking Tournament) වෙරළ වොලිබෝල් තරගාවලිය නියෝජනය කළ පිරිමි කණ්ඩායම එහි රිදී පදක්කම දිනා ගැනීම.

වර්ෂ 2010 ජනවාරි 28 සිට පෙබරවාරි 05 දක්වා බංගලාදේශයේ ඩකා නගරයේ පැවැති X1 වන දකුණු ආසියානු තරගාවලිය නියෝජනය කළ ශ්‍රී ලංකා කණ්ඩායම එහි ලෝකඩ පදක්කම දිනා ගැනීම අගෝස්තු මස 13 සිට 18 දක්වා චීනයේ ලියුපන්ෂු නුවර පැවැති ආසියානු වෙරළ වොලිබෝල් තරගාවලිය නියෝජනය කළ ශ්‍රී ලංකා කණ්ඩායම එහි රිදී පදක්කම දිනා ගැනීම. 2012 ඔලිම්පික් තරගමාලාව නියෝජනය කිරීමට සුදුස්සන් තේරීමේ තරගය සැප්තැම්බර් 27 දින සිට ඔක්තෝම්බර් 02 දක්වා ඉන්දියාවේ චෙන්නායිහි පැවැති අතර එහිදී ශ්‍රී ලංකා කණ්ඩායම මධ්‍යම ආසියානු කලාපය නියෝජනය කිරීමට සුදුසුකම් සපුරාලීම වර්ෂ 2010 ඔක්තෝම්බර් 14 සිට 17 දක්වා ආසියානු වොලිබෝල් සම්මේලනය විසින් චීනයේ ෂියානින් හි පවත්වන ලද වෙරළ වොලිබෝල් තරගාවලිය නියෝජනය කළ ශ්‍රී ලංකා කණ්ඩායම ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදි. 2010 සැප්තැම්බර් 09 සහ 10 දිනවල ඉතාලියේ රෝම

නගරයේ පැවැති ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ XXX11 වන සමුළුව ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය නියෝජනය කිරීම. 2010 සැප්තැම්බර් 10 සිට 21 දක්වා බහරේන්හි පැවැති FIVB අදියර 111 පුහුණු පාඨමාලාවෙන් ශ්‍රී ලංකා පුහුණුකරුවන් දෙදෙනෙකු සමත්වීම (පසු කලෙක ඔවුන් ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම්හි ප්‍රධාන පුහුණුකරුවන් බවට පත්විය). 2010 සැප්තැම්බර් 12 සිට 20 දක්වා වියට්නාමයේ හෝචිමින් නුවර පැවැති XV වන ආසියානු කනිෂ්ඨ කාන්තා තරගමාලාවේ අවසන් මහා තරගය ශ්‍රී ලංකා විනිශ්චයකරුවකු විසින් විනිශ්චය කිරීම (ප්‍රථම වරට අවසන් මහ තරගයක් විනිශ්චය කිරීම). වර්ෂ 2011 ජනවාරි 13 සිට 15 දක්වා ස්ලොවැකියාවේ පැවැති ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ වෛද්‍ය කොමිසම ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ වෛද්‍ය ලාල් ඒකනායක සහභාගිවීම. 2011 ජූලි 02 සිට 08 දක්වා තායිලන්තයේ පැවැති ජාත්‍යන්තර වොලිබෝල් පුහුණුකරු අදියර 111 පාඨමාලාව හැදෑරූ ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ නියෝජිතයා ඉන් සමත්වීම. වර්ෂ 2011 අප්‍රේල් 27 හා 28 දිනවල ඉන්දියාවේ චෙන්නායි නුවර පැවැති ප්‍රථම මධ්‍යම ආසියානු කාලාපීය වොලිබෝල් සමුළුව නියෝජනය කිරීම. වර්ෂ 2011 ජූලි 23 සිට 29 දක්වා කම්බෝජයේ පැවැති ආබාධිත ලෝක වොලිබෝල් තරගාවලිය නියෝජනය කළ ශ්‍රී ලංකා කණ්ඩායම ලෝකඩ පදක්කම දිනාගැනීම සහ තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය ලබාගැනීම. 2011 සැප්තැම්බර් 21 සිට 23 දක්වා චීන තායිපේ පැවැති X1X වැනි ආසියානු වොලිබෝල් සමුළුව නියෝජනය කළ ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති ඩිලාන් පෙරේරා එහි පරිපාලන කමිටු සාමාජිකයකු ලෙස තෝරා ගන්නා ලදී. 2011 ඔක්තෝම්බර් 08 සිට 14 දක්වා හම්බන්තොට පැවැති ප්‍රථම දකුණු ආසියානු වෙරළ ක්‍රීඩා උලෙළ නියෝජනය කළ ශ්‍රී ලංකා පිරිමි හා කාන්තා කණ්ඩායම් රන් සහ රිදී පදක්කම් දිනාගන්නා ලදී. වර්ෂ 2011 සැප්තැම්බර් 21 සිට 29 දක්වා ඉරානයේ ටෙහෙරාන් නුවර පැවැති XV1 වැනි ආසියානු පිරිමි වොලිබෝල් තරගාවලිය නියෝජනය කළ ශ්‍රී ලංකා කණ්ඩායම ප්‍රථම වරට සුපර් ලීග් වටයට (අවසන් කණ්ඩායම් 08) සුදුසුකම් ලබාගැනීම. වර්ෂ 2011 ඔක්තෝබර් 26 සහ 27 දින මැලේසියාවේ පැවැති ආබාධිත මාස්ටර් වෙරළ වොලිබෝල් තරගාවලියට ශ්‍රී ලංකා පිරිමි කණ්ඩායම සහභාගී වෙමින් ලෝකඩ පදක්කම දිනාගැනීම.

අනාගත අභියෝග

ශ්‍රී ලංකාවේ වොලිබෝල් ක්‍රීඩාව ආරම්භයේ සිට වර්තමානය (2012) දක්වා පැමිණි ගමන් මග යහපත් පරිසරයක් තුළ පහසුකම් සහිතව සිදුවූවක් නොවේ. ප්‍රධාන යුග තුනක් යටතේ හඳුනාගනු ලැබූයේ එකී කාල පරාසයන්හි වොලිබෝල් ක්‍රීඩාවේ ක්‍රියාකාරීත්ව සහ එහි උන්නතිය වෙනුවෙන් කරන ලද කැපකිරීම් හා ඉන් ලබාගත් ප්‍රතිලාභ පිළිබඳව අධ්‍යයනය කිරීමෙනි. මෙම අධ්‍යයනය සඳහා භාවිත කරන ලද පර්යේෂණ ක්‍රමවේදයට අනුව ශ්‍රී ලංකාවේ වොලිබෝල් ක්‍රීඩාවේ අනාගත අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීම පිණිස මුහුණු දීමට සිදුවන අභියෝග මොනවාද යන්න මෙයින් සාකච්ඡා කෙරේ.

වොලිබෝල් ක්‍රීඩාවේ පරිපාලන කටයුතු ව්‍යාප්ත කිරීම යටතේ ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය තවදුරටත් මෙයින් අදහස් කෙරෙනුයේ වොලිබෝල් පරිපාලනය කිසියම් පිරිසක් හෝ කණ්ඩායමක් සතු නොවී දීප ව්‍යාප්ත නියෝජනයකි. ඒ යටතේ ක්‍රීඩා පරිපාලන නිලධාරීන්ට අමතරව විනිශ්චයකරුවන් (විවිධ මට්ටමින්) පුහුණුකරුවන් (විවිධ අදියර නියෝජනය වන පරිදි) පර්යේෂකයින්ගෙන් සමන්විත වීම.

වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් විවිධ වයස් කාණ්ඩ යටතේ විවිධ තරගාවලීන් නියෝජනය කිරීම සඳහා තෝරාගැනීම සඳහා ජාතික සංචිත පිහිටුවීම සහ පවත්වා ගෙනයාම විධිමත් කිරීම (වර්තමානයේ සිදු කෙරෙන ක්‍රමවේදය යටතේ පුහුණු කටයුතු වෙනුවෙන් වැය කෙරෙන කාලය ප්‍රමාණවත් නොවේ). මෙම සංචිත වලට අයත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ප්‍රායෝගික පුහුණුවට අමතරව න්‍යායාත්මක හා ධනාත්මක සිතුවිලි වර්ධනය කෙරෙන නායකත්ව සහ අධ්‍යාත්මික පුහුණු වැඩසටහන් ඒ පිළිබඳ විශේෂඥයින් මගින් සිදු කිරීම (බොහෝ විදේශීය රටවල මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කර සාර්ථක ප්‍රතිඵල ලබා ඇත. නිදසුන් ඇමරිකා එක්සත් ජනපදය, රුසියාව, ඉතාලිය, බල්ගේරියාව, ස්ලෝවැකියාව, ජපානය, චීනය, කොරියාව, ඉරානය).

වොලිබෝල් ක්‍රීඩාවට අවතීරන වන අවධියේ සිට විවිධ වයස් සීමාවන් යටතේ ක්‍රමිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩාවේ ජීව ගුණය ආරක්ෂා කරගැනීම පිණිස සහ ක්‍රීඩාවේ අනාගත යහපැවැත්ම උදෙසා විනය හා ආචාරධර්ම (Discipline and Ethics) මෙන්ම ගුණාත්මක චර්යාවන් වර්ධනය කිරීමේ ක්‍රමවේද හඳුන්වාදීම (පාසැල් මට්ටමේ සිට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ විනය සහ සාරධර්ම සීඝ්‍රයෙන් පිරිහෙමින් පවත්නා නිසා ඉතා කඩිනමින් ඒවා වර්ධනය කිරීම ක්‍රීඩාවේ අනාගත පැවැත්ම සහ අභිවෘද්ධිය උදෙසා ඉතා වැදගත් වන්නකි).

ශ්‍රී ලංකාවේ වොලිබෝල් පුහුණුකරුවන්ගේ සංගමයක් පිහිටුවා තිබීම ක්‍රීඩාවේ අනාගත යහපැවැත්ම වෙනුවෙන් ඉතා වැදගත්වන්නකි. එහෙත් ගැටලුව වන්නේ සමහර පුහුණුකරුවන් අතර සමගියක් නොපවතී. ඔවුන් අතර සමගියක් සහ යහපත් සම්බන්ධතා වර්ධනය කිරීම ඉතා වැදගත් වනු ඇත. (සියලු පුහුණුකරුවන් උක්ත සංගමයේ සාමාජිකයන් වශයෙන් බඳවා කිසියම් විනය නීතී මාලාවකට යටත් කර ජ්‍යෙෂ්ඨත්වය සහ දක්ෂතාව පදනම් කරගත් විනිවිද බවකින් යුත් ක්‍රමවේදය අනුගමනය කිරීම). ජාත්‍යන්තර වොලිබෝල් පුහුණු පාඨමාලා අදියර 1, 11 හා 111 වශයෙන් සමත් පුහුණුකරුවන් අතර නිරන්තර ගැටුම් ඇතිවීම ඔවුන් සෑම විටම ජාතික කණ්ඩායම්හි පුහුණුකාරීත්වය අපේක්ෂාවෙන් කටයුතු කෙරේ. ක්‍රීඩාවේ පැවැතිය යුතු මහත්මා ගුණය විනාශ කරගනිමින් පරිපාලනය සමඟ ක්‍රීඩාවට නොගැළපෙන අයථා සම්බන්ධතා පවත්වා ගෙන යාම. පරිපාලනය කිසියම් විනිවිද බවකින් යුක්ත ක්‍රමවේදයක් යටතේ ජාතික පුහුණුකරුවන් තෝරා ගත යුතුය (දැනට සිදුකෙරෙන ලකුණු ලබාදීමේ සහ තේරීමේ ක්‍රමවේදය අවස්ථානුකූලව වෙනස්වන පරිද්දෙන් සහ පරිපාලනයේ සිතැඟි පරිදි සිය අවශ්‍යතා සපුරාගත හැකි වන අයුරින් එකී අවස්ථාවට සකස් කරගනු ලබන්නකි. නිදසුන් වශයෙන් වර්ෂ 2016 දී ජාතික කනිෂ්ඨ කාන්තා කණ්ඩායමට අදියර 1 සමත් පුහුණුකරුවකුගේ ක්‍රීඩිකාවන් හත් දෙනෙකු තොරාගනු ලැබුවද එකී පුහුණුකරුට එම කණ්ඩායමේ කිසිදු පුහුණු කටයුතු පිළිබඳ තනතුරක් නොලැබීම).

ජාතික කණ්ඩායම්වල කනිෂ්ඨ කණ්ඩායම සහ යොවුන් කණ්ඩායම (පිරිමි සහ කාන්තා) වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කිරීම පිණිස ක්‍රීඩක ක්‍රීඩිකා පුහුණු සංචිත තෝරා ගැනීම විධිමත් කිරීම. කිසියම් තරගාවලියක් ඉලක්ක කරගනිමින් ප්‍රමාණවත් කාල පරාසයක් මෙකී සංචිත පවත්වා ගෙන යා යුතුය. (ප්‍රායෝගික සහ අධ්‍යාත්මික පුහුණුව තුළින් දක්ෂතා දැක්වීමට ප්‍රමාණවත් කාලයක් අවම වශයෙන් අඛණ්ඩ නේවාසිකව මාස තුනකවත් කාලයක් අවශ්‍යවනු ඇත).

දෙවැන්න වන්නේ එකී පුහුණු සංචිත තුළින් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට සුදුසු කණ්ඩායම තේරීමයි. වර්තමානයේ මෙම තේරීමේ ක්‍රමවේදය කෙරෙහි විශ්වාසය කිසියම් දුරකට බිඳවැටී ඇත. ඊට

ප්‍රධානතම හේතු වශයෙන් හඳුනාගෙන ඇත්තේ තේරීම් මණ්ඩලයේ සමහර සාමාජිකයින්ගේ ස්වාධීනත්වයට බාහිර බලවේග මගින් හානි පැමිණවීම යි. එමෙන්ම තේරීම් මණ්ඩල සමහර සාමාජිකයින් පක්ෂග්‍රාහීව කටයුතු කිරීම (විටෙක තේරීම් මණ්ඩල සාමාජිකයින් හිතවතුන්ගේ හා පුහුණුකරුවන්ගේ දරුවන් පවා තෝරාගත් අවස්ථා දක්නට ඇත. තම දරුවකු හෝ ඥාති මිත්‍රයින් පුහුණු සංචිතවල සිටී නම් එවිට තේරීම් මණ්ඩල සමාජිකත්වයෙන් ඉවත්වීම සදාචාර ක්‍රියාවකි. එහෙත් එවැන්නක් සිදුනොවීම කණගාටුදායක තත්ත්වයකි. 2016 වසරේ පිරිමි ජාතික කණ්ඩායමේ පළමු ක්‍රීඩකයින් හය දෙනා අතරට තෝරන ලද ක්‍රීඩකයකු තම සේවා කරන යුධ හමුදා කණ්ඩායමේ පළමු ක්‍රීඩකයන් හය දෙනා අතරට ඇතුළත් නොවීම, 2016 ජාතික පිළ නියෝජනය කළ ක්‍රීඩකයකු තමන් සේවය කරන ආයතනයේ කණ්ඩායමවත් තෝරා නොගැනීම. මෙම වර්ෂයේ අන්තර් ආරක්ෂක වොලිබෝල් තරගාවලිය ජයගනු ලැබූයේ උක්ත කණ්ඩාමයි. එකී තරගාවලියේ දක්ෂතම ප්‍රහාරකයා වශයෙන් සම්මාන දිනාගනු ලැබූයේ ජාතික කණ්ඩායමට තෝරා නොගත් එහෙත් ජාතික කණ්ඩාමය නියෝජනය කිරිමට සියලු සුදුසුකම් සපුරා ඇති ක්‍රීඩකයකි).

තුන්වැන්න වන්නේ ජාතික තේරීම් කමිටු සාමාජිකයින් වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන තරගමාලා නැරඹීමටවත් සහභාගී නොවීම. එම නිසා ක්‍රීඩකයින්ගේ සැබෑ දක්ෂතා හඳුනාගැනීමේ පූර්ණ හැකියාව නොලැබෙනු ඇත. තේරීම් සිදු කෙරෙන අවස්ථාවේ දක්වන දක්ෂතා වලින් පමණක් වොලිබෝල් ක්‍රීඩාවේ සියලු දක්ෂතා හඳුනාගත නොහැකි බව තේරීම් කමිටුව හෝ එකී කමිටු පත්කරන බලධාරීන් නොදැන සිටීම. (මෙසේ තේරීම් කමිටු සමාජිකයින් තරගාවලී නැරඹීමට සහභාගි නොවීමට හේතු ලෙස ඔවුන්ගේ අදහස වන්නේ ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් හෝ ඒ වෙනුවෙන් මූල්‍යමය දීමනාත් නොලැබීම බවයි. එමනිසා ඉදිරියේදී මෙම ගැටලුවට සාර්ථක විසඳුම් ලබාදිය යුතු ය. එකක් ඔවුන්ට අවැසි පහසුකම් හා දීමනා ලබාදීම නැතිනම් එවැනි පහසුකම් හා දීමනා අපේක්ෂා නොකරන සුදුස්සන් එකී කටයුත්ත වෙනුවෙන් පත් කිරීමයි).

බොහෝ තරගමාලාවන්හි ක්‍රීඩා තරග විනිශ්චය පිළිබඳ මත බේද පවතී. ක්‍රීඩාවේ ජීව ගුණය ආරක්ෂා කරගැනීම පිණිස සුදුසුකම් පමණක් නොව පක්ෂග්‍රාහී නොවන විනිසුරුවන් භාවිත කළ යුතුය. සමහර විනිසුරුවන් ක්‍රීඩා සමාජ හෝ ආයතනවල ක්‍රීඩා කණ්ඩායම් පුහුණුකරුවන් වශයෙන් කටයුතු කරයි. එවැනි පුද්ගලයින් කිසි ලෙසකින්වත් තේරීම් කමිටුවලට හෝ විනිසුරුවන් වශයෙන් පත් නොකළ යුතුය. ඔවුන් සෑම විටම තම කණ්ඩායමට හෝ ක්‍රීඩා සමාජයට වාසි සහගතව විනිශ්චයන් ලබාදීම හෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තේරීම ශ්‍රී ලංකාව වැනි රටක නොවැලක්විය හැක්කකි (එක් වැරදි තීන්දුවක් පුහුණුකරුවකුගේ හෝ ක්‍රීඩකයකුගේ අනාගත පැවැත්ම තීරණය කෙරෙන ප්‍රධාන සාධකයක් වනු ඇත).

වොලිබෝල් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාවයි. එම නිසාම වොලිබෝල් ක්‍රීඩාව ආසියාවෙන් ඔබ්බට ගෙනයාමට නම් ඒ පිළිබඳව විධිමත් පර්යේෂණ සිදු කිරීමේ අත්‍යවශ්‍ය කරුණකි. වොලිබෝල් ක්‍රීඩාව සම්බන්ධව ජාත්‍යන්තර සහ අනාගත අභියෝග ජය ගැනීම සඳහා ඉලක්කගත පර්යේෂණ ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා දේශීයත්වය හොඳින් හඳුනන අප රට තුළ ක්‍රියාවට නැන්විය හැකි වොල්බෝල් ක්‍රීඩා ආකෘති ගොඩනැගිය යුතුය (මෙතෙක් අප ක්‍රියාත්මක කරන ලද විදේශීය ආකෘති වෙනුවට අප රටේ ක්‍රීඩකයින්ගේ දක්ෂතා හා හැකියා මෙන් ම ආකල්පවලට වඩාත් ගැළපෙන දේශීය ආකෘති හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම).

වොලිබෝල් ක්‍රීඩා ලීග් තරගමාලා සංවිධානය කිරීම මගින් රටතුළ වෘත්තීමය ක්‍රීඩකයින් බිහි කිරීම. පළමුව පළාත් මට්ටමින් වොලිබෝල් ක්‍රීඩා සමාජ බිහි කර එකී ක්‍රීඩා සමාජය නියෝජනය කිරීමට එක් ජාතික මට්ටමේ ක්‍රීඩකයකුට අවස්ථාව ලබාදීම. ඒ අනුව ලීග් තරගමාලා සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙන්දේසි වනු ඇත. මේ යටතේ එක් එක් ක්‍රීඩකයින්ට කිසියම් මූල්‍යමය වටිනාකමක් හිමිවන අතර එමගින් වෘත්තීමය ක්‍රීඩකයින් බිහි කළ හැකිය. දෙවනුව පළාත් මට්ටමින් ඔබ්බට ගොස් දිස්ත්‍රික්ක මට්ටමින් වොලිබෝල් ලීග් අරම්භ කර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හොඳ ඉල්ලුමක් සහිත වෙළෙඳපොලක් නිර්මාණය කළ යුතුය. මෙම කටයුත්ත වෙනුවෙන් විවිධාකාර අනුග්‍රාහකත්වයන් ලබාගත යුතුය. (මෙවැනි ලීග් තරගමාලාවන් බොහෝ රටවල ක්‍රියාත්මක වේ. එකී රටවල ක්‍රීඩා සමාජ නියෝජනය කිරීමට විදේශ ක්‍රීඩකයින්ටද අවස්ථාව ලබා දී ඇත).

සමාලෝචනය

වර්ෂ 1916 දී ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් වොලිබෝල් ක්‍රීඩාව වර්තමානය වන විට සිය වසක් සපුරා ඇත. දුප්පතාගේ හා ගමේ ක්‍රීඩාව වශයෙන් හඳුනාගත් වොලිබෝල් ක්‍රීඩාව 1980 දශකය අගභාගය වන විට ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් හා විනිසුරන් ජාත්‍යන්තරය දක්වා රැගෙන යාමට සමත් විය. ශත වර්ෂයක වොලිබෝල් ඉතිහාසය ප්‍රධාන යුග තුනක් යටතේ හඳුනාගත හැකිය. වොලිබෝල් ක්‍රීඩාවේ ආරම්භයේ සිට 1970 දශකය දක්වා අවධිය සම්ප්‍රදායික යුගය වශයෙන් ද, 1980 සහ 1990 දශක දෙකට අයත් කාල සීමාව වොලිබෝල් ක්‍රීඩා ඉතිහාසය පරිවර්තනයකට ලක් කළ අවධිය දෙවන යුගය වශයෙන්ද, 2000 දශකයේ සිට වර්තමානය දක්වා වොලිබෝල් ක්‍රීඩාවට ජාත්‍යන්තර තාක්ෂණය සපුරාගත් අවධිය ලෙස තුන්වන යුගයත් වෙන් කෙරේ. මෙම යුගයන්ට අදාළ කාල වකවානුවලදී ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ පරිපාලන කළමනාකරණය එකී යුග බෙදීමට දායකත්වය සපයා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපතිවරුන් තිදෙනෙක් මෙම යුග තුනට නායකත්වය ලබාදෙන ලදි. ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා පළමු යුගයේද, චරිත රත්වත්ත දෙවන යුගයේද, ඩිලාන් පෙරේරා තුන්වන යුගයේද යුග පුරුෂයන් වශයෙන් වොලිබෝල් ක්‍රීඩාව වර්තමානයේ ලබා ඇති දියුණුව වෙනුවෙන් කටයුතු කර ඇත.

වර්ෂ 1990 දී යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යංශය මගින් මහාචාර්ය විනී විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව මගින් වොලිබෝල් ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වශයෙන් තීරණය කරන ලදී. ජාත්‍යන්තර වොල්බෝල් ක්‍රීඩා තරගමාලා නියෝජනය කිරීම හා ජයග්‍රහණ අත්පත් කර ගැනීමට හැකිවීම අතීතයේ කරන ලද අයෝජනයන්හි ප්‍රතිලාභ වශයෙන් හඳුන්වා දිය හැකිය. ජාත්‍යන්තර මට්ටමේ පුහුණුකරුවන්, විනිසුරුවරුන්, ජාත්‍යන්තර විනිසුරු උපදේශකවරුන් හා ක්‍රීඩකයින් රැසක් සිටීම ජාතික ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් අප සතු මානව ප්‍රාග්ධනය වශයෙන් පෙන්වා දිය හැකිය. වර්තමානය වන විට ජාත්‍යන්තර මට්ටමේ ගෘහස්ත ක්‍රීඩාගාර රාශියක් රට තුළ ඉදිව ඇති අතර තවත් ක්‍රීඩාගාර රාශියක් ඉදිවෙමින් පවතී. එහෙත් වොලිබෝල් ක්‍රීඩාවට අවැසි තාක්ෂණික මෙවලම් ප්‍රමාණවත් සංඛ්‍යාවක් එකී ක්‍රීඩාගාරවල දක්නට නොමැත. ඒකී භෞතික ප්‍රාග්ධනය තවදුරටත් වර්ධනය කළ යුතුය. එසේ වනුයේ නම් පමණක් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාවේ අපේක්ෂිත ඉලක්ක ජයගැනීම උදෙසා අවැසි මානව සහ භෞතික ප්‍රාග්ධනය පිළිබඳව තෘප්තිමත් විය හැකි ය. අවසන් වශයෙන් සිදුවිය යුත්තේ එකී ප්‍රාග්ධනය නිවැරදි ව කළමනාකරණය කිරීම හා අයෝජනය කිරීම පමණකි. එකී කාර්යය ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සහ ක්‍රීඩා අමාත්‍යංශයේ වගකීම වනු ඇත.

මූලාශ්‍ර

රණසිංහ සුසිල්, (2012), වොලිබෝල් එදා සිට අද - ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ්, මාලිගාවත්ත, කොළඹ.

Dissanayaka A, (2004), 'Global Sports & Environmental Events Management', Sports & Physical Education Unit, International Summer School, University of Oslo, Norway.

Federation Internationale de Volleyball, (2000), 'History of Volleyball', FIVB Congress. FIVB Park in Lausanne, Switzerland.

Federation Internationale de Volleyball, (2015), 'Official Volleyball Rules 2015-2016', 34th FIVB Congress. FIVB Park in Lausanne, Switzerland.

www.FIVB.com, 'Olimpic Contribution', Best of the Best, Tokyo, Japan.

24

ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ සන්නිවේදන අර්ථ සමුදායක්

සුනන්ද මහේන්ද්‍ර

'' ගුරු '' යන යෙදුම අප සමාජයේ බහුලව භාවිතයට ආ උත්තම යෙදුමකි. '' ගුරු '' , ''දෙගුරු'' ''තිලෝගුරු'', ''ගුරුන්නාන්සේ '' , ''ගුරුකම් '' යන යෙදුම් ඒ හා සමඟ යෙදෙන අන්‍ය යෙදුම් සමුදායකි. '' ගුරු '' යයි සලකන්නේ යමක් '' උගත් '' හෙවත් '' ඉගෙනුමක් '' ලද කෙනෙකි. ඒ අනුව මේ යෙදුම '' ගුරු '' , ''ඇඳුරු '' , '' මහදුරු '' , '' වෙදදුරු '' යනාදී වශයෙන් දිගු වී පවතී. ඒ අනුව අප යමක් ඉගැන්වූ කෙනෙකුට මේ මඟින් '' ගුරු '' යයි කීමට අමතක නොකරමු.

'' ගුරු '' පදය විවිධාකාර ලෙස යෙදෙන හා යොදන අයුරු දැක ගැනීමට නම් සුමංගල ශබ්ද කෝෂය පෙරළා බැලිය යුතුය. ප්‍රාචීණවාදී සංස්කෘතියේ බහුල ලෙස යෙදෙන්නේ '' උත්තම '' හා '' සාධු '' යන අර්ථවල ය. මේ හේතුවෙන් ඉංග්‍රීසියේ "Teacher" යන්නට වැඩි අර්ථයක් Guru යන්නෙන් ප්‍රචලිතව පවතී. මේ හේතුවෙන් "guru" යන්නට බහුල සන්නිවේදනාර්ථ සමුදායක් එකතු වී පවතී. ' ''ගුරුන්නාන්සේ '' යන්න යාතුකර්ම ඇදුරන් හැඳින්වීමට යෙදෙන නාමයක් ලෙෂ හැඳින්වේ. එය කෙතරම්ද කිව හොත් ප්‍රාථමික සන්නිවේදනය ලෙස රංග කලාවේදී '' පොතේගුරු '' යන්නත් '' රංගගුරු '', '' නාට්‍යගුරු'' යනුවෙන් භාවිතා කෙරේ. පරපුරෙන් පරපුරට පැවත එනඥානය (දැනුම) මැනවින් හඳුනා ඒ ඥානය තම සිසු පරපුරට ප්‍රදානයකළ හැකි ශක්තිය ඇති කෙනෙකු වටා සැකසෙන කවය '' ගුරුකුලය '' ලෙස සැලකේ. ඉගැන්වීමක් කළහැක්කේ යමක් උගත් ගුරුවරයෙකු විසින්ය යන්න ජන සමාජයකදී වුව සැලකෙන්නේ සන්නිවේදනයේ '' ගුරු '' සංකල්පය හෙවත් (Teacher concept in Communication) යන්න ය. කිසියම් ජන මාධ්‍යයක් විභූෂණය වන්නේ ඊට අන්තර්ගත'' සන්දේශය '' Message දැන උගත් සන්දේශකයන්ගෙන් සැදුම්ලත් විට යන්න මින් ගම්‍ය කෙරේ. කිසියම් මතයක් සන්දේශ ගත කිරීමට නම් ඒ මතය පිළිබඳ දැනුමක් ඇති (Knowledgeable) සන්නිවේදකයෙකු අවශ්‍ය බව ඉන් ප්‍රකාශ කෙරේ.

මට වඩාත් හුරු රංග කලාවයි. රංග කලාවෙන් කළ යුත්තේ හුදෙක් විනෝදය සඳහාම විනෝදය සැපයීම නොවේ. රංග කලාව එක්තරා ක්‍රමයක චිකිත්සාවකි. (Therapy) හෙවත් ගුරුකමකි. කුමක්ද චිකිත්සාව කියන්නෙ? වෙදකමත්, එක්තරා සුවපත් කිරීමක්. රංග කලාව පැවත එන්නේ යාතුකර්මයෙනි. මොකක්ද යාතු කර්මය කියන්නේ ? (Ritual) මානව අවශ්‍යතාවක් (Human necessity) උපතේසිට මරණය දක්වාම මානවයා යාතු කර්මයේ නියැළී සිටින කෙනෙකි. සුදාරකෝත්පත්තිය , නැති නම් යහපත් දරු උපතක් සඳහා යාතු කර්මය අවශ්‍යය. දරු ගැබ දරා සිටින මවට එමගින් ශාන්තියක් අත්පත් කරදෙනු ඇත. එපමණක්, ගිලන්ගතව සිටින කෙනෙකුගේ සිත මෙන් කයත් සුවපත් කළ හැකි ය. ඊට ශාන්ති කර්ම අවශ්‍ය කෙරේ. ගිලන්ගත වීම ස්වාභාවිකයි. ඉන් මිදීම අවශ්‍ය ය. වැඩි කලක් යහතින් ජීවත් වීමට අකමැති කවුරුන්ද ? ආයු , වර්ණ , සැප , බල ඇති කෙනෙක් සිටිය හැකිද ? සිටිය නොහැකි ය. හිත සන්සුන් කර ගැනුමටට රංග කලාව අවශ්‍ය නොකෙරේද? සන්සුන් සිත සුව එළවයි. විනෝදය හා විවේක සුවය බද්ධ වී පවතී. රංග කලාවට සම්බන්ධ වන හැම කෙනෙකුන්ම සන්සුන් සිතින් සිටිය යුතුයි. රංග කලාවේ නියමුවාට එබැවින් ගුරුන්නාන්සේ යන්න ගැළපේ. කෙමෙන් රංග කලාවට සම්බන්ධ හැම කෙනෙක්ම '' ගුරු '' බවට පත්වේ.

කොහොමද එහෙම වෙන්නේ? විශාල ප්‍රේක්ෂකාගාරයකට ඉගැන්වේ. මොනවාද උගන්වන්නේ ? විවිධාකාර අත්දැකීම්, චින්තන, මෙහෙයුම්, යමක් උගන්වන්නා ගුරුවරයා, ඉගෙනීම (learning) හා ඉගැන්වීම (Teaching) නොමැතිව ජීවත් විය නොහැකිය. ජීවත් වුණත් එය සැබෑ ජීවිතයක් නොවේ. '' උපන්නාට මේ ලොව වැනෙමින් සිටීමක් '' ටික දෙනෙකුට උගන්වන්න, බොහෝ දෙනෙක් ඉගෙන ගනිති. කොන්ෆියුසියස්තුමා තමයි. එහෙම කිව්වේ.

අපට පෙරාතුව ජීවත් වූ ගුරුවරුන්ගෙන් අපි ඉගෙනුමක් ලැබුවා නොවේද? දැන් අපි, අපට පසුව එන අයට උගන්වනු ලබනවා. රංග කලාව උගත හොත් බොහෝ දේ උගත හැකිය. Watcher concept (ආරක්ෂක සංකල්පය) හා Forum Concept (මණ්ඩප සංකල්පය) ගුරු සංකල්පයෙන් පසුව එන සන්නිවේදන සංකල්පයන් ය.

සන්නිවේදකයා ''ගුරු සංල්පය'' ගුරු කොට ගත යුතුය යන්න විවිධාකාර ලෙස ප්‍රකාශ කෙරේ. තමන් දැන අන්‍යයන් දැනුම ඇත්තන් කළ යුතුය යන්න මින් ප්‍රකාශිත අර්ථය ය. බුදුන් වහන්සේ දසිය බක්සඟනට පැවසූ පරිදි, ''චරථ භික්කවේ චාරිකං චරමානු, බහු ජන සුඛාය, බහුජන හිතාය යන්න මෙහිදී සිහි කටයුත්තකි. තම බික්සඟන දැන උගත් පිරිසක් වීම හේතුවෙන් ඔවුන්ගේ බණ දම් උගන්නා ශ්‍රාවක (ග්‍රාහක) මණ්ඩල දැන උගත් වන අයුරු අප වටහා ගත යුතු ය. ජනමාධ්‍ය භාවිතයට මෙය අපූරු පසුබිමක් සකසයි. මේ කරුණ මැනවින් පෙන්නුම් කරන්නේ දූතෙය්‍ය සූත්‍රය අනුසාරයෙනි. නැණවත් දේ උගන්වන ගුරු හිමියන් අපේ රටේ බහුලව ගුරු හාමුදුරුවෝ යනුවෙන් භාවිතයට ගැනී පවතී. වඩාත් සමීපව බලන කල්හි ශ්‍රාවක, ග්‍රාහක මණ්ඩල දැනුමැත්තන් බවට පත් කිරීමට නම් භාණක ස්ථානය මැනවින් සන්නිවේදක පෝෂණයේදී තිබිය යුතු ය.

''ගුරුන්ට අකුරු වරදී'' යන ජන කියමනේ සැඟවුණු හෙවත් නිලීනාර්ථ (Hidden Meanings) සමුදායක් පවතී. ගුරුන්ට තමන් උගත් දේ වැරදීමට හේතුවක් සොයාගත නොහැකි ය. එහෙත් ගැඹුරින් කල්පනා කර බලන විට මෙය ගුරු පුහුණුව පිළිබඳ සංකල්පයක් ලෙස සැලකිය හැකිය. තමන් නිසි

ලෙස ඉගෙනුමක් ලද ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම ගුරු කාර්යයි. මෙය වරදින්නේ ගුරුවරයා නොමඟ යැවීමෙන් හෝ මං මුලා කිරීමෙනි. ගුරු වෘත්තිය මස්ත බාල්දු වූ කල්හි ද මෙය සිදු වනු වැළැක්විය නොහැකි ය. ගුරුන්ට වැරදීම යනු ඔවුන්ගෙන් ඉගෙනුම ලබන සිසුන්ට ද වැරදීමකි. එමගින් මුලු පරපුරකටම වැරදීමකි.

'තමනට කවුද ශිල්ප ශාස්ත්‍ර ඉගැන්නුවේ'' යනුවෙන් ඇසීමට පෙර සිට පැවත එන ප්‍රශ්නයකි. ඉන් ගම්‍ය වන්නේ සරල ලෙස බලන කල '' කවුද තමන්ගේ ගුරුවරයා ?'' යන්න ය. මගේ ගුරුවරයා අසවලා යනුවෙන් පටන් ගෙන ''අසවලා'' යයි කී සැනින් කෙනෙකු එක්කෝ නිශ්ශබ්ද වනු ඇත. නැතහොත් තවත් ප්‍රශ්න ඇත. ''කවුද ඕවා ඉගැන්නුවේ '' යනුවෙන් ඇසීමද සාමාන්‍යයෙන් සිදු වන්නකි. ''මම අහවල් විශ්වවිද්‍යාලයේ අහවල් ගුරුන්ගෙන් තමයි ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගත්තේ'' යයි කෙනෙකු පවසන්නේ මහත් ගර්වයකිනි. එහිම විකල්පයද සිදු වනු අප ඇස් පනාපිටම දක ගත හැකි ය.

ඔබේ රටේ බොහෝම ඉහළ වර්ගයේ ගුරුවරු ඇති නේද ? යන ප්‍රශ්නය මගෙන් කලකට උඩදී ඇසුවේ මහා සන්නිවේදන ශාස්ත්‍රඥයෙකු වූ මහාචාර්ය විල්බර් ශ්‍රාම් (Wilbur Schramm) මහතාය. මට ප්‍රථම වතාවටත්, අන්තිම වතාවටත් එතුමා මුණ ගැසුණෙ හවායි රටේ හොනොලුලු හි පිහිටි ඊස්ට් වෙස්ට්, මධ්‍යස්ථානය (East West Centre) නමින් ප්‍රකට සන්නිවේදන ශාස්ත්‍රාලයේදී ය. ශ්‍රාම් මහතා තුළ මා දුටුවේ අතිශය නිහතමානී උත්තම ගති ලක්ෂණ සමුදායකි. එතුමා මගෙන් එබඳු ප්‍රශ්නයක් ඇසුවේ කිනම් හේතුවක් නිසාද යන්න මට ඒ අවස්ථාවේදී නොවැටහිණි. එහෙත් කල්යත්ම එසේ නඟන ලද ප්‍රශ්නයෙන් එතුමා අපේක්ෂා කළ ප්‍රතිචාරය කෙබඳු දැයි මම වටහා ගතිමි. ඔව් මහාචාර්යතුමනි'' යයි පැවසූ මගේ මුවින් නිකුත් වදන් වැල මට මතක ය. අපේ රටේ ඉතාමත්ම ඉහළ වර්ගයේ ගුරුවරු ඉන්නවා ඒත් මට හරියටම ඔබතුමාට පිළිතුරු දෙන්නට පුළුවන්ද යන්න සැක සහිතයි. ඔබතුමා මගෙන් ඒවාගේ ප්‍රශ්නයක් ඇසුවේ මක් නිසාද කියලවත් මට තේරුම් ගැනීම අපහසුයි. ''මම හැම රටකින්ම මෙතැනට එන අයගෙන් මුලින්ම අහන ප්‍රශ්නයක් තමයි තමන්ගේ ගුරුවරුන් ගැන කල්පනාවේ නිමග්න වීමට තරම් සාධක සමුදායක් ඉන් බිහි විය. ''මට හමු වූ උත්තම ගණයේ ගුරුවරු කවරහුද ?'' මම මගෙන්ම ප්‍රශ්නයක් නැගුවෙමි. මට විටින් විට ඉගැන්වූ ගුරුවරු පෙළ ගැසී මගේ මතක ජවනිකා පිරෙන්නට වූහ. ඇතැම් ගුරුවරුන් අපට ඉගැන්වූ දේ සිහිපත් විය. ඇතැම් ගුරුවරුන් ගේ විවිධ නිර්මාණශීලී ඉගැන්වීම් (Creative Teaching) මට සිහිපත් විය.

පසුවදා විල්බර් ශ්‍රාම් මහතාගේ දේශනයකදී සන්නිවේදනයේ ගුරු සංකල්පය (Teacher Concept in Communication) යන්න අන්තර්ගත විෂය බවට පත් විය. සන්නිවේදනය යන්න සාම්ප්‍රදායිකව මානව සමූහයා අතර විවිධ අර්ථ වලින් පැවත එන අයුරු සාකච්ඡා විය. කෙමෙන් සන්නිවේදනාර්ථ (Communicationmeanings) යන්න ද බිහි වූ අයුරු අපේ කතා බහට ලක් විය. එකම විෂය ධාරාවක විසිරී පැතිරී ගිය සන්නිවේදනාර්ථ සමුදායක් තිබිය හැක. මේ තත්ත්වය වටහා ගැනීම එක් පැත්තකින් වදන ඔස්සේ බිහි වූ අර්ථ වලින් කියවෙන දේ හඳුනාගත යුතු ය. ඒ සඳහා පුළුල් ලෙස Semantics හෙවත් පද අර්ථ පිළිබඳ අධ්‍යයනය කිරීමට සිදු වේ. Semantics යන්න අර්ථ විචාරය ලෙසත්, පද අර්ථ විභාගය ලෙසත්, පද අර්ථ විභාගය ලෙසත් හැඳින ගැනීම අපට උගන්වා ඇත. කෙමෙන් මෙකල එය සන්නිවේදනාර්ථ ලෙසද ගැනේ.

ගුරු සිත නොරිදවා
වේලාව නොවරදවා
බැති පෙම් උපදවා
අකුරු උගනී කුමරු සොඳවා

යන කාව්‍යශේඛර කවි පද හතර මගේ මුවට නැගෙන්නේ විවිධ අර්ථ නගමිනි. '' ගුරු සිත ''යන යෙදුම කෙතරම් අපූරුද ? එහි හුද වාච්‍යාර්ථය ඉක්මන් වූ සියුම් සංකල්පයක් ඇතැයි මට හැඟේ. මේ නම් සාමාන්‍ය ගණයේ ගුරුවරයෙක් නොවිය හැකියි. මේ නම් සැබවින්ම උත්තම ගණයේ ගුරුවරයෙකු විය යුතුය. යන හැඟුමක් නිදන්ගත වේ. '' අකුරු උගැනීම '' යනු ශාස්ත්‍රඥ භාවය ලබාගැනුමකි. එය පහසුවෙන් ලද නොහැකි ය. ඉගෙනුම හා ඉගැන්වීම, (Learning and tcaching) පිළිබඳ පිරිපුන් දැනුමක් ලැබේ. නැණ නුවණ ලැබ ගැනුමට නම් අකුරු උගත යුතුය. සුභාෂිතයේ එන '' උගත මනා ශිල්පයමයි මතු රැකෙනා '' යන්න අපට මෙහිදී සිහිපත් වේ. නැණ නුවණ නොලබා සිටීම යනු අන්ධකාරයේ නිමග්න වීමකි. ගුරු සිත රිදවන්නේ නම් ඉන් ලැබෙන්නේ අනිෂ්ට ප්‍රතිඵලයන්ම ය. තවද අර්ථයක් වන '' ගුරු '' යන උත්තම හෙයින් හවන් උත්තමයකුගේ සිත නොරිදවිය යුතු බවයි. ගුරු කෙනෙකුන්ගේ සිත නොහොබනා ලෙස රිදවීම වරදකටත් වඩා'' පාපයක් '' බව පෙන්නුම් කෙරෙන ප්‍රබලතම නිදසුන් ලැබෙන්නේ දෙව්දත් චරිතයෙනි. දෙව්දත් තුමන්ගේ ගුරුන්ගේ සිත රිදවී ය.

ගුරු පරපුර (Generation of teachers) යනු උත්තම මානව සම්ප්‍රදායකි. එබැවින් ගුරුවරයා යනු හැමටම ඉහළින් සිටින හා හිඳවන කෙනෙකි. මුල් ගුරු, උප ගුරු, යනාදී යෙදුම් පහළ වී ඇතත් ඒ හැම කෙනෙකුටම නිවාස වන්නේ ගුරු ගෙදරය. ආදිතම යෙදුමක් ලෙස එය සැලකිය හැකිය. රජවරුන්ගේ දූපුතුන් හෙවත් කුමර , කුමරියන් තම ඉගෙනුම් කටයුතු සඳහා රාජගුරුන් ලෙස පිදුම් ලද දිසාපාමොක් නමින් හැඳින් වූ ගුරුවරු සොයා යාම සම්ප්‍රදායක් විය. '' ගුරු තන්හි තබා සැලකීම ''යනු පැරණි සම්භාව්‍ය සාහිත්‍යයේ එන සංකල්පයකි. තම ගුරුන් නැමද ඉගෙනුම් කටයුතු පටන් ගැනීමට ඉන් ඇරඹිණි. ගුරුවරයකු හමුවට යන සිසුවා කළේ එකත්පස්ව හිඳීමකි. එය ගුරු ගෞරවය ලෙස හඳුන ගත යුත්තකි. ගුරු ගෞරවය කෙමෙන් දුරස් වනාවාත් සමඟ ගුරු - ගෝල හෙවත් ගුරු - සිසු පරතරය ද ඈත් විය. ඒ හේතුවෙන්ම ගුරු වෘත්තිය තවත් සාමාන්‍ය වෘත්තියක් බවටපත් වූවාට සැක නැත. '' ගුරු සංගම් '' අවශ්‍ය වූයේ ගුරු වෘත්තියේ ගෞරවය රැක ගැනීමය. ගුරුවරුන්ට ගෞරව කරන සමාජයකට ගුරු සංගම් අවශ්‍ය නොවේ. ගුරු පූජා පැවැත්වූයේත්, ගුරු දින පැවැත්වූයෙත් ගුරුවරයන්ට ගෞරව කරන සමාජ පැවැත්මේ උත්තමාංගයක් වශයෙනි. උත්තම ගණයේ ගුරුවරුන්ට තම සිසුන් විසින් ගුරු පූජා පැවැත්වීම හදවතට එකඟව සිදු වූ ක්‍රියාදාමයක් ය. '' මට ඉගැන්වූ ඇතැම් ශ්‍රේෂ්ඨ ගුරුවරුන් නිසා තමයි. මට අද මේ තත්ත්වයට ඒමට පුළුවන්කමක් ලැබුණේ. යනුවෙන් කෙරෙන ප්‍රකාශන අපට අසන්නට ලැබේ. මට ඉතිහාසය ඉගැන්වූ මගේ ගුරුවරුන් මට නිතරම සිහිපත් වෙනවා යි ශ්‍රී ජවහල්ලාල් නේරුතුමා ප්‍රකාශ කළේ ය. '' උත්තම ගණයේ ගුරුවරුන් නැති සමාජය වූ කලී , කැලි වලට භේද භින්න වී පැවතීම වැළැක්විය නොහැකිය. චීන මහා දාර්ශනික කොන්ෆියුසියස් (Confusius) ප්‍රකාශ කළේ ය. '' බොහෝ තීරණ ගැනීමේදී මට මගේම ගුරු වීමට සිදු වූ වාර අපමණ ය. යි මහත්මා ගාන්ධි තුමා ප්‍රකාශ කළේය. ''ගුරු මහත්ම, මහත්මාවනි' යයි ඇමතූ අනගාරික ධර්මපාල තුමා මෙසේ කීය 'දරුවන්ට හරි හැටි උගන්වන්න. ඒත් ඒ මදි, ආගම දහම ගැනත් උගන්වන්න රට බේරා ගැනීමට උගන්වන්න.

සන්නිවේදනය කෙමෙන් තාක්ෂණය හේතුවෙන් දිගු වී ජන මාධ්‍ය බේදයක් බවට පත් වීමේදී ගුරු කාර්යය (teacher function) ඊට නතු වූ අයුරු ප්‍රථම කොට අපට උගන්වනු ලැබුවේ මහා බ්‍රිතාන්‍ය සන්නිවේදන ශාස්ත්‍රඥයකු වූ රේමන්ඩ් විලියම්ස් (Rymond Williams) සහ ජෝර්ජ් ගාබ්නර් (George Gerbner) විසිනි. ඔවුන් පැහැදිලි කළ මතවාදයන්ට අනුව ජනමාධ්‍ය භාවිතයේදී තෙවැදෑරුම් ධර්මතාව (Three fold function) යළිත් සිහිපත් කර ගත හැකි ය. ඒවා නම්,

1. Watcher (ආරක්ෂක)
2. Forum (මණ්ඩප)
3. Teacher (ගුරු)

ජනමාධ්‍ය භාවිතයේදී වඩාත් ප්‍රබලත්වයක් දක්වනු ලබන්නේ ගුරු සංකල්පයට අනුකූලව ය. ඒ කෙසේද යත් සන්නිවේදකයා තම භූමිකාව (Role) කෙමෙන් ගුරුවරයෙකුගේ කාර්යයට හරවා ගන්නා විට එම සන්නිවේදකයා හා ඔහුගේ හෝ ඇයගේ මාධ්‍ය (Medium) කෙරෙහි අවනත බවක් (loyalty) දැකගත හැකි වේ. මේ අවනත බව විටෙක ඇල්මකි. තවත් විටෙක ගෞරවයකි. ලිඛිත, ශ්‍රව්‍ය හා දෘශ්‍ය යන මාධ්‍යයන් මගින් මීට කොතෙකුත් නිදර්ශන පැරණි නවීන භේදයකින් තොරව දැන හැඳින ගත හැකි ය. දිනපතා ලංකාදීප පුවත්පතේ, කලක් මුළුල්ලේ දිනපතා පළවූ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ '' වගතුග '' තීරු රචනාව කියවූ පාඨක ජනයාට එකල හැඟුණේ තීරු රචකයා හුදු ලේඛකයෙකු හෝ හිඩැස් පුරවන්නකු (gag writer) නොව එම සීමාවෙන් ඉක්මවූ ගුරු සංකල්පයක පිහිටා ඇති බවකි. වගතුග තීරුවේ බෙහෙවින් ගැබ් වූයේ ගුරු උපදේශයන් හා මාර්ගෝපදේශයන් ය. මෙලෙසින්ම කලක් මුළුල්ලේ '' ඇත්ත '' පුවත්පත්හි කතුවැකිය පළ කළේද සන්නිවේදනයේ '' ගුරු '' සංකල්පයයි. සමාජයක පවත්නා ඇතැම් විෂමතා දුරු කිරීමට ජනමාධ්‍ය කාර්යභාර්ය උපයෝගී කර ගත හැකි ය. මෙබඳුම ගුරු සන්නිවේදන සංකල්පය ශබ්ද මාධ්‍යයේ ප්‍රබලත්වයට ද හැරවිය හැකි ය. මෙහිදී නිවේදකයාගේ කාර්යභාර්ය මුල් තැනක් ගනී. නිවේදකයෙකුට තම ශ්‍රාවක මණ්ඩලය වෙත කෙතරම් සමීප විය හැකිද යන්න උරගා බැලීමේ සමීක්ෂණ රැසක් බී බී සී ලෝක සේවය (BBC World Service) මගින් පවත්වන ලදී.

ඉන් ප්‍රධාන සාධකය සලකනු ලැබුවේ තොරතුරු විකාශනයේ (Information dissemination) හි අන්තර්ගත වූ නිරවද්‍යතාවයි. (accuracy) නිවැරදිව දැනගන්න නිවැරදිව සන්නිවේදනය කරන්න යනු ලෝක සේවයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වූ ජෝන් රීච් (John Reith) ගේ මතය විය.

යමක් දැන ඉගෙන සිටීම එසේ නොදැන සිටීමට වඩා හැම අතින්ම යහපත බව ප්‍රකාශ කෙරේ. ඇතැම් විටෙක සාමාන්‍ය වශයෙන් හෝ නීතිය (law) නොදැන සිටීම හේතුවෙන් දඬුවම් ලැබීමට හේතු කාරක බව පෙනී යයි. දැනගෙන ගියොත් කතරගම නොදැන ගියොත් අතරමඟ යන කියමනින් මෙබඳු බොහෝ දේ ස්වදේශික වශයෙන් පළ කෙරේ.

''මග හොඳට තිබේ නම්
යන්න දැසත් පෙනේ නම්
කිම බැදි වල යන්නෙ
මංමුලා වූ එකෙකු සේ ''

යන්න ඔවදන් මුසු ආප්ත කවි පද හතරක් ලෙස සැලකිය හැකිය.

ඉගෙනුම් විධික්‍රම (Learning techniques or methods) ලෙස බෙහෙවින් ව්‍යවහාරයේ පවතී. යම්කිසි කාර්යයක් මැනවින් හා විධිමත් ලෙස ඉගෙනුම් ලැබීම ඉන් අදහස් කෙරේ. පුහුණුවකින් කිසියම් කාර්යයක් සංයුක්ත විය යුතු බවක් ගම්‍ය කෙරේ. නුපුහුණු වෛද්‍යවරයෙකුට නිසි වෘත්තීය පුහුණුව සඳහා පරිවාස කාලයක් ඇත. මෙහි ද තම වෛද්‍ය වෘත්තික පුහුණුව මැනවින් ලද හැකි ය. එම සුදුසුකම නොලබා මැනවින් ඉගෙනුම ලද තැනැත්තා වෛද්‍යවරයෙකු වශයෙන් නොසැලකේ. යුද භටයෙකු වීමටද පුහුණුවක් ලද යුතු ය. ඉන් තොරව යුද බිමට යා නොහැකි ය.

මා ඇසූ එක්තරා රංග ගුරුතුමකු පිළිබඳ සැබෑ කතාවකින් මේ සටහන් පෙළ සමාප්ත කිරීමට කැමතියි. ඒ කතාවේ මතුපිට පෙළට වඩා වැදගත් වන්නේ ඉගෙනීම හා ඉගැන්වීම් පිළිබඳ යටි පෙළයි.

එක්තරා අධ්‍යාපන ඇමතිවරයෙක් එක්තරා රංග ගුරුතුමෙකුගේ කතාවකට කන් දී සිට මෙහෙම කියනවා

ගුරුතුමනි , ඔබ දන්නා පරිදි තමයි මේ රටේ අධ්‍යාපනය භාර ඇමතිතුමා මම ඔබතුමාගේ කතාව ඉතා ආසාවෙන් අසා සිටියා. මටත් නිකමට වාගේ සිතුනා රංග කලාව ඉගෙන ගැනීමට ඇත්නම් කියලා. මේ නිසා මම කල්පනා කලා ඔබතුමාත් මගේ අමාත්‍යාංශයේ උපදේශක තනතුරකට පත් කරන්නට එවිට ඔබතුමන්ට පුළුවන්කමක් ලැබේවි මට හිතෙනවා අපේ ගුරුවරුන්ට රංග කලාව පිළිබඳ හොඳ දැනුමක් ලබාදීමට

ඇමතිවරයාගේ මේ කතාව අසා සිටි රංග ගුරුතුමා මොකක්ද කීවේ ?

බොහෝම ස්තුතියි ඇමතිතුමනි, මම ඒ තනතුර භාර ගන්නට ඒ හැටි කැමැත්තක් නැහැ.

' ඒ මක් නිසාද?

' එවිට මට සිදු වන්නේ මා තුළ ජීවත් වන රංග ගුරු මියගොස් වෙන කෙනෙක් මතු වීමයි.

' එසේ නොවන්නට වගබලා ගත නොහැකිද?

' ඒසේ වීමට නම් මම , මට හුරු රංග කලාවේ ම නියැළී සිටිය යුතුයි '

උපදේශක තනතුර භාර ගන්නේ නැද්ද ?

'නැහැ එය මට කටු ඔටුන්නක් වේවි.

ඇමතිවරයා බෙහෝ වේලා කල්පනාවන් බලා සිටියා රංග ගුරුවරයා දිහා .

(ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රධානෝත්සවය අමතා පවත්වන ලද දේශන පිටපතයි)

25

ආයතනික සන්නිවේදනය

අසිත ප්‍රභාත් මල්ලවආරච්චි

සාරාංශය

වර්තමාන සමාජය තුළ පවතින ඕනෑම සමාගමක හෝ සංවිධානයක අනාගත අභිවෘද්ධිය, එම ආයතනයේ කොටස් කරුවන්, ආයෝජකයන්, පාරිභෝගිකයන්, සේවකයන් හා ප්‍රජා සාමාජිකයන් අතර පවතින විශ්වාසය මත රඳා පවති. ආයතනික ක්‍රියාකාරිත්වය ගෝලීයකරණය වීමත් සමගම එය වඩා ක්‍රමවත්ව, සක්‍රීයව හා විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යාමට එකි ආයතනයේ වෘත්තිකයන් අනුගමනය කරන විධික්‍රම ඉතා වැදගත් ය. එහිදී සන්නිවේදන වෘත්තිකයන්ට හා මහජන සම්බන්ධතා නිලධාරින්ට සුවිශේෂි ස්ථානයක් හිමි වේ. ඔවුන්ට ආයතනය තුළ සිදුවන සියලු සන්නිවේදන කටයුතු ආවරණය කිරීමට අවශ්‍ය විධිමත් කළමනකරණ ක්‍රියාවලියක් අවශ්‍ය වේ. ඒ අනුව ආයතනයක පවතින අභ්‍යන්තර හා බාහිර කටයුතු සන්නිවේදනය කිරීමේ කළමනාකරණ ක්‍රියාවලිය ආයතනික සන්නිවේදනය (Corporate Communication)තුළින් සිදු වේ.

ආයතනික සන්නිවේදනය හැඳින්වීම

ආයතනයේ අනන්‍යතාව මත එම ආයතනයේ ප්‍රතිරූපය ගොඩනගන සන්නිවේදන ක්‍රියාවලිය, ආයතනික සන්නිවේදනය ලෙස හැඳින්විය හැකිය. Corporate Communication යන වචනයෙන් සරලව අදහස් වන්නේ එයයි. කළමනාකරණ ක්ෂේත්‍රය තුළ මහජන සම්බන්ධතා විධික්‍රමයක් ලෙස Corporate Communication යන්න බහුලව භාවිත වේ. ඒ අනුව සංවිධානයක් හෝ සංවිධාන කිහිපයක් එකට ගෙන යාමේදී ඒ යටතේ කළමනාකරණය කිරීමට අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන කටයුතු ආවරණය කිරීම මේ යටතේ සිදු වේ. ආයතනික සන්නිවේදය Van Riel නිර්වචනය කර ඇත්තේ "ආයතනය රඳා පවතින කණ්ඩායම් සමඟ ගැළපෙන සම්බන්ධතා නිර්මාණය කරන සහ බාහිර සන්නිවේදන ආකාරයන් කාර්යක්ෂමව හා සඵලදායි ලෙස සුසංගත කරනු ලබන කළමනාකරණ උපක්‍රමයක් " (ජිනදාස, 2014, පිටුව 180) ලෙස ය.

ආයතනික සන්නිවේදනය Joep Cornelisser දක්වා ඇත්තේ, "Corporate communication is a management function that offers a framework and vocabulary for the effective coordination of all means of communication with the overall purpose of establishing and maintaining favorable reputations with stakeholder groups upon which the organization is dependent"(Chistensen, Morsing, Cheney,2008, Page 15). මෙම අර්ථ දැක්වීමට අනුව පැහැදිලි වන්නේ, ආයතනික සන්නිවේදනය යනු සංවිධානය මත පදනම්ව සිටින කොටස්කරුවන් හා අනෙකුත් කණ්ඩායම්වල සමස්ත අභිමතාර්ථයන්ට හිතකර ලෙස එකඟත්වයෙන් පවත්වාගෙන යනු ලබන සියලු මාධ්‍යයන්ගේ ඵලදායි සම්බන්ධීකරණය සඳහා වන රාමුවක් ලෙස සකස් කළ කළමනාකරණ ක්‍රියාවලියක් බවයි.

Chris fill ආයතනික සන්නිවේදනය ප්‍රධාන කොටස් 03 බෙදා දක්වයි.

1. Symbol- සලකුණු
2. Behaviour- හැසිරීම්
3. Different forms of planned communication- විවිධ ආකාරයේ සන්නිවේදන සැලසුම් (Fill, 2009, Page 394).

Chris fill දක්වන ආකාරයට මෙම සන්නිවේදන සැලසුම් අලෙවිකරණ සන්නිවේදන ක්‍රමවේදයක් ඔස්සේ සිදු වේ. ආයතනික සන්නිවේදනයට අනුව යම් ආයතනයක අනන්‍යතාවයට අනුව එහි ප්‍රතිරූපය ගොඩනැඟීමට සලකුණු (Symbol), හැසිරීම්(Behaviour) හා විවිධ ආකාරයේ සන්නිවේදන සැලසුම් (Different forms of planned communication)ඉතා අත්‍යවශ්‍ය වේ.

ආයතනික සන්නිවේදනය සැලකිය යුතු කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකි. එහිදී සන්නිවේදනය කිරීමට ලැබෙන පාර්ශ්වකරුවන්, මහජනතාව (Public) නැත්නම් සංඝටක (constituents) ලෙස හැඳින්විය හැකි ය. ඩොල්ෆින් (Dolphin) දක්වන ආකාරයට "අභ්‍යන්තර සන්නිවේදනයක් සිදු නොවී බාහිර සන්නිවේදනයක් සිදුවිය නොහැක" (Paul Copley, 2004, Page 264).ආයතනය තුළ පවතින සැබෑ ස්වරූපය හඳුනාගැනීමටත්, පවතින ගැටලු හඳුනාගැනීමටත්, එම ගැටලු නිරාකරණය කිරීමටත්, ආයතනයේ දැක්ම කරා ළඟාවීමටත් ආයතනික සන්නිවේදනය ඉතා අත්‍යවශ්‍ය වේ. අදහස් හුවමාරුව, ගැටලු හඳුනාගැනීම, සුදුසු උපාය මාර්ග තීරණය කිරීම, ආදි කටයුතු ඔස්සේ ආයතනික සන්නිවේදනය සවිබල ගැන්විය හැකිය. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සංවිධානගතව උද්‍යෝගය ඇති කිරීම, පිළිගැනීම වර්ධනය කිරීම, ගෞරවය පෝෂණය කිරීම, සිදු කළ යුතු ය. එහිදී නව අදහස්, නව නිෂ්පාදන, මනා කැපවීම සඳහා අවස්ථාව ලබාදිය යුතු අතර ආයතනයේ සේවකයන්ගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීම වාසි සහගත වේ. ආයතනයක පවතින කාර්යය සැලසුම්කරණය හා සන්නිවේදනය යන්න ප්‍රධාන ආකාර 03 ක් යටතේ දැක්විය හැකි ය.

1. කළමනාකරණ සන්නිවේදනය (Management Communication)
2. අලෙවිකරණ සන්නිවේදනය (Marketing Communication)
3. ආයතනික සන්නිවේදනය (Corporate Communication)

කළමනාකරණ සන්නිවේදනය, ආයතනයක අභ්‍යන්තර හා බාහිර කණ්ඩායම් අතර සිදු වන්නකි. කළමනාකරණ සන්නිවේදන න්‍යායන් මත පදනම්ව මෙම ක්‍රියාවලිය සිදු වේ.

අලෙවිකරණ සන්නිවේදනය, ආයතනය තුළසිදුවන භාණ්ඩ හා සේවාවන් අලෙවි කිරීම සඳහා වන ප්‍රචාරණය, අලෙවිකිරීම හා අනුග්‍රාහක කටයුතු යනාදි ක්‍රියාවලින්ගෙන් සමන්විත වේ.

ආයතනික සන්නිවේදනය මහජන සම්බන්ධතා, රාජ්‍ය සම්බන්ධතා, ආයෝජක සම්බන්ධතා, පාරිසරික සම්බන්ධතා ආදිය මත පදනම්ව පවතින පුළුල් ක්‍රියාවලියක් වේ.

ආයතනික සන්නිවේදනයේ ස්භාවය

ආයතනික සන්නිවේදනය සිදු කිරීමේදි සාර්ථක සබඳතා සමඟ සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් පුළුල් විදග්ධ දැනුමක් අවශ්‍ය වේ. එයට අදාළ පාර්ශ්වකරුවන් එම විෂයපථය තුළ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ගෝලීය දැනුමකින් යුක්ත විය යුතු ය. එහිදි සංවිධානය අතින් අත්පත් කරගැනීම්, බෙදා හැරීම් මෙන්ම ආයතනය තුළ පවතින නව දිශාවන් ස්ථානගත කිරීම්, මහජන මතය, දේශපාලන නායකත්වය, කොටස්කරුවන් ආදි සියල්ල කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එම නිසා ආයතනික සන්නිවේදනය යන්න සරල සංකල්පයක් ලෙස හඳුනානොගතයුතු අතර එහි සාර්ථක අසාර්ථකතාව මත සමස්ත ආයතනයේම ඉදිරි රඳාපැවැත්ම ගොඩනැගී ඇත.

ආයතනික සන්නිවේදනය මූලික ආකාර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.



මේ අනුව ආයතනයක සන්නිවේදනය යම් ආයතනයක අනන්‍යතාව, විශ්වාසය, ප්‍රතිරූපය, කීර්තිනාමය යන දෑ ඉස්මතු කිරීම වෙනුවෙන් කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කරයි. එයින් පැහැදිලි වන්නේ ආයතනික සන්නිවේදනය හුදෙක් තොරතුරු හුවමාරුවක් ලෙස පමණක් හඳුනාගැනීම ප්‍රමාණවත් නොවේ. එය තොරතුරු හුවමාරුව ඉක්මවා ගිය ක්‍රියාවලියකි. සේවකයන් සිය අදාළ කාර්යයන් ඉටු කරනු ලබන ආකාරය, අනෙකුත් පාර්ශ්වයන් සමඟ ගනුදෙනු කරන ආකාරය, බාහිර සමාජය සමඟ ගනුදෙනු කරන ආකාරය, අනෙකුත් සංවිධාන සමඟ සම්බන්ධීකරණය වන ආකාරය ආදි වශයෙන් විවිධාකාර ක්‍රියාකාරිත්වයක් මේ තුළින් දැකගත හැකිය. ඊට අමතරව සේවක හා ප්‍රජා සම්බන්ධතා, සන්නිවේදන කළමනාකරණය, ගැටුම් නිරාකරණය, නිපුණතා වර්ධනය ආදි ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ.

ආයතනික සන්නිවේදන ක්‍රියාවලිය තුළ පවතින මූලික වගකීම් කිහිපයක් Jeep Cornelissenවිසින් ඉදිරිපත් කර ඇත.

- වෙළඳ නාමය පිටුපස සිටින ආයතනයන්ගේ ආයතනික පැතිකඩ ප්‍රවර්ධනය කිරීම.
- ආයතනයන්ගේ අපේක්ෂිත අනන්‍යතාව ඉස්මතු කිරීම හා පවතින විෂමතා අවම කිරීම.
- සන්නිවේදන කාර්යයන් ඉටු කිරීම.
- සන්නිවේදන කාර්යයන් පිළිබඳව නිවැරදි තීරණ ගැනීම, ක්‍රියාමාර්ග සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
- ආයතනික අරමුණු ඉටු කිරීම.
- අභ්‍යන්තරික හා බාහිර සහයෝගය වැඩි දියුණු කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපාරික ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම (Cornelissen, 2004, Page 28).

මේ අනුව ආයතනික සන්නිවේදනය යම් ආයතනයක අනන්‍යතාවය, විශ්වාසය, ප්‍රතිරූපය, කීර්තිනාමය යන දෑ ඉස්මතුකිරීම වෙනුවෙන් කේන්ද්‍රිය භූමිකාවක් ඉටුකරන බව පෙනී යයි. ඒ බව ඉහත සඳහන් සාධක අනුව පැහැදිලි වේ. අනෙක් අතට ආයතනික සන්නිවේදනය හුදෙක් තොරතුරු හුවමාරුවක් ලෙස පමණක් හඳුනාගැනීම ප්‍රමාණවත් නොවේ. එය තොරතුරු හුවමාරුව පරයා ගිය ක්‍රියාවලියකි. සේවකයන් සිය අදාල කාර්යයන් ඉටු කරනු ලබන ආකාරය, අනෙකුත් පාර්ශවයන් සමඟ ගනුදෙනු කරනු ලබන ආකාරය, අනෙකුත් සංවිධාන සමඟ සම්බන්ධීකරණය වන ආකාරය ආදී වශයෙන් විවිධාකාර ක්‍රියාකාරිත්වයක් මේ තුළින් දැකගත හැකිය. ඊට අමතරව සේවක හා ප්‍රජා සම්බන්ධතා සන්නිවේදන කළමනාකරණය, ගැටුම් නිරාකරණය, නිපුණතා වර්ධනය ආදි ක්‍රියාමාර්ගයන් ගණනාවක් ද ඇතුළත් වේ. ඒ අනුව ආයතනික සන්නිවේදනයෙහි භූමිකාව පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඊට ඇතුළත් ප්‍රධාන සංරචක කිහිපයක් Van Riel විසින් ඉදිරිපත් කර ඇත.

I. **අභ්‍යන්තර සන්නිවේදනය** (Internal Communication)

ආයතනයක් තුළ ඒදිනෙදා පවතින කෙටිකාලීන ක්‍රියාකාරකම් මේ යටතට අයත් වේ. විශේෂයෙන් ම පුද්ගලයන් අතර හා දෙපාර්තමේන්තුව අතර සිදුවන සන්නිවේදන කටයුතු ප්‍රධාන වේ.

II. **මහජන සම්බන්ධතා** (Public Relations)

ආයතනය, සංවිධානය හා මහජනතාව අතර අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතා ස්ථිර කිරීම, පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම ආදි සමස්ත ක්‍රියාදාමය මෙයට ඇතුළත් වේ.

III. **ආයතනික හෝ මහජන කටයුතු** (Corporate or Public Affairs)

මහජන මතය හා තීරණ ගැනීම ආයතනය හා සම්බන්ධ සමාගම් හෝ ආයතනයට තර්ජනයක් වන සමාගම් සම්බන්ධව ක්‍රමෝපායික ක්‍රියාමාර්ග අනුගමනය කිරීම, ඉලක්කගත කණ්ඩායම් සමඟ ගනුදෙනු කිරීම, අභ්‍යන්තර හා බාහිර ආයෝජන සම්බන්ධතා පවත්වාගෙන යාම. සංකීර්ණ සමස්තයම ආයතනික හෝ මහජන කටයුතු තුළින් සිදු කරනු ලැබේ.

IV. **පාරිසරික ප්‍රතිපත්ති** (Environmental Policies)

මෙහිදි විශේෂයෙන්ම ඉලක්කගත කණ්ඩායම් සමඟ කටයුතු කරන ආකාරය ඉතා වැදගත් කොට දැක්විය හැක. අභ්‍යන්තර හා බාහිර වශයෙන් උපායමාර්ග සංවර්ධනය කිරීමෙදි මෙම ප්‍රතිපත්ති මත සිට කටයුතු කිරීම ආයතනයේ ප්‍රවර්ධනයට ඉතා වැදගත් වේ. සමාගමේ කාර්යය සාධනය පවත්වාගෙන යාමේදි හා අනාගත අපේක්ෂාවන් පිළිබඳ නිවැරදි දැක්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වේ.

V. **ආයෝජක සම්බන්ධතා** (Investor Relations)

ආයතනයේ හෝ සමාගමේ මූල්‍යමය සාධකය පෝෂණය කරනු ලබන අලෙවිකරණ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම මේ යටතේ වැදගත් වේ.

VI. **ශ්‍රම වෙළඳපොළ සන්නිවේදනය** (Labour Market Communication)

අනාගත සේවකයන් තෝරා ගැනීම, බඳවා ගැනීම හා පුහුණු කිරීම මෙන්ම උපදේශකයන් පත් කර ගැනීම වැදගත් වේ. අනෙක් අතට නියෝජිතයන් සමඟ ඒකාබද්ධ සන්නිවේදන ගිවිසුම් පිළිබඳව ද අවධානය යොමුකල යුතුය.

VII. **ආයතනික ප්‍රචාරණ** (Corporate Advertising)

ආයතනය හෝ සංවිධානය සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම හෝ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා කරනු ලබන සන්නිවේදන කටයුතු ආයතනික ප්‍රචාරණය ඔස්සේ අධ්‍යයනය කළ හැක (Paul copley, 2004, Page 207).

ආයතනික සන්නිවේදනයේ ව්‍යුහය

ආයතනික සන්නිවේදනයේ අභ්‍යන්තර ව්‍යුහය පිළිබඳව අවධානය යොමු කිරීමේදි මානව සම්පත හා මහජන සම්බන්ධතාව යන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. මෙහිදි මානව සම්පත ලෙස

අදහස් කරනු ලබන්නේ,"යම් ආයතනයක හෝ සංවිධානයක සේවය කරනු ලබන පිරිසය. මහජන සම්බන්ධතාව යනු යම් සමාගමක්, නිෂ්පාදනයක් හෝ පුද්ගලයෙක් ඒ පිළිබඳව හොඳ හිත, එසේ නැත්නම් අවබෝධය සහ මහජන ප්‍රතිරූපය ඇතිකරනු ලබන ක්‍රියාමාර්ගයයි" (ජිනදාස, 2016). අලෙවිකරණය යනු මහජන අවශ්‍යතා තුළින් හඳුනා ගැනීම, ඒ පිළිබඳ කලින් සිතීම හා මහජන අවශ්‍යතා ඔවුන් සතුටු වන ආකාරයට ලාභදායි ලෙස ලබා දීම පිළිබඳ වූ කළමනාකරණ ක්‍රියාවලියකි. මේ අනුව මහජන සම්බන්ධතාව හා අලෙවිකරණය කිසියම් ආයතනයක පවතින ප්‍රධාන කළමනාකරණ ක්‍රියාවලි දෙකකි. එය කළමනාකාරිත්වයේ පවතින අවබෝධය, ආයතනික සංස්කෘතිය මත රඳා පවති. මේ අනුව ආයතනික සන්නිවේදන ක්‍රියාවලිය පවත්වාගෙන යාම ඉතා සංකීර්ණ මෙන්ම ආයතනයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියක් බව පැහැදිලි වේ.

ආයතනයක සන්නිවේදන කාර්යය පිළිබඳ අවධානය යොමු කිරීමේදී එය ආයතනික මට්ටම්වලින් පමණක් නොව විවිධ මට්ටම්වලින් සිදුකරනු ලබන සංකීර්ණ ක්‍රියාවලියක් බව පැහැදිලි වේ. එහිදී අදාළ පාර්ශවයන්ගේ සක්‍රිය දායකත්වය පමණක් නොව මනා කළමනාකාරීත්වය ද ඉතා වැදගත් වේ. එම නිසා අදාළ පාර්ෂවයන්ගේ සහයෝගයෙන් කටයුතු කිරීමට හා මනා සම්බන්ධීකරණයක් සිදු කිරීමේදී අදාළ තීන්දු තීරණ ගැනීම සඳහා හා එම තීන්දු සන්නිවේදනය කිරීමට ආයතනික ව්‍යුහයක් අත්‍යවශ්‍ය වේ. එම ආයතනික සන්නිවේදන ව්‍යුහය පහත ආකරයට දැක්වීමට හැකිය.



විශේෂඥ දැනුම මත අදාළ කටයුතු වලට විශේෂඥ ප්‍රාගුණ්‍යය යෙදීමෙන් එම කටයුතු සක්‍රීයව සිදුකර ගැනීමට හැකියාව ලැබේ.එම නිසා විවිධ දෙපාර්තමේන්තු යටතේ එම විෂය පරාසයන් බෙදාදීම තුළින් කාර්ය සාධනය සක්‍රීයව මෙන් ම විධිමත් ආකාරයට සිදු කරගැනීමට හැකියාව ලැබේ. වෙන් වෙන් වශයෙන් කොටස් වී තිබුණත් එම දෙපාර්තමේන්තු අභ්‍යන්තරික වශයෙන් අන්තර් සම්බන්ධතා පවතින ආකාරය අපට දැකගත හැකිය. ඒ අනුව ආයතනික සංවිධානය විසින් නිකුත් කරන ලද තොරතුරු අභ්‍යන්තර හා බහිර වශයෙන් සිටින පාර්ශ්වකරුවන් වන පාරිභෝගිකයන්, රජයේ නිළධාරින්, මාධ්‍ය වෘත්තිකයන්, ප්‍රාදේශීය ප්‍රජාව, වෙනත් සංවිධාන ආදි සියල්ල වෙත තොරතුරු බෙදා හැරීම මෙහිදි අර්ථවත් කෙරේ. එම පාර්ශවකරුවන් අතර පණිවිඩ ගමන් කිරීම ක්‍රියාකාරකම් හා භාවිතයන්වල සක්‍රීයතාව මත ආයතනික සන්නිවේදනය ශක්තිමත් වේ.

ආයතනික සන්නිවේදන මෙවලම්

- Company Logo (සමාගම් ලාංඡනය)
- Company Design (Including front and Typeface)(සමාගම් නිර්මාණ (අකුරු වර්ග හා අකුරු))
- Company stationary (letter heads, visiting cards, greetings etc.) (සමාගම් ලිපි ද්‍රව්‍ය, ලිපි ශිර්ෂ, කාඩ්පත්, සුබ පැතුම් ආදිය)
- Internet branding(අන්තර්ජාල වෙළඳ නාමකරණය)
- Customer Relations(පාරිභෝගික සබඳතා)
- Rewards, appraisals and recognitions(ත්‍යාග, ඇගයීම් හා පැසසුම්)
- Advertisement, Campaign, Direct marketing, etc.(දැන්වීම්කරණය, ව්‍යාපාර, සෘජු අලෙවිය ආදිය)
- Personal and commercial vehicle branding

ආයතනික සන්නිවේදන ආකෘති

ආයතනික සන්නිවේදනය යන්න විවිධ සන්නිවේදන අවශ්‍යතා මත විවිධ පාර්ශ්වකරුවන්, අභ්‍යන්තර හා බාහිර වශයෙන් සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, නිසි ආකාරයේ ආයතනික බදවාගැනීම් සිදුකිරීම, ආයතනික සන්නිවේදන ඉලක්ක හඳුනාගැනීම, සන්නිවේදන උපාය මාර්ග සංවර්ධනය කිරීම ආදි වශයෙන් සංකීර්ණ ක්‍රියාවලියකි. එම නිසා අදාළ පාර්ශ්ව විසින් අවස්ථාවට උචිත කුමන ආකාරයේ ආකෘතියද යොදාගත යුතු යන්න පැහැදිලි කරගැනීම ඉතා වැදගත් වේ. අධ්‍යයනයේ පහසුව තකා අපට ආයතනික සන්නිවේදන ආකෘති කිහිපයක් වෙන් කොට හඳුනාගත හැක.

i. අභ්‍යන්තර සන්නිවේදනය(Internal Communication)

ii. පාරිභෝගික සන්නිවේදනය (Consumer Communication)

iii. මාධ්‍ය සන්නිවේදනය (Media Communication)

iv. අර්බුද සන්නිවේදනය (Crisis Communication)

අභ්‍යන්තර සන්නිවේදනය (Internal Communication)

අභ්‍යන්තර සන්නිවේදනය සඳහා සංවිධානය තුළ සිදුවන විධිමත් හා අවිධිමත් සියලුම සන්නිවේදන විධික්‍රමයන් ඇතුළත් වේ. උපායමාර්ගික සන්නිවේදන කළමණාකරුවන්, අභ්‍යාන්තර සන්නිවේදන කළමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීමෙන් තම ආයතනයේ අරමුණු කරා ගමන් කරවීමට සේවකයන් හා ආයෝජකයන් පොළඹවනු ලැබේ. ආයතනයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සහ විශිෂ්ට ප්‍රතිඵල අත්පත් පත් ගැනීමේ ක්‍රමවේදයක් ලෙස අභ්‍යන්තර සන්නිවේදනය උපයෝගි කරගත හැක. මේ බව Yeoman විසින් පැහැදිලි කොට ඇත්තේ මෙසේය. "Very little attention is paid to internet communication by public relations scholars yet it is viewed as part of an organization's strategic communication function" (Yeomans , 2006, page 337). අභ්‍යන්තර සන්නිවේදනය යන්න Frankසහ Brownell විසින් අර්ථ දක්වා ඇත්තේ මෙසේය. " The communications transaction transactions between individuals and ? or group at various levels and in different areas of specialization that are intended to design and redesign organizations, to implement design and to co-ordinate Day-to day activities" (Frank and Bronell, 1989, page 5-6).

ඒ අනුව සැලසුම් නිර්මාණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් අතර එදිනෙදා විවිධ මට්ටමේ හා විශේෂඥ දැනුමෙන් යුක්ත සන්නිවේදන ගනුදෙනු සිදු කිරීම හා සම්බන්ධීකරණය කිරීම අභ්‍යන්තර සන්නිවේදනය තුළින් සිදු කෙරේ. එම සන්නිවේදන කටයුතු හා සම්බන්ධීකරණය සිදුවන ආකාරය පහත රූප සටහන ඇසුරින් විග්‍රහ කළ හැකිය.



Internal communication positioned within van Riel's (1995) integrated corporate communication model(Paul R. Jackson, 2007, page 179).

මෙම ආකෘතියට අනුව ආයතනික සන්නිවේදනයේ ප්‍රධාන කොටසක් ලෙස අභ්‍යන්තර සන්නිවේදනය දැක්විය හැක. එහිදී විශේෂයෙන්ම සංවිධාන කටයුතු සිදුවන ආකාරය, භාෂාව, සංකේතාත්මක භාවිතය, ඔවුන්ගේ ඉලක්ක හා අරමුණු සංවිධානයේ විනය ආදිය සන්නිවේදන සංදර්භයක සිට සාකච්ඡා කරනු ලැබේ. ආයතනයක් තුළ අභ්‍යන්තර සන්නිවේදනය සිදු කරගන්නා ආකාර ප්‍රධාන කොටස් 4ක් යටතේ දැක්විය හැකිය. එනම්,

Electronic Media	Computer - පරිගණක
	Telephone - දුරකථන
	Television - රූපවාහිනී
Voice mail-	Email - විද්‍යුත් ලිපි
Conference calls	Internet - අන්තර්ජාල
SMS	Video
Screen saver	Webcasts
Messaging	DVD
Desktop alert	Electronic News letter
Messages	Podcasts
Desktop News Feeds	blogs
Internal Social media tools	(Twitter, Yammer, and Style)
Print media	- Magazine – සඟරා
	- Newsletters – පුවත් හසුන්
	- Brocheures – අත්පොත්
	- Post cards - තැපැල්පත්
	- Posters – පොස්ටර්
	- Memos – මතක සටහන්
Face to face communication	- Meeting –රැඟපෑම්
(මුහුණට මුහුණලා කෙරෙන	- conferences – සම්මන්ත්‍රණ

සන්නිවේදනය)	- Site visits – ක්ෂෙත්‍ර චාරිකා
	- Get together – නැවත හමුවීම්
	- Consultation forums – උපදේශන සේවා
	- lunches – දිවා ආහාර
	- Round table discussions – වට රවුම් මේස සාකච්ඡා
Work space	- Notice boards – දැන්වීම් පුවරු
(වැඩකරන පරිසරය තුළ ඇතිකල හැකි සන්නිවේදන විධික්‍රම	- Led screens – ප්‍රදර්ශන කුටි

පාරිභෝගික සන්නිවේදනය (Consumer communication)

චර්යාත්මක වෙනසක් ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතනික සන්නිවේදනය තුළ යොදාගත හැකි ක්‍රමවේදයක් ලෙස පාරිභෝගික සන්නිවේදනය (Consumer communication) හැඳින්විය හැක. මෙහිදී මූලික වශයෙන් වෙළඳ මහජන සබඳතාව වන ආයතනයේ නිෂ්පාදන මිලදී ගනුලබන පාරිභෝගික ජනතාව අතර තම වෙළඳ නාමය ප්‍රචලිත කිරීමේ අරමුණින් කරනු ලබන සන්නිවේදන ක්‍රියාකාරකම්ය. වෙළඳපොළ තුළ විශේෂයෙන්ම පාරිභෝගිකයා විවිධාකාරයේ තෝරා බේරා ගැනීම්වලට ලක්කරන නිසා පාරිභෝගිකයාගේ රුචිය, කැමැත්ත හා අවශ්‍යතාවය හඳුනා ගනිමින් කටයුතු කිරීමට ආයතන විසින් උත්සහ ගනු ලැබේ.

ඕනෑම ව්‍යාපාරයක හදවත වන්නේ පාරිභෝගිකයා ය. එමනිසා පාරිභෝගිකයන් සෑම විටම උපයා ගැනීමට ව්‍යාපාරික ආයතන සෑම අවස්ථාවකදී ම උත්සහ ගනු ලැබේ. ආයතනයේ පණිවිඩය ඉතා නිර්මාණශීලී ව පාරිභෝගිකයාට අවබෝධ කිරීම මෙහිදී ඉතා වැදගත් වේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට ඕනෑම ආයතනයක විවිධ උපක්‍රම අනුගමනය කරනු ලැබේ. ඒ අතර,

i. උපාය මාර්ග සංවර්ධනය (Strategy Development)

ii. වෙළඳ නාම හා මහජන සම්බන්ධතා (Brand and Product Public Relations)

iii. පාරිභෝගිකයා/ පාරිභෝගික බැඳීම (Consumer/ Customer Engagement)

iv. මාධ්‍ය සබඳතා (Media Relations)

v. සැලසුම් සකස් කිරීම හා නිර්මාණය කිරීම (Content Planning and Creation)

vi. කොටස් කරුවන්ගේ සබඳතා (Stakeholder Relations)

vii. දක්ෂතා කළමනාකරණය කිරීම හා සම්බන්ධ කර ගැනීම (Talent Management and Engagement)

viii. අවස්ථාවට සංකල්ප සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම (Event Concept Development and Management)

ix. අනුග්‍රාහකත්වය (Sponsorship)

x. ගැටලු කළමනාකරණය (Issues Management)

අර්බුද සන්නිවේදනය (Crisis Communication)

ඕනෑම ආයතනයක පැවැත්මට අභියෝගයක් වන අවස්ථාවක් ලෙස අර්බුද සන්නිවේදනය හැඳින්විය හැක. විශේෂයෙන්ම සමාගමක පවතින කීර්තිනාමය නිර්මාණය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පවතින මහජන සම්බන්ධතා උප විෂය ක්ෂෙත්‍රයක් ලෙස අර්බුද සන්නිවේදනය හැඳින්විය හැක. ආයතනයකදී යම් හෝ පරීක්ෂණ ස්වරූපයෙන් පවතින අපරාධ චෝදනාවක් හා සම්බන්ධ අවස්ථාවක දී මාධ්‍ය පරීක්ෂණයකදී කොටස්කරුවන් හා සම්බන්ධ නඩු විභාගයක් වැනි අවස්ථාවකදී පාරිසරික නීති උල්ලංඝනය වූ අවස්ථාවක දී නීති හෝ ආචාරධර්ම බිඳ වැටීමකදී මූල්‍ය අර්බුදයකදී එම ආයතනයට අර්බුද කළමනාකරණය වෙනුවෙන් කටයුතු කිරීමට සිදු වේ.

අර්බුදය යන්න Thimothy Coombs විසින් අර්ථ දක්වා ඇත්තේ, " Crisis as the perception of an unpredictable event that threatens important expectancies of stakeholders and can seriously impact an organization's performance and generate negative out cones" (Coombs, 2007,page 10).ඒ අනුව අර්බුදයක් යනු පාර්ශ්වකරුවන්ට තර්ජනයක් වන, සංවිධානයේ කාර්යය සාධනයට බරපතල බලපෑමක් හා සෘණ ප්‍රතිඵල මතුකරන සංසිද්ධියක් ලෙස සරලව ඉදිරිපත් කළ හැක. වැඩිදුරටත් අදහස් දක්වන Thimothy coombs, "Crisis Communication as the collection, processing and dissemination of information required to address a crisis situation" (coombs, 2007, page 10).ඒ අනුව අර්බුද සන්නිවේදනය යනු යම්කිසි අර්බුදකාරි අවස්ථාවක දී තොරතුරු එකතු කිරීම, සැකැස්ම හා බෙදාහැරීම හා සම්බන්ධ සක්‍රීය ක්‍රියාකාරීත්වයක් ලෙස දැක්වීමට පුළුවන. Jonathan Bernstein විසින් අර්බුද සන්නිවේදනය කිරීමේ පියවර 10ක් පෙන්වා දී ඇත. එනම්

I. අර්බුදයක් අපේක්ෂාවෙන් සිටිම(Anticipate crisis)

II. අර්බුද සන්නිවේදනය කරන කණ්ඩායම හඳුනා ගැනීම. (Identity your crisis communication team)

III. මාධ්‍ය ප්‍රකාශකයෝ හඳුනාගැනීම (Identity main spokes persons)

IV. මාධ්‍ය ප්‍රකාශකයෝ පුහුණු කිරීම (Spokesperson training)

V. නිවේදන හා අධීක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම (Spokesperson training)

VI. පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම (Establish notification and monitoring system)

VII. ග්‍රාහකගතවන ප්‍රකාශ සංවර්ධනය (Identify stakeholders)

VIII. අර්බුදකාරී තත්ත්වය තක්සේරු කිරීම (Develop holding statements)

IX. ප්‍රධාන පණිවිඩ සකස් කර අවසන් කිරීම (Finalize and adapt key messages)

X. පශ්චාත් අර්බුද විශ්ලේෂණය (post crisis analysis),(Bernstein, 2016, page 21).

මූලාශ්‍ර

මනෝජ් පුෂ්පකුමාර ජිනදාස, 2016, මහජන සම්බන්ධතාව, මාධ්‍ය නීතිය හා ආචාර ධර්ම, සංස්කෘතික සන්නිවේදන පර්යේෂණ ආයතනය, 260, මැදහින්න, මැදමහනුවර.

Chasteness, Mettle Morsing, George Cheney, 2008, Corporate Communication, loss Angeles, Sage Publications, London.

Chris Fill, 2009, Marketing Communications, Pearson Education Limited, Edinburgh gate, Harlow, Essex CM202JL, England.

Paul Copley, 2004, Marketing Communication Management: Concepts and Theories Cases and Practices, Elsevier Butterworth fle lineman oxford.

Patrick de Pelsmacker, Maggie Geuens and Joerivanden Bergh,2007, Marketing Communications Pearson Education limited, England.

Joep Cornelissen, 2004, Corporate Communications; Theory and Practice,Sage Publications, London

Richard J. Vavey, 2002, Marketing Communication:Principles and Practice Routledge, 11 new fetter lone, London.

Sandra M. Oliver, 2004, Mend Book of Corporate Communication and Public Relations, Rutledge, 11 new fetter lane, London.

Coombs, W. Timothy, 2007, Ongoing Crisis Communication: Planning, Managing and Responding, sagePublications, loss Angeles.

Jonathan, Bernstein, 2016, Crisis Management.

Paul R. Jackson, 2007, Rethinking Internal Communication:AStakeholder approach Corporate Communication: An International Journal vol.12, No 2 . 2007, Emerald Group publishing Limited.

26

BUDDHIST EDUCATION

Ven. Kandegoda Wimaladhamma Thero

Buddhist education in the Dhamma tradition should be concerned above all with the transformation of character. Since a person's character molded by values, and values are conveyed by inspiring ideals, the first task to be faced by Buddhist educators is to determine the ideals of their education system. If we turn to the Budhha's discourses in search of the ideals of their educational system. If we turn to Buddha's discourses in search of ideal proper to a Buddhist life, we find five qualities that the Buddha often held up as the hallmarks of the model disciple, whether monk or layperson. These five qualities are faith, virtue, generosity, learning and wisdom. Of the five, two-faith and generosity — relate primarily to the heart: they are concerned with taming the emotional side of human nature. Two relate to the intellect: learning and wisdom. The fifth virtue or morality, partakes of both sides of the personality: the first three precepts- abstinence from killing, stealing and sexual abuse- govern the emotions; the precepts of abstinence from falsehood and intoxicants help to develop the clarity and honesty necessary forrealization of truth. Thus Buddhist education aims at a parallel transformation of human character and intelligence, holding both in balance and ensuring that both are brought to fulfillment.

The entire system of Buddhist education must be rooted in faith (saddha) faith in Triple Gem, and above all in the Buddha as the Fully Enlightened One, the peerless teacher and supreme guide to right living and right understanding. Based on this faith, the students must he inspired to become accomplished in virtue (sila) by following the moral guidelines spelled out by the five Precepts. They must be come to know the precepts well, to understand the reasons for observing them, and to know how to apply them in the difficult circumstance of human life today. Most

importantly, they .should come to appreciate the positive virtues these precepts represent: kindness,honestly, purity, truthfulness and mental sobriety. They must also acquire the spirit of generosity and self-sacrifice (chaga) so essential for overcoming selfishness, greed and the narrow focus on self-advancement that dominates in present day society.

There are some who believe that Buddhism is so lofty and sublime a system that it cannot be practiced by ordinary men and women in this workaday world or ours, and that one has to retire from it to a monastery, or to some quiet place, if one desires to be a true Buddhist.

This is a sad misconception, due evidently to a lack of understanding of the teaching of Buddha. People run to such hasty and wrong conclusions as a result of their hearing, or reading casually, something about Buddhism written by someone, who, as he has not understood the subject in all its aspects, gives only a partial and lopsided view of it. The Buddha's teaching is meant not only for monks in monasteries, but also for ordinary men and women living at some with their families. The Noble Eight fold Path, which is the Buddhist way of life, is meant for all, without distinction of any kind.

The vast majority of people in the wind cannot turn monk, or retire in to caves or forests. However noble and pure Buddhism may be, it would be unless to masses of mankind if they could not follow it in their daily life in the world of today. But if you understand the spirit of Buddhism correctly (and not only its letter), you can surely follow and practice it while living the life of an ordinary man.

There may be some who find it easier and more convenient to accept Buddhism, if they do live in a remote place, cut off from the society of others. Others may find that kind of retirement dulls and depresses their whole being both physically and mentally, and that it may not therefore be conductive to the development of their spiritual and intellectual life.

The Sigala- Sutta(Digdhanikaya) shows with what great respect the layman's life, his family and social relations are regarded by the Buddha.

For instance, the relationship between parents and children between teachers and pupil, between husband and wife, between friends, relatives and neighbors and between the religious and laity.

We see then that lay life, with its family and social relations, is included in the 'noble discipline', and is within frame work of the Buddhist way of life, as the Buddha envisaged it.

If one desires to become a Buddhist, there is no initiation ceremony (or baptism) which one has to undergo. (But to become a Bhikkhu, member of the order of the sangha, one has to

undergo a long process of disciplinary training and education) If one understands the Buddha's teaching and if one is convinced that his teaching is the right path and if one is tries to follow it, then one is a Buddhist. But according to the unbroken age old tradition in Buddhist countries one is considered a Buddhist if one takes the Buddha, the Dhamma (the teaching) and the sanga(the order of Monk) generally called 'the triple gem" — as one's refuges, and undertakes to observe the five precepts (Panchaseela) —the minimum moral obligations of a lay Buddhist 01 (1) not to destroy life, (2) not to steal, (3) not to commit adultery, (4) not to tell lies, (5) not to take intoxicating drinks, -reciting the formulas given in the ancient texts. On religious occasions Buddhists in congregation usually recite these formulas, following the lead of a Buddhist monk.

There are no external rites or ceremonies which a Buddhist has to perform. Buddhist is a way of life, and what is essential is following the Noble Eightfold Path. Of course there in all Buddhist countries simple and beautiful ceremonies in religious occasions. There are shrines with status of the Buddha , stupas and dagabas and Bo-trees in monasteries where Buddhist worship, offer flowers, lights lamps and burn incense. This should not be likened to prayer in theistic religions, it is only a way of paying homage to the memory of the Master who showed the way. These traditional observances though inessential, have their value in satisfying the religious emotions and needs of those who are less advanced intellectually and spiritually, and helping them gradually along the path.

Those who think that Buddhism id interested only in lofty ideals, high moral and philosophical thought, and that it ignores the social and economic welfare of people, are wrong. The Buddha was interested in the happiness of men. To him happiness was not possible without leading a pure life based on moral and spiritual principles. But He knew that leading such a life was hard in unfavorable material and social conditions.

Buddhism does not consider material welfare as an end in itself, it is only a means to an end — a higher and nobler end. But it is a means which is indispensable, indispensable in achieving a higher purpose for man's happiness. So Buddhism recognizes he need of certain minimum material conditions favorable to spiritual success even that of a monk engaged in meditation in some solitary place.

The Buddha did not take life out of the context of its social and economic background, he looked as it as a whole in all its social, economic and political aspects. His teachings on ethical, spiritual and philosophical problems are fairly well known. But little is known, particularly in the west, about his teaching on social,economic and political matters. Yet there are numerous discourses dealing with these scattered throughout the ancient Buddhist texts. Let us take only a few examples.

The Cakkavattisihanada sutta of the DighaNikaya clearly states that poverty (daliddiya) is the cause of immorality and crimes such as theft, falsehood, violence, hatred, crueltyetc. kings in ancient times, like governments today, tried to suppress crime through punishment. The Kutadanta- sutta of the same Nikaya explains how futile this is. It says that this methods can never be successful. Instead the Buddha suggests that, in order to eradicate crime, the economic condition of the people should be improved, gain and other facilities for the agriculture should be provided for farmers and cultivators, capital should be provided for traders and those engaged in business, adequate wages should be paid to those who are employed. When people are thus provided for with opportunities for earning a sufficient income, they will be contented, will have no fear or anxiety, and consequently the country will be peaceful and free from crime.

Because of this Buddha told lay people how important it is to improve their economic condition. This does not mean that he approved of hoarding wealth with, desire and attachment, which is against his fundamental teaching, nor did he approve of each and every way of earning one's livelihood. There are certain trades like the production and sale of armaments, which he condemns as evil means of livelihood, as we saw earlier.

From the few examples given above, one could see that the Buddha considered economic welfare as requisite for human happiness, but that he did not recognize progress as real and true if it was oly material, devoid of a spiritual and moral foundation. While encouraging material progress, Buddhism always lays great stress on the development of the moral and spiritual character for a happy, peaceful and contented society.

Learning wisdom virtues work closely together. By learning (suta) is meant a wide knowledge of the Buddhist texts which is to be acquired by extensive reading and persistent study. But mere learning is not sufficient. Knowledge only fulfills its proper purpose when it serves as a spring board for wisdom (panna). Direct personal insight into the truth of the Dhamma. Of course, the higher wisdom that consummates the Noble Eightfold Path does not lie within the domain of the Dhamma tradition. This wisdom must be generated by methodological mental training in calm and insight, the wings of Buddhist meditation. But Buddhist education can go far in laying the foundation for this wisdom by clarifying the principals that are to be entreated by insight. In this task learning and wisdom are closely interwoven the former providing a basis for the latter. Wisdom arises by systematically working the ideas and principles learned through study in to the fabric of the mind, which requires deep reflection, intelligent discussion and keen investigation.

It is wisdom that the Buddha held up as the direct instrument of final liberation, as the key for opening the doors to the deathless and also as the infallible guide to success in meeting

life's mundance challenges. Thus, wisdom is the crown and pinnacle of the entire system of Buddhist education and all the preliminary steps in a Buddhist educational system should be geared towards the flowering of this supreme virtue.

References

Bodhi B., (1998), Aims of Buddhist Education, Retrieved from http://www.accesstoinsight.org/lib/authors/bodhi/bps-essay_35.html

Chodron T., (1988), Dharma Friendship Foundation, Retrived from http://dharmafriendship.org/vtc-the-need-for-modern-buddhist-education/

Miller J., (2007), Education and Learning: A Buddhist Perspective, Rtrived from

Nguyen M T, (2007), Buddhist Monastic and Regional Revival Moments, Retrieved from https://books.google.lk/books

Rahula K, (2015), Buddhist Studies as a Discipline and its Role in the Education, Retrieved from http://www.sjp.ac.lk/news/buddhist-studies-as-a-discipline-and-its-role-in-the-education/

Tibet Foundation, Retrieved from http://www.tibet-foundation.org/page/buddhist_education

27

Towards a new information structure (With special reference to BRICS conference)

Ajantha Hapuarachchi

Introduction:

The **2016 BRICS** summit held its eighth annual , an international relations conference attended by the heads of state of the five member states , , , and . The summit held in , India, the second time the city has hosted the summit after the . India is to assume the chair of the BRICS from February 2016 to 2017 and China will take up from 2017. The BRICS would consider its own "New information Structure".

The first section of this paper is the current media scenario in the world after introducing the New World Information and Communication Order. The second part explains how the NWICO connects today's net world, and the third section continues how to revisit a new world information and communication order in the new era. Three decades ago "Many voices –One world" was a slogan from UNESCO and the MacBride report recommendations are widely used in mass media and communication studies. Now the slogan has become "Many Voices - Net world", because of the emergence of new media and social media have made a digital era.

As human beings we have passed the four major eras , namely Industrial, Electric, Electronic ,and Information. Information age is the revolutionary and controversial age in human history, because of the invention of the Internet and the World Wide Web. By then the media navigated with the satellite with high technology to create a new era of communication. New World Information and Communication order came to being in the era of television and satellite technology.

Its major intentions were, how to maintain national and cultural sovereignty in the face of rapid globalization of mass media. At that time, many developing and communist countries were concerned that international news coverage was dominated by the West, especially the United States, and that western-produced content was overwhelming in the media of developing countries, which lacked sufficient resources to create their own quality fare.

The fear was that western cultural values, especially those of the United States, would overshadow and displace those of other countries. These countries saw this as a form of colonialization, a cultural imperialism-the invasion of an indigenous people's culture by powerful foreign countries through mass media.

For establishment of a NWICO characterized by several elements problematic to western democracies due to their internal media situation. In arguing that individual nations should be free to control the new and entertainment that entered their lands, it called for monitoring of all such content, monitoring and licensing of foreign journalists, and requiring that prior government permission be obtained for direct radio, television and satellite transmissions into foreign countries. At this juncture, western nations rejected these rules as a direct infringement on the freedom of expression.

Western allies of the United States may have agreed that the restrictions of the NWICO were a threat to the free flow of information, yet virtually every one had in place rules that limited U.S media content in their own countries. Canada, required that specific proportions of all content-print and broadcast-either be produced in Canada or reflect Canadian cultural identity. The French made illegal the printing of certain US words, including "hamburger" "cartoon" (France maintains an official office to prosecute those who would "debase" its language, the Academie Francaise, mentioned in our opening vignette). In 1989 the European Union, then called the European Community, established "Television Without Frontiers" which mandates that 50% of all content on all television channels in Europe be produced in its member countries. In 1998 the cultural ministers of 20 countries, among them Brazil, Mexico, Sweden, Canada, Italy met in Ottawa to develop "ground rules" to protect their nations' cultures from "the Hollywood Juggernaut".

South Korean law mandates that, movie houses show native films at least 146 days out of each year .British law forbids foreign ownership in its commercial broadcasting channels. The resistance to U.S. media would not exist among our international friends if they did not worry about the integrity of their own cultures. It is folly, then, to argue that non-native media content will have no effect on local culture-as do many U.S .media content producers. The question today is "How much influence will countries accept in exchange for fuller membership in global community?

In light of instant, inexpensive, and open computer network communication, a parallel question is "Have notions such as national sovereignty and cultural integrity lost their meaning? For example, ESPN is carried on 20 networks in 21 languages to 155 million television households in 183 different countries. The BBC broadcasts daily to a worldwide audience in 40 languages, as does Radio Beijing from China. CNN uses 14 satellites to transmit to a billion viewers in almost 200 counties. Mexican soap operas dominate the television schedules of much of Latin and South America. Three of the four largest U.S. record companies have international ownership. Hollywood's Universal Studios is owned by French Vivendi, Columbia Pictures by Japanese Sony, and 20th century Fox by Rupert Murdoch's Australian corporation.

Modern media technology makes the delivery of this varied content not only possible but profitable. The advanced nations of the world, through their multi-national corporations, greatly expand their control over the international flow of information. As a result, much of the world may become ever more heavily dependent on the western nations and japan. Though it is believed the global people sharing the common assumptions of a common culture, is a Utopian dream. If the BRICS considers a new information order this current situation is very important when redressing. What has happened to the basic communication patterns from one to one .

A----------B

One to one



One to many



many to many

Anyone can access from anywhere at any time and interact.



Current scenario

Before revisiting the NWICO , it is very important to realize that, what happened in the mass media firms at the beginning of the twenty-first century. Media fragmentation, audience segmentation, distribution of products across media boundaries, digital convergence, globalization and conglomeration can be seen . We'll also take a close look at Google, a large web-based corporation that is on the way to becoming a cross-media conglomerate like Walt Disney and News Corporation which are the media giant in the world.

This western mind set frequently compare a mass audience taking a sample at large .At this point we should realize the six related trends describe the mass media world - Media fragmentation, Audience segmentation, Distribution of products across media boundaries, Globalization, Conglomeration, Digital convergence.

Media fragmentation refers to the increase in the number of mass media outlets that has taken place during the past two decades. The process is ongoing as companies continue to find even more ways to distribute and exhibit news, information, advertising and entertainment in as many places as possible.

Audience Erosion refers to a decrease in the percentage of the population using a particular medium or specific media outlet. Audience erosion is taking place because of media fragmentation.

The dramatic increase in the number of media and media outlets has given people more choices for news, entertainment, information and education, leading to smaller audiences overall. **Audience segmentation** means that producers and distributors try to reach different types of people with messages tailored specifically for them. Some target segments may be quite large-in the millions. Others might comprise only thousands of individuals.

Distribution of products across media boundaries:-in the past a newspaper was just, but it is so much more, with content moving across media boundaries - from the traditional print piece to the paper's website to the papers' own cable news network to a downloadable version of the paper's top stories on anyone's PDA device and beyond. It is achieving a good share of mind-making a substantial proportion of the target audiences in a variety of media locations aware of the material's existence.

Globalization - global consumers are a way to make the audience larger. In this way media executives are viewing countries around the world as part of the initial market place for these mass media materials.

Conglomeration – A mass media conglomerate is a company that holds several mass media forms in different media industries under its corporate umbrella .Mass media conglomerates are not new. What is relatively new is the approach to them that their corporate leaders are taking.

Digital Convergence - convergence means coming together. Digital convergence refers to the use of computer technologies to allow different media to share the same or similar materials.

Social media - Social media has come to mean sites that allow people to create networks of acquaintances and friends and to share their writings and audio visual materials with them. Social media sites are money making operations, in fact, the biggest ones, Myspace and YouTube are owned by two major mass media conglomerates, news corporation and Google respectively. We have to concern about the agenda-setting power of huge media conglomerates when information is released by the justice department or some organization that reflect critically upon part of the conglomerate. Will a news organization that is owned by the conglomerate rush to do an investigative story on the subject? Will it do a story at all?

In this situation is discussed from here the NWICO and which sections to be redressed or modified. At this juncture, the noble conclusion of the NWICO, to be considered, because it effects exists even today.

"Our review of communication the world over reveals a variety of solutions adopted in different countries-in accordance with divers traditions, patterns of social, economic and cultural life, needs and possibilities. This diversity is valuable and should be respected; there is no place for the universal application of preconceived models. Yet it should be possible to establish in broad outline, common aims and common values in the sphere of communication, based on common interests in a world of interdependence. The whole human race is threatened by the arms race and by the persistence of unacceptable global inequalities, both of which generate tensions and which jeopardize its future and even its survival. The contemporary situation demands a better, more just and more democratic social order, and the realization of fundamental human rights. These goals can be achieved only through understanding and tolerance, gained in large part by free, open and balanced communications."

When we go through this conclusion that the emergence of new media and cross media contents have made a suspicion of balanced communication and democratization of information.

According to the NWCIO its first communication policies are, Strengthening Independence and Self-Reliance, Social Consequences and New Tasks, Professional Integrity and Standards, Democratization of Communication, Fostering International Cooperation, Greater Attention to Neglected Areas, More Extensive Financial Resources.

Among those Professional integrity and Democratization of Communication is still major areas which should be discussed when considering a new information order.

We are witnessing the evolution of a universal interconnected network of audio, video and electronic text communication that blur the distinction between interpersonal and mass communication and between public communication. Everything depend on digital at present .

This situation have seen Everat M Rogers long before (1995) as follows:

"One of the most important trend in recent years has been the fragmentation and segmentation of media audience. Every aspect of modern communication is now dependent on computer. In fact, yesterday's audiences are today's sovereign consumers of media messages. The next decade promises even more radical shifts in media operations. New communication theories and models reflect these shift. We are moving into a generation of addressable users of multimedia (rather than audiences).

Discussion:

Post - modernist or postmodern thinkers like Habermas, Leotard, Baudrillard show the above situation as public sphere. Whereas the modern public sphere spaces required citizens, forming "rational" political opinions, the global public sphere is a multi - discursive political space, a sphere of mediation. This new type has no center, no periphery, no agenda setting. Contexts are shaped or mediated-by autonomously operating media systems, and by not only by big news authorities, such as CNN, but also by drudge.com , yahoo and so on.

By look into this matter we can understand the world system of societies and structure of network society and its effects. BRICS is also very important powerful organization to look into this situation. This must take the upper hand to navigate the media system for national security, social integrity, financial strength, and specially interpersonal spirituality in Asian people. The interference or dominance of western media outlets always make colorful mind- set in Asians. As long as they are illiterate the western media giants can work the way they want. Especially the television media have made their viewers via satellite through big companies. The ethics and cultural and values of Asians will be overwhelmed by those productions. Unfortunately the big Indian film industry- Bolly wood also have gone to holy wood, intermixing western and Indian culture. The nes Information order will have more considerations.

References:

ABD- 2000-2004 Asia Pacific Cultural Centre for UNESCO

Atherton, Christopher, F (1987) Tele democracy: Can technology protect

Democracy new burg park CA sage

Baran, Stanley, J Introduction to Mass communication. USA McGraw–Hill

Bell, D. (1976) Cross –cultural contradictions of capitalism: New York.

Black, J (1995) Introduction to Mass Communication, USA: McGraw–Hill.

Castells, Manuel(1989)The informational city; information Technology economic restructuring, and the urban-regional process. Oxford: Blackwell.

Chandos. R (2005) Globalization, Information and Libraries-, Oxford- England: Ruth Publishing

Crystal.D. (1995) Cambridge Paperback Encyclopedia London, Cambridge university press

Cowie. AP, (1991-2003) Oxford Advanced Learner's Dictionary. London Oxford University Press.

Dasgupta, S (2005) the Changing Face of Globalization, sage, New Delhi

Dionne, J (1987) the Information Revolution-, New York; McGraw-Hill.

Education today (2000-2002)–The newsletter of UNESCO Publishing.

Ferguson(ed),(2003) Public communication; the new imperatives. London; sage

Friedman. J (1994) Cultural identity and global process: London.

Hobsbawn, E(1998) Industry and Empire, India: Sage

Huntington, S(1993) The Clash of Civilizations: .New York.

Iyon ,D(1988)The Information Society–issues and illustrations, Worcester: Billion& sons Ltd.

Jan AGM vanDijk (2006) the network society, Delhi, Sage Publications

Kim. Y (1988) Human transformation-Communication and cross Cultural adaptation, Philadelphia.

Kunczik.M (1998) Media Giants, communication manual, Germany: Friedrich Ebert stiftung.

Kunczik, M (1995) Concepts of Journalism North and South: Ebert Stiftung.

Mattelant,A (2003) The Information Society, New Delhi: Sage Publishers.

Ogburn, W.F(1950) Social Change: New York.

Robertson.R (1992) Globalization social theory andGlobal culture, London

Shrivastava K.M.(1998) Media Towards 21st century, New Delhi, Sterling publishers pvt ltd.

South Asia Foundation (2002) E-Trends-Making sense of the electronic Communications revolution : London

The world book Encyclopedia –world book Inc-Scott Fetzer Com-1988.

Time Magazine, July 22-2002.

Time Magazine , March 27-2003.

Time Magazine , September-2006.

Whitehead A.N (1926) Science and the modern world ,London, New York

William Rose,A.Wolf (1932) An outline of Modern knowledge: The Camelot press ltd. London & Southampton.

Winston, B (1998) Media Technology and Society, London: Rutledge.

23

සන්නිවේදකයන් සඳහා සන්නිවේදන කෞෂල්‍යය

වාසනා මෛත්‍රී හේරත්

සියලු රැකියා සඳහා ඉතා ම අවධාරණයෙන් ඉල්ලා සිටින සන්නිවේදන කුසලතා පූර්ණත්වය සන්නිවේදන විෂය හදාරන්නෙකුට හෝ සන්නිවේදන ක්ෂේත්‍රයේ රැකියාවක නියැලීමට බලාපොරොත්තු වන්නෙකුට අන් කවරෙකුටත් වඩා වැදගත් අවශ්‍යතාවයක් බව අමුතුවෙන් කිවයුතු නැත. නමුත් සන්නිවේදන කුසලතා යනු මොනවාද යන්නත් ඒවා වඩවා ගත හැක්කේ කෙසේ ද යන්නත් පිළිබඳ ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපනය තුළ කතා බහට ලක් වන්නේ අල්ප වශයෙනි. රැකියා විරහිත උපාධිධාරීන්ගේ ගැටලුව පිළිබඳ කතා බහේ දී නම් සන්නිවේදන කුසලතා සංවර්ධනය කර නොගැනීම සම්බන්ධයෙන් උපාධිධාරීන්ට චෝදනා එල්ල වේ.

අර්ථ දැක්වීමේ දී පවා සන්නිවේදන කුසලතා යනු ඇතැමෙක් භාෂා කුසලතාව ලෙස අර්ථ දක්වති. ඇතැමෙකුට අනුව සන්නිවේදන කුසලතා යනු පරිගණක විෂය හා සම්බන්ධ දැනුමයි. ඇතැමෙකු සන්නිවේදන කුසලතා සංවර්ධනය කළ හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කරද්දී ඇතැමෙක් සන්නිවේදන කුසලතා යනු ජන්මයෙන් රැගෙන එන දක්ෂතාවක් ය යන විශ්වාසයේ එල්බ සිටිති. බොහෝ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් පවා එසේ විශ්වාස කර හෝ නොකර තම සන්නිවේදන කුසලතා සංවර්ධනය කර ගැනීම නොසලකා හරිමින් සන්නිවේදන හැකියාවන් ඔප් නංවාගත් කුසලතා පූර්ණයන්ගේ දක්ෂතා ලෙස උපේක්ෂා සහගතව බලා සිටිති.

සන්නිවේදන හැකියාව ඕනෑ ම කෙනෙකුට ඇත. උපතේ සිට මේ දක්වා සෑම මොහොක දී ම අපි සන්නිවේදනය කරමින් සිටිමු. සන්නිවේදන කුසලතා පූර්ණත්වය යනු සන්නිවේදන හැකියාව නොවේ. එය වෙනකකි. පුද්ගලයෙකු අතිශය දක්ෂ ලෙස, ශූර ලෙස කතා කරන විට සන්නිවේදනය හේතුවෙන් විවිධ අවස්ථා ජයගන්නා විට එසේත් නැත්නම් සන්නිවේදනය ආහරණයක් කර ගනිමින් අන් අය අතර කැපී පෙනෙන විට සෙස්සෝ ඔවුන් දෙස බලා තමාට එසේ සන්නිවේදන දක්ෂතාවක්

නැත්තේ ඇයි දැයි ශෝක වෙති. අප විශ්වාස කරන්නේ ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත කියාය. සන්නිවේදනය සම්බන්ධයෙන් ගත්ත ද ඇතැමෙකුට ලිවීමේ හැකියාවත් තවත් අයෙකුට කතා කිරීමේ හැකියාවත් ආදී ලෙස ලැබී ඇති බව අපි විශ්වාස කරමු. එහෙත් සන්නිවේදන කුසලතා පූර්ණත්වය පිළිබඳ සාකච්ඡා කරන මෙම ලිපියෙහි අන්තර්තය තුළ ඇත්තේ පුද්ගලයෙකුගේ සන්නිවේදන දක්ෂතාවය යනු සහජයෙන් ලැබෙන්නක් නොවේ ය යන්නයි. සැබැවින් ම එය පුහුණුව ඔස්සේ ළඟා කර ගත හැක්කකි.

සන්නිවේදන කුසලතා

සන්නිවේදන කුසලතා පිළිබඳ පර්යේෂකයන්ගේ විද්‍යාත්මක පර්යේෂණ කිරීමේ අවධානය යොමු වූයේ ක්‍රාස්මන් (Crassman, 1960) නම් පර්යේෂකයා විසින් සමාජ කුසලතා පිළිබඳ කරන ලද මූලික පර්යේෂණයත් සමඟ ය. ක්‍රාස්මන්ගේ මූලික පර්යේෂණය වූයේ ස්වයංක්‍රීය යන්ත්‍රෝපකරණ හැසිරවීමේ කාර්යය අතරතුර මිනිසුන් වැඩ කරන අනෙක් මිනිසුන් සමඟ සන්නිවේදනය කිරීමේ දී සමාජ කුසලතා භාවිත කිරීම කෙසේ සිදු වන්නේ ද යන්නයි. මෙහි දී ඔහුට සමාජ කුසලතා පිළිබඳ අධ්‍යයනයන් එතෙක් කර නොමැති බව දැනගැනීමට ලැබීම හේතුවෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ සමාජ මනෝවිද්‍යාඥයෙකු වන මයිකල් ඇන්ගීල් (Michael Angyle) සමඟ එක්ව සමාජ කුසලතා පිළිබඳ අධ්‍යයනය කිරීමට පෙළඹ තිබේ. මෙහි දී ඔවුන් විසින් මිනිස් යන්ත්‍ර සමඟ මිනිස් අන්තර් ක්‍රියාකාරීත්වය සොයා බැලීම සඳහා යොමුව ඇති අතර මුල්වරට කායික ක්ෂමතාවය සහ සමාජ ක්ෂමතාවය සංසන්දනය කිරීමට සිදු කරන ලදී.

1967දී ෆිට්ස් සහ පොස්නර් (Fitts and Posner) ඔවුන්ගේ තාක්ෂණික කුසලතා පිළිබඳ කරන ලද සාකච්ඡාවේ දී සමාජ කුසලතා ද වැදගත් සාධකයක් බව අවධාරණය කරන ලදී. එම වර්ෂයේ දී ම ඇන්ගිල් අයි කෙන්ඩල්(Angyle I Kendom) විසින් සමාජ කුසලතා පිළිබඳ නිර්වචනය කායික කුසලතා නිර්වචනය ඔස්සේ සකස් කොට ඉදිරිපත් කරන ලද්දේ පහත ආකාරයෙනි.

'යම් වස්තුවක් හෝ අවස්ථාවක් සම්බන්ධයෙන් සංවිධානය කරන ලද හා සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාකාරීත්වයේ යටින් පිහිටි මුලු සංවේදක දාමයටත් මධ්‍ය ම කායික යාන්ත්‍රණයටත් සම්බන්ධ යම් ක්‍රියාකාරකමක් වන එහි එක් ප්‍රධාන විශේෂත්වයක් වන්නේ ක්‍රියාවෙහි ක්‍රියාකාරීත්වය සංවේදක යෙදවුම් තුළින් නොකඩවා පාලනයවීමත් එහි ප්‍රතිඵල වශයෙන් එන ක්‍රියාවන් යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා නොකඩවා ක්‍රියාත්මක වීමත් ය.'

ඇන්ගිල්. අයි. කෙන්ඩන්ගේ මෙම නිර්වචනය තුළින් සමාජ කුසලතාවන්හි ස්වභාවය, කාර්යභාරය, නිරූපණය සහ සන්නිවේදන කුසලතාවක අන්තර්ගතය පිළිබඳ සාකච්ඡා කිරීමත් සමඟ ම විවිධ පර්යේෂකයන් හා න්‍යායවේදීන් සමාජ කුසලතා පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් කරන්නට විය.

සන්නිවේදන කුසලතා පිළිබඳ නිර්වචන

1978 දී පිලිපිස් (Phillips, 1978) විසින් ඉදිරිපත් කරන ලද නිර්වචනයට අනුව පුද්ගලයෙකු කුසලතා පූර්ණ වන්නේ ඔහු හෝ ඇයගේ අනෙකුත් පුද්ගලයන් සමඟ ස්වකීය අයිතීන්, අවශ්‍යතා, තෘප්තිමත්භාවය, බැඳීම් ආදියට හානියක් නොවන ආකාරයෙන් සන්නිවේදනය කළ හැකි වීමේ ප්‍රමාණය අනුව ය. මෙම නිර්වචනය තුළින් ඔහු පුද්ගල හමුවීම තුළ සහ අන්‍යෝන්‍ය බැඳීම් තුළ අඩංගු ඉතා කුඩා සහ වටිනා සාධක පිළිබඳවත් හැසිරීම් වල ප්‍රතිඵල පිළිබඳවත් අවධාරණය කර තිබේ.

මේ හා සමාන ප්‍රවේශයක් කොම්ස් සහ ස්ටැබි(Combs and Staby, 1977) විසින් ද ඉදිරිපත් කර තිබේ. ඔවුන්ට අනුව සමාජ කුසලතා යනු සෙසු පුද්ගලයන් සමඟ සමාජමය වටිනාකම් සහ පිළිගැනීම්වලට අනුව විශේෂිත පුද්ගලික හෝ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි ආකාරයෙන් ද ඇති සමාජ සංදර්භයක් තුළ අන්තර් ක්‍රියාකාරීවීමේ හැකියාවයි.

එසේ ම (Kelly, 1982) දක්වා ඇති පරිදි සමාජ කුසලතාව අත්‍යවශ්‍යයෙන් ම දැක්විය හැක්කේ පුද්ගල අරමුණු වලට යාමට ඇති හැසිරීම් මාර්ගයක් ලෙස ය.

කෙලී ෆින්චන් සහ බීච් (Kelly Finchan and Beach, 2003) එක්ව කළ අධ්‍යයනයෙන් පසුව ඔවුන් දෙදෙනා ද 'සන්නිවේදන කුසලතා යනු සන්නිවේදන අරමුණු අවබෝධ කොට ගෙන සමාජමය වශයෙන් සුදුසු පරිදි හැසිරීමයි.' යනුවෙන් නිර්වචනයක් ඉදිරිපත් කර ඇත.

මයිකල්සන්, සුගායි, වුඩ් සහ කාස්ඩින් (Michelson, Sugai, Wood and Kazdin, 1983)සමාජ කුසලතා සංකල්පය කෙරෙහි කේන්ද්‍ර වන ප්‍රධාන සාධක හයක් අවධාරණය කොට තිබේ. ඒ අනුව සමාජ කුසලතා,

1. උගත යුතු ය.
2. විශේෂිතව වාචික හා අවාචික හැසිරීම්වලට සම්බන්ධය.
3. සුදුසු ආරම්භයන් සහ ප්‍රතිචාර උපදවයි.
4. සෙසු පුද්ගලයනගේ උපරිම සම්මානය ලබා ගැනීමට උපකාරී වේ.
5. සුදුසු කාල නිශ්චයක් හා විශේෂිත හැසිරීම් පාලනයක් අවශ්‍ය ය.
6. පුළුල් වශයෙන් පැතිර පවත්නා සංදර්භානුගත සාධකවල බලෑමට හසුවේ.

සන්නිවේදන කුසලතා පිළිබඳ අවබෝධ කර ගැනීමට ඉතා ම වැදගත්කමක් දරන නිර්වචනයක් ඉදිරිපත් කර ඇත්තේ ඕවන් හාජි (Hargie,2006) යි. ඔහුට අනුව 'සන්නිවේදන කුසලතා යනු යම් අරමුණක් කේන්ද්‍ර කොටගෙන පුද්ගලයෙකු තුළ සිදුවන ක්‍රියාවලියකි. එය අවස්ථාවට සුදුසු සමාජ හැසිරීම් හා අන්තර් සම්බන්ධී වන අතර උගත හැකි සහ පාලනය කළ හැකි වේ.'

සන්නිවේදන කුසලතා ක්‍රියාකාරකමක් සෑම විට ම පරාර්ථය කේන්ද්‍රීය වේ.

සමාජ අන්තර් ක්‍රියාව පරමාර්ථ කේන්ද්‍රීය සන්නිවේදන කුසලතා යනු පුද්ගලයෙකුගේ සන්නිවේදන අරමුණු ඉටු කර ගැනීමේ හැකියාවයි. (Dindia and Timerman, 2003.p 686).යම් පුද්ගලයෙකු විසින් කුසලතා හැසිරීම් තෝරා ගනු ලබන්නේ යම් අභිමත ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙනි. එය හේතුවක් රහිතව හෝ අහම්බෙන් සිදු වන දෙයක් නොවේ. මැක් ඩොගලි(Mcdougali,1912) මානව හැසිරීම්වල ඇති අරමුණු සහිත ස්වභාවය එහි ප්‍රධාන නෛසර්ගිකයක් බව පවසයි. මෙහි දී අරමුණු සහ සැලසුම් අතර වෙනස හඳුනා ගත යුතු වේ. අරමුණු පිහිටුවා ගැනීමෙන් අනතුරුව සෑම විට ම අරමුණක් ඉෂ්ටප්‍රාප්ත කර ගැනීම සඳහා සැලසුම් අවශ්‍ය වේ. සැලසුම් යනු අරමුණු වෙත ළඟා වීම සඳහා ඇති මාර්ගෝපදේශයන් වේ. බෙගර් ක්නොල්ටන් සහ ඒබ්‍රහම්ස් (Beger Knoltonn and Abrahams, 1996) පවසන පරිදි සැලසුමක් සෑම විට ම අරමුණක් පෙන්නුම් කරන අතර අරමුණක් ඇතැම් විට සැලසුම් පෙන්නුම් නොකළ හැකිය. පුද්ගලයෙකුට අපේක්ෂිත අරමුණක් තිබිය හැකි ය. එහෙත් ඉතා පරෙස්සම්කාරී සැලසුමක් නැතිව එය ළඟා කරගත හැකි නොවේ.

ඉලක්ක හෙවත් අරමුණු පිහිටුවීම ඒවා ක්‍රියාවට නැංවීමට හා අරමුණු අත්හැර දැමීම යන කාරණා විවිධ විචල්‍යන් ගණනාවක බලපෑම හේතුවෙන් සිදු වේ. (Oettingen, Bulgarella, Henderson and Gollwitzer, 2004) අරමුණු ක්‍රියාත්මක කිරීමේ තීරණය මූලික ව ප්‍රධාන කරුණු දෙකක් මත සිදු වේ. ඒ, අභිප්‍රේයතාව (අරමුණ වෙත යෑමේ කැමැත්ත) හා සාධ්‍යතාව (අරමුණු වෙත යා හැකි බවට ඇති විශ්වාසයේ ශක්තිමත් බව)යි.

අරමුණු උද්ග්‍රහණ අරමුණු, කාර්යය සාධන අරමුණු යනුවෙන් ද වෙන් කොට හඳුනාගත හැකිය. උද්ග්‍රහණ අරමුණු යන්න තමා විසින් ම මහත් උවමනාවකින් යුතුව පිහිටුවා ගන්නා අරමුණු වන අතර මේවා ඉෂ්ටප්‍රාප්ත කර ගැනීමේ දී වන ව්‍යර්ථවීම් ධනාත්මක ව අත්දැකීම් ලෙස බොහෝ විට එම පුද්ගලයා විසින් සලකනු ලබයි. කාර්යසාධන අරමුණුවල දී වෙනත් කෙනෙකුගේ මෙහෙයවීම මත හෝ දී ඇති අරමුණක් වෙත ළංවීම සිදු වන අතර බොහෝ විට ව්‍යර්ථය පසු බැසීමට හේතු වේ. එම නිසා උද්ග්‍රහණ අරමුණු, කාර්යසාධන අරමුණුවලට වඩා ජය ගැනීමෙහිලා වැඩි නැඹුරුවක් පවතී. (Oettingen et al.2004)

ලොක් සහ ලැන්තම් 1990 දී අරමුණක් විසින් යම් ක්‍රියාවක් දිරි ගැන්වීම සිදු කරනු ලබන ආකාරයත් හැසිරීමක් පාලනය කිරීම සඳහා මාර්ගෝපදේශකයෙකු ලෙස පෙනී සිටන්නේ කෙසේ ද යන්නත් පෙන්වා දී තිබේ. (Locke and Lantham, 1990) ඒ අනුව ඔවුන් විසින් ස්වකීය අධ්‍යයනයන් ඔස්සේ ඉදිරිපත් කරන ලද මූලධර්ම පහත පරිදි වේ.

1. විශේෂිත වූ අරමුණක් සහිතව යම් කාර්යයක නිරත වන පුද්ගලයෙක් එසේ විශේෂිත අරමුණක් රහිතව එම කාර්යෙහි නිරත වන පුද්ගලයෙකුට වඩා සාර්ථක වේ.

2. අරමුණෙහි නියැලී ඇති මට්ටම අනුව ක්‍රියාකාරීත්වයෙහි ප්‍රමාණය වැඩිවේ.

3. යම් අපැහැදිලි අරමුණකට වඩා ඉතා පැහැදිලි අරමුණක් විසින් නිෂ්පාදනය කරනු ලබන ප්‍රතිඵල සාර්ථක වේ.

දිගු කාලීන අරමුණක් ඉෂ්ටප්‍රාප්ත කර ගැනීම සඳහා කෙටි කාලීන අරමුණු ගණනාවක් පසු කළ යුතු ය. මොහොතින් මොහොත වන හැසිරීම් මාර්ගෝපදේශයට ලක් ව සාර්ථක ව ක්‍රියාකාරී නොවුණහොත් පසුව දිගු කාලීන අරමුණු වෙත ළඟා වීම අපහසු වන බව (Sloboda, 1986) පවසයි.

මේ ආකාරයට කුඩා ඉලක්ක සපුරා ගැනීම තුළින් විශාල ඉලක්ක වෙත යා හැකි වන ආකාරයට කුසලතා හැසිරීම් ධූරාවලියකින් යුතුව සංවිධානය වී තිබේ.(Spitzberg and Cupach, 2002) නිදසුනක් ලෙස යම් වෘත්තියක් සඳහා වෘත්තිකයෙකු තෝරා ගැනීමට නම් ආයතන ප්‍රධානියෙකු විසින් එම ක්‍රියාවලිය සඳහා දිගු කාලීන අරමුණක් පිහිටුවා ගන්නා අතර එම අරමුණ ඉටු කර ගැනීමේ දී කුඩා හෙවත් අනු ඉලක්ක ගණනාවක් පිහිටුවා ගැනීමට සිදු වේ. එම ඇබෑර්තු දැනවීම ප්‍රසිද්ධ කිරීමට අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ලැයිස්තු ගත කිරීමට ඔවුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ආදී වශයෙන් මෙහි දී උප ඉලක්ක පිහිටවිය යුතු අතර මෙම උප ඉලක්ක ද තව දුරටත් කුඩා ඉලක්ක ඔස්සේ සැලසුම් කළ හැකි ය.

කුසලතා හැසිරීම්වල ඇති අනෙක් ලක්ෂණය නම් ඉලක්ක පුද්ගල උපවිඥානය තුළ රැඳී පැවතීමයි. පුද්ගලයෙකු ක්‍රියාත්මක වන අවස්ථාවේ දී උවමනාවෙන් හෝ ආයාසයකින් යුක්තව අදාළ අරමුණු වෙත යාම සඳහා ක්‍රියාකළ යුතු නොවන අතර කුසලතා සමූහයක් විසින් හැසිරීම් පාලනය කරනු ලබයි. නිදසුනක් ලෙස යම් පාපන්නදු ක්‍රීඩකයෙකු පන්දුවට පහර දෙන අවස්ථාවේ දී ඔහුගේ ඉලක්ක හෝ හැසිරීම් පිළිබඳ සිතමින් කාලය ගත නොකරයි. ඔහුගේ පුහුණුව තුළ හැසිරිය යුත්තේ කෙසේ ද යන්නත් පිළිබඳ උපවිඥානික පාලන ආඥාවන් ඔහු ලබා ගන්නා අතර ඔහු ක්‍රියාත්මක වන අවස්ථාවේ දී උපවිඥානය මගින් ඔහුගේ හැසිරීම් මාර්ගෝපදේශනයට ලක් කෙරේ. ඒ ආකාරයෙන් ම සමාජ කුසලතා වලින් පරිපූර්ණ පුද්ගලයෙකු ද අන්තර් පුද්ගල හැසිරීම්වල දී මා මුලින් ම මුවඟට සිනාවක් නගා ගත යුතුයි. ඊළඟට ඍජු අක්ෂි සම්බන්ධතාවය පවත්වා ගත යුතුයි. ඒ අතරතුර සුදුසු ප්‍රතිචාර දැක්විය යුතුයි. මා දැක්විය යුත්තේ කුමන ප්‍රතිචාරය දැයි ආදී වශයෙන් උවමනාවෙන් යම් පුද්ගල සම්බන්ධතාවයක් හසුරුවා ගන්නා ආකාරය පිළිබඳ සිතන්නට වෙහෙසෙන්නේ නැත. ඔහුට හෝ ඇයට එම හැසිරීම් ආඥාවෙන් ලබා දෙන්නේ උපවිඥානය මගිනි.

ග්‍රීනි(Greene,2003.p55) නිගමනය කර ඇති පරිදි ඉලක්ක කේන්ද්‍රීය හැසිරීම් පුද්ගල උපවිඥානිකත්වය තුළ රැඳීමට දිගුකාලීන පුහුණුව හේතු වේ. දිගු කාලීන පුහුණුවක් ඇති විට පුද්ගලයෙකුට අදාළ හැසිරීම්වල දී ඒ පිළිබඳ විඥානිකව හෝ සිතා බැලීමක් අවශ්‍ය නොවේ යනුවෙන් පවසන ග්‍රීනි විශේෂඥයන් බොහෝ විට තමන් කරන දේ එතරම් සාර්ථකව කරන්නේ කුමන ආකාරයෙන් දැයි විස්තර කිරීමට අපොහොසත් වන්නේ එහෙයින් බව පවසයි.

කුසලතා ඉගැනුම් ක්‍රියාවලිය අනුක්‍රමික අවස්ථා සතරකින් සමන්විත ය.

1. අචේතනික - අශක්නුවත් බව

   මෙම අවස්ථාවේ දී අප නුපුහුණු ආකාරයෙන් සිදු කරන ක්‍රියාව පිළිබඳ අප අතිශයින් ම නොදැනුවත් ය.

2. සචේතනික - අශක්නුවත් බව

   මෙම අවස්ථාවේ දී අප ක්‍රියාකාරී වෙමින් සිටන නමුදු අවශ්‍ය වන කුසලතාවල ප්‍රමාණවත් පුහුණුවක් නොමැති බව දැනුවත් ය.

3. සචේතනික - අශක්නුවත් බව

   කුසලතා උපාර්ජන මුල් අවස්ථාව වන මෙහි දී අප ක්‍රියාකාරී වන විට අප කුසලතා සහිත ආකාරයෙන් හැසිරෙන බව දැනුවත් ය.

4. අචේතනික - ශක්නුවත් බව

   පූර්ණ වශයෙන් කුසලතා ස්වීකරණය වූ විට අප කරනු ලබන ක්‍රියාව පිළිබඳ අවධානයක් නැතිව නමුදු ඉතා සාර්ථකව එහි නියැලේ.

මෙහි දී ලැන්ගර්, බ්ලැන්ක් සහ චනොවිට් (Langer, Blank and Chanowitz, 1978) පෙනවා දෙන්නේ සචේතනික මට්ටමේ හැසිරීමක් අචේතනික මට්ටමේ හැසිරීමක් අචේතනික මට්ටමට ගෙන යා හැකි බවයි.(Burgoon and Langer, 1995) මේ තත්ත්වය විශ්ලේෂණය කරමින් කල්පනාකාරී ක්‍රියාකාරකම් ඉතා නම්‍යශීලී ලෙස සිතීමට සහ එයින් ප්‍රවේශම් සහගත තෝරා ගැනීම වෙත එළඹීම සඳහා අරමුණු උපකාරී වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරයි. මෙසේ බලන කළ කුසලතා හැසිරීම් කල්පනාකාරී ය. එසේ ම කුසලතා හීන බව කල්පනාකාරී නොවන සහ අවස්ථානුකූල සාධක පිළිබඳ අඩු අවධානයක් සහ අනම්‍ය හැසිරීම් රටා පෙන්නුම් කරයි.

කෙසේ වෙතත් ඉතා ඉක්මණින් උප විඥානික මට්ටමෙන් ක්‍රියාකාරී වීම සහ ප්‍රතික්‍රියා දැක්වීමේ හැකිකම කුසලතාවක වැදගත් කොටසක් ලෙස සැලකේ. අවිඥානිකත්ව භූමිකාව පිළිබඳ සාකච්ඡාවේ දී බ්‍රෝඩි (Brody, 1987) සිහිකල්පනාවෙන් සිටීම හා සිහිකල්පනාවෙන් සිටන බව දැන සිටීම පිළිබඳ පැහැදිලි කිරීමක් කර ඇති අතර උප විඥානික මට්ටමෙන් උත්තේජන දැනීම කෙසේ සිදු වන්නේ ද යන්නත් පුද්ගලයා විඥානික වශයෙන් එය නොදැන සිටින විට හැසිරීම් කෙරෙහි එය බලපාන්නේ කෙසේ ද යන්නත් ඔහු ස්වකීය අධ්‍යයනයෙන් පෙන්වාදී තිබේ.

කුසලතා ඉගැනීමේ අවස්ථාවේ දී සවිඥානික ව සිතුවිලි ඇතිව සිටින නමුත් පුහුණුවක් තුළින් ඒවා උපවිඥානය වෙත ගලා යන අතර එයින් ශක්තතාව වර්ධනය කරවයි.

සන්නිවේදන කුසලතා යනු හැසිරීම් ක්‍රියාවලියක් ද වේ

හැසිරීම් යනු ක්ෂමතාවයෙහි ඇති ප්‍රධාන අංගයක් වන හෙයින් ඒවා තවත් විශේෂාංග බොහෝමයක් සමඟ ක්‍රමිකව නිර්මාණය වේ. ඒ ආකාරයට ම සමස්ත ක්‍රියාවලියේ විවෘත කොටස වන අරමුණු ලුහුබැඳීමට උපක්‍රම ක්‍රියාවේ යෙදවීමට සැලසුම් කිරීමට නිරන්තරයෙන් පරිසරය සම්බන්ධීකරණය කිරීමට අනෙක් පුද්ගලයන්ගේ තත්ත්වය පිළිබඳ සැලකිලිමත්වීමට අවස්ථාවට උචිත

ලෙස ප්‍රතිචාර දැක්වීමට අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා සාධනීය දේ ඇස්තමේන්තු කිරීම සහ අනාගත හැසිරීම් සුදුසු ආකාරයට ගැළපීම යන සියල්ල කායික හැසිරීම විසින් නියෝජනය කරනු ලබයි. මෙලෙස ඒ ඒ පුද්ගලයාගේ ප්‍රතිචාර හසුරුවනු ලැබීම මත අන්තර් ක්‍රියාව ගනුදෙනු ක්‍රියාවලියක් බවට පත් වේ.

අන්තර් ක්‍රියාව නර්තනයක් වැනි යැයි පවසන විද්වතුන් (Adler, Rosenfeld and Proctor (2001)), නර්තනයේ සහ අන්තර් ක්‍රියාවේ සමානතා පැහැදිලි කරමින් පුද්ගලයෙකු ස්වකීය හැඟීම් ප්‍රකාශ කිරීමටත් අනෙක් අයගේ සිතට කාවැද්දීමට සම්බන්ධතාවයක් වර්ධනය කර ගැනීමට උපකාරීවීමට කාලය ගත කිරීමට හෝ සහායකයා නොමග යැවීමට ආදී වශයෙන් කෙනෙකු නර්තනයේ හෝ අන්තර් ක්‍රියාවේ යෙදිය හැකි බව පවසයි. එහි දී එම අන්තර් ක්‍රියාව හෝ නර්තනය පදනම් වන්නේ දෙදෙනා ඉගෙන ගන්නා ලද හැසිරීම් සම්භාරය දෙදෙනා අතර සම්බන්ධීකරණය කිරීම මත ය. දෙදෙනොගේ ම ප්‍රකාශන විධීන් පූර්වාපේක්ෂිත වන අතර දෙදෙනා ම චලනයන් හා ගලා යන ප්‍රතිචාර සම්බන්ධීකරණ රටාව අනුපූරණය කරයි. එක් පුද්ගලයෙකු අදක්ෂ හෝ නොපුහුණු වුවහොත් අනෙකා මහත් අපහසුවට ලක්වේ.

සන්නිවේදන කුසලතා තුළ ඇත්තේ අන්තර් සම්බන්ධිත හැසිරීම් ය.

සමාජ කුසලතා යනු හැසිරීම්වල හඳුනාගත හැකි විවිධ ඒකක ලෙසින් හඳුනාගත හැකිය. මිලර් කෘට් සහ හාජී 1992 දී හැසිරීමක මූලික ලක්ෂණ හඳුනාගැනීම සම්න්ධයෙන් පහත ආකාරයෙන් දක්වා ඇත. කුසලතා පිළිබඳ විනිශ්චය ඍජුවම හැසිරීම් ක්‍රියාවන්ට සම්බන්ධය. අප පාපන්දු ක්‍රීඩකයකු කොතරම් පුහුණුදැයි විනිශ්චය කිරීමේදී එම විනිශ්චය සිදු කරන්නේ එම ක්‍රීඩකයාට පාපන්දු ක්‍රීඩා පිළිබඳ විශලේෂණයක් කිරීමට පැවරීමෙන් නොවේ. අප ඔහුව කුසලතා පූර්ණ හෝ පුහුණු ලෙස හඳුන්වන්නේ ඔහු ක්‍රීඩාවෙහි නිරත වන ආකාරය දෙස බැලීමෙනි. අපගේ සමාජ කුසලතා සම්බන්ධ විනිශ්චයන් ද පදනම් වන්නේ පුද්ගලයකුගේ සමාජ හමුවීම් තුළ වන හැසිරීම් මතයි. එම නිසා කුසලතා ක්‍රියාවේ වන ප්‍රධාන ලක්ෂණයක් නම් මෘදු එකිනෙකට බැඳුණු හැසිරීම් ක්‍රියාවේ නැංවීමේ ඇති හැකිකමයි.

කුසලතා හැසිරීම් ස්වභාවයෙන්ම අනුක්‍රමිකය. එසේම සෙසු හැසිරීම්වලට බද්ධය. සෑම කුඩා ප්‍රමාණයේ කුසලතා හැසිරීම් ඒකකයක්ම විශාල හෝ වඩාත් ප්‍රබල කුසලතා හැසිරීම්වලට වෙන් වෙන් වශයෙන් අනුක්‍රමිකව සම්බන්ධ වේ. නිදසුනක් ලෙස ගියරයක් මාරු කිරීම හෝ ප්‍රශ්නයකට පිළිතුරක් දීම වැනි කුඩා හැසිරීම් ඒකකයක් වාහනයක් පැදවීම හෝ සමමුඛ පරීක්ෂණයකට පිළිතුරු දීම වැනි කුසලතා හැසිරීම්වලට වෙන් වෙන් වශයෙන් සම්බන්ධ වේ. මෙම හේතුව සමාජ කුසලතා පුහුණු කිරීම පිළිබඳ අවධානය යොමු කරවන ලද අතර කායික කුසලතා වර්ධන ක්‍රමවේදය කෙරෙහි අවධානය යොමු වේ. මෙහිදී විශේෂයෙන්ම විවිධ සේවා ආයතනයන්හි සේවයන් වෙත වඩාත් හොඳ පුහුණුවක් ලබා දීම සඳහා කුසලතා හැසිරීම්වල කුඩා ඒකක වෙත අවධානය යොමුකිරීම වැදගත් බව පිළිගෙන ඇත.

සමාජමය වශයෙන් කුසලතා පූර්ණ හැසිරීම් යනු යම් පොදු අරමුණක් වෙත යාම සම්බන්ධයෙන් අන්තර් සම්බන්ධිත ව හා සමකාලීකව ක්‍රියාවේ යෙදවෙන වෙන් වෙන් වශයෙන් වන කුසලතා හැසිරීම්වල එකතුවකි. මෙවන් වූ මිනිස් කුසලතා හැසිරීම් ඉතා විශාල සංඛ්‍යාවක් හඳුනාගත හැකි අතර ඒවා එකින් එක වෙන් වෙන් වශයෙන් ඉගෙනිය හැකි බව හාජී (Hargie,2006) පවසයි. කෙසේ වෙතත්

පුද්ගලයෙකු කුසලතාපූර්ණවීමට නම් ඔහු හෝ ඇය විසින්, අන්තර්ක්‍රියාවට අවශ්‍ය පරිදි මෙම කුසලතා සාධක සුදුසු ලෙස එකිනෙකට සම්බන්ධ කරගත යුතුය. සමාජ අන්තර්ක්‍රියාවට විවිධාකාර අභ්‍යාසයන් සහ එම අභ්‍යාසයන්ගෙන් ලබා ගන්නා දේ අවශ්‍ය පරිදි කැටි කර ගැනීමේ පුහුණුව අත්‍යවශ්‍ය ය. (Stivers, 2004 p 260)

මෙය එක් අතකින් ටෙනිස් ක්‍රීඩකයෙකුට දක්ෂ ලෙස ක්‍රීඩා කිරීම සඳහා අවශ්‍ය වන පුහුණුවට සමාන කළ හැකිය. ටෙනිස් ක්‍රීඩාවේ දක්ෂයෙකු වීම සඳහා යම් ක්‍රීඩකයෙකු ක්‍රීඩාවේ විවිධ පැති වෙන වෙනම පුහුණු වෙයි. ඔහු ක්‍රීඩා කරන අවස්ථාවේදී ඔහුගේ පුහුණුව තුළින් ඔහුට ලැබුණු සෑම පුහුණු අංශයක්ම එකට සම්බන්ධ වී අවශ්‍ය ආකාරයෙන් ක්‍රීඩා කිරීමේ හැකියාව ඔහු වෙත ලැබෙන්නේ නිරායාසයෙනි. මේ ආකාරයටම පුද්ගලයන්ගේ සමාජ කුසලතා සාධක පිළිබඳව ද එහි ක්ෂුද්‍ර විශ්ලේෂණයන් ඉදිරිපත් කළ හැකිය. කුසලතා පූර්ණ යැයි පිළිගැනීමට නම් මෙසේ ප්‍රගුණ කරන ලද විශේෂ කුසලතා සාධක බොහොමයක් එකට ක්‍රියාත්මක වන ආකාරය කෙරෙහි සැලකිලිමත් විය යුතුය. මේ සම්බන්ධයෙන් වර්ජ්, සොකාරා සහ බුල් (Vrij, Soukara& Bull,2004) පවසන්නේ වාචික හා අවාචික හැසිරීම් දෙස වෙන වෙනම බලා තීරණයන්ට එළඹීමට වඩා වාචික හා අවාචික හැසිරීම් සමස්තයෙහි සංයෝජනය විශ්ලේෂණය කිරීමෙන් තීරණයන්ට එළඹීම වඩාත් සුදුසු බවය. මැක් රායි (Mc rae,2004) මෙහිදී හැසිරීම් ක්‍රියාවන් ඔකෙස්ට්‍රාවකට සමාන යැයි පවසයි. අදාල සංගීතය නිවැරදිවත් අලංකාරවත් නිර්මාණය වන්නේ සෑම සංගීත භාණ්ඩයක්ම සමකාලිකව වැයෙන විටය. එක් සංගීත භාණ්ඩයක ක්‍රියාකාරීත්වයේ වරදක් වූ විට එය සමස්ත තනුවටම බලපායි කුසලතා යනු සම්බන්ධීරණයෙන් වියන ලද හැසිරීම් දැලක් වශයෙන් ප්‍රොක්ටර් සහ දුතා (Proctor & Dutta 1955 p.18) හඳුන්වයි.

කුසලතා නිශ්චය කිරීම සඳහා යොදා ගත හැකි එක් වැදගත් උපමානයක් නම් නිරවද්‍යතාවයි. 'උසස් ලෙස පුහුණු පුද්ගලයන් ක්‍රියාත්මක වීමේදී අඩු දෝෂී පෙන්නුම් කරන අතර නුපුහුණු පුද්ගලයන්ගේ ක්‍රියාකාරීත්වය තුළ වැඩි වශයෙන් දෝෂී පෙන්නුම් කරනු දැකිය හැකියි' යනුවෙන් පවසන මැතිව්ස් සහ පිරිස (Matthews.et al) කුසලතා විනිශ්චය කිරීමේ දී දෝෂයන් කොටස් දෙකකට බෙදා දක්වයි.

1. අත් වැරදීමෙන් හෝ මගහැරීමෙන් සිදු වන දෝෂ
2. අනවබෝධයෙන් සිදු වන දෝෂ

1. අත් වැරදීමෙන් හෝ මගහැරීමෙන් සිදු වන දෝෂ

මෙයින් ක්‍රියාව, ක්‍රියාවේ යෙදවීම මගහැරීම පිළිබඳව කියවේ. නිදසුනක් ලෙස රියැදුරෙකුට එන්ජිම ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ගියරය උදාසීන කිරීම අමතක විය හැකිය.

2. අනවබෝධයෙන් සිදු වන දෝෂ

මෙහිදී පුද්ගලයෙකු තම හැසිරීම තුළින් බලාපොරොත්තු වන ප්‍රතිඵලය සෘණාත්මක බවට හරවන සේ ක්‍රියා කරයි. නිදසුනක් ලෙස යම් නුපුහුණු රියැදුරෙකු ක්ලචය අවශ්‍ය පමණට වඩා ඉක්මනින් අත්හැරීම නිසා එන්ජිම නතරවිය හැකිය.

අවස්ථානුකූල යෝග්‍යතාවකින් යුතු බව

වෙල්ෆර්ඩ් (Welford,1976 p.2) කායික කුසලතා පිළිබඳව කළ විශ්ලේෂණයේ දී මනුෂ්‍යයෙක් බාහිර අවස්ථාවක් සමඟ සම්බන්ධ වූ විට ඊට අදාළ කෘත්‍යමය පද්ධතියක් නිර්මාණය කරගන්නා බවත් කුසලතා විශේෂ අවස්ථාවලදී ඊට අදාළ පරිසරයට සම්බන්ධව විශේෂ පරිමානයන් නියෝජනය කරන බවත් පෙන්වා දී ඇත. කායික කුසලතාවලට සමානව ම සමාජ කුසලතා ද අවස්ථාවට නම්‍යශීලිවීමේ පරිමාණයකින් යුක්ත බව එලිස් සහ වයිටන්ග්ටන් (Ellis and Whittington,1981 p.12) පෙන්වා දෙන අතර හැසිරීම් සමාජම ය වශයෙන් පුහුණුවීමට නම් ඒවා අදාළ සංදර්භය පිළිබඳව දැන සිටිය යුතු බවත් සාමාන්‍යයෙන් එක් සංදර්භයකට සුදුසු වන හැසිරීම් කුසලතාවක් තවත් සංදර්භයකට නොගැලපෙන බවත් ඔවුන් පැහැදිලි කරයි. අවස්ථාවට අදාළ සාධක විසින් හැසිරීම් හැඩගස්වනු ලබන බව මැග්නන්සන් (Magnison,1981) පවසයි.

කුසලතා අන්තර්ගතය තුළ ඇත්තේ ඉගෙනිය හැකි හැසිරීම් ය.

භාෂාව ස්වභාවයෙන් පිහිටන්නේ නැතිවාක් මෙන්ම සෑම සමාජ කුසලතාවක් ම අනිවාර්යයෙන් ම ඉගෙනිය යුතු බව න්‍යායවේදීන් ගේ අදහසයි. මේ අසහසට එකඟ නොවන සැන්ඩර්ස් (Sanders,2003 p.228) වැනි න්‍යායවේදීහු ඇතැම් හැසිරීම්වල කුඩා අංග ස්වභාවිකවම පිහිටන බවට ද තර්ක කරති. එහෙත් දරුවෙකුට තනිව තමන්ගේ ජන්ම භාෂාව සංවර්ධනය කරගත නොහැකි මෙන්ම ඔහුට තනිවම සමාජ අන්තර් ක්‍රියාවන් ද සංවර්ධනය කරගත නොහැකි බව ද එසේම දෙමාපියන්ගේ අන්තර් ක්‍රියාකාරීත්ව කුසලතා දරුවන්ගේ සමාජ ශක්තතාව වර්ධනයේදී ඉතා වැදගත් සාධකයක් බව දහාට්, නෙවෙල් හා ඔල්සන් (Hart, Newell & Olsen,2003) පෙන්වා දී තිබේ.

බැන්ඩූරා (Bandara,1971) ගේ සමාජ උගෙනුම් න්‍යාය ඉදිරිපත් කර ඇති ආකාරයට ඇසිපිය හෙළීම වැනි ඉතා කුඩා සාධක කිහිපයක් හැරුණු කොට සෑම හැසිරීම් සම්භාරයක්ම ඉගෙන ගන්නා ක්‍රියාවන් ය. මෙම සමාජ ඉගෙනුම් ක්‍රියාවලියට දෙමාපියන්, යහළුවන්, මාධ්‍ය තරු, ගුරුවරුන් වැනි සෙසු පුද්ගලයන් අනුකරණය කිරීම හා අනුගමනය කිරීම ද ඇතුළත් වේ. පුද්ගලයන් සෙසු පුද්ගලයන් හැසිරෙන ආකාරය නිරීක්ෂණය කරන අතර ඊට සමාන හැසිරීම් රටාවන් පුහුණු වේ. ඇතැම් පුද්ගලයන් තුළ සෙසු පුද්ගලයන්ට සාපේක්ෂව විශේෂිත වූ හැකියාවන් දැකිය හැකිය. නමුත් හැසිරීම් ගත් විට වැඩි ප්‍රතිශතයක් ඉගෙනීමෙන් ලබා ගන්නා සහ පුහුණුවෙන් වැඩි දියුණු කරගැනීමේ හැකියාවෙන් යුක්තය. ඵලදායී ඉගෙනුම් ක්‍රියාවලියක අවධානය සහ ඉලක්ක පිළිබඳව නිරන්තර අපේක්ෂාවත් පුහුණුවත් අන්තර්ගත වේ.

ප්‍රත්‍යක්ෂණපාලනය

පුද්ගලයෙකුට ස්වකීය සන්නිවේදන ක්‍රියාව ප්‍රත්‍යක්ෂණම ය වශයෙන් කෙතරම් දුරට හැසිරවිය හැකි ද යන්න අනෙක් කරුණ වේ. සාමාන්‍යයෙන් සමාජයීය වශයෙන් හැසිරීමේ ප්‍රමාණවත් දැනුමක් නොමැති පුද්ගලයෙකු පුද්ගලාන්තර සන්නිවේදන කුසලතාවල මූලික සාධක ඉගෙනිය හැකිය. එහෙත් එහිදී ඔහු අත්‍යවශ්‍යයෙන් ම ස්වකීය අපයෝගීතාවට අවශ්‍ය වන සිතුවිලි ක්‍රියාවලිය සංවර්ධනය කර ගත යුතු වේ.

යම් කුසලතාවක් එහි අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට නම් කාලය භාවිතය එහි සැලකිලිමත් විය යුතු තීරණාත්මක සාධකයක් වේ. හැසිරීමක් කුසලතාවක් ලෙස හැඳින්විය හැක්කේ එය සුදුසු අවස්ථාවේ දී සිදු වන්නේ නම් පමණකි. නිවැරදි දේ වුව ද නුසුදුසු අවස්ථාවක දී පැවසීම සමාජයීය වශයෙන් ප්‍රමාණවත් නොවන හැසිරීමක ලක්ෂණයකි. සන්නිවේදන කුසලතා පිළිබඳව ඉගෙනීමේ දී කුමන අවස්ථාවක එම කුසලතා ඉදිරිපත් කළ යුතු දැයි ඉගෙනීම ද කුසලතා ඉගෙනීම තරමටම වැදගත් වේ. මෙහිදී අනුක්‍රමික පාලන න්‍යාය වැදගත් වේ (Madrala,1994) අනුක්‍රමික පාලන න්‍යාය තුළ පුද්ගලයෙකුගේ හැසිරීම හඳුන්වනු ලබන්නේ අනුක්‍රමිකව පහළ සිට ඉහළට වශයෙන් පාලන මට්ටම් නවයක් (9)එකට බැඳී හසුරුවනු ලබන විශේෂිත වූ ක්‍රියාවලියක් ලෙසය.

I. තීව්‍රතා පාලනය

මෙම පළමු මට්ටම අපගේ සමට යටින් පිහිටි හැඟීම් පිළිගැනීමේ අවස්ථාව වන මාංශ පේෂීන් චලනය කශේරුකාව සම්බන්ධ ප්‍රතිචාරවලට සම්බන්ධය. මෙම මූලික මට්ටමේ දී සිදුවන හානි සන්නිවේදනය සම්බන්ධයෙන් ඉතා තීරණාත්මක ප්‍රතිවිපාකවලට හේතු වේ. නිදසුන් ලෙස, පෙනීමේ හෝ දැකීමේ අඩුපාඩු, ඇසීම සම්බන්ධ ගැටලු වැනි දේ පුද්ගලාන්තර හැකියාවට බාධා කරයි.

II. සංවේදන පාලනය

මෙහිදී මුල් මට්මමේ දී රැස් කර ගන්නා ලද දේ සංවිධානය කරගනු ලබන අතර අර්ථවත් පැකේජ හෙවත් පොදි වශයෙන් නිර්මාණය කරයි. මුහුණෙන් නිරූපණය වන හැඟීම් ප්‍රකාශන වැනි ක්‍රියාකාරීත්වයන් හි පදනම මෙහි දී ඇති වේ.

III. ආකෘතිකමය පාලනය

දෙවන මට්ටමේ දී සංවිධානය වූ මූලික පැකේජයන් මෙම මට්ටමේ දී තව දුරටත් විශාල ආකෘති වශයෙන් සංවිධානය වේ. මෙහිදී බාහු චලනය පාලනය කිරීම, දෘශ්‍ය විධීන්, කථන රටා ආදිය සංජානනය කිරීම වැනි පාලනයන් සිදුවේ. අවාචික සංඥා විකේතකරණය කිරීමේ හැකියාව මෙම මට්ටමේ දී ඇති වේ.

IV. සංක්‍රාන්තික පාලනය

මෙම මට්ටම තුළ තව දුරටත් මූලික ආකෘතීන් වඩා හොඳ ප්‍රතිචාර කෙරෙහි මෙහෙයවයි. කටහඬේ උස් පහත් භාවය වෙනස් කිරීම, වචන උච්ඡාරණය, අවශ්‍ය අවස්ථාවන්හි දී හිස චලනය, ආදිය මෙන්ම මෙම මට්ටමේ දී අනෙක් පුද්ගලයන්ගේ අර්ථ හඳුනාගැනීමේ අවස්ථා ද ලබා දෙයි.

V. අනුක්‍රමික පාලනය

මෙම මට්ටමේ දී අප විසින් අපගේ සන්නිවේදනයන්හි අන්තර්ගතය, ගලායාම, දැනීම ක්‍රමික බව ආදිය හසුරවනු ලබන අතර සුදුසු ආකාරයට අන්තර් ක්‍රියාවන් සිදු කිරීම සමකාලික ව ප්‍රතිචාර දැක්වීම අවස්ථානුකූල ව සංදර්භයට ගැළපෙන ලෙස සියල්ල හසුරවනු ලැබේ. පුද්ගලයෙකු සමාජයීය වශයෙන් පුහුණු ද යන්න විනිශ්චය කිරීමට හැකි වන්නේ මෙම මට්ටමේ සිටයි.

VI. සම්බන්ධතා පාලනය

මෙහිදී පුද්ගලයන් විනිශ්චය කිරීමටත් සම්බන්ධතා පිළිබඳව තීරණ ගැනීමටත් සුදුසු උපක්‍රම ක්‍රියාත්මක කරමින් උසස් අරමුණු හඹා යාම සිදු වේ. නිදසුන් ලෙස රැවටිලිකාර පණිවුඩයක් නිවැරදිව ආකේතකරණය හා විකේතකරණය කර ගැනීමේ හැකියාව මෙම මට්ටමේ දී ලැබේ. සාර්ථක ව්‍යාපාරික ගණුදෙනු සඳහා සාකච්ඡා කිරීම් උසස්වීමක් සම්බන්ධයෙන් රැකියාවේ පුද්ගල සම්බන්ධතා හැසිරවීම් වැනි දේ මෙම මට්ටම තුළ සිදු වේ.

VII. කාර්යක්‍රම පාලනය

මෙම මට්ටමේ දී සන්නිවේදනය විවිධ සංදර්භයන් තුළ අර්ථ දැක්වීමට, පූර්වකථන කීමට, හැසිරවීමට සංවර්ධනය කෙරේ. කුසලතා උපාර්ජනය දැනුම් සම්පාදනය ක්‍රියාවලියට සම්බන්ධය.(Matthews et al,2000) මෙහිදී වර්ග දෙකක දැනුම වැදගත් වේ. (spitzbege & Cupach,2002)

1. සමාජමය හමුවීමක දී වැදගත් වන්නේ කුමක්දැයි දැනීම (අන්තර්ගත හෝ ප්‍රකාශනමය දැනුම)

මෙම වර්ගයේ දැනුමට සමාජ හමුවීම් සම්බන්ධ නීති පිළිබඳ දැනුවත් බව මිනිසුන් විසින් රඟ දක්වනු ලබන භූමිකා ඔවුන්ට සම්බන්ධ වන ආකාරය පිළිබඳ දැනුවත් බව වැනි දේ අයත් වේ. කුසලතා ඉගෙනීමේ මුල් අදියරයේදී මෙම දැනුම විශේෂයෙන් ප්‍රමුඛ වේ.

2. කුසලතාපූර්ණ ලෙස ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම (පරිපාටිය දැනුම)

පුද්ගලයෙකු පුහුණුබවට පත්වීමේ දී ඔහු හෝ ඇය සතු ප්‍රකාශනමය දැනුම තුළින් පරිපාටිය දැනුම සම්පාදනය කරගැනීම අවශ්‍ය වේ. මෙහිදී පුද්ගලයා විශාල වශයෙන් පුද්ගලාන්තර සන්නිවේදන කුසලතා ක්‍රියාකරවීමෙහිලා ඍජුවම සම්බන්ධ වන විශේෂ පරිපාටින් සංවර්ධනය කරගනී.

මේ හා සමානව ම සමාජමය හැසිරීම් සම්බන්ධ මානසික නියෝජනයන් රඟ දක්වන භූමිකා පිළිබඳව ද විද්වත් අවධානය ප්‍රබලව යොමුව තිබේ. උසස් ලෙස පුහුණු වූ පුද්ගලයන් සතුව මෙවැනි අවස්ථානුයෝගී මානසික නියෝජනයන් විශාල ගබඩාවක් පවතී. මෙම නියෝජනයන්

හෝ සංකල්පිත මනෝ රටාවන් විසින් අවස්ථානුකූල ලෙස පෙර අත්දැකීම්වලින් ලද දැනුම සංසන්දනය කරන අතර තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරවයි. මෙහිදී දැනුමට අදාළ ප්‍රතිඵල සංවිධානය මගින් සිතීම සඳහාත් ප්‍රත්‍යක්ෂණ ක්‍රියාකාරකම් සඳහාත් අවශ්‍ය වන මනෝ රටාවන් සපයා දෙයි. මනෝ රටාවක් යනු එකම අවස්ථාවකට නැවත නැවත නිරාවරණය වීමෙන් සංවර්ධනය කරගනු ලබන ඥානමය ආකෘතියකි. මෙම ඥානමය ආකෘතිය මගින් යම් විශේෂිත අවස්ථාවක විශේෂිත සංදර්භයක් තුළ හැසිරීමේ දැනුමෙන් සහ තොරතුරුවලින් පිරිපුන් පුද්ගලයෙකු නිර්මාණය කරයි. අවශ්‍ය පරිදි සූදානම් කොට ඇති පෙළ හෙවත් පිටපත් ගණනාවකින් මෙම මනෝරටාවන් සමන්විත වේ. පුද්ගලයෙකු වැඩිහිටියෙකු සමයෙහි දී අනෙක් මිනිසුන් සමඟ ගනුදෙනු කිරීම සඳහා මෙවන් විවිධාකාරයේ මනෝ රටාවන් දහස් ගණනක් සංවර්ධනය කර ගනී. (වෙළඳසැලක් තුළ බඩු මිළදී ගැනීම, ගුවන් තොටුපළ තුළ ක්‍රියාකාරීත්වය වැනි දේ)අපගේ මනෝ රටාවන්ගේ ක්‍රියාකාරීත්වය මාර්ගෝපදේශනය කරනු ලබන්නේ අභ්‍යන්තර කථන මගිනි. මෙම ක්ෂේත්‍රය අධ්‍යයනය කරමින් ජොන්සන් අභ්‍යන්තර කථනයට අදාළ ප්‍රධාන නෛසර්ගිකයන් තුනක් හඳුන්වා දෙයි. ඒ අනුව මුලින්ම එය ස්වාර්ථයික හෙවත් අහං කේන්ද්‍රිකය. ස්වකීය සුභ සිද්ධිය සඳහා පමණක් භාවිත වේ. කථිකයා හා ශ්‍රාහකයා යන දෙපාර්ශ්වය ම පුද්ගලයෙකුගේ ස්වකීයයත්වය තුළ හිඳී. දෙවනු අනෙක් පුද්ගලයන් හා ශබ්ද නගා කරන කතාබහක් සේ නොවේ. එය නිහඬය. තෙවනුව එය එක් වචනයකට අර්ථ ගණනාවක් ආදී ලෙස ඉතා තදින් තෙරපා ඔබ්බන ලද සංඥාර්ථ විශාල ගණනාවකින් යුක්තය. මනෝ රටාවන් පුද්ගලයන් වෙත තොරතුරු ක්‍රියාවලියේදී සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ප්‍රත්‍යක්ෂණමය වශයෙන් කෙටි මාර්ග සපයා දෙන බව ෂේන් (Shen,2004) පවසයි.

අත්දැකීම් රහිත වන විට අදාළ මනෝ රටාවන් ඵලදායී ලෙස සකස් කරගැනීම අපහසු වන හෙයින් නුපුරුදු නව අවස්ථාවක් එකවර විනිශ්චය කර ගැනීම පුද්ගලයෙකුට තරමක් අපහසු විය හැකිය. වෘත්තිකයන් ගත් විට ද ඕනෑම වෘත්තියක නියැලීමේ දී එම වෘත්තියට අදාළ විශේෂ විෂය සම්බන්ධයෙන් සංවර්ධනය කරන ලද පෙළ සහ මනෝ රටාවන් ඉගෙනීම වෘත්තිකයෙකුට අත්‍යශ්‍ය වේ.

ප්‍රොක්ටර් සහ දුතා පැහැදිලි කරන ආකාරයට කුසලතාව උපාර්ජනය වන ප්‍රමාණය වැඩිවත්ම ප්‍රත්‍යක්ෂණ අවශ්‍යතාව හෙවත් ප්‍රත්‍යක්ෂණ මෙහෙයවීමේ උවමනාව අඩු වේ. නිදසුන් ලෙස යම් අවස්ථාවක් හැසිරවීම පුරුදු පුද්ගලයෙකුට ඒ පිළිබඳව ගැඹුරින් සිතා බැලීමට අවශ්‍ය වන්නේ නැත. එවිට ප්‍රත්‍යක්ෂණ සම්පත් වෙනත් ක්‍රියාකාරකම් සඳහා යෙදවීමේ අවස්ථාව ලැබේ. අත්දැකීම් සහිත ගුරුවරයෙකුට පන්තියේ දීළමුන් පාලනය කර ගැනීම සම්බන්ධයෙන් නිවැරදිව සහ විශේෂිතව සංවර්ධනය කර ගන්නා ලද පෙළ හා මනෝ රටාවන් තිබේ. මෙම පෙළ සහ මනෝ රටාවන් වෘත්තිමය සංදර්භය තුළ ඉතා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම සඳහා වැදගත් අංගයක් වේ. කුසලතා ක්‍රියාකාරීත්වය තුළ ද ඉක්මන් බව ඉතා වැදගත් සාධකයකි. නිදහසේ ගලා යන අන්තර් පුද්ගල හමුවීම් තුළ කථිකයන් අතර අන්‍යෝන්‍ය ප්‍රතිචාර සඳහා ආසන්න වශයෙන් මිලි තත්පර 200කට අඩු කාලයක් ගතවේ.

VIII. ප්‍රතිපත්ති පාලනය

පුද්ගලයෙකු සංවර්ධනය කරනු ලබන කාර්ය ක්‍රමයන් අනිවාර්යයෙන් ම ඔහුගේ ප්‍රතිපත්ති හෝ අරමුණුවලට සෘජුව ම සම්බන්ධ විය යුතුය. එවිට ඒවායෙහි ක්‍රියාකාරීත්වය ඉබේ හැසිරවේ. පාර්ක් (þrk,1994) පෙන්වා දෙන පරිදි අසාර්ථක හැසිරීම් සෑම විටම සිදු වන්නේ පුද්ගලයන්ගේ සැබෑ ප්‍රතිපත්තීන්ට අවශ්‍ය වන පරිදි කාර්ය ක්‍රමයන් සකස් කර නොගැනීම නිසාය.(p.603)

IX. ක්‍රම සංකල්ප පාලනය

මෙම අනුක්‍රමයේ ඉහළින්ම ඇත්තේ අපගේ පරමාදර්ශී ස්වසංකල්ප රීතියයි. මෙය අපගේ ප්‍රතිපත්ති පාලනය කරන අතර ඒවා මාර්ගෝපදේශනය කරයි. කාර්යක්‍රම නිර්ණය කරගැනීම සිදු වන්නේ ඉන් පසුවය. යම් පුද්ගලයෙකු තමාගේ ස්වසංකල්පය උපකල්පනය කරන්නේ තමා අවංක පුද්ගලයෙකු ලෙස නම්, එවිට ඔහු හෝ ඇය විසින් සෑම විටම සංවර්ධනය කරන ප්‍රතිපත්ති නම් සත්‍යය පැවසීම, පොරොන්දු ඉටු කිරීම වැනි දේ ය. මෙම අනුක්‍රමයේ තවදුරටත් පහළට යන විට කාර්ය ක්‍රම මට්ටමේ දී මනෝ රටාවන් සූත්‍රණය කිරීමේ දී මෙම ප්‍රතිපත්ති විවිධ සංදර්භයන් තුළ ක්‍රියාත්මක කළ හැකි ආකාරයට සකස් කරයි.

සමාලෝචනය

ඉහත සියලු පැහැදිළි කිරීම් තුළින් අවසන ඔප්පු වන සාධකය නම් සන්නිවේදන කුසලතා ඉගෙනීමෙන් හා පුහුණුවෙන් සංවර්ධනය කරගත හැකි බව ය. එම කාර්යය සඳහා උනන්දුව හා කැපවීම අවශ්‍ය. අචේතනික හා අවිඥානික හා අඥාන සන්නිවේදන ක්‍රියාවන්ගේ නිශේධනීය ප්‍රතිඵල බහුලව දැකිය හැකි වත්මන් ලෝකය තුළ සන්නිවේදන කුසලතා සචේතනිකව ඉගෙන ප්‍රගුණ කර ගැනීමෙන් සන්නිවේදන ඵලදායිතාව දෝතට ගත හැකි වේ. තමාට සන්නිවේදන කුසලතාවක් දෙවියන් දී නැතැයි ශෝක වන බොහෝ දෙනාට කිව යුතුව ඇත්තේ නොහැකියාව යනු නොලැබීම නොව ලබා නොගැනීම ම පමණක් බව ය.

References

Adler, R., Rosenfeld, L. & Proctor, R. (2001). *Interplay: the process of interpersonal communication*, 8th edn. Orlando, FL: Harcourt.

Bagozzi, R. & Kimmel, S. (1995). A comparison of leading theories for the prediction of goal-directed behaviours. *British Journal of Social Psychology*, ***34***, 437–461.

Bandura, A. (1971). *Social learning theory*. Morristown, NJ: General Learning Press. Becker, R., Heimberg, R. & Bellack, A. (1987). *Social skills training for treatment of depression*. New York: Pergamon Press.

Berger, C., Knowlton, S. & Abrahams, M. (1996). The hierarchy principle in strategic communication. *Communication Theory*, ***6***, 111–142.

Brody, N. (1987). Introduction: some thoughts on the unconscious. *Personality and Social Psychology Bulletin*, ***13***, 293–298.

Burgoon, J. K. & Langer, E. J. (1995). Language, fallacies, and mindlessness– mindfulness in social interaction. In B. R. Burleson (Ed.), *Communication Yearbook: Vol. 18*. Thousand Oaks, CA: Sage.

Carver, C. & Scheier, M. (1998). *On the self-regulation of behavior*. Cambridge: Cambridge University Press.

Clampitt, P. (2001). *Communicating for managerial effectiveness*, 2nd edn. Thousand Oaks, CA: Sage.

Combs, M. & Slaby, D. (1977). Social skills training with children. In B. Lahey & Kazdin (Eds), *Advances in clinical child psychology*. New York: Plenum.

Crossman, E. (1960). *Automation and skill*. DSIR Problems of Progress in Industry, No. 9. London: HMSO.

Ellis, R. & Whittington, D. (1981). *A guide to social skill training*. London: Croom Helm.

Fitts, P. & Posner, M. (1967). *Human performance*. Belmont, CA: Brooks-Cole.

Greene, J. (2003). Models of adult communication skill acquisition: practice and the course of performance improvement. In J. Greene & B. Burleson (Eds), *Handbook of communication and social interaction skills*. Mahwah, NJ: Lawrence Erlbaum.

Hargie, O. (1988). From teaching to counselling: an evaluation of the role of micro-counselling in the training of school counsellors. *Counselling Psychology Quarterly*, ***1***, 75–83.

Hart, C., Newell, L. & Olsen, S. (2003). Parenting skills and social-communicative competence in childhood. In J. Greene & B. Burleson (Eds), *Handbook of communication and social interaction skills*. Mahwah, NJ: Lawrence Erlbaum.

Johnson, J. (1993). Functions and processes of inner speech in listening. In A. Wolvin & C. Coakley (Eds), *Perspectives on listening*. Norwood, NJ: Ablex.

Kelly, J. (1982). *Social skills training: a practical guide for interventions*. New York: Springer.

Langer, E., Blank, A. & Chanowitz, B. (1978). The mindlessness of ostensibly thoughtful action. *Journal of Personality and Social Psychology*, ***36***, 635–642.

Locke, E. & Latham, G. (1990). *A theory of goal setting and task performance*. Englewood Cliffs, NJ: Prentice-Hall.

Magnusson, D. (Ed.) (1981). *Towards a psychology of situations*. Hillsdale, NJ: Lawrence Erlbaum.

Matthews, G., Davies, D., Westerman, S. & Stammers, R. (2000). *Human performance: cognition, stress and individual differences*. Hove: Psychology Press.

McDougall, W. (1912). *Psychology: the study of behaviour*. London: Williams and Norgate.

McRae, B. (1998). *Negotiating and influencing skills*. Thousand Oaks, CA: Sage. Messer, D. (1995). *The development of communication: from social interaction to language*. Chichester: Wiley.

Michelson, L., Sugai, D., Wood, R. & Kazdin, A. (1983). *Social skills assessment and training with children*. New York: Plenum.

Millar, R., Crute, V. & Hargie, O. (1992). *Professional interviewing*. London: Routledge. Newton, M. (2002). *Savage girls and wild boys: a history of feral children*. London: Faber.

Oettingen, G., Bulgarella, C., Henderson, M. & Gollwitzer, P. (2004). The self-regulation of goal pursuit. In R. Wright, J. Greenberg & S. Brehm (Eds), *Motivational analyses of social behavior*. Mahwah, NJ: Lawrence Erlbaum.

Parks, M. R. (1994). Communication competence and interpersonal control. In M. Knapp & G. Miller (Eds), *Handbook of interpersonal communication*, 2nd edn. Thousand Oaks, CA: Sage.

Phillips, E. (1978). *The social skills basis of psychopathology*. New York: Grune and Stratton.

Proctor, R. W. & Dutta, A. (1995). *Skill acquisition and human performance*. Thousand Oaks, CA: Sage.

Sanders, R. (2003). Applying the skills concept to discourse and conversation: the remediation of performance defects in talk-in-interaction. In J. Greene & B. Burleson (Eds), *Handbook of communication and social interaction skills*. Mahwah, NJ: Lawrence Erlbaum.

Shen, F. (2004). Chronic accessibility and individual cognitions: examining the effects of message frames in political advertisements. *Journal of Communication*, ***54***, 123–137.

Sloboda, J. (1986). What is skill? In A. Gellatly (Ed.), *The skilful mind: an introduction to cognitive psychology*. Milton Keynes: Open University Press.

Spitzberg, B. & Cupach, W. (2002). Interpersonal skills. In M. Knapp & J. Daly (Eds), *Handbook of interpersonal communication*, 3rd edn. Thousand Oaks, CA: Sage.

Stivers, T. (2004). 'No no no' and other types of multiple sayings in social interaction. *Human Communication Research*, ***30***, 260–293.AA

Vrij, A., Akehurst, L., Soukara, S. & Bull, R. (2004). Detecting deceit via analyses of verbal and nonverbal behavior in children and adults. *Human Communication Research*, ***30***, 8–41.

Welford, A. (1976). *Skilled performance: perceptual and motor skills*. Glenview, IL: Scott, Foresman.

ปกอาเฟบ หา ตาสำหรับ

29

නව මාධ්‍ය බිහිවීම සහ සමාජගත වීම

දිනිති ජයසේකර

තාක්ෂණය සන්නිවේදන ක්‍රමවේදයන්හි වෙනස්වීම් ඇති කරන යුගයක ජනමාධ්‍ය භාවිත රටා ද පරිවර්තනයකට බඳුන් වී ඇත. එහිදී ජනමාධ්‍ය අතරට නවමාධ්‍ය පැමිණීම ද සිදුව ඇති අතර එහි පවතින වෙනස්කම් වෙත මානව සමාජය අනුවර්තනය වෙමින් පවතී. විවිධ වූ නවමාධ්‍ය සමාජගත වී ඇති අතර මාෂල් මැක්ලූහන් "ගුටෙන්බර්ග් ගැලැක්සි" ලෙස හැඳින්වූ යුගය වෙනස් වී "ඉන්ටර්නෙට් ගැලැක්සි" නම් යුගය පැමිණ ඇත. (Castells, 2001,p3) සන්නිවේදනය සතුව පවතින බලය මෙහිදී විද්‍යාමාන වේ. "Power is more than communication, and communication is more than power" ලෙස කැස්ටෙල්ස් දක්වා ඇති කියමන වර්තමානයෙහි වඩාත් යථාර්ථයක් ව ඇත. (Castells, 2001,p3)

නවමාධ්‍ය සමාජ ගතවීම සමඟ අන්තර්ජාලය, සමාජජාල, නවීන ජංගම දුරකතන, බ්ලොග් අඩවි, වැනි නවමාධ්‍ය ස්වරූප දැකිය හැක. ඒ අතරින් අන්තර්ජාලය පිළිබඳ මූලික වශයෙන් මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කරනු ලැබේ. 1995 දී මිලියන හතලිහක් ව පැවති විශ්වීය අන්තර්ජාල භාවිතකරන්නන් 2008 වනවිට බිලියන 1.4 කි. ජනගහනයට අනුපාතව අන්තර්ජාල භාවිතකරන්නන් සැලකීමේදී 60% ක ප්‍රතිශතයක් සංවර්ධිත රටවලින් වාර්තා වූ අතර සංවර්ධනය වෙමින් පවතින රටවල ද අන්තර්ජාල භාවිතය ශීඝ්‍රව වර්ධනය වී ඇත. එසේම 2008 වනවිට විශ්වීය අන්තර්ජාල භාවිත අනුපාතය ලෝක ජනගහනයෙන් 1/5 ක්ව තිබූ බව දැකගත හැකිවිය. (Castells, 2001,p62) පරිගණක තාක්ෂණයේ වැඩි දියුණුව සමග අන්තර්ජාලය භාවිතයෙන් සන්නිවේදනය කළ හැකි සහ ඩිජිටල් තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සංවර්ධනය වී ඇති සන්නිවේදන මාධ්‍ය නවමාධ්‍ය ලෙස සැලකිය හැකිය.පුවත්පත, රූපවාහිනිය, ගුවන්විදුලිය, වැනි මාධ්‍ය පැරණි මාධ්‍ය ලෙස වර්තමානයේ සලකනු ලැබේ.අන්තර්ජාලය, සමාජජාල, නවීන ජංගම දුරකතන, බ්ලොග් අඩවි, වැනි මාධ්‍ය නවමාධ්‍ය ලෙස සලකයි. නමුත් ''නවමාධ්‍ය'' සියලු කල්හි ''නව'' ලෙසට හැඳින්වීමට නොහැකි වන්නේ තාක්ෂණික දියුණුව සමග නවමාධ්‍ය වෙනස්කම් වලට භාජනය වීම සිදුවන බැවිනි. ඩිජිටල් තාක්ෂණය, ජාලගතවීම, සහ සම්බන්ධතා සිදුවීම මගින් නවමාධ්‍ය සමාජගත විය. නවමාධ්‍ය සතුව පවතින තාක්ෂණික හැකියාව නිසා පවතින ආර්ථික, සමාජීය, බලය වෙනත් විරුද්ධ දිශාවකට හැරවීමේ හැකියාව පවතී (Neuman, 1991)

නවමාධ්‍ය බිහිවීම සහ සමාජගතවීම හඳුනාගැනීම සඳහා පවතින නිර්වචන විමසා බැලීම අවශ්‍යය.

ජාල යනු අන්තර් සම්බන්ධිත තත්ත්වයකි. මෙය මානව භාවිතාවේ පැරණි මුහුණුවරකි. එය අන්තර්ජාලය විසින් බලගැන්වුනු ජාල සම්බන්ධතා මගින් නව ලෝකයක් ලබා දෙනු ලැබේ. (Castells, 2001,p1)

ඩිජිටල් අවකාශයක සන්නිවේදනය සඳහා භාවිත කරන මෙවලම්, එනම් අන්තර්ජාලය මගින් සිදුකරන සන්නිවේදන මෙවලම් නව මාධ්‍ය ලෙස හැඳින්වේ. (නවමාධ්‍ය පරිගණක සහ ජංගම දුරකථන වැනි) එසේම, නව ක්‍රමවේදයන් මගින් ඩිජිටල් අවකාශයක සන්නිවේදනය සිදුකරන අතර කුඩා කණ්ඩායම් හි පුද්ගලයන් ඒකරාශී කරමින් සජීවීව තොරතුරු හුවමාරු කිරීම, බෙදාහැරීම සිදු කරන මාධ්‍ය මේ ගණයට වැටේ. (http://www.pcmag.com)

පරිගණක තාක්ෂණය හේතුවෙන් පහසුවෙන් විද්‍යුත් සන්නිවේදනය සිදුකළ හැකි විධි නව මාධ්‍ය යටතට ගැනේ. වෙබ් අඩවි, සංවාද කවුළු, විද්‍යුත් තැපැල්, ඩිජිටල් කැමරා, ජංගමශීලී පරිගණක, ඩිජිටල් දත්ත සම්ප්‍රේෂණය කළ හැකි දුරකථන වැනි ක්‍රමවේද විද්‍යුත් ලෙස ගත හැකිය.' (http://www.webopedia.com)

'වර්තමානය වනවිට දැකගත හැකි හෝ අනාගතයේ බිහිවිය හැකි ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ක්‍රමවේද නවමාධ්‍ය යටතට ගැනේ. ත්‍රිමාණ තාක්ෂණික නිර්මාණ, ග්‍රාහකයා සමඟ අන්තර් සම්බන්ධතාව දක්වන තාක්ෂණික මාධ්‍යය, සජීවී සමාජ මෙහි දී සලකා බැලේ.' (http://searchsoa.techtarget.com/definition/new-media)

එසේම,

ඉලෙක්ට්‍රොනික, පරිගණක තාක්ෂණය, තොරතුරු තාක්ෂණය සමඟ සබඳතා දක්වන මාධ්‍ය නවමාධ්‍ය වේ. අන්තර්ජාලය සහ වෙනත් විදුලි සංදේශ ක්‍රමවේද සමඟ බැඳුණු විවිධ නව සන්නිවේදන විධි ලෙස ද නවමාධ්‍ය අර්ථකථනය කළ හැකිය.
(http://www.thefreedictionary.com/new+media)

පරිගණක තාක්ෂණයේ වැඩි දියුණුව සමග අන්තර්ජාලය භාවිතයෙන් සන්නිවේදනය කළ හැකි සහ ඩිජිටල් තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සංවර්ධනය වී ඇති සන්නිවේදන මාධ්‍යය 'නවමාධ්‍ය' ලෙස ගත හැකි බව සියලු නිර්වචන විමසීමෙන් පැහැදිලි වේ.

නමුත් 'නවමාධ්‍ය' සියලු කල්හි 'නව' ලෙසට හැඳින්වීමට නොහැකි වන්නේ තාක්ෂණික දියුණුව සමග 'නවමාධ්‍ය' වෙනස්කම්වලට භාජනය වීමත්, අද 'නව' ලෙස සැලකූ මාධ්‍ය අදින් වසර කිහිපයකට පසුව 'පැරණි මාධ්‍ය' වීමට ද අවකාශය පවතින බැවිනි. පුවත්පත්, සඟරා, රූපවාහිනිය, ගුවන්විදුලිය, පොතපත, ඍජු තැපැල් හුවමාරුව වැනි ක්‍රමවේද පැරණි මාධ්‍යය වලට නිදසුන් වේ.

බ්ලොග් සහ සජීවී ජර්නල, වෙබ් අඩවි, බ්ලූ රේ ඩිස්ක් මගින් ක්‍රියාකරන සීඩී, ඩීවීඩී තැටි, බහුවිධ වීඩියෝ ක්‍රීඩා, සමාජ ජාල, අන්තර්ජාල භාවිතය තුළ සිදු කරන මාධ්‍ය 'නව මාධ්‍ය' ලෙසට සැලකිය හැකිය. (www.oneere.com)

නවමාධ්‍ය පැරණි මාධ්‍යයෙන් වෙනස් වන්නේ කුමන ආකාරවලින් දැයි විමසීමේදී දැකගත හැකි ලක්ෂණ කිහිපයකි.

- පැරණි මාධ්‍ය ස්ථාවර ස්වරූප ගනී. වෙනස් කිරීම පහසු නැත. නමුත් බ්ලොග්, වෙබ් අඩවි ක්ෂණිකව යාවත්කාලීන කිරීම කළ හැකිය.
- නවමාධ්‍ය බහු විධ ග්‍රාහකයන් සඳහා අන්තර් ක්‍රියාකාරී සංදේශ ආකෘති හඳුන්වා ඇත. එනම් ග්‍රාහකයාට පවතින මාධ්‍ය කතිකාවත් සඳහා ඍජුව සහභාගි වීමේ හැකියාව පවති. අදාළ ග්‍රාහකයා දක්වන ප්‍රතිචාරය මත නව කතිකාවක් නිර්මාණය වීමේ හැකියාව ඇත.
- අක්ෂර, වීඩියෝ පට, ඡායාරූප ආදී විවිධ ක්‍රම භාවිත කරමින් සංදේශ සැකසීමට නව මාධ්‍යයනට හැකියාව ඇති නමුත් පැරණි මාධ්‍ය සතුව පවතින මෙම හැකියාව සීමා වේ. (www.oneere.com/pdf/eve_newmedia.pdf)

1980 වකවානුවේ 'නවමාධ්‍ය' යන්න භාවිතා කරනු ලැබුවේ කේබල් සහ චන්ද්‍රිකා රූපවාහිනී වීඩියෝ වැනි ක්‍රම හැඳින්වීම සඳහාය. පසුව 'බ්ලොග්, සමාජ ජාල අඩවි, ජංගම දුරකථන පණිවිඩ හුවමාරුව සහ ඊට අදාළ නව තාක්ෂණික වැඩසටහන්' යන්න හඳුන්වා දීමට භාවිත කර තිබේ. (khalatil, 2008)

නවමාධ්‍ය පිළිබඳ විමසීමේ දී, මෙම සන්නිවේදන ක්‍රමවේදය දැනුම මත පදනම් වේ. සංඥා සහ අන්තර්ගතය ඩිජිටල්කරණයට ලක් වී ඇත. විවිධ "බහුමාධ්‍ය" ක්‍රමවේද යන්නෙන් අන්තර් ක්‍රියාකාරීත්වය මේ සඳහා බලපා ඇත. මේ තුළ ජංගම දුරකථනයේ සිට ඩිජිටල් රූපවාහිනිය, අන්තර්ජාලය ආදී වූ "බහු මාධ්‍ය" අයත් වේ. නවමාධ්‍ය බිහිවීම සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේද අවශ්‍ය වූ අතර අන්තර්පුද්ගල සන්නිවේදනය සහ ජනමාධ්‍ය සන්නිවේදන ක්‍රමවේද මේ මගින් ඒකාබද්ධ කර ඇත. වඩා ආකර්ෂණීය ක්‍රමවේද මගින් ග්‍රාහක මනසට අනුබල දීමේ හැකියාව ඇති යෙදවුම් මෙහිදී අවශ්‍ය වේ.(Cardoso, 2006)

ප්‍රායෝගික භාවිතයේ දී සියලු ජනමාධ්‍ය එක්තරා වකවානුවක දී 'නවමාධ්‍ය' වේ. තාක්ෂණික දියුණුව මත එම ජනමාධ්‍ය 'පැරණි මාධ්‍ය' බවට පත්වීම සිදුවේ. එමනිසා නවමාධ්‍ය සහ පැරණි මාධ්‍ය අතර වෙනස තාවකාලික වේ.

> නවමාධ්‍ය බිහිවීම, ව්‍යාප්ත වීමේ දී හුවමාරුව, වෙනස්වීම් වැනි ක්‍රියාවලි මාධ්‍ය සමාජයේ දැකගත හැකි වීම 'විප්ලවයක්' ලෙසට ද හැඳින්විය හැකිය. එය පැහැදිලිව හඳුනාගත හැකි හෝ පුළුල් වෙනසක් විප්ලවයක් ලෙසට අර්ථ දැක්විය හැකි ය. (Encarta World English Dictionary Bloomsbury ,1999)

නවමාධ්‍ය බිහිවීම පිළිබඳ සැලකීමේදී "1980 අගභාගයේ සහ 1990 මුල් වකවානුවේ දී සමාජ වෙනස්වීම් සහ පරිගණක නිර්මාණ අතර සමාන්තර සබඳතාවක් දැකගත හැකිවිය. මේ තත්ත්වයේ දී සීතල යුධමය වාතාවරණයන් දැකිය හැකි වූ අතර වෙබ් අඩවි ස්ථාපිත වීම සිදුවිය. සීතල යුද්ධය සහ වෙබ් අඩවි පිහිටවීම අතර සම්බන්ධතාවය පැහැදිලිව නොපෙනුණ ද සංකල්පීය වශයෙන් මේ අංශ දෙක අතර සබඳතාවක් ඇත." (New Media Branding -2010 April)

එසේම මුද්‍රිතව පැවති සන්නිවේදන ආකෘති සහ ඇනලොග් තාක්ෂණයෙන් පැවති සන්නිවේදන මාධ්‍ය, ඩිජිටල් පරිගණක පැමිණීමෙන් වෙනස් මුහුණුවරක් ගනු ලැබිණි. පරිගණක ක්‍රීඩා, අන්තර්ජාලය ආදිය තුළ 'පැරණි මාධ්‍ය' පිළිබඳ සහ 'නවමාධ්‍ය' පිළිබඳ කතිකාවක් ගොඩ නැගීය.

'තොරතුරු හුවමාරුව' මගින් සියලුම පෞද්ගලික, සංස්කෘතික, සමාජීය ක්‍රියාකාරීත්වයන් නව ආකෘතික මුහුණුවරක් ගනු ලැබීය. මෙය විටෙක රැඩිකල් ව්‍යුහයක් ගෙන ඇත. මෙම බලගැන්වීමේ යාන්ත්‍රණය මගින්, නව දෘෂ්ටි සමාජගත කරනු ලැබ ඇති 'දැනුම' කේන්ද්‍රීය සමාජයක් බිහිවීමේ අවශ්‍යතාව මතු කරන ලදී. (Ruckriem, Ang-stein, and Erdmann ,2011).

තොරතුරු තාක්ෂණයේ විප්ලවය සමඟ විවිධ අන්තර්ගත ඒකරාශි වීම සිදුවේ. තාක්ෂණික මෙවලම්, විවිධ ක්‍රියාකාරකම්, භාවිතය, සමාජීය පද්ධතින් ආදිය සම්බන්ධ කරමින් නව ආකෘති බිහිවන්නට විය. එක් රටක නිෂ්පාදිත භාණ්ඩ හා සේවා වෙනත් භූගෝලීය දේශ සීමාවක දී අලෙවි කිරීමේ අවශ්‍යතාව මතුවිය. (මේ නිසා ආර්ථිකයේ වෙනස්කම් ඇතිවිය) වෙළඳාම මත ආර්ථිකය පදනම් වීමෙන් වේගවත් ආර්ථික දියුණුවක් සඳහා පවතින කොන්දේසි, නීතිරීති, නියාමන නවීකරණය කිරීමට අවශ්‍ය විය. එහි දී ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි සමාජගත වී වෙළඳපොළ ආර්ථිකය දියුණු වුව ද විවිධ සමාජ ගැටලු උද්ගත විය. එසේම සමාජීය අභියෝග කිහිපයක් නිර්මාණය විය. ඒ අනුව,

- දැනුම් පරතරය
- 'පෞද්ගලිකත්ව' ගැටලු
- හුවමාරු වෙළඳපොළ තුළ වංචා

ආදිය පැවති සමාජයට අභියෝග එල්ල වූ කරුණු ලෙස දැකගත හැකිය.

මේ සියලු දෑ සමඟ භූගෝලීය සීමා තරණය කිරීමේ අවශ්‍යතාව මතුවීමේ ප්‍රතිඵලයක් ලෙස තොරතුරු තාක්ෂණය අත්හදා බැලීම් බහුලව සිදුවිය. 1970 වකවානුවේ දී පමණ සිට මෙය සිදුවුව ද 1990 කාල සීමාවේ දී තොරතුරු බහුලීකරණය සහ තාක්ෂණික වර්ධනයන් පුළුල් ව දැකගත හැකි ය. මෙහි දී,

- ඩිජිටල්කරණය
- ජාලගතවීම
- සහසම්බන්ධතා දැකගත හැකි ය.

ඩිජිටල්කරණය මගින්, පරිගණක භාවිත කරමින් ගබඩා කිරීම, පාලනය, සම්ප්‍රේෂණය සිදු වූ අතර, කතිකා, පෙළ, දත්ත, වීඩියෝ පට ආදිය පෙරට වඩා වේගවත් ව සහ අවම පිරිවැයකින් හුවමාරු විය. රැහැන් සහිතව හෝ රහිත වශයෙන් වේගවත් ඩිජිටල් ජාල පද්ධතියකින් යුතුව තොරතුරු බෙදාහැරීම සිදුවිය.

වෙන් වෙන්ව පැවති අංශය ඒකාබද්ධ වීම මෙහිදී සිදුවිය. විදුලි සංදේශ, පරිගණක, ඉලෙක්ට්‍රොනික විකාශය යන අංශ අතර මනා අන්තර් සම්බන්ධතාවයක් සිදුවිය. විනෝදාස්වාදන

ක්ෂේත්‍රය සහ විකාශන මාධ්‍ය ආයතන සම්බන්ධ විය. දෙපාර්ශවයන් අතර පැවති සන්නිවේදනය බහු පාර්ශව සන්නිවේදනයක් බවට පරිවර්තනය වූ අතර මින් සමාජීය දුරස්ථභාවය අවම වේ.

රූපසටහන්, අක්ෂර, පෙළ, ශබ්දය මගින් ගොඩනැගුණු සංදේශ ඩිජිටල්කරණය නිසා ද්විත්ව අංක සහිත සංදේශ බවට පත්විය. ඩිජිටල් සංකේත, අන්තර්ගත බහුවිධකරණය විය. ඩිජිටල් සම්ප්‍රේෂණයේ දී භූගෝලීය සීමා අතික්‍රමණය විය. සජීවී සංදේශ, විශේෂ ප්‍රයෝග භාවිත කරන ලද සංදේශ, සැනින් විසරණය වීම සිදුවිය.

තාක්ෂණික දියුණුව, තොරතුරු භාවිතය නිසා 'නවමාධ්‍ය' සමාජගත විය. මාධ්‍යයන් 'නව' බවට පරිවර්තනය වීමේදී මෙතෙක් පැවති මාධ්‍යයනට කුමක් සිදුවේදැයි ගැටලුවක් පැනනගී.

Neuman, W. Russell (1991) යෝජනා කරන්නේ 'නවමාධ්‍ය' සතුව පවතින තාක්ෂණික හැකියාව මගින් පවතින ආර්ථික සමාජීය බලය වෙනත් විරුද්ධ දිශාවකට හැරවීමේ හැකියාව පවතින බවයි. එසේම විශ්වීයව පවතින ජාල සම්බන්ධ කිරීම මගින් අන්තර්පුද්ගල සහ පොදු සන්නිවේදනය අතර පැවති දුරස්ථභාවය අවම කිරීමේ හැකියාව ඇති බවද දක්වයි.

සමාජ සම්බන්ධතාවන් හි වෙනස්කම්, තොරතුරු විසරණ ක්‍රියාවලියේ දී දැකගත හැකි වෙනස්කම්, සංස්කෘතික විපර්යාස ආදී සමස්ත ක්‍රමයේ ම වෙනස්කම් නවමාධ්‍ය බිහිවීම සමග දැකගත හැකිය.

- ඩිජිටල්කරණ ක්‍රියාවලිය නිසා, තොරතුරු විසරණය සඳහා වැයවන කාලය අවම වීම සහ සිදුවන සිදුවීම්, තෝරාගත් තොරතුරු හුවමාරුව සඳහා අවම කාලයක් ගත වේ.
- ඩිජිටල්කරණය තාක්ෂණික ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් වුව ද මෙය විශ්වීය ක්‍රියාවලියකි. සමාජය පිළිගැනීම සමග පෞද්ගලික සහ සමාජීය ක්‍රියාවලිය තුළ මූලික අවශ්‍යතාවයක් ලෙස දැකගත හැකි වූ ඩිජිටල්කරණය සමග මාධ්‍යය අන්තර්ගතයේ ගුණාත්මකභාවය වර්ධනය සිදුවිය.
- ඩිජිටල්කරණය ආපසු හැරවිය නොහැකි ක්‍රියාවලියකි. සංවර්ධන, සංවර්ධනය වෙමින් පවතින භේදයකින් තොරව රටවල් මේ වෙත ආකර්ෂණය වී ඇත.
- සන්නිවේදන ක්‍රියාවලිය, මානව සබඳතා, හැකියාව, විවිධ මානයන් වෙත විවෘත විය.

1995 අගභාගය වන විට විශ්ව ව්‍යාප්ත ජාල නැතහොත් World Wide Web හි ශීඝ්‍ර ව්‍යාප්තවීමක් දැකගත හැකි ය. ඒ වන විට මිලියන දහසයක පරිගණක සන්නිවේදකයන් සිටි අතර 2001 වසර වන විට මිලියන හාරසියය ඉක්මවා ඇත. 2005 දි බිලියන එකක් වූ අන්තර්ජාල භාවිතකරන පිරිස 2010 වනවිට බිලියන දෙක ඉක්මවා ඇත. (Castells, 2001 p.3)

විසි වන ශතවර්ශයේ අවසන් භාගයේ ක්ෂේත්‍ර තුනක අන්තර් සම්බන්ධතාව හඳුනාගත හැකිවිය.

1. ජාලමය සම්බන්ධතා මත රඳාපවතින නව සමාජ ආකෘතියක් හඳුනාගත හැකිවිය.
2. ගෝලීයකරණය හමුවේ ආර්ථික කළමණාකරණය නම්‍යශීලීවීම.
3. පුද්ගල නිදහස සහ විවෘත සන්නිවේදනය සමාජයේ ප්‍රමුඛ වී ඇත.

අන්තර්ජාලය යනු සන්නිවේදන මාධ්‍යයකි. පුද්ගලයන්ගෙන් පුද්ගලයන්ට එකම මොහොතක විශ්වීය අවකාශයක සන්නිවේදනය කළ හැකි පළමුවන අවස්ථාව අන්තර්ජාලය මගින් නිර්මාණය වී ඇත.(Castells, 2001. p2)

නවමාධ්‍ය සමාජගත වීම නිසා ග්‍රාහකයා ද ඒ වටා ඒකරාශී වීම දැකගත හැකි ය. එහි දී පෙර පැවති ජනමාධ්‍ය මගින් පමණක් ග්‍රාහක අවශ්‍යතා සඳහා සතුටුදායක සේවයක් ලබාදිය නොහැකි විය. තාක්ෂණික, සමාජීය, සංස්කෘතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම පැරණි මාධ්‍යයට ගැටලුවක් විය. තාක්ෂණික දියුණුව නිසා පැරණි මාධ්‍ය නැවත සැකසීම අවශ්‍ය විය. නව ආකෘතීන් භාවිතය, නව මාධ්‍ය පුළුල් වීමෙන් නව සංකල්පවල වැදගත්කම මතු විය.

ස්ටෝබර් දක්වන ආකාරයට (Stober, 2004) මාධ්‍ය පරිණාමය වීම අදියර තුනක් යටතේ සිදුවිය.

	පැරණි මාධ්‍යයන්ගේ සොයා ගැනීම සහ වර්ධනයන්	නවෝත්පාදන සහ නව මාධ්‍ය ව්‍යාප්ත වීම.
මුද්‍රණය	ලේඛනයේ දිගුවකි	මුද්‍රණ ක්‍රමවේද සංවර්ධනය වේ.
විද්‍යුත් ටෙලිග්‍රාෆ්	දේශපාලන සහ යුද කටයුතු සඳහා යොදාගත් ටෙලිග්‍රාෆ් ක්‍රමයේ වර්ධනයකි.	ප්‍රවෘත්ති ආයතනය තොග වෙළඳපොළ තොරතුරු
දුරකථනය	ටෙලිග්‍රාෆ් ක්‍රමයේ දියුණුවකි.	වෙළඳ, පෞද්ගලික අරමුණු සඳහා යොදාගත් මාධ්‍යයකි.
සිනමාව	ප්‍රාසාංගික මාධ්‍යයකි.	ප්‍රවෘත්ති, සිනමා රීලයන් භාවිත වේ.
රේඩියෝව	වයර් පදනම් වූ ටෙලිග්‍රාෆ් ක්‍රමය දියුණු වී ඇත.	විනෝදාස්වාදන, තොරතුරු වැඩසටහන් විකාශය
රූපවාහිනිය		සිනමාව සමග බද්ධ වී විකාශනය
පරිගණක බහුමාධ්‍ය	අංක විද්‍යාවේ දියුණුවකි	බහු අවශ්‍යතා සඳහා ක්‍රමවේද

(Stober, 2004,p.483-505)

1.2.1.1වගුව මාධ්‍ය පරිණාමය

මේ මගින් පැහැදිලි වන්නේ මුද්‍රණ, විද්‍යුත් ටෙලිග්‍රාෆ් දුරකථනය, සිනමාව, ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි මාධ්‍ය විවිධ තාක්ෂණික වපසරියක් හේතුවෙන් සමාජගත වූ අතර එම මාධ්‍ය වැඩිදුරටත් නවීන තාක්ෂණික සංවර්ධනයන්ට භාජනය වී ඇති බව ස්ටෝබර් ගේ අදහසයි.

සන්නිවේදන ක්‍රමවේදවල මූලික ස්වරූපය නවීකරණය වීම සිදුවිය. බහුමාධ්‍ය සන්නිවේදන ක්‍රමවේද සමාජගත විය. එසේම, ඉල්ලුම මත අන්තර්ගත සැපයුම, ජංගමශීලී මාධ්‍ය, අන්තර් පුද්ගල සම්බන්ධතාවෙන් තොරව සංදේශ ග්‍රාහකගත වීම සිදුවිය.

- මාධ්‍යය සහ අන්තර්ගතය පිළිබඳ පැවතුණු නාමයන් වෙනස් වීමකට ලක්විය.
- පෞද්ගලික/ඍජු ලෙස මුහුණට මුහුණ පැවති අන්තර් පුද්ගල සබඳතා, පොදු/ඍජු මුහුණට මුහුණ සංවාද බවට පරිවර්තනය විය.
- නිදහස්/ඍජු කථිකා, මැතිවරණ, වෙළඳ කථිකා වැනි දෑ සඳහා අතරමැදි පාර්ශව ලෙස විවිධ මාධ්‍ය සම්බන්ධ වීම සිදුවිය. (ලිපි, ෆැක්ස්, විද්‍යුත් තැපැල් වැනි)
- මාධ්‍ය සම්බන්ධ කරගනිමින් සිදු වූ පෞද්ගලික සන්නිවේදන විධික්‍රම නිදහස් සමාජ කතිකා බවට පරිවර්තනය විය. (මහජන රැස්වීම් වැනි)

නවමාධ්‍ය පැමිණීම සමග ජනමාධ්‍ය පරිසරය තුළ සිදු වූ වෙනස්කම් මේ තුළින් පැහැදිලි වේ. (Heller,2006,p.311-329) මේ මගින් පෞද්ගලික සන්නිවේදන මාධ්‍ය ක්‍රමවේදය පරිවර්තනයකට භාජනය වෙමින් ජනමාධ්‍ය පරිසරයක සන්නිවේදනය සිදුකිරීම බවට පත් වී තිබේ. අන්තර්ගත නවීකරණයකට ලක්ව ඇත. ග්‍රාහක අවශ්‍යතා වෙනස් වී ඇති අතර මූලික සන්නිවේදන ක්‍රියාවලිය වෙනසකට ලක් වී ඇත. එසේම අන්තර්ගතයේ පවතින ගුණාත්මකභාවය යාවත්කාලීන වීම සහ එය ග්‍රාහකයා මත තීරණය වීම සිදුවේ. මෙතෙක් සන්නිවේදකයන් පමණක් නිපදවා ග්‍රාහක ගත කරන ලද සංදේශ සැකසීමේ ක්‍රියාවලිය වෙනසකට ලක් වී ඇති අතර එහිදී නවමාධ්‍ය යටතේ ග්‍රාහකයින් ද වඩා සාර්ථක අන්තර්ගත සහිත පණිවිඩ සමාජගත කිරීමක් දැකගත හැකිය. සන්නිවේදන ක්‍රියාවලිය ද නවමාධ්‍ය සමග පරිවර්තනයකට බඳුන් වී ඇත.

ග්‍රාහක මනසට අවශ්‍ය පරිදි අන්තර්ගත තෝරාගැනීමට අවකාශ ඇත. එසේම පැරණි මාධ්‍යවල දී මෙන් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥතාවය දක්වන පිරිස් පමණක් අන්තර්ගත නිර්මාණය කිරීම සිදු නොවේ. එහෙත්, සමාජ ජාල වැනි අන්තර්ජාල මාධ්‍ය ක්‍රමවේද විමසීමෙන් මේ බව පැහැදිලි වේ.

සන්නිවේදන ක්‍රියාවලිය විමසන විට ද පැරණි මාධ්‍ය සහ නවමාධ්‍ය අතර වෙනස්කම් දැකගත හැකි ය.

මැක්වෙල් (Mcqail) දක්වන ලෙසට පැරණි මාධ්‍ය සහ නවමාධ්‍ය අතර වෙනස සංසන්දනය කළ හැකි ය. නවමාධ්‍ය සමග සන්නිවේදන ක්‍රියාවලිය පුළුල් වී ඇත. විශ්වීය ග්‍රාහක පිරිසකට පණිවිඩ සම්ප්‍රේෂණය ක්ෂණික ප්‍රතිචාර, සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර පහසු සන්නිවේදන ක්‍රියාවලියක් සමග බහුවිධ ප්‍රමිතීන්ගෙන් යුත් අන්තර්ගත සහිත පණිවිඩ ග්‍රාහක ගත වීමක් දැකගත හැකි ය.

පැරණි මාධ්‍යයනට සාපේක්ෂව නවමාධ්‍ය සන්නිවේදන ක්‍රියාවලිය සංකීර්ණ ය. නමුත් ක්ෂණිකව වඩා වැඩි ග්‍රාහක පිරිසකට තොරතුරු විසරණ හැකියාව ඇත. මෙය පැරණි මාධ්‍යයට සාපේක්ෂව වෙනස් වී ඇත.විවිධාකාරයෙන් නවමාධ්‍ය ස්වරූප දැකගත හැකි නිසා අන්තර්ගතයේ ආකෘතිය, ව්‍යුහය

එකිනෙකට වෙනස් වේ. මේ තත්ත්වය පැරණි මාධ්‍යය වලට වඩා වෙනස් ආකාර ගනී. එසේ ම ග්‍රාහක ස්වරූපය අනුව විමසීමෙන්ද පැරණි මාධ්‍යට වඩා නවමාධ්‍ය ග්‍රාහකත්වය වෙනසකට බඳුන් වී ඇති බව පැහැදිලි ය.

තොරතුරු හුවමාරුව මගින් සියලුම පෞද්ගලික සංස්කෘතික, සමාජීය ක්‍රියාකාරීත්වය නව ආකෘතික මුහුණුවරක් ගනු ලැබීය. (Rkuckreim and others , 2011) එසේම සන්නිවේදන ක්‍රමවේදවල මූලික ස්වරූප නවීකරණය වූ අතර බහුමාධ්‍ය සන්නිවේදන ක්‍රමවේදයක් සමාජගතවීම ඉල්ලුම මත අන්තර්ගත සැපයුම්, ජංගමශීලි මාධ්‍ය, අන්තර්පුද්ගල සම්බන්ධතාවෙන් තොරව සංදේශ ග්‍රාහක ගත වීම දැකගත හැකිය.

මූලාශ්‍ර

Cardoso,Gustavo.(2006).The Media in the Network Society, Browsing ,News, Filters and Citizenship. Lisbon Centre for Research and Studies in Sociology. Retrieved From

Castells, Manuel.(Eds.).(2004).The Network Society: A Cross Cultural Perspectives, Edward Elgar:UK

Castells, Manuel.(2001).The Internet Galaxy: Reflections on the Internet ,Business, and Society. New York: Oxford University Press

Castells, Manuel.(2009). Communication Power. New York: Oxford University Press.

Hiller,Jannie.,& S.Cohen.Ronnie.(2006).Internet Content Regulation: What Method. ,August 2006,vol.61, pp 830-846.Retrieved From

Neuman,W.Russel.(1991).The Future of the Mass Audience, Cambridge: Cambridge University Press. Retrieved from

Ruckreim,George.Ang-stein & Claudia.Erdmann,Werner(2011)Understanding media revolution. How digitalization is to be considered Retrieved from

Stober,Rudolf. (2004)What Media Evolution is: A theoretical approach to the society of New Media:Europeon Journal of Communication, ,483-505.

30

රූපවාහිනී මාධ්‍යයේ තාක්ෂණික සහ සංස්කෘතික ගෝලීය පරිණාමය

මනෝජ් පුෂ්පකුමාර ජිනදාස

ශතවර්ෂ ගණනාවක් තිස්සේ රටවල් ගණනාවක විසූ විවිධ ක්ෂේත්‍රවල ඉංජිනේරුවරුන් හා ගවේෂකයන් විසින් කරන ලද නොයෙකුත් අත්හදා බැලීම් රූපවාහිනි ඉතිහාසය ගොඩනැගීමට පසුබිම් විය. රූපවාහිනියේ මූලික සිද්ධාන්ත හඳුනාගැනිමෙහි ලා විද්‍යුත් යාන්ත්‍රික ක්‍රම (Electro-mechanica methods) ඔස්සේ සිදුකරන ලද ස්කෑන් කිරීම, සම්ප්‍රේෂණ කිරීම සහ ප්‍රතිබිම්බයක් සකස් කිරීම යනාදිය හේතු විය. විද්‍යුත් ඉලෙක්‍රොනික කැමරාව සහ ක්‍රියාත්මක කිරීමේ නල යනාදිය වඩා හොඳින් ක්‍රියාත්මක වීම විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනී වැඩසටහන් විකාශනය සාර්ථක විය.

යාන්ත්‍රික රූපවාහිනිය ආරම්භ වීම ඒ පිළිබඳ සිදු කරන ලද සොයා ගැනීම් කිහිපයක ප්‍රතිඵලයකි.

1. 1873 විලෝග්බි ස්මිත් විසින් සෙලනියම් මූලද්‍රව්‍ය භාවිතයෙන් ෆොටෝකන්ඩක්ටිවිටි උපකරණය සොයාගැනීම.(Photo Conductivity).
2. 1884 දී පෝල් නිප්කොව් විසින් සැකෑන් තැටිය සොයා ගැනීම (Scanning disk).
3. 1926 දී ජෝන් ලොගී බෙයාර්ඩ් විසින් දුරට දර්ශනය කරන ලද චලන ප්‍රතිබිම්බ ඉදිරිපත් කිරීම.

1884 දී අවුරුදු 23 ක වයසැති ජර්මන් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීයකු වන පෝල් නිප්කොව් විසින් ප්‍රථමවරට විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනී ක්‍රමය යෝජනා කර, එහි පේටන්ට් බලපත්‍රය ද ලබා ගත්තේ ය. නිප්කොව් විසින් රූපවාහිනි යාන්ත්‍ර ආකෘතියක් නිර්මාණය නොකළ නමුත්, 1939 තෙක් ඔහු විසින් ඉදිරිපත් කරන ලද Spinning තැටිය හා සම්බන්ධ “ Image rasterizer ” නිසා රූපවාහිනිය වඩා ජනප්‍රිය මාතෘකාවක් බවට පත් විය.

1900 අගෝස්තු මස 25 දින ප්‍රංශයේ පැවැති ජාත්‍යන්තර ලෝක වෙළඳපලක පැවති ජාත්‍යන්තර විද්‍යුත් කොංග්‍රසයේදී ප්‍රථමවරට කොන්ස්ටන්ටීන් පර්ස්කි විසින් "television" යන වචනය ලොවට හඳුන්වාදී ඇත. මෙහිදී පර්ස්කි විසින් නිප්කොව් ඇතුලු අනෙක් ගවේෂකයන්ගේ අත්දැකීම් දක්වමින් එවකට පැවති විද්‍යුත් යාන්ත්‍රික තාක්ෂණික මෙවලම් පිළිබඳ විමසුමක් සිය අධ්‍යයන පත්‍රිකාවේ සඳහන් කර ඇත.

1907 වන විට ලී ඩිෆොරස්ට් හා ආතර් කෝන් යන තවත් අය විසින් ප්‍රායෝගිකව සැලසුම් කරන ලද විස්තාරන නල තාක්ෂණය ක්‍රියාත්මක විය. 1909 දී ප්‍රංශයේ දී ජෝර්ජ්ස් රිග්නොක්ස් සහ ඒ.ෆෝනියර් යන අය විසින් කැරකෙන දර්පණ තලයක් ස්කෑනරය වශයෙන් ද, ග්‍රාහකය (රිසීවරය) වශයෙන් සෙලනියම් කුටීර 64 කින් සමන්විත ගැබක් ද භාවිත කරමින් නිසල ප්‍රතිබිම්බ වල අඳුරු සේයාවක් අඛණ්ඩව සම්ප්‍රේෂණය කරමින් එය ඉදිරිපත් කිරීමට හැකියාව සලසා ගත්තේය.

1901 දී බොරිස් රොසීන්ග් හා ඔහුගේ ශිෂ්‍ය ව්ලැඩිමීර් ස්වොරිකින් විසින් ප්‍රතිබිම්බ සම්ප්‍රේෂණය කිරීම සඳහා යාන්ත්‍රික දර්පන තල ස්කෑනරයක් භාවිතයෙන් ක්‍රියාත්මක කරන රූපවාහිනි ක්‍රමයක් නිර්මාණය කළේය. මෙම අත්දැකීම් ස්වෝරිකින්ගේම වචන වලින් ම දක්වන්නේ නම් "ග්‍රාහකයේ බ්‍රෝන් නලය (කැතෝඩ කිරණ නලය/CRT) තුළට වයර් ඔස්සේ පැමිණියේ ඉතාමත් නරක ප්‍රතිබිම්බ මාලාවකි." වශයෙනි. ඒ තුළ චල ප්‍රතිබිම්බ ලබාගැනීමට නොහැකි වූයේ ස්කෑනරය තුළ තිබූ සංවේදීතාව ප්‍රමාණවත් නොවීම මෙන්ම එහි තිබූ සෙලනියම් කුටීරය වඩා හොඳින් නොතිබීම නිසයි.

ප්‍රථම රූපවාහිනි මහජන දර්ශනය ස්කොට් ජාතික ජෝන් ලොගී බෙයාර්ඩ් විසින් ඉදිරිපත් කරන ලද්දේ 1925 මාර්තු 25 වැනි දිනය. ලන්ඩනයේ සෙල්ෆිරිච් දෙපාර්තමේන්තු ගබඩාව අසල චලනය වන ප්‍රතිබිම්බ වල අඳුරු සේයාරුවක් දුර දර්ශනය කිරීමට සලස්වීම මෙහිදී සිදුවිය. ඒ අතර 1925 මැයි මස බෙල් දුරකථන රසායනාගාරවල සිට විනිවිද යා හැකි අන්දමේ නිසල ප්‍රතිබිම් වල අර්ධතාන හැඩයේ රූප සම්ප්‍රේෂණය කිරීමට හැකි විය. 1925 ජුනි මස 13 වැනි දින චාල්ස් ෆ්‍රැන්සිස් ජෙන්කින්ස් විසින් සුළඟින් ක්‍රියාකරණ සෙල්ලම් ක්‍රීඩා කිරීමට ඇති මෝලක, චල ප්‍රතිම්බයක් අඳුරු සේයාරුවක් මෙන් දැකිය හැකි වන පරිදි සම්ප්‍රේෂණය කර තිබේ. එය මේරිලන්ඩ්හි නාවික රේඩියෝ මධ්‍යස්ථානයේ සිට සැතපුම් පහක් පමණ ඈතින් වොෂින්ටන්හි පිහිටි සිය රසායනාගාරය වෙත තරංග වල 48ක තීව්‍රභාවය (48 Line resolution)සහිත කැමරා කාච තැටි ස්කෑනරයක් භාවිත කරමින් එය සම්ප්‍රේෂණය කර තිබේ.

රූපවාහිනිය යනුවෙන් හඳුන්වන්නේ අඛණ්ඩ වශයෙන් තානමය විවිධත්වය සහිතව චලනය වන ප්‍රතිබිම්බ සම්ප්‍රේෂණය කිරීමට නම්, එය 1925 ඔක්තෝබර් 02 දින වන විට ප්‍රථම වරට බෙයාර්ඩ් විසින් පෞද්ගලිකව සොයාගෙන තිබේ. නමුත් අවංකව මෙය පැහැදිලි කරන්නේ නම් ඔක්තෝම්බර් 02 වන දින වන විට බෙයාර්ඩ් විසින් චල ප්‍රතිබිම්බ සම්ප්‍රේෂණය කරමින් ඉහත ආකාරයේ අඳුරු සේයා රුවක් ලබා ගැනීමට නොහැකි විය. බෙයාර්ඩ්ගේ ස්කෑනරයට හැකි වූයේ තත්පරයකට ප්‍රතිබිම්බ පහක් පමණක් ක්‍රියාත්මක කිරීමට පමණි. එය චලන ප්‍රතිබිම්බයක් ලබාගැනීමට අවශ්‍ය ශක්‍යතාවට වඩා පහළ මට්ටමක පැවතිණි. එනම් තත්පරයකට ප්‍රතිබිම්බ දොළහක්වත් අඩුම තරමේ ක්‍රියාත්මක කිරීමට හැකිවිය යුතුයි. 1926 ජනවාරි මස වන විට බෙයාර්ඩ් විසින් තත්පරයට ප්‍රතිබිම්බ 12.5 ක් ක්‍රියාත්මක කිරීමට හැකිවන අයුරින් ස්කෑන් යන්ත්‍රය වැඩි දියුණු කළේ ය.

ජෝන් ලොගී බෙයාර්ඩ් විසින් සාර්ථක ආකාරයේ රූපවාහිනි ක්‍රමය ප්‍රථමවරට ඉදිරිපත් කළේ 1926 ජනවාරි 26 වැනි දින ලන්ඩන් නුවර සිය රසායනාගරයේදී ය. එය රාජකීය ආයතනයේ සාමාජිකයන්ට මෙන්ම පුවත්පත් වාර්තාකරුවන්ට ද දැක බලා ගැනීමට හැකි වන අන්දමින් මහජන ප්‍රදර්ශනයක් පවත්වා ඉදිරිපත් කර තිබේ.

තරංග වල සිය ගණනක පමණ තීව්‍රභාවය (line of resolution) තිබූ පසුකාලීනව පැවති විද්‍යුත් ක්‍රමයක් මෙන් නොව, බෙයාර්ඩ් විසින් ද්විත්ව සර්පිලාකාර කාච (තරංග වල තීව්‍රභාවය 30 වන) ස්කෑන් තැටිය භාවිත කරමින් නිපදවූ සිරස් ස්කෑන් ප්‍රතිබිම්බය පිළිගත හැකි ආකාරයෙන් මිනිස් මුහුණ නිරූපණය කිරීමට ප්‍රමාණවත් විය.

1927 දී බෙයාර්ඩ් විසින් ලන්ඩන් හා ග්ලාස්ගෝ අතර දුරකථන මාර්ග යොදා ගෙන 705 kmක දුරකට රූපවාහිනි සංඥා සම්ප්‍රේෂණය කර ඇත. 1928 දී බෙයාර්ඩ් රූපවාහිනී සංවර්ධන සමාගම (සිනමා රූපවාහිනි ආයතනය) මගින් ලන්ඩන් හා නිව්යෝර්ක් අතර අත්ලාන්තික් සාගරය ඔස්සේ සිදු කරන ලද ප්‍රථම රූපවාහිනී සංඥා සම්ප්‍රේෂණය සිදු කළේය. එය මුහුද වෙරළක සිට නැවකට කරන ලද ප්‍රථම සම්ප්‍රේෂණය ද වේ. බෙයාර්ඩ් විසින් විද්‍යුත් යාන්ත්‍රික ඉන්ෆ්‍රාරේඩ් වර්ණ රූපවාහිනිය (මෙය Noctovision නමින් හඳුන්වා තිබේ.) සහ ස්ටීරියෝස්කොපික් රූපවාහිනිය එකල ඉදිරිපත් කළේය. මේ සඳහා ඔහු අතිරේක කාච, තැටි සහ පෙරහනු භාවිත කර ඇත. එමෙන්ම බෙයාර්ඩ් විසින් වීඩියෝ තැටි පටිගත කිරීමේ ක්‍රමය ද (එය Phonovision නමින් හඳුන්වා තිබේ.) දියුණු කළේය. 1927 සිට ක්‍රියාත්මක කළ Phonovision පටිගත කිරීම් ගණනාවක්ම අද පවා දක්නට ලැබේ. 1929 දී බෙයාර්ඩ් විසින් ජර්මනියේ විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනි සේවාව පිළිබඳ සිදුකළ ප්‍රථම අත්හදා බැලීමට සම්බන්ධ විය. 1929 නොවැම්බර් මස බෙයාර්ඩ් සහ පාත්හි බර්නාඩ් නටන් යන දෙදෙනා එක්ව ප්‍රංශයේ ප්‍රථම රූපවාහිනී සමාගම වන Television - Baird - Natan ස්ථාපිත කළේ ය. 1931 දී බෙයාර්ඩ් ප්‍රථමවරට එළිමහනේ සිට රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කළේය. 1932 දී බෙයාර්ඩ් විසින් අල්ට්‍රා කෙටි තරංග රූපවාහිනිය ක්‍රියාත්මක කළේ ය. යාන්ත්‍රික ක්‍රමය භාවිතයෙන් දුරට දර්ශනය කරන ලද රූප ඍජුවම ස්කෑන් නොවුනත් 1936 දී BBC රූපවාහිනී විකාශනයේදී බෙයාර්ඩ් ගේ විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනි ක්‍රමය තරංග 40ක (Lines of resolution 240) උපරිම තීව්‍රභාවයකින් යුතුව ක්‍රියාත්මක කළේය. 17.5 mm චිත්‍රපට රූපගත කලත්, මෙය එකල වේගයෙන් දියුණු විය.

1936 නොවැම්බර් මස 02 දින ලොව ප්‍රථම මහජන රූපවාහිනි සේවාව, උතුරු ලන්ඩනයේ වික්ටෝරියානු ඇලෙක්සැන්ඩ්‍රා මාලිගයේ සිට සම්ප්‍රේෂණය කළේය. එය සිදු කළේ එම වර්ෂයේ අගෝස්තු මස සිට ඔලිම්පියා හි පිහිටි බෙයාර්ඩ් - මාර්කෝනි රේඩියෝ ප්‍රදර්ශනයේ විකල්ප වශයෙන් ක්‍රියාත්මක කළ දිනපතා අත්හදා බැලීමේ විකාශන පාදක කරගෙනය. අද අප දකින රූපවාහිනී විකාශනයේ ගේ ආරම්භය සිදු වූ ස්ථානය ලෙස මෙම අවස්ථාව සලකනු ලැබේ. මේ සමගම මාර්කෝනි විසින් සකස් කළ Marconi - EMI හා line 405 ක් ක්‍රියාත්මක වන සම්පූර්ණ විද්‍යුත් රූපවාහිනිය ඉදිරියේ මාස තුනක් යන විට අන්තර් මාධ්‍ය චිත්‍රපට ක්‍රමය (Intermediate Film System) තවදුරටත් ක්‍රියාත්මක නොවී ය.

1927 අප්‍රේල් 07 වැනි දින බෙල් දුරකථන රසායනාගාරයේ වැඩ කළ හර්බට් ඊ. අව්ස් සහ ෆ්‍රෑන්ක් ග්‍රේ යන අය විසින් යාන්ත්‍රික රූපවාහිනිය පිළිබඳ අපූර්ව ඉදිරිපත් කිරීමක් කළේ ය. මෙම

ප්‍රත්‍යාවර්තිත - ආලෝක රූපවාහිනි ක්‍රමය තුළ කුඩා හා විශාල යන දර්ශන රූප රාමු දෙකම ඇතුළත් විය. මෙම කුඩා ග්‍රාහකයා තුළ අඟල් 2.5 ක උසකින් හා අඟල් 2 ක පළලකින් එහි රූප රාමුව සකස් විය. පුළුල් රිසිවරයේ රූප රාමුව අඟල් 30 ක උසකින් හා අඟල් 24 ක පළලකින් සකස් විය. මෙම රූපරාමු ග්‍රාහක (receiver) උපකරණ දෙකටම නියමිත ආකාරයෙන්, ඒකවර්ණ චල ප්‍රතිබිම්බ මැවීමට හැකි විය. එමෙන්ම එහි පින්තූර සමඟ එකවිට ශබ්දය ද ලබා ගැනීමට හැකි විය. මාර්ග දෙකක් ඔස්සේ මෙම රූප සංඥා සම්ප්‍රේෂණය කළේ ය.

1. නිව්යෝර්ක් නගරයේ සිට වොෂින්ටන් දක්වා වයරයක් භාවිත කර හඬ ක්‍රියාත්මක කළේය.

2. නිව්ජර්සි හි ටිපනි සිට රේඩියෝ සම්බන්ධතාව ඔස්සේ ක්‍රියාත්මක කිරීම.

මෙම සම්ප්‍රේෂණ ක්‍රම දෙකම සැසඳීමේදී ප්‍රේක්ෂකයන්ට එහි ගුණාත්මකතාව පිළිබඳ වෙනසක් නොදැනුනි. මෙම විකාශනය තුළ සිටි පුද්ගලයන් වූයේ වාණිජ ලේකම් වන හර්බට් හූවර්ය. මෙම පුද්ගලයන් වෙත කැරකෙන ඉලක්ක ස්කෑනරයෙන් නිපදවෙන දිළිසෙන ආලෝක කදම්බය නිපද වූ ස්කෑනරය තුළ කාච සිදුරු 50 ක් එම කුටියේ තිබුණේය. එම කුටිය මගින් තත්පරයට රූප රාමු 18 බැගින් ක්‍රියාත්මක විය. එහිදී එක රූපරාමුවක් තත්පරයෙන් 16 න් පංගු 56 බැගින් හසු කරගත්තේය (අද ක්‍රියාත්මක වන්නේ තත්පරයට රූප රාමු 30 හෝ 60 වන ප්‍රමාණයකි.) පිළිවෙළින් තත්පරයෙන් 16 න් පංගු 33.3 හෝ 16.7 බැගින් එක් රූප රාමුවක් හසු කරගැනීමේදී ක්‍රියාත්මක වෙයි. රූපවාහිනී ඉතිහාසඥයෙකු වන ඇල්බර්ට් ඇබරැම්සන් විසින් බෙල් රසායනාගාරයේ ඉදිරිපත් කිරීම පිළිබඳ එහි තිබෙන වැදගත්කම දක්වයි.

"මෙතෙක් නිපදවූ යාන්ත්‍රික රූපවාහිනී ක්‍රම අතුරෙන් ඉතාමත් හොඳම ඉදිරිපත් කිරීම මෙයයි. මෙහි පින්තූරවල ප්‍රමිතිය හා සැසඳීමට මෙයට බොහෝ කාලයකට පෙර මෙවැනි සොයාගැනීමක් යොදා ගැනීම අත්‍යවශ්‍ය යි."

මේ අතර රුසියාවේ විසු ලියොන් කෙරමින් විසින් දර්පණ තලය මූලික කරගත් රූපවාහිනියක් වැඩි දියුණු කරමින් සිටියේය. එය 1925 වන විට තරංග 16ක තීවුතාවය (lines of resolution 16) ක් ද, 1926 වන විට එය අන්තර්කාච ක්‍රියාත්මක කිරීමේදී තරංග 32ක තීවතභාවයක්එය හා පසුව 64 බැගින් විය. මෙම අධ්‍යයනයේදී ප්‍රතිඵලයක් ලෙස 1926 මැයි 07 වැනි දින, විද්‍යුතය භාවිතයෙන් අඩි පහක හතරැස් රූපරාමුවක් මතට එකවිට ක්‍රියාත්මක වන චල ප්‍රතිබිම්බ සම්ප්‍රේෂණය කොට නිරූපණය කළේ ය. 1927 වන විට තරංග 100 ක තීව්‍රතාවය ප්‍රතිබිම්බයක් ඉදිරිපත් කිරීමට ඔහු සමත් විය. මේ අතර තීව්‍රතාවය 120 ක ප්‍රතිබිම්බයක් ඉදිරිපත් කිරීමට හැකි වූයේ 1931 තරම් පසුකාලයක ය.

මේ අතර ජපානයේ හවමත්සු කාර්මික උසස් පාසලේ දී නිප්කෝව්ගේ තැටි ස්කෑනරය හා CRT නල ක්‍රියාකරණය භාවිතයෙන් තරංග තීව්‍රතාව40 ක රූපවාහිනී ක්‍රමයක් 1926 දෙසැම්බර් 25 වන දින කන්ජිරෝ කයනාගී විසින් ඉදිරිපත් කළේ ය. ඔහුගේ පර්යේෂණය දෙවන ලෝක යුධ සමයෙන් පසුව ඇමරිකාව විසින් ජපානය ආක්‍රමණය කිරීමත් සමඟ රූපවාහිනි නිෂ්පාදන ආකෘතියක් සැකසීම සඳහා ඔහු ගත් උත්සාහය ව්‍යර්ථ විය.

ක්‍රමයෙන් යාන්ත්‍රික රූපවාහිනිය, සාමාන්‍ය ජනප්‍රිය රූපවාහිනි ක්‍රම ඉදිරියේ අභාවයට ගියත් දිගු ඉන්ෆ්‍රාරෙඩ් තරංග භාවිත කරන කැමරා තුළ එය තවදුරටත් යොදා ගනී.

ඉලෙක්ට්‍රොනික රූපවාහිනිය

1908 දී බ්‍රිතාන්‍යයේ රාජකීය සංගමයේ ශාස්ත්‍රධරයකු වන ඇලන් ආච්බෝල්ඩ් කැම්ප්බෙල් - ස්විින්ටන් විසින් "නේචර්" නම් වන විද්‍යා ශාස්ත්‍රීය සංග්‍රහයේ ලිපියක් පළ කරමින්, සංඥා සම්ප්‍රේෂණය හා නැවත ලබාගැනීම යන කාර්ය දෙකම ක්‍රියාත්මක කළ හැකි උපකරණයක් ලෙස කාල් බ්‍රොන් විසින් සොයා ගන්නා ලද බ්‍රෝන් නාලය නැතිනම් කැතෝඩ කිරණ නලය භාවිතයෙන් "දුරස්ථ විද්‍යුත් දර්ශනයක් ලබාගන්නේ කෙසේද" යන්න විස්තර කළේය.

මේ අවස්ථා ඉතාම මෑතක් වන තුරු රූපවාහිනී තාක්ෂණය තුළ ව්‍යවහාර කළ "විද්‍යුත් රූපවාහිනිය" යන්න ප්‍රථම වරට ව්‍යවහාර කළ අවස්ථාව ලෙස සැලකේ. මේ පිළිබඳ ඔහුගේ තිබෙන අදහස් හා දැක්ම 1911 ලන්ඩන් නුවර පැවති දේශනයකදී වැඩිදුරටත් ඉදිරිපත් කළේය. එය The Times පත්‍රය හා Rontger සංගමයේ ශාස්ත්‍රීය සංග්‍රහයේ පළ විය. 1926 ඔක්තෝම්බර් මස පළ වූ "නේචර්" සඟරාව ට ලිපියක් එවමින් කැම්ප්බෙල් - ස්විින්ටන් දැක්වූයේ තමා, ජී.එම්. මිචින් හා ජේ.සී.එම්. ස්ටැන්ටන් සමඟ විද්‍යුත් රූපවාහිනිය පිළිබඳ කරන ලද අත්හදා බැලීම් වඩා සාර්ථක අත්හදා බැලීමක් නොවන බවයි. ඔවුන් සෙලනියම් අලේපනය මතට ප්‍රතිබිම්බයක් පතිත කිරීම තුළින් විද්‍යුත් සංඥාවක් උත්පාදනය කිරීමට උත්සාහ ගත්තේය. ඒත් සමඟ ඔවුන් එය කැතෝඩ කිරණ නාලයක් භාවිතායෙන් ස්කෑන් කළේය.

මෙම අත්හදා බැලීම් 1914 මාර්තු මස මික්චින් මියයාමට පෙර පැවැත්විය. නමුත් ඔවුන් ඉන් පසුව 1973 වන විට EMI හි එච්.මිලර් හා ජේ.ඩබ්. ස්ට්‍රේන්ජ් හා RCA හි එච්. අයම්ස් හා ඒ.රෝස් වශයෙන් එකිනෙකට වෙනස් කණ්ඩායම් දෙකක් බවට පත්වෙමින් නැවත එම අත්හදා බැලීම් කළේ ය. කැම්ප්බෙල් - ස්විින්ටන් භාවිත කළ ඔවුන් විසින් නිපද වූ සෙලනියම් ආලේපනය කළ තැටිය යොදා ගෙන එම කණ්ඩායම් දෙකම කළ අත්හදා බැලීම් සාර්ථක වූයේ "ඉතාමත් අවපැහැවුණු ප්‍රතිබිම්බ" ලබාගැනීමෙනි. ග්‍රාහකය ලෙස කැතෝඩ කිරණ නාලය යොදා ගෙන අනෙක් අය විසින් පර්යේෂණ ගණනාවක් සිදු කළත්, සම්ප්‍රේෂකය වශයෙන් කැතෝඩ කිරණ නාලය යොදාගෙන අත්හදා බැලිම් කිරීම නව අත්දැකීමක් විය. 1920 දශකය අග භාගය වන විටත් විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනිය තව දුරටත් හදුන්වා දෙමින් පවතින අතර කාලයක, හන්ගේරියාවේ කල්මන් තිහානී, ඇමරිකා එක්සත් ජනපදයේ පිලෝ ෆාන්ස්වර්ත් හා ව්ලැඩිමීර් ස්වෝරිකින් යන අය විසින් පූර්ණ ඉලෙක්ට්‍රොනික සම්ප්‍රේෂණ නල පිළිබඳව එකිනෙකා විවිධ අත්හදා බැලීම් සිදු කලහ.

1927 සැප්තැම්බර් මස 07 වැනි දින සැන් ෆ්‍රැන්සිස්කෝ හි, ග්‍රීන් වීදියේ අංක 202 හි පිහිටි සිය රසායනාගාරයේ සිට ෆාන්ස්වර්ත් විසින් ඔහුගේ නවතම උපකරණය වන Image Dissector කැමරාව උපයෝගි කර ගෙන තනි රේඛාවක් සම්ප්‍රේෂණය කළේය. 1928 සැප්තැම්බර් මස 03 වැනි දින ෆාන්ස්වර්ත් විසින් ඒ ආශ්‍රයෙන් පුවත්පත් සඳහා ඉදිරිපත් කිරීමක් කළේය. 1929 දී එම ක්‍රමය වැඩි දුරටත් දියුණු කළේ යාන්ත්‍රික බල උත්පාදකයක් ඉන් ඉවත් කිරීමෙනි. එමගින් සිය රූපවාහිනි ක්‍රමය තුළ යාන්ත්‍රික කොටස් දක්නට නොලැබේ. එම වර්ෂයේදී ෆාන්ස්වර්ත් විසින් ප්‍රථම වතාවට සජීවි රූපයක ප්‍රතිබිම්බයක්

පතිත කිරීමට හැකි විය. ඒ සඳහා සිය භාර්යාව වන එල්මා (Elma) යොදා ගෙන තිබිණි. ඇයගේ අගල් තුනහමාරක ප්‍රතිබිම්බයක් එහි සටහන් වූයේ ඇයගේ ඇස් වසා සිටිමිනි. ඇස් වැසී ඇත්තේ දීප්තිමත් ආලෝකය අවශ්‍ය වූ නිසා විය හැක.

මේ අතර ව්ලැඩිමීර් ස්වෝරිකින් ද කැතෝඩ කිරණ නාලය යොදා ගනිමින් ප්‍රතිබිම්බ නිර්මාණය කොට ඉදිරිපත් කිරීමට නොයෙකුත් අත්හදා බැලීම් සිදුකර තිබේ. ස්වොරිකින් 1923 දී වෙස්ටින්හවුස් විද්‍යුත් සංස්ථාවේ වැඩ කරන කාලයේ දී විද්‍යුත් කැමරා නාලයක් වැඩිදියුණු කිරීමට කටයුතු කළේය. නමුත් 1925 දි කළ ඉදිරිපත් කිරීමේදී ඔහු විසින් සකස් කළ ප්‍රතිබිම්බය අඳුරු පැහැ ගැන්වූ එකකි. එය අඩු Contrast එකක් හා මන්ද definition එකක් වූ නිසා එය තවදුරටත් සකස් කිරීමට අවශ්‍ය විය. සවෝරිකින් ගේ ප්‍රතිබිම්බ සකස් කිරීමේ නලය රසායනාගාරයේ තත්ත්වයට කිසිදු විටෙක සමාන නොවී ය.

නමුත් මෙහිදී වෙස්ටින්හවුස් පේටන්ට් බලපත්‍රය හිමි RCA යප්‍රකාශ කළේ 1927 ෆ්‍රාන්ස්වර්ත් විසින් සිය Image Dissector උපකරණය සඳහා ඉල්ලා සිටි පේටන්ට් බලපත්‍රය මගින් වෙනත් ඕනෑම අයකුගේ විද්‍යුත් ප්‍රතිබිම්බ මවන උපරකණයක පේටන්ට් හිමිකාරිත්වයෙන් ඉවත් වන බවයි. මේ ආකාරයට RCA ය 1923 ස්වොරිකින් විසින් ඉදිරිපත් කරණ ලද පේටන්ට් බලපත්‍රය ලබාගැනිමේ අයදුම්පත්‍රයට අනුව ෆ්‍රාන්ස්වර්ත්ට එරෙහිව පේටන්ට් බලපත්‍රයට මැදිහත් වීමේ නඩුවක් ගොනු කළේ ය. ස්වොරිකින්ට එරෙහිව ෆ්‍රාන්ඩ්වර්ත් විසින් ඉදිරිපත් කරන ලද සැබෑ නිපැයුම්කරුවා කව්රුන්ද යන ගවේෂණය සම්බන්ධයෙන් ඇ.එ. ජනපද පේටන්ට් කාර්යාලය 1935 දී තීන්දුවක් දෙමින් එයට එකඟ නොවී ය. ඒ අතර ෆ්‍රාන්ස්වර්ත් ප්‍රකාශ කළේ 1923 දී ස්වෝරිකින් විසින් ඉලෙක්ට්‍රොනික ප්‍රතිබිම්බයක් ලබාගැනීම සඳහා සිදු කරන ලද ක්‍රමය අසාර්ථක නිසා ඔහුගේ පේටන්ට් බලපත්‍රයට තමා අභියෝග කරන බවයි.

ස්වොරිකින් විසින් 1923 ඉදිරිපත් කරන ලද පේටන්ට් අයදුම්පත්‍රයට අනුව 1928 දී වර්ණ සම්ප්‍රේෂණය සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍රය ලබාගත්තේ ය. ඔහු සිය මූලික අයදුම්පත්‍රය 1931 දී එකිනෙකට වෙන් කර දක්වන ලදී. මේ අතර ස්වෝරිකින් සිය මුල් අත්හදා බැලීම මත 1923 පේටන්ට් අයදුම්පත්‍රය යොමු කළ විද්‍යුත් සම්ප්‍රේෂණ නාලයක ආකෘතියක් හෝ පිටපතක් නැවත ඉදිරිපත් කිරීමට එතරම් කැමැත්තක් නොදැක්වුවා මෙන්ම ඒ සඳහා ඔහු අපොහොසත් විය. 1939 සැප්තැම්බර් මස උසාවියට ගොනු කළ අභියාචනය පරාද වීමත් සමඟ රූපවාහිනි උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා වාණිජ ගමන්මගට ප්‍රවිෂ්ට විය. එහිදී RCA විසින් ෆ්‍රාන්ස්වර්ත්ගේ උපකරණය නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ඇ.ඩො. මිලියන එකක් ගෙවීමට එකඟ විය. එමෙන්ම ඒ අනුව මෙහිදී ෆ්‍රාන්ස්වර්ත්ගේ පේටන්ට් බලපත්‍රය පාවිච්චි කිරීම, බලපත්‍ර ගාස්තු ගෙවීම හා වසර දහයක කාලයක් සඳහා එහි හිමිකම ලබාදීම වෙනුවෙන් එම ගාස්තුව ෆ්‍රාන්ස්වර්ත් වෙත RCA සමාගම විසින් ගෙවන ලදී.

සම්ප්‍රේෂණයේදී අඩු විද්‍යුත් ධාරිතාවක් ලබාදීමෙන් හෝ කැමරා නාල නිසා හෝ ඇතිවන සංවේදීතාව අඩුකම 1924 දී කල්මන් තිහානි විසින් විසඳන ලදී. ඔහුගේ විසඳුම වූයේ සෑම ස්කෑන්කරණ චක්‍රීය වාරයක් පාසාම විද්‍යුත් බලය ආරෝපිත වූ මෙන්ම, තැන්පත් වූ (එකතුවූ) කැමරා නලයක් සකස් කිරීමයි. මෙම උපකරණය මුලින්ම ව්‍යවහාර වශයෙන් සඳහන් වූයේ රේඩියෝස්කෝප් (Radioskop) වශයෙන් හැඳින්වූ ඔහු විසින් සොයාගන්නා ලද රූපවාහිනී ක්‍රමයක් සඳහා අවශ්‍ය පේටන්ට් බලපත්‍රයක්

සඳහා 1926 මාර්තු මස හංගේරියාවේ දී අයදුම්කිරීමත් සමඟය. එම අයදුම් පත්‍රයට 1928 දී තවදුරටත් සංශෝධන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 1928 වන විට ප්‍රංශය හා බ්‍රිතාන්‍ය යන රටවල් 1929 වන විට ඇ.එ. ජනපදයේ තිහානි ගේ කැමරා නාලය සඳහා පේටන්ට් හිමිකාරිත්වය ලැබීය. 1931 වන විට තිහානිගේ අදහස හා සැලැස්ම RCA සමාගමේ නව නිෂ්පදානයක් වන අයිකනොස්කෝප් (Iconoscope) සඳහා හේතු වූවද, 1939 මැයි මස වන තෙක් තිහානිගේ සම්ප්‍රේෂණ නාලය සඳහා අවශ්‍ය පේටන්ට් බලපත්‍රය සැලකිල්ලට නොගත්තේය. 1939 ඔක්තෝබර් මස වන විට තිහානිගේ ග්‍රාහක නලය සඳහා පේටන්ට් කාර්යාලයේ අවධානය යොමු විය. එම නාල දෙක සඳහාම පේටන්ට් අනුමැතිය ලැබීමට පෙර RCA සමාගම විසින් එම උපකරණ දෙකම මිලයට ගන්නා ලදී. විද්‍යුතය ආරෝපණය කිරීම හා ගබඩාකිරීම හා සම්බන්ධ අදහස් (විවිධ හා එකිනෙකට වෙනස් තාක්ෂණික විසඳුම් තිබූ නමුත්) අද පවතින සියලුම ආකාරයේ නූතන ප්‍රතිබිම්බ සංවේදන සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා වශයෙන් තවදුරටත් නොවිසඳුණු මාතෘකා දෙකක් ලෙස පවතී.

මේ අතර ලෝකය පුරාම විද්‍යුත් රූපවාහිනිය පිළිබඳ නොයෙකුත් දියුණුවීම් ඇති විය. 1931 අගෝස්තු මස බර්ලින් රේඩියෝ සංදර්ශනයේදී මැන්ෆ්‍රඩ් වොන් ආර්ඩේන් විසින් CRT උපකරණය භාවිතයෙන් සම්ප්‍රේෂණය හා ග්‍රාහක ගතවීම යන කාර්ය දෙකම දක්වෙන ආකාරයෙන් මහජනතාව ඉදිරියේ සිය රූපවාහිනී ක්‍රමය පිළිබඳ ප්‍රදර්ශනයක් ඉදිරිපත් කළේ ය. ආර්ඩේන් විසින් චිත්‍රපට හා පිටපත් ස්කෑන් කිරීම සඳහා කැරකෙන - ස්ථානීය ස්කෑනරය භාවිත කිරීම වෙනුවට CRT භාවිතයෙන් සිය කැමරා නාලය වැඩි දියුණු නොකළේය. පිලෝ ෆාන්ස්වර්ත් විසින් ඇමරිකාවේ ෆිලඩෙල්ෆියාහි ෆ්‍රැන්ක්ලින් ආයතනයේ සිට සජීවී කැමරාවක් උපයෝගී කරගෙන සිය පූර්ණ විද්‍යුත් රූපවාහිනී ක්‍රමය පිළිබඳ මහජන ප්‍රදර්ශනයක් 1934 අගෝස්තු මස 25 වන දින අඛණ්ඩව දින දහයක් එක දිගට පවත්වා තිබේ.

1933 දී RCA විසින් තිහානි විසින් ඉදිරිපත් කරන ලද විද්‍යුත් ආරෝපණ හා ගබඩා කිරීමේ මූලධර්මය මත පදනම් වෙමින් වැඩිදියුණු කළ කැමරා නාලයක් හඳුන්වා දෙනු ලැබී ය. ස්වොරිකින් විසින් නම් කරන ලද අයිකනෝස්කෝප් (Iconoscope) උපකරණය ෆාන්ස්වර්ත් විසින් සොයාගන්නා ලද Image Dissector උපකරණයට වඩා සංවේදීතාවකින් වැඩි 75,000LUX පමණ ආලෝක සංවේදීතාවක් ඇති නව නාලයක් ලෙස හඳුනාගත හැක. කෙසේ වෙතත් මෙහිදී ෆාන්ස්වර්ත් විසින් තමන්ගේ Image Dissector උපකරණයේ තිබූ දෝෂය වන විද්‍යුත් බලය ලබාගැනීම, සඳහා "Multifactor" නම් උපකරණය සොයාගැනීම 1930 දී ආරම්භ වූ අතර එය 1931 දී ෆාන්ස්වර්ත් විසින් ඉදිරිපත් කර තිබේ. මෙම කුඩා උපකරණයට යම් සංඥාවක් 60 ගුණයකින් ධාරිතාව බලවත් කිරීමට හැකි වීමෙන් ඉලෙක්ට්‍රොනික උපකරණ සෑම එකක්ම පාහේ යොදා ගත හැකි වඩාත් සාධනීය උපකරණයක් බවට "Multifactor" පත් විය. මෙම උපකරණයේ තිබූ අවාසිය වූයේ අසාමාන්‍ය ආකාරයෙන් එය ඉක්මනට ගෙවී යාමයි.

1932 දී බ්‍රිතාන්‍යයේ EMI ඉංජිනේරු කණ්ඩායම මෙහෙය වූ අයිසැක් ෂොන්බර්ග් විසින් BBC ය සඳහා සැලසුම් කළ කැමරාවක හදවත බඳු "Emitron" විද්‍යුත් උපකරණය සඳහා පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කළේ ය. 1936 නොවැම්බර් 02 වන දින ඇලෙක්සැන්ඩ්‍රා මාළිගයේ පිහිටි ඡායාරූපගාරයේ සිට Emitron උපකරණය භාවිතයෙන් තරංගයේ 405 තීව්‍රතාවකින් යුත් විකාශනයක් ආරම්භ කළේ ය. එය විකාශනය කළේ වික්ටොරියානු ගොඩනැගිලි අතුරෙන් ඉහළට කුලුණක පිහිටි ස්ථානයක

විශේෂයෙන් ඉදිකළ ඉහළ පිඨිකාවක් ඔස්සේ ය. එය බෙයාර්ඩ්ගේ යාන්ත්‍රික ක්‍රමය උපයෝගී කරගෙන ඡායාරූපාගාරයේ සිට කෙටිකලක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය. නමුත් එය එවකට වඩා විශ්වාසවන්ත හා දෘශ්‍යමය වශයෙන් විශිෂ්ට වූවක් විය. මෙය ලොව ප්‍රථමවරට ඉදිරිපත් වූ ඉහළ තීව්‍රතාවයක් සහිත රූපවාහිනී සේවාවයි.

ඇමරිකානු මුල් Iconoscope උපකරණය ක්‍රියාත්මක කිරීමේදී සංඥාවට බොහෝ බාධක ඇති වූ අතර, නොයෙකුත් ශබ්ද නිසා හඬ අපහැදිලි විය. මේ අතර එකල ලබාගත හැකි ව තිබූ ඉහළ සංඛ්‍යාත යාන්ත්‍රික ස්කෑනින් ක්‍රම අතර එම උපකරණය කෙරෙහි තිබූ අවධානය අඩු විය. EMI කණ්ඩායම, අයිසැක් ෂෝන්බර්ග් ගේ ප්‍රධානත්වයෙන් යුතුව Iconoscope (Emitron) උපකරණය මගින් ඉලෙක්ට්‍රොනික සංඥා සකස් කරන්නේ කෙසේද යන්නත්, එය ක්‍රියාත්මක කිරීමේදී එහි කාර්යක්ෂමතාව න්‍යායික වශයෙන් උපරිම 75% ක ප්‍රමාණයක් බවත් අනාවරණය විය. මෙහි තිබූ ගැටළුව මගහරවමින් වඩාත් දියුණු කැමරා නාල උපකරණ දෙක සොයා ගෙන ඒ සඳහා පේටන්ට් බලපත්‍රය ද 1934 වන විට ලබා ගත්තේය.

ඒ Super - Emitron හා CPSEmitron හා උපකරණ දෙකයි. මින් Super - Emitron කැමරා නාලය කලින් තිබූ Emitron සහ Iconoscope උපකරණ වල ගුණාත්මකතාවට වඩා ඉහළ අගයක් ගත්තේය. මෙම උපකරණය BBC ය මගින් බාහිර විකාශන කටයුතු සඳහා භාවිත කළේය. ඒ 1937 යුධ විරුවන් සමරන දිනයේ දී එංගලන්ත රජු විසින් යුධ හමුදා විරු ස්මාරකය අසල මල් වඩමක් තබන අවස්ථාව රූපවාහිනිය මගින් මහජනතාව නරඹන අවස්ථාව සඳහා භාවිත කිරීමයි. අසල පිහිටි ගොඩනැගිල්ලක වහළයේ තැන්පත් කර ඇති කැමරාවක් භාවිත කරමින් සජීවි ලෙස වීදියක දර්ශනයක් විකාශනය කළ ප්‍රථම අවස්ථාව ලෙස මෙය සැලකේ. 1939 නිව්යෝර්ක් හි තිබූ ලෝක වෙළඳපල සංදර්ශනයට ප්‍රථම ෆ්‍රාන්ස්වර්ත් ගේ RCA ආයතනයට හෝ එබඳු විකාශනයක් කිරීමට මින් පෙර නොහැකි විය.

අනෙක් අතට 1934 වන විට ස්වොරිකින් විසින් ජර්මනියේ පිහිටි Telefunken ජර්මන් බලපත්‍ර සමාගම සමඟ එකතුව පේටන්ට් හිමිකම් ලබාගැනීමට කටයුතු කළේය. මෙම අනු සංධානයේ ප්‍රතිඵලයක් ලෙස Image Iconoscope (එය ජර්මනියේ හැඳින්වූයේ Superikonoskopනමින් නැමැති නව උපකරණයක් නිපදවිය. මෙම නව උපකරණය අනිවාර්යයෙන්ම Super - Emitron උපකරණය හා සමඟ හොඳින්ම එක හා සමාන ව ක්‍රියා කළ හැකි තත්ත්වයේ තිබුණි. Super - Emitron සහ Image Iconoscope උපකරණ නිෂ්පාදනය හා වාණිජ මට්ටමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ෆ්‍රාන්ස්වර්ත් හා ස්වොරිකින් අතර ඒවායෙහි පේටන්ට් බලපත්‍ර ලබාගැනීම සම්බන්ධයෙන් බරපතල ගැටළුවක් ඇති නොවීය. එයට හේතුව වන්නේ 1925 දී ජර්මනියේ විසු ඩික්මාන් සහ හෙල් යන අය විසින් නිපදවූ Image Dissector නැමැති උපකරණය සඳහා අවශ්‍ය පේටන්ට් බලපත්‍රය ලබාගැනීමට කලින්ම ඉදිරිපත් වීමයි.

එනම් ඇමරිකාවේ ෆ්‍රාන්ස්වර්ත් එයට වසර දෙකකට පසුව පේටන්ට් බලපත්‍රය ඒ සඳහා ලබාගැනීමට කටයුතු කළේ ය. 1936 සිට 1960 දක්වා යුරෝපයේ මහජන සේවා විකාශන කටයුතු සඳහා වූ ප්‍රමිති ගත උපකරණයක් ලෙස Image Iconoscope (Superikonoskop) උපකරණය පත් විය. Vidicon සහ Plumbicon කැමරා නල පසුකලෙක වැඩිදියුණු වීමත් සමඟම Image Iconoscope උපකරණය කෙරෙහි තිබූ ඉල්ලුම අඩු විය. Image Orthicon යනාදි යුරෝපීය නිෂ්පාදන උපකරණ වෙළඳපලට

පැමිණීමත් සමඟ ඒවාට ඇමරිකානු උපකරණ සමඟ එකිනෙක තරඟකරන්නට විය. හෙයිමන් නැමැති ජර්මන් සමාගමක් විසින් 1936 පැවති බර්ලින් හි ඔලිම්පික් තරඟය සඳහා "Superikonoskop" උපකරණය නිෂ්පාදනය කළේය. 1955 දක්වා කාලය තුළ හෙයිමන් සමාගම එම උපකරණය නිෂ්පාදනය කර වෙළඳපලට හඳුන්වා දුන්නේය. පසුව නෙදර්ලන්ත සමාගමක් වන Philips සමාගම විසින් 1952 සිට 1958 දක්වා කාලය තුළ Image Iconoscope සහ multicon නැමැති උපකරණ නිෂ්පාදනය කර වෙළෙඳපලට හඳුන්වා දුන්නේ ය.

නොයෙකුත් ප්‍රමාණයන්ගෙන් යුත් රූපවාහිනි උපකරණ විශාල පරාසයක් තුළ විවිධ වෙළඳපලවල දක්නට ලැබෙන සමයක, ඇමරිකානු රූපවාහිනි විකාශන අතර 1941 සම්මත ප්‍රමිති ඇතිවන තෙක් රූපවාහිනි විවිධ තාක්ෂණයන්ගේ ආධිපත්‍යය හා වැඩසටහන් අතර තරඟයක් ඇති විය. උදා. ලෙස RCA සමාගම විසින් නිව්යෝර්ක් ප්‍රදේශයට පමණක් විශේෂිතව Iconoscope උපකරණය භාවිත කළ අතර, ෆිලඩෙල්ෆියා හා සැන් ෆ්‍රැන්සිස්කෝ යන ප්‍රදේශවල ෆ්‍රාන්ස්වර්ත්ගේ Image Dissector යන උපකරණය ක්‍රියාත්මක විය. 1939 සැප්තැම්බර් මස වන විට RCA සමාගම විසින් ෆ්‍රාන්ස්වර්ත්ගේ පේටන්ට් බලපත්‍රය ලබාගැනීම සඳහා ඉදිරි දස වසරක කාලය සඳහා ෆ්‍රාන්ස්වර්ත්ගේ රූපවාහිනි හා රේඩියෝ සංස්ථා පේටන්ට් බලපත්‍ර ගාස්තු ගෙවන ලදී. මෙම ඓතිහාසික ගණුදෙනුවත් සමඟම RCA සමාගම ඔවුන්ගේ විකාශන පද්ධතිය සඳහා ෆ්‍රාන්ස්වර්ත්ගේ තාක්ෂණය වඩාත් හොඳින් යොදාගත්තේ ය.

1941 දී ඇ.එ. ජනපදය 525 -තරංග තීව්‍රතාවය සහිත රූපවාහිනිය භාවිත කළේ ය. 1944 වන විට ලොව ප්‍රථම 625 - තරංග තීව්‍රතාවය සහිත රූපවාහිනී ප්‍රමිතිය සෝවියට් රුසියාවේ සැලසුම් විය. 1946 දී එය එරට ජාතික රූපවාහිනී ප්‍රමිතියක් බවට පත් විය. එම 625 –ක තරංග තීව්‍රතාවය සහිත රූපවාහිනි ප්‍රමිතිය ප්‍රථම වරට විකාශන කටයුතු 1948 දී මොස්කව් නුවර ආරම්භ විය. එයට සමගාමීව යුරෝපයේ CCIR ප්‍රමිතිය ද ක්‍රියාවට නැංවී ය.

වර්ණ රූපවාහිනිය

රූපවාහිනි විකාශනය

රූපවාහිනී මධ්‍යස්ථාන මගින් වැඩසටහන් විකාශනය කළ විට එය නාලිකා නමින් හැඳින්විය. පසුකාලීනව ඒ සඳහා ඔවුන් රජයෙන් බලපත්‍ර ලබාගන්නා ලදී. ඒ රූපවාහිනී නාලිකාවන් රජයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ය. මුලින්ම ප්‍රාදේශීය වශයෙන් විසුරුවා හැරීමේදී තරංග ආයාමය (bandwidth) ප්‍රමාණවත් නොවූ නිසා රූපවාහිනී නාලිකා කිහිපයක් සඳහා පමණක් රජයෙන් බලපත්‍ර හිමි විය. එමෙන්ම ඒ සඳහා රජයේ නියාමන ක්‍රියාත්මක කිරීම ද අනිවාර්ය විය.

ඇ.එ. ජනපදයේ ෆෙඩරල් සන්නිවේදන කොමිසම (FCC) විසින් 1941 ජූලි මස වන විට රූපවාහිනිය මගින් වෙළඳ දැන්වීම් ප්‍රචාරය සඳහා අවසර ලබා දුන්නේ. නමුත් එම බලපත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කාරණයක් විය. එක්සත් රාජධානියේ මෙයට වඩා හාත්පසින් වෙනස් විය. එනම් රූපවාහිනි යන්ත්‍ර හිමිකරුවන් රූපවාහිනී සේවා ලබාගැනීම සඳහා BBC ආයතනයට මුදලක් ගෙවීමෙන් පසු සේවාව ලබාගත හැක. රූපවාහිනි මහජන සේවා විකාශනය බ්‍රිතාන්‍ය රාජකීය වරලත් අධිකාරී පත්‍රයක් මගින් ක්‍රියාත්මක විය.

එක්සත් රාජධානිය

බ්‍රිතාන්‍යයේ පළමු රූපවාහිනී ප්‍රචාරය 1929 සැප්තැම්බර් මස බෙයාර්ඩ් විසින් හඳුන්වා දෙන ලද රූපවාහිනි විද්‍යුත් යාන්ත්‍රික ක්‍රමය යොදා BBC යේ රේඩියෝ සම්ප්‍රේෂකය විසුරුවා හැර තිබේ. 1930 වන තෙක් බෙයාර්ඩ් විසින් සතියකට දින පහක පමණ සීමිත වැඩසටහන් ප්‍රමාණයක් විසුරුවා හැර තිබේ. මේ අතර සවුත් ඇම්ප්ටන් විසින් රූපවාහිනියේ ප්‍රථම සජීවි සම්මුඛ සාකච්ඡා වැඩසටහන ක්‍රියාත්මක විය. එහි පෙජී නොයෙල් නැමැති නිළිය හා ගායිකාව නිව්යෝර්ක් නුවර සිට මෙම වැඩසටහනට එක් විය. 1932 අගෝස්තු 22 දින බෙයාර්ඩ් ගේ විද්‍යුත් යාන්ත්‍රික ක්‍රමය භාවිතයෙන් නිතිපතා විකාශන සේවාව ආරම්භ කළ අතර, එය 1935 සැප්තැම්බර් මස 11 වැනි දා තෙක් ක්‍රියාත්මක විය.

ලන්ඩන් හි ඇලෙක්සැන්ඩ්‍රා මාළිගයේ සිට මාර්කෝනි EMI 405 - තරංග තීව්‍රතාවක ප්‍රමිතිය සහ බොයාර්ඩ් ගේ වැඩිදියුණු කළ 240 - තරංග තීව්‍රතා ප්‍රමිතිය ඉක්මවමින් 1936 නොවැම්බර් මස 02 දින BBC ය විසින් රූපවාහිනි ද්විත්ව - ක්‍රම සේවාව ආරම්භ කරමින්, ලොව ප්‍රථම ඉහළ තීව්‍රතාවකින් යුතු රූපවාහිනි සේවාව ආරම්භ කළේය. එය අද BBC සජීවි අන්තර්ජාල රූපවාහිනී සේවාව බවට පත්ව තිබේ. රජය විශේෂ උපදේශක කමිටුවක් කැඳවමින් මාර්කෝනි EMI ඉලෙක්ට්‍රොනික ක්‍රමය මගින් වඩා හොඳ රූප ලබාගත හැකි බව තීරණය කළ අතර, 1937 පෙබරවාරි මස වන විට බෙයාර්ඩ්ගේ රූපවාහිනි ක්‍රමය ඉන් මඟහැරුණි. 1936 සිට 1939 දක්වා කාලය තුළ ලන්ඩන් නගරයේ රූපවාහිනී විකාශන කටයුතු දිනකට පැය හතරක පමණ කාලයක් ක්‍රියාත්මක විය. එකල මේ සඳහා 12,0000 ත් 150,000 ත් අතර ප්‍රමාණයක ග්‍රාහක සංඛ්‍යාවක් සිටියහ. ඇතැම් තානායම් හෝ බීර අලෙවි සැල් වල තිබූ රූපවාහිනි යන්ත්‍ර වටා ක්‍රීඩා වැඩසටහන් නැරඹීමට සිය ගණනක් ප්‍රේක්ෂකයෝ ඉඳ ගත්හ. මයිකි හවුස් කාටූනයක් විකාශනය කිරීමත් සමඟම දෙවන ලෝක යුද්ධය පැවති කාලයේදී 1939 සැප්තැම්බර් මස 01 වන දින කිසිදු පූර්ව දැන්වීමකින් තොරව BBC සේවාව තහනම් කරන ලදී. නැවත දෙවන ලෝක යුද්ධය අවසන් වීමත් සමඟම එම කාටූනය ම ඉදිරිපත් කරමින් ඇලෙක්සැන්ඩ්‍රා මාළිගයේ සිට 1946 ජුනි මස 07 වැනි දින BBC ය ක්‍රියාත්මක කළේය. 1947 වර්ෂාවසානය වන විට බ්‍රිතාන්‍යයේ රූපවාහිනී බලපත්‍ර ලාභීන් 54,000 ක්ද, ඇ.එ. ජනපදයේ එය 44,000 ක්වශයෙන් දක්නට හැකි විය.

ප්‍රථමවරට අත්ලාන්තික් සාගරය ඔස්සේ ලන්ඩන් නගරයේ සිට නිව්යෝර්ක් දක්වා රූපවාහිනි තරංග සම්ප්‍රේෂණය කළේ බෙයාර්ඩ්ගේ රූපවාහිනී සංවර්ධන සමාගම (Cinema Televison) විසිනි. එහෙත් එම තරංග මහජනතාව වෙත විකාශනය නොවී ය. ප්‍රථම වරට සජීවී සැටලයිට් සංඥා ඇ.එ. ජනපදයේ සිට බ්‍රිතාන්‍ය වෙත විකාශනය කලේ 1962 ජුලි මස 23 දින Telstar චන්ද්‍රිකාව ඔස්සේ ය. යුරෝපීය මහද්වීපය තුළ ප්‍රථම සජීවි රූපවාහිනී විකාශනය 1950 අගෝස්තු මස 27 වන දින ක්‍රියාත්මක විය.

ඇ.එ. ජනපදය

1941 ජුලි මස WNBT (පසුව WNBC) ආයතනය විසින් ඇ.එ. ජනපදයේ ප්‍රථම සතිපතා වාණිජ රූපවාහිනි වැඩසටහන සකස් කළේ ය. ප්‍රථම සතිපතා රූපවාහිනී සේවාව ආරම්භ වූයේ 1928 ජුලි 02 වැනි දිනය. වොෂින්ටන් හි උපනගරයක් වූ වීටන් මේරිලෑන්ඩ් හි සිට W3XKWN අත්හදාබැලීමේ

රූපවාහිනි මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා FCC ය මගින් සී.එෆ්. ජෙන්කින් වෙත බලය පැවරුවේ ය. 1929 වසන්ත කාලය මුල කලාතුරකින් අර්ධනාද (Halftone) ඔස්සේ විකාශන කටයුතු කළත් පළමු මාස 18 ක කාලය තුළ චලන පින්තූර චිත්‍රපට වල සිට 48ක තරංග තීව්‍රතාව මගින් වර්ගයේ අපහැදිලි ප්‍රතිබිම්භ විකාශනය කළේ ය.

1928 අගෝස්තු මස 14 වැනි දින 48 ක තරංග තීව්‍රතාව සහිත ප්‍රතිබිම්බ භාවිතයෙන්, සීමා සහිත නමුත් නිතිපතා විකාශනය කරන සජීවී රූපවාහිනී වැඩසටහන් ආරම්භ කිරීමට හියුගෝ ගර්න්ස්බර්ග් ගේ නිව්යෝර්ක් හි පිහිටි නිව්යෝර්ක් සිටි රේඩියෝ මධ්‍යස්ථානයට හැකි විය. මෙහි එක් ට්‍රාන්ස්මීටර් යන්ත්‍රයක් භාවිතයෙන් නිහඬ රූපවාහිනී ප්‍රතිබිම්බ පමණක් දැකගත හැකි විය. චලනය වන සෙල්ලම් භාණ්ඩ වල මුහුණු පමණක් එහි දර්ශනය විය.

එම මාසය අවසාන වන විට amateur කණ්ඩායම අත්හදාබැලීම් සඳහා ගර්න්ස්බර්ග් විසින් වැඩසටහන් නැවත විකාශනය කළේය. ඔහු සඳහන් කළ ආකාරයට "පුරා මාස 06 ක කාලයක් අප මහජනතාව සඳහා රූපවාහිනිය විකාශනය කළේය. එහෙත් මෙතෙක් අප අත්කරගත් දෙයක් නොමැත." එසේම හියුගෝ ගර්න්ස්බර්ග් විසින් රූපවාහිනි මාධ්‍යය පිළිබඳ ලොව ප්‍රථම ජර්නලය Televison නමින් ප්‍රකාශයට පත් කළේ ය.

නිව්යෝර්ක් හි ස්නේක්ටඩ් හි පිහිටි ජෙනරල් ඉලෙක්ට්‍රික් හි අත්හදාබැලිමේ මධ්‍යස්ථානය 1928 ජනවාරි මස 13 වන දින සිට විටින් විට විකාශනය කළ රූපවාහිනි තරංග 48 - තීව්‍රතා ප්‍රතිබිම්බය ලොස් ඇන්ජලීස් තරම් ඈතකට යැවීම සඳහා කෙටි තරංග යොදා ගන්නා ලදී. එම වර්ෂයේ සැප්තැම්බර් මස වන විට සතියකට රූපවාහිනි වැඩසටහන් හතරක් විකාශනය කළේ ය.

WRGB සේවාව අද පවතින රූපවාහිනියේ සෘජු ආදි කර්තෘවරයකු ලෙස සැලකේ. ලොව ප්‍රථම වරට රූපවාහිනිය මගින් විකාශනය කළ සජීව රූපවාහිනි නාට්‍ය ලෙස සැලකෙන්නේ 1928 සැප්තැම්බර් මස 11 වන දින විකාශනය කළ ඒකාංගික නාට්‍යයක් වන "The Queen Messenger" (රැජිණගේ පණිවිඩකාරයා) නැමැති නාට්‍යයි. වර්තමාන රූපවාහිනි විකාශන සේවාවක් වන WNBC හි මුල් සේවාවක් වන W2XBS මධ්‍යස්ථානය ඔස්සේ 1929 මාර්තු මස නිව්යෝර්ක් නගරයේදී දුවැන්ත රේඩියෝ ජාලයක් වන RCA ය විසින් දිනපතා රූපවාහිනී විකාශන කටයුතු කිරිම පිළිබඳ අත්හදාබැලීම් කළේ ය. එහි තරංග60 - තීව්‍රතා සම්ප්‍රේෂණය තුළ පින්තූර, සංඥා, පුද්ගලයන්ගේ සහ උපකරණවල රූප යනාදිය අඩංගු විය. 1931 තෙක් අත්හදාබැලීම් විකාශනයක් ක්‍රියාත්මක විය. General Broadcasting System හි WGBS රේඩියෝව සහ W2XCR රූපවාහිනිය 1931 අප්‍රේල් 26 නව දින නිව්යෝර්ක් නගරයේදී ප්‍රථමවරට ඔවුන්ගේ ප්‍රතිබිම්බ විකාශන කටයුතු ආරම්භ කළේ ය.

A 5 - 4 විදියේ, හත්වැනි (07) ස්ථානයෙහි පිහිටි එඩලින් ශාලාවේ කරන ලද විශේෂ ප්‍රදර්ශනාත්මක වැඩසටහනක් ද සමගින් මෙම දිනකට පැය හතරක කාලයක් තුළ විකාශනය කරන අගල් හතරක (15cm) ප්‍රමාණයෙන් යුත් රූපරාමුවක් තුළ එවකට සිටි සුපිරි රංගන තරු විකාශන තරංග ඔස්සේ දැකගැනිමට දස දහස් ගණනින් ආකර්ෂණය විය. මෙහි සිටි තරු අතර බොක්ස් වාර්තා තැබූ ලීමියෝ කනේරා, මෙන්ම අනෙක් නළු නිලියන් අතර ගර්ටෘඩ් ලෝරන්ස්, ලුවිස්කාල් හර්න්, ෆ්‍රැරුන්සස් උප්ටන් සහ ලයනල් ඇට්විල් මෙන්ම WHN නිවේදක නීල්ස් ග්‍රැන්ඩ්ලුන්ඩ් යන අය වූහ.

CBS හි නිව්යෝර්ක් සිටි රූපවාහිනී මධ්‍යස්ථානය වන W2XAB සේවාව තරංග 60 -තීව්‍රතා විද්‍යුත් යාන්ත්‍රික ක්‍රමය උපයෝගී කරගෙන 1931 ජූලි මස 21 වැනි දින ප්‍රථම වරට සතියකට දින හතක නිතිපතා පවත්වන රූපවාහිනී විකාශනය ආරම්භ කළේය. එහි ප්‍රථම වැඩසටහන් විකාශනය සඳහා නගරාධිපති ජිම් වෝකර්, බොස්වෙල් සහෝදරියන්, කේට් ස්මිත් සහ ජෝර්ජ් පර්ස්විත් යන අය සහභාගි වූහ. එම සේවාව 1933 පෙබරවාරි මස වන විට අවසන් විය. දොන් ලී ගේ විකාශන මධ්‍යස්ථානය වන W6XAO ය ලොස් ඇස්ජලීස් හි සිට 1931 දෙසැම්බර් මස වන විට විකාශනය ආරම්භ විය. එය UHF තාක්ෂණය භාවිතයෙන් වසර ගණනාවක්ම ඉරිදා සහ නිවාඩු දින හැරෙන්නට අනෙක් සෑම දිනයකම චිත්‍රපට ගත කරන ලද ප්‍රතිබිම්බ නිතිපතා විකාශනය කළේය.

1935 වන විට අඩු තිව්‍රතාවක් තිබූ විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනී විකාශන, රාජ්‍ය විශ්වවිද්‍යාලවල (1939 දක්වා ක්‍රියාත්මක විය) රූපවාහිනි මධ්‍යස්ථාන හැරෙන්නට අනෙක් සියල්ල නතර විය. ක්‍රමිකව පරිණාමය වන රූපවාහිනි තාක්ෂණය තුළ එහි ස්ථිර තාක්ෂණික ප්‍රමිතියක් FCC ය විසින් හඳුනා නොගත්තේ ය. ඒ අතර සියලුම ඇ.එ. ජනපද රූපවාහිනි සේවා සඳහා අත්හදාබැලීමේ සහ වාණිජ නොවන රූපවාහිනී බලපත්‍ර ලබාදීම නිසා, රූපවාහිනියේ ආර්ථික වර්ධනයට එය ඉමහත් බාධාවක් විය.

රූපවාහිනියේ අනාගත දිශානතිය 1934 අගෝස්තු මස ෆිලෝ ෆාන්ස්වර්ත් විසින් ෆිලඩෙල්ෆියාහි ෆ්‍රෑරූන්ක්ලින් ආයතනයේදී පූර්ණ විද්‍යුත් රූපවාහිනී ක්‍රමයක් පිළිබඳ ඉදිරිපත් කිරීම මගින් ඉඟි කළේය.

1936 ජූනි මස 05 වැනිදා ඩොල් ලී විකාශන සේවාව මගින් චලන රූප චිත්‍රපට භාවිතයෙන් තරංග 300 තිව්‍රතා ප්‍රතිබිම්බ සහිතව W6XA0 සේවාව මගින් (පසුව KTSL) ලොස් ඇන්ජලීස් හිදී ඉහළ තිවුතාවකින් (240 lines) යුත් මාසයක කාලයක රූපවාහිනී ප්‍රදර්ශනයක් ඉදිරිපත් කළේය. එම වසර ඔක්තෝම්බර් මස වන විට W6XA0 සේවාව මගින් චිත්‍රපට පිළිබඳ දිනපතා රූපවාහිනී විකාශන සේවා අරඹන ලදී. RCA ය සහ එහි උපශාඛාවක් වන NBC විකාශන සේවාව විසින් 1936 ජූලි මස 07 වැනි දින නිව්යෝර්ක් නගරයේ 343-line විද්‍යුත් රූපවාහිනී විකාශනයක් සජීවි චිත්‍රපට අන්තර්ගත ඇතුළත්ව එහි බලපත්‍ර ලාභීන් වෙත විකාශනය කළේය.

එම වර්ෂයේ නොවැම්බර් 06 වන දින එහි පළමු මහජන ප්‍රදර්ශනය පිළිබඳ පුවත්පත් තුළින් පවා අනාවරණය විය. 1937 සහ 1938 කාලය තුළ අක්‍රමවත් ආකාරයට රූපවාහිනී සේවා විකාශනය විය. නිව්යෝර්ක් හා ලොස් ඇන්ජලීස් යන නගරවල නිතිපතා දෛනික විකාශන කටයුතු විද්‍යුත් විකාශන සේවා ඇසුරෙන් 1938 අප්‍රේල් මස ආරම්භ විය. 1939 නිව්යෝර්ක් හි ලෝක වෙළඳපල විවෘත කරමින් 1939 අප්‍රේල් 30 වන විට NBC සේවාව රූපවාහිනී දෛනික විකාශන කටයුතු නිව්යෝර්ක් නගරයේ සිට ආරම්භ කළේය. 1939 ජූනි මස වන විට තරංග 441 - තිව්‍රතා රූපවාහිනී විකාශනය කටයුතු නිතිපතා විකාශන සේවාවක් වශයෙන් නිව්යෝර්ක් හා ලොස් ඇන්ජලීස් යන නගරවල ආරම්භ විය. එය 1939 නොවැම්බර් මස වන විට ස්කෙනක්ටඩි හි පිහිටි ජෙනරල් ඉලෙක්ට්‍රික් මධ්‍යස්ථානය මගින් විසුරුවා හැර ඇත. 1939 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා ජෙනරල් ඉලෙක්ට්‍රික් සමාගමට අයත් නිව්යෝර්ක් නගර NBC සේවාව වන W2XBS සේවාව සෑම සතියකම බදාදා සහ ඉරිදා දිනවල පැය 20 - පැය 48 දක්වා කාලයක් වැඩසටහන් ප්‍රචාරය කිරීමට මාසයක පමණ කාලයක් තුළ හැකි විය. එකල විකාශය වූ රූපවාහිනී වැඩසටහන් වලින් 33% ප්‍රවෘත්ති ද, 29% නාට්‍ය ද, 17 % අධ්‍යාපනික වැඩසටහන් ද වශයෙන්

රූපවාහිනි 2000 ක පමණ ප්‍රමාණය වසර අවසානය වන විට එය ග්‍රාහක සංඛ්‍යාව 5000 සිට 8000 දක්වා වර්ධනය විය. Empire State ගොඩනැගිල්ලෙහි වහලයේ සවි කර තිබූ ට්‍රාන්ස්මීටර් යන්ත්‍රයට සැතපුම් 10 (16Km) ක ඈතක දුරක සිට බාහිර පටිගත කිරීම දුරස්ථ සේවා ලොරියක් මගින් සිදු කළේ ය. මෙකල කේබල් භාවිතයෙන් මෙඩිසන් චතුරස්‍ර උද්‍යානයේ සිදුවීම් ආවරණය කළේ ය. එමගින් එම ස්ථානයේ සිට 80Km ක පමණ ප්‍රදේශයක වෙසෙන ජනගහණය 10,000,000 ක පමණ ග්‍රාහක සංඛ්‍යාවකට 1940 පමණ විට රූපවාහිනි විකාශන කිරීමට හැකි විය.

FCC විසින් 1941 මැයි මස 02 වැනි දින NTSC රූපවාහිනී ඉංජිනේරු සම්මත ප්‍රමිති භාවිතයට ගන්නා ලදී. එහි පහත ලක්ෂණ අන්තර්ගත විය.

- 525 line of vertical resolution
- තත්පරයට රූපරාමු 30
- එයට interlaced ස්කෑන් ක්‍රමය භාවිත කිරීම.
- තත්පරයට ක්ෂේත්‍ර 60 ක ආවරණය.
- FM තරංග ඔස්සේ ශබ්දය යොදා ගැනීම.

1939 තෙක් අලෙවි කළ රූපවාහිනී යන්ත්‍ර අඩු තීව්‍රතාවකින් සහිත යුතු ඒවා විය. එයට තවමත් නව ප්‍රමිතීන් එක්කාසු කරගැනීමට හැකියාව තිබුණි. මේ අතර රූපවාහිනිය සඳහා වාණිජ බලපත්‍ර ලබා ගැනීමට තිබූ හැකියාව අවබෝධ කර ගත්තේ ය. ඒ අනුව 1941 ජූලි 01 වන විට නිව්යෝර්ක් හි NSB හා CBS යන රූපවාහිනී මාධ්‍යස්ථාන අවශ්‍ය බලපත්‍ර ලබාගත්තේ, ෆිලඩෙල්ෆියා හි තිබූ ෆිල්කෝනි රූපවාහිනී මධ්‍යස්ථානය වන WPTZ අනුව යමිනි. 1941 ජූලි මස 01 දින සවස්යාමේදී ඇමරිකානු රූපවාහිනී විකාශනයේ ප්‍රථම වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය දක්නට ලැබුණේ ය. ඒ නිව්යෝර්ක් හි NSB මධ්‍යස්ථානයේ WNBT (අද WNBC) සේවාව තුළයි. ඇමරිකාව දෙවන ලෝක යුද්ධයට අවතීර්ණ වීමත් සමඟ දෛනික වාණිජ රූපවාහිනී කාලය සතියකට පැය 15 සිට පැය 04 දක්වා අඩු විය. බොහොමයක් රූපවාහිනි සේවා තහනම් කළේය. ඉතිරි වූ රූපවාහිනි සේවා කිහිපයක විනෝදාස්වාදන වැඩසටහන් (බොක්සින් සහ නාට්‍ය වැනි) එමෙන්ම මැඩිසන් චතුරස්‍ර උද්‍යානයේ අවස්ථා, යුධ ප්‍රවෘත්ති, මෙන්ම ගුවන් මංකොල්ල කරුවන්ගෙන් ප්‍රවේශ වීමට අවශ්‍ය පුහුණුවීම් හා ප්‍රථමාධාරකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මෙම ඉතිරි රූපවාහිනී සේවා මගින් විකාශනය විය.

1942 වන විට රූපවාහිනී යන්ත්‍ර 5000 ක් පමණ ක්‍රියාත්මක විය. නමුත් රූපවාහිනී ප්‍රවෘත්ති නිෂ්පාදනය, ගුවන්විදුලි ප්‍රවෘත්ති වැඩසටහන් නිෂ්පාදනය, සහ අනෙකුත් විකාශන උපකරණ 1942 අප්‍රේල් මස සිට 1945 අගෝස්තු මස දක්වා තහනම් කළේ ය.

1947 වන විට ඇමරිකාවේ ගුවන්විදුලි යන්ත්‍ර මිලියන 400 ක් පමණ තිබෙන විට රූපවාහිනී යන්ත්‍ර තිබුණේ 44,000 ක් පමණ (ඉන් ඇතැම්විට 30,000 ක්ම නිව්යෝර්ක් නගර සීමාවට අයත්ය.). දෛනික වශයෙන් නිතිපතා විකාශනය වන ජාල රූපවාහිනී සේවා ආයතනය විසින් මධ්‍යස්ථාන තුනක ජාලගත කිරීමෙන් ආරම්භ විය. ඒ 1944 දී ෆිලඩෙල්ෆියා හා නිව්යෝර්ක් ප්‍රධාන නගර සේවා මධ්‍යස්ථානය,

1946 ඩූ මවුන්ට් රූපවාහිනී ජාලය හා 1948 CBS සහ ABC යන රූපවාහිනී ජාල එකිනෙක එක්කාසු වීමෙන් 1949 වන විට රූපවාහිනී ජාල සේවාව නිවේයෝක් නගරයේ සිට මිසිසිපි ගංගාව තෙක් ද, 1951 දී බටහිර වෙරළ තීරය තෙක්ද, එය දිගු විය. 1951 දී Field Sequential වර්ණ ක්‍රමය හා සමඟ සම්බන්ධ වෙමින් CBS රූපවාහිනී විකාශන කටයුතු ආරම්භ විය. එය ඉන් මාස හතරකට පසුව තාක්ෂණික හා ආර්ථික හේතු සාධක නිසා අත්හිටුවනු ලැබී ය.

රූපවාහිනි කර්මාන්තය තුළ එවකට ක්‍රියාත්මක වූ ජාතික රූපවාහිනී පද්ධති කොමිසම (NTSC) විසින් RCA තාක්ෂණයට අනුකූලව වර්ණ රූපවාහිනී ක්‍රමය දියුණු කළේ ය. එය බොහෝ දුරට පවත්නා කළු හා සුදු රිසීවරයනට සමාන විය. අනෙක් අතට 1953 වන විට වාණිජ සේවා වර්ණ රූපවාහිනී විකාශන කටයුතු ආරම්භ විය.

කැනඩාව

කැනේඩියානු විකාශනය සංස්ථාව (CBC) විසින් තත්පරයට ක්ෂේත්‍ර 60 ක් ක්‍රියා කරන ඇමරිකානු තරංග 625 - තිව්‍රතා B/W සේවාව සිය විකාශන කටයුතුවල සම්මත ප්‍රමිතිය ලෙස යොදා ගත්තේ ය. කැනඩාවේ රූපවාහිනී විකාශන කටයුතු, 1952 සැප්තැම්බර් මස සිට ආරම්භ කළේ ය. එහි ප්‍රථම විකාශන කටයුතු එහි මොන්ට්‍රියෙල්හි පිහිටි ක්විබෙක් CBFT රූපවාහිනී මධ්‍යස්ථානයේ සිට 1952 සැප්තැම්බර් මස 06 වැනි දින විසුරුවා හැරියේ ය. එහි මුල් වැඩසටහන් ඉංග්‍රීසි හා ප්‍රංශ යන ද්විභාෂාවලින්ම කථනය විය. එයට දින දෙකකට පසුව, එනම් 1952 සැප්තැම්බර් මස 08 වැනි දින ටොරොන්ටො හි පිහිටි ඩන්ටාරියෝ මධ්‍යස්ථානය වන CBFT රූපවාහිනි සේවාව, විකාශනය කටයුතු ආරම්භ කළේ ය. මෙය කැනඩාවේ ඉංග්‍රිසි කථාකරන්නන් ගේ ප්‍රධාන රූපවාහිනි විකාශන මධ්‍යස්ථානය බවට පත්වන අතර, එම ශතවර්ෂය තුළ මොන්ට්‍රියෙල්හි CBS ආයතනයේ දෙවන ඉංග්‍රීසි භාෂා රූපවාහිනී මධ්‍යස්ථානය ආරම්භ කිරීමෙන් අනතුරුව CBFT සේවාව තුළ ප්‍රංශ භාෂා රූපවාහිනී විකාශන කටයුතු ද ආරම්භ කළේ ය. CBC හි ප්‍රථම පෞද්ගලික හිමිකාරිත්වය දරන රූපවාහිනී මධ්‍යස්ථානය වන CKSO රූපවාහිනී සේවාව 1953 ඔක්තෝබර් මස ඩන්ටාරියෝහි සුඩ්බරි හි ආරම්භ විය. මෙය සියලු ම පෞද්ගලික රූපවාහිනී සේවාවන්ට CBC සමඟ අනුසන්ධානගත වීමට සිදුවිය. මේ අතර 1960 - 61 කාලය තුළ CTV රූපවාහිනිය කැනඩාවේ දෙවැනි ජාතික ඉංග්‍රීසි භාෂා රූපවාහිනී ජාලය ස්ථාපිත කළේ ය.

ප්‍රංශය

1930 දශකය තුළ ප්‍රථම වරට රූපවාහිනී විකාශනය පිළිබඳ අත්හදාබැලීම් ප්‍රංශය තුළ ආරම්භ විය. නමුත් රූපවාහිනී නව තාක්ෂණික මෙවලම් හා භාවිත ප්‍රංශය තුළ කියා කිරීමට පටන්ගත්තේ මන්දගාමීව ය.

1929 නොවැම්බර් මස ප්‍රංශයේ ප්‍රථම රූපවාහිනී සමාගම වන “Television - Baird - Natan” බර්නාඩ් නටන් විසින් ස්ථාපනය කළේ ය. 1931 අප්‍රේල් 14 වන දින රෙනේ බර්තෙලෙම් විසින් තෙවන තරංග තීව්‍රතා සම්මත ප්‍රමිතිය භාවිත කරමින් ප්‍රථම සම්ප්‍රේෂණය සිදු කළේ ය. 1931 දෙසැම්බර් 06 වැනි දින හෙන්ඩ්‍රි ද ෆ්‍රාන්ස් විසින් CGT නමින් තවත් රූපවාහිනී සමාගමක් ආරම්භ කළේය. කළු සහ සුදු

වශයෙන් තරංග 60 ක තිව්‍රතා (definition - 60 - line) රූපවාහිනී වැඩසටහනක් සතියකට පැය එක බැගින් වන පරිදි අත්හදා බැලීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළේ ය. එය "පැරිස් රූපවාහිනිය" නමින් ආරම්භ කළ අතර, 1933 මුල භාගයේ සිටම දිනපතා විකාශනය විය.

ප්‍රංශයේ ප්‍රථම නිල රූපවාහිනී නාලිකාව 1935 පෙබරවාරි මස 01 වැනි දින ආරම්භ විය. එය ප්‍රංශයේ නිල වශයෙන් රූපවාහිනි නාලිකාවක් ආරම්භ වූ දිනය ලෙස සැලකේ. එය තරංග 60 - තරංග ඔස්සේ ප.ව. 8.15 සිට ප.ව. 8.30 දක්වා විකාශනය විය. එම වැඩසටහන පැරීසියේ Radio - PTT ඡායාරූපාගාරයේ සිට බීට්‍රිස් බ්‍රෙටි නම් නිළිය විසින් ඉදිරිපත් කළේය. එම විකාශනය 100 Km දුරකට සම්ප්‍රේෂණය විය. 1935 නොවැම්බර් මස 10 වැනි දින ප්‍රංශයේ තැපැල් ඇමති ජෝර්ජ් මැන්ඩෙල් විසින් තරංග 180 -ක තිව්‍රතාව සහිත ප්‍රථම විකාශනය අයිෆල් කුළුණේ සිට විසුරුවා හැරියේ ය. නොවැම්බර් මස 18 වන දින එහි ප්‍රථම නිවේදක වශයෙන් කටයුතු කළ සුසී වින්කර් විසින් ප.ව. 5.00 සිට ප.ව. 7.30 දක්වා කාලය තුළ පුවත්පත් සඳහා රූපවාහිනී ඉදිරිපත් කිරීමක් කළේ ය. 1937 ජනවාරි මස 04 වැනි දින සිට රූපවාහිනිය පෙ.ව. 11.00 සිට 11.30 දක්වාත්, ප.ව. 8.00 සිට 8.30 දක්වා සතියේ දිනවල ද, ප.ව. 5.30 සිට ප.ව. 7.30 දක්වා ඉරිදා දිනවල ද නිතිපතා විකාශන කටයුතු ආරම්භ කළේ ය.

1939 වන විට පුද්ගලික රූපවාහිනි යන්ත්‍ර 200 සිට 300 දක්වා ප්‍රමාණයක් තිබුණි. ඇතැම් ඒවා මහජනයා නිතර එක්රැස්වන තැන්වල තබා තිබුණි.

දෙවන ලෝක යුද්ධය සඳහා ප්‍රංශය අවතීර්ණ වීමත් සමඟම, රූපවාහිනි විකාශනය නතර විය. එමෙන්ම අයිෆල් කුළුණේ තැන්පත් කර තිබූ සම්ප්‍රේෂකය විනාශ කර දමන ලදී. 1940 සැප්තැම්බර් මස 03 වැනි දා ජර්මන් වෘත්තික හමුදාව විසින් ප්‍රංශ රූපවාහිනිය අල්ලා ගන්නා ලදී. පරිගණක සමාගම සහ Telefunken රූපවාහිනී විකාශනය සමඟ තාක්ෂණික ගිවිසුමක් ඇති කරගන්නා ලදී. ජර්මන් තැපැල් අමාත්‍යාංශය සහ ජාතික රේඩියෝ ප්‍රචාරය (Vichy ගේ ගුවන්විදුලිය) සමඟ මූල්‍ය එකඟතාවක් ඇති කරගනිමින් එහි සේවය ආරම්භ කළේ ය. 1943 මැයි මස 07 වැනි දින ප.ව. 3.00 ට සන්ධ්‍යා විකාශනය ආරම්භ කළේ ය.

පැරීස් රූපවාහිනියේ ප්‍රථම විකාශනය rue Cognace - Jay හි සිට විසුරුවා හැරියේ ය. නිතිපතා විකාශනය වන අතර, එය දිනකට පැය 5 1/4 ක පමණ කාලයක් 1944 අගෝස්තු 16 වැනි දින දක්වා විකාශනය විය. හමුදා සෙබළුන්ගේ ආරෝග්‍යා ශාලාවල විකාශන කටයුතු සිදු කිරීම සඳහා 441 තරංග තිව්‍රතා රූපවාහිනී යන්ත්‍ර සවිකර තිබුණි. අයිෆල් කුළුණේ සවිකර තිබූ සම්ප්‍රේෂක ඔස්සේ නාවික හමුදාව විසින් රූපවාහනී සම්ප්‍රේෂණය පාලනය කිරීම දකුණු එංගලන්ත වෙරළ තීරයේ පිහිටි RAF සහ BBC ඉංජිනේරුවන් විසින් තරංග ලබාගැනීම තෙක් විශාල ප්‍රදේශයකට එය බලපාන ආකාරයෙන් ක්‍රියාත්මක කළේය.

1944 දී රෙනේ බර්තලම්යු විසින් 819 තරංග තිව්‍රතා රූපවාහිනි ප්‍රමිතිය වැඩිදියුණු කළේය. යුද්ධය පැවති කාලය තුළ බර්තලමියු විසින් රූපවාහිනි තරංග සම්ප්‍රේෂණ සම්මත ප්‍රමිතිය 1015 සහ 1042 තරංග තිව්‍රතා දක්වා වැඩිදියුණු කළේය. යුද්ධයෙන් ප්‍රංශය නිදහස් කර ගැනීමත් සමඟම 1944 ඔක්තෝබර් මස 01 වැනි දින රූපවාහිනි සේවා නැවත ක්‍රියාත්මක කළේය. විකාශන කටයුතු Cognace - Jay

ඡායාරූපාගාරයේ සිට සම්ප්‍රේෂණය කළේය. 1945 ඔක්තෝබර් මස අයිෆල් කුළුණේ තිබූ සම්ප්‍රේෂකය නැවත ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව නැවත ක්‍රියාත්මක කළේය. 1148 මිටරන්ඩ් රූපවාහිනී සේවාව 819 තරංග තිව්‍රතා විකාශන ප්‍රමිතියකින් විකාශන කටයුතු කළේ ය. යුරෝපීය රටවල් අතුරින් එතරම් ප්‍රමිතියකින් රූපවාහිනී විකාශන කටයුතු කළේ ප්‍රංශයයි. අනෙක් රටවල් 625 තරංග තිව්‍රතා ප්‍රමිතියකින් ක්‍රියාත්මක කළේ ය.

ජර්මනිය

1929 විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනී විකාශනය ආරම්භ විය. නමුත් ඒ 1934 තෙක් ශබ්දය නොමැතිව නිහඬ රූපවාහිනී විකාශනයක් ලෙසය. 1935 මාර්තු මස 22 වැනි දින රූපවාහිනී විද්‍යුත් ජාල සේවා ආරම්භ විය. ඒ සඳහා නිප්කොව් තැටිය භාවිත කරමින් කැමරා, අන්තර් මාධ්‍යයක චිත්‍රපට ක්‍රමය, ටෙලිසින් චිත්‍රපට සම්ප්‍රේෂණ භාවිතයෙන් 180 තරංග තිව්‍රතාව යොදා ගෙන තිබේ.

Iconoscope උපකරණ භාවිතයෙන් කැමරා යොදා ගෙන රූපවාහිනී සංඥා සම්ප්‍රේෂණය 1936 ජනවාරි මස 15 වන දින ආරම්භ විය. 1936 අගෝස්තු මස බර්ලින් සහ හම්බර්ග් යන නගරවලට කැමරා සහ අන්තර්මාධ්‍යයක චිත්‍රපට කැමරා සහ සියලුම විද්‍යුත් උපකරණ යොදාගෙන බර්ලින් හි වසන්ත කාලයේ පැවැති ඔලිම්පික් ක්‍රීඩා තරඟ රූපවාහිනී විකාශන කටයුතු කළේය. රූපවාහිනී යන්ත්‍ර පෞද්ගලිකව ගෙවල්වල නොමැති අය සඳහා නැරඹීමට අවශ්‍ය මහජන රූපවාහිනී කාමර 28 ක් සකස් විය. 1937 පෙබරවාරි මස වන විට ජර්මනියේ රූපවාහිනී විකාශන කටයුතු සඳහා 441 තරංග තිව්‍රතා ක්‍රමය භාවිත විය. දෙවන ලෝක යුධ සමය තුළ එම ප්‍රමිතිය ප්‍රංශය වෙත ඇදී ගියේය. ප්‍රංශයේ අයිෆල් කුළුණ ඔස්සේ එම රූපවාහිනී තරංගසම්ප්‍රේෂණය කළේය.

ඇමරිකානු යුධ හමුදා රේඩියෝ ජාලය, දෙවන ලෝක යුද්ධය අවසාන වන විට ක්ෂේත්‍ර 60 කට පමණ 525 තරංග තිව්‍රතා ප්‍රමිතිය භාවිතයෙන් ඇමරිකානු රූපවාහිනී ග්‍රාහක යොදාගෙන ජර්මනියේ ක්‍රියා කළ යුධ හමුදාවන් වෙත අවශ්‍ය වන පරිදි ඇමරිකානු රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කළේ ය. මේ අතර ඇමරිකානු විකාශන උපකරණ තවදුරටත් වැඩි දියුණු කළේය. එහිලා බල තරංග වල චලනය ඉවත් කිරීම සඳහා යුරෝපයේ තිබූ මූලික තරංග සංඛ්‍යාතයන්ට අනුව සිරස් එමෙන් තිරස් සංඛ්‍යාත අගය තරංගයක දිග ක්ෂුද්‍ර තත්පර 0.5 දක්වා වෙනස් කිරීමට අවශ්‍ය වන පරිදි හර්ට්ස් 15,750 සිට හර්ට්ස් 15,625 දක්වා වෙනස් කළේ ය. මෙම සංඥාවන් සමඟ සිරස් ආකාරයට තරංග විසුරුවා හැරීම සඳහා තරංග 625 තරංග තිවුතාසහ ස්කෑන් ක්ෂෙත්‍ර 50 ක් ඇතුළත්ව ජර්මන් ප්‍රමිතිය ලබාගැනීමට අවශ්‍ය වෙනස්කම් කරමින් ඇමරිකානු රූපවාහිනී ග්‍රාහක උපකරණ සකස් විය. මෙම AFN ක්‍රමය, පසුව PAL ප්‍රමිතිය බවට පත්ව එය ජර්මනියේ ස්වදේශීක රූපවාහිනී ක්‍රමය බවට පත් නොවීය. NTSC 486 දෘෂ්‍ය තරංග ප්‍රමිතියෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් 1960 දශකය වන විට වෝල්ටර් වෘච් විසින් දෘශ්‍ය තරංග 576 PAL තාක්ෂණය ක්‍රියාත්මක කරන PAL තාක්ෂණයට විශේෂිත YUV වර්ණ රූපවාහිනී ක්‍රමය සොයා ගන්නා ලදී.

සෝවියට් රුසියාව

සෝවියට් රුසියාව, 1931 ඔක්තෝබර් මස 31 වැනි දින මොස්කව් හිදී තරංග 30 තිව්‍රතාවකින් යුත් විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනී විකාශන කටයුතු අත්හදා බැලී ය. එමෙන්ම 1932 වන විට රූපවාහිනී යන්ත්‍ර වාණිජ වශයෙන් කර්මාන්තශාලා වල නිෂ්පාදනය වීමට පටන් ගත්තේ ය.

RCA සමාගම විසින් නිෂ්පාදනය කරන ලද උපකරණ භාවිතයෙන් 1937 මාර්තු 09 වන විට රුසියාවේ මොස්කව් නුවර විද්‍යුත් රූපවාහිනී විකාශනය ප්‍රථමවරට අත්හදා බැලීමේ කටයුතුවල නිරත විය. 1938 දෙසැම්බර් මස 31 වන විට නිතිපතා කෙරෙන විකාශන කටයුතු ආරම්භ විය. මෙහි භාවිත කළ 343 ක තරංග තිව්‍රතාව දිගු කාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නොවී ය. එම නිසා 1940 වන විට තරංග 441 කතිව්‍රතාව මේ සඳහා වැඩි දියුණු කළේ ය. එය 1944 වන විට 625 තරංග තිවුතාවක ප්‍රමිතිය පැමිණීමත් සමඟ වෙනස් විය. අවසානයේදී මෙම රූපවාහිනී තාක්ෂණික ප්‍රමිතිය රුසියාවේ එවකට ජාතික ප්‍රමිතිය ලෙස සනාථ විය.

1948 නොවැම්බර් 04 දා සිට මොස්කව් නුවර තරංග 625 ක තිව්‍රතාව ආකෘතිය අත්හදා බැලීමේ සම්ප්‍රේෂණ කටයුතු සඳහා භාවිත කළේය. ඒ අතර නිතිපතා විකාශන කටයුතු 1949 ජුනි මස 16 වන දින සිට ආරම්භ විය. මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමට GOST 7845 - 55 විශේෂ තාක්ෂණයෙන් යුතුව කළු හා සුදු රූපවාහිනිය 1955 සිට යොදා ගත්තේ. එහි සංයුතිය තුළ රූප රාමු ප්‍රමාණය තරංග 625 ක තිව්‍රතාවකින් සකස් විය. රූප රාමු වල අගය රාමු 25 සහ විඩියෝ තරංග ආයාමය මෙගාහර්ට්ස් 6 පමණ විය. ප්‍රධාන සංඛ්‍යාතය හර්ට්ස් 50 වන තෙක් භාවිත කරන බොහොමයක් රටවල රූපවාහිනී තාක්ෂණය තුළ ඉහත සඳහන් පරාමිතීන් සම්මත තත්වය බවට පත් විය. ඒ සංඥා අද දක්නට ලැබෙන PAL හා SECAM රූපවාහිනි ක්‍රම වල පදනම බවට පත් විය.

1951 දී 625 තරංග තිව්‍රතා ප්‍රමිතියෙන් යුතුව විකාශන කටයුතු ආරම්භ වීමත් සමඟ, රුසියාවේ බොහොමයක් නගරවල රූපවාහිනි ක්‍රමය බවට මෙම තතත්වය පත් විය. වර්ණ රූපවාහිනියේ විකාශන කටයුතු SECAM වර්ණ රූපවාහිනී ක්‍රමය භාවිතයෙන් 1974 වන විට ආරම්භ විය.

ජපානය

1979 දී ජපානයේ විකාශන සේවාව වන NHK මගින් ප්‍රථමවරට ඉහළ තිව්‍රතාවක් සහිත පාරිභෝගික රූපවාහිනියක් 5:3 ධාවන අනුපාතයකින් වැඩිදියුණු කළේ ය. මෙම රූපවාහිනී ක්‍රමය Hi - Vision හෝ MUSE වශයෙන් හඳුන්වනු ලැබේ. ඒ සඳහා පවතින NTSC ක්‍රමයේ පවතින ධාරිතාව මෙන් දෙගුණයක තරංග ආයාමයකින් යුත් එකක් මෙහි සංඥාගත කිරීම සඳහා අවශ්‍ය විය. නමුත් එහි තිව්‍රතාව (1080i/1125 lines) සිව්ගුණයකින් වැඩි වූ ප්‍රමාණයකින් භාවිත කිරීමට අවශ්‍ය විය. 1989 දී චන්ද්‍රිකා රූපවාහිනී අත්හදා බැලීමේ කටයුතුවල නිරත වූහ. එහි නිතිපතා විකශන කටයුතුවල අත්හදාබැලීම් 1991 දී ආරම්භ විය. ඒ අනුව 1994 නොවැම්බර් 25 වැනි දින BS - 9ch ප්‍රමාණයෙන් නිතිපතා රූපවාහිනී විකාශන කටයුතු ආරම්භ විය. මෙය වාණිජ විශේෂාංග හා NHK රූපවාහිනී වැඩසටහන් සමඟ ක්‍රියාත්මක විය.

සෝනි (Sony) සමාගම විසින් 1981 අප්‍රේල් මස ඇල්ජියර්ස් හි පැවති රූපවාහිනී ඉංජිනේරුවරුන්ගේ ජාත්‍යන්තර සමුළුවකදී වීඩියෝ කැමරාවක්, රූපවාහිනී යන්ත්‍රයක් හා වීඩියෝ - ටේප් රෙකෝඩරයක් (VTR) භාවිතයෙන් පුළුල් ඇනලොග් ඉහළ සංඛ්‍යාතයේ රූපවාහිනී ක්‍රමයක් වන HDTV රූපවාහිනිය ප්‍රථමවරට ක්‍රියාත්මක කළේ ය. 1981 අප්‍රේල් මස HDVS පරිමාණයේ රූපවාහිනිය ද ක්‍රියාත්මක කළේය. එයට HDC - 100 කැමරාව, HDV - 100 වීඩියෝ රෙකෝඩරය සහ HDS - 100 වීඩියෝ ස්විචය සමඟ ක්‍රියාත්මක කළේ ය. මේ සඳහා තාක්ෂණික මෙවලම් ලෙස 1125 - තරංග තිව්‍රතාව වර්ගයේ වීඩියෝ ක්‍රමය Interlaced Video සහ 5:3 ප්‍රමාණයෙන් භාවිත කළේය.

රූපවාහිනී තාක්ෂණික නව සොයා ගැනීම්

ප්‍රථම සජීවී රූපවාහිනී විකාශනය ඇමරිකාවේ සිදුවූයේ 1951 සැප්තැම්බර් 04 වැනි දින ය. ඒ ඇමරිකාවේ ජනාධිපති හැරී ටෘමන් විසින් කැලිෆොනියාවේ සැන් ෆ්‍රැන්සිස්කෝ නුවර පැවති ජපන් සාම ගිවිසුම් සමුළුව අමතා කළ කථාව විකාශනය කිරීමයි. මෙය දේශීය වෙළෙඳපලට අවශ්‍ය විකාශන මධ්‍යස්ථාන වෙත සැපයීම සඳහා ක්ෂේත්‍ර තරංග රේඩියෝ ක්‍රමය සහ AT සහ T යන කේබල් තරංග ආශ්‍රයෙන් මහද්වීප අතර විකාශනය කළේ ය.

ප්‍රථමවරට වෙරළ තිර දෙකක් හා අතර සම්ප්‍රේෂණය කළ වාණිජ රූපවාහිනී සජීවී විකාශනය 1951 නොවැම්බර් මස 18 දින සිදු විය. මෙය සැන් ෆ්‍රැන්සිස්කෝ හි ගෝල්ඩන් ගේට් බ්‍රිජ් සහ නිව්යෝර්ක් නගරයේ බෘක්ලීන් බ්‍රිජ් හි අතර දෙකඩ තිරයක් මත දර්ශනය වූ CBS රූපවාහිනී සේවාවේ “See it now” යන වැඩසටහනයි. 1958 දී රූපවාහිනිය ලොව දිගුම රූපවාහිනී ජාලය නවා ස්කොටියා හි සිඩ්නි නුවර සිට බ්‍රිටිෂ් කොළොම්බියා හි වික්ටෝරියා දක්වා විසුරුවා හැරියේ ය. වාර්තා වන අන්දමට එසැනින් පුවත් (Breaking News) වැඩසටහනක එක දිගට සිදු කළ සජීවී රූපවාහිනී වැඩසටහන මෙකළ CBS මගින් විසුරුවා හැරියේය. ඒ 1958 ඔක්තෝබර් මස 23 වැනි දින ස්ප්‍රින්හිල් හි දී සිදුවූ පතල් ආපදාව වාර්තා කරමිනි.

1970 දශකය තුළ කේබල් සහ චන්ද්‍රිකා රූපාවහිනී තාක්ෂණය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟම රූපාවහිනී නාලිකා ගණනාවක් ආරම්භ වූ අතර, විශේෂයෙන්ම එමගින් ව්‍යාපාරිකයන්ට සුවිශේෂී ග්‍රාහක කණ්ඩායම් ඉලක්ක කර ගත් වැඩසටහන් මාලා ද සකස් වන්නට විය. මේත් සමඟ මුදල් ගෙවා රූපවාහිනිය විකාශනය ලබාගැනීමේ ප්‍රවණතාව ද කරලියට පැමිණියේ ය. ඒ අතර හෝම් බොක්ස් ඩෆීස් (HBO) සහ ඇමරිකානු ෂෝටයිම් වැඩසටහන් මෙන්ම බ්‍රිතාන්‍යයේ ස්කයි රූපවාහිනිය ද (SKY T.V) මුල් තැන ගනී.

රූපවාහිනී යන්ත්‍ර

විද්‍යුත් යාන්ත්‍රික රූපවාහිනිය ක්‍රියාත්මක වූ කාලයේදී වාණිජ වශයෙන් නිෂ්පාදනය කළ රූපවාහිනී යන්ත්‍ර ඇ.එ. ජනපදය, සෝවියට් රුසියාව යන රටවල 1928 සිට 1934 දක්වා කාලය තුළ ක්‍රියාත්මක විය. මුලින්ම 1928 බ්‍රිතාන්‍යයේ දී ජෝන් ලොගී බෙයාර්ඩ් විසින් නිපදවූ රූපවාහිනී උපකරණය බොහෝ දුරට තිබූ ගුවන්විදුලි යන්ත්‍රයට සවිකළ රූපවාහිනී මෙවලමක් පමණි. එහි නියෝන් නාලය, හා

රතු පැහැයෙන් යුතු මුද්දරයක ප්‍රමාණයෙන් වන ප්‍රතිබිම්බ සකස් කරන විවර දාමයකින් (Spiral) සමන්විත Spinning disk උපකරණයෙන් සමන්විත ය. එම මුද්දරයක ප්‍රමාණයේ ප්‍රතිබිම්බය විශාලනය වන වීදුරුවක් භාවිත කරමින් දෙගුණයක් දක්වා ප්‍රමාණයකින් පෙන්වනු ලැබී ය. බොයාර්ඩ්ගේ "Televisor" නැමැති උපකරණය, රේඩියෝවක් නොමැතිව ද ක්‍රියාත්මක කළ හැක. 1930 සිට 1933 දක්වා කාලය තුළ ප්‍රථම වරට විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර "Televisor" නමින් හැඳින්වී ය. ඒවා දහස් ගණනින් අලෙවි විය.

කැතෝඩ කිරන නාලය සහිතව ප්‍රථමවරට වාණිජ වශයෙන් නිෂ්පාදනය කරන ලද විද්‍යුත් රූපවාහිනිය 1934 දී ජර්මනියේ Telefunken ආයතනය විසින් නිෂ්පාදනය කළේ ය. ඒ අනුව යමින් බ්‍රිතාන්‍යයේ 1936 ද, ප්‍රංශයේ 1936 ද, ඇමරිකාවේ 1938 ද විද්‍යුත් රූපවාහිනි යන්ත්‍ර නිපදවි ය. අගල් තුනක (8 Cm) රූපවාහිනී දර්ශන තලයකින් සමන්විත ප්‍රතිබිම්බය පමණක් දැකගත හැකි වන පරිදි නිපදවූ රූපවාහිනිය, දෙවන ලෝක යුද්ධයට කලින් කර්මාන්ත ශාලාවල නිපද වූ මිල අඩුම රූපවාහිනී යන්ත්‍රයයි. එය ඇමරිකානු ඩොලර් 125 ක් විය. 2007 දී එම උපකරණයම ඇ.ඩො. 1,863 කි. එකල මිල අධිකම රූපවාහිනිය අගල් 12 (30 cm) දර්ශන තලයකින් යුත් ඇ.ඩො. 445 ක මිල වන රූපවාහිනියයි (එය 2007 දී ඇ.ඩො. 6,663 කි).

දෙවන ලෝක යුද්ධයට පෙර ආසන්න වශයෙන් නිෂ්පාදනය කළ විද්‍යුත් රූපවාහිනි යන්ත්‍ර ප්‍රමාණය බ්‍රිතාන්‍යයේ 19,000 ක් ද ජර්මනියේ 1,600 ක් ද විය. එකල රූපවාහිනි යන්ත්‍ර ඇමරිකාවේ 70,000 ත් 80,000 ත් අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කළේ ය.

යුද්ධයට පෙර 1942 දී රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය නතර කළේය. එය නැවත ආරම්භ වන්නේ 1945 අගෝස්තු මසය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇමරිකාව තුළ රූපවාහිනි යන්ත්‍ර භාවිත කිරීම ඉතාමත් වේගයෙන් ඉහළ නැංගේය. ඒ කෙරෙහි පහත තත්වයන් හේතු විය.

- නිෂ්පාදනය වේගයෙන් ඉහළ නැගීම.
- යුද්ධයට සම්බන්ධ තාක්ෂණයන් නැවතත් වැඩි දියුණු වීම.
- බටහිර ලෝකය පුරා රූපවාහිනී ජාල ක්‍රමිකව ව්‍යාප්ත වීම.
- විශාල වශයෙන් රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කිරීම නිසා යන්ත්‍ර වල මිල පහත වැටීම.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු විවේක කාලය ක්‍රමයෙන් වැඩි වීම.
- අතිරේක වශයෙන් තැන්පත් කළ ආදායම් වැඩිවීම.

1947 දී මෝටරෝලා (Motorola) සමාගම විසින් ඇ.ඩො. 189.95 මිලකට හඳුන්වාදුන් රූපවාහිනිය ප්‍රථම වරට ඇ.ඩො. 200 මිලකට අලෙවි කිරීමත් සමඟම එය ඇමරිකානුවන්ට දැරිය නොහැකි මිලක් බවට පත්වෙමින් මිලියන ගණනින් අලෙවි විය.

1946 වන විට ඇමරිකානු ගෘහයන්ගෙන් 0.5% ක පමණ ප්‍රමාණයක තිබූ රූපවාහිනි යන්ත්‍ර එය, 1954 වන විට 55.7% ක් ද, 1962 වන විට 90% ක් ද බවට පත් විය.

1947 වන විට බ්‍රිතාන්‍යයේ ගෘහයන් 15,000 ක පමණ රූපවාහිනි යන්ත්‍ර තිබුණි. එය 1952 මිලියන 1.4 ක්ද, 1968 මිලියන 15.1 ක් ද බවට පත් විය.

වසර ගණනක් යනතෙක් විවිධ රටවල පැවති රූපවාහිනි තාක්ෂණික ප්‍රමිති එකිනෙකට වෙනස් විය. ප්‍රංශය විසින් ජර්මනිය තුළ තරංග 441 තිව්‍රතා ප්‍රමිතිය භාවිත කළ අතර, එය පසුව 819 තිව්‍රතා ප්‍රමිතිය දක්වා වර්ධනය විය. එමගින් ඕනෑම ඇනලොග් රූපවාහිනි ක්‍රමයකින් වඩා හොඳ පැහැදිලි පින්තූර ලබා දුන්නේය. එය ආසන්න වශයෙන් බ්‍රිතාන්‍යයේ පැවති 405 තරංග තිව්‍රතා ක්‍රමය මෙන් දෙගුණයක ගුණාත්මකතාව සහිත ප්‍රමිතියකි. මෙහිදී කැමරාවලට තිබූ අගය මෙන් සිව් ගුණයක පටිගත කිරීමක් සිදු විය.

මේ සමඟ තරංග ආයාමය සිව් ගුණයකින් වැඩි විය. Pixel එකක් සමඟ ප්‍රමාණයද 1/4 ක් බවට පත් විය. ඒ හා සමානව සංවේදීතාව ද අඩු විය. 819 තිව්‍රතා කැමරාව එයට අමතරව කිසිම දෙයක් අත්කර ගත්තේ නැත. වර්ණ සම්ප්‍රේෂණ කටයුතු සඳහා මෙය න්‍යායිකව භාවිත කළේය. බොහොමයක් යුරෝපීය රටවල් භාවිත කළ CCIR ක්‍රමය තුළ ප්‍රංශය නැවතත් 625 තිව්‍රතා ප්‍රමිතියට පැමිණයේ ය.

බොහෝ යුරෝපීය රටවලට වර්ණ රූපවාහිනිය පැමිණීමත් සමඟම PAL ප්‍රමිතිය භාවිත කළේය. ප්‍රංශය, සොවියට් රුසියාව යන බොහොමයක් නැගෙනහිර යුරෝපය රටවල් SECAM රූපවාහිනී තාක්ෂණය යොදා ගත්තේ ය. උතුරු ඇමරිකාව NTSC 525තරංග තිව්‍රතා ප්‍රමිතිය භාවිත කරමින් වර්ණ රූපවාහිනිය පුළුල් කිරීම සඳහා යොදාගත්තේ ය. එහිදී රූප රාමුවල අගය තරමක් අඩු විය.

1960 දශකය පුරාම රූපවාහිනි යන්ත්‍ර තුළ වැකුම් නාල ඉලෙක්ට්‍රොනික තාක්ෂණය භාවිත කළේය. මෙමගින් තරමක විශාල, බර දැරිය නොහැකි රූපවාහිනි යන්ත්‍ර බිහි විය. මෙයට අමතරව වැකුම් නාල වර්ණ රූපවාහිනිය තුළ දුර්වල අන්දමින් ක්‍රියා කළේ ය. තුනී ස්වරූපය ගොඩනැගීම සඳහා විශාල ප්‍රමාණයක නාල අවශ්‍යවීම එයට හේතුවයි. වැකුම් නාල මගින් බොහෝ සරල NTSC/PAL පෙරහන් ඔස්සේ ඉතාමත් දුර්වල වර්ණ රූපවාහිනි තත්වයක් දක්නට ලැබුණි. එමෙන්ම එහා මෙහා රැගෙන යා හැකි රූපවාහිනී වල වර්ණ ප්‍රතිබිම්බ වල පැහැදිලිබව ලාබගැනීම සඳහා විශාල ප්‍රමාණයක නාල අවශ්‍ය විය.

1970 දශකය මුල් කාලයේදීම ස්ථිති විද්‍යුත් තාක්ෂණික මෙවලම් බිහිවීමෙන් වර්ණ රූපවාහිනීවල නාල වෙනුවට එම ඉලෙක්ට්‍රොනික න්‍යාය භාවිත විය. මෙමගින් වඩාත් පැහැදිලි, ඇදහිය හැකි රූප වර්ණ රූපවාහිනිය තුළින් ලබාගැනීමට හැකි විය. 1971 දී ප්‍රථමවරට වර්ණ රූපවාහිනිය කළු හා සුදු රූපවාහිනියට වඩා වේගයෙන් අලෙවි විය. අනෙක් රටවලට වර්ණ රූපාවහිනිය ක්‍රමයෙන් මන්දගාමීව අවතීර්ණය විය. එමෙන්ම 80 දශකය අගවන තෙක් යුරෝපීය රටවල වර්ණ රූපවාහිනිය පොදු ජනප්‍රිය රූපවාහිනිය බවට පත් නොවී ය.

1965 දී FCC ය විසින් ඇ.එ. ජනපදයේ විකුණන ලද සියලු ම රූපවාහිනි යන්ත්‍ර සඳහා UHF තාක්ෂණය බද්ධ කිරීමට කටයුතු කළේය. 1971 වන විට රටේ UHF මධ්‍යස්ථාන 170 ක් මේ සඳහා භාවිත කළේ ය. දේශීය වැඩසටහන් සඳහා අවම බලයක් එහි ක්‍රියාත්මක විය. මුල් කාලයේදී රූපවාහිනි යන්ත්‍ර නිෂ්පාදකයින් විසින් UHF තාක්ෂණය ලබා දුන්නේ විටින් විට ය. බොහොමයක් රූපවාහිනි යන්ත්‍ර

කර්මාන්ත ශාලාවලින් එම UHF උපකරණය යන්ත්‍රයට සවි කර නොතිබුණු. ඒ වෙනුවට UHF Tuner නැමැතිඅතිරේක මෙවලමක් බහාලිය හැකි අන්දමින් හිස් අවකාශයක් රූපවාහිනි යන්ත්‍රය තුළම සකස් කර තිබුණි.

1970 දශකය තුළ රූපවාහිනි යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා දුරස්ථ පාලක යන්ත්‍ර බිහිවිය. මෙම දුරස්ථ පාලක තාක්ෂණය මුලින්ම භාවිත කළේ 1950 දශකය තුළ සොනිත්ගේ අවකාශ ඇණවුම් පාලකය ඔස්සේය. නමුත් මේවා රූපවාහිනිය හා සම්බන්ධ ඉහළ හඬ සංඛ්‍යාතයක් සහිත යාන්ත්‍රික මෙවලමකි. 1980 දශකය තෙක් ප්‍රථම විද්‍යුත් ඉලෙක්ට්‍රොනික දුරස්ථ පාලක දැකගැනීමට නොහැකි විය.

1980 දශකය තුළ රූපවාහිනි තාක්ෂණික අත්හදා බැලීම් මූලික වශයෙන් ඉහත ලක්ෂණ වලට අනුව හඳුනාගත හැක. කේබල් රූපවාහිනියේ නැගීමත් සමගම විද්‍යුත් ඉලෙක්ට්‍රොනික රූපවාහිනි සුසරයන් ද අතින් අතපැතිර ගියේ ය. එමෙන්ම අනලොග් කොම්බ් පෙරහනු ද 70 දශකය තුළ ඉහළ තාක්ෂණික රූපවාහිනී යන්ත්‍ර තුළ භාවිත විම වඩාත් ජනප්‍රිය විය. මේ අතර කළු හා සුදු රූපවාහිනිය (අගල් 05 ක් ප්‍රමාණයෙන් යුත් බැටරියෙන් ක්‍රියාකරණ ආකෘතිය හැරෙන්නට) ඇමෙරිකානු වෙළෙඳපලෙන් ක්‍රමයෙන් ඉවත් වන්නට විය.

1988 දී LCD රූපවාහිනිය හඳුන්වා දුන්නේ ය. එය අතින් ගෙන යා හැකි ඉතාමත් කුඩා කළු හා සුදු දර්ශන තලයෙන් යුත් 480 - තරංග තිව්‍රතා NTSC පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොකළ හැකි මෙවලමකි. 1990 දශකය තුළ ඉහළ රූපවාහිනී තාක්ෂණික යන්ත්‍ර තුළ තරංග තිව්‍රතා තුනක් ඇති ඩිජිටල් කොම්බ් පෙරහනු සහිතව ක්‍රියා කළේ ය. මෙයට අමතරව, විඩියෝ ක්‍රීඩා සහ VCR රූවාහිනී සඳහා අවශ්‍ය Composite Video හා S- Video තාක්ෂණික මෘදුකාංග මෙකල බිහිවිය.

2009 ජුනි 12 වන විට ඩිජිටල් භූගෝලීය රූපවාහිනිය (DTV) නැතහොත් ඩිජිටල් තාක්ෂණයෙන් පමණක් ක්‍රියාකරණ විකාශනය බිහිවීමත් සමගම ඇ.එ. ජනපදය තුළින් ඇනලොග් විකාශන රූපවාහිනි තාක්ෂණය අවසන් විය.

රූපවාහිනියේ ස්වර්ණමය අවධිය

ඇමරිකාව තුළ රූපවාහිනියේ ස්වර්ණමය අවධිය 1940 දශකයෙන් පසුව 1950, 60 දශක පුරා දක්නට ලැබේ.

මුල්කාලින රූපවාහිනී නාට්‍ය දෙස බැලීමේදී පැය ගණනක් දිග ටෙලි නාට්‍ය මාලා දැකගැනීමට හැකි විය. එමෙන් ම මේ පිළිබඳ නොයෙකුත් විචාර ද පළ විය.

1950 දශකයේ මැදභාගය තුළ රූපවාහිනී සජීවි නාට්‍ය අතර ඇල්ෆ්‍රඩ් හිච්කොක් ගේ The Twilight Zoneසහ Presents යන නාට්‍ය විකාශනය වීමත් සමඟ රූපවාහිනියේ ස්වර්ණමය යුගය වශයෙන් එය හඳුනාගත ගත හැක. මේ අතර 50 දශකයේ මූලිකත්වය ගත් රූපවාහිනී නාට්‍යකරුවකු සමඟ 1960 දශකයේ රූපවාහිනී නාට්‍ය නිෂ්පදාකයෙකු වන ඩේවිඩ් සස්කයින්ඩ් පැවැත්වූ සාකච්ඡාවකදී තීරණය කළේ රූපවාහිනියේ ස්වර්ණමය යුගය ලෙස 1938 සිට 1954 දක්වා කාලය දැක්විය හැකි බවයි.

ඒ අතර මෙම ටෙලි නාට්‍ය හා රූපවාහිනියේ ස්වර්ණමය යුගය සැලකීමේදී එවකට ප්‍රකටව තිබූ රූපවාහිනී නාට්‍යයක් වන Playhouse 90 හි අවසාන කොටස 1961 විකාශනය වීමත් එමෙන්ම, ටෙලි නාට්‍ය ප්‍රධාන අධ්‍යක්ෂකවරයකු වන ජෝන් ෆ්‍රැරන්කන්හීමර් එයින් සමුගැනීමත් සමඟ මෙම ක්ෂේත්‍රයේ එවකට තිබූ ස්වර්ණමය කාලපරිච්ඡේදය අවසන් විය.

රූපවාහිනිය නව මාධ්‍යයක් ලෙස නව වැඩසටහන් නිර්මාණය කිරීමේ මූලික සංකල්ප ගණනාවක්ම හඳුනාගැනීමට එයට හැකි විය. එමෙන්ම බෙහෙවින් ජනප්‍රිය රසික අවධානය ලද (Prime time Drama) නාට්‍ය ඒවායේ මුල් ස්වරූපයෙන් හා සම්භාව්‍ය ස්වරූපවලින් නිෂ්පාදනය වීම ද හඳුනාගත හැක. ඒ අතර මුලින්ම විකාශනය වූ වොල්ට් ඩිස්නිගේ වැඩසටහන්, පීටර් පෑන්ගේ "මැරී මාර්ටින්" MGM හි සම්භාව්‍ය නාට්‍යයක් වන The Wizard of Oz මෙන්ම රොජර්ස් සහ හැමර්ස්ටයින් ගේ සින්ඩරෙල්ලා වැනි නිර්මාණ මේ අතර වැදගත් වේ.

මේ අතර නව ටෙලි නාට්‍යකරුවන්ගේ සම්ප්‍රාප්තිය පිළිබඳ විචාරකයෝ සහ ප්‍රේක්ෂකයෝ බලාපොරොත්තු සහගතව සිටියහ. ඒ අතර පැඩී චෙයේෆ්ස්කි, හෝටන් ෆූට්, ටරුඩ් මොසල්, රෙජිනෝල්ඩ් රෝස්, රොඩ් සර්ලන් ජෝන් විඩල් යන අය කැපී පෙනේ.

බොහොමයක් මෙම නට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ සජීවී නාට්‍ය මාලාවන්ගේ කොටස් වශයෙනි. ඒ අතර, The Philco Television Play house, Kraft Television theatre, සහ Play house 90 යන ඒවා කැපී පෙනේ. ෂේක්ස්පියර් ගේ නාට්‍ය අතර සිය වයස 69 දී ඔහුගේ රූපවාහිනී නාට්‍ය නිෂ්පදාන අතර පැය එකක නිෂ්පාදනයක් ලෙස "මැක්බත්" නාට්‍ය විකාශනය වී ඇත.

මුල්කාලීන රූපවාහිනී වැඩසටහන් විකාශන අතර දැකිය හැකි සීමා ද හඳුනාගත හැක. දිනකට පැය 24 පුරාම රූපවාහිනී විකාශන සිදු නොවී ය. විශේෂයෙන්ම 1990 දශකය වන තෙක් උතුරු අමරිකාවේ එය සම්ප්‍රදායක් ලෙස ක්‍රියාත්මක විය.

එමෙන් ම එකල තිබූ රූපවාහිනී තාක්ෂණයේ සීමාව විසින් ද දිනකට පැය 12 සිට 18 දක්වා කාලය තෙක් වැඩසටහන් විකාශන කටයුතු සීමා කිරීමට සිදු විය.

එමෙන් ම රූපවාහිනියේ ජනප්‍රියත්වය හමුවේ මේ කෙරෙහි දැක්වූ ප්‍රතිචාර මෙහිදී වැදගත් වේ. 1950 දශකය වන විට, අද මෙන් මිනිසුන්ගේ සමාජීය ජීවිතයේ අත්‍යාවශ්‍ය කාර්ය රූපවාහිනිය මගින් ඉටු නොවීය. කෙසේ වෙතත් 1958 පමණ වන විට රූපවාහිනිය නිවෙස්වල ප්‍රධානම විනෝදායන මාධ්‍යය බවට පත් විය. මේ අතර එතෙක් ඉහළ ග්‍රාහක ප්‍රතිචාරයක් තිබූ සිනමාව කෙරෙහි (රූපවාහිනියේ ආගමනයත් සමඟ) ග්‍රාහක ප්‍රතිචාර අඩු විය. මෙම අභියෝගය හමුවේ සිනමාගාර තුල පුළුල් තිර භාවිත කරමින් (1952) නිවෙස් තුළ දැකිය නොහැකි ආකාරයට නව තාක්ෂණික අත්දැකීම් මුසු කරමින් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇත.

රූපවාහිනියේ ස්වර්ණමය යුගය පිළිබඳ විමසීමේදී එයින් සිදු වූ සංස්කෘතික වැදගත්කම් හා සුවිශේෂිතා කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ.

1950 හා 60 දශක තුළ රූපවාහිනී ජාලගත වැඩසටහන් විකාශනය වීමත් සමඟම එතෙක් තිබූ සම්භාව්‍ය ඉහළ සංස්කෘතිය වාණිජ ජාල රූපවාහිනිය විසින් යටත් කරගන්නා ලදී. ලියොනාඩ් බර්නස්ටයින් හා ආතුරෝ ටොස්කනිති යන නළුවන් ප්‍රථම වරට රූපවාහිනියේ පෙනී සිටීමත් එය ප්‍රථම වරට කානගී ශාලාවේ සිට විකාශනය කිරීමත් මෙහිදී දැකගත හැක.

එමෙන්ම ෂේක්ෂ්පියර්ගේ කෘතීන් ප්‍රථම වරට ඇමරිකානු සජීවී නාට්‍ය විකාශන ලෙස දැක්විය හැක. එමෙන් ම චෙකොව්ස්කිගේ The Sleeping Beauty, The Nutcracker යන ඒවා මෙන්ම විශේෂයෙන්ම රූපවාහිනිය සඳහා නිබන්ධනය කළ ඔපෙරා වන Amahl and the Night Visitors යන ඒවා හඳුනා ගත හැක.

එමෙන්ම මෙකල NBC රේඩියෝ වැඩසටහන් විසින් සිය රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී The Bell Telephone Hour කෘතිය, සම්භාව්‍ය හා පදික වේදිකා නළු නිළියන් විසින් ඉදිරිපත් කරන ලද්දකි. මෙම සියලුම කෘති NBC, CBS සහ ABC යන නාලිකා තුළ විකාශනය විය. ඉන් බොහොමයක් කෘති අද දක්නට නොමැත. වාණිජ සේවා රූපවාහිනී ජාල මගින් බොහෝවිට ජනප්‍රිය වැඩසටහන් අරමුණු කරගන්නා ලදී. එකල එම වැඩසටහන් විචාරය කිරීම සඳහා ඔවුන්ගේ විචාරකයෝ ඒ ඒ රූපවාහිනී ජාලයන් හි සිටියහ. ඒ අතර ඇලීන් සාරිනන් හා බ්‍රයන් ඩ් ඩුහර්ට් යන අය සඳහන් කළ හැක.

රූපවාහිනී ශිල්පීහු සහ ලේඛකයෝ රේඩියෝ ක්ෂෙත්‍රයේ කලින් ක්‍රියාත්මක වූවෝ වෙති. එම නිසා වඩාත් මුවහත් වූ මට සිළුටු ආකාරයෙන් රූපවාහිනී කෘති ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් මුල් කාලයේ බිහිවීමට, ගුවන්විදුලිය සඳහා කාලයක් තිස්සේ වැඩසටහන් සකස් කිරීමෙන් ලද අත්දැකීම් හේතු විය. මුලින් ම ගුවන්විදුලි සඳහා නිෂ්පදානය කළ රේඩියෝ නාට්‍ය පසුකාලයේ රූපවාහිනීය සඳහා යොදා ගත්තේ ය. ඒ අතර I love Lucky වැනි නාට්‍ය සෘජුව ම ගුවන්විදුලිය සඳහා සකස් කළ කෘතියකි. 1940 දශකයේ රේඩියෝ වැඩසටහනක් වූ ලුසීල් බෙල්ගේ My Favorite Husband නාට්‍ය රූපවාහිනී මාධ්‍ය සඳහා නැවත පිටපත් ලියා නිෂ්පාදනය කිරීමට හේතු විය. මේ අතර 1950 දශකයේ මැදභාගය වන තෙක් ප්‍රධාන නගරවල රූපවාහිනිය සඳහා වන ග්‍රාහකත්වය ප්‍රමාණාත්මකව වැඩි වන තෙක් ගුවන්විදුලිය හා රූපවාහිනිය සඳහා එකම නාට්‍ය විකාශනය විය. ඒ අතර, Our Miss Brooks, The Burns and Allen Show සහ The Jack Benny Program යන නාට්‍ය කෘති දැක්විය හැක.

1960 දශකයේ මුල් භාගය වන විට ඇමරිකානු ගෘහයන්ගෙන් 90% කම රූපවාහිනී යන්ත්‍ර තිබුණි. මෙකළ තත්වානුරූපී ප්‍රහසන නාට්‍ය හා අනෙක් නාට්‍ය ගුවන්විදුලි මධ්‍යයෙන් මුළුමනින්ම ගිලීහී රූපවාහිනී මාධ්‍යය තුළ අපූර්ව ආකර්ෂණයක් දිනා ගත්තේ ය. මේ අතර The Lone Ranger, Gunsmoke වැනි නාට්‍ය කැපී පෙනේ. මෙකල Plauhouse 90 වැනි මුල් කාලීන ගුවනවිදුලි නට්‍ය හා ඒ ඔස්සේ බිහිවූ රූපවාහිනී ගුවන්විදුලි නාට්‍ය කෘතිය මුළුමනින්ම නතර විය.

බ්‍රිතාන්‍ය රූපවාහිනිය, ඇමරිකාවේ රූපවාහිනිය ව්‍යාප්තවීම කෙරෙහි මූලාරම්භක පදනම සැපයීය. මේ අතර 1936 දී BBC සේවාව මගින් දිනපතා විකාශන කටයුතු ආරම්භ කිරීම දැක්විය හැක. කෙසේ වෙතත් එය 1939 දි දෙවන ලෝක යුද්ධය නිසා නතර වුවත් 1946 දී යුද්ධයෙන් පසුව නැවතත් ක්‍රියාත්මක විය.

1949 සිට 1955 දක්වා කාලය තුළ බ්‍රිතාන්‍ය හා ඇ.එ.ජනපදය ද රූපවාහිනි මාධ්‍යයේ ස්වර්ණමය ක්‍රියාකාරිත්වයේ හිණි පෙත්තට නැංගේය. 1970 දශකය තෙක් මෙය ක්‍රමයෙන් ගමන් කළේය.

Night Kneale වැනි රූපවාහිනී පිටපත් රචකයකු මෙන්ම, Rudlph Cartier වැනි රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදකයෙකු විසින් The Quatermass Experiment සහ Mystory Story යන සම්භාව්‍ය රූපවාහිනි නාට්‍ය කෘති සකස් කළේය. මේවායෙහි පටිගත කිරීම් දක්නට නොලැබේ. අනෙකුත් විශේෂ වැඩසටහන් අතර Francis Durbridge විසින් නිෂ්පදානය කළ මාලා නාටක Muffin The Mule සහ Audy pandy වැනි සම්භාව්‍ය ළමා නාට්‍ය වැඩසටහන් මේ අතර දැක්විය හැක.

කැනඩාවේ රූපවාහිනියේ ස්වර්ණමය යුගය බොහෝ දුරට ඇමරිකාවට සමානය. නමුත් වසර 05 ක පමණ කාලයක් එයට වඩා ප්‍රමාද වීමට හේතු වූයේ ආර්ථික හා භූගෝලීය වශයෙන් ඉස්මතු වූ බාධක තත්වයන් ය.

දකුණු අප්‍රිකාව ලෝකයේ රූපවාහිනිය ව්‍යාප්ත වීම තුළ ඉතාමත් පසුකාලීනව රූපවාහිනිය ළගා වූ රට වන්නේය. 1970 දශකයේ මැද භාගය වන තෙක් එය ප්‍රමාද වූයේ වර්ණභේදවාදය මූලික කරගත් ආණ්ඩුව විසින් රූපවාහිනිය විකාශනය කිරීම ප්‍රතික්ෂේප කිරීමයි. 1975 දී අත්හදා බැලීම් කටයුතු සිදු වූ අතර, 1976 දී ජාතික වශයෙන් අප්‍රිකාව තුළ පුළුල්ව රූපවාහිනිය ව්‍යාප්ත විය.

ලෝකයේ රූපවාහිනිය ආරම්භ වූ මුල් කාලයේදීම ශ්‍රී ලංකාවට ද රූපවාහිනිය ලබාදීමට නොයෙකුත් යුරෝපීය රටවල්, ජර්මනිය, ඇමරිකාව, ආදී රටවල් උත්සාහ කළත් එවකට ආණ්ඩු කළ දේශපාලකයෝ එය ප්‍රතික්ෂේප කළේ රූපවාහිනිය වැනි සංකර මාධ්‍යයක් ශ්‍රී ලංකාව වැනි සදාචාර සංස්කෘතික රටකට පැමිණීමට තරම් ප්‍රමාණවත් මාධ්‍ය සංස්කෘතියක් මෙහි නොමැති බව දක්වමිනි. එහෙත් මේ අතර 50 දශකයේ සිට 70 දශකයේ අග දක්වා පෞද්ගලික වශයෙන් සිදු කරන ලද නොයෙකුත් අත්හදාබැලීම් වල ප්‍රතිඵලයක් ලෙස ශාන් වික්‍රමසිංහ විසින් 70 දශකයේ අග ක්‍රියාත්මක වූ කොළඹ ක්‍රමය යටතේ මුලින්ම කේබල් රූපවාහිනි ක්‍රමයක් අත්හදා බැලුවේ කොළඹ නගර සීමාවේ 10 Km පමණ විකාශන ආවරණ කලාපය ක්‍රියාත්මක කිරීමට පමණි. මුලින්ම 1979 ITN රූපවාහිනිය ආරම්භ කළ අතර, 80 දශකයේ මුල භාගයේදීම ජපන් රජයේ අනුග්‍රාහකත්වය මත රජය විසින් ජාතික රූපවාහිනී සේවා (SLRC) රජයේ රූපවාහිනි නාලිකාවක් ලෙස ආරම්භ කළේ ය. පළිගු මැණිකේ, ලා හිරු දහසක් වැනි ටෙලි නාට්‍ය මුල් කාලයේදි ජනප්‍රිය විය.

90 දශකයෙන් පසුව පෞද්ගලි අංශයට ද රූපවාහිනි සේවාවන් ආරම්භ කිරීම සඳහා අවස්ථාව ලබාදීමෙන් සිරස, ස්වර්ණවාහිනි, TNL, MTV, Max, දෙරණ, යනාදි රූපවාහිනි නාලිකා බිහිවිය. 2012 වන විට ශ්‍රී ලංකාවේ රූපවාහිනි නාලිකා 25කට ආසන්න සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. එමගින් ම වඩාත් ජනප්‍රිය මාධ්‍යයක් ලෙස රූපවාහිනිය මුල් තැන ගෙන තිබේ.

References

Boyce,Gorge . Curran, Kames. And Wingate,Pauline.(1978). Newspaper History from the Seventeenth Century to the present Day.USA, Constable.

Briggs, Asa and Burke, Peter.(2010). Social History of the Media: From Gutenberg to the Internet.USA, polity.

Fisher,Claude S.(1994). America Calling : A social History of the Telephone to 1940. USA,

University of California press.

Green, Lilia.(2010). The Internet; An Introduction to New Media. Oxford, Berg.

Harasim, Linda M.(1993). Global Network Computers and International Communication. USA, Sage.

Hilmes, Michele and Jacobs, Jason.(2008). The Television History Book(Television, Media and Cultural Studies.). UK, British Film Institute.

Hilmes, Michele and Loviqlio, Jason.(2002). Radio Reader Essays in the Cultural History in Radio.UK,Taylor and Francis Group.

Katz, James E. (2008). Handbook of Mobile Communication Studies. Cambridge, Massachusetts. The MIT press

Kress, Gunther.(2003). Literacy in the New Media Age. London, Routledge.

Poe, Marshall T.(2010).A History of Communications;Media and Society from the Evolution of Speech to the Internet.UK, Cambridge University press.

Rogers, Everette M.(1997). History of Communication Study. USA, Free Press.

Thompson, Kristin and Bordwell, David.(2002). Film History : An Introduction. MacGraw Hill.

ชีวภาพ, เชื้อวิศวกรรม
และ ทางสาธารณสุข

31

සිංහල සිනමාවට විෂය වූ තාරුණ්‍යයේ ජීවන අරගලය

උදිත ගයාෂාන් ගුණසේකර

විනෝද මාධ්‍යයක් ලෙසින් දේශීය ප්‍රේක්ෂකත්වය ආමන්ත්‍රණය කළ සිනමාව, විවිධ විෂයයන් ඔස්සේ සමාජ ගතිකයන් විමර්ශනය කිරීමට දරන ලද උත්සාහයන් ඒවායේ අන්තර්ගතය දෙස බලන විට හඳුනාගත හැකි ය. මේ දක්වා සිනමාවට විෂය කොටගත් අපරිමාණ විෂය ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ වශයෙන් පෙනෙන්නට ඇත්තේ ප්‍රේමය, විවාහය, පවුල් ජීවිතයේ සංඝට්ටන, ලිංගිකත්වය, පංති පරතරය ආදිය තේමා කොටගත් පබැඳුම් ය. මේ සියල්ල සිනමා තිරය මත විදහා පෑමේ දී තාරුණ්‍යය යන්න වැඩි ප්‍රේක්ෂක ආකර්ෂණය දිනාගත් වාහක ක්‍රමවේදයක් ලෙස ද භාවිත වී තිබේ. සමාජයේ සැබෑ ප්‍රශ්න දෙස බලන හා ඒවා වටහාගන්නා ක්‍රමවේදයකට වඩා අභිමත සිහින ඔස්සේ සැහැල්ලුවෙන් සැරිසරන්නට හැකි උපක්‍රමයක් ලෙස සිනමාව පොදු ප්‍රේක්ෂකත්වයට සමීප වී තිබේ. මේ නිසා කර්මාන්තයක් වශයෙන් සලකා ලාභ ලැබිය හැකි සහ ජනප්‍රියවාදී සරල වින්දන ආකෘති කෙරේ වැඩි නැඹුරුවක් පැවතීම අස්වාභාවික වූවක් නොවේ. එය සිනමාවේ අවගමනයක් සේ සැලකිය යුත්තක් ද නොවේ.

තාරුණ්‍යය බොහෝ සිනමා කෘතිවල පදනම බවට පත්ව ඇත්තේ අරමුණු කිහිපයක් මුල් කොට ගනිමිනි. එය කතා ආඛ්‍යානයෙක් තුළ කවර හෝ දිශානතියක් ඔස්සේ ජවසම්පන්න ලෙස විවරණය කළ හැකි වස්තු බීජයකි. තාරුණ්‍යය යන්න ආකර්ශනයෙන් අනූනව ගෙනහැර දැක්වීමට පුළුවන. ප්‍රේක්ෂක මනෝභාවයන් තුළ 'බලාපොරොත්තුව' යන්න, සජීවී ලෙස පවත්වා ගැනීමටත්, කුතුහලය රඳවා ගැනීමටත් සමත්කම් දක්වන්නකි. වාණිජ සිනමාකරුවන් සේ ම සිනමාව යන්න සමාජ කැඩපතක් කොටගත් නිර්මාණවේදීන් ද තාරුණ්‍යය අමුද්‍රව්‍ය කොටගන්නේ මේ අරුත් සහිතව ය.

සිංහල සිනමාව පිළිබඳ කෙරෙන ප්‍රත්‍යාවලෝකනයක දී තාරුණ්‍යයේ ජීවන අරගලය මූර්තිමත් කෙරෙන පොඩිපුතා (1955 නොවැම්බර් 25), අහස්ගව්ව (1974 ජනවාරි 24), මචං (2008 ඔක්තෝබර් 23) යන චිත්‍රපට ඇසුරින් මෙරට 'තරුණයා' මුහුණදෙන ජීවන අරගලය කෙටියෙන් විමසා බැලීම මෙම ලිපියේ මුඛ්‍ය අරමුණ වෙයි. මෙරට සිනමා ඉතිහාසයේ යුග තුනක දී විරැකියාව හා එහි බලපෑම තාරුණ්‍යය විෂය කොට ගනිමින් විමසා බලන්නට දැරූ ප්‍රයත්නයන් මෙම කෘති තුනට නිමිති වී ඇත.

සිංහල සිනමාවේ වට්ටෝරුගත ආකෘතිය බිඳදමමින් වෙනත් සමකාලීන සිනමාකරුවන්ට වඩා ඉදිරියට විත් ලාංකික ජන සමාජය දෙස හෙළන ලද යම් තරමක යථාර්ථවාදී බැල්මක් ලෙස පොඩිපුතා චිත්‍රපටය වැදගත් වෙයි. සම්ප්‍රදායික චිත්‍රපට ආකෘතියෙන් මුළුමනින් ම බැහැර නුවූව ද ඒවාට උරුම වූ රළු හා පටු සීමාවන් සපුරා ජයගත නොහැකි වුවද සිරිසේන විමලවීරයන් සෙසු චිත්‍රපටකරුවන්ට වඩා ඉදිරියේ සිටිමින් තාරුණ්‍යයේ සමාජ ගැටලු ප්‍රතිනිර්මාණය කරයි.

පොඩිපුතා සඳහා විමලවීරයන් නිමිති කොටගන්නේ මෙරට සාමාන්‍ය මිනිසාගේ ජීවිතයයි. ඒ නිසා ම සෙසු සිනමාකරුවන්ට විෂය නොවන ප්‍රවේශයකින් මිනිසාගේ දුක හා වේදනාවට හේතුව ඉරණම ම නොවන බව කියාපාන්නට ඔහුට හැකියාව ලැබේ. සමාජ විෂමතාවන් හමුවේ මිනිසුන්ගේ යහපත් පැවැත්මට අවකාශයක් නොමැති බව විවරණය ඔහුගේ අධ්‍යාශය විය. මේ දැක්ම යහපත් ය. මානව දයාවෙන් යුක්ත ය. පොඩිපුතා තේමාවේ ප්‍රබල සමාජ ගැටලුවක් පිළිබඳ වස්තුබීජයක් අන්තර්ගත විය. ගැමි උගත් තරුණයන් මුහුණපා සිටින විරැකියාව පිළිබඳ වූ මේ ප්‍රකාශනය යථාර්ථ රීතියක මෙන් ම සිනමානුරූපී විලාසයක පිහිටුවන්නට නොහැකි වීමේ හේතුවෙන් දුර්වල ව ගියේ වුවද එය පසු කාලයක සුහුඹුලු ව වැඩෙන ප්‍රබල සිනමා රීතියක මූලාවස්ථාව බව කිව යුතු ය.[1] හැත්තෑව දශකයේ හමුවන පතිරාජ සිනමාවේ අඩංගු සමාජ විමර්ශනාත්මක සංලක්ෂණ පිළිබඳ මුල් උරගා බැලීම පොඩිපුතා යැයි කීම අතිශයෝක්තියක් නොවේ.

සිරිල් බී. පෙරේරා වැනි විචාරකයන්ගේ මතයට අනුව මේ සිංහල සිනමාවක, දේශීය සිනමාවක නියත ඇරඹුම පොඩිපුතා ය.[2] සිනමා විචාරක සුනිල් මිහිඳුකුලට අනුව විමලවීරගේ විශිෂ්ටතම සිනමා නිර්මාණය ද පොඩිපුතා ය.[3]

අති සීමිත තාක්ෂණික සම්පත්, සීමිත ශිල්පීය දායකත්වයන් සහ අනේක විධ ආර්ථික ගැටලු සහිත අවධියක තම සිත්හි මවාගත් ආකෘතිය අර්ථාන්විත කේන්ද්‍රීය භාවය බිඳනොදමා සිනමා කෘතියකට ගොනු කරලීම පහසු කාර්යයක් නොවේ. පැවති සිනමා භාවිතයන් අතර පුරෝගාමී කාර්යභාරයක් ලෙස පොඩිපුතා චිත්‍රපටය හඳුනාගන්නා ගාමිණී වේරගමයන් එය ප්‍රථම දශකයේ වැදගත් ම චිත්‍රපටය සේ හඳුන්වයි. වඩා දැනුම්වත් දැක්මක් සහිතව සමාජ ගැටලු විමසා බලන්නට වෙරදරන සිනමාකරුවෙකු මෙයින් බිහිවූ බව ඔහු කියා සිටී.

ජයවිලාල් විලේගොඩ සිංහල භාෂිත හා සමාජ සංවේදී චිත්‍රපටයක් ලෙස පොඩිපුතා හඳුන්වන අතර, එය අනුකාරකවාදී සිනමාව මගින් සිදුකළ අපවිත්‍රත්වය යටපත් කරන්නක් බව දිනමිණ පුවත්පතට විචාරයක් ලියමින් ප්‍රකාශ කරයි. ''උසස් සිංහල චිත්‍රපටයක් කවදා හෝ නව ජීවන චිත්‍රාගාරයෙන් බිහිවෙතැයි සරදියෙන් තුළින් අප තබාගත් බලාපොරොත්තු ඉටු කරමින් සිරිසේන විමලවීරගේ පොඩිපුතා 1955 චිත්‍රපට වර්ෂය අවසන් කළේ දෝෂයෙන් යුක්තව තිබූ අපේ චිත්‍රපට කලාව සෝදා පිරිසිදු කර ගැනීමෙනි.[4]

පොඩිපුතාහි සියලු නිර්මාණ ආධිපත්‍යයන් සිරිසේන විමලවීරයන් තම පූර්ණ අණසක යටතේ මෙහෙයවූ බැවින් ඔහු ස්වාධීන නිර්මාණවේදියෙකු ලෙස ප්‍රකට කරන කුසලතා මෙමගින් සාධාරණව ඇගයීමට පුළුවන. විමලවීරයන් හැරුණු විට ආනන්ද වීරකෝන්, පුෂ්පා ජෙනට්, ප්‍රේමකාන්ති, මාලනී

රණසිංහ, එන්. ආර්. ඩයස්, ඇස්. එච්. ජෝතිපාල, ජී. ඩී. වීරක්කොඩි, චිත්‍රා ධනවලවිතාන, ඩී. ජී. හෙට්ටිආරච්චි, කුමාරි මානෙල්, පර්ල් වාසුදේවි, එඩී ජූනියර්, ඒ ඩී මාටින්, ඊ. මාෂල් පෙරේරා, දයා විමලවීර, උපසේන විමලවීර යන රංගන ශිල්පීහු මෙහි රඟපෑහ. මෙහි සංගීත නිර්මාණය ටී. එෆ්. ලතීෆ් සමග එම්. පී. සුගතදාස විසිනි. ජී. එස්. බී. රාණි සහ සිසිර සේනාරත්න ගායනයට එක් වූහ.

සමාජයේ උසස් යැයි සම්මත නීතිඥ වෘත්තියට සැරසන වැඩිමහල් පුතු වෙනුවෙන් බාල පුතුගේ රැකියා අවස්ථාව ද, ඉගෙනීම ද අහිමි කරගැනීමෙන් පියා සහ පුතුන් දෙදෙනාට අත්වන ඉරණම පොඩිපුතා කතා පුවතේ අන්තර්ගත වෙයි. චිත්‍රපටයේ ප්‍රධාන ප්‍රචාරාත්මක ඡායාරූපය සේ භාවිත කළ පොඩිපුතාගේ චරිතය රඟපාන ආනන්ද වීරකෝන් ''ඇබෑර්තු නැත'' නමින් සඳහන් පුවරුවක් බෙල්ලේ එල්ලාගෙන සිටින දෘශ්‍යාංගය කෘතියේ සමස්ත අරුත ප්‍රකාශයට පත් කරයි. සුපුරුදු ඉන්දියානු සාම්බාරු වට්ටෝරුවෙන් ඔබ්බට යමින් එවක ලාංකික පවුල් සංස්කෘතියට මුහුණ පෑමට සිදුවන ව්‍යසනය විමලවීරයන් මෙයට තේමා කොටගනී. එසේ වුවද මෙම ගැටලුව සමාජමය හා රාජ්‍යමය අවකාශ සමගින් බද්ධ කරන්නට ඔහු නොපළඹෙයි.

ධර්මසේන පතිරාජයන්ගේ ප්‍රථම වෘත්තාන්ත චිත්‍රපටය අහස්ගව්වයි. සිංහල සිනමාව විෂයෙහි සමාජ යථාර්ථ ප්‍රකාශන රීතිය හඳුන්වාදීමේ ලා පුරෝගාමී වන සිනමා කෘතිය ද මෙය වෙයි. අහස්ගව්වට පසුබිම් වන්නේ රැකියා අහිමි තරුණයන් ය. විරැකියාව හේතුවෙන් විවිධ සමාජ ඛේදවාචකයන්ට මුහුණපාට තරණයන් ජීවිතය ගැටගසා ගැනීමට දරන අප්‍රතිහත වෑයම නිර්මාණකරුවා සියුම් ලෙස ග්‍රහණය කර ගනී. තාරුණ්‍යයේ කෙළිලොල් බව, ජීවිතයේ චමත්කාරය, යෞවන ප්‍රේමය, අරමුණු සහිත ජීවන රටාව, සරලත්වය, නිදහස්කාමී බව යන සියලු ගුණාංග අහස්ගව්වේ තාරුණ්‍යය ගොඩනැංවීමේ දී සංකලනය කොට ගෙන ඇත. සමාජ ආර්ථික රටාවන් මගින් ගිලගන්නා තාරුණ්‍යයේ සිහින හා ඒවා සැබෑ කරගන්නට යොදාගන්නා උපාය මාර්ග නිසා තරුණ ජීවිතවල පැවැත්මට එල්ලවන තර්ජන සිනමාකරු ඉදිරිපත් කරන්නේ මේ සමාජය තුළ ඔවුන්ගේ පැවැත්ම කෙරෙහි ඇති අවිනිශ්චිත භාවය පසක් කරමිනි.

චිත්‍රපටයේ ප්‍රධාන චරිත ලෙස ඉදිරිපත් වන්නේ විජේ (අමරසිරි කලංසූරිය) ගුණේ (විමල් කුමාර ද කොස්තා) හා බන්දු (වික්‍රම බෝගොඩ) ය. මහල් නිවසක ජීවත් වන විජේ රැකියා විරහිත පහළ මධ්‍යම පන්තියේ සංකේතයකි. ඔහුගේ පියා දුම්රිය දෙපාර්තමේන්තුවේ සුළු රැකියාවක නියැලෙමින් පවුලේ නඩත්තුව සඳහා වෙහෙසෙයි. මව ගෘහණියක වන අතර, නැගණිය ටියුටරි අධ්‍යාපනයේ නියැලෙයි. බන්දු මේ තිදෙනාගෙන් වැඩි අධ්‍යාපනයක් හා ආර්ථික තත්වයක් සහිත වෙයි. බිඳුණු අපේක්ෂාවන් සහිත ඉචඡා භංගත්වයෙන් පෙළෙණ පාවෙන තරුණි ජීවිතවල ඇති වියලි කර්කශ බව මෙහි දී මනාව නිරූපණය වේ. තාරුණ්‍යය සමග අවදිවන ප්‍රාර්ථනා ජීවන ගැටලු සමගින් පොරබදන ආකාරයත්, ලැබෙන කවර හෝ ඉඩ ප්‍රස්තාවක දී ඒවා නිදැල්ලේ පිටාර ගලායන අයුරුත් නිසා චිත්‍රපටයේ සජීවී බව හා සමකාලීන සමාජ ප්‍රකාශනය ඉස්මතු වී පෙනේ. සමාජ ආර්ථික ව්‍යුහය මගින් යටපත් කළ නොහෙන මානුෂීය හැඟීම්වල ප්‍රබලත්වය මෙහි මැනවින් නිරූපිත ය. මුදල මත සියලු සමාජ සාධක තීන්දු වන අවධියක මානව සබඳතාවන් පරයා ක්‍රය ශක්තියේ අවශ්‍යතාව වර්ධනය වී තිබේ. එවිට මුදල මත යැපෙන යාන්ත්‍රික සමාජයේ අවයවයක් බවට පත්වනු විනා මේ තරුණයට තෝරාගත හැකි අන් විකල්පයක් ද නැත.

ප්‍රධාන චරිත අතුරින් කෙනෙකුට (බන්දු) රැකියාව ලැබීමත් සමග ඔහු සිය පෙම්වතිය (විජිතා) විවාහ කොටගෙන සම්ප්‍රදායික පවුල් ආකෘතියට ප්‍රවිශ්ට වෙයි. ක්‍රමයෙන් සම්ප්‍රදායික චින්තනයට ළන් වන. ඔහු කෙළිලොල් තාරුණ්‍යය සමුදෙමින් සිය බිරිඳ ද එහි තවත් පුරුකක් බවට පත්කර ගනී. තමන් සොයා එන විජේගේ ක්‍රියාකාරකම් සමච්චලයට ලක් කරන බන්දු හා විජිතා පවතින සමාජ ක්‍රමයට අනුව පරිණාමය විය යුතු බව ඔහුට උගන්වයි. ඔවුන් විජේගෙන් අසන ප්‍රශ්න මගින් පාවෙන තරුණ ජීවිතයකට මේ සමාජ ක්‍රමය තුළ තවදුරටත් තම පැවැත්ම රඳවාගැනීමට ඇති නොහැකියාව හෙළිදරව් කරයි.

''මොකක්ද යකෝ පිං ගොනා වගේ තාත්තගෙන් ම කකා ඉන්නෙ?''

''උඹ මෙහෙ එනකොට තාත්තගෙ සල්ලි පිල්ලි ගහල ද ආවෙ?''

''ආණ්ඩුවෙන් පිනට දෙන ගැසට් එක බලල හරි රස්සාවක් හොයා ගනින්කො''

''නංගි තාම බස් හෝල්ට් ගානෙ රස්තියාදු වෙනවද? තාත්ත තවම බොනවද? කසිප්පු ද බොන්නෙ?''

විජේ එක් අවස්ථාවක ඔරලෝසු විකුණා උපයාගත් මුදලින් නැගණියට ත්‍යාගයක් රැගෙන එයි. එය සොරකම් කොට උපයාගත් මුදලකින් ලබාගත්තේ දැයි නැගණිය හා මව සැක පහළ කරයි.

අහස් ගව්වේ තරුණයා මුහුණ දෙයන විරැකියාව පිළිබඳ ගැටලුව ප්‍රබල නාටකීය ලක්ෂණ සහිතව ඉදිරිපත් වන්නකි. තාරුණ්‍යය සමච්චලයට පාත්‍රවන, තරුණකම කෙරේ ආශීර්වාදයක් නොමැති, යෞවනයේ ගැටලු විසඳා ගැනීමට මගපෙන්වීමක් හෝ මග හසරක් නොපෙනෙ, අඩු තරමේ තරුණ ජීවතවල වටිනාකම වචනයකින් හෝ ඉස්මතු නොවන තත්ත්වයක් යටතේ සිදුව අනාථ භාවය හා වල්වැදීම එහි මානව නිරූපණය වේ.

ජීවිතවල බිඳුනු බලාපොරොත්තු හා පිළිසරණක් නැති කර්කශ බව චිත්‍රපටය පුරා ම එකාකාර ලෙස ගලා යයි.

''හිරේ විලංගුවේ වැටුණත් කමක් නෑ මොකක් හරි ජීවත් වෙන්න මාර්ගයක් හොයාගෙන, මට හිතෙනව මචං මෙ කක්කුස්සිවල කොමෝඩ් ගලවල පංචිකාවත්තට වත් විකුණල කීයක් හරි හොයාගන්න.''

ගුණේගේ ඉහත දෙබස මෙන් ම ඔවුනට යම් ආකාරයකින් මග පෙන්වන මහතුන්ට (විජය කුමාරතුංග) රැකියාව ලැබීමෙන් පසු ජීවිතය ගොඩනැගීමේ වුවමනාවට ද චිත්‍රපටය තුළ අවධාරණය වෙයි.

''අපි ඉල්ලීම් වගයක් ඉල්ලලා තියෙනා. අපේ සභාපතිතුමා කීවා ලැබෙයි කියලා. මං වෘත්තීය සමිතියටත් බැඳුනා. අපි දුක් විඳින මිනිස්සුනෙ....''

චිත්‍රපයේ මහතුන්ගේ චරිතය විකාශනය කොට ඇති ආකාරය පිළිබඳ විමසීමේ දී ඔහුගේ සමාජ පසුබිම පිළිබඳ තතු හෙළි නොවුන ද සමාජයේ පහළ පංතියක තරුණයෙකු වග තේරුම් ගත හැකි ය.

අන් මගක් නොමැතිකම හේතුවෙන් නගරයේ තැබෑරුමක ගිනි වතුර විකුණා ජීවිතය සර කර ගනියි. ඔහු විජේ හා ගුණ පිළිබඳ දරනුයේ සානුකම්පිත ආකල්පයකි. මේ නිසා විජේ පොලීසියට හසු වූ අවස්ථාවේ ඔහු බේරා ගන්නේ මහතුන් ඇප වීමෙනි. ඒ තුළින් ඔහු මේ සමාජයේ විරැකියාව හේතුකොට ගෙන අපේක්ෂා භංග තරුණයන් පිළිබඳ එම පන්තියේ ම සාමාජිකයෙකු ලෙස සාධාරණව බලා ඇත. ඇති හැකි අයට වඩා තමා මෙන් ම තම පන්තියේ සියල්ලෝ ම මේ දුවන්නේ තම අරමුණක් ජය ගැනීමට ය. හොරබඩු සිදුවීමෙහි දී වාහනයක හැපී ගුණේ මිය යාම පිළිබඳව ශෝක වන මහතුන් ඔහුගේ අවමගුලට සහභාගි වීමෙන් ද කළ හැකි උපරිම ගෞරවය ඉටු කර තිබේ. සිනමා කෘතිය තුළ මහතුන් සමකාලීන සමාජයේ සංකේතාත්මක චරිතයක් ලෙස ගොඩනගා ඇත. ඇප ලබා නිදහස් වන විජේට මුණගැසෙන්නේ නගර සභාවේ කුණු ලොරිය පදවාගෙන යන මහතුන් ය. පසු අවස්ථාවක ඔහුට ආණ්ඩුවේ රැකියාවක් ලැබේ. සමාජයේ කර්කශ භාවය හෙළි කරන මහතුන්ගේ වදන් ප්‍රබල සංකේතයකි.

''ඉස්සර කළෙත් මිනිස්සුන්ගෙ කුණු අදින එක. දැන් කරන්නෙත් ඒකමයි.''

''කුණු කොතැනද අපි එතන.''

මහතුන් දේශපාලනය පිළිබඳ සවිඥානිකයෙකි. ඔහු වෘත්තීය අරගල මගින් අයිතීන් දිනාගත යුතුය යන මතයේ පසුවෙයි. මහතුන් විසින් පදවන කුණු ලොරියේ නැගී පැමිණෙන විජේ කතාබහ කරන්නේ සාමූහික බලවේග මගින් ජීවිතය ජයගත යුතු බව ය. අවසානයේ මහතුන් ද විජේ ද මැයි පෙළපාලියේ උද්‍යෝගයෙන් ගමන් කරනු පෙනේ. මෙය සමස්ත කෘතියේ ම දේශපාලන සවිඥාණකත්වය එළිදැක්වෙන අවස්ථාවකි. දේශපාලන අරගලය යන්න තාරුණ්‍යයේ ගැටලු සඳහා වන බලාපොරොත්තු සහගත විසඳුමක් බව මෙයින් ඉඟිකරයි.

අහස් ගව්ව නිර්මාණය වන්නේ 1971 කැරැල්ලෙන් පසුවයි. 1971 කැරැල්ල සමාජ විෂමතාවන්ට එරෙහිව ආයුධ අතට ගත් විප්ලවකාරී ක්‍රියාවන්වල අවසානයකි. නමුත් අහස් ගව්වේ අවසානය සාම්ප්‍රදායික අවසානයකි. තරුණ සමාජ ප්‍රශ්න විසඳා ගනු වස් ඔවුන් අවසානයේ එළඹෙන්නේ සාම්ප්‍රදායික වාමාංශික දේශපාලන මතවාදයකට ය.

වාණිජවාදය නිසා පරාජයට පත් වන තාරුණ්‍යය පිළිබඳ හෙළි කරන අහස් ගව්ව ඕනෑ ම සමාජ මට්ටමක තරුණයෙකුට සමීප විය හැකි පොදු අත්දැකීමකි. තාරුණ්‍යයේ සුන්දරත්වය හා විනෝදාත්මක බව මතුපිටින් පෙනුනද ඒ තුළ දැවෙන සමාජ යථාර්ථය තුළින් මේ තරුණයන් හික්මවා ඇත. පතිරාජ සමාජ යථාර්ථය කිසියම් දේශපාලන හැඩයක් සහිතව සමාජය සමග බද්ධ කිරීම අහස්ගව්වේ වැදගත්කමයි. මෙහි දී දේශපාලන දෘෂ්ටියකින් තරුණයන්ගේ ප්‍රශ්න දෙස බැලීමට සිනමාවේදියා උත්සාහ දරා ඇත. ප්‍රකාශ මාධ්‍යයක් ලෙස සිනමාවෙන් සමාජය කියවන්නේ කෙසේ ද යන්න ඔහු මනාව සනාථ කොට ඇත. සමාජ යථාර්ථය දේශපාලන දෘෂ්ටි කෝණයකින් බැලූ ප්‍රථම අවස්ථාව ලෙස අහස් ගව්ව හැඳින්විය හැකි ය.

සිනමාවට සමාජ යථාර්ථ රීතිය ගෙන එන අහස් ගව්ව පිළිබඳව පතිරාජ දක්වන අදහස මෙබඳු ය.

''විරැකියාව නිසා ගොඩනැගෙන තරුණ අසහනය, පවත්නා සමාජ රටාවට එරෙහි ව බලවේගයක් බවට පරිවර්තනය වන ස්වරූපය මා අහස් ගව්වේ ඍජුව කතා කළා. ඒ වගේ ම යථාර්ථවාදී සමාජ රටාව සහ තරුණ අසහනය ආකස්මිකව සිදුවන්නක් නොව එය සමාජ බලවේගයන්ගේ මම ඵලයක් බව දක්වන්නට ද මා වගබලා ගත්තා.[5]

පුද්ගල චරිතයක ක්‍රියාකාරිත්වයට තුඩුදෙන සමාජමය බලවේගය ගවේෂණයේ කූටප්‍රාප්තිය අහස් ගව්ව යි. සරල නිදහස් සිනමා රීතියක් ඔස්සේ තාරුණ්‍යය නිරූපණය කරමින් ඒ තුළ පවත්නා ඛේදවාචකය ඉදිරිපත් කොට තිබේ. විරැකියාව පදනම් කොටගෙන සමාජ යථාර්ථය පිළිබිඹු කිරීමෙහි ලා අහස් ගව්වේ සිනමා භාවිතය අතිශය ප්‍රබල වේ.

රුවන්ති ඩී චිකේරාගේ තිර කතාවට අනුව උබර්තෝ පැසෝලිනී අධ්‍යක්ෂණය කළ මචංහි පළමු ජවනිකාවේ ම ප්‍රේක්ෂකයා රැගෙන යන්නේ කොළඹ මුඩුක්කු පරිසරයකට ය. සමකාලීන වටාපිටාව හා උපසංස්කෘතික ලක්ෂණ චිත්‍රපටය ආරම්භයේ ම ප්‍රේක්ෂකයා වෙත රැගෙන එන්නට සිනමාකරුවා ප්‍රවේසම් වන හෙයින් වඩා නිවැරදි හා අවබෝධාත්මක පසුමානයක් උපයෝගී කොටගෙන චරිත ගොඩනැංවීම පහසු වී ඇත.

මෙහි කේන්ද්‍රීය චරිතය ස්ටැන්ලි (ධර්මප්‍රිය ඩයස්) ය. ඔහු නිර්මාණය වන්නේ කොළඹ මුඩුක්කු පරිසරයකිනි. ඔහුලේ මල්ලී නෙවිල් ය. ඔහු ද ඒ පරිසරය තුළ ම වැඩුණු කෛරාටික කොලුගැටයෙකි. ස්ටැන්ලිගේ නැගණිය සුරේෂ් නම් පුද්ගලයෙකු සමග විවාහ වී සිටියි. ඇය දෙදරු මවකි. ස්ටැන්ලිගේ මිත්තණියන් දෙදෙනා රේස් කොළ බලමින් සරල ජීවන පැවැත්මක් සහිත නිදහස් ජීවිත ගත කරන්නාහ. ස්ටැන්ලිගේ නැගණිය නිවස ඇපයට තබා ලක්ෂ තුනක පමණ මුදලක් ඔහුට ලබා දී ඇත. ස්ටැන්ලි විදේශ ගතවීම සඳහා මුදල් ලබාදීමෙන් රුවන් නම් වංචාකාරයෙකුට හසුවීම හේතුකොට ගෙන සියල්ලෝ ම අසරණ වී සිටිති. ස්ටැන්ලි විටෙක දොඩම් වෙළෙන්දෙකි. විටෙක රේස් දමන්නෙකි. තවත් විටෙක ජීවිතය ගැටගසාගනු වස් වකුගඩු විකිණීමට තැත් දරන්නෙකි. ගෙවල් කුලී, මිත්තණියන්ට සැලකීම, මල්ලි පාසල් යැවීම, නැගණියගේ ණය යනාදී ආර්ථික හා සමාජ ප්‍රශ්න රාශියකින් පීඩිත ස්ටැන්ලි එයින් මිදීම සඳහා තෝරාගන්නා මාර්ගය විදේශ ගත වීමයි. සිය රට තුළ පවතින විරැකියාව නිසා අසරණ තත්ත්වයට පත්ව ඇති මොවුහු නොදකින දේශයක් වෙනුවෙන් සිහින දකිති. විරැකියාව කේන්ද්‍ර කොටගෙන පැගින තාරණ්‍යයේ අසහකාරී හා පීඩාකාරී ස්වභාවය ස්ටැන්ලිගේ චරිතය තුළින් සියුම් ලෙසත්, කර්කශ වත් නිරූපණය කොට ඇත. මේ හේතු නිසා චරිත අතර ගොඩනැගෙන නොරිස්සුම් ස්වභාවය හා පාලනය කළ නොහැකි ස්වභාවය නිසා ස්ටැන්ලි පවුල තුළ ද ප්‍රතික්ෂේප වන තත්ත්වයට පත්ව ඇත. නැගණියගේ ණය ගෙවා ගත නොහැකි වීම නිසා ස්ටැන්ලි සුරේෂ් මගහරියි. ණයට බත් පාර්සලයක් ගෙනැවිත් මිත්තණියන් හට සලකන නමුදු ඔවුන් ද ස්ටැන්ලිට බරක් වී ඇත. මිත්තණියන් දෙදෙනා අතිශය සරල එමෙන් ම කුමකින් කුමක් සිදු වුවත් ඒ සියල්ල යහපතක් ලෙස සලකන කාන්තාවන් ය. ගෙවල් කුලී ගෙවා ගැනීමට නොහැකි නිසා නිවසේ වහල, අයිතිකරු විසින් ගලවාගෙන යාම පවා ඔවුන් දෙදෙනා දකින්නේ යහපතක් ලෙස ය. රේස් කොළය බැලීම පමණක්

ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වී ඇත. නෙවිල්ගේ අධ්‍යාපනය හා ඔහුගේ මැර ස්වභාවය පවා ස්ටැන්ලිට පාලනය කර ගත නොහැකි ය. වියදම් කිරීමට මුදල් නොමැතිවීම තුළ ඔවුන් සියල දෙනා ම එකිනෙකා පරයා යන පාලනය කළ නොහැකි චරිත බවට පත්ව ඇත.

ජීවිතය ගැටගසා ගන්නට වෙර දරන තරුණ හා මැදිවියේ කණ්ඩායමක් ලාංකික සමාජය තුළ කවර ලෙසකින් හෝ ජයගත නොහැකි ජීවන අවශ්‍යතා සපුරා ගනු පිණිස විදෙස්ගත වීමට යත්න දරති. පියාගේ දේශපාලනයට ආධාර කරන පුත්‍රයෙකු, හෝටල් කම්කරුවෙකු, ලිංගික ශ්‍රමිකයෙකු, මිනී වළවල් කණින්කෙු, හෝටල් සේවකයෙකු, කාර්ය සේවකයෙකු සහ පොලිස් නිලධාරියෙකු සහ ඔහුගේ පහළ නිලධාරියෙකුගෙන් මුල්වටයේ තරුණ කණ්ඩායම සමන්විත වෙයි. පසුව විදෙස් රැකියා ජාවාරම්කරුවෙකු හා ඔහු විසින් රට පැටවීමට සූදානම් කොටගත් විදේශිකයින් පිරිසක් ද මීට එක්වෙති. එකිනෙකට සපුරා ම වෙනස් වයස් මට්ටම්, සමාජ තත්ත්වයන්, පවුල් පසුබිම්, උපසංස්කෘතීන් හා ආකල්පවලින් සමන්විත කණ්ඩායමක් බැවින් මෙහි දී ඉතා පුළුල් වපසරියක් තුළ දේශීය ජන සමාජයේ යථාර්ථය අනාවරණය කරලන්නට සිනමාකරුවාට ඉඩ ප්‍රස්තා ලැබී තිබේ.

අත්පන්දු කණ්ඩායමක් ලෙස පෙනි සිටිමින් රැකියා සොයා යන තරුණ පිරිසකගේ ඛේදවාචකය මංචි චිත්‍රපටයේ වස්තු විෂය වී ඇත. තාරුණ්‍යය තුළ විරැකියාව නිසා නැගෙන සමාජ ප්‍රශ්න හා ඒ තුළ ඔවුන් සමාජ පෙළෙඹෙන ක්‍රියා මෙහි නිරූපණය වේ. සිය රටේ සමාජ ක්‍රමය තුළ ජීවත්වීමට සහ පැවතීමට මොවුන්ට අවසර නැත. තාරුණ්‍යය තුළ පිබිදෙන අපේක්ෂා සියල්ල මෙම හේතුවෙන් අමිහිරි කර්කශ තත්ත්වයට පත්ව ඇත. අත්‍යවශ්‍ය පවුල් වගකීම් සහ දෙමව්පියන්ට සැලකීම, සහෝදරයන්ට සැලකීම යනාදිය මහා බරක් ලෙස හිස මත පැටවී තිබේ. ඉලක්ක රහිත සිහින සමග පොරබදන තාරුණ්‍යයේ හඬ තීව්‍ර ආකාරයෙන් මචංහි විනිවිද දක්වා තිබේ.

සිනමා කෘතිය අරම්භයේ ම ප්‍රබල දෘශ්‍ය රූපාවලියකින් ප්‍රේක්ෂක අවධානය දිනා ගන්නා මචං එම අවධානය සිනමා කෘතිය අවසාන වන තෙක් ම එක ලෙස පවත්වා ගනී. දැල්වෙන මාර්ග සංඥා, බයිසිකල් තල්ලු කර ගෙන පැමිණෙන පොලිස් නිලධාරීන්, මාර්ගයේ නිදා සිටින ගැහැණිය සහ පෝස්ටර් අලවන තරුණයන් තුළින් ග්‍රහණය කරගන්නා අවධානය චිත්‍රපටය තුළ සාවධානව පවත්වාගෙන යයි. හාස්‍යයට යටින් ගැඹුරු සමාජ යථාර්ථයක් විශද කිරීමෙහි ලා මචං ගෙන ඇති උත්සාහය අතිශය වැදගත් ය. මතුපිටින් ගොඩනැගෙන හාස්‍යයට යටින් තාරුණ්‍යයේ පීඩාකාරී සමාජ ව්‍යසනය ප්‍රබල ලෙස දෘශ්‍ය මාධ්‍යයට ඒකරාශී කොට තිබේ. ඉදිරිපත් කරන තේමාවට අදාළව භාවිත කොට ඇති වර්ණ සංයෝජන රටාව ද ප්‍රස්තුතය ඉස්මතු කිරීමෙහි ලා ප්‍රමුඛ දායකත්වයක් ලබා දී ඇත.

මචංහි කේන්ද්‍රීය චරිතය වන ස්ටැන්ලිට අප්‍රමාණ ජීවිත වගකීම් අතර එකක් හෝ ඉටුකරගැන්මට කවර හෝ හැකියාවක් නැත. එහෙත් ජීවිතය අත්හැර දමන්නට ඔහු සූදානම් නැත. රුපියල් ලක්ෂ තුනකට වකුගඩුවක් විකුණාගැනීමට ඔහු අරඅදින්නේ ද පවත්නා ගැටලුවලින් ගොඩඒමට අන්මගක් නොමැති නිසා ය. ඒ හා සම්බන්ධ ඔහු සතු අවබෝධයේ තරම පහත දෙබස් ඛණ්ඩයෙන් පසක් වෙයි.

''වකුගඩුවලින් මොකද කරන්නෙ?''

''හුජ්ජ කරනවා.''

''අරුන් මගෙ එක වකුගඩුවකට ලක්ෂ තුනක් දෙනවා.''

මචං චිත්‍රපටයේ සියලුම චරිත බිහිවන්නේ ආර්ථික සාධකය මුල් කර ගෙන ය. එහි දී ආර්ථිකය ස්ථාවර කර ගනු වස් විදේශ ගත වීම නම් වන ඒකායන පරමාර්ථය කේන්ද්‍ර කොට ගෙන මෙහි කතා පුවත විකාසය වේ.

නීතිය ඉදිරියේ පෙනී සිටින පොලිසිය ද නීති විරෝධී ලෙස විදේශගත වීමට යොමු වන්නේ මේ සමාජ ක්‍රමය තුළ ආර්ථික පැවැත්ම ස්ථාවර කර ගත නොහැකි නිසාවෙනි. මිනීවළවල් කණින්නා මව බේරාගැනීම සඳහා මුදල් සොයා පැමිණෙන පියා සහ පුතා යන මේ සියලු චරිත සමාජ ආර්ථික ක්‍රමය මගින් පීඩාවට පත් වූ පාර්ශ්වකරුවෝ ය. ගෙවල් කුලී ගෙවීමට නොහැකි වීම නිසා නිවසේ වහලය ගලවාගෙන යාමට තරම් ආර්ථික තත්ත්වය පිරිහී ඇති සමාජ ක්‍රමයක් තුළ තරුණයන් ලෙස ඔවුන් තවත් මෙහි නොරැඳී විදේශ මුදල් සොයා යෑමට සැරසීම වරදක් ද නොවේ. නමුත් ඔවුන් මේ සඳහා යොදාගන්නා ක්‍රමය ගැටලු සහගතය, අස්ථාවරය, නීති විරෝධී ය.

මචං චිත්‍රපටය තුළ දක්නට ලැබෙන සුවිශේෂත්වය වන්නේ පුළුල් ලෙස සමාජ රූපය කර තිබීමයි. එහි දී විරැකියාව සියලු සමාජ තලවල පුද්ගලයන් තලා දමන ප්‍රබල සමාජ සාධකයක් බව විවරණය කරයි. මෙහි දී ඔවුන් විරැකියාවට විසඳුම ලෙස හඳුනාගන්නේ විදේශ ගත ඩොලර් සොයා යාමයි. එයට සියලු සමාජ පන්තිවල පුද්ගලයේ අයත් වේ. රජයේ සේවයේ නියුතු පොලිස් නිලධාරියාගේ සිට මිනී වළවල් කණින්නා දක්වා සෑම සමාජ පන්තියක ම සංස්කෘතිය මචං තුළින් නිරූපණය වේ. ඒ අනුව මචංහි ජාතීන් ගණනාවක සංස්කෘතික විවරණයක් සිදු කොට අත. සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ යන සංස්කෘතික සංකලනයක් මචංහි නියෝජය කරයි. විරැකියාව නමැති පොදු සමාජ ප්‍රශ්නය සියලු සමාජ සංස්කෘතික තලවල පාත්‍ර වර්ගයාට එක ම ආකාරයට බලපෑම් කර ආකාරය එහි පෙන්නුම් කෙරේ.

ලාංකික සමාජයේ යුග තුනක තාරුණ්‍යය පෙළනු ලබන එක ම සමාජ ගැටලුවක් සමකාලීන සමාජ සාධක මත පිහිටා විවරණය කරන්නට 'පොඩිපුතා', 'අහස් ගව්ව', 'මචං' ය සිනමා කෘති ත්‍රිත්වයෙන් ම උත්සාහ දරා ඇත. දේශීය සිනමා රසිකයා මහ පොළොවේ යථාර්ථයෙන් දුරස් කොට මනෝ ලෝකවලට පිටමං කිරීමේ මෙරට වාණිජවාදී සිනමා ධාරාවට එරෙහිව උඩුගං බලා පිහිනීමේ වඩාත් ප්‍රගතිශීලී මාධ්‍ය භාවිතයක් මෙම කෘති තුනෙහි ම පැහැදිලිව පෙනේ.

පොඩිපුතා චිත්‍රපටයේ විරැකියාව පිළිබඳ ප්‍රශ්නය තමාට, පවුලට හා කුටුම්බයට බලපාන අයුරු විග්‍රහ කිරීමට උත්සාහ දරා ඇති අතර, අවශේෂ සමාජ සාධක එහි දී විමර්ශනයට පාත්‍ර නොකෙරේ. එහෙත් දෛනික ජීවිතය හා සහසම්බන්ධ සජීවී මානව සබඳතා කෙරෙහි විරැකියාවෙන් ඇතිකෙරෙන බලපෑම හා සම්මතයෙන් පිටපැන ඊට විසඳුම් සෙවීමේ ආදීනව යම් සමාජ යථාර්ථයක් මතු කරමින් එහි නිරූපණය වේ.

අහස්ගව්වේ සමාජ සබඳතාව පරිණත ස්වභාවයක් දිස්වේ. එහි සියලු චරිත පැනනගින්නේ එක ම සමාජ පංතියක් පසුබිම් කොටගනිමිනි. තරුණ නාගරික පංතිය සිය ගැටලු විසඳාගැනීමේ ඒකායන

විසඳුම ලෙස රජයේ රැකියා බලාපොරොත්තුව සිටිති. ඔවුන් රජය සමග පවත්නා එක ම සබඳතා මාර්ගය තැපැල් කන්තෝරුව හා එහි ඇති ගැසට් පත ය. සමාජමය ප්‍රකාශන ලෙස නගරයේ ආපන ශාලාව, වංචනික ව්‍යාපාරවල යෙදෙන මැර කණ්ඩායම්, විජේගේ පියාගේ රැකියාව, නැගණියගේ ප්‍රේමය, මහල් නිවාසවල දිනචර්යාව වැනි සීමිත සාධක ගණනක් එහි දී විග්‍රහයට බඳුන් වේ. එසේ ම එහි දැක්වුයේ සීමිත සංස්කෘතික අංග ලක්ෂණ සමුදායකි. පවුලේ සබඳතා, දාරක ප්‍රේමය, ආදරය පවත්නා එහෙත් ජීවිතයේ හදගැස්මට සමීප බවක් නොපෙන්වයි. ඒ නිසා ම විරැකියාව පිළිබඳ ගැටලුව තාරුණ්‍යයේ දෛනික පැවැත්ම යන කරුණට සීමා වෙයි.

මචං චිත්‍රපටයේ සමාජ සම්බන්ධතා ජාලය මීට වඩා පුළුල් පරිසරයක් පුරා විහිදෙමින් ප්‍රේක්ෂකයා ඇමතීම සිදුකර තිබේ. මචංහි සියලු චරිත පැන නගින විරැකියාව කේන්ද්‍ර කොට ගත් අස්ථාවර භාවය සිදවල පුද්ගලයන්ගේ සංකලනයක් ඒ තුළ වේ. මිනී වළවල් කණින්නා පෝස්ටර් අලවන්නෝ, බාර්කීපර්වරයා ඇතුළු පොලිස් නිලධාරීන් දක්වා එහි සම්බන්ධතා ජාලය විහිද යයි. එහි දී මචං චිත්‍රපටය සියලුම ප්‍රේක්ෂකයේ වෙත මේ ඛේදවාචකය තුළින් සමාජ ආමන්ත්‍රණය සිදු කරයි. විවිධ සමාජ තලවල සබඳතා ජාලයක් ඔවුන් සතු වේ. එය එක් ආකාරයකින් විශාල ප්‍රේක්ෂක පිරිසක් ආමනන්ත්‍රණයට යොදා ගත් ප්‍රයෝගයක් වේ. විශාල සමාජ සබඳතා ප්‍රමාණයකින් ප්‍රේක්ෂකයා වෙත ගමන් කිරීමේ අදාළත්වය වැඩි ය. එවිට ප්‍රේක්ෂකයාට සිනමා කෘතිය දැනෙන ප්‍රමාණය වැඩි ය. ප්‍රේක්ෂකයා කුමන සමාජ තලයකට අයත් වුව ද මේ ඉරණම ඔහුට පොදු සාධකයක් බව පැවසීමෙන් ඔවුන් සිනමා කෘතිය හා ප්‍රබල ලෙස බැඳ තබා ගැනීමට කටයුතු කොට ඇත.

එසේම ජර්මනියට යෑමේ අපේක්ෂාව බිඳ වැටු පසු මොවුන් උපකාර පතන්නේ වංචනික විදෙස් රැකියා ඒජන්තයෙකු වන රුවන්ගෙනි. ඔහුගේ සම්බන්ධතා ජාලය විවරණය කළ නොහැකි තරම් ය. වංචාකරුවෙකු ලෙස හඳුනාගන්නා රුවන්ගේ මාර්ගයෙන් ම ඔවුන්ට අවසානයේ විදේශගත වීමට සිදුවේ. ව්‍යාජ ලියකියවිලි සකස් කිරීම හා ව්‍යාජ ලෙස රටින් පිටවීම සඳහා ඔහු වටා ඇති ප්‍රබල සම්බන්ධතා ජාලය ක්‍රමිකව විකාශනය වන ආකාරය සිනමා කෘතියේ දක්නට ලැබේ.

මොවුන් රජය සමග පවත්වන සබඳතා ද අහස් ගව්වේ මෙන් සීමිත වපසරියකට ලඝු නොවේ. එහිදී සමාජයේ පහළ ම තලයේ පිරිස් පවා රජයේ ඉහළ ආයතන සමග සබඳතා පවත්වන ආකාරය දක්නට ලැබේ. ස්ටැන්ලි, මනෝජ්, මිනී වළවල් කණින්නාගේ සිට කාර්යාලයේ සේවය කර සුළු සේවකයා පොලිස් නිලධාරීන් දක්වා තානාපති කාර්යාලය සමග පවත්වන සබඳතා විග්‍රහ වේ. ඒ අනුව විවිධ සමාජ තලවල පුද්ගලයන් එකට ගැටෙන අවස්ථාවක් ලෙස මචං පෙන්වා දිය හැකි ය.

මෙම සිනමා කෘති ත්‍රිත්වය ම ආර්ථික අස්ථාවර භාවය නිසා සමාජ ගැටුම් උග්‍ර වන ආකාරයත් ඊට පිළිතුරු වශයෙන් පැනනගින ජීවිත හා සම්බන්ධ ඛේදවාචකයනුත් ප්‍රකාශ කරයි. අද දක්වාත් වෙනස් නොවූ ප්‍රශ්නයක් යුග තුනක සිනමාකරුවන් ක්‍රමිකව දියුණු සිනමා ආඛ්‍යානයක් ඔස්සේ ගොඩනංවනු ලැබ ඇති ආකාරය මේ පිළිබඳ සමාලෝචනයේ දී පැහැදිලි වේ. පොඩිපුතා චිත්‍රපටයේ දී විරැකියාවේ ආදීනව පවුල් හා මානව සබඳතාවන් කෙරේ වන බලපෑමත්, අහස් ගව්වේ දී විරැකියාව පිළිබඳ ගැටලුව තාරුණ්‍යය කෙරේ ඇතිකරලන පීඩනය හා අභියෝගයනුත් විවරණය කරයි. මචං මේ ගමන්මගෙහි වඩාත් ඉදිරි පියවරක් තබමින් විරැකියාවේ පෞද්ගලික, කුටුම්බ, සමාජ ආදීනව සේ ම ඊට ආබද්ධ

සංස්කෘතික හා මානවීය සංලක්ෂණ ද චිත්‍රපටයට හසුකර ගනී. මේ අනුව විරැකියාව හා බැඳුණු රාජ්‍යමය, රාජ්‍යතාන්ත්‍රිකමය මෙන් ම ප්‍රායෝගික සමාජබද්ධ හෘදය සංවේද මත ගොඩනැගෙන නාටකීය ආඛ්‍යානයක් ඊට පදනම් කොට ගනී.

තවමත් මේ රට තුළ නොවිසඳුන ප්‍රධාන හා සර්වකාලීන සමාජ ගැටලුවක් දෙස දේශීය සිනමාවේ පියවර තුනක ඉදිරි ගමනක් පොඩිපුතා, අහස් ගව්ව හා මචං වෙතින් පිළිබිඹු වේ. ඒ අනුව ලාංකේය සිනමාකරුවා සිය මාධ්‍යය කෘතහස්ත ලෙස මෙහෙයවමින් සමාජ වගකීමට උරදෙන භූමිකාවක රැඳී සිටින වග මෙම චිත්‍රපට ත්‍රිත්වය සනාථ කරයි.

මූලාශ්‍ර

1. වේරගම, ගාමිණී. (2004) දේශීය සිනමා වංශය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ පි. 58, 59
2. මිහිඳුකුල, සුනිල්. (2007) සිනමාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ පි 22
3. එම පි. 22
4. වේරගම, ගාමිණී. (2004) පි. 66
5. ජයලත්, ගාමිණී. (1994 ජුනි 30) දිනමිණ, පි. 08

32

ජනප්‍රිය සිනමාව : ජනශ්‍රැතියේ නව වුහුණුවර

චන්දිමා නිශ්ශංක

''ජනශ්‍රැති වාචික කතන්දර වෙයි. ජනයා අතර විනෝදාශ්වාදය සඳහා ඒවා භාවිත වේ. චමත්කාර විස්මය ජනක දේ හෝ දිනපතා ජීවිතයේ සංසිද්ධි වලින් ජනශ්‍රැති සමන්විත ය. එයටම ආවේණික ශෛලියක ආකෘතියක් ද ප්‍රබන්ධ රීතියක් ද ඒවා සතු ය.'' ජනශ්‍රැති පර්යේෂකයෙකු වන අලෙක්සැන්ඩර් නිකිෆරෝෆ් ගේ විග්‍රහය එසේ වෙයි. වෙනස් වන සුළු වාචික සම්ප්‍රදායක් පදනම් කර ගන්නා ජනශ්‍රැතිය ගැන නිශ්චිත නිර්වචන නැත. එය පැතිරෙන්නේ වාචිකව ය. සම්ප්‍රදාය මත පදනම් වූ සංස්කෘතික ප්‍රජාවක් ඇසුරේ බිහි වන ජනශ්‍රැති, එම කණ්ඩායමේ අත්දැකීම් බෙදා හදා ගනිමින් එම ප්‍රජාවට සේවය කරයි.

ගීයක් නම් ගායනය කළ යුතු මෙන්, ජන කතා කියනු ලැබේ. ඒවා ඇසින් බලා කියවීම අරමුණු කර ගත් ඒවා නොව, කනෙන් අසා ග්‍රහණය කර ගැනීම ඉලක්ක කර ගත් නිර්මාණ වෙයි. ගීතයක් එහි තනුව හා ගායන ලීලා අධයනය කිරීමෙන් තොරව පදමාලාව ඇසුරෙන් අධ්‍යයනය කරන්නට නොහැකි වන මෙන්, ජන කතා ද ඒවායේ ඉදිරිපත් කිරීම් රටා ගැන අවධානයෙන් තොරව අධ්‍යයනය කළ නොහැකි ය. විදග්ධ සාහිත්‍ය මෙන් නොව ජනශ්‍රැති සියලු දෙනාටම වැටහෙන සුළු ය. එය වාග් විද්‍යාවේ සීමාවන් අතික්‍රමණය කරමින්, එක් ජන කණ්ඩායමක සිට තවත් ජන කණ්ඩායමක් වෙත ගමන් කරයි. ජනශ්‍රැතියෙහි සැබෑ උරුමක්කරුවන් වන, දියුණු ශිෂ්ටාචාරයක් සමඟ ගනුදෙනු නොකරන ජන කොටස් වලට මෙන්ම, දියුණු ශිෂ්ටාචාරයන්ට අයත් විදග්ධයනට ද එක ලෙස ජනශ්‍රැතිය රස විඳීමට හැකියාව තිබේ. ජන ශ්‍රැතිය තුළ සදාකාලික නැවුම් ගුණයක් පවතින්නේ එහෙයිනි; ඒවා කාව්‍යාත්මක, විශ්වසනීය හා චමත්කාරී වන අතරම සජීවී උත්කර්ෂවත් බවකින් ද පිරී තිබේ. ළමා කමට හුරු අවිහිංසක ආඛ්‍යාන රීතියකින් වුව ද ගැඹුරු නුවනක් බෙදා දෙයි. යුරෝපා සාහිත්‍යය ගොඩ නැගීමට ජනශ්‍රැතිය විශාල දායකත්වයක් ලබා දුන් බව සාහිත්‍ය විචාරකයන් ගේ මතයයි. එමෙන්ම මධ්‍යකාලීන රුසියානු සාහිත්‍ය තුළ ද ජනශ්‍රැතියේ පුළුල් බලපෑමක් දැකිය හැකිය.

මිත්‍යා කතා හා ජන කතා අතර වෙනසක් තිබේ. මිත්‍යා කතා ආගමික පසුබිමක් සහිත වෙයි. මනුෂ්‍ය හැඟීම් ගහන වූ දෙවිවරු ඒවායේ බහුල වෙති. ජන කතා සෞන්දර්යාත්මක ය. මිත්‍යා කතා වඩාත් පැරණි වන අතර ජනකතා ඊට වඩා පසුකාලීන ය. පුරා කතා මේ දෙවර්ගයෙන් ම වෙනස් වන අතර එහි ආඛ්‍යාන රීතිය ද වෙනස් ය. පුරාකතාවන්ගේ අරමුණ විනෝදායනය නොවේ. සදාචාරකරණය ය. අධ්‍යාත්මික අගයක් සහිත වර්ණනා එහි වෙයි.

ජනශ්‍රැතිය බිහිවන ජන සමාජයේ සමාජ පිළිවෙල ජනශ්‍රැති තුළ අඩංගු වෙයි. ඒවා සම්පූර්ණ මනඃකල්පියක් නොවන අතරම කිසියම් සංස්කෘතියක හැසිරීම පිළිබඳ නිශ්චිත ඓතිහාසික සටහනක් ද නොවේ. ජනශ්‍රැතිය සජීවී වූවකි; එය අපගේ ජීවිත කාලය තුළ දීම වෙනස් කම් වලට භාජන වෙමින් අප සමඟ අත්දැකීම් බෙදා ගනී. දීර්ඝ ජනශ්‍රැති ප්‍රවර්ගයන් මුද්‍රණය වීම ඇරඹුන විට ඒවා මධ්‍යම පන්තියේ රුචිකත්වයට අනුව නැවත හැඩ ගස්වනු ලැබිණි.

තරමක් විවාදාත්මක වුව ද ජනශ්‍රැතිය සංස්කෘතික උරුමයන් සමඟ බැඳී ඇති බව ලොව පුරා පිළිගනී. ජාතික උරුමයන් ගෙන් බහුතරය ගොඩ නගන්නට ජනශ්‍රැති දායක වූ බව ගෝලීය උරුමයන් පිළිබඳ අධ්‍යනයේ දී පුළුල් ලෙස අවධානයට ගනී. ජනශ්‍රැති අධ්‍යයනය දියුණු වූයේ 19 වන සියවසේ රොමෑන්ටික් ජාතිකවාදය තුළිනි.

ජනශ්‍රැතියේ ඇති කණ්ඩායම් ගුණය එහි ජාතික අනන්‍යතාව සංකේතාත්මකව ගොඩ නගනු ලබයි. රොමෑන්ටික් ජාතිකවාදය පිළිබඳ කතිකාවේ කේන්ද්‍රීය අදහස වනුයේ ජනශ්‍රැති අතීතයේ අනුස්මරණීය පුරාවස්තු වන බවයි. එමගින් දීප්තිමත් සංස්කෘතික අනන්‍යතා වර්තමානය තුළ වැඩි දියුණු කර ගන්නට උපකාර වන බව පිළිගනු ලැබේ. මෙම රොමෑන්ටික් ජාතිකවාදීන්ගේ ඉලක්කය වූයේ පරමාදර්ශී ජාතික අනන්‍යතාවක් මත පදනම් වූ නව සමාජයක් ගොඩ නැගීමයි. එමගින් පැරණි ශිෂ්ටාචාරයේ ස්වර්ණමය යුගයන්හි කාන්තිය වර්තමානය මත පරාවර්තනය වනු ඇතැයි ඔවුහු විශ්වාස කළහ.

ජනශ්‍රැති පර්යේෂකයා ඉතිහාසය, සාහිත්‍යය, මානව විද්‍යාව හා සමාජ විද්‍යාව වෙතින් විෂයීක ශික්ෂණයක් ලැබුව ද, වෙනස් දෘෂ්ටි කෝණයකින් විෂය ක්ෂේත්‍රය දෙස බැලිය යුතු වෙයි. ජනශ්‍රැති නිල නොවන ප්‍රකාශන ගුණයෙන් යුතු සන්නිවේදන විධීන් වන අතර ඒවා දිනපතා ජීවිතය සමග බැඳී තිබේ. එය සම්භාව්‍ය නිල සංස්කෘතියේ කොටසක් නොවේ. එහෙයින්ම එය අධ්‍යයන ආයතන මට්ටමෙන් උගන්වනු නොලැබේ. ශාස්ත්‍රාල තුළ උගන්වනු ලබන්නේ ප්‍රභූ සම්භාව්‍ය කලාවන් ය. ජන කලාවන් සම්භාව්‍ය කලාවට වඩා ජනප්‍රිය කලාවට සමීප කම් දක්වයි.

කෙසේ වුව ද, ජනශ්‍රැති අධ්‍යයනය හුදෙක් සාහිත්‍යමය අධ්‍යයනයක් නොවේ. සමාජීය තත්ත්වයන් හා හැසිරීම් දාමයක ප්‍රකාශනයක් වන ජනශ්‍රැති නිසි ලෙස ග්‍රහණය කර ගැනීමට කිසිවෙකුට අවශ්‍ය නම්, එය අයත් සමාජ සම්ප්‍රදාය විසින් දිනපතා ජීවිතයේ ක්‍රියාත්මක කරන සංස්කෘතික අගයන්, අභිලාශ හා විශ්වාසයන් ගැන අවබෝධයක් තිබීම අවශ්‍යය. ඒ ඒ අවස්ථාවන්ගේ හා සමාජීය භාවිතයන් ගේ ප්‍රකාශනයක් වන ජනශ්‍රැති, සංකේත භාවිත කොට සිය ආඛ්‍යානය සකසා ගන්නා අතර අත්දැකීම් සංක්ෂිප්ත කරයි. යථාර්ථයෙන් නිදහස් වීමට මඟ පෙන්වයි. එය එක් අයුරකින් ප්‍රබන්ධයක් මෙනි. එහෙත්

මතුපිටින් පෙනෙන අතාර්කික හා අපිළිවෙළ විනිවිද ගොස් යටි පෙළ සොයා ගැනීම පර්යේෂකයෙකුගේ කාර්ය භාරය වෙයි.

ජනශ්‍රැතිය යථාර්ථයට ඇති සම්බන්ධ ය. ව්ලදිමීර් ප්‍රොප් විස්තර කරන්නේ මෙසේ ය.

1. වෙනත් ඕනෑම කලාවක් මෙන් ජනශ්‍රැතිය ද යථාර්ථය වෙතින් පැන නගී.
2. එහි නිර්මාණකරුවන් ගේ අත්දැකීම් හා සැබෑ ජීවිතය ජනශ්‍රැතියේ පිළිබිඹු වේ. කාලය හා ප්‍රවර්ගය අනුව මේ පිළිබිඹුව වෙනස් වේ.
3. ජන කලාකරුවා යථාර්ථය නියෝජනය කරනු පිණිස තමන්ගේම ඉලක්කයක් ගොඩ නගා ගනී.

ඔහු එය නැවත වෙනත් ආකාරයකින් ද විවරණය කරයි.

1. ජනශ්‍රැතිය යථාර්ථයෙන් පැන නැගෙන්නේ වුව ද එය නිශ්චිත යථාර්ථයක් සමඟ බැඳී නොපවතී.
2. අනෙක් ආකාරය නම් මිනිසුන්ගේ ජීවිත වල සැබෑම ස්වරූපය ද එහි ගැබ්ව තිබීමයි.
3. යථාර්ථය විස්තර කිරීමට ඉදිරිපත් කරන්නාට ඇති අභිලාශය නිර්මාණ තුළින් පැහැදිලි වේ.

ජනශ්‍රැති එක්රැස් කිරීම සමනලුන් එකතු කිරීමක් බඳු යැයි ඩන්ඩිස් පවසයි. ඒවා එතරම්ම විචිත්‍රය; දුර්ලභය; රූපකාර්ථවලින් කතා කරයි. මෙසේ විස්තර කරන්නට යෙදුන ද 19 වන සියවසේ දී කාර්මීකරණය ගැමි ජීවිතය හා ගැටෙන විට, සංස්කෘතිය මත පදනම් වූ ජාතිකවාදය හා අධිරාජ්‍යවාදී පාලනයත්, යටත්විජිතවාදය හා සංස්කෘතික සාපේක්ෂතාවයත් එකිනෙක ගැටෙන විට ජනශ්‍රැතිය අභියෝගයට ලක්විය.

ජන වීරයා :

ජන කතාවන් හි එන වීරයා පැන නගින්නේ සමාජ අර්බුද තුළිනි. පීඩනයට පත් මිනිසුන්ගේ සමාජ කණ්ඩායම් තුළ පීඩනයට එරෙහිව නැගී සිටින කැරලිකරුවන් වීරයන්සේ ඉස්මතු වේ. මරණින් මතුව ද ඔවුන් විසූ ජන කණ්ඩායම් තුළ ඔවුන් පිළිබඳ පුවත් මුඛ පරම්පරාගතව පවතී. එය ලෝකය පුරා දැකිය හැකි ප්‍රවණතාවකි. එය ''රොබින් හුඩ් නියමය'' ලෙස හැඳින්වේ. මෙම ආකෘතිය පැන නැගුනේ අපරාධකාරී වීරයන් පිළිබඳ ඉතිහාසය හා පුරා කතාවන් හි අඩංගු සත්‍යය ද ප්‍රබන්ධය ද තුලනාත්මකව අධ්‍යනය කිරීමෙනි. සියවස් දෙකක් පුරා පැතිරුණ කරුණු එහි දී සැලකිල්ලට ගෙන ඇති අතර ආසියාව, යුරෝපය හා ලතින් ඇමෙරිකාව ආදී විවිධ භූගෝලීය කලාපයන්ට අයත්, චීනය, ජපානය, ඉන්දියාව, රෝමය, ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදය, බ්‍රසීලය ආදී රටවල් රැසක් අවධානයට ලක් වී තිබේ. පූර්ව ක්‍රිස්තියානි, ක්‍රිස්තියානි, ඉස්ලාම්, හින්දු, බෞද්ධ ආදී ආගමික හා සංස්කෘතික පදනම් ඊට පසුතල වේ. බොහෝ පුරා කතා, ගීත, සාහිත්‍ය ආදී කලා නිර්මාණයන් තුළ අපරාධකාරී වීරයන් පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

අපරාධකාරී වීරයන් නිර්මාණය වීම.

අපරාධකාරී වීරයන් නිර්මාණය වීම දීර්ඝ කාලීන, සංකීර්ණ හා පුළුල්ව විහිදුන සමාජ ආර්ථික දේශපාලන ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි. එය පුළුල් කාල හා අවකාශ පරාසයක විහිදුන විශ්වීය මානව ක්‍රියාකාරීත්වයකි. යහපත් හොරෙක්, ගරු කටයුතු හොර දෙටුවෙක්, සමාජ වීරයෙක් වන මංකොල්ලකරුවෙක් නිර්මාණය කර ගැනීමේ ප්‍රවණතාවයක් ලොව පුරා සංස්කෘතීන් තුළ දැකිය හැකිය. ඒවායේ පොදු ලක්ෂණය නම් මෙම මංකොල්ලකරුවන් පොහොසතුන් ගෙන් සොරා ගත් හෝ මංකොල්ලකා ගත් දේ දුප්පතුන් අතර බෙදා දීමයි. මෙබඳු වීරයන් මිය ගිය පසු ඔවුන්ගේ ජීවන පුවත් ජනශ්‍රැති ගත වේ. තවත් කාලයක, තවත් තැනක දී පුද්ගලයෙකු පීඩනයට එරෙහිව අවි එසවීමට දිරි ගන්වන මග දැක්මක් බවට පත් වේ.

බොහෝ අපරාධ වීරයන් ශක්තිමත් ජාතික වාර්ගික හෝ ආගමික අනන්‍යතාවක් සහිත ය. එම ප්‍රජා කණ්ඩායම් අතර ඔහු නැවත නැවත කියවන ජනශ්‍රැතියක් බවට පත් වේ. සමාජ වීරයන් වන කොල්ලකරුවන් බිහිවන්නේ අසාධාරණයට හා පීඩනයට පත් වූ ජන කොටස් වෙතිනි. හොබ්ස්බවුම් පවසන පරිදි, පසුව ඔවුන් ජනප්‍රවාද බවට පත් වේ. එබඳු වීරයන් පැන නගින්නට හේතු වන කරුණු බොහෝ විට ජාතිය, ආගම, ජන වර්ගය, පන්තිය හෝ කුලය පදනම් කර ගනී.

ග්‍රීසියේ හා තුර්කියේ විසූ එබඳු කැරලිකරුවන්ට විරුද්ධව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය නීති පවා සම්පාදනය කර තිබිණි. ඔවුහු ඉතා විශාල ජනතා සහයෝගයක් දිනා ගත්තෝ වූහ. ඔවුන් පිළිබඳව 20 වන සියවසේ මුල් කාලයේ දී පද්‍ය 318 ක ග්‍රීක වීර කාව්‍යයක් ලියැවී ඇති අතර පද්‍ය 400 ක තුර්කි කාව්‍යයක් ලියැවී ඇත. අපරාධ වීරයන් ගේ පොදු ලක්ෂණ කිහිපයකි.

1. ඔවුන්ට කුරුල්ලන්ට මෙන් ඉගිල යා හැකි වෙයි.
2. විවිධ වෙනස් ඇඳුම් පැළඳුම් ආදියෙන් දිනපතා පෙනී සිටී.
3. කඩවසම් පෙනුමෙන් යුතුය.

පොදුවේ ගත් විට ආකර්ෂණීය ය. ඔවුහු සිය ජන කණ්ඩායමේ යහපත පිණිස සටන් වදිති. මිනිසුන් මරන්නේ ආත්මාරක්ෂාව පිණිස පමණි. මග හැරිය නොහැකි අහම්බයකදී හැර කාන්තාවන්ට හිරිහැර නොකරති. පාලකයන් ගේ උගුල්වලට හසු නොවී පැන යති. ඉතා ශක්තිමත් හා නිර්භීත වෙති. එමෙන්ම ආයුධ හැසිරවීමෙහි සුරු වෙති. බොහෝ විට සිය කණ්ඩායමේ සාමාජිකයෙකු හෝ සමාජ කණ්ඩායමේ කිසිවෙකු විසින් පාවා දීමෙන් පාලනාධිකාරියට කොටු වෙති. ජන ගායනා ජන කතා පිරී තිබෙන්නේ මෙබඳු පුද්ගලයන් පිළිබඳ සානුකම්පිත වර්ණයන් ගෙනි.

අපරාධ වීරයන් මිය ගිය පසු ඔවුන්ගේ මරණින් මතු ජීවිතය බිහි කරන්නේ ජනශ්‍රැති, පුවත්පත්, නාට්‍ය, කවි හා සිනමාව විසින් බැව් ග්‍රැහැම් සීල් පවසයි. ඉන්දියාවේ මෑත කාලීන අපරාධ වීරයෙකු වූ වීරප්පන් ඒ පිළිබඳ නිදසුනකි. ඔහු ඉන්දියාවේ ''වඩාත්ම අවශ්‍ය අපරාධකරුවා'' විය. ජනමාධ්‍ය ඔහු පිළිබඳ වාර්තා කිරීමේ දී අතිශයෝක්තියෙන් යුතු වචන භාවිත කළ අතර ''ඉන්දියානු ඔසාමා බින් ලාඩන් / රොබින් හුඩ්'' ආදී ලෙසින් හැඳින් විය. ඔයැ? Weekend Australian 2004 දී වාර්තා කළේ වීරප්පන්

සමහරුන්ට දුෂ්ටයෙකු වන අතර ඇතැමෙකුගේ වීරයෙක් වන බවයි. ඔහු ගැන ජනප්‍රිය ධාරාවේ සිනමා කෘති දෙකක් බිහි වී ඇති අතර ඔහු වර්තමාන රොබින් හුඩ් වෙතැයි එම වාර්තාව සඳහන් කරයි. වීරප්පන් ජීවත්ව සිටින කාලයේ දීම ඔහුගේ ක්‍රියාවන් ගැන සිනමා තිර පිටපත් ලියැවුන අතර මළ සිරුරේ උණුසුම යන්නටත් පෙර ඔහුගේ මරණින් මතු ජීවිතය නිර්මාණය කිරීම ඇරඹිනි.

ඉතිහාසය හා මිත්‍යා කතා තුළ අපරාධ වීරයා අවධානයට ගැනෙනුයේ සංස්කෘතික න්‍යායකට අනුවය. එනම් ''කොතැනක හෝ හිඳින ජන කණ්ඩායමකට, ඔවුන් අසාධාරණයට ලක්වන බව, අසමාන ලෙස සැලකීමකට ලක්වන බව, පීඩනයට පත් වූ බව හැඟෙන විට ඓතිහාසික හෝ ප්‍රබන්ධ අපරාධ වීරයා කරලියට පැමිණේ. ඔහුගේ මරණින් මතු ජීවිතය ද ඒ මිනිසුන් විසින් උත්කර්ශයට නගනු ලබයි. රෝම අධිරාජ්‍ය සමයේ සිට අද දක්වා ලොව පුරා ජනශ්‍රැති ගත අපරාධ වීරයා බිහි වන්නේ ඒ අනුවය. ඉතිහාසයන් ජනශ්‍රැතියත් අපරාධ වීරයා ගොඩනගන්නට උපකාර වන අතර ජනමාධ්‍ය රොබින් හුඩ් න්‍යාය ඉදිරියට ගෙන යන්නට උපකාර කරයි. ජනප්‍රිය සිනමාව එහි ප්‍රධාන මෙහෙයුම් කාරකය ලෙස ක්‍රියා කරයි.

ජනශ්‍රැති සිනමාව

ඇතැම් සිනමා කෘති ජනශ්‍රැතිකරුවන්ගේ කාර්ය භාරය ඉටු කරන අතර සමකාලීන පුරා කතා එක් රැස් කරන්නෙක් ලෙස ද ක්‍රියා කරයි. නූතන පුරා කතා රැස් කරන්නෙක් හා බෙදා හරින්නෙක් ලෙස සිනමාවේ හා රූපවාහිනියේ කාර්ය භාරය නිසි ලෙස තක්සේරු වී නැත. එක් අතකින් ජනමාධ්‍ය මගින් සංස්කෘතික ප්‍රකාශනයන් සජාතීයකරණය කිරීම නිරීක්ෂණය කිරීමට හා ග්‍රහණය කිරීමට හැකිය. අනෙක් අතට සාම්ප්‍රදායික ආඛ්‍යාන ශෛලීන් හා මුඛ්‍යාර්ථයන් ජනප්‍රිය සිනමාව හා රූපවාහිනිය තුළ ඉදිරිපත් වන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. ජනප්‍රිය සංස්කෘතික ප්‍රකාශනයන් තුළ සමකාලීන විශ්වාස හා සම්ප්‍රදායන් පරාවර්තනය වන්නේ කෙසේ ද යන්නත් රසික සංස්කෘතියේ පරාසයන් හා ජනප්‍රිය සංස්කෘතික පරිභෝජනයේ හැසිරීම ද එමගින් අනාවරණය කර ගත හැකිය.

ස්මිත් තොම්සන් පවසන්නේ සිනමාව අසිරිමත් කතන්දර කියන්නෙකු මෙන් ම කතන්දර බෙදා හරින්නෙකු ද වන බවයි. සුරංගනා කතා කීමට කදිම මාධ්‍ය සිනමාව යැයි ඔහු කියයි. ජනශ්‍රැතියේ එන මනෝ රූප පහසුවෙන් එමගින් දෘශ්‍ය රූප බවට පත් කළ හැකි අතර ඒවාට ජීව ගුණයක් ලබා දීමට ද පිළිවන. ජනමාධ්‍ය මගින් ගොඩ නගන ගෝලීය ගම්මානයේ දී නිල තොරතුරු සජාතීය කිරීමේ බලපෑමෙන් නව ප්‍රජාවක් ගොඩ නගන අතර, මහා සමාජය වෙත කතා පුවත් දැවැන්ත ලෙස අලෙවි කිරීම මගින් වෘත්තීය, වාර්ගික, වයස් කාණ්ඩ, ලිංගිකත්වය, ආගමික හෝ වෙනත් කණ්ඩායම් ජනශ්‍රැති වාහක ප්‍රජාවක් ලෙස ගොඩ නැගිය හැකිය. හඳුනා ගත් තොරතුරු ක්‍රමානුකූලව ලොව පුරා පුරවැසියන් වෙත සමාන ලෙස බෙදා හැරීම මගින්, ජාතික සීමාවන් ඉක්මවා සංකේතීය සජාතීය සමාජ පිළිවෙළක් ගොඩ නැගිය හැකි යැයි විශ්වාස කෙරේ. එමෙන්ම චිත්‍රපට හා රූපවාහිනිය බඳු ජනප්‍රිය සංස්කෘතිකාංග මගින් විවිධ සංස්කෘතීන් සජාතික එක් පාරිභෝගික ක්‍රමයකට පෙරලනු හැකි වෙතැයි ඩෙනේ අදහස් කරයි. ජෙරල්ඩ් තෝමස් පවසනුයේ රූපවාහිනී සෝප් ඔපෙරාව නිව් ෆවුන්ඩ්ලන්ත කතන්දර කීමේ සම්ප්‍රදාය අනුව ක්‍රියා කරන බවයි. ඔහු ගේ නිරීක්ෂණය නම් ජනශ්‍රැතිය මෙන්ම සෝප් ඔපෙරාව ද දෘශ්‍ය

රූපයට වඩා වාචික සම්ප්‍රදාය වෙත වැඩි විශ්වාසයක් තබන බවයි. එලිසබෙත් බර්ඩ් ගේ අදහස ජනප්‍රිය සංස්කෘතිය සපුරාම ජන ආඛ්‍යාන භාවිත කරමින් නව තේමාවන් පළ කරන බවයි. ජනප්‍රිය සංස්කෘතිකාංග ප්‍රේක්ෂකාගාරයේ වැඩි ආකර්ශනයට ලක් වනුයේ එහෙයින් බව බර්ඩ් පවසයි.

ජනශ්‍රැති සිනමාවේ භාවිතය

1934 දී පමණ බ්‍රිතාන්‍ය සිනමා අධ්‍යයන ආයතනය ජනශ්‍රැති සිනමාව පිළිබඳ උනන්දුවක් දක්වා තිබේ. එක්සත් ජනපදයේ දී 1935 වසරේදී පමණ එබඳු අවධානයක් පළ වූ බවට සාධක ඇත. 70-80 දසක වල දී ජනශ්‍රැති පදනම් කරගත් සිනමාව වාර්තා චිත්‍රපට ප්‍රවර්ගයක් ලෙස සලකන්නට හුරු වී සිටිය ද, ෆෙයින්ටම් වැනි විචාරකයන් විසින් එම සිනමාව කොන් කළ සිනමාවක් නොව සම්පූර්ණ අරමුණු සහගත ඉදිරිපත් කිරීමක් ලෙස හඳුන්වා ඇත. 1980 සිට චීනය තුළ චීන සංස්කෘතිය හා සාම්ප්‍රදායිකත්වය තහවුරු කරන්නට විශාල කාර්ය භාර්යක් ඉටු කළේ ජනශ්‍රැතිය පදනම් කර ගත් සිනමාව මගිනි. චීන සිනමා අධ්‍යයන ක්ෂේත්‍රයේ දී මෙය ගැමි සිනමාව ලෙස ශානර ගත කොට තිබුණ ද, 80 දශකයේ සිනමා අධ්‍යයන පාසල් තුළින් බිහි වූ 'පස්වන පරපුර' නම් කණ්ඩායම ජනශ්‍රැති පදනම් කරගත් සිනමා කෘති සඳහා ජාතික හා ජාත්‍යන්තර සම්මාන දිනා ගෙන ඇත.

වාර්තා චිත්‍රපට වලින් ජනශ්‍රැති පාදක කරගත් සිනමාව වෙනස් වන අයුරු ශර්මන් පැහැදිලි ලෙසම පෙන්වා ඇත. මෙම සිනමා කරුවන්ගේ අරමුණ ජනශ්‍රැති වාර්තාගත කිරීම නොවේ. ජනශ්‍රැති සිනමාව ජන චර්යාවන් උත්සව හෝ ප්‍රාසාංගික ඉසව් ඉදිරිපත් කරන අතර, ප්‍රේක්ෂකයා ඒ තුළ තමාගේ ජීවිතයෙහි කැඩපත් පිළිබිඹුව දකී. අපට අප ගැනම අර්ථකථනය කරන්නට එමගින් කවුළුවක් හැර දෙයි. මෙම අර්ථාන්විත එළඹුම මඟින් ජනශ්‍රැති සිනමාව විග්‍රහ කිරීමේදී සිනමාකරුවා, කෘතිය හා ප්‍රේක්ෂකයා අතර අන්තර්පයීත හා සංදර්භමය අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇති සම්බන්ධයක් ඇති වෙයි. චිත්‍රපට මගින් කාර්මීකරණය වූ සමාජයේ සම්ප්‍රදායන් ජාලය හා පුද්ගලයා පිළිබඳ විග්‍රහ කරයි. ඇතැම් විට ඒ සිනමාකරුවා සබඳතා දක්වන ජන වර්ගය, ආගම, රැකියාව හෝ විශේෂ අවධානය සහිත ජන කණ්ඩායම් පිළිබඳව වුව ද විය හැකිය.

ජනශ්‍රැති පාදක කරගත් සිනමාව පිළිබඳ අධ්‍යයනය සමාජ හා සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ විෂය ක්ෂේත්‍රයක් පමණක් නොවේ. ජනශ්‍රැති අන්තර්ගතය හා සිනමාත්මක ක්‍රියාදාමය යන දෙඅංශය ම එමගින් ශක්තිමත් කෙරේ. මයික් ජේ. කොවන් 2003 දී ප්‍රකාශ කළ ආකාරයට පසුගිය දශක දෙකකට අධික කාලයක දී ජනශ්‍රැතිය ජනප්‍රිය සිනමාව හා රූපවාහිනිය වෙත විහිදී තිබේ. ඇතැම් චිත්‍රපට ඍජු ලෙස ජනශ්‍රැතිය කැඩපත් පිළිබිඹු ලෙස ඉදිරිපත් කිරීම හෝ වාර්තා කිරීම නොකරයි. ඒවා ජනශ්‍රැතිය අනුසාරයෙන් එහි ආකෘතික ලක්ෂණ භාවිත කරමින් නව ජනශ්‍රැති නිර්මාණය කරයි. නිශ්චිත සිනමා කෘතිය තුළ පමණක් පවතින එබඳු කල්පිත ජනශ්‍රැති සිනමා ජනශ්‍රැති ලෙස නම් කර ඇත. ජනශ්‍රැතියක බඳු සමාජ ආකල්ප නියෝජනය කිරීම්, ප්‍රාසාංගික බව නිර්මාණය කර හෝ දෙමුහුන් කර වෘතාන්ත චිත්‍රපට තුළ බහා ඇත. සමාජ ඓතිහාසික, භූගෝලීය හා සංස්කෘතික පසුතලයන් පිළිබඳ මුල් සංදර්භයන් ගෙන් ඉවත් කොට සලකා බලන විට, ඒවා ජනශ්‍රැති බඳුව ක්‍රියා කරයි. දර්ශනය, රංගනය, සිද්ධි, සිනමා ජනශ්‍රැති කතා පුවත තුළ වාචිකව හෝ නිර්වාචිකව අන්තර්ගත විය හැකිය.

ඉන්දියානු සිනමාවේ පළමු කෘතිය වන රාජා හරිශ්චන්ද්‍ර (1913) මහා භාරතය ඇසුරු කර ගෙන ලියැවුන තැන් පටන්, දකුණු ආසියාව පුරා තිරකතා රචකයන් ජනශ්‍රැතිය සිය පිටපත් රචනයට දායක කර ගත් අවසථා අප්‍රමාණ ය. ආරම්භයේ පටන්ම දකුණු ආසියානු සිනමාවේ විචිත්‍රත්වය උදෙසා ජන නාටක නැටුම් සංගීතය හා කවි උපයෝගී විය. යුරෝපයේ බිහි වූ සිනමා මාධ්‍යය ආසියාව තුළ දී ඊටම අනන්‍ය සුවිශේෂී ආකෘතික ලක්ෂණ සහිත කලාවක් බවට පත් වන්නේ එහෙයිනි; ජනයා ගේ සංස්කෘතික ආත්මික ලක්ෂණ ජනශ්‍රැතියේ ආකෘතික ලක්ෂණ තුළින් ප්‍රක්ෂේපණය කරන්නට මංපෙත් විවර කර ගැනීම නිසා ය. පාකිස්තානයේ ජනප්‍රිය සිනමාව කල එළි දකින්නේ 50 දසකයේ දී වන අතර, 1954 දී තැනුන ''සාසි'' චිත්‍රපටයට පාදක වනුයේ ඉන්දු නිම්නය පුරා පැතිර තිබූ සාසි පුන්නු නම් ජන කතාවයි. ඒ අනුව යමින් 1956 වන විට ''උමර් - මර්වි'' නිපදවනු ලැබුවේ ද ඉන්දු නිම්නයේ ජනප්‍රවාද පදනම් කර ගනිමිනි. 70 දසකයේ මැද භාගයේ යුසුෆ් රතෝරේ ගේ සයිරන් ජෝ සවාල් දක්වාම තැනුන චිත්‍රපට ගැමි සාම්ප්‍රදායික කතන්දර පදනම් කර ගත් අතර, විශාල ප්‍රේක්ෂකාගාරයක් ආකර්ෂණය කිරීමට එම කතන්දර සමත් විය. පසු කලෙක මසාල සිනමා අන්තර්ගතය කරා පරිවර්තනය කරනු ලැබුව ද උමර්-මර්වි වෙතින් ලද ආභාසය එතුළ පවා සම්පූර්ණයෙන් මැකී ගොස් නැත. ජනශ්‍රැතියේ එන ජන වීරවරිය උමර්-මර්වි තුළ දේශප්‍රේමී කතා නායිකාව ලෙස ඉදිරිපත් කර තිබේ. එවක සමකාලීන දේශපාලනය තුළ ඉස්මතුව තිබූ ප්‍රවණතාවට එය සපුරා සමපාත විය. පාකිස්තානය බෙදීයාම නිසා මනසින් ඇද වැටුන ජාතිය තුළ ''ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පටන් ධෛර්ය සම්පන්න වීරයන් බිහි කළ ජාතියක් වෙමු'' ය යන අභිමානය කුළු ගන්වන්නට එය සමත් විය. උමර්-මර්වි පිටපත 1990 දසකයේ දී නැවත රූපවාහිනී නාට්‍යයක් ලෙස නිෂ්පාදනය වීම ම එහි සමාජ බලපෑම පිළිබඳ නිදසුනක් වෙයි.

උමර්-මර්වි සිනමා කෘතිය මගින් සින්ද් ශිෂ්ටාචාරය ජනශ්‍රැති ගත කිරීම එකිනෙක මත ගැටෙන ජාතිකත්වය සමග සබැඳි දේශපාලන තත්ත්ව දෙකක් වෙයි. එක් අතකින් එය සුවිසල් ජනවාර්ගික හා සංස්කෘතික විවිධත්වයක් සහිත පාකිස්තාන අනන්‍යතාව සනිටුහන් කරයි. අනෙක් අතින් ජාතියේ අභ්‍යන්තර ආධිපත්‍යය හා ස්වෛරීත්වය වෙත වෙනත් බාහිර මැදිහත්වීම් සීමා කිරීමට යෝජනා කරයි. උමර්-මර්වි ප්‍රේක්ෂකයාට ආරාධනා කරනුයේ අකාලික ප්‍රජා කණ්ඩායමක් හඳුනා ගන්නටයි. 1950 ගණන් වල දී සංස්කෘතිය හා එහි අනාගතය ගැන තිබූ සැක සංකා මෙම සිනමා කෘතියේ අඩංගුය. එමගින් පැරණි කතාවක් නව මාධ්‍යයක් මගින් ප්‍රක්ශේපනය කරමින් සුවිශේෂී සාමූහික අත්දැකීමක් ප්‍රේක්ෂකයාට ලබා දෙයි. එකිනෙකා නොදන්නා ඉන්දු නිම්නයේ ජන සමූහයාට, රට පුරා විසිරුණ අඳුරු කාමර වල දී එකිනෙකා නාඳුනන මිනිසුන් සමඟ අසුන් ගෙන එක පොදු අත්දැකීමක් බෙදා හදා ගැනීමට සිනමා කෘතිය අවස්ථාව සලසයි. එතෙක් මෙම කතාව රඟ දැක්වුන වේදිකා නාට්‍ය, නැටුම් හා ගායනා ආකෘති සුමට ලෙස සිනමා කෘතිය තුළ අදහස් පළ කිරීමට යොදා ගන්නා අතර එමගින් පැරණි සම්ප්‍රදාය නව තාක්ෂණය සමඟ මුසු කරයි; ප්‍රේක්ෂකයාට හුරු පුරුදු අත්දැකීමක් බවට පත් වෙයි.

ජනප්‍රිය සිනමාව : නූතන ජනශ්‍රැතියක්

ජනශ්‍රැතිය නිශ්චිත කාල පරාසයක් හෝ නිශ්චිත භූගෝලීය ප්‍රභේදයක් හෝ සංස්කෘතියක් නියෝජනය කිරීම නිරූපනය කිරීම නොකරයි. එසේම ජනශ්‍රැති සිනමාව ද නිශ්චිත සංස්කෘතියක් හෝ කාලයකට අයත් පුද්ගල කණ්ඩායමක් ස්ථානයක් ඍජුව නියෝජනය නොකරයි. එය; කාලය කාලයෙන්

බැහැරට ගෙන සිනමාව මත තබා නිරූපනය කරයි. සිනමා ජනශ්‍රැතිය මගින් ජන කණ්ඩායම් හෝ පුද්ගලයන් පිළිබඳ සංස්කෘතික අනන්‍යතා ගොඩනගයි. එමගින් එම ප්‍රබන්ධයන් සත්‍ය ලෙස සලකන නරඹන්නන් මුලා වීම ද සිදුවිය හැකිය. නිදසුන් ලෙස ජෝන් ෆෝඩ් සිය නිර්මාණ තුළ ගොඩනගන ''හොලිවුඩ් ඉන්දියානුවා'' සිතා මතාම ස්වදේශික අමෙරිකානුවන් වරදවා නිරූපනය කිරීමකැයි දෝෂාරෝපණයට ලක්ව තිබේ. සිනමා ජනශ්‍රැතිය කාව්‍ය හා තිරය හරහා සිනමා කරු හා ප්‍රේක්ෂකයා අතර සන්නිවේදනයක් ගොඩ නගයි. ජනශ්‍රැති සිනමාව ඉදිරියේ ඇති අභියෝගය නම් සිනමාකරුවා හා ප්‍රේක්ෂකයා අතර වන සන්නිවේදනයයි. එහි දී ඒ දෙදෙනා එකම සංස්කෘතික රාමුවකට අයත් වේ නම් සිනමා කෘතියෙහි සංදේශය සන්නිවේදනය වන ප්‍රමාණය හා පිටස්තර සංස්කෘතියකට අයත් ප්‍රේක්ෂකාගාරයකට සිනමා කෘතිය සන්නිවේදනය ප්‍රමාණය අතර වෙනසක් තිබේ.

අනෙකක් තබා එකම සංස්කෘතික රාමුවක් තුළ දී පවා පැරණි අගයන් හා නව අගයන් අතර ගැටුම් පැන නගී. පැහැදිලිවම ජනශ්‍රැති සිනමාව, අතීතය වර්තමානයට ද අනාගතයට ද ප්‍රක්ෂේපණය කරයි. එය වෙනත් ඕනෑම සංස්කෘතිකාංගයක් මෙනි. ජනශ්‍රැති පාදක කර ගත් සිනමාව මතකයන් හා මනඃකල්පිතයන් අන්තර්ගත කර ගනී. ඒවා පොහොසත් සමාජ සම්ප්‍රදායන් වෙතින් පැන නැගී ප්‍රේක්ෂකාගාරයේ අතීතකාමය අවුළුවයි. එය ජනශ්‍රැතියක අරමුණ වන විනෝදාස්වාදය, සමාජ චාරිත්‍ර හා සාරධර්ම තහවුරු කිරීම හා සංස්කෘතික චර්යාවන් තහවුරු කිරීම යනාදිය ඉටු කරයි. ජනශ්‍රැති සිනමාව නිසැක ලෙසම අභියෝගයට ලක් වනුයේ අන්තර් සංස්කෘතික ගැටුම් සහිත, නව යුගයේ සංස්කෘතික අනන්‍යතා මගිනි. ජනවාර්ගිකත්වය දේශපාලන හා සංස්කෘතික නිර්මිතයකි. එහෙයින් රටින් රටට ජන වාර්ගිකත්වය පිළිබඳ පැහැදිලි කිරීම් වෙනස් විය හැකිය.

ජනශ්‍රැති සිනමාව මේ අභියෝගය මැද සංස්කෘතික අනන්‍යතා විවරණයක යෙදෙන හෙයින් ''මුල් සොයා යන'' සිනමාවක් ලෙස ද හැඳින්විය හැකිය. සැබැවින් ම එය මතකයන් හා සම්ප්‍රදායන් නවීකරණයේ මාර්ගයක් ලෙස සැලකේ.

මූලාශ්‍ර

Barucha, Rustom.1989. Notes and the Invention of Tradition. Economic and Political Weekly.Vol.24 No.33

Bronner, Simon.2007. The Meaning of Folklore.Utah State University Press. Logan.

Cashmen, Ray. 2000. The Heroic outlaw in Irish Folklore and Popular Literature. Routladge. Bloomington.

Harvilahti, Lauri. 2003. Folklore and Oral Tradition. Vol. 18. Universiti of Helsinki.

Koven, Mikel J. 2003. Folklore Studies and Popular Films. The Journal of American Folklore Vol 116 No 460. Spring. University of Illinois Press.

Krawczyk, Violetta. E-Folklore in the Age of Globalization. Fabula. Vol.47. No.3. New York.

Peter, Pugsley.2013. Tradition Culture and Aesthetic in Contemporary Asian Cinema. Ashgate Publishing Company. Burlington.

Seal, Graham.2009. The Robinhood Principle: Folk History and Social Bandit Journal of Folklore Research. Vol 46 No: 1. Indiana University Press. Baltimore.

Sims, Maria.2011. Living Folklore. Utah University Press. Logan.

Wang, Yiman. 2013. Remaking Chinese Cinema. University of Hawaii Press. Honolulu.

Wilson, William.2006 The Marrow of Human Experience. Utah University Press. Logan.

Zhang, Juwang. 2005. Filmic Folklore and Chinese Cultural Identity. Western Folklore Society

33

ශාබ්දික සිනමාවේ මූලධර්මයක් ලෙස අසමකාලිකතාවය

තරුපති මුණසිංහ

ශබ්දයේ තාක්ෂණික සොයාගැනීම් බොහෝ කලකට පෙර ස්ථාපිතව, ඉතා විශිෂ්ට සජීවී ශබ්ද පටිගත කිරීමේ පර්යේෂණ බොහොමයක් සිදුවී අවසන් ය. වර්තමානය වන විට අමෙරිකානු සිනමාවේ තාක්ෂණික ශබ්ද පටිගත කිරීම් අනෙකුත් රටවලට සාපේක්ෂව දියුණු මට්ටමක පවතී. නමුදු සිනමා ශබ්දයේ තාක්ෂණික දියුණුව ඇති වුවත් සිනමා මාධ්‍යයේ ඇති ප්‍රකාශනමය ගුණය පසුගාමී තත්ත්වයක පවතින බව ද කිව යුතු ය. සෝවියට් සමූහාණ්ඩුව න්‍යායාත්මකව ඇමෙරිකාව සහ යුරෝපයට වඩා දියුණු තත්ත්වයක පවතින බව මාගේ විශ්වාසයයි. ප්‍රයෝගිකව මා යම් උත්සාහයන් ගෙන ඇතත්, අප සියලු දෙනාට ඇති ප්‍රධාන ගැටලුව වන්නේ, සිනමාවේ දී නව අරුත් සම්පාදනය සඳහා ශබ්දය භාවිත කල හැක්කේ කෙසේද යන්නයි. ශබ්දය යනු ස්වභාවිකත්වය මැවීම සඳහා කිසියම් යන්ත්‍රයක් මගින් සිදුවන ක්‍රියාවලියක් වූවා නම් අපගේ අරමුණු හුදු සිළුවක් වන්නට තිබිණි. නමුත් එම තත්ත්වය ඊට වඩා වෙනස් ය. උදාහරණයක් ලෙස, නිහඬ සිනමාවේදී කාර් රථයක් පමණක් පෙන්විය හැකි වුවත් දැන් අපට එම රූපයට ශබ්දයක් එකතු කොට වඩාත් සජීවී ව ස්වභාවිකත්වය මතු කළ හැකිය. එසේම නිහඬ සිනමාවේදී මිනිසෙකු කතා කරන විට උප ශීර්ෂ වලට පමණක් සීමා වන්නට සිදු වුවත් වර්තමානයේදී එම රූපයට ස්වභාවික කටහඬ එකතු කොට වඩාත් අර්ථවත්ව දකින්නට සහ අසන්නට හැකි ය. එනම් ශබ්දයේ ආගමනයත් සමග සිනමා කෘතියේ අන්තර්ගතයට නව ප්‍රකාශනාත්මක සහ අර්ථාන්විත අගයක් එකතු කරන්නට හැකි විය.

නිහඬ චිත්‍රපටය ගැන සළකා බලන කල, එයට ශබ්ද භාවිතයක් එකතු කළහොත් එකම ධාවන කාලයක් තුළ ප්‍රේක්ෂකයාට එක සමාන තොරතුරු සමුදායක් වඩා ගැඹුරින් සන්නිවේදනය කළ හැකි වන්නට තිබිණි. එනම් චිත්‍රපටයේ අන්තර්ගතයට ගැඹුරු අවබෝධයක් එකතු කිරීමට සරළව ස්වභාවික ශබ්ද එකතු කිරීම පමණක්ම ප්‍රමාණවත් නොවන්නේ ය. මෙහිදී රූපයේ රිද්මයට සමාන රිද්මයක්

ශබ්දයෙන් එකතු කළ යුතු වන්නේ ය. එසේම ශබ්දය සහ රූපය එකට එකතුවීම ම පමණක් ප්‍රමාණවත් නොවන අතර රූපයේ අන්තර් ක්‍රියාවට ද මනාව සම්බන්ධ විය යුතු ය. මෙම ක්‍රමවේදය පවතින ක්‍රමවේදයන්ට වඩා නව්‍යතාවයකින් සහ පොහොසත් බවකින් යුක්ත වන අතර එය මනාව ග්‍රහණය කර ගැනීමටද මිනිස් මොළය සමත් වේ. උදාහරණයක් ලෙස ගතහොත් නාගරික ප්‍රදේශයක දිවි ගෙවන පාන් අලෙවි කරන්නෙකු කාන්තාර මධ්‍යයේ සිටී. නිශ්ශබ්ද සිනමා පටයකදී පළමුව අප නාගරික පරිසරයක් පෙන්වා පසුව කාන්තාර ප්‍රදේශය පෙන්විය යුතු ය. නමුදු ශබ්ද සහිත සිනමා පටයකදී නාගරික පරිසරය නොපෙන්වා නාගරික ශබ්ද කාන්තාර පරිසරය සමග සංස්කරණය කළ හැකිය. මෙවැනි භාවිතාවන් බටහිර යුරෝපයේ සිනමා අධ්‍යක්ෂවරුන්ට බොහෝ සෙයින් සමීප වන අතර ම ශබ්ද සහිත චිත්‍රපටයකදී ශබ්ද මූල කිහිපයක් එකට මුසු කිරීම සඳහා වන අසමකාලිකතා (Asynchronous) ක්‍රමවේදය භාවිත වන අතර එය සමකාලිකතා (Synchronous) ක්‍රමවේදයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. අසමකාලිකතාවය (Asynchronous) යනු දෘශ්‍ය රූපයට අසමාන ශබ්ද මුසු කිරීම වේ. උදාහරණයක් ලෙස දෙදෙනෙකු වාද කරන රූප රාමුවකට පසුබිමින් සයිරන් නලා හඬක් ඇසීම.

සමකාලිකතාවය (Synchronous) යනු දෘශ්‍ය රූපයට සමාන ශබ්ද මුසු කිරීම වේ. උදාහරණයක් ලෙස රූපයේ පියානෝවක් වාදනය කරන විට එම ශබ්දයම ඇසීම. මෙම භාවිතයන් යොදා ගනු ලබනුයේ ඒ ඒ අවස්ථාවන්ටද අනුව ය.

මෙම ශබ්ද සහ රූප මිශ්‍රණය ගැන සිතා බලන්න. උදාහරණයක් ලෙස, එක්වරම ඔබට කෙනෙකු උදව් ඉල්ලා පිටතින් කෑගසනු ඇසේ. ඔබ කවුළුවෙන් එබී බලන විට මාර්ග තදබදය පමණක් දිස්වේ. නමුදු මාර්ග තදබදයේ වාහන ශබ්ද කිසිවක් ඔබට නැසේ. ඇසෙන්නේ හැඬුම් හඬක් පමණි. අවට පිරික්සන ඔබේ දෑස් එක්වරම හැඬුම් හඬ එන ස්ථානය වෙත යොමු වේ. විශාල පිරිසක් මැද අයෙක් තුවාල වූ පුද්ගලයා වත්තම් කරගෙන සිටී. ඔහු දැන් නිසොල්මන් ය. ගිලන් රථයක් එනු දිස්වේ. එම ගිලන් වූ පුද්ගලයාගේ ඇඳුම ඔබේ සොහොයුරාගේ ස්වරූපයට සමාන බවක්ද දිස්වේ. දහවල් දෙකට පමණ ඔබ හමුවන්නට සිටි ඔබේ සොයුරාදැයි සැක සිතී ඔබ එක්වරම ඔබේ කාමරයේ ඇති බිත්ති ඔරලෝසුව දෙස බලයි. දැඩි නිශ්ශබ්දතාවයකි. වේලාව දහවල් දෙක විය හැකිද? ඔබ ඔරලෝසුව දෙස බලන කල එහි වේලාව යන ශබ්දය ඇසේ. මෙම මොහොත ජවනිකාවේ පළමුවන සමකාලිකතා (Synchronous) අවස්ථාව ය. එතෙක් ශබ්ද සංයෝජනය සිදු වන්නේ අසමකාලිකතා (Asynchronous) ක්‍රම වේදය අනුව ය. සජීවී ලෝකයේදී මෙම අවස්ථාව ම සිදුවන විට ශබ්ද සහ රූප මිශ්‍රණය සිදුවන්නේ මීට බොහෝ වෙනස් අයුරින් සහ වෙනස් ශාබ්දික තත්වයක් යටතේ විය හැකි බැවිනි.

මුළු ලෝකයම රිද්මයකට අනුව පවතින අතර ලෝකයේ සැමවිට රිද්මයන් දෙකක් පවතින බවට මා විශ්වාස කරමි. එනම් වාස්තවික ලෝකය (Objective world) සහ ආත්මීය ලෝකය (Observe world) වේ. මිනිසාගේ ඇස, කණ සහ සමට අවට ලෝකයෙන් ලැබෙන්නේ අඩක් වූ හැඟීම් සමුදායක් පමණි. මෙම හැඟීම් වල රිද්මය වෙනස් වන්නේ යමකු බාහිර ලෝකයෙන් දකින සහ අසන දේ අනුව ය.

මිනිසා ලෝකය කියවීම යනු කිසියම් වූ සංස්කරණය වෙමින් අසන දකින ක්‍රියාදාමයකි. එම ක්‍රියාදාමයේ වේගය පවතින්නේ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සන්නිවේදන ග්‍රාහක වේගය අනුව ය. එනම් ශබ්ද සහිත සිනමා පටයක් නිම වීම සඳහා මිනිසාගේ වාස්තවික ලෝකය (Objective world) සමග පවතින ශ්‍රව්‍ය

සහ දෘශ්‍ය ක්‍රියාවලිය බලපානු ලබයි. රූපය සහ ශබ්දය සිනමා පටයේ පිහිටවනු ලැබෙන්නේ ඉහත ක්‍රියාවලියෙන් ලැබෙන රිද්මය අනුව ය. මෙම ක්‍රියාවලිය රූපය සහ ශබ්දය ප්‍රතිසංවාදී (Counterpoint) අයුරින් පිහිටවන සරල සහ ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියකි.

දැන් මූලික පැනය වන සිනමා පටයක දෙබස් සහ ශබ්දය සම්බන්ධ කතාබහට පිවිසෙමු. බොහෝ සිනමාපටවල චරිත කතාබහ ප්‍රේක්ෂකාභිමුඛයට පැමිණවීම සඳහා ක්‍රම දෙකක් භාවිත කරනු ලබයි. පළමු ක්‍රමය වන්නේ අධ්‍යක්ෂවරයා පිරිසක් කතාබහ කරන අන්දම වේදිකාවේ වන යම් දෙයක් අප දකින ආකාරයෙන් එක රූප රාමුවකින් රූගත කිරීමයි. මෙම ක්‍රමය සිනමාව කලා මාධ්‍යයක් ලෙස දියුණු වීමට ප්‍රථම මුල් කාලීන නිහඬ චිත්‍රපටවල රූගත කරන ලද ආකාරයයි. අනෙක් ක්‍රමය වන්නේ එම නිහඬ සිනමාවේ ම තවත් ආභාසයක් වන සමෝධාන රීතිය (Montage editing) අනුගමනය කරමින් එක් එක් චරිත වල දෙබස් ඛණ්ඩ වෙන වෙනම රූගත කර වාර්තාවක ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමයි. මෙම දෙවන ක්‍රමය ප්‍රේක්ෂකයාගේ දෘෂ්ටිකෝණයෙන් ප්‍රථිපල දායක වන්නේ ඔහුට ප්‍රමාණවත් අයුරින් හැඟීම්බරව සහ බුද්ධිමත්ව රූප කියවා තීරණයකට එළැඹිය හැකි වන නිසා වේ.

සංස්කරණ ශිල්පය භාවිත කොට කිහිප දෙනෙකු සම්බන්ධ වන සංවාදයක් විවිධ අයුරින් සංස්කරණය කළ හැක. උදාහරණයක් ලෙස ප්‍රේක්ෂකයාගේ අවධානය සංවාදය වෙත යොමු කරවීම සඳහා, පළමු පුද්ගලයාගේ සමීප රූපයක ඔහු කථා කරන අතර ඔහුගේ කතාව අවසානයේදී එම සමීප රූපයේ ම දෙවන පුද්ගලයා තම පිළිතුරු සංවාදය අරඹයි. පසුව කැමරාව දෙවන පුද්ගලයාගේ කථාව වෙත යොමුවේ. මෙහිදී රූප සංස්කරණය මෙහෙයෙවන්නේ ශබ්දය ප්‍රමුඛව ය.

- වෙනත් අයුරකින්, ප්‍රේක්ෂකයා ද පැනයට ලැබෙන උත්තරය ගැන උවමනාව ඇති කරවීම සඳහා අවසානයේ ප්‍රශ්ණය අසන සංවාදයේ කෙළවරින් දර්ශණය ඇරඹිය හැකිය. එවිට ඍජුවම උත්තරය ප්‍රශ්නය සහ උත්තරය යන දෙකම ප්‍රේක්ෂකයාට ග්‍රහණය කර ගත හැකි වන අතරම ශබ්දය සහ රූපයද සමාන්තරව ගමන් කරවිය හැක.

- එසේත් නැතහොත්, ප්‍රේක්ෂකයා කථාව අසා සිටීමට කැමැත්තක් දක්වන නිසා කථාව සිදුවන අතරතුර අනෙක් පාර්ශවයන් කථාව අසා සිටින අන්දමද පෙන්විය හැක, හෝ වෙන් වෙන්ව අසා සිටින අයගෙත් කථා කරන්නගේත් මුහුණේ ඉරියව් පෙන්විය හැක.

මෙම උදාහරණවලින් අධ්‍යක්ෂණයෙන් සහ සංස්කරණ ශිල්පයෙන් ප්‍රේක්ෂකයාගේ හැඟීම් සහ බුද්ධිය අවුළුවාලන අයුරින් මෙම මාධ්‍යය හැසිරවිය හැකි බවයි. එනම් විශේෂිත වූ රිද්මයකට තිරය මත එකම සිදුවීම් මාලාව ගෙනහැර දැක්විය හැක. එසේම විශේෂයෙන් අධ්‍යක්ෂවරයාට තම සංස්කාරකවරයා අතර ඇති සම්බන්ධයත් ප්‍රේක්ෂකාගාරයේ ස්වභාවය හඳුනාගෙන ඔවුන්ව ජවනිකාවත් සමග සම්බන්ධ කල හැකි වන්නේ කතාවේ අන්තර්ගතය පිළිබඳව ඇති ගැඹුරු අධ්‍යයනයත් සමගයි.

විශේෂයෙන් පළමු කථිකයා ප්‍රේක්ෂක අවධානය තදින්ම ලබාගෙන සිටින මොහොතකදී දෙවන කථිකයාට තමන් වෙත ප්‍රේක්ෂක අවධානය ලබා ගැනීමට විශේෂ උත්සහයක් දැරීමට සිදු වනු ඇත. එමෙන්ම දෙවන කථිකයාගේ මැදිහත්වීම වැදගත් වන්නේ ඒ වනවිට පළමු කථිකයා විසින් දෙවැන්න පිළිබඳව ප්‍රේක්ෂක මනසෙහි ඇති කර ඇති ආකල්පයත් නිසා ය. එබැවින් ප්‍රේක්ෂකයාගේ සම්පූර්ණ අවධානය දෙවැන්නාට යොමුවේ. මා විශ්වාස කරනවා නාට්‍යමය ස්වභාවයක් එක් කිරීමට පටිගත කරගත්

පළමු වැන්නාගේ සංවාදය දෙවන්නාගේ රූපය මත මුසු කිරීමෙන් ජවනිකාවට භාවමය තත්ත්වයක්ද ලබා දිය හැකි වන්නේ ය. උසාවියකදී මරණ තීන්දුව ප්‍රකාශයට පත් කරන වේලාවේදී අධ්‍යක්ෂවරයා තම කැමරාව යොමු කල යුත්තේ විනිසුරුවරයාට ද, විත්තිකරුවාට ද නැතහොත් සහා ගර්භයට ද?

'Deserter' නම් මාගේ ප්‍රථම ශබ්ද චිත්‍රපටයේ අවසන් ජවනිකා කිහිපයේදී, කථා නායකයා තමා රුසියාවට පැමිණි ආකාරය ප්‍රේක්ෂකයාට පවසයි. මුලු සිනමා පටය පුරාවටම ඔහුගේ ජීවිතයේ ඉරණම නිසා ගැලවෙන්නට නොහැකි වුණු බියසුළු බව වැනි බලවේග සහ ඔහුගේ හැඟුම්බර ජීවිතය ගැන තම සහෝදර සේවකයන්ට පවසයි. ඔහුට රුසියන් භාෂාවෙන් කථාකළ නොහැකි නිසා පරිවර්තකයෙකු භාවිත කරයි.

ජවනිකාව ආරම්භයේදී නැව් තටාංගනයේ දර්ශන කිහිපයකින් පසුව, කථා නායකයා සහ ඔහුගේ පරිවර්තකයා දකින්නට ලැබේ. කතාව දිග හැරෙද්දී ක්‍රමිකව පරිවර්තකයා දර්ශනය වීම බොහෝ සෙයින් අඩු වී කථා නායකයාගේ මානසික තත්ත්වයට ප්‍රේක්ෂකයා සමීප කරවයි. මෙහි භාවිත කරන ශබ්ද මුසු කරන ක්‍රමය කළින් සාකච්ඡා කළ සංවාද රූපාවලියට භාවිත කරමින් වඩා තීව්‍ර ලෙස එම කථිකයන් දෙදෙනාගේ සම්බන්ධය ගොඩනැගිය හැකි ය. කෙටි සහ දිගු විරාම වලින් කථිකයන් දෙදෙනාගෙන් පසුව කථනයට එළඹෙන්නාගේ කථාව පිලිබඳ ප්‍රේක්ෂකයන්ගේ කුතුහලය ගොඩ නැගිය හැකි ය. මෙහිදී ශබ්දය වාස්තවික (Objective) ස්වරූපයකින් ගෙන ආ හැකි අතර රූපය ආත්මීය (Subjective) ස්වරූපයකින් ඉදිරිපත් වේ. එනම් සමාන ලෙස ශබ්දය අභිප්‍රායික සහ රූපය ආත්මීය ඉදිරිපත් කිරීමකි. මෙහි දක්වන ශබ්දයේ සහ රූපයේ සුසංයෝගය 'Deserter' සිනමා පටයේ දෙවන කොටසේදී ගෙනහැර දැක්වෙයි. මෙහිදී ශබ්දය යනුවෙන් මා අදහස් කළේ සංගීතයයි, සංගීතය කිසිවිටෙක සිනමාවේ සහයක තත්ත්වයක් නොඋසුලයි. එය, එයටම ආවේණික ස්වභාවයකින් පිහිටිය යුතු ය.

'Deserter' හි දෙවන කොටසෙහිදී විශාල වීදිවල ගමන් කරන සුඛෝපභෝගී වාහන මෙහෙයෙවන අලංකාර ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් රූපාවලියක් මගින් නාගරික ජීවිතය ස්ථාපිත කරයි. ආරම්භක රූප රාමු නිශ්චල ස්වභාවයකින් යුක්ත වන අතර සේවකයන්ගේ ශබ්ද සහ රූපාවලිය මිශ්‍රවීමත් සමග එම නිශ්ශබ්දතාවය බිඳී යයි. පොලිස් නිලධාරීන්ගේ නිරන්තර අවධානය මධ්‍යයේ වීදි හිස්වන බවක් දිස්වේ. ඒ අතර විරෝධතාකරුවන්ද පත්‍රිකා රැගෙන වීදිවල සැරිසරයි. අපගේ අවධානය පොලිස් නිලධාරීන්ගේ සූදානම් වීම කෙරෙහි යොමු වේ. ඔවුන්ගේ අශ්වයන් සහ මෝටර් රථ ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට ඇදෙයි. සේවකයන් ද උද්ඝෝෂණය සඳහා සේවක ධජය වටා රොක් වෙයි. සේවක පිරිස ප්‍රමාණයෙන් පොලිස් භට කණ්ඩායමේ ප්‍රමාණයට සමාන වේ. පොලීසිය සේවකයන් සිරහාරයට පත් කරයි. සටන් කිරීමට නොලැබෙන සේවකයන් අධෛර්යට පත්වන සේවකයන් නිහඬව තැන තැන වාඩි වී සිටී. එක්වරම පොලිස් නිලධාරියෙකු සහ භට පිරිසක් වීදියේ සේවකයන් සිටින ප්‍රදේශයට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණ සිටගනී. රූපාවලියේ ස්වභාවය එක්වරම නොසිතූ ලෙස වෙනස් වේ. මෙම තත්ත්වය ප්‍රේක්ෂකයාගේ භාවයන් වල ඉහළ පහළ යන ස්වභාවයක් ඇති කරවයි.

ඉන් පසුව ඇතිවන ගැටුමින් පොලීසිය පරාජය කළ සේවකයන්ගේ විජයග්‍රහණය නැගෙන සංගීත නාදය මතුවේ. එම සංගීතය කථාවේ කූටප්‍රාප්තිය වන සේවක ජයග්‍රහණය රූප සමුදාය සමග මනා සේ මුසුවේ.

මෙහිදී සංගීතය විශේෂ කාර්යභාරයක් ඉටු කරයි. රූපය මගින් එම ස්ථානයේ ඇති තත්ත්වය ගෙනහැර පාන අතරතුර වඩා ප්‍රබල වූ අයුරින් අන්නගත සේවක විජයග්‍රහණය පිලිබඳ හැඟීම ප්‍රේක්ෂකයා වෙත සන්නිවේදනය කරයි. සිනමා කෘතිය තුළ ශබ්දය වඩා ආකර්ෂණීය ලෙස ආත්මීය (Subjective) ලෙසත්, රූපය වාස්තවික (Objective) ලෙසත් ක්‍රියාත්මක වෙමින් ප්‍රතිසංවාදී (Counterpoint) දෙබසක් ඇති කර ගත හැකි ආකාරයේ කාර්ය සාධනයක් ඉටු කරන අයුරින් මම මෙහිදී භාවිත කළෙමි. මෙම ප්‍රතිසංවාදී (Counterpoint) භාවිතාය නිර්මාණශීලී අයුරින් ශාබ්දික සිනමාවේදී යොදා ගත හැකි බව මගේ විශ්වාසයයි.

Reference

Weis, E. and J. Belton (1985). Film sound: theory and practice, New York: Columbia University Press, 1985.

34

ලෝක සිනමාවේ වාරණ සංකල්පය

සමන්තිකා ප්‍රියදර්ශනී

හැඳින්වීම

එකිනෙකා මත රැඳුණු සංකීර්ණ සමාජ සබඳතා ජාලයක මිනිසා ජීවත් වන බැවින් එක් අයකුගේ අදහස් ප්‍රකාශනය තවෙකෙකු මත බලපෑම වැළැක්විය නොහැකිය. අදහස් ප්‍රකාශනය මර්දනය හා නුසුදුසු හෝ අහිතකර යයි සැලකූ සන්නිවේදන උපකරණ විනාශ කර දැමීම එනම් 'වාරණය' මේ හේතුව නිසා පැන නගින අතර එයට මානව සන්නිවේදනය තරම්ම දිගු ඉතිහාසයක් ඇත.

වාරණය සාධාරණීකරණය සඳහා ඉදිරිපත්ව ඇත්තේ සමාජයක් සදාචාර දූෂණයෙන් ආරක්ෂා කර ගැනීම හෝ දේශපාලන අධිකාරයට එරෙහි කැරලිකාරී අදහස් මැඩපැවැත්වීම යන ද්විත්ව හේතුන්ය. මෙම තර්ක මත පදනම්ව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට එරෙහි ප්‍රබල අවියක් ලෙස වාරණය ඉතිහාසය පුරා භාවිත වී ඇත. සංස්කෘතික, සමාජ, දේශපාලන, ආර්ථික හා භූගෝලීය සීමා මත කලා කෘතියක් වාරණය වීම සිදුවිය හැකිය. මෙහිදී ලෝක සිනමාවේ වාරණ අවස්ථා ඇමරිකාව, බ්‍රිතාන්‍ය හා ඉන්දියාව යන රටවලට විශේෂිතව විමර්ශනය කරනු ලැබේ.

වාරණය

පොදුවේ ගත් කළ වාරණය (Censorship) යනු දෝෂ පරීක්ෂාවයි. සාහිත්‍ය කලාව ඇතුළු යම් සන්නිවේදන මාධ්‍යයක දෝෂ නැතහොත් යෝග්‍යතාව පරීක්ෂා කර නොගැලපෙන දෑ ඇතොත් ඒවා ඉවත් කොට අනුමත කිරීම මින් අදහස් කෙරේ. එහි වචනාර්ථය 'වැළැක්වීම', 'වැළැක්වීම', 'තහනම','මුවාව' හෝ 'බාධක' ලෙස ගත හැකි බව සරසවි සිංහල සිංහල ශබ්දකෝෂයේ දක්වා ඇත.

රජයක් හෝ අනෙකුත් බල අධිකාරයක් යම් යම් දේ ඇසීම, දැකීම, ප්‍රකාශ කිරීම හෝ ලිවීම තහනම් කළ විට .වාරණය නිවාරණමය (Preventive) ස්වරූපයක් ගනියි. නිවාරණමය වාරණය බොහෝ විට යමක් ප්‍රකාශයට පත්කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට පෙර අදාළ පිටපත් පරීක්ෂා කිරීම, රට තුළට ගෙනෙන ලේඛන ආදිය පරීක්ෂා කිරීම හා සමහර අවස්ථාවල විද්‍යුත් මාධ්‍ය වලට බාධා පැමිණවීම ආදියද

මෙයට අයත් වේ. දේශපාලන වාරණය බොහෝ විට නිවාරණමය ස්වරූපයක් ගනී. වාරණයේ දණ්ඩනමය (Punitive) ස්වභාවය යනු යමක් නිෂ්පාදනය කිරීමට හෝ ප්‍රකාශයට පත් කිරීමට පසු එයට සීමා පැනවීමකි. නිදසුන් ලෙස පොතක් බෙදාහැරීම තහනම් කිරීම හෝ නාට්‍යයක් ප්‍රදර්ශනය නතර කර දැමීම ගත හැකිය.

බාහිර වාරණය වළක්වා ගැනීම සඳහා චිත්‍රපට කර්මාන්තය තම නිෂ්පාදන ස්වයං වාරණයකට ලක් කර ගන්නා අතර ශ්‍රේණිගත කිරීම් (Rating System) මඟින් එම චිත්‍රපට සුදුසු කිනම් කණ්ඩායමකටද යන්න තෝරා දෙනු ලැබේ. විදේශීය බෙදාහැරීම් වලදී චිත්‍රපට වල වෙනත් රටවල් වල විරෝධය පැමිණිය හැකි කොටස් ඉවත් කිරීම සඳහා සංස්කරණය කරනු ලැබේ.

වාරණයේ ප්‍රභේද ලෙස මුද්‍රිත වාරණය (පුවත්පත්/නවකතා/කෙටිකතා/පොත්පත්/සඟරා), ගුවන්විදුලි වාරණය, වේදිකා නාට්‍ය වාරණය, ගීත වාරණය, රූපවාහිනී වාරණය, සිනමා වාරණය හා අන්තර්ජාල වාරණය ආදී වාරණයන් නූතනයේ වඩාත් කැපී පෙනෙයි.

සිනමාව

සිනමාව ප්‍රබල කලා මාධ්‍යයක් වන අතරම කර්මාන්තයකි. එසේම එය සමාජයේ විවිධ ක්ෂේත්‍රයන් විදහාපාන කැඩපතකි. චලන චිත්‍රය ආරම්භ වූ දා සිටම චිත්‍රපටයේ ප්‍රමිතිය වාරණයකින් තොරව පවත්වාගෙන යා හැකිද යන්න පිළිබඳ සංවාදය ගොඩනැගී ඇත. චිත්‍රපටය යථාව හා ජීවිතය එලෙසින්ම පිළිබිඹු කරන්නා වූ කැඩපතක් නොවේ. එය පුද්ගල නිශ්චිත පරමාදර්ශයන්ගෙන් ඔබ්බට ගොස් සංඥාර්ථ හා මනෝ විශ්ලේෂණාර්ථ සමඟ ගනුදෙනු කරන භාවිතයකි. චිත්‍රපටයක නිශ්චිත අරුත සොයා යෑමේදී එය බිහි වූ සමාජ සංස්කෘතිය තුළ තැබීමට සිදුවේ. මේ නිසාම සිනමා කෘතියක් එකී සමාජ, දේශපාලන හා සංස්කෘතික මැදිහත්වීම් සමඟ ගැටීමට සිදුවේ.

සිනමා තිරයෙහි අප දකින දෙය යථාර්ථය ලෙස පෙනුනද එය අප ජීවත්වන ලෝකයට වඩා බෙහෙවින් වෙනස්ය. එදිනෙදා අප ජීවත්වන ලෝකය පිළිබඳව අපගේ ඉන්ද්‍රිය බද්ධ දැනීම පවතින්නේ යථාර්ථවත් අවකාශය හා කාලය පදනම් කොටගෙනය. අප චිත්‍රපටයේ දකින අවකාශය හා කාලය එදිනෙදා අප ජීවත්වන ලෝකයේ ඇති කාලය හා අවකාශයට වඩා බෙහෙවින් වෙනස්ය. අවකාශය වශයෙන් තිරයෙහි අප දකින්නේ ත්‍රිමාණ ස්වභාවයෙන් තොර පැතලි ආකාරයේ ලෝකයකි. එසේ වුවත් අවකාශය එම පැතලි යථාර්ථය තුළ කළ නොහැකි බොහෝ දේ කැමරා චලනය මගින් සිදුකළ හැකිය. කාලය පිළිබඳ තත්ත්වයද එසේය. චිත්‍රපටයේ දී අප අසන හඬ හා මිනිස් භාෂණය ද එදිනෙදා ජීවිතයේ අප අත්දකින දෙයට වඩා වෙනස්ය. චිත්‍රපටයේ අත්දැකීම කෘත්‍රිම වුවත් සිනමාකරු යථාර්ථවාදී හැඟීමක් චිත්‍රපටය තුළින් ප්‍රේක්ෂක මනසෙහි ඇති කිරීමට සමත්ය.

සිනමාව හා සමාජය

සිනමාව සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. අධ්‍යක්ෂක, නළු නිළියන්, තිරනාටක රචකයන්, කලා අධ්‍යක්ෂකයන් ආදීන් කලාත්මක අංශයට අයත් වේ. කැමරා ශිල්පීන්, සංස්කරණ ශිල්පීන්, ශබ්ද පරිපාලන ශිල්පීන් තාක්ෂණික අංශයට අයත් වේ. එම කලාත්මක හා තාක්ෂණික ශිල්පීන් නිසි ලෙස හසුරුවමින්

එයින් යම් නිර්මාණයක් කිරීමේ හැකියාව අධ්‍යක්ෂකවරයා සතු වේ. අධ්‍යක්ෂකවරයා දක්ෂ ව්‍යාපාරික ඥාණයෙන් යුතු අයෙක්ද වීම වැදගත් වන්නේ සිනමාව අනෙකුත් කලා මාධ්‍යයන්ට වඩා විශාල මූල්‍යමය ආයෝජනයක් අපේක්ෂා කරන බැවිනි. සිනමා නිර්මාණය සාර්ථක නිර්මාණයක් වන්නට එය රසවිඳිය හැකි ප්‍රේක්ෂක පිරිසක්ද සිටිය යුතුය. එබැවින් අධ්‍යක්ෂකවරයාට තාක්ෂණික, කලාත්මක දැනුම මෙන්ම සමාජය පිළිබඳ දැනීමද අතිශයින් වැදගත්ය. සමාජයේ ප්‍රමාණවත් පිරිසක් කෙරෙහි තමන්ගේ නිර්මාණය යොමු කිරීමට නොහැකි වන්නේ නම් සමාජය තමන්ගේ නිර්මාණය පිළිගැනීමට අපොහොසත් වන්නේ නම් කරන්නා වූ සිනමා නිර්මාණයේ ප්‍රතිඵලයක් නැත. සමාජයේ තත්ත්වය තේරුම් ගනිමින් සිනමා නිර්මාණයක් කිරීමේ ඥානය අධ්‍යක්ෂකවරයා සතුව පැවතීම ඉතාම වැදගත්ය.

සිනමාව හා සමාජය අතර ඇති සබඳතාවය පිළිබඳව විමසීමේදී සිනමාව හා සමාජය අතර පවත්නා සම්බන්ධතාව කෙබඳුද? සමාජය ගැන නොසලකා සිනමාවට පැවතිය හැකිද? සිනමාවේ අරමුණ කුමක්ද? යන කරුණු කෙරෙහි අවධානය යොමු වේ. සිනමාව හා සමාජය අතර පවතින සබඳතාවය පිළිබඳව විවිධ අදහස් ඉදිරිපත් වී ඇත. පොදුවේ සලකන කළ සිනමාවේ අභිප්‍රාය වන්නේ ජනතාවට විනෝදාස්වාදය ලබාදීම හෝ සමාජ ශුභ සාධනයට අදාළ ආචාර විද්‍යාත්මක මූලධර්මයන් පැහැදිලි කිරීම යැයි යෝජනා කළ හැක. බාහිර වශයෙන් සැලකීමේදී සිනමාව සෞන්දර්යය සමඟ සම්බන්ධ වන බව දැකිය හැක. නමුත් අභ්‍යන්තර වශයෙන් සලකන කළ එය සත්‍යය හා සමාජ තත්වයන් සමඟ සම්බන්ධ වේ. එමෙන්ම ඒ ඒ සමාජවල තත්කාලීන වශයෙන් ඇතිවන සමාජ ප්‍රවණතාවයන්ගෙන් පෝෂණය වන අතර එය උපත ලද පරිසරයේ විශේෂතාවන්ද නිරූපණය කරයි.

සමාජ සංස්ථාවක් ලෙසට සිනමාව තුළට නැඹුරුව සිටින ප්‍රේක්ෂකයන් කෙරෙහි අවධානය යොමු කිරීමේදී අවධානයට ලක්වන ප්‍රධාන කරුණු දෙකකි. එනම්, චිත්‍රපට මඟින් සමාජ සාරධර්මයන් දූෂණය කරන්නේද? සමාජයට වැඩදායක වන චිත්‍රපට සෑදිය නොහැකිද? යන ප්‍රශ්න දෙකයි. සිනමාව සමාජයට කරන බලපෑම සැලකීමේදී මෙම ගැටලු මතුවේ.

සමාජ විද්‍යාඥයින් ප්‍රකාශ කරන පරිදි සමාජයේ සාමාජිකයින් එක අරමුණකින් යුතුව එකමුතුව කරන කාර්යයන් සමාජයක් පවත්වාගෙන යාමට උපකාරී වෙයි. එවැනි කටයුතු වලට සහභාගි වීමෙන් සමාජයේ සාමාජිකයන් සාමාජික තෘප්තියක් මෙන්ම පෞද්ගලික තෘප්තියක්ද ලබයි. වචනාර්ථය ගෙන බැලූ විට සිනමාව ජන කලාවක් වූවත් එමඟින් ආකර්ෂණයක් ඇති කෙරෙන්නේ පොදුවේ නොව පෞද්ගලිකවය. චිත්‍රපට ප්‍රදර්ශනය වන කාලය තුළ අඳුරෙහි ගැලී වටපිටාව අමතක කර එම කාලය තුළ කිසිදු සාමාජික සම්බන්ධතාවක් නොපවත්වා සිටින්නට ප්‍රේක්ෂකයාට හැකියාව ඇත. එහෙත් එය ප්‍රේක්ෂකයාගේ පැත්තෙන් හුදෙක් හුදෙකලා වීමේ කාර්යයක් පමණක් නොවේ. සමහර විටෙක චිත්‍රපට නරඹන්නට යන්නේ පවුල් පිටින්ය. සමහර විටෙක පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ය. මිත්‍රයන්, ප්‍රේමවන්තයන් ලෙසිනි. එසේ වුවද ප්‍රේක්ෂකයා චිත්‍රපට අත්දැකීමට සහභාගි වන්නේ පෞද්ගලිකවයි. විවිධ සමාජ මට්ටම් තුළ සිටින ප්‍රේක්ෂකයා බලෙන් සිනමාශාලාව වෙත ගෙන ඒමට නොහැකිය. එය ප්‍රේක්ෂකයාගේ තේරීම මත වේ. මේ නිසා සිනමාකරුවාද සෙසු කලාකරුවන් මෙන් තමාගේ පැවැත්ම සුරක්ෂිත කරගැනීම සඳහා සමාජ සංස්ථා, පුද්ගල පෞරුෂය මෙන්ම සමාජ ප්‍රවණතා කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතුය. මෙහිදී ඔවුන්ට මුහුණ පාන්නට වන අභියෝගය වන්නේ ජනයා නොමඟ යැවීමෙන් තොරව තම නිර්මාණය ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කිරීමයි. සිනමාව මිනිසාගේ නිර්මාණයක් බැවින් එය පවතින්නේ

මිනිසාට ඉහළින් හෝ පහළින් නොව මිනිසා සමඟය. පොදුවේ ගත්කළ සිනමාව මඟින් මිනිසා සමාජ පරිසරය හා ඇතිකොට ගන්නා අන්තර් සම්බන්ධතා හා ගැටුම් මෙන්ම සමාජයේ සදාචාරාත්මක පරිමාණයන් ද විචාරයට ලක් වේ. මෙමඟින් ප්‍රේක්ෂකයා වෙත ඍජු හෝ වක්‍ර බලපෑම් එල්ලවේ.

සිනමාව හා සමාජය අතර සබඳතාවය පිළිබඳව කතා කිරීමේදී සංස්කෘතික අධ්‍යයනය මඟින් එළඹුම් දෙකක් පැහැදිලි කර දෙනු ලැබේ. එනම් පාඨමය එළඹුම හා සන්දර්භමය එළඹුම වශයෙනි. පාඨමය එළඹුම වැඩි වශයෙන් අවධානයක් කරනුයේ චිත්‍රපටයක අන්තර්ගත පෙළ (text) නැත්නම් පාඨ කථනය කෙරෙහිය. පෙළ මඟින් තොරතුරු රැසක් ලබාදෙයි. චරිත, ඇඳුම් පැළඳුම්, දෙබස්, කැමරාකරණය, රඟපෑම, සංගීතය, සංස්කරණය ආදිය තුළින් තොරතුරු රැසක්ම හෙළිවෙයි. සන්දර්භමය එළඹුම චිත්‍රපටයේ ඇති සුවිශේෂී චරිත ලක්ෂණ හඳුනා ගන්නට උත්සාහ කරයි. එනම් සමාජ, සංස්කෘතික දේශපාලන ආයතනික ආදී වශයෙන් උද්ගතවන සුවිශේෂී ලක්ෂණ හඳුනාගැනීමයි. චිත්‍රපටයක සමාජය පිළිබිඹු වන ආකාරය මෙන්ම සමාජය කෙරේ සිනමාවේ බලපෑම හඳුනා ගැනීමට උත්සාහ කිරීමේදී චිත්‍රපට මඟින් අර්ථ ඉපදවීම හා ඒවා බෙදා හැරීම අවධානයට යොමුවේ. චිත්‍රපටයකින් කියැවෙන මූලික අදහස් උදහස් ප්‍රේක්ෂකයා සමඟ සම්බන්ධ වන්නේ ඔහුගේ සමාජ තත්ත්වය හා තරාතිරම මතය. චිත්‍රපටය ඔහු විසින් තේරුම් ගන්නා අතරම චිත්‍රපටයේ එන මූලික අදහස් උදහස් විශ්වාස හා භාවිත මඟින් ඔහුගේ සිතුම් පැතුම් වෙනස් කිරීමට ද හේතු වේ.

සිනමාව හා වාරණය

සිනමාව වාරණය වීම සමහර රටවල වාරණය ඉතාමත් මෘදු වන අතර එය බාලවයස්කරුවන් ආරක්ෂා කිරීම සඳහා සහ ප්‍රේක්ෂකයන්ට සිනමා කෘතියේ අන්තර්ගතය දැනුම් දීමට යොදාගන්නා ශ්‍රේණිගත කිරීම් (Rating System) ක්‍රමයකට සීමා වේ.

අනෙකුත් රටවල් තවමත් චිත්‍රපට සම්පූර්ණයෙන්ම වාරණය කිරීම හෝ කොටස් කපා ඉවත් කිරීමට බලකරන දැඩි වාරණ ක්‍රමයන් අනුගමනය කරනු ලැබේ. සාමාන්‍යයෙන් වාරණය ප්‍රධාන ක්ෂේත්‍ර තුනකට අදාළව ක්‍රියාත්මක කෙරේ. එනම් ලිංගිකත්වය, ප්‍රචණ්ඩත්වය හා දේශපාලනයයි.

මෙහි ලිංගිකත්වයහා ප්‍රචණ්ඩත්වයප්‍රධාන වශයෙන් බාලවයස්කරුවන් වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් වල මූලික අවශ්‍යතාවයක් වන අතර, දේශපාලනය යන සාධකය පැහැදිලිවම රාජ්‍ය, රාජ්‍ය ආයතන සහ ආණ්ඩුවල අවශ්‍යතාවයකි. වාරණ නීති ලිහිල්කිරීම ඉතා මෑත කාලීන දෙයකි. ඇමරිකා එක්සත් ජනපදයෙහි 1960 දශකයේ අගභාගයේදී ද, බ්‍රිතාන්‍ය, ප්‍රංශය හා ස්පාඤ්ඤය වැනි රටවල 1970 දශකයේ මැද භාගයේ පමණද, වාරණ නීති ලිහිල් කිරීම දැකිය හැක. එයට අමතරව ඇමරිකා එක්සත් ජනපදය හා ජර්මනිය වැනි සමහර රටවල චිත්‍රපට වාරණය ව්‍යවස්ථානුකූලව නීති විරෝධී වන නමුත් වාරණය තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. සමාජයක් පිළිගන්නා සදාචාර ප්‍රමිතීන් වල මට්ටම නිරූපණය කිරීම හා ආරක්ෂා කිරීම වාරණය මඟින් සිදුවේ යැයි වාරණය වෙනුවෙන් අදහස් දක්වන්නෝ පවසති.වාරණයට විරුද්ධව අදහස් දක්වන්නෝ ප්‍රකාශ කරන්නේ වාරණය සදාචාරය නිරූපණය වෙනුවට සදාචාර සම්මතයන් ගොඩනැගීම සිදුකරන බවයි.

මේ පිළිබඳ පක්ෂව හා විපක්ෂව කීමට කරුණු තිබේ.

පක්ෂව

දරුණු ප්‍රචණ්ඩ ක්‍රියා/ ලිංගිකත්වය/ සමාජ හැසිරීම් රටා/ තරුණ හැසිරීම් නිරූපණයේ යම් පාලනයක් අවශ්‍යයි.

විපක්ෂව

සමාජයේ බලවත් කණ්ඩායම් විසින් තමන්ගේ මතවාද සහ සදාචාර සම්මුතීන් මහජනයා මත පැටවීමේ ක්‍රියාවලිය වාරණය ලෙස දක්වයි.

ඇමරිකානු සිනමාව හා වාරණය

එක්සත් ජනපදය සිනමා කර්මාන්තයේ ප්‍රමුඛ රටක් වන අතර එහි ඉතා ප්‍රසිද්ධ වාරණ ආයතනයක් වේ. එය ඇමරිකන් හේස් කාර්යාලය (Hays Office) නම් වේ. එහි නිල නාමය ඇමරිකාවේ චිත්‍රපට නිෂ්පාදකවරු හා බෙදාහරින්නන් (Motion Picture Producers and Distributors) වන අතර එය වඩා ජනප්‍රිය වූයේ එහි පළමු සභාපති විලියම් එච්. හේස් (William H. Hays) (1922-1945) ගේ නමිනි. හේස් කාර්යාලය 1922 දී ආරම්භ කෙරුණේ හොලිවුඩ් තාරකාවන්ගේ සදාචාර විරෝධී බව පිළිබඳව ඇති වූ මහජන උද්ඝෝෂණය හේතුවෙනි. එනම් මහජන අවධානයට යොමු වූ චිත්‍රපට වල ලිංගිකමය කාරණා නිරූපණයට විරෝධය දැක්වීමක් ලෙස මෙය පිහිටවූ අතර චිත්‍රපට කර්මාන්තය තුළ ස්වයං වාරණ ප්‍රතිපත්තියක් ඇති කිරීම මෙහි අරමුණ විය.

හේස් මාර්ගෝපදේශ (The Hays Code)

1922 දී යෝජනා කරමින් ක්‍රියාත්මක කරන චලන චිත්‍ර නිෂ්පාදන හා බෙදාහැරීම් ආයතනයේ (Motion Picture Producers and Distributors of America - MPPDA) සභාපතීත්වයට ඇමරිකාවේ රිපබ්ලිකන් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු හා තැපැල්පතිවරයකු වශයෙන් සේවය කළ විලියම් එච්.හේස් (William H Hays) පත්වූයේය. ඔහුගේ මූලික අවධානය යොමුවූයේ මහජන කැලඹිලි මත සිනමා වාරණ තත්ත්වයක් ගොඩනැගෙනවාට වඩා සිනමා කර්මාන්තය තුළින් ඒ සඳහා අවශ්‍ය ක්‍රමෝපයාන් ක්‍රියාත්මක කිරීමට ය.

1930 ගණන්වල ආරම්භයේ පටන් 1950 ගණන්වල ආරම්භය දක්වා වූ වසර 20ක කාල පරිච්ඡේදයක් ඇමරිකානු වාණිජ සිනමාව කර්මාන්තය තුළින්ම පැන නැගුණු දැඩි නීති පද්ධතියක් තුළට සීමා වී ක්‍රියාත්මක විය. මෙම නිෂ්පාදන ප්‍රඥප්තිය (Production Code) හෙවත් Hays Code ඇමරිකාවේ වාණිජ සිනමාපට මඟින් පිළිබිඹු කළ යුතු සුවිශේෂ මතවාදී හා සදාචාරමය කරුණු නිශ්චය කර දී ඇත. මෙම MPPDA ආයතනයේ බලපෑම සමස්ත සිනමා කර්මාන්තයම නතු කර ගැනීමට කටයුතු කර ඇත. මෙය ප්‍රඥප්තියක් ලෙස 1930 දී ඉදිරිපත් කරන ලද නමුත් 1934 දක්වා එය ක්‍රියාත්මක කිරීම දුෂ්කර විය. විශේෂයෙන් එකල පැවති ආර්ථික අවපාතය හමුවේ ප්‍රේක්ෂකාගාරය හිස්වෙමින් පැවති අතර ප්‍රේක්ෂකයින් ආකර්ෂණය කර ගැනීමේ මුඛ්‍ය අංග ලිංගිකත්වය හා ප්‍රචණ්ඩත්වය අත්‍යවශ්‍ය අංග ලෙස චිත්‍රපට

නිෂ්පාදකයින් තීරණය කර තිබුණි. 1934 දී රාජ්‍ය වාරණ නිලධාරීන්, කාන්තා කණ්ඩායම්, අධ්‍යාපනික හා ආගමික කණ්ඩායම් හොලිවුඩ් චිත්‍රපට වලට විරුද්ධව කටයුතු කරන මෙන් උද්ඝෝෂණ කරන ලදී. රෝමානු කතෝලික පල්ලිය සමහර චිත්‍රපට හෙළා දකිමින් රටපුරා පැවති ඉරුදින පූජා වලදී එම චිත්‍රපට නොබැලීමට මහජනතාව වෙතින් ප්‍රතිඥා ලබා ගන්නා ලදී.

මෙම මහජන විරෝධතා හමුවේ හොලිවුඩ් නිෂ්පාදකවරුවන් හේස් ප්‍රඥප්තිය (Hays Code) ක්‍රියාත්මක කිරීමට එකඟත්වය පළ කර සිටින ලදී.

හේස් කාර්යාලය සිනමා කර්මාන්තය විසින්ම තම අයිතීන් මධ්‍යම රජයේ මැදිහත් වීම් තුළින් ආරක්ෂා කර ගැනීම සඳහා ආරම්භ කරගනු ලැබූවක් සේ ගැනේ. හොලිවුඩ් තාරකාවන්ගේ තිරයෙන් පිටත සිදුවූ ආන්දෝලනාත්මක ලිංගික සිදුවීම් තිරය මත කතා පුවත් වාරණයට හේතුවීම විශ්මය දනවයි. හේස්ට අවශ්‍ය වූයේ මධ්‍යම හෝ ප්‍රාන්ත රජයන්ගේ මැදිහත්වීමට වඩා හොලිවුඩ්පුරය විසින්ම ස්වයං වාරණයන් ක්‍රියාත්මක කරවීමය. මෙහි අරුත වූයේ තාරකාවන් නිෂ්පාදන සමාගම් වල බලපෑමට වඩ වඩාත් නතුවීම හා එමඟින් තරු ගුණය ජීවිතයට වඩා විශාල හා එසේ නොවන යන අවස්ථා දෙකම දරාගැනීමට සිදුවීමේ විසංවාදයට ගොදුරුවීමය. මෙය සමහරෙකුගේ ජීවිත විනාශ වීමට පවා බලපෑවේ ය. (පේම්ස් ඩීන්, මැරිලින් මොන්රෝ, ජූඩ් ගාර්ලන්ඩ්, රිවර් ෆිනික්ස්)

තාරකාවන් පාලනය සම්බන්ධයෙන් සිනමා කර්මාන්තය සාර්ථක වුවත් සිනමා නිර්මාණ ස්වයං වාරණයේදී මෙම ක්‍රමය එතරම් සාර්ථක නොවීය. නිදසුනක් ලෙස පාතාල අපරාධ කල්පි ප්‍රශංසාවට ලක්කරන චිත්‍රපට විචාරකයන්ගේ දැඩි විවේචනයට ලක්විය. 1934 දී සියළු නිෂ්පාදන සමාගමක්ම එකඟ විය යුතු නිෂ්පාදන නියාමනයන් (ක්‍රිස්තියානි ආගමේ දස පනත ආශ්‍රයෙන්) ප්‍රකාශ කරන ලදී. එය M.P. Production code/ Hays Code නම් විය.

හේස් ප්‍රඥප්තියෙහි අන්තර්ගත කරුණු

1. අපරාධයක් නිරූපණය කිරීමේදී අපරාධය සිදුකරන ආකාරය පෙන්නුම් කරන දර්ශන ඉදිරිපත් නොවිය යුතුය.

   ප්‍රේක්ෂකයන්ට අපරාධය අනුකරණය කිරීමට උනන්දු කරවන දර්ශන හෝ අපරාධකරුවන් වීරයන් හෝ ඔවුන්ගේ ක්‍රියාවන් සාධාරණ බව දැක්වෙන දර්ශන ඇතුළත් කිරීමට නොහැක.

   (නිදසුනක් ලෙස 1931 දී ප්‍රදර්ශනය කළ අපරාධ කණ්ඩායමක් වීරත්වයෙන් නිරූපණය කළThe Public Enemy චිත්‍රපටය 1934 න් පසු ප්‍රදර්ශනය කිරීමට අවසර දී නැත.)

2. ආගමික කණ්ඩායම් සැනසීම සඳහා ආගම් සම්බන්ධ කරුණු වලදී මෙම ප්‍රඥප්තිය දැඩි ස්ථාවරයක සිටින ලදී. කිසිම චිත්‍රපටයකට කිසිදු ආගමක් හෝ ආගමික විශ්වාසයක් අවමානයට ලක් කළ නොහැකිය. ආගමික, පූජකයන්, කපටීන් හෝ විකටයින් ලෙස නිරූපණය කළ නොහැකිය. ආගමික උත්සව ගෞරවාන්විත ලෙස නිරූපණය කළ යුතුය.

3. ප්‍රඥප්තියට අනුව විදේශීය රටවල් වල හා විදේශිකයන්ගේ නියෝජනයන් ගෞරවාන්විත නිරූපණයන් ලෙස පිළිබිඹු විය යුතුය.

4. එළිපිට නිරූපණය කරන ලිංගිකත්වය, අභිචාරමය ලිංගික ක්‍රියා (Sexual Perversion) (සමලිංගික සම්බන්ධතා/ ලේ ඥාතීන් අතර ලිංගික ක්‍රියා ආදිය) නිරූපණය නොකළ යුතුය.

5. ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවයන් නිරූපණයේදී විවාහය දෙස කාරුණිකව බැලිය යුතුය. අනියම් සම්බන්ධතා ආකර්ෂණීය ලෙස නිරූපණය නොකළ යුතුය. ඒවා විකට චිත්‍රපට සඳහා යොදා නොගත යුතු අතර කුතුහලය හා සරාගී බවක් ඇතිවන ලෙස එම සම්බන්ධතා නිරූපණය නොකළ යුතුය. මෙබඳු අනියම්, තහනම් හෝ අපිරිසිදු සම්බන්ධතා නිරූපණය කරන විට එයට ප්‍රතිමුඛ සදාචාර වටිනාකම් නිරූපණය විය යුතුය. එනම් තම හැසිරීම් හේතුකොට ගෙන අදාළ චරිතයන්ට වද වේදනා විඳීමට සිදුවන ආකාරය නිරූපණය කළ යුතුය.

6. වැඩිහිටි නිරුවතට කිසිදු අනුමැතියක් නොලැබුණි. නිදන කාමර දර්ශන ඉතාමත් ප්‍රවේශමෙන් රූප ගත කළ යුතු විය. ලිංගික ක්‍රියාකාරකම් ඉඟි කරන නැටුම් නිරූපණය කළ නොහැකි විය.

Hays Office වර්තමාන නාමය M.P.A.A. (Motion Picture Association of America) වේ.

1952 පටන් සිනමාව පුවත්පත් හා සඟරා බඳු අනෙකුත් මාධ්‍ය සමඟ ඇමරිකානු ව්‍යවස්ථාවට කරනු ලබන පළමු සංශෝධනය මඟින් එය තවදුරටත් ආරක්ෂා කරනු ලැබිණ.

ඇමරිකානු නීතිය අනුව අශ්ලීල යන පදනම මත වැඩිහිටියන්ට පමණක් වූ වාරණයන් පැනවීමට වෙන් වෙන් ප්‍රාන්ත වලට බලය පැවරිණ. ළමයින් සම්බන්ධ කරුණේදී රාජ්‍ය බලධාරීන් ඔවුන්ගේ බලය චිත්‍රපට වර්ගීකරණය (Film Classification) දක්වා පතුරුවා ඇත. 1968 දී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මඟින් චිත්‍රපට වලින් ළමුන්ට වන බලපෑම සම්බන්ධයෙන් තීරණ ගනිමින් චිත්‍රපට වර්ගීකරණයට පළාත් පාලන බලධාරීන්ට බලය තිබෙන බව ප්‍රකාශ කරන ලදී. 1968 දී මෙම හේස් ප්‍රඥාප්තිය ඉවත දමා වර්තමානය තෙක් ක්‍රියාත්මක ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය (Rating System) හඳුන්වා දෙන ලද අතර එම වසරේදීම චිත්‍රපට කර්මාන්තය විසින්ම චිත්‍රපට වර්ගීකරණය සම්බන්ධ වැඩපිළිවෙලක් සකස් කර ගන්නා ලදී. මෙම වර්ගීකරණ ක්‍රමවේදය සිනමා කර්මාන්තයේ ස්වයං විනයක් ඇති කරගැනීමේ ක්‍රමයකි. එය Motion Picture Association of America-(MPAA) මගින් පරිපාලනය වේ. වර්තමානයේ භාවිත වන වර්ගීකරණය නම්,

G - General Audience (සාමාන්‍ය ප්‍රේක්ෂකයින්ට)

PG - Parental Guidance Suggested (දෙමාපියන් අධීක්ෂණය යෝජිතයි.)

PG - 13 - Parental Guidance Suggested, Some material is not suitable for under - 13 year olds. (දෙමාපිය අධීක්ෂණය යෝජිතයි. සමහර කොටස් වයස 13ට අඩු අයට සුදුසු නැත.)

R - Persons under the age of 17 must be accomapanied by a parent or adult guardian. (වයස 17 ට අඩු අය දෙමාපියන් හෝ භාරකරුවන් සමඟ පැමිණිය යුතුයි.)

NC 17 - No one under 17 admitted. (වයස 17 ට අඩු කිසිවෙක් ඇතුළු කර ගනු නොලැබේ.)

සමහර නිරීක්ෂකයන් ඇමරිකාවේ චිත්‍රපට සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් පවතින්නේ වර්ගීකරණයක් බවට හා වාරණයන් පවතින්නේ ඉතා සුළුවෙන් බවට තර්ක ඉදිරිපත් කරයි. එහෙත් නිෂ්පාදකයින් හා බෙදාහරින්නන්ට 'R' වර්ගීකරණය නොඉක්මවන චිත්‍රපට සැපයීමට නිරායාස බලපෑමක් ඇතිවන බවට තවත් තර්කයක් ඉදිරිපත් වේ. නිරන්තරව වයස 17ට අඩු චිත්‍රපට ප්‍රේක්ෂක කණ්ඩායම බැහැර කිරීම තුළ චිත්‍රපටය මූල්‍යමය වශයෙන් අසාර්ථක වීමට හේතුවේ.

වර්තමාන වර්ගීකරණය තවත් ගැටළු කිහිපයක්ම මතු කොට ඇත. එනම් MPAA මණ්ඩලය ළමයින් දැකිය යුතු දේ හා නොදැකිය යුතු දේ තීරණය කිරීමට භාවිත කරන ක්‍රමවේදය කුමක්ද? යන්නත්, චෝදනා කරනු ලැබ ඇති ලෙසින් MPAA ආයතනයේ අනුග්‍රාහකයන් වන ප්‍රධාන චිත්‍රපට සමාගම් වලට විශේෂ වරප්‍රසාද ලැබෙයිද? යන්නත්ය.

බ්‍රිතාන්‍ය සිනමාව හා වාරණය

බ්‍රිතාන්‍ය චිත්‍රපට වර්ගීකරණ මණ්ඩලය BBFC (British Board of Film Classification) 1912 දී සිනමා කර්මාන්තය විසින් පිහිටවනු ලැබුවේ පළාත් පාලන ආයතන විසින් කරනු ලැබූ වාරණ බල ශූන්‍ය කිරීම සඳහාය. ආරම්භයේ පටන් එය වර්ගීකරණ පද්ධතියක් පවත්වාගෙන යනු ලැබීය. ආරම්භයේ එය U (Universal) සියල්ලන්ටම සුදුසු, A (Adult) වැඩිහිටියන්ට වඩාත් සුදුසු වශයෙන් ප්‍රධාන වර්ගීකරණයක් කරනු ලැබීය.

1921 දී 'A' වර්ගීකරණයට නව එකතු කිරීමක් කරමින් දක්වනුයේ 'වර්ගීකරණය යටතේ වන චිත්‍රපට නැරඹීමට ළමුන් පැමිණෙන්නේ නම් ඔවුන් වැඩිහිටියෙකු සමඟ පැමිණිය යුතුය.' යනුවෙනි. 1921 දී ලන්ඩන් නගර සභාව ඉහත වර්ගීකරණය පිළිගන්නා තුරු මෙම වර්ගීකරණ පද්ධතියට උපදේශනාත්මක බලයක් පමණක් හිමිවිය. සෘජු වාරණ ආයතනයක් නොවූවත් BBFC ආයතනය පවත්නා වටිනාකම් සහ අවශ්‍යතාවයන් ආරක්ෂා කරන ආකාරයෙන් කටයුතු කළේය.

BBFC ආයතනය සඳහා සිනමා කර්මාන්තය අනුග්‍රහය දක්වනු ලබයි. සම්ප්‍රදායිකව එහි සභාපති සහ අධ්‍යක්ෂක පත්කිරීම සිදු කරනුයේ පළාත් පාලන බලධාරීන්ගේ, සිනමා කර්මාන්තයේ වෘත්තිය සංගම්වල සහ අභ්‍යන්තර කටයුතු ඇමතිවරයාගේ එකඟතාවය මතයි. එබැවින් BBFC ආයතනය රජයේ සහ සිනමා කර්මාන්තයේ බලපෑමෙන් ස්වාධීන යැයි පිළිගත හැකිද යන්න ගැටලුවකි. එහි සාමාජිකයන්ට රජයන් සමඟ තහවුරු වූ සම්බන්ධකම් පැවතිණි. නිදසුනක් ලෙස 1935-1947 දක්වා BBFC ආයතනයේ සභාපති බැරන් ටයිරල් (Baron Tyrell) නියෝජ්‍ය රාජ්‍ය ඇමති ලෙස සහ දේශපාලන බුද්ධි අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කර තිබුණි. I හා II ලෝකයුද්ධ අතර කාලයේ පළාත් පාලන ආයතන වැඩි

සංඛ්‍යාවක් BBFC ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකය චිත්‍රපටයක සදාචාර මට්ටම පිළිබඳ මිනුම ලෙස ගෙන ඒවා ප්‍රදර්ශනයට කටයුතු කරන ලදී. II වන ලෝක යුද්ධය අවසන් වනතුරුම ඇමරිකාවේ MPPDA ආයතනය මෙන්ම BBFC ආයතනයද නිල නීති පද්ධතියක් අනුගමනය කරන ලදී.

BBFC ආයතනය 1920, 1930 ගණන්වල තහනම් කරන ලද චිත්‍රපට

වර්ෂය	චිත්‍රපටය	තහනම් කිරීමට හේතුව
1925	Battleship Potemkin	විප්ලව හිතවාදී ප්‍රචාරණය (Pro-revolutionary Propaganda)
1926	Mother	විප්ලව හිතවාදී ප්‍රචාරණය
1931	La Chienne	ප්‍රධාන චරිතය පසු නොතැවෙන ගණිකාවකි.
1931	The Public Enemy	අපරාධ සහ අපරාධ කල්ලි ප්‍රචණ්ඩ ලෙස නිරූපණය කිරීම.

II ලෝක යුද්ධයේ ආරම්භයත් සමඟ රාජ්‍යය සිනමා වාරණය සම්බන්ධ සෘජුව මැදිහත් වී ජාතික ආරක්ෂාව නමින් මහජනයා වෙත තොරතුරු ගලායාම පාලනය කිරීම සඳහා තොරතුරු අමාත්‍යංශයක් (The Ministry of Information) පිහිටුවන ලදී. යුද කාලය තුළ සෑම චිත්‍රපටයක්ම තොරතුරු අමාත්‍යංශයට ඉදිරිපත් කළ යුතු වූ බැවින් BBFC හි ක්‍රියාකාරිත්වය බොහෝ සෙයින් අඩු විය. තොරතුරු අමාත්‍යංශයේ සිනමා ඒකකය (Films Devision) ජැක් බෙඩින්ටන්ගේ (Jack Beddington 1940-1946) නායකත්වයෙන් වාණිජ සිනමා නිර්මාණකරුවන්ට කළයුතු සහ නොකළයුතු ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලදී. 1942 දී පමණ, අදහස් කමිටුවක් (Ideas Committee) එය යටතේ පිහිටුවනු ලැබූ අතර එයට බ්‍රිතාන්‍ය වාණිජ සිනමාවේ තිර රචකයන් හා අධ්‍යක්ෂකවරුන් එක්කර ගන්නා ලදී. එය යුද කාලීන ප්‍රචාරණ උපායයන් නිර්මාණය කරන ස්ථානයක් ලෙස භාවිත විය. II ලෝක යුද්ධයෙන් පසු BBFC ආයතනයට ස්ථිර ක්‍රියාත්මක ක්‍රමවේදයක් නොපැවතුණු අතර සමාජ ආකල්ප මත එහි තීරණ වෙනස් කරන ලදී.

වියට්නාම යුද්ධය සම්බන්ධයෙන් නිපද වූ ප්ලැටූන් (Platoon) චිත්‍රපටය නැරඹූ BBFC සාමාජිකයින් එයට 18 සහතිකය සුදුසු බව තීරණය කරන ලදී. බ්‍රිතාන්‍ය සිනමා බෙදාහැරීම් කණ්ඩායම මෙම චිත්‍රපටය යුදමය චිත්‍රපටයක් නොවන බැවින් හා එය යුද්ධය පිළිබඳ ගැඹුරු සංකල්පනාවන් ඇති චිත්‍රපටයක් ලෙස අවධාරණය කරමින් BBFC වෙත අභියාචනා කරන ලදී. ඒ අනුව නැවත පරීක්ෂා කරමින් BBFC ආපසු '15' සහතිකයක් එම චිත්‍රපටය වෙත නිර්දේශ කරන ලද අතර 15-17 ළමුන් කණ්ඩායම වෙනුවෙන් පූර්ව පරීක්ෂණ දර්ශනයක් පැවැත්වීමට නියම කර ඉන් අනතුරුව '15'සහතිකය ලබාදීමට කටයුතු කරන ලදී.

බ්‍රිතාන්‍ය චිත්‍රපට වර්ගීකරණ ආයතනය (British Board of Film Classification - BBFC) මඟින් චිත්‍රපට වර්ගීකරණයේ මූලික අභිප්‍රාය, බාල වයස්කරුවන්ගේ ආරක්ෂාව බව දක්වයි. BBFC ආයතනය සිනමා කර්මාන්තයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක වේ. BBFC මඟින් චිත්‍රපට සඳහා පමණක් නොව වීඩියෝ

නිෂ්පාදන සඳහාද වර්ගීකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරයි. චිත්‍රපට වර්ගීකරණයේදී පහත නිගමනයන් ක්‍රියාත්මක වේ.

U - Suitable For all (සියල්ලන්ටම)

PG - Parental Guidance adviced (දෙමාපිය අධීක්ෂණය යෝජනා කරයි.)

12 - Restricted to persons 12 years and over (අවුරුදු 12 සහ ඊට වැඩි අයට පමණයි)

15 - Restricted to persons 15 years and over (අවුරුදු 15 සහ ඊට වැඩි අයට පමණයි)

18 - Restricted to persons 18 years and over (අවුරුදු 18 සහ ඊට වැඩි අයට පමණයි)

R18 - Restricted distribution only through sex shops specially licensed cinemas. etc
(ලිංගික භාණ්ඩ වෙළඳසැල් සහ විශේෂ බලපත්‍ර ලද සිනමාශාලා වලට බෙදා හැරීමට සීමාකර තිබේ.)
වීඩියෝ චිත්‍රපට කර්මාන්තයේ U යනුවෙන් හඳුන්වන තවත් අමතර වර්ගීකරණයක් ඇත.

U - Particulary suitable for children. (විශේෂයෙන් ළමුන්ට සුදුසුය.)

වීඩියෝ චිත්‍රපට මුදාහැරීම් වලදී වෙන වෙනම වර්ගීකරණයන් සිදුකරනු ලබයි. BBFC ආයතනයේ මූලික ප්‍රතිපත්තියට අනුව වීඩියෝ වර්ගීකරණයේදී, චිත්‍රපට වර්ගීකරණයට වඩා දැඩි පදනමකින් ක්‍රියාත්මක වේ. එයට හේතුව වීඩියෝ පට ගෘහස්ථ පරිහරණය සඳහා ගෙනයන බැවිනි.

ඇමරිකාවට වඩා වෙනස් වූ පදනමක සිට වැඩිහිටියන්ට පමණක් නිර්මාණය වූ චිත්‍රපට වර්ගීකරණයට අමතරව පුළුල් නීතිමය වාරණයන්ට ලක්කිරීමක්ද බ්‍රිතාන්‍ය තුළ දැකිය හැක. පහත සඳහන් හේතු මත චිත්‍රපටවල කොටස් කපා ඉවත් කිරීමට BBFC ආයතනයට බලය ඇත.

I අශ්ලීල බව (Obscenity)

II ලිංගික ප්‍රචණ්ඩත්වය

III ප්‍රචණ්ඩ පරපීඩක ක්‍රියාවලීන් අවධාරණය කිරීම්

IV භයානක අවිආයුධ මහිමයට නැංවීම (Glamoisation of weapons)

V 1937 සිනමා ඡායාරූප පනත (Cinematography Act - 1937) උල්ලංඝනය කරමින් සතුන් හා ළමා නළුවන් හිංසනයට පත් කිරීම.

VI අනුකරණය කළ හැකි, භයානක හෝ අපරාධමය ක්‍රමෝපායන්

VII ආගමකට අපහාස වන රූප හෝ සංවාද

ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ කාරණයේදී BBFC ආයතනයේ ක්‍රියාවලිය අගය කළයුතු වුවත් වැඩිහිටි ප්‍රේක්ෂකයන් උදෙසා නිර්මාණය වන චිත්‍රපට වාරණ ප්‍රතිපත්තිය මතභේදයට තුඩු දෙන්නකි.

ඉන්දියානු සිනමාව හා වාරණය

ඉන්දියානු ප්‍රේක්ෂකයන්ගේ මුල්ම සිනමා අත්දැකීම වූයේ බොම්බායේ වොට්සන් හෝටලයේ 1896 ජූලි මස ලුමියර් සහෝදරයන් විසින් කළ ප්‍රදර්ශනයයි. 1913 දී ප්‍රථම ඉන්දියානු චිත්‍රපටය වන 'රාජා හරිස්චන්ද්‍ර' ඩඩාසංහබ් ෆල්කේ විසින් නිෂ්පාදනය කරන ලද අතර 1920 දී ඉන්දියානු චලන චිත්‍ර අඥාපනත සම්මත විය. ඒ යටතේ මදුරාසිය, කල්කටාව, බොම්බාය, ලාහෝරය (වර්තමානයේ පාකිස්ථානය) හා රැන්ගුන් (වර්තමානයේ මියන්මාරය) යන නගර වල පොලිස් ප්‍රධානීන් යටතේ වාරණ මණ්ඩල පිහිටුවන ලද අතර ඒවා එකිනෙකින් ස්වාධීනව ක්‍රියාත්මක විය.

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය

1930 ගණන්වල අගභාගයේ පටන් 1947 අගෝස්තු 15 වන දින බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ගන්නා තුරු ඉන්දියාව තුළ දියුණු දේශපාලන උද්ඝෝෂණ ක්‍රියාත්මක විය. අධිරාජ්‍යවාදයට එරෙහිව ගෙන ගිය මෙම නිදහස් අරගලය හේතුකොට ගෙන ඉන්දියානු චිත්‍රපට බොහොමයක් බ්‍රිතාන්‍ය වාරණයකට ලක් විය. නැඟ එන ජාතිකවාදී හැඟීම් ඍජුව නිරූපණය කළ දේශපාලනික චිත්‍රපට දැඩි සුපරීක්ෂණයකට ලක් කෙරුණි. මහ රජතුමාගේ නිල ඇඳුම අඳින සොල්දාදුවන්, ක්‍රිස්තියානි ආගමික පූජකයින්, රජයේ ඇමතිවරුන්, තානාපතිවරුන් හා විදේශීය නිල නියෝජිතයන්, පොලීසිය, විනිශ්චකාරවරුන් හෝ රජයේ සිවිල් නිලධාරීන් පිළිබඳව අපහාසාත්මක ඉඟි පළ කළ ඕනෑම චිත්‍රපටයක් තහනම් කෙරුණි. නමුත් බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට අභියෝග නොකළ සමාජ ප්‍රතිසංස්කරණ නිරූපණය කළ චිත්‍රපට වලට මෙම බලපෑම එල්ල නොවීය. බ්‍රිතාන්‍යයන් තමන් ඉන්දියාව ශිෂ්ට සම්පන්න කිරීමේ ක්‍රියාවලියක සිටින බව විශ්වාස කරන්නට කැමති වූ බැවින් මෙවන් චිත්‍රපටවලට පහසුකම් ද ලැබුණි. චිත්‍රපට නිෂ්පාදකවරු චිත්‍රපට තහනම් වීම හා ඒ තුළ තම මූල්‍යමය ආයෝජනයන්ට විය හැකි අවධානම හේතුවෙන් ඉන්දියානු ජනතාව පිනවන ප්‍රේම වෘත්තාන්ත හා පවුලේ කතා නිරූපණයට පමණක් පෙළඹුනි.

සමහර චිත්‍රපට නිෂ්පාදකවරු මෙම දේශපාලන බලපෑම් වලට ප්‍රතිචාර දැක්වූයේ බ්‍රිතාන්‍ය ඇඳුම් පැළඳුම් ආදිය විහිළු සහගත ලෙස අනුකරණය කළ ඉන්දියානු චරිතයන් මැවීමෙනි. හොඳින් නිම කළ බටහිර පන්නයේ කලිසම් කෝට් ඇඳ තොප්පියක් දමාගෙන නිරන්තරයෙන් ඉන්දියානුවන්ට 'මෝඩයන්' යැයි බැණ වැඳුණු 'ඔහු' කපටියෙක් හෝ කවටයෙක් ලෙසින් හාස්‍යයට ලක් කෙරිණි. සාම්ප්‍රදායික ඉන්දියානු ඇඳුම් ඇඳගත් ජාතිකවාදී වීරයා සැමවිටම ඔහුව පරදා නැඟී සිටියේය.

නිදහසේ උද්යෝගය වැඩි වෙද්දී සමහර අධ්‍යක්ෂකවරු චිත්‍රපට තුළ දේශප්‍රේමී ප්‍රතිරූප ඇතුල් කිරීමෙන් රටේ පොදු ජනමතය දැක්වීය. නිදසුනක් ලෙස 1945 දී 'අන්ටෝල් ගාදි' (Anmol Ghadi) නම් මෙහෙබුද් (Medboob) අධ්‍යක්ෂණය කළ චිත්‍රපටයෙහි චරිතයක් සඟරාවක් පෙරලන අතර එම සඟරාවේ මුල් පිටෙහි තහනම් කරන ලද ඉන්දියානු ජාතික හමුදාවේ ආරම්භකයා වන සුභාෂ් චන්ද්‍රබෝස් (Subahash Chandra Bose) ගේ සේයාරුවක් ඇත. අධිකරණය තුළ දර්ශන නිරූපණයේ දී බ්‍රිතාන්‍ය

රජුගේ ඡායාරූපය වෙනුවට බිත්තියේ එල්ලා තිබුණේ මහත්මා ගාන්ධිගේ සේයාරුවකි. වාරණ නිලධාරීහු නොපැකිලිව මේ සියලු ප්‍රතිරූප සිනමා කෘතිවලින් කපා දැමූහ. අනතුරුව චිත්‍රපට නිෂ්පාදකවරු ඉන්දියානු කොංග්‍රසයේ සලකුණු චිත්‍රපට වලට එකතු කිරීම ආරම්භ කළහ. චිත්‍රපටයේ දර්ශනයක පසුබිමේ කෙනෙකුට ගාන්ධියානු සංකේතය වූ 'චරකය' (Spinning Wheel) දකගත හැකි වූ අතර එය අධිරාජ්‍යයේ ආර්ථික රටාවට එරෙහිව වීම පිළිබිඹු කළේය. ගබඩාවක ගාන්ධිගේ ඡායාරූපය සහිත කැලැන්ඩරයක් එල්ලා තිබීම, ගෙදරක නේරුගේ ඡායාරූපයක් ද ශබ්ද පටයේ කොංග්‍රස් පක්ෂයේ ජනප්‍රිය ගී තනු වලට අනුකූලව පා තබන හමුදා ආචාර පෙළපාලියක හඬ ආදිය අන්තර්ගත කර තිබුණි. බොහෝ විට මෙවැනි සංකේත වලට කතාවේ ගලා යෑම සමඟ කිසිදු සම්බන්ධතාවයක් නොවූ නමුත් සිනමාශාලා වලදී මේවා නරඹන්නන්ගේ ප්‍රීති ඝෝෂා වලට හේතු විය. යුද්ධය ආරම්භයත් සමඟ බ්‍රිතාන්‍ය වාරණ බලධාරීන් මෙවන් දර්ශන කපා හැරීමට නියෝග කළහ. 1942 න් පසු ගාන්ධි හා තවත් කොංග්‍රස් නායකයින් ගණනාවක් සිරගත කරන ලද අතර කිසිදු ආකාරයකින් ගාන්ධිගේ ඡායාරූප චිත්‍රපට තුළට අන්තර්ගත කිරීමට ඉඩ නොලැබුණි.

1943 දී ජී. මූකර්ගේ (G. Mukerijee) අපරාධමය පුවතක් (Crime Thriller) අඩංගු කරගත් කිස්මන් (Kismet) නැමැති චිත්‍රපටයේ එක් උද්වේග කර ගීතයේ දෙබස් වලින් ඉන්දියාවට තමන්ගේ පාඩුවේ ඉන්න දෙන ලෙස ජර්මනියට හා ජපනුන්ට කියයි. නමුත් ගීතයට අදාළ දර්ශනාවලිය මඟින් ගීතයේ පදවලින් ඉඟි කරන්නේ කිනම් විදේශීය බලවේගයක් පිළිබඳව ද යන්න ප්‍රේක්ෂකයන්ට පැහැදිලි කරයි. කල්කටා නගරයේ පමණක් එක් සිනමාහලක මේ චිත්‍රපටය අවුරුදු 3 1/2 ක් එක දිගට ප්‍රදර්ශනය කෙරුණි. පූර්ව නිදහස් යුගයේ දී ඓතිහාසික (Historical) සහ ජනප්‍රවාදගත (Mythological) කතා පුවත් පවත්නා දේශපාලන අරගලයේ සංකේතාත්මකව නිරූපණය (Metaphors) සඳහා භාවිත කිරීම සිදු විය. 1941 දී සොරාබ් මෝදිගේ (Sohrab Modi) 'සිකන්ධර්' (Sikander) චිත්‍රපටයේ නිර්භීත ඉන්දියානු පාලකයෙක් මහා ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණයට විරුද්ධව සටන් කරයි.1943 දී විජය බාත්තේ 'රාම් රාජ්‍ය' (Ram Rajya) චිත්‍රපටයේ සුප්‍රසිද්ධ රාම රාවණා ගැටුම යහපත සහ අයහපත අතර අරගලයක් ලෙසින් බ්‍රිතාන්‍යයට එරෙහි ඉන්දියානු අරගලයට ඉඟි සපයමින් නිරූපණය කෙරුණි. මෙම චිත්‍රපට මහත් ජනප්‍රසාදයට (box-office) ලක් විය.

II ලෝක යුද සමයේ සිනමාපට හිඟ වූ අතර බ්‍රිතාන්‍ය රජය ඒවා බෙදා හැරීමට කෝටා ක්‍රමයක් හඳුන්වා දුන්නේය. මෙම කෝටා සඳහා සුදුසුකම් ලැබීම පිණිස චිත්‍රපට නිෂ්පාදකයින් අවම වශයෙන් සෑම චිත්‍රපට හතරකට එකක්වත් බ්‍රිතාන්‍ය යුද වෑයම් හුවා දක්විය යුතු විය. මෙවන් චිත්‍රපට ඉන්දියානු ජනතාව අතර බෙහෙවින් අඩු ජනප්‍රියතාවයක් හිමිකර ගත්තේය. 1946 දී පී. ශාන්තාරාම් නම් අධ්‍යක්ෂකවරයා බ්‍රිතාන්‍ය රජයේ මෙම කොන්දේසිය මඟ හැර යාමට එක් ක්‍රමයක් ලෙස චීනය පසුබිම් කරගත් ජපන් විරෝධී චිත්‍රපටයක් නිර්මාණය කළේය. එය 'ඩොක්ටර් කොට්නිස් කී අමර් කහානී' (Dr. Kothis Ki Amar Kahani) නමිනි. මෙම චිත්‍රපටය චීන කොමියුනිස්ට්වරුන්ට ජපානයට විරුද්ධව සටන් කිරීමට උදව් කරන ඉන්දියානු දොස්තර කෙනෙකුට ගෙතුණු අතර මෙය සමහර විට මහජන ප්‍රසාදයට ලක් වූ හා 'යුද වෑයම හුවා දක්වන' (War effort) එකම චිත්‍රපටය විය යුතුය.

නිදහස හා ඉන්පසු අවධිය

1947 දී ඉන්දියාව නිදහස දිනා ගත්තේය. සිනමා කර්මාන්තය වහාම නිදහස වෙනුවෙන් කළ අරගලය තුල වීරත්වයට පත් වූවන් පිළිබඳ චිත්‍රපට සාදන්නට මෙය සමහරු නිදසුනක් ලෙස 1948 දී ආර්. සේගල් ගේ (R. Sehgal) 'ශාහිඩ්' (Shaheed) දැක්විය හැක. නමුත් මෙම සැමරීමේ උද්යෝගය ඉන්දියාව හා ඉස්ලාමීය පාකිස්ථානය වශයෙන් බෙදා වෙන් වීමේ බිහිසුණු ක්‍රියාදාමය මඟින් අඩපණ විය. දශලක්ෂ ගණන් හින්දු හා මුස්ලිම්වරුන් නව දේශ සීමා තරණය කර තමන් තෝරාගත් රටවල් වලට අනාථයින් ලෙස පැමිණියහ. පාකිස්ථානයට අයත් වූ ලාහෝරයේ (Lahore) චිත්‍රාගාර වල රැකියාව කළ හින්දු චිත්‍රපට අධ්‍යක්ෂකවරුන්, සංගීතඥයින්, ගීත රචකයෝ සහ කාර්මික ශිල්පීන් බොම්බාය කරා පැමිණි අතර දශකයක් ඇතුළත චිත්‍රපට නිෂ්පාදනයට බලපෑම් කරන්නට ඔවුන්ට හැකි විය. කල්කටාව තම ප්‍රේක්ෂකාගාරයෙන් සැලකිය යුතු කොටසක් නැගෙනහිර බෙංගාලය, නැගෙනහිර පාකිස්ථානය (වර්තමාන බංගාලිදේශය) බවට පත් වීමේ දී අහිමි කර ගත්තේය. කල්කටාවේ චිත්‍රාගාර බිඳවැටෙන්නට වූ අතර එහි පුහුණු වූ බොහෝ දෙන ද බොම්බයට පැමිණියහ. සිනමා නිර්මාණ මධ්‍යස්ථාන ලෙස ලාහෝරය සහ කල්කටාවේ බිඳ වැටීම 'බොම්බාය' ඉන්දියාවේ චිත්‍රපට අගනගරය බවට පත් කළ අතර එය නිල නොවන ලෙස බොලිවුඩ් ලෙසින් හැඳින්වීම ආරම්භ විය.

නිදහසත් සමඟ චිත්‍රපට නිෂ්පාදකවරු 'වාරණ ප්‍රතිපත්ති' වල සුවිශාල ලිහිල් කිරීමක් බලාපොරොත්තු වූයේ නම් ඔවුන්ගේ ඒ අදහස් මුළුමනින්ම අසාර්ථක විය. නව ඉන්දියානු වාරණ නිලධාරීහු තම පූර්ව ගාමීන්ට ද වඩා දැඩි බවකින් කටයුතු කරන්නට විය. ලිංගික දුරාචාරය (Sexual Immorality) වලකාගත යුතු මූලික කරුණක් විය. 1949 මැයි මස ජර්නල් ඔෆ් ද බෙංගාල් මෝෂන් පික්චර් ඇසෝසියේෂන් (Journal of the Bengal Motion picture Association) හි උපුටා දක්වා තිබූ වාරණ රීතින් (Censorship Guidelines) වලට අනුව 'නිදහස් ආලය' (Free Love) 'අවිවාහ මාතෘත්වය' (Companionate Marriage) වැනි නීත්‍යානුකූල නොවූ ලිංගික සම්බන්ධතා වලට ඉඩ දෙනු නොලැබුණි. අනාචාරය හෝ නීති විරෝධි ලිංගික සම්බන්ධතා කතාවේ ගලායාමට අත්‍යවශ්‍ය නම් ඒවා සාධාරණීකරණය නොකළ යුතු අතර සිත් ඇඳ ගන්නා සුළු ආකාරයෙන් නිරූපණය නොකළ යුතුය. වැඩිහිටියන් සිපගැනීම හෝ වැලඳ ගැනීම, අප්‍රසන්න ලෙස සරාගී බවකින් නිරූපණය නොකළ යුතුය.

ලිංගික ආශාව නිරූපණයට ඉඩ නොලැබුණු විට ඒ පිළිබඳ ගීතයන් ගැයුණු අතර සිප වැළැඳ ගැනීමක් සඳහා පෙම්වතුන්ගේ දෙතොල් සමීප වන තීරණාත්මක මොහොතේ ක්ෂණිකව කැමරාව ඉවතට හැරවී 'ලව් බර්ඩ් යුවලක්', 'රෝස මල් උයනක්' හෝ 'විහිදෙන වතුර මලක්' දෙසට යොමු විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 60 යටතේ මධ්‍යම ආණ්ඩුව (Central Government) චිත්‍රපටි ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය දීමේ ක්‍රියාවලියට වගකිව යුතුව ඇත. 1952 චලන චිත්‍ර ආඥා පනත අනුව චිත්‍රපටි මහජනයාට ප්‍රදර්ශනය කිරීම, වාරණ මණ්ඩල පත් කිරීම මධ්‍යම ආණ්ඩුව මගින් සිදු කෙරේ. මෙම පනත යටතේ ප්‍රාදේශීය වාරණ නිලධාරීන්ගේ ස්වාධීනත්වය අහෝසි කර ඒවා බොම්බායේ වාරණ මණ්ඩලය යටතට පත් කරන ලදී. 1952 චලන චිත්‍ර පනතේ චිත්‍රපට වර්ගීකරණය සම්බන්ධ කොටස් 1983 දී සංශෝධනය කරන ලද අතර එතැන් පටන් වාරණ මණ්ඩලය, චිත්‍රපට වර්ගීකරණ මධ්‍ය මණ්ඩලය (Centrel Board of Film Certification- CBFC) ලෙසින් හැඳින්වේ. මෙය ඉන්දියානු රජයේ නියාමන

කාර්යාංශය වන අතර තොරතුරු හා විකාශන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එය චිත්‍රපට, රූපවාහිනී වැඩසටහන්, රූපවාහිනී දැන්වීම් හා ප්‍රචාරණ මාධ්‍ය අධීක්ෂණය හා ශ්‍රේණිගත කිරීම හා වාරණය සිදු කරයි. මෙමඟින් 1952 චලන චිත්‍ර ආඥා පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව චිත්‍රපට මහජන ප්‍රදර්ශනයට නියාමනය කරන අතර එහි සහතිකයක් නොමැතිව ඉන්දියාව තුළ චිත්‍රපට ප්‍රදර්ශනය කළ නොහැකිය.

මෙම මධ්‍ය මණ්ඩලයේ සභාපති ඇතුළු සියලු සාමාජිකයින් මධ්‍ය රජය මඟින් පත් කෙරේ. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය බොම්බායේ පිහිටා ඇති අතර බොම්බාය, කල්කටා, චෙන්නායි, බැංගලෝර්, තිරුවනපුරම්, හයිද්‍රභාද්, නවදිල්ලිය, කල්කටා හා ගුහාවතී යන නගර වල ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇත. ප්‍රාදේශීය කාර්යාල වල චිත්‍රපට නැරඹීම සඳහා උපදේශක මණ්ඩල වල සහාය ලැබෙන අතර එම මණ්ඩල වලට සමාජයේ විවිධ කොටස් නියෝජනය වන පරිදි මධ්‍ය රජය විසින් වසර 02ක කාලයකට සාමාජිකයන් පත් කරයි.

CBFC ආයතනය වර්තමානයේ සිදුකරන චිත්‍රපට වර්ගීකරණය

U - සියල්ලන්ටම පොදුවේ නැරඹිය හැකිය.

U/A - දෙමව්පිය මඟ පෙන්වීම යෝජිතය.

සියලු දෙනා සිනමා ශාලාවට ඇතුළු කර ගන්නා නමුදු සමහර දර්ශන වයස 12ට අඩු දරුවන්ට නුසුදුසු විය හැකිය.

A - වැඩිහිටියන්ට පමණයි.

මෙම වර්ගීකරණය ලැබූ VHS, DVD මිලට හෝ කුලියට ගැනීම හෝ නැරඹීම සඳහා අවුරුදු 18ට අඩු කිසිවෙකුට ඉඩ නොලැබේ. මෙම චිත්‍රපට වල භාෂාව සම්බන්ධයෙන් සීමා කිරීමක් නොමැත. මත් ද්‍රව්‍ය භාවිත දර්ශන, විස්තරාත්මක නොවූ ලිංගික දර්ශන ආදියට ඉඩ ලැබේ.

S - විශේෂ පුද්ගල පිරිසකට පමණක් සීමා වේ.

(උදාහරණ ලෙස වෛද්‍යවරුන්ට පමණක් ප්‍රදර්ශනය කිරීම දක්විය හැක.)

CBFC ආයතනය ලිංගිකත්වය, නිරුවත, ප්‍රචණ්ඩත්වය හෝ දේශපාලනිකව සංවේදී යයි සිතන කාරණා මත චිත්‍රපට ප්‍රදර්ශනයට පෙර කොටස් ඉවත් කරන ලෙස නිරන්තරයෙන් නිෂ්පාදකවරුන්ට දැනුම් දෙයි.

2002 දී ආනන්ද් පත්වදාන් විසින් 'පරමාණු අවි අත්හදා බැලීම් හා 2011 සැප්තැම්බර් 11 ප්‍රහාරයේ දර්ශන' අඩංගු කොට නිපද වූ චිත්‍රපටයේ කොටස් 21ක් ප්‍රදර්ශනයට පෙර වාරණයට මණ්ඩලය දැනුම් දුන්නේය. එයට එරෙහිව අධ්‍යක්ෂකවරයා අධිකරණයේ පිහිට පැතූ අතර අධිකරණය මෙම ඉවත්කිරීම් ව්‍යවස්ථානුකූල නොවන බව තීරණය කළේය.

2003 දී ඉන්දියානු Transsexual පිරිස් සම්බන්ධයෙන් නිෂ්පාදනය කර අධ්‍යක්ෂණය කළ Gulabi Aaina (රෝස කැඩපත) නම් චිත්‍රපටය වාරණ මණ්ඩලය විසින් තහනම් කරන ලදී. ආන්තික කණ්ඩායමකට සංවේදී ලෙස නිරූපණය සම්න්ධයෙන් විචාරක අවධානයට ලක්වූ විදේශ චිත්‍රපට උළෙල ගණනාවක ප්‍රදර්ශනය කර සම්මාන පවා දිනාගත් එම චිත්‍රපටය තවමත් තහනම් කර ඇත.

ඉන්දියානු ව්‍යවස්ථාව

ඉන්දියානු ව්‍යවස්ථාවේ අංක 19 (1) අනුව අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සියලුම පුරවැසියන්ට ලබාදී ඇත්තේ අංක 19 (2) දරණ වගන්තියෙන් පනවා ඇති සාධාරණ වාරණයන්ට යටත්වය. මෙම සීමාකිරීම් වලින් අදහස් වන්නේ ඉන්දියාවේ ස්වාධිපත්‍යයට (Sovereignty) හා අඛණ්ඩත්වයට (Integrity) හානියක් නොව පරිදි එමෙන්ම රාජ්‍යයේ ආරක්ෂාව, මිත්‍ර රාජ්‍යයන් සමඟ මිත්‍රශීලී සබඳකම් පවත්වා ගැනීම මෙන්ම උසාවියෙන් දඬුවම් ලැබිය හැකි වැරදි වලට යටත් නොවන සේ නීතියට එකඟව ක්‍රියා කිරීම් යන කරුණුය. මෙම තත්ත්වය මත චිත්‍රපට නිපදවීම, ප්‍රදර්ශනය කිරීම සාධාරණ වාරණයන්ට යටත් වේ. මෙය ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාවේ අඩංගු කරුණු වලට යටත්ව චිත්‍රපටි සම්බන්ධයෙන් වාරණයක් ඇති කිරීමට ඉඩ ලැබී ඇත.

එහි දක්වා ඇති කරුණු අනුව සිනමාව වෙනත් මාධ්‍ය ප්‍රකාශනයන්ට සම නොවේ. සමාජයේ විවිධ කොටස් වලට විශේෂයෙන් ළමා සමාජයට හා වැඩිහිටි සමාජයට බලපෑම් කිරීමට වැඩි ඉඩකඩක් ඇති නිසා සිනමාව පූර්ව වාරණයට (Pre-Censorship) ලක්කිරීම සංකීර්ණ කටයුත්තකි. සිනමාව සාක්ෂරතාවය ඇති හෝ නැති කොටස් වලටද අහිතකර බලපෑම් එල්ල කිරීමට හැකි මාධ්‍යයක් හෙයින් එහි බලපෑම් වැලැක්වීම දුෂ්කරය. එම නිසාම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ගැන තීරණ ගැනීමට උසාවියට නැතහොත් නීතිමය මණ්ඩලයට සිදුවේ. එසේ කළහොත් චිත්‍රපටි විශාල සංඛ්‍යාවක් වාරණයන්ට ලක්වීම හේතුවෙන් චිත්‍රපට ප්‍රදර්ශනය අසීමිත නීතිමය බාධක වලට ලක්වේ.

චිත්‍රපටවල උචිතානුචිතභාවය පාලන කිරීම පිළිබඳව 1969 දී චිත්‍රපට වාරණ පනත මඟින් එනම් කෝෂ්ලා කමිටුව (Khoshla Committee) වාර්තාව මඟින් ආවරණය වී ඇත. එක්සත් ජනපදයේ මෙන් ඉන්දියාවේද චිත්‍රපට ස්වයං වාරණයන්ට ලක් වන්නේ නම් පූර්ව වාරණයන්ට ලක්කිරීමේ අවශ්‍යතාවයන් පැන නගින්නේ නැත. කෝෂ්ලා කමිටුව විසින් තත්ත්වය සමීක්ෂණයට ගෙන සඳහන් කර ඇත්තේ ස්වයං වාරණය (Voluntary Censorship) ඉන්දියාවට නොගැලපෙන බවය.

සමාලෝචනය

සිනමා කෘතියක අර්ථ එම චිත්‍රපට නිෂ්පාදනය වන රටවල සමාජ ව්‍යුහය හා වෙන් කළ නොහකි ලෙස බැඳී ඇත. ජාතිය, වර්ගය, වයස් ප්‍රමානය, ආගම, වෘත්තිය, අධ්‍යාපනය, දේශපාලනය, පක්ෂපාතීත්වය ආදී වශයෙන් විවිධ ප්‍රභේදයන්ට එය වර්ග කළ හැක. මේ එක් එක් කණ්ඩායම්වල රුචි අරුචිකම් වෙනස්ය. නමුත් සිනමා වාරණය දියුනු තාක්ෂණික ලෝකය තුළ කල් ඉකුත් වූ සංකල්පයකි.

සිනමාව වැනි බහු ජන මාධ්‍යයන් මතවාදී විශ්ලේෂනය සඳහා සරු තෝතැන්නකි. ඒවා සාමාජික, කාර්මික, ආර්ථික අවශ්‍යතාවන් ගේ කදිම නියෝජනයක් වීමයි.

(විජේතුංග, 1994 පිටු 95-96)

එබැවින් වාරණය බාල වයස්කරුවන් ආරක්ෂා කිරීම හා ප්‍රේක්ෂකයන්ට සිනමා කෘතියේ අන්තර්ගතය දැනුම් දීමට යොදා ගන්නා ශ්‍රේණිගත කිරීමක් වශයෙන් වර්තමානයේ භාවිත කළ හැක.

මූලාශ්‍ර

විජේතුංග, ගාමිණී (1994), සිනමාව සංස්කෘතිය හා මතවාද, පද්මා විජේතුංග.

සරසවි සිංහල සිංහල ශබ්ද කෝෂය(2010),සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

Bose, Brinda (2006) Gender and Censorship, Women Unlimited, New Dilhi.

Hayward, Susan, (2004) Key Concepts in Cinema Studies.

Key Concepts in Cinema Studies-2004 second Edition Hayward, Susan, First Indian Reprint

Murphy, Terrence J (1963), Censorship, Helicon Limited, Ireland.

Nelmes, Jill (1996) An Introduction to Film Studies, Rutledge, London and New York.

Neve, Brian, (1992) Film and Politics in America, Rutledge, London and New York.

Robertson, James, The Hidden Cinema Rutledge, London and New York.

Sarkar, Kobita (1975), Indian Cinema Today, Sterling Publishers Pvt. Ltd, New Delhi.

35

අවකාශ රංගය හා සිනමාලංකාරය

අරුණ ලොකුලියන

රුසියානු සිනමාවේ පුරෝගාමීන් වන සර්ජි අයිසන්ස්ටයින් (Sergei Eisestein), විසෙවෝල්ද් පුඩොව්කින් (Vsevolod Pudovkin) සහ ඇලෙක්සැන්ඩර් ඩොව්චෙන්කෝ (Alexander Dovchenko) යනු සිනමාවේ මූලික සංවිධිත න්‍යාය ගොඩනැගූ පුරෝගාමීහු වෙති. (Block, 2008,10) ඔවුහු ඒ සඳහා පාදක කර ගන්නේ මුළුමනින්ම තමන් විසින් ගොඩනගාගත් සංකල්ප නොවෙතත් එම න්‍යායයන්ගේ බහුතරයට පාදක වන්නේ ඔවුන්ගේම වන ප්‍රායෝගික සිනමා භාවිතයයි.

ස්ට්‍රයික් (1925), බැට්ල්ෂිප් පොටෙම්කින් (1925), ඔක්තෝම්බර් (1927), අලෙක්සැන්ඩර් නෙවස්කි (1938), ඉවාන් ද ටෙරිබල් (1944/45) වැනි රුසියානු සිනමාවේ මෙන්ම ලෝක සිනමාවේ ද සංධිස්ථාන සිනමා කෘති නිර්මාණය කළ අයිසන්ස්ටයින් වෙත ප්‍රබලතම සිනමාත්මක ආභාසය ලැබෙන්නේ රුසියානු සිනමාවේ පුරෝගාමී සිනමාකරුවකු වන විස්වොලෝද් මෙයෙර්හෝල්ඩ් (Vsevolod Meyerhold) වෙතිනි. මෙයෙර්හෝල්ඩ් රුසියානු වේදිකා රංගනය විෂයෙහි ස්ටැනිස්ලවුස්කි හැරුණු විට වඩාත්ම බලපෑම් සහගත න්‍යාය ගොඩනැගූ රංගවේදියායි. සර්ජි අයිසන්ස්ටයින් සිනමා නළු නිළියන් අධ්‍යක්ෂණයේදී මෙයෙර්හෝල්ඩ් ගොඩනැගූ සංකේතවාදී රංග වින්‍යාසය භාවිතයට ගත් අතර ඔහුගේ සිනමා වියරණය විෂයෙහි එකී බලපෑම දැකිය හැකිය. (www.imdb.com/vsevolod meyerhold)

සිනමාවේ මූඛ්‍යාංග (Elemens) විෂයෙහි අයිසන්ස්ටයින් ප්‍රමුඛ ඉහත පුරෝගාමීන් විසින් ගොඩනැගූ දෘශ්‍ය මූලධර්ම වැදගත්වන්නේ ඕනෑම කලාත්මක අනුභූතියක් ගොඩනැගීමේදී නිර්මාණකරුවකු විෂයෙහි පැනනැගෙන විවිධාකාර ගැටලුවලට විසඳුම් මෙන්ම උත්ප්‍රේරකයන් එමගින් ලබාගත හැකි බැවිනි.

1. **දෘශ්‍ය සංරචක** (The Visual Components)

සිනමාවේදී, නිශ්චල ඡායාරූපකරණයේදී, දැන්වීම්කරණයේදී, වේදිකාවේදී, රූපවාහිනියේදී, ප්‍රසංගයකදී හෝ ජංගම දුරකතන තිරයකදී නැතහොත් සොබාදහමේදී අපි දකින දේ යනු දෘශ්‍ය සංරචකයකි. සචල හෝ අචල, ලොකු හෝ කුඩා, කළු සුදු හෝ වර්ණ ලෙස විභේදනය කළ හැකි මුත් අවසන ඒ සියල්ල දෘශ්‍ය සංරචකයකි. හැඟවුම්කාරක පඨිතයකි. ඒවායේ ඇති නිර්මාණශීලී හැසිරවීම් මගින් අපි ඒවාට ජීවනාර්ථ ආදේශ කරන්නෙමු. ඒ තුළ ගැඹුරු සංකේතාත්මක අර්ථ හඳුනාගන්නෙමු.

මේ හැම අවස්ථාවකදීම එකී දෘශ්‍ය සංරචක තුළ කිසියම් කතාවක්, දෘශ්‍ය රූපයක් හා ශබ්දය ද එකවර අඩංගු වෙයි. නරඹන්නෙකු තුළට කිසියම් භාවයක් හෝ අදහසක් සන්නිවේදනය කිරීමෙහිලා, එකී මූලික සංඝටක තුන දෘශ්‍ය සංරචකය තුළ නිශ්චිත කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එබැවින් රූපයක් (Picture) නොහොත් දෘශ්‍ය සංඝටකයක් මූලිකව කොටස් තුනකට ඛණ්ඩනය කර දැක්විය හැකිය. එනම්,

I. කතා පුවත (Story) හෙවත් කතා මන්ත්‍රණය (Plot), චරිත (Character) සහ දෙබස් (Dialogue).

II. ශබ්දය (Sound) හෙවත් දෙබස් (Dialogue), ශබ්ද ප්‍රයෝග (Sound Effects), සංගීතය (Music).

III. රූප (Visuals) හෙවත් මූලික රූප සංරචක වන අවකාශ (Space), රේඛා (Line), හැඩතල (Shape), තානය (Tone), වර්ණය (Colour), චලනය (Movement) සහ රිද්මය (Rhythm) යනුවෙනි. (Bruce,2008,15)

මෙහිදී කලා කෘතියක මූලික රූපයක් සඳහා සංයෝග වන ඉහත පළමු සංඝටක ද්විත්වය වන කතා පුවත සහ ශබ්දය එහි අභ්‍යන්තරයේ පළමු වටයේදී ගොඩනැගෙන සංඝටක වන විට එහි තෙවන සංඝටකය වන රූප යන්න නිර්මාණකාර්ය සඳහා වන ප්‍රායෝගික අභ්‍යාසකරණයේදී භාවිතයෙන් ගොඩනැගෙන සංඝටක ලෙස හඳුන්වාදිය හැකිය. එය කලා කෘතියකදී නිර්මාණකරුවාගේ ශිල්පීය පරිචය මත ඔපමට්ටම් වන සංඝටකය ද වෙයි. එහෙයින් මූලික රූප සංඝටක පිළිබඳ වන අවබෝධය කලාකෘතියක විශිෂ්ට පරිසමාප්තිය විෂයෙහි අත්‍යන්තයෙන් වැදගත් වෙයි. සිනමාවේදී මෙහි උපයෝගීතාව සිනමාලංකාර වර්ධනය විෂයෙහි උපස්ථම්භක වන්නේ අධ්‍යක්ෂවරයාගේ රූප පරිකල්පනය හා ශිල්පීය පරිචය මත එය පදනම් වන බැවිනි. එහෙයින් ඒ පිළිබඳ අධ්‍යයනය සිනමාවේදී අනිවාර්ය අවශ්‍යතාවකි.

මූලික දෘශ්‍ය සංඝටක අධ්‍යයනය:

පොදුවේ සිනමා කෘතියකදී හෝ නිශ්චල ඡායාරූපයකදී දෘශ්‍ය සංඝටක (Visual Components) මගින් මනෝභාව (Moods) චිත්තාවේග (Emotions) අභිප්‍රාය (Ideas) මෙන්ම වඩා වැදගත් වන දෘශ්‍ය ආකෘතියක් ද (Visual Structure) රූපයක් වෙත සන්නිවේදනය කරනු ලබයි. (Bruce,2008,15) මෙහිදී උත්සාහ කරන්නේ සිනමාවට විශේෂිතව සහ ඊට අමතරව රූපවාහිනිය, පරිගණකය හෝ ඡායාරූපයට අනුගතව එහි කාර්යභාරය, අවකාශය යන මූලික සංඝටක විශේෂිතව සාකච්ඡා කිරීමයි.

අවකාශය (Space) :

දෘශ්‍ය රූපයක් තුළ මූලික වශයෙන් හඳුනාගත හැකි දෘශ්‍ය අවකාශයන් තුනක් පවතී. එනම්,

I. කැමරාව සහ වස්තුව අතර ඇති භෞතික අවකාශය (The Physical space in front of the Camera).

II. ඉහත කැමරාව සහ වස්තුව අතර වන භෞතික අවකාශය තිරය මත ගොඩනගන අවකාශය (Space as it appears on Screen).

III. තිරය, ප්‍රමාණය සහ හැඩය මත ගොඩනගන අවකාශය (The spatial size and shape of the screen it self). (Bruce, 2008,15)

මේ සියල්ල අන්තර්ගත සහ මූර්තිමත් කරන, දෘශ්‍ය මාධ්‍ය තුළ අවකාශය යනු සංකීර්ණ දෘශ්‍ය සංඝටකයකි. අවකාශය යනු අප හා වස්තුවක් අතර ඇති දුර හෝ ක්ෂේත්‍රයයි. බිම් පෙදෙස නොහොත් වපසරියයි. එය සුදු හෝ ආලෝකමත් විය හැකිය. කළු හෝ අඳුරු විය හැකිය. ඇරුණු හෝ වැසුණු විය හැකිය. ගැඹුරු හෝ නොගැඹුරු විය හැකිය. ද්විමාන හෝ ත්‍රිමාණ විය හැකිය. ඒ කුමනාකර වෙතත් අවකාශය යනු අප අවට, අප හා යම් වස්තුවක් අතර වන ක්ෂේත්‍රය නොහොත් මණ්ඩියයි; බිම් පෙදෙසයි; ක්ෂේත්‍රඵලයයි. එහි ඇති ආකාර රාශියක් දෘශ්‍ය අවකාශ උප සංඝටක ලෙස හඳුනාගත හැකිය.

අවකාශයේ උප සංඝටක (Sub components of space) :

මේ යටතේ මූලික ස්වරූප දෙකක් යටතට ගැනෙන උප සංඝටක හඳුනාගත හැකිය.

එනම්,

(අ). I. ගැඹුරු අවකාශ (Deep Spaces).

II. සමතල/ තුනි අවකාශ (Flat Spaces).

III. සීමිත අවකාශ (Limited Spaces).

IV. නොපැහැදිලි අවකාශ (Ambiguous Spaces).

(ආ). I. අනුපාතය (Aspect Ratio).

II. පෘෂ්ඨීය බෙදීම් (Surface Divisions).

III. අනාවෘත අවකාශ (Open Spaces).

IV. සංවෘත අවකාශ (Closed Spaces). ලෙසයි.

මේ හැම උප සංඝටකයක් හරහාම දෘශ්‍ය රූපයක අවකාශය පාලනය කළ හැකිය. නිදසුනක් ලෙස පහත රූපමය ගොඩනැගීම් පෙන්වා දිය හැකිය. සිහින් හඬක සිට සංගීතයකට විසල් හඬක් දක්වා වර්ධනය විය හැකිවාක් මෙන් පහත රූපසටහන් තුළ දැක්වෙන ලක්ෂයට (තිත) පින්තූර රාමුවක් තුළ (Picture Plane). සරල තිතක ස්වරූපයේ සිට සංකීර්ණ දෘශ්‍ය සංඝටකයක් දක්වා සංවර්ධනය වීමේ හැකියාව පවතී.

සරල තිතක් සංකීර්ණ දෘශ්‍ය සංඝටකයක් දක්වා වන වර්ධනය



I.
පින්තූර රාමුව තුළ වර්ධනීය විය හැකි සරල ලක්ෂය

II.
එම (ලක්ෂය) පින්තූර රාමුව හරහා රේඛාවක් දක්වා වර්ධනය වෙයි.

III.
ලක්ෂය ස්වාධීන සංවෘත අවකාශයක් දක්වා වර්ධනය වෙයි.

IV.
සරල තිතක සිට සංකීර්ණ ඝනකයක අවස්ථාව දක්වා වර්ධනය වෙමින් සංකීර්ණ දෘශ්‍ය ආකෘතියක් ගොඩනගයි.

මෙම පින්තූර රාමුව (Picture Plane) සිනමා තිරයක් (Film Screen) සේ ගෙන වර්ධනය වන ලක්ෂය තවවෙකුගේ චලනයට ආදේශ කළ විට දෘශ්‍ය සංඝටකයේ කුඩාම අංශුව වන ලක්ෂයේ චලනයෙන් අරඹා ගොඩනැගිය හැකි සංකීර්ණ දෘශ්‍ය සංඝටක පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිය. මෙකී සංකීර්ණ චලනය තුළ මූලික දෘශ්‍ය සංඝටක වන අවකාශ, රේඛා, හැඩතල, තානයන්, වර්ණ, චලන සහ රිද්ම යන ඕනෑම අවස්ථාවක් නිර්මාණය වනු හඳුනාගත හැකිය. මෙම තත්ත්වයන්ගේ ස්වභාවය සහ හැසිරීම නිර්මාණකරුවකු විසින් වටහා ගත යුත්තේ ඇයි? රූප මාධ්‍ය තුළ වස්තු සංරචනය (Object Composition) ඔස්සේ අර්ථ ගොඩනැංවීමට ඇති හැකියාව දැනුවත්ව භාවිත කිරීම සඳහා අවැසි පරිචය ලබාගැනීමටයි. එකී දැනුම සහිත දෘශ්‍ය නිර්මාණකරුවකුට ස්වකීය අමුද්‍රව්‍ය අර්ථාන්විතව පාලනය කළ හැකි ය. එසේම අවට ඇති අවකාශයන් සහ වස්තූන් ආශ්‍රයෙන් අර්ථ ගොඩනගා ගනු සඳහා ඒ වෙත ප්‍රවේශ විය යුතු අයුරු, අන්තර්ඥානයකින් මෙන් වටහා ගැනීමේ ශක්තිය උදවා ගත හැකිය. සම්ප්‍රදායික හෝ සාමාන්‍ය අවකාශයක විශිෂ්ට සහ අර්ථාන්විත අපූර්වතාවන් මතු කර ගත හැකිය. සරල දේ තුළ ගැඹුරත්, සාමාන්‍ය දේ තුළ අසාමාන්‍යයත් නිර්මාණය කළ හැකිය. ඒ සඳහා වන ශිල්පීය ඥානය ගලා එන්නේ මෙකී මූලික සංඝටක පිළිබඳ අධ්‍යයන පරිචයෙනි.

නළුවා සහ අවකාශය:

සිනමාවේ දෘශ්‍ය රූපය සහ අවකාශය අතර ඇති සම්බන්ධය එකිනෙක සහසම්බන්ධ කරනු ලබන්නේ නළුවාගේ කාර්යභාරය විසිනි. සැබවින්ම තිරයක් මත නළුවා ද සමස්ත රූපයේම කොටසකි. එහෙත් එහි විශේෂත්වයක් තිබේ. නළුවා ද පොදුවේ දෘශ්‍ය රූපය තුළ රූපයේම (Picture) අංගයක් වුව එහි සිටින බුද්ධිමය වශයෙන් ප්‍රතිචාර දක්වනු ලබන පුද්ගලයා වීමයි. සැබවින්ම දෘශ්‍ය රූපය තුළ ඔහු පළමු නළුවායි. ඔහුට අමතර දෘශ්‍ය රූපය තුළ අවකාශය, රේඛාව, හැඩතල, තැන, වර්ණ, චලන හා රිද්ම යන සප්ත නළුවන් ද ඒ ඒ අංශයන්ගෙන් සංවේදනා ප්‍රකාශනයේ යෙදෙමින් භාව රූපනයේ යෙදෙති. මෙහිදී පළමු නළුවා වන පුද්ගලයා මෙන්ම සෙසු සප්ත අංශයෙන් ද පොදුවේ Cast යනුවෙන් හැඳින්විය හැකිය. පළමුව පුද්ගලයා විෂයෙහි රංගධරයා (Cast) යන අර්ථයෙන් සහ දෙවනුව පෙරකී සප්ත සාධක එක්වී පොදුවේ ගොඩනගන දෘශ්‍ය රූපය 'එක් ආකාරයක්' නැතහොත් එක් මහා ඒකකයක් හෝ අච්චුවක් (Cast) ලෙස ගැනීමෙනි. මේ දෙවර්ගයේම පාත්‍රයෝ පෙර කී ලෙස ස්වකීය භූමිකා රංගනයෙන් අවසන සමස්ත දෘශ්‍ය රූපයටම සේවා සම්පාදනය කරති.

බෘස් බ්ලොක් විසින් රචිත 'The visual Story' කෘතියේදී ඔහු එය අපූර්ව ආකාරයෙන් පහදයි. ඒ මෙසේය.

'The first step is to take this cast of Charactor, called visual components and discover who they are. It's a cast that we're stuck with, but it's a great cast. In fact, these Screen cast members are capble of playing any part, any mood, any emotion, and they're great on television, a Computer Screen, or the big screen. This versatile cast work equally well in live action, animation, and computer generated media. They're the most sught after, (and least understood) players around. *(Bruce, 2008, 21)*

එනම් පොදුවේ දෘශ්‍ය රූපයට අයත් උක්ත සංඝටකයෝ ජීවී නළුවා මෙන්ම සිනමා රංගයේ ද, සජීවීකරණයේ ද, පරිගණකයෙන් නිපන් මාධ්‍ය තුළ ද සමාන භූමිකා නිරූපණයක් සිදු කරන බවයි.

දෘශ්‍ය රූප සංඝටකයක් ලෙස සිනමා අවකාශයේ (Space) විශේෂත්වය:

සජීවී නළුවා හැරුණු විට සිනමාවේදී දෘශ්‍ය සංඝටකයන් අතර සමස්ත රූපයට වඩාත්ම බලපෑම් සහගත දෘශ්‍ය ඒකකය ලෙස අවකාශය හැඳින්විය හැකිය. ඊට හේතුව ලිපියේ පූර්වයේ දක්වා ඇති පරිදි අවකාශය මූලික ආකාරය තුනකින් රූපයට ප්‍රවේශ වීමයි. එනම්,

I. ස්වාභාවික පරිසරය තුළ කැමරාව හා වස්තුව අතර වන ප්‍රවේශය

II. තිරය සහ වස්තුව අතර වන තිර රූප ප්‍රවේශය සහ

III. තිරයේ භෞතික ප්‍රමාණය මත එය ප්‍රේක්ෂකයා හමුවෙහි ප්‍රතිනිර්මාණය කරනු ලබන අවකාශ ප්‍රවේශය වශයෙනි.

භෞතික පරිසරයේදී පුද්ගලයෙකු මසැසින් (Human eye) දකින අවකාශය සහ එහි තිර ප්‍රක්ෂේපිත අවකාශය අතර ප්‍රබල වෙනස්කම් පවතී. කැමරා කාච පද්ධතියේ හැසිරීම තුළින් මතුවන තාක්ෂණික

ප්‍රබලතා හා ඌනතා මත මෙය සිදුවෙයි. අවසන එය ප්‍රේක්ෂකයා හමුවට එන්නේ ස්වභාවික පාරිසරික අවකාශය මසැසින් විඳීමට වෙනස් විඳීමක් ලෙසිනි. ප්‍රේක්ෂකයෙක් ලෙස ලැබෙන මෙම වින්දනය තිරයේ ප්‍රමාණය අවකාශයට කරනු ලබන බලපෑම මත තවත් බලපෑමට ලක්වෙයි. නිදසුනක් ලෙස ස්ටීවන් ස්පීල්බර්ගේ ජුරාසික් පාක් (1993) චිත්‍රපටයේ සිනමා තිර ප්‍රක්ෂේපණය හා එහි වීඩියෝ ප්‍රක්ෂේපණය අතර වෙනස දැක්විය හැකිය. ප්‍රබල සිනමා තිරයේ ඇති දැවැන්ත සත්වයින් ලෙස ප්‍රේක්ෂකයා වෙත භීතිය ද, සංත්‍රාසය ද ජනිත කරනු ලබන ඩයිනෝසරයෝ වීඩියෝ ප්‍රක්ෂේපණයේදී කුඩා තිරය තුළ සාපේක්ෂව කරනු ලබන බලපෑම නොගත හැකි තරම්ය.

මේ ආකාරයෙන්ම අවකාශයේ අෂ්ට උප සංඝටක සිනමා රූපයේදී සිදුකරන භාව ප්‍රකාශනය තුළින් ද සිදුවන බලපෑම වටහා ගත හැකිය.

සිනමාව හා ගැඹුරු අවකාශය (Cinema and deep space)

සිනමාව යනු ආලෝකයේ කලාවයි. සිනමාව උපදින්නේ තිරය මත පතිත වන ආලෝකය එහි තීව්‍රතාවය මගින් නිර්මාණය කරනු ලබන එළිය සහ අඳුර මගිනි. එකී ආලෝකය තිරය මත පතිත වන්නේ ස්වභාවික ලෝකයේ ආලෝකයේ කාර්යභාරය ප්‍රතිනිර්මාණය කරමිනි. සිනමා ආලෝකකරණයේ කාර්ය, ස්වාභාවික ලෝකයේ කිසියම් මානව හැඟීමක් යථාරූපී ලෙස ප්‍රතිනිර්මාණයයි. 'ආලෝකකරණයේ මූලික කාර්යය ආලෝකය අප අවට පරිසරයට අනුව හසුරුවමින් පර්යාවලෝකනය කෘතීම ලෙස ගොඩනැගීමය. (Zettl, 2005, 20) එනම් දෘශ්‍ය සංඝටකයක ජීවී නළුවාගේ සිට අනෙකුත් සප්ත රූප සංඝටක ගොඩනගනු ලබන්නේ ආලෝක ආකෘතීන් වශයෙනි.

දෘශ්‍ය නිර්මිතය විෂයෙහි ආලෝකය:

දෘශ්‍ය ආකෘතිය හෙවත් නිර්මිතය පාදක වන්නේ (Contrast) ආලෝකයේ තීව්‍රතාවය සහ බන්ධුත්වය (Affinity) මතයි.

රූපසටහන - 01

ඉහත රූපසටහන 01 ඊට නිදසුනකි. මෙහිදී දෘශ්‍ය සංඝටකයක් තානය (Tone) මගින් වස්තුවක දීප්තිය (Brightness) අනෙකට සාපේක්ෂව අඳුරු අන්තරය (Gray Scale) කොතෙක් ද යන්න හඟවාලනු ලබයි. එකී උපරිම ප්‍රතිවිරුධ තානයක් දෙපස කළු හා සුදු පැහැ අන්තරයන්ගෙන් දක්වාලනු ලබයි.

රූපසටහන - 02

මෙම 02 රූපසටහන ඉහත උපරිම කළු සුදු පැහැ අන්තර හෙවත් තානයන් රූප රාමුවක නිරූපණයට නිදසුනකි. මෙහි වර්ණ අතර සහ සම්බන්ධය හෙවත් වර්ණ බන්ධුත්වය (Affinity) ශූන්‍ය ලෙස ගත හැකිය. එනම් වර්ණ බන්ධුත්වය මුළුමනින්ම ප්‍රතිවිරුද්ධ බවයි. මෙම ගුණය සිනමාවේදී විවිධ අරුත් උදෙසා යෙදෙන අයුරු සිහිපත් කර ගැනීමෙන් වස්තූන් අතර තීව්‍රතාවය හෝ වඩාත් ඉස්මතුවීම නිර්මාණශීලීව භාවිත වන අයුරු වටහා ගත හැකිය. එහිදී පසුබිම හා වස්තුව අතර වන අවම වර්ණ බන්ධුත්වය හා ඉහළ වර්ණ අන්තරය මෙමගින් අරුත් ගැන්වෙයි. වර්ණ බන්ධුත්වය (Affinity) සහ වර්ණ ප්‍රභේදනය (Colour Contrast) ඔස්සේ මෙතෙක් අප සාකච්ඡා කළ දෘශ්‍ය සංඝටක (අවකාශ, රේඛා, හැඩතල, තානය, වර්ණ, චලන හා රිද්ම) විස්තර කළ හැකිය. සැබවින්ම එම සියලු සංඝටක ගුණ දෘශ්‍ය තිරය මත ප්‍රතිනිර්මාණය වන්නේ වර්ණ බන්ධුත්වය (Affinity) හා වර්ණ ප්‍රභේදනය (Colour Contrast) මගිනි. මෙය වර්ණ බන්ධුත්වය හා වර්ණ ප්‍රභේදන මූලධර්මය ලෙස හැඳින්වෙයි.

The greater the contrast in a visual component, the more the visual intensity or dynamic increases.

The greater the affinity in a visual component, the less the visual intensity or dynamic decreases.

(Block, 2008,24)

දෘශ්‍ය සංඝටකයක උපරිම වර්ණ ප්‍රභේදනය (වර්ණ අන්තරය) යනු උපරිම වර්ණ තීව්‍රතාව හෝ එහි උපරිම ගතිකමය වැඩිවීමයි. දෘශ්‍ය සංඝටකයක උපරිම වර්ණ බන්ධුත්වය යනු අවම වර්ණ තීව්‍රතාවය හෝ එහි උපරිම ගතික අවමතාවයි.

මෙය වඩාත් සරලව මෙසේ දැක්විය හැකිය.

Contrast = Greater visual intensity - (පැහැ අන්තරය = උපරිම දෘශ්‍ය තීව්‍රතාව)

Affinity = Less visual intensity - (වර්ණ බන්ධුත්වය = අවම දෘශ්‍ය තීව්‍රතාව)

(Block, 2008,24)

මෙම මූලධර්මය මත පිහිටා දෘශ්‍ය සංඝටකයක අවකාශයේ ප්‍රභේදනයක් ගැන අධ්‍යයනය කළ හැකි අතර අවකාශය තුළ වස්තූන්ගේ සහ කැමරාවේ පිහිටීම් මත ගොඩනැගෙන භාව ප්‍රකාශන සහ සන්නිවේදනාර්ථ වටහාගත හැකිය.

ගැඹුරු අවකාශ (Deep Space) :

සිනමා හෝ දෘශ්‍ය මාධ්‍යයෙහි අවකාශ ගැඹුර යනු ද්විමාන තිරයක් මත ත්‍රිමාණ ලෝකය ප්‍රතිනිර්මානය කිරීමේ දෘශ්‍ය මායාව මගින් ප්‍රේක්ෂකයාට ත්‍රිමාණ ලෝකයේ උස, පළල හා ගැඹුර (height, width and depth) පිළිබඳ දෘශ්‍ය අත්දැකීම විඳීමට සැලැස්වීමයි. මෙය සිදුකරනු ලබන්නේ ගැඹුර පිළිබඳ ඉංගිත තිරය මත ගොඩනැංවීමෙනි. ඒ සඳහා වර්ණ බන්ධුත්වය සහ වර්ණ විභේදනය මගින් ගොඩනගනු ලබන අදෘශ්‍යමාන රේඛා (invisible lines) උපකාරී කරගනු ලැබේ.

පහත 03 රූපරාමුව ද්විමාන තලයකි.

රූපසටහන - 03

රූපසටහන - 04

මෙහි 03 රූපරාමුව ද්විමාන තලයකි. එහි ඉහළ හා පහළ රේඛා මෙන්ම වම් සහ දකුණු පස රේඛා ද සමාන්තරව පිහිටයි. 04 රූපයේ දැක්වෙන ගොඩනැගිලි බිත්තිය ද එවැනි ද්විමාන තලයකි. වම් පස රූපයේ මෙන් එය ද ද්විමාන පෘෂ්ඨයකි. එහෙත් පර්යාවලෝකනය ගොඩනැගීම මගින් එහි ත්‍රිමාණ ලක්ෂණ ගොඩනැගී තිබේ. ඒ සඳහා උපස්ථම්භක වී ඇත්තේ ආලෝක අන්තර (Lighting Intensity) හා ආලෝක ප්‍රභේදන ගුණයයි. එම ගුණාංග මගින් පර්යාවලෝකනය ගොඩනැගීමට භාවිත කර ඇත්තේ ඒක ලක්ෂ (One Point), ද්වි ලක්ෂ (Two Point) සහ ත්‍රිත්ව ලක්ෂ (Three Point) පර්යාවලෝකනය රීතීන්ය.



රූපසටහන - 05

රූපසටහන - 06



රූපසටහන - 07

ඒක ලක්ෂ පර්යාවලෝකනය (One Point Perspective)

ඉහත රූපසටහන් ත්‍රිත්වය ඒක ලක්ෂ පර්යාවලෝකනයට නිදසුන් වේ. මෙහි දැක්වෙනුයේ පළමු ගොඩනැගිලි බිත්තියම වෙතත් දකින්නාගේ දෘෂ්ටි ස්ථානය (Viewers looking position) ඒක ලක්ෂීය පර්යාවලෝකන රීතියට අනුව වෙනස් කිරීම මගින් ද්විමාන තිරය මත මායාමය අවකාශීය ගැඹුරක් ගොඩනගා තිබේ. ඒ අලෝකයේ තීව්‍රතාව හා අන්තරය ඇසුරිනි. පහත රූප සටහන් ද්විත්වය ද ඒක ලක්ෂ පර්යාවලෝකනයට නිදසුන් වේ.

රූපසටහන - 08

රූපසටහන - 09

ද්වි ලක්ෂ පර්යාවලෝකනය (Two Point Perspective)

මෙහිදී පළමු ගොඩනැගිල්ලම දකින්නාගේ දෘෂ්ටි ස්ථානය ඉහළට හෝ පහළට චලනය කිරීමෙන් ද්වි ලක්ෂ පර්යාවලෝකනය ගොඩනගා තිබේ. පහත රූපසටහන් තුන මගින් ඒ බව පැහැදිලි කරගත හැකිය.


රූපසටහන - 10

රූපසටහන - 11



රූපසටහන - 12

මෙහිදී පර්යාවලෝකනය මත ත්‍රිමාණ මතුකිරීම සඳහා අදෘශ්‍යමාන රේඛා ද්විත්වයක ඒක ලක්ෂී වීමේ ගුණය භාවිත වෙයි. මෙහිදී දෘශ්‍ය සංඝටකයේ සිදුවන වෙනස මුල් අවස්ථා ද්විත්වයට වඩා හැඟීම් සහ අර්ථ විෂයෙහි ද වෙනස් වේ. සිනමාවේදී ගාම්භීරත්වය වැනි මනෝභාව ගොඩනැංවීම සඳහා මෙම රූප භාවිතය සුලබව යෙදෙයි.

ත්‍රිත්ව ලක්ෂ පර්යාවලෝකනය:

මෙහිදී ද්විමාන තිරය මත ත්‍රිමාණ ලක්ෂණ ගොඩනැගීම සඳහා අදෘශ්‍යමාන රේඛා ත්‍රිත්වයක් ඡේදනය වීමේ රීතිය භාවිත වේ. පහත රූපසටහන් 4 මගින් එහි ආකාරය පැහැදිලි කරගත හැකිය.

රූපසටහන - 13


රූපසටහන - 14



රූපසටහන - 15



රූපසටහන - 16

රූපයේ දෘෂ්ටි ස්ථානය සාමාන්‍ය ඇස් මට්ටමෙන් පහළට රූපසටහන් අංක 13, 14, 15 හෝ ඉහළට රූපසටහන් 16 ගෙනයාම මගින් අදෘශ්‍යමාන රේඛා ත්‍රිත්ව ඡේදනයක් මගින් ද්විමාන තිරය මත ගැඹුරු අවකාශ මතුකෙරෙයි.

පහත දැක්වෙන්නේ එහි තවත් දෘෂ්ටි ස්ථානයකි. එහිදීත් ත්‍රිත්ව ලක්ෂ පර්යාවලෝකනය (Three Point Perspective) ක්‍රියාත්මක වෙයි.

රූපසටහන - 17



රූපසටහන - 18

18 රූපයෙහි ඉහළට රේඛා විහිදුවීමෙන් තෙවන රේඛා ඡේදනය නිර්මාණය වෙයි.

පහත රූපසටහන් දෙකෙහි ද්වි ලක්ෂ පර්යාවලෝකනය ඇතුළතට නෙරාගිය ගැඹුර ගොඩනංවා තිබේ.

රූපසටහන - 19



රූපසටහන - 20

මේ ආකාරයෙන්ම කැමරා චලන ඔස්සේ ගොඩනගන පෙරබිම, මැදබිම හා පසුබිම තුළින් ද වස්තූන් හා නළුවන් වෙත අවධානය ගොඩනැගිය හැකිය. එහිදී චලනය වන අවකාශය (moving space) අනවරතව ක්ෂේත්‍ර ගැඹුර වෙනස් කර ගනිමින් ප්‍රේක්ෂකයා විෂයයෙහි ගොඩනගන භාව ප්‍රකාශනය වෙනස් කර ගනියි. විශේෂත්වය වන්නේ එහිදී එකවර නළුවා සහ අවකාශය ද රංග භූමිකාවකට අවතීර්ණ වීම මගින් අවකාශ රංගනයකට මගපෑදීමයි. ඒ බව පහත රූපසටහන් හතරින් වටහා ගත හැකිය.



රූපසටහන - 21



රූපසටහන - 22

රූපසටහන - 23



රූපසටහන - 24

මෙහිදී සිදුවන්නේ කැමරාවේ ගමන් කිරීම ඔස්සේ ගැඹුර අනවරත වෙනසකට භාජනය වන අයුරක් ප්‍රතිනිර්මාණය වීමෙන් නළුවා විෂයෙහි වන අවධාරණය වෙනස් වීමෙන් අර්ථ ප්‍රකාශනය එකිනෙකට වෙනස් වීමයි. සිනමා අවකාශ රංගය මෙහිදී ද හඳුනාගත හැකිය.

එසේම අවකාශය කැමරාවේ චලනය ඔස්සේ වෙනස් කිරීම තුළින් ඒ ඒ වස්තූන් මෙන්ම අවකාශය ද ප්‍රේක්ෂකයාට පෙනෙන ආකාරය සහ එහි ස්වරූපය ද වෙනස් වෙයි. අවකාශ ගැඹුර සහ පැහැඅන්තර හා තීව්‍රතාව ඔස්සේ එමගින් ද සිනමා භාව ප්‍රකාශනයට මග විවර වෙයි. පහත රූපසටහන් ඊට නිදසුන් සපයයි.



රූපසටහන - 25

රූපසටහන - 26



රූපසටහන - 27

මෙම කැමරා චලනය තුළින් සහ වර්ණ තීව්‍රතාව වෙනස් කිරීම මගින් එකම හැඩතලය (Shape) තුළ විවිධ හැඩතල මතු කර ගත හැකිය. එය අවශ්‍යතාව මත අනෙකුත් දෘෂ්ටි සංඝටක හා සහ සම්බන්ධ කළ හැකිය.

මේ ආකාරයෙන් පැහැඅන්තරය සහ ආලෝක/වර්ණ තීව්‍රතාව (Intensity) අර්ථාන්විතව වෙනස් කිරීමෙන් සිනමාවේ භාවාර්ථ නිපදවා ගත හැකිය. එහිදී අප විශ්වාස කරනුයේ ජීවී නළුවා එහි ප්‍රමුඛයා බවයි. එහෙත් ජීවී නළුවාගේ රංගය උපදින්නේ අධ්‍යක්ෂවරයා විසින් අවකාශ පාලනය මගින් ගොඩනගන මායාව ඔස්සේ බවත් අවකාශය ප්‍රධාන රංග භූමිකාවක් නිරූපණය කරනු ලබන බවත් වටහාගත යුතුය.

මේ සඳහා ඉහත පැහැදිලි කළ අවකාශ භාවිතයන්ට අතිරේකව සීමිත අවකාශ (Limited Space), නොපැහැදිලි අවකාශ (Ambiguous Space), තිරයේ අනුපාතය (Aspect Ratio), පෘෂ්ඨීය බෙදීම් (Surface Divisions) (පෙරබිම, මැදිබිම, පසුබිම ලෙස), අනාවෘත අවකාශ (Closed Spaces) එනම් විවෘත භූමි දර්ශන වැනි විවෘත අවකාශ, සංවෘත අවකාශ වැසුණු කාමර තුළ අවකාශ පිහිටීම් වැනි විවිධ අවකාශ සිනමා රංග කාර්යයට සහසම්බන්ධ වෙයි. ඒ සඳහා පොදුවේ ද්විමාන තිර අවකාශය තුළ ආලෝක තීව්‍රතාව හා වර්ණ බන්ධුතාවයන් ද, වර්ණ ප්‍රභේදනයන් ද ක්‍රියාත්මක වෙයි. ඒ මගින් අනු අවකාශ ප්‍රභේද වන රේඛා (Line), හැඩතල (Shape), තාන (Tone), වර්ණ (Colour), චලන (Rhythm), රිද්ම යන සප්ත නළුවන් ජීවී නළුවන් සමඟ එකාත්මිකව අවසන් දෘශ්‍ය සංරචකය (Main Visual Components) නිර්මාණය කරනු ලබයි.

රුසියානු සිනමා පුරෝගාමීන් ප්‍රායෝගික සිනමා භාවිතයෙන් සහ ස්වභාවික පරිසරය ආලෝකයෙන් සහ සංකේතසාරී මනසකින් කියවීමෙන් ලෝක සිනමාවට දායක කළ සිනමාලංකාරයන් පංගු මාත්‍රයක් ලෙස එය දැක්විය හැකිය. අවසාන අර්ථයෙන් සිනමා අවකාශය තුළ අපිඳු රංග සංඝටකයෝ වෙමු.

මූලාශ්‍ර:

1. Bruce A, Block, (2008), The Visual Story, Elsevie inc, U.S.A.

2. Zettl, Herbert, (2005), Sight Sound Motion, Applied Media Aesthetics, forth edition, Thomson Wadsworth Publication, U.K.

3. Albers, Josef (1963), The Interation of Color, New Haven, CT, Yale University press, U.S.A.

වෙබ් අඩවි

1. www. imdb.com/vsevolod meyerhold

සටහන්

සටහන්

සටහන්

සඳසර

SANDASARA

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය

Essays in Honour of Senior Professor Chandrasiri Rajapaksha

කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ දසක හතරක විශිෂ්ට සේවාකාලයක් සපුරාලූ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයෝ සන්නිවේදන විෂය පිළිබඳ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයකු, පර්යේෂකයකු, විෂයමාලා සම්පාදකයකු සහ ගත්කතුවරයකු වශයෙන් ඉටුකර ඇති ශාස්ත්‍රීය හා ජාතික මෙහෙවර සුවිසෙස්ය.

අංශාධිපතිවරයකු, මාධ්‍ය අධ්‍යක්ෂවරයකු, පීඨාධිපතිවරයකු සහ ජනසන්නිවේදන විෂය පිළිබඳ ලංකාවේ පළමු ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා ද වශයෙන් එතුමන්ගේ විශ්වවිද්‍යාලයීය මෙහෙවර ගරුකටයුතු වන්නේය.

Rs. 2500/-

ප්‍රකාශනය: ජනසන්නිවේදන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව.

PUBLISHED BY: DEPARTMENT OF MASS COMMUNICATION,
UNIVERSITY OF KELANIYA, SRI LANKA.